


# භාවනා මාර්ගය

කටුකුරුන්දේ ඤාණානන්ද භික්ෂු

# භාවනා මාර්ගය

(විශේෂ 'පහන් කණුව දෙසුම්' වෙළුමකි)

කටුකුරුන්දේ ඤාණනන්ද භික්ෂු

ප්‍රකාශනය
කටුකුරුන්දේ ඤාණනන්ද සදහම් සෙනසුන් භාරය

2016

# ධර්ම දානයකි

මුදලට විකිණීම සපුරා තහනම් වෙයි.

ප්‍රථම මුද්‍රණය - 2011 ජනවාරි
දෙවන මුද්‍රණය - 2011 මැයි
තෙවන මුද්‍රණය - 2012 අගෝස්තු
සිවුවන මුද්‍රණය - 2013 නොවැම්බර්
පස්වන මුද්‍රණය - 2014 සැප්තැම්බර්
සයවන මුද්‍රණය - 2014 දෙසැම්බර්
සත්වන මුද්‍රණය - 2016 මැයි
අටවන මුද්‍රණය - 2016 ජූනි

## සියලුම හිමිකම් ඇවිරිණි

මුදලට විකිණීම සඳහා හෝ ලාභ ලැබීම පිණිස වන සියලු ආකාරයේ උපුටා ගැනීම්, නැවත පළ කිරීම් සපුරා තහනම්ය. මෙම දහම් පොත ධර්ම දානයක් ලෙස නැවත පළ කිරීමට කටුකුරුන්දේ ඤාණනන්ද සදහම් සෙනසුන් භාරය වෙත විමසීම් යොමු කරන්න. ධර්ම ග්‍රන්ථ සහ දේශනා සඳහා පිවිසෙන්න

www.seeingthroughthenet.net

ISBN 978-955-3962-09-6

විමසීම්

කටුකුරුන්දේ ඤාණනන්ද සදහම් සෙනසුන් භාරය
කිරිල්ලවලවත්ත, දම්මුල්ල, කරඳන.
දුරකථනය: 0777127454

knssb@seeingthroughthenet.net

මුද්‍රණය

කොලිටි ප්‍රින්ටර්ස්
17/2, පැඟිරිවත්ත පාර, ගංගොඩවිල, නුගේගොඩ.
දුරකථනය: 0114870333

# ධර්ම දානයකි

## මුදලට විකිණීම සපුරා තහනම් වෙයි.

කතු හිමියන්ගේ දහම් පොත් ලබාගත හැකි ස්ථාන:

1. සුනිල් විජේසිංහ මහතා – 39/10, ශාන්ත රීටා පාර, ගල්කිස්ස.
2. හේමමාලා ජයසිංහ මහත්මිය
   29/8, පැඟිරිවත්ත මාවත, මිරිහාන, නුගේගොඩ.
3. චන්දන විජේරත්න මහතා
   23/79A, 1 වන පටුමග, ධර්මපාල පෙදෙස, තලවතුගොඩ.
4. ස්ටැන්ලි සූරියාරච්චි මහතා – 25, කඩ වීදිය, දේවාලේගම.
5. එස්. ඒ. ලයනල් මහතා
   140/19, රුහුණුසිරි උද්‍යානය, හක්මන පාර, මාතර.
6. සිරිමා විජේරත්න මහත්මිය – 15, ඇලපාත, රත්නපුර.
7. ඒ. ජී. සරත් චන්ද්‍රරත්න මහතා
   'සමන්', ඇරැවුල හංදිය, කන්ඩලම පාර, දඹුල්ල.
8. ජේ. ඒ. ඩී. ජයමාන්න මහතා
   ජයමාන්න වත්ත, ලබුයාය, කුරුණෑගල පාර, කුලියාපිටිය.
9. මහාචාර්ය කේ. එම්. විජේරත්න, දන්ත විද්‍යා පීඨය,
   පේරාදෙණි විශ්ව විද්‍යාලය, පේරාදෙණිය.
10. වෛද්‍ය පී. වීරසිංහ මහතා
    බණ්ඩාර බුලංකුලම, ලංකාරාම පාර, අනුරාධපුර.
11. ආර්. ඒ. චන්ද්‍රි රණසිංහ මහත්මිය
    ස්ටුඩියෝ 'චායා', රෝහල හන්දිය, පොළොන්නරුව.
12. නේරා විජේසුන්දර මහත්මිය
    ඉළුක්පිටිය බෙහෙත් ශාලාව, ඉළුක්පිටිය, ගැටහැත්ත.
13. ඩී. සී. ඒ. නිශ්ශංක මහතා – 91A, වුඩ්වර්ඩ් පාර, ගාල්ල.
14. පියදාස සමරකෝන් මහතා
    සුදුවැලි පැලැස්ස, කිරින්ද, තිස්සමහාරාමය.

www.seeingthroughthenet.net

www.facebook.com/seeingthrough

# පටුන


හැඳින්වීම v

ප්‍රකාශක නිවේදනය vii

අමා ගඟ vii

01. 'යො ච මෙත්තං භාවයති' (පහන් කණුව 147) 1
(මෙත්තා චේතො විමුත්තිය)

02. 'අනාපාන සතී යස්ස' (පහන් කණුව 148) 24
(ආනාපාන සතිය)

03. 'උරගොව තචං ජිණ්ණං' (පහන් කණුව 149) 45
(මරණ සතිය)

04. 'සුඤ්ඤතො ලොකං අවෙක්ඛස්සු' (පහන් කණුව 150) 65
(සුඤ්ඤතානුපස්සනාව)

05. 'අහු බුද්ධස්ස දායාදෙ' (පහන් කණුව 151) 85
(අට්ඨික සඤ්ඤාව)

06. 'කද නු කට්ඨෙ ච තිණෙ ලතා ච' (පහන් කණුව 152) 107
(ධාතුමනසිකාරය)

07. 'නයිදං අත්තකතං බිම්බං' (පහන් කණුව 153) 127
(නාමරූපය)

08. 'සුගහීත නිමිත්තස්ස' (පහන් කණුව 157) 149
(සමථ-විපස්සනා)

උප ග්‍රන්ථය 172

අනුක්‍රමණිකාව 177

# භාවනා මාර්ගය
# හැඳින්වීම
(ප්‍රථම මුද්‍රණය)

මෙම විශේෂ පහන් කණුව දෙසුම් වෙළුම, භාවනා මාතෘකා කිහිපයකට අදාළ අන්දමින් අප විසින් පවත්වන්නට යෙදුන දෙසුම් අටක එකතුවකි. මේතාක් මුද්‍රණ ද්වාරයෙන් නිකුත් වී ඇති පහන් කණුව දෙසුම්වලද සමථ විපස්සනා භාවනා වඩන යෝගාවචරයින්ට ප්‍රයෝජනවත් විය හැකි දෑ අවසථානුකූලව කියැවුන නමුදු පරිහරණයේ පහසුව තකා මේ විශේෂ දෙසුම් අට එක වෙළුමක් වශයෙන් එළිදැක්වීමට තීරණය කළෙමු. මේ ග්‍රන්ථය පිහිට කරගෙන භාවනා මගට බසින යෝගාවචරයින්ට අවශ්‍යවන ධෛර්යය හා මං සලකුණු අපගේ අනිකුත් ග්‍රන්ථ ඇසුරින් ලද හැකිය.

දෙසුම් පිටපත් කිරීමෙන් හා අනුක්‍රමණිකාව පිළියෙල කිරීමෙන් හා සහායවූ පින්වත් ඩබ්. එම්. පී. වික්‍රමසිංහ මහත්ම - මහත්මීන්ට සහ අපගේ පොතපත ශෝභන ලෙස මුද්‍රණය කරදෙන කොලිටි ප්‍රින්ටර්ස් සමාගමේ සී. ජයසෝම මහතා ඇතුළු සැමටද අපගේ පුණ්‍යානුමෝදනාව හිමිවේ.

මෙයට,
සසුන් ලැදි
කටුකුරුන්දේ ඤාණනන්ද භික්ෂු

කටුකුරුන්දේ ඤාණනන්ද සදහම් සෙනසුන
පොත්ගුල්ගල ආරණ්‍ය සේනාසනය
“පහන්කණුව”
කන්දේගෙදර, දේවාලේගම.
(2553) 2010 අප්‍රේල්

# කටුකුරුන්දේ ඤාණනන්ද සදහම් සෙනසුන් භාරය
# ප්‍රකාශක නිවේදනය

'කටුකුරුන්දේ ඤාණනන්ද සදහම් සෙනසුන් භාරය' පූජ්‍ය කටුකුරුන්දේ ඤාණනන්ද ස්වාමීන් වහන්සේ විසින් සම්පාදිත සියලුම ධර්ම ග්‍රන්ථ හා දේශිත ධර්ම දේශනා පිරිසිදු ධර්ම දානයක් වශයෙන්ම ධර්ම පිපාසිත ලෝකයාහට ප්‍රදානය කිරීමේ උන්වහන්සේගේ අභිමතාර්ථය ඉටු කිරීමට ඇප කැප වී සිටියි. මේ අනුව ධර්ම ග්‍රන්ථ මුද්‍රණය සහ බෙදාහැරීම පිළිබඳ කාර්යභාරයත්, ධර්ම දේශනා සංයුක්ත තැටිගත කිරීම සහ www.seeingthroughthenet.net වෙබ් අඩවිය, www.facebook.com/seeingthrough සමාජ ජාල අඩවිය පවත්වා ගෙන යාමත් කටුකුරුන්දේ ඤාණනන්ද සදහම් සෙනසුන් භාරයේ වගකීම වනු ඇත.

දෙස් විදෙස් වැසි ධර්මකාමී පාඨක ශ්‍රාවක විශාල පිරිසක් වෙනුවෙන් ක්‍රියාත්මක වන මෙම පුළුල් ධර්ම දාන වැඩ පිළිවෙලට දායකවීමට කැමති පින්වතුන් හට පහත සඳහන් බැංකු ගිණුමට තම ආධාර මුදල් යොමුකිරීමට අවස්ථාව ඇත.

මෙම ධර්ම දාන වැඩපිළිවෙලට ආධාර එවීම පිළිබඳ සියලු විමසීම්:

කටුකුරුන්දේ ඤාණනන්ද සදහම් සෙනසුන් භාරය
කිරිල්ලවල වත්ත, දම්මුල්ල, කරඳන.
දුරකථන අංක: 0777127454
ඊමේල් ලිපිනය: knssb@seeingthroughthenet.net

ආධාර මුදල් යොමු කිරීම:

කටුකුරුන්දේ ඤාණනන්ද සදහම් සෙනසුන් භාරය (K.N.S.S.B)
ගිණුම් අංක: 007060000241
සම්පත් බැංකුව, SWIFT: BSAMLKLX
ශාඛා අංකය: 070
ශාඛාව: ආර්. ජී. සේනානායක මාවත, කොළඹ - 07.

# අමා ගඟ

මහවැලි ගඟ උතුරට හැරැවීමෙන් පසු එතෙක් නිසරු මුඩු බිම් ලෙස පැවති පෙදෙස්වල සිදුවූයේ ඉමහත් වෙනසෙකි. පිපාසයට පැන් බිඳක් නොලබා සිටි ගොවීහු පෙදෙස පුරා නිහඬව ගලා යන සිසිල් දිය දහරින් පිනා ගියහ. මැලවුනු ගොයම සරුව නිල්වන්ව කරලින් බර විය. මල් පලින් ගැවසීගත් තුරු-ලිය බලා සැනසෙන පෙදෙස් වැසියෝ තුටු කඳුළු වගුළහ.

දහම් අමා ගඟ 'උතුරට' හැරැවීමේ වැඩ පිළිවෙළක් මෙයට තෙවසරකට පෙර ඇරඹුණි. දහම් පත-පොත තබා 'එද-වේල' සඳහා වත් විය පැහැදම් කිරීමට වත්-කමක් නැත්තෝ, නිහඬව නොමිලයේ ගලායන අමිල දහම් අමා දිය දහරින් සදහම් පිපාසය සන්සිඳුවා ගත්හ. අරිටු මිසදිටු හැර, සැදැහැයෙන් සරුව, ගුණ නුවණින් බරව පිළිවෙත් මඟට නැමී ගත්හ. ලොවී-ලොවුතුරු මල් පල නෙලා ගනිමින් හද පුරා පිරි බැතියෙන් නන් අයුරින් සොම්නස පළකළහ.

'ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරය' නමින් දියත් කළ මෙම ධර්මදාන වැඩපිළිවෙල සඳහා අපගෙන් වැයවුනේ පිරිසිදු ධර්මදාන සංකල්පය පමණි. අමාගඟ 'උතුරට' හැරැවූවෝ සසුන් ගුණ හඳුනන පරිත්‍යාගශීලී සැදැහැවත්හුමය. 'නිවනේ නිවීම' පොත් පෙළ එළි දැක්වීමෙන් නොනැවතී 'පහන් කණුව ධර්මදේශනා' පොත් පෙළෙහි 'බර පැන' දැරීමටත්, දෙස්-විදෙස්වල දහම් පිපාසිතයින් උදෙසා අප අතින් ලියැවෙන අනිකුත් පොත-පත ඒ අයුරින්ම එළි දැක්වීමටත් ඔවුහු උත්සුක වූහ. 'දෙන දේ පිරිසිදුවම දීමේ' අදහසින් අමිල වූ දහම ඊට නිසි ශෝභන මුද්‍රණයකින්ම ධර්මකාමීන් අතට පත් කිරීමට පියවර ගත්හ. මුද්‍රිත පිටපත් සංඛ්‍යාව අවසන්වනු හා සමගම 'නැවත මුද්‍රණ' පළකිරීමෙන් දහම් අමා ගඟ වියළී යා නොදීමට දැඩි අදිටනකින් ඇප කැපවූහ.

'පොත් අලෙවිය' පිළිබඳව මෙකල බහුලව දක්නට ලැබෙන වාණිජ සංකල්පයට පිටුපා, තහංචිවලින් තොරව, තමන් අතට නොමිලයේම පත් කැරෙන 'දහම් පඬුර' තුළින් ධර්මදාන සංකල්පයෙහි අගය වටහා ගත් බොහෝ පාඨක පින්වත්හු තමන් ලද රස අහරක්, නෑ-හිතවතුන් සමග බෙද-හදා ගන්නාක් මෙන් නොමසුරුව අන් දහම් ලැදියනටද දී ධර්ම දානයට සහභාගී වූහ, ඉනුදු නොනැවතී, ශක්ති පමණින් 'ධර්ම ග්‍රන්ථ මුද්‍රණභාරයට' උරදීමටද ඉදිරිපත්වූහ, ඇතැමෙක් ලොකු කුඩා දහම් පොත් මුද්‍රණය කරවීමේ හා නැවත-නැවත මුද්‍රණය කරවීමේ බරපැන ඉසිලීමට පවා පසුබට නොවූහ.

සම්බුදු සසුන මේ ලක් පොළොවෙහි පවතින තාක් මේ දහම් අමාගඟ ලෝ සතුන් සිත් සනහමින් නොසිඳී ගලා යේවා යනු අපගේ පැතුමයි.

"සබ්බදානං ධම්මදානං ජිනාති"

මෙයට,
සසුන් ලැදි
කටුකුරුන්දේ ඤාණනන්ද භික්ෂු

පොත්ගුල්ගල ආරණ්‍ය සේනාසනය
'පහන් කණුව'
කන්දේගෙදර, දේවාලේගම
2000 ජුනි 05 (2544 පොසොන්)

# 01

පහන් කණුව ධර්ම දේශනා අංක 147

# නමො තසස භගවතො අරහතො සමමා සමබුඬධසස

**යොච මෙතතං භාවයති**
**අපපමාණං පතිසසතො**
**තනු සංයොජනා හොනති**
**පසසතො උපධිකඛයං**

**එකමපි චෙ පාණමදුටඨචිතෙතා**
**මෙතතායති කුසලො තෙන හොති**
**සබෙබච පාණෙ මනසානුකමපං**
**පහුතමරියො පකරොති පුඤඤං ති**

***- ඉතිවුතතක, එක නිපාත***

සැදැහැවත් පින්වතුනි,

මෛත්‍රී භාවනාව තුළින් මතුකරගන්නා චිත්ත විමුක්තියේ ආනිශංස පක්ෂය තිලෝගුරු සම්මා සම්බුදුරජාණන් වහන්සේ ඉතාමත්ම ඉහලින් වර්ණනා කරලා තියෙනවා. මෙත්තාචෙතොවිමුත්ති නමින් හැඳින්වෙන ඒ චිත්ත තත්ත්වය දානාදී පින්කම්වල සියලුම කුසල් බලය අභිභවා බැබලෙන, ඊට වඩා වටිනාකමක් ඇති, ඒ වගේම යම් යම් බරපතල කර්ම විපාකවල පවා බලය බිඳින ප්‍රබල කුසල් සිතක් බව බුදුරජාණන් වහන්සේ පෙන්නා දීලා තිබෙනවා.

දන් මේ අපි මාතෘකා කළ ගාථා සඳහන් වන ඉතිවුත්තක පාළියේ ඉතාමත් විසිතුරු උපමා වලින් බුදුරජාණන් වහන්සේ මෛත්‍රී චෙතොවිමුක්තියේ අගය විදහා දක්වලා තිබෙනවා. සංසාරයේ කෙනෙක් බලාපොරොත්තු වන භවභෝග සම්පත්-සාමාන්‍යයෙන් භවභෝග සම්පත් වලට යොදන වචනය උපධි කියන වචනයයි. ඒ භවභෝග සම්පත් ලබාදෙන පුණ්‍ය ක්‍රියා මේ ධර්මයේ හැඳින්වෙන්නේ ඕපධික පුඤ්ඤ කිරිය වත්ථු නමින් - ඕපධික පුණ්‍ය ක්‍රියා වස්තු නාමයෙන්. මේ සූත්‍ර දේශනාවේදී බුදුරජාණන් වහන්සේ සංඝයා වහන්සේලාට වදාරනවා "මහණෙනි, යම්තාක් ඕපධික පුණ්‍යක්‍රියා වස්තූන් තිබෙනවා නම්, ඒ කියන්නේ භවභෝග සම්පත් දෙන

කුසල ශක්තීන් තිබෙනවා නම්, පුණ්‍යක්‍රියා තිබෙනවා නම්, ඒ සියල්ලම මෛත්‍රී චෙතොවිමුක්තියෙන් දහසයෙන් පංගුවක්වත් වටින්නේ නැත. මෛත්‍රී චෙතොවිමුක්තියම ඒ සියලු පින්කම් අභිභවා ආලෝකවත්ව බැබළෙනව. ඊළඟට උපමාවක් දෙනවා. යම්සේ මහණෙනි, තාරකා වල යම් ප්‍රභාවක් තිබේද ඒ ප්‍රභාව චන්ද්‍රප්‍රභාවයෙන් දහසයෙන් පංගුවක්වත් වටින්නේ නැත්තේ යම්සේද, එසේම ඕපධික පුණ්‍යක්‍රියා වස්තු වල කුශලශක්තිය මෛත්‍රී චෙතොවිමුක්තියෙන් දහසයෙන් පංගුවක්වත් වටින්නේ නැත. ඊට වඩා බබළනවා කියලා. ඊළඟට දෙවැනි උපමාවක් දක්වනවා. යම්සේ මහණෙනි වස්සාන ඍතුවේ අවසාන මාසයේ සරත් සමයේ සූර්යයා වළාකුළු නැති අහසට පැන නැගිලා දීප්තිමත්ව ආලෝකය විහිදනවාද, බබළනවාද අන්න එසේම සියලුම ඕපධික පුණ්‍යක්‍රියා වස්තූන්වල ආනිශංස පක්ෂය අභිභවලා මෛත්‍රී චෙතොවිමුක්තිය බබළනවය. තුන්වැනි උපමාවකුත් දක්වනවා. මහණෙනි, යම්සේ රැයෙහි අළුයම් කාලයෙහි පහන්තරුව දීප්තිමත්ව බබළනවාද එසේම සියලුම ඕපධික පුණ්‍යක්‍රියා වස්තූන් ඉක්මවලා මෛත්‍රී චෙතොවිමුක්තිය බැබළෙනවය. එහෙම ප්‍රකාශ කරලා තමයි මෙන්න මේ අපි මාතෘකා කළ ගාථා වදාළේ.

ඒ ගාථාවල අර්ථයට හිත යොදමු. 'යොච මෙත්තං භාවයති - අප්පමාණං පතිස්සතො' - යම් කෙනෙක් සිහියෙන් යුක්තව අප්‍රමාණ වශයෙන් මෛත්‍රිය වඩයිද, 'තනුසංයොජනා හොන්ති'- පස්සතො උපධික්ඛයං උපධික්ඛය කියල කියන්නේ උපධීන් ක්ෂය කිරීම නම්වූ නිවන. ඒ නිවන දකින්නාවූ ඒ පුද්ගලයාගේ සංයෝජන කියලා කියන්නේ භව බැම්- භවබන්ධන - තුනීවෙනවාය.

ඊළඟ ගාථාවේ කියවෙනවා 'එකම්පි චෙ පාණමදුට්ඨචිත්තො- මෙත්තායති කුසලො තෙන හොති'- එක ප්‍රාණියකුට, එක සත්ත්වයෙකුට හෝ දූෂිත නොවූ සිතින් මෛත්‍රිය වඩනවා නම් ඒ තැනැත්තා කුසල් කරන්නෙක්, කුසල තැනැත්තෙක්, දක්ෂයෙක් වෙනවා ධර්මානුකූලව. 'සබ්බෙච පාණෙ මනසානුකම්පං- පහූතමරියො පකරොති පුඤ්ඤං'- සියලුම ප්‍රාණීන්ට අනුකම්පා කරන ඒ ආර්ය පුද්ගලයා 'පහූතමරියො පකරොති පුඤ්ඤං' ඒ ආර්ය ශ්‍රාවකයා බොහෝ පිං රැස්කරනවා කියලා ඒ ගාථාවේ වදාළා.

එතකොට මේ මෛත්‍රී භාවනාව-මෛත්‍රීය කියන වචනය-කාටත් ප්‍රියයි. හැම දෙනාම දන්නවා. මෛත්‍රී භාවනාව ගැන කියන කොට හැමදෙනාටම එක පාරටම සිහියට නැගෙන්නේ මෙත්ත සූත්‍රයයි. මේ මෙත්ත සූත්‍රය වචනයක් වචනයක් පාසා, පදයක් පදයක් පාසා, මහා පුදුම විධියට ගැලපිලා තියනවා. තථාගත සම්මා සම්බුදුරජාණන් වහන්සේ ගේ ශ්‍රී මුඛයෙන් නිකුත් වුන සූත්‍රයක් කියලා හිතෙන තරමට පුදුම විධියට අර්ථවත්ව ගැලපිලා තියෙනවා. පොඩි කාරණයක් මතක් කරන්න තියෙනවා. බොහෝ දෙනා මේ සූත්‍රය

හඳුන්වන්නේ 'කරණීය මෙත්ත සූත්‍රය' නමින්. එතන පොඩි අඩුපාඩුවක් තියෙනවා. මොකද, මේ සූත්‍රය ආරම්භවන පද 'කරණීයමත්ථ කුසලෙන- යංතං සන්තං පදං අභිසමෙච්ච' - එතන අත්ථකුසල කියන වචනයයි තියෙන්නෙ. ඒක නිසා එක්කෝ මේකට 'කරණීය සූත්‍රය' කියන්න ඕන. නැත්නම් 'මෙත්ත සූත්‍රය' කියන්න ඕන. කරණීය මෙත්ත සූත්‍රය කියන එක සුදුසු මදි බවයි අපේ හැඟීම.

ඉතින් කොහොම හෝ වේවා, මේ මෙත්ත සූත්‍රය ආරම්භ වෙන්නේ මේ විදියට ඒකේ මූලික අදහස ප්‍රකාශ කරමින්. 'කරණීයමත්ථ කුසලෙන යං තං සන්තං පදං අභිසමෙච්ච.' අත්ථකුසල කියල කියන්නේ යහපත සලසා ගන්න දක්ෂයා, තමන්ගේ යහපත සලසා ගන්නා දක්ෂයෙකු විසින් කළයුතු- මොකක් සඳහාද? යම් ඒ ශාන්ත පද නම්වූ නිවන අවබෝධ කරගැනීම සඳහා- ඔන්න එතකොට ඒ නිවන අවබෝධ කර ගැනීමට සුදුසු අන්දමින්මයි. මෛත්‍රිය වැඩීමේදී ඒකට අවශ්‍යවන ගුණාංග පහළොවකුත් එතන ඊළඟට බුදුරජාණන් වහන්සේ දක්වනවා. අපි මතක තියා ගන්න ඕන. මේ සූත්‍ර දේශනය දේශනා කළේ ආරණ්‍යක යෝගාවචර සංඝයා වහන්සේලා සඳහායි. විශේෂයෙන්ම උන්වහන්සේලාගේ ජීවිතයට අදාළ අන්දමින් අපි ඒ පදමාලාව තේරුම් ගත යුත්තේ. නමුත් ඒකට සීමා නොකර අපි කල්පනා කරන්න ඕන, ගිහි හෝ පැවිදි හෝ යෝගාවචරයෙක් මෛත්‍රිය හරියට වඩන්න බලාපොරොත්තු වෙනවා නම් චෙතොවිමුක්තිය තත්ත්වය දක්වා, මේ ගුණාංග තමා තුළ දියුණු කරගතයුතු බව.

මොනවද ඒ ගුණාංග? මේ සමහර වචන පැහැදිලි නොවන්න පුළුවන් මේ කාලෙ. 'සක්කො' කියල කියන්නේ හැකියාවක් ඇති. දක්ෂ කියන අදහසයි. මෙතන අදහස් වන්නේ සංඝයා වහන්සේලා පිළිබඳව නම් වත පිළිවෙත පිළිබඳව, ඒ පැවිදි ජීවිතය හා සම්බන්ධ කටයුතු පිළිබඳව දක්ෂයෙක් වීම. කුසලව, අනලස්ව, දක්ෂවීම-'සක්කො'. 'උජු' කියල කියන්නේ සෘජු, අවංක කියන එකයි. මෙතන වචන දෙකක් තියෙනව තරමක් දුරට සමාන. 'උජු සුජු' 'උජු' කියන්නේ සෘජු. 'සුජු' කියන්නේ වඩාත් සෘජු. ඒ වචන දෙකේ අර්ථය සාමාන්‍යයෙන් තෝරන්නේ 'උජු' කියල කියන්නේ කයිනුත් වචනයෙනුත් සෘජු. සමාජයට බාහිරව අවංක. සුජු කියල කියන්නේ තමාට තමා අවංක. ඒ කියන්නේ සිතිනුත් සෘජු, මනසිනුත් අවංක. එතකොට 'සක්කො උජු ච සුජු ච සුවචො' -ඒ වචනය දන්නවා කවුරුත්. කීකරු කියන එකයි. සුවචො චස්ස මුදු අනතිමානී - මුදු කියන එකත් දන්නවා. 'අනතිමානී'- නිහතමානී. 'සන්තුස්සකො ච'. 'සන්තුස්සකො' කියල කියන්නේ ලද දෙයින් සතුටුවන ස්වභාවය ඇති, 'සුභරො' කියන්නේ පහසුවෙන් පෝෂණය කළ හැකි බව. 'සුභරො ච'. 'අප්පකිච්චො ච' කියල කියන්නේ අල්පකෘත්‍ය ඇති-වැඩි වැඩ නැති, වැඩි වැඩ ඇති කෙනෙකුට භාවනා කරන්න අමාරුයි. 'සල්ලහුකවුත්ති'-

ලසු පැවතුම් ඇති. ලසු කියල කියන්නේ සැහැල්ලු පැවතුම් ඇති. 'සන්තින්ද්‍රියො ච නිපකො ච'- ශාන්ත වූ ඉඳුරන් ඇති. 'නිපක' කියල කියන්නේ පැසුණු බුද්ධිය ඇති. ප්‍රඥාවන්ත කියන එකයි. 'අප්පගබ්භො' කියල කියන්නේ ප්‍රගල්භ කියන වචනය යොදනවා කයින් වචනයෙන් ඕළාරික, ගොරෝසු පැවතුම් ඇති බවට. තැනට නොගැළපෙන ගොරෝසු පැවතුම් ඇති කෙනාට ප්‍රගල්භ කියලා කියනවා. 'අප්පගබ්භො' කියන්නේ එසේ ප්‍රගල්භ වීමේ ස්වභාවය නැති, 'කුලෙසු අනනුගිද්ධො' කුලයන්හි නොඇලුනු. සංඝයා වහන්සේලා ගැන කියනව නම් නුසුදුසු නොමනා ගිහි සම්බන්ධකම් නැති කියන එකයි. ඊළඟට තව විශේෂ එකක් කියනව. 'න ච ඛුද්දං සමාචරෙ කිඤ්චි යෙන විඤ්ඤූ පරෙ උපවදෙය්‍යුං - අන්‍යවූ ඒ නුවණැත්තන් ගරහන සුළුවූ- ගරහන අන්දමේ සුළු වූද වරදක් නොකරන්නාවූ කියලා ඔන්න ඔහොම ගුණාංග පහළොවක් දක්වලා ඔන්න ඊළඟට මෛත්‍රී භාවනාවට අදාල පද සමූහයයි. ඉදිරිපත් කරන්නේ.

ඊළඟට කියනවා 'සුඛිනො වා ඛෙමිනො හොන්තු - සබ්බෙ සත්තා භවන්තු සුඛිතත්තා' - සුඛිනො කියන එක තෝරන්නේ කායික වශයෙන් සුව ඇති, 'ඛෙමිනො හොන්තු' ඛෙම කියල කියන්නේ ආරක්ෂා සහිත නිර්භය. එහෙම නැත්නම් උපද්‍රව රහිත කියන එකයි. 'සුඛිනො වා ඛෙමිනො හොන්තු.' සියලු සත්ත්වයෝ ඒ විධියට සැප ඇත්තෝ වෙත්වා. 'සබ්බෙ සත්තා භවන්තු සුඛිතත්තා. සුඛිතත්තා කියන එක තෝරන්නේ සුවපත් සිත් ඇත්තෝ. සුඛිත චිත්ත කියන එකයි. ඉතින් මෙන්න මේ මෛත්‍රී භාවනාව පිළිබඳ හරියට කොඳුනාරටිය වගේ වටිනා මේ පාඨය-පාලි භාෂාවෙන් දරාගන්න අමාරු අයට නිරන්තරයෙන් සිහිපත් කිරීමට සුදුසු අන්දමින් මීට කලකට පෙර වැඩවාසය කළ පැලෑණේ ශ්‍රී වජිරඤාණ මාහිමිපාණන් වහන්සේ එක්තරා සරල සිලෝවකට නහලා තියෙනවා. පොඩි ළමයකුට වුනත් මතක තියා ගන්න පුළුවන්.

කයිනුත් සුවැත්තෝ
කිසිත් උවදුරු නැත්තෝ
වෙත්වා සියලු සත්හුමැ
සුවපත්වූ සිතැත්තෝ

ඉතින් කොයි ආකාරයෙන් නමුත් අන්න අර මූලික අදහස එතන කියවෙනවා.

ඊළඟට බුදුරජාණන් වහන්සේ විග්‍රහ කරනවා අර 'සබ්බෙ සත්තා' කියලා හැඳින්වූයේ කවුද කියලා. සියලු සත්ත්වයෝ. ඒක බුදුරජාණන් වහන්සේ මෙතැනදී කොටස් පහකට දක්වනවා. පොදු වශයෙන් මුළු මහත් ලෝකයාම බෙදෙන හැටි. 'යෙ කෙචි පාණභූතත්ථි' යම්තාක් ප්‍රාණීන් සත්ත්වයින් සිටිනවා

නම්, 'තසා වා ථාවරා වා අනවසෙසා' 'තස' කියල කියන්නේ තැතිගත්. 'ථාවර' කියන්නේ තහවුරු. 'අනවසෙසා' කියල කියන්නේ නිරවශේෂයෙන්, එතකොට මුළු ලෝකයම බෙදන්න පුළුවන් ඕනෑම මොහොතක තැතිගත් හා තැති නොගත් හැටියට. සාමාන්‍යයෙන් අපි තැති ගත් අය ගැනයි කරුණාව මෛත්‍රිය පතුරන්න බලාපොරොත්තු වන්නේ. නමුත් අන්න බුදුරජාණන් වහන්සේ කියනවා තැතිගත්- තැතිනොගත් දෙපක්ෂයටම. 'ථාවර' කියන්නේ තහවුරු. අපි ගනිමු, පහසුවට, තැතිගත් - තැති නොගත්, කියල. තසා වා ථාවරා වා අනවසෙසා' නිරවශේෂ වශයෙන්.

ඊළඟට ඔන්න ශරීර ප්‍රමාණය අනුව-'දීඝා වා යෙ මහන්තා වා - මජ්ඣිමා රස්සකාණුකථූලා' දික් හෝ මහත් හෝ මධ්‍යම ප්‍රමාණය හෝ කොට හෝ සියුම් හෝ ස්ථූල තරබාරු හෝ ඒ කියන විධියට ශරීර ප්‍රමාණ වශයෙන් ඒ ඕනෑම සත්ත්වයෙක්.

'දිට්ඨා වා යෙව අද්දිට්ඨා' දුටු හෝ නුදුටු- ඒ දෙගොල්ලම 'යෙ ච දූරෙ වසන්ති අවිදූරෙ' දුර හෝ නුදුර. එතකොට දුටු හෝ නුදුටු, දුර හෝ නුදුර, භූතා වා සම්භවෙසී වා' හටගත් හා හටගැනීමක් බලාපොරොත්තුවෙන් සිටින්නාවූ කියන එක. අපි තේරුම් ගන්න ඕනෑ දෙවන වචනය මව්කුසක ඉන්න දරුවත් බිත්තරයක ඉන්න සතත් කියල ඒ විදියටයි. උපන් නූපන් කියල ගනිමු. අන්න ඒ විධියට එතකොට මේ **සමස්ත පහක්** හැටියට ගත්තොත් මේ මුළු ලෝකයා, බුදුරජාණන් වහන්සේ 'සබ්බෙ සත්තා' නමින් හඳුන්වලා තියෙන්නේ අර මේ කාලයේ බොහෝ දෙනා හිතන ආකාරයට මම, මගේ හිතවතා, මැදහතා ආදී වශයෙන් නොවේ, පෞද්ගලික මට්ටමින් නොවේ. පොදු වශයෙන් ලෝකයා විග්‍රහ කරලා තියනවා. මේ විධියට අපි ගනිමු තැති ගත්- තැති නොගත්, ලොකු -කුඩා, දුටු-නුදුටු, දුර-නුදුර, උපන්-නූපන්, වශයෙන් ඔය විධියට කොටස් පහක් වශයෙන්. 'භූතා වා සම්භවෙසී වා- සබ්බෙ සත්තා භවන්තු සුඛිතත්තා, එතැනිනුත් හැඟවෙනවා 'සබ්බෙ සත්තා' කියන එක ආයිත් කියැවෙනවා. ඒ සියලු සත්ත්වයෝ සුවපත්වූ සිතැත්තෝ වෙත්වා. 'සබ්බෙ සත්තා භවන්තු සුඛිතත්තා.'

ඒ එතකොට සත්ත්වයින්ට සුවය පැතීම් වශයෙන්. ඒවගේම මෙතන කියවෙනවා හිත සුව පැතීම වගේම අහිත දුක දුරලීම සඳහාත් යම් ප්‍රාර්ථනාවක් කරනවා.

න පරො පරං නිකුබ්බෙථ
නාතිමඤ්ඤෙථ කත්ථචි නං කඤ්චි
බ්‍යාරොසනා පටිඝසඤ්ඤා
නාඤ්ඤමඤ්ඤස්ස දුක්ඛමිච්ඡෙය්‍ය

කියන ඒ ගාථාවෙන් කියවෙන්නේ 'න පරො පරං නිකුබ්බෙථ' එකෙක් තව එකෙකුට වංචා නොකෙරේවා. තව කෙනෙක් නොරවට්ටාවා කියන එකයි. 'නාතිමඤ්ඤෙථ කත්ථචි නං කඤ්චි' කොතැනක හෝ කිසිවෙක් තවත් කෙනෙකු හෙළා නොදකීවා කියන එකයි 'බ්‍යාරොසනා පටිඝසඤ්ඤා-නාඤ්ඤමඤ්ඤස්ස දුක්ඛමිච්ඡෙය්‍ය' රොස් පරොස්වී 'පටිඝසඤ්ඤා' කියන්නේ ගැටෙන අදහසින් 'නාඤ්ඤමඤ්ඤස්ස දුක්ඛමිච්ඡෙය්‍ය' එකෙක් අනෙකෙකුගේ දුකක් කැමති නොවන්නේය කියන එකයි.

ඔන්න ඊළඟට තියනවා කවුරුත් අහලා තියන කාටත් ප්‍රිය මනාප උපමාව.

මාතා යථා නියං පුත්තං
ආයුසා එක පුත්තමනුරක්ඛෙ
එවම්පි සබ්බභූතෙසු
මානසං භාවයෙ අපරිමාණං

යම්සේ මවක් තමාගේ එකම පුතු දිවිපුදා හෝ රැක ගනීද එසේම මුළු ලෝකය පිළිබඳව 'එවම්පි සබ්බ භූතෙසු- මානසං භාවයෙ අපරිමාණං'- ඒ විධියටම මුළු ලෝකයටම - මවක් දරුවකුට තියන මෛත්‍රීය මුළු ලෝකයටම පැතිරවිය යුතුය කියන එකයි. 'එවම්පි සබ්බ භූතෙසු මානසං භාවයෙ අපරිමාණං' අප්‍රමාණවූ මෛත්‍රීමය මනසක් වැඩිය යුතුය.

මෙත්තං ච සබ්බලොකස්මිං
මානසං භාවයෙ අපරිමාණං
මුළු ලෝකය පුරාම අප්‍රමාණ වූ මෛත්‍රී සිතක් වඩනේය.

ඊළඟට කියවෙනවා- **'අපරිමාණං'** කියන වචනය විග්‍රහ කරනවා. ප්‍රමාණයක් නැත කිව්වේ මොන අදහසින්ද? අන්න එතැනදී තමයි ඔය මෙත්තා චෙතො විමුක්තිය පැත්තට යන්නේ.

උද්ධං අධො ච තිරියං ච
අසම්බාධං අවෙරං අසපත්තං

උඩ, යට, සරස- සරස කියනකොට දිසා අනුදිසා අහුවෙනවා- 'උද්ධං අධො ච තිරියං ච', 'අසම්බාධං' -බාධා රහිතව, 'අවෙරං' අවෛරීව, 'අසපත්තං'නොසතුරුව 'උද්ධං අධො ච තිරියං ච අසම්බාධං අවෙරං අසපත්තං'

ඔන්න ඊළඟට වඩන ඉරියව්ව පිළිබඳව කියවෙනවා. දැන් ආනාපාන සතිය ආදී භාවනාවලදී බුදුරජාණන් වහන්සේ බොහෝවිට ඒකට ඉඳගත්තු ඉරියව්ව, කෙලින් ශරීරය තබාගෙන ආදී වශයෙන් විශේෂයක් දක්වූවත් මෙතන සතර ඉරියව්වෙන්ම, 'තිට්ඨං චරං නිසින්නො වා' හිටගෙන හෝ ඇවිදිමින් හෝ හිඳිමින් හෝ, 'සයානො වා යාවතස්ස විගතමිද්ධො' හාන්සිවී හෝ යම්තාක් නින්දට යට නොවී සිටී නම්, නිදිමතට යට නොවී සිටී නම්, ඒ තාක්ම පුළුවන් කියන එකයි. 'එතං සතිං අධිට්ඨෙය්‍ය' මේ සිහිය මොකක්ද? **මෛත්‍රීමය සිහිය**, මෛත්‍රීමය සිතින්ම ඒ අනුවම සතිය පැවැත්වීමයි 'එතං සතිං අධිට්ඨෙය්‍ය - බ්‍රහ්මමෙතං විහාරං ඉධමාහු' මේ ලෝකයේ ඒක බ්‍රහ්මවිහරණයකැයි නුවණැත්තෝ කියත්. බ්‍රහ්මවිහරණයක්, බ්‍රහ්ම විහාරයක් කියන එකයි.

ඊළඟට 'දිට්ඨිංච අනුපගම්ම සීලවා'- ඔන්න යමක් විශේෂයෙන් ප්‍රකාශ කරන්නේ මොකද? මේ මෛත්‍රී භාවනාව සත්ත්වයින් අරමුණු කරලයි පවතින්නේ. ඒක තුළ කෙනෙක් දැඩිව ගන්න පුළුවන් මේ සත්ත්වයා තුළ ආත්මයක් තිබෙනවා කියලා. ඒක ආත්ම දෘෂ්ටියට නැඹුරු වෙන්න ඉඩ තිබෙන නිසා- ඒ මිසදිටුවට යන්න ඉඩ තියෙන නිසා- 'දිට්ඨිඤ්ච අනුපගම්ම සීලවා' සිල්වත් වූයේ, ඒ දෘෂ්ටියට යන්න නොදී 'දස්සනෙන සම්පන්නො' ආර්ය දර්ශනයෙන් යුක්ත වූයේ 'කාමෙසු විනෙය්‍ය ගෙධං' පංචකාමයන් පිළිබඳ ගිජු බව දුරලා, 'න හි ජාතු ගබ්භසෙය්‍යං පුනරෙතී' ති. ඒ කියන්නේ, නැවත මව්කුසයක නින්දට වැටෙන්නේ නැහැ කියන්නේ අනාගාමී වේ. අනාගාමී තත්ත්වය දක්වාම මේ භාවනාව තුළින් නිවන් පැත්තට හැරෙන්න පුළුවන් බව ඒ සූත්‍රයේ ප්‍රකාශ වෙනවා.

එතකොට දැන් මෙතන අපි ඒ සූත්‍රයේ කියවුනු අදහස් පිළිබඳව ප්‍රායෝගිකව වචන කීපයක් කියතොත්- බොහෝ දෙනා ඒවා බලාපොරොත්තු වන නිසා- මෛත්‍රී භාවනාව පිළිබඳ නා නා විධ ක්‍රම දක්වලා තිබෙනවා. ඕනෑම ක්‍රමයක් කළත් හිතට එකඟව, මෙත්තා සහගත මෛත්‍රීමය අදහසින් කළා නම්, ඒවා අපතේ ගියේ නැහැ. නමුත් අපි යම් යම් ක්‍රම දක්වනවා, මේ කාලයේ හැටියට, සරල වඩාත් ප්‍රායෝගික හැටියට සලකන්න පුළුවන්. අර බහුල වශයෙන් දවස පුරා කරන්න පුළුවන් අන්දමට. ඒක නිසයි අපි බොහෝ විට කියන්නේ ඔය කොඳුනාරටිය වශයෙන් පෙන්නුව අර 'සුඛිනො වා ඛෙමිනො හොන්තු- සබ්බෙ සත්තා භවන්තු සුඛිතත්තා' කියන එකේ අදහස් සමූහයම අපි එක වචනයකට දැම්මොත් 'සුවපත් වෙත්වා! හෝ සුවපත් වේවා!' කියන වචනයට. තමන් ඒක ඇත්ත වශයෙන් අර්ථවත් කරගත යුතුයි. සාමාන්‍ය වචනයක් හැටියට සලකන්නේ නැතිව හරියට අර **විටමින් පෙත්තක් වගේ**. අර මෛත්‍රී සූත්‍රය පුරා තියන මුළු පදාර්ථයම මේ පදයට දමලා '**සුවපත් වෙත්වා**'. ඒක මට ඇති කියලා හිතට සලකා ගත්තොත්, ඒ තුළ

මෛත්‍රිය හදවතට ළං වෙනවා නම්, අන්න එහෙනම් ඒක භාවිතා කළාට කමක් නැහැ - අර්ථවත්ව **'සුවපත් වෙත්වා'**. මොකද දවසේ සතර ඉරියව්වේදීම ඒ ටික පහසුවෙන් පාවිච්චි කරන්න පුළුවන් නිසා. හතර ඉරියව්වේ අමාරුයි- අර නිදුක් වේවා නිරෝගී වේවා අවෛරී වේවා කියල හැල්ලක් කියන්න අමාරුයි. ඒකයි අපි කියන්නේ ඒක ඉතින් තමන් දැනගන්න ඕනැ. ඒ වචනය ඇත්ත වශයෙන් ඒක මන්ත්‍රයක් වගේ - ගුප්ත දෙයක් හැටියට නොවෙයි. තමන්ගේ හදවතට ළංව 'සුවපත් වෙත්වා'! කියන වචනය තුළට අර ටික දාගත්තොත් අන්න ඒක ලේසියි. ඊට පස්සේ, තමන්ට ඒක පරිහරණය කිරීම පහසුයි.

ඉතින් විශේෂයෙන්ම මෛත්‍රී චෙතො විමුක්තිය වඩන්න නම් අර විධියට ප්‍රබල අන්දමින් සෑහෙන කාලයක් ඒක වඩන්න ඕන. ඉතින් ඔන්න ඒකට අදාළ විශේෂ කරුණු ඒවගේම ඒකේ ආනිශංස පක්ෂයත් ප්‍රකාශ වන මෙත්ත සූත්‍රය ළඟට තියන වැදගත් සූත්‍රය තමයි- මෛත්‍රිය ගැන කථා කරන කොට- මෙත්තානිසංස සූත්‍රය. ඒකත් මේ පින්වතුන් දන්නවා. ඔය සජ්ඣායනා ආදීයේදී භාවිතා කරනවා.

බුදු රජාණන් වහන්සේ සැවැත් නුවර ජේතවනාරාමයේදී කෙලින්ම ඒකේ ආනිශංස පක්ෂය ප්‍රකාශ කිරීම් වශයෙන් 'මෙත්තාය භික්ඛවෙ චෙතො විමුත්තියා ආසෙවිතාය භාවිතාය බහුලීකතාය යානිකතාය වත්ථු කතාය අනුට්ඨිතාය පරිචිතාය සුසමාරද්ධාය එකාදසානිසංසා පාටිකංඛාති' මහණෙනි, මෛත්‍රී චෙතො විමුක්තිය- ඔන්න ඊළඟට ඒක වඩන ආකාර අටක් එතන සඳහන් වෙනවා. 'මෙත්තාය චෙතො විමුත්තියා ආසෙවිතාය, 'ආසෙවිතාය' කියන්නේ ඇසුරු කරන ලද්දේ. ලද්දී කියල කියමු. ඇසුරු කරන ලද මෛත්‍රී චෙතොවිමුක්තියයි. ඇසුරු කරනවා කියන්නේ යහළුවෙක් වගේ නිරන්තරයෙන් ඒක පුරුදු කිරීමයි- 'ආසේවිතාය' - 'භාවිතාය' කියන්නේ වැඩීම, ක්‍රමානුකූලව දවසින් දවස ඒක දියුණුවන ආකාරයට වැඩීමයි. 'බහුලීකතාය'-අන්න එනවා වචනය-බහුල වශයෙන් කිරීම. අර ඒකයි අපි කීවේ බහුල වශයෙන් කරන්න කෙටි කමටහන උපකාර වෙනවා කියලා. 'ආසේවිතාය භාවිතාය බහුලීකතාය' - 'යානිකතාය' අන්න වැදගත් වචන කීපයක් එනවා. 'යානිකතාය' යානාවක් මෙන් කරන ලද්දේ. දැන් ගමන් කරන කොට මෛත්‍රී යානයේ යනවා කියලා හිතාගෙන වගේ ඒ තරමට මෛත්‍රී සහගත හිතින් යන්න, ඇවිදින්න, ඒ කටයුතු කරන්න පුළුවන් නම් 'යානිකතාය' යානාවකින් යන්නා වගේ. යානාවක් බවට පත්කරගන්නා ලද්දේ. 'වත්ථු කතාය' කියන එක ඇතැම් විට වරදවලා තේරුම් ගන්නවා. වත්ථු කියන්නේ එතන වස්තුව නොවේ. වාස්තු කියලා වචනයක් තියනවා. 'වාස්තු' කියල කියන්නේ ඔය ගෙයක් හදන කොට ඉඩමක්, ඉඩමට කියනවා. වාස්තු විද්‍යාව කියලා ඔය ව්‍යවහාරයේ තියෙන්නේ. අන්න ඒ අදහසින් මෙතන 'වත්ථු කතාය කියන්නේ එතකොට තමන්ට, අපි

හිතමු, ලොකු උස ගොඩනැගිල්ලක් හදනව නම් ඒ ඉඩම හොඳට සකස් කරගන්න එපායැ. එතකොට මෛත්‍රී සිත අන්න වාස්තුවක් බවට පත්කර ගන්නව, ඉඩමක් බවට පත්කර ගන්නව. අනුට්ඨිතාය, අනුට්ඨාන කියල කියන්නේ යමකට අනුව හිට ගැනීම. යමකට හේත්තුවීම වගේ. එතකොට ඒකත්, මෛත්‍රිය අන්න එතකොට හිටගැනීමටත් උපකාර වෙනවා- 'අනුට්ඨිතාය' 'පරිචිතාය' කියන්නේ පුරුදු කරන ලද්දේ- 'සුසමාරද්ධාය' - හොඳින් ආරම්භ කරන ලද්දේ.

ඔය කියන අට ආකාරයකින් මෙත්තා චෙතොවිමුත්තිය වඩන කොට ආනිශංස එකොළහක් බලාපොරොත්තු වෙන්න පුළුවන් කියල බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනවා. ඒවා බොහෝ විට මේ පින්වතුන් අහලත් ඇති. අපි කෙටියෙන් සලකා ගත්තොත්,

සුඛං සුපති - සුවසේ නිදියනවා

සුඛං පටිබුජ්ඣති - සුවසේ පිබිදෙනවා

න පාපකං සුපිනං පස්සති - නපුරු නරක සිහින පෙනෙන්නේ නැත කියන එක.

මනුස්සානං පියො හොති - මනුෂ්‍යයින්ට ප්‍රිය වෙනවා.

අමනුස්සානං පියො හොති - අමනුෂ්‍යයින්ටත් ප්‍රිය වෙනවා.

දෙවතා රක්ඛන්ති - දෙවියෝ රකිනවා

නාස්ස අග්ගි වා විසං වා සත්ථං වා කමති - ඔහුගේ ශරීරයට ගින්න වස විස ආයුධ ආදියෙන් පීඩාවන් වන්නේ නැත, කියන එකයි.

තුවටං චිත්තං සමාධියති - ඉක්මණින් සිත සමාධිමත් වෙනවා.

මුඛවණ්ණො විප්පසීදති - මුහුණ ප්‍රසන්න වෙනවා

අසම්මූළ්හො කාලං කරොති - නුමුළාව කළුරිය කරනවා

උත්තරිං අප්පටිවිජ්ඣන්තො බ්‍රහ්මලොකූපගො හොති- මෙලොව අර්හත් භාවය ලැබුවේ නැත්නම් - ඊට ඉහළ තත්වයක් නොලැබුව හොත් - බ්‍රහ්මලෝකයට යනවා.

කියලා අන්න ඒ විධියට ආනිශංස බුදුරජාණන් වහන්සේ අර මෙත්තා චෙතොවිමුත්තිය වැඩීමේ ආනිශංස නිවන් දක්වාම යන හැටි ඒ සූත්‍රය තුළ පෙන්නුවා. ඔන්න එතකොට ඒ ආනිශංස එකොළහයි එතන දක්වන්නේ.

නමුත් මේ ආනිශංස එකොළහ පමණක් නොවෙයි අපි අර කලින් කීව මේ මෛත්‍රී චෙතොවිමුක්තිය මහ ප්‍රබල ආනිශංස ඇති දෙයක් බව ප්‍රකාශ වන වටිනා සූත්‍රයක් තියනවා. ඒක හඳුන්වන්නේ සංඛ සූත්‍රය නමින්. සංඛ කියන්නේ හක්ගෙඩිය. ඒ පිළිබඳ කථා ප්‍රවෘත්තියයි දැන් අපි

විශේෂයෙන් කියන්නේ. මේ පින්වතුන් සමහර විට අහලා නැති නිසා. අනිත් ඒවා නම් ඔය ප්‍රකට දේවල්, මෙතෙක් සඳහන් කළ ඒවා. මේ පිංවතුන්ට පහසුවෙන් සලකාගන්න පුළුවන්.

මේ සංඛ සූත්‍රය පිළිබඳ කථානතරය මෙහෙමයි සඳහන් වන්නේ. බුදුරජාණන් වහන්සේ එක් අවස්ථාවක නාලන්දාවේ පාවාරික අඹ වනයේ වැඩ වාසය කරනකොට අසිබන්ධකපුත්ත කියන නිගණ්ඨ ශ්‍රාවකයා බුදුරජාණන් වහන්සේ දකින්ට ඇවිල්ලා ඉඳගත්තා. බුදුරජාණන් වහන්සේ නිගණ්ඨ ශ්‍රාවකයාගෙන් අහනවා 'ගාමණී, මොකක්ද ඔබේ ශාස්තෲන් වහන්සේ - නිගණ්ඨනාථ පුත්ත - දේශනා කරන ධර්මය' එතකොට ඒ ධර්මයේ කොටසක් ගාමිණී කියනවා 'ස්වාමීනී අපේ ශාස්තෲන් වහන්සේ මෙහෙමයි ප්‍රකාශ කරන්නේ. යම් කෙනෙක් ප්‍රාණඝාතය කරනවා නම් 'යම්තාක් කෙනෙක් ප්‍රාණඝාතය කරනවා නම් - ඒ තැනැත්තා ඒකාන්තයෙන්ම නිරයට අපායට යනවා. යම්කෙනෙක් අදින්නාදානය කරනවා නම්, හොරකම් කරනවා නම්, නිරයට- අපායට නියතයි. ඊළඟට කාමමිථ්‍යාචාරය ඒ පාපකර්මය කළොත් ඒත් නිරයට. මුසාවාද- බොරු කීවොත් යම් කෙනෙක්, ඒත් අපායට යනවා කියලා ඊළඟට ඒකේ සිද්ධාන්තයත් ඒ එක්කම ප්‍රකාශ කරනවා. 'යං බහුලං යං බහුලං විහරති තෙන තෙන නියාාති.' ඒ පාඨයෙන් කියවෙන්නේ යම් යම් ආකාරයට බහුල වශයෙන් ජීවත් වෙයිද, විහරණය කරයිද, වෙසෙයිද, ඒ ඒ විධියට පරලොව තත්ත්වය වෙයි. ඕක කිව්ව හැටියෙ බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනවා 'එහෙම නම් ගාමණී ඔය නිගණ්ඨ නාථපුත්තගේ ධර්මයට අනුව කවුරුත් නිරයට යන්නේ නැහැ නේ.' එතන සියුම් තර්කයක් බුදුරජාණන් වහන්සේ නගන්නේ. ඊළඟට ඒක විස්තර කරන්නේ මේ විධියට. බුදුරජාණන් වහන්සේ අහනවා ගාමණීගෙන්, 'ගාමණී දැන් යම්කිසි කෙනෙක් ප්‍රාණඝාතය කරනවා රෑයේ හෝ දවාලේ හෝ ඉඳ හිටලා විටින් විට ප්‍රාණඝාතය කරනවා. එතකොට ඒ පුද්ගලයා දවසකට ප්‍රාණඝාතය කරන වෙලාවද වැඩි, නොකර ඉන්න වෙලාවද වැඩි? එතකොට අසිබන්ධක පුත්ත ගාමණී කියනවා ඒ පුද්ගලයා ප්‍රාණඝාතය නොකර ඉන්න වෙලාවයි වැඩි. ඔන්න ඒක අනුවයි බුදුරජාණන් වහන්සේ කියන්නේ එහෙමනම් ඒ පුද්ගලයා අපායට යන්නේ නැහැ නේ. ඇයි වැඩියෙන් ජීවත් වෙන කාලය අනුව නේ නිරයට යන්නේ. ඒ විධියටම- ආයි මේ පින්වතුන්ට නොකීවට බුදුරජාණන් වහන්සේගේ කථා ශෛලිය අනුව අදින්නාදානය පිළිබඳවත් අර විධියට ප්‍රශ්න කරලා, කාමමිථ්‍යාචාරය පිළිබඳවත් ප්‍රශ්න කරලා, මුසාවාදය පිළිබඳවත් ප්‍රශ්න කරලා නිගණ්ඨනාථ පුත්‍රගේ අර මතය නිෂ්ප්‍රභා කළා. මොකක්ද? යම් යම් ආකාරයකින් බහුල වශයෙන් ජීවත් වනවා නම් ඒ ආකාරයටම අපායට යනවා කියන එක.

ඔන්න ඊළඟට ඒ වෙනුවට මොකක්ද බුදුරජාණන් වහන්සේ ඉදිරිපත් කරන ධර්මය කියලා දන් මේ පින්වතුන් කල්පනා කරනවා ඇති. ඒ එක්කම බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනවා ඒ වගේ දෘෂ්ටියක් ගැනීමේ ආදීනවත්. 'ගාමණී' දන් යම් ශ්‍රාවකයෙක් - අර විධියේ ධර්මයක් දේශනා කරන ශාසතෘ වරයකුගේ ශ්‍රාවකයෙක් - මොකක්ද? යම් කෙනෙක් ප්‍රාණඝාතය කළොත් අපායට නිරයට යනවා ඒකාන්තයි. හොරකම් කළොත් අපායට නිරයට යනවා. කාමමිථ්‍යාචාරයෙහි හැසුරුනොත් අපායට නිරයට යනවා. බොරුවක් කීවොත් අපායට නිරයට යනවා මයි. එහෙම කියන ශාස්තෘවරයෙක් කෙරෙහි ශ්‍රද්ධාව ඇති කරගත් ශ්‍රාවකයා මෙහෙම කල්පනා කරනවා. මගේ ශාස්තෘන් වහන්සේ මේ වගේ දෘෂ්ටියක් දරනවා. මේ වගේ මතයක් දරනවා. දන් මම යම් ප්‍රාණඝාතයක් කරලා තියනවා. දන් ඉතින් මම අපායට කැපවෙලා ඉන්නේ. එහෙම හිතන ශ්‍රාවකයා ඒ හිත අතහරින්නේ නැතිව, ඒ දෘෂ්ටිය අතහරින්නේ නැතිව, ඒ වචනය අතහරින්නේ නැතිව, සිටියොත් ඇත්ත වශයෙන් අපායේ ගිහින් තිව්වා වගේ ඇත්ත වශයෙන්ම අපායට යන්න ඉඩ තියනවා කියලා බුදු රජාණන් වහන්සේ ප්‍රකාශ කළා.

ඔන්න ඒකේ ආදීනව පක්ෂය දක්වූවා අර විධියට - නියති වාදයක් හැටියට සැලකීමෙ. ප්‍රාණඝාතයක් කළොත් අපායට යනවා ඒකාන්තයෙන් කියන එක නිගණ්ඨ ධර්මයට අනුකූල එකක්. එතකොට බුදුරජාණන් වහන්සේ ඔන්න දක්වනවා ඒකේ අනික් පැත්ත. ඔන්න ලෝකයේ තථාගත සම්මා සම්බුදු කෙනෙක් උපදිනවා, උන්වහන්සේ මේ විධියටයි ප්‍රකාශ කරන්නේ- මේ තමන් වහන්සේ ගැනයි කියන්නේ- ප්‍රාණඝාතයට නොයෙකුත් ආකාරයෙන් ගරහනවා. නින්දා කරනවා. ප්‍රාණඝාතය කරන්න එපා කියනවා. අදින්නාදානය කරන්න එපා කියනවා. කාමමිථ්‍යාචාරයෙන් වළකින්න කියනවා. මුසාවාදයෙන් වළකින්න කියනවා. අන්න ඒ ශාසතෘවරයා කෙරෙහි ශ්‍රද්ධාව ඇති කර ගත්තු ශ්‍රාවකයා මෙහෙමයි කල්පනා කරන්නේ 'මාගේ ශාස්තෘන් වහන්සේ මේවාට ගරහනවා ප්‍රාණඝාතය අදින්නාදානය ආදියට. ඒක සුදුසු නැහැ. ආ! මා විසින් කරලා තියනවා යම් ප්‍රමාණයක්- අපි හිතමු ප්‍රාණඝාතය ගැනයි මේ පුද්ගලයා කල්පනා කරන්නේ-මේ මගේ ශාස්තෘන් වහන්සේ ප්‍රාණඝාතයට ගරහනවා. නමුත් මම යම් අවස්ථාවක ප්‍රාණඝාතයක් කරලා තියෙනවා. ඒක හොඳ නැහැ. නමුත් මා ඒ කළ ප්‍රාණඝාතය ගැන පසුතැවිලි වෙනවා නම්- 'විප්පටිසාරී' - ඒ ගැන පසුතැවිලි වෙනවා නම් ඒක නොකළා වෙන්නේ නැහැ. මා ඒ ගැන පසුතැවිලි වීම තුළින් ඒ කරපු දේ නැති කරන්න බැහැ' එහෙම කල්පනා කරලා ඒ තැනැත්තා ඉදිරියට ප්‍රාණඝාතයෙන් වළකිනවා. ඒ ශික්ෂාපදය රකිනවා. ඒ විධියටම අනික් ඒවාත් මේ පිංවතුන්ට හිතා ගන්න පුළුවන් නේ. ඒ ශ්‍රාවකයා අර හතර ගැනම කල්පනා කරලා තමන්ගෙන් ඒක සිද්ධවුනාට මොකද නියත වශයෙන් හිතන්නේ නැහැ අපායට කැපවුනා කියලා. අනාගතයට ඒ පිළිබඳව හික්මෙනවා.

ඔන්න ඊළඟට කරන්න තියන ටික බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනවා. ඒ ශ්‍රාවකයා එතනින් නවතින්නේ නැතිව තමා කරපු අකුසලය ගෙවා දාන්න කරන ඊළඟ උත්සාහයයි මේ පෙන්නුම් කරන්නේ. ඒ තැනැත්තා - ඒ ආර්ය ශ්‍රාවකයා- ප්‍රාණඝාතය අතහැරලා - ඒ දස අකුසල්ම අතහරිනවා- ප්‍රාණඝාත, අදින්නාදාන, කාමමිථ්‍යාචාර ඊළඟට බොරුකීම. බොරුකීම පමණක් නොවේ කේලාම් කීම, පරුෂ වචන කීම, නිෂ්ඵල වචන දෙඩීම, ඒවායිනුත් ඉවත් වෙනවා. වචනයෙන් කෙරෙන අකුසල් හතරෙනුත් ඊළඟට අවසාන වශයෙන් දක්වෙනවා අභිජ්ඣා ව්‍යාපාද, මිච්ඡාදිට්ඨි කියන විෂමලෝභය ද්වේශය, ඊළඟට මිථ්‍යාදෘෂ්ටිය ඒ දසඅකුසල්ම ඉවත් කරලා, දසකුසල් මාර්ගයට අවතීර්ණ වෙලා, සම්‍යක්දෘෂ්ටියෙන් යුක්තව සතිමත්ව- ඊළඟට මොකද්ද කරන්නේ?- අන්න එතනදී තමා ඔය මෛත්‍රීචෙතොවිමුක්තිය ප්‍රකාශ කරන්නේ.

ඒ තැනැත්තා, ඒ ශ්‍රාවකයා, අර අකුසල් ගෙවා දාන්න මොකක්ද කරන්නේ? 'මෙත්තා සහගතෙන චෙතසා එකං දිසං ඵරිත්වා විහරති විපුලෙන මහගගතෙන අවෙරෙන අබ්‍යාපජ්ඣෙන.' ඔය විදියටම කියනවා පුළුල්වූ මහත්වූ අප්‍රමාණ වූ අවෛරීවූ පීඩාරහිතවූ මෛත්‍රී සහගත සිතින් එක දිසාවක් පතුරුවා වාසය කරනවා. එක දිසාවකට පතුරුවනවා. දෙවෙනි දිසාවට පතුරනවා. තුන්වැනි දිසාවට පතුරනවා. හතරවෙනි දිසාවට පතුරවනවා. උඩට යටට පතුරනවා. අන්න ඒ විධියට අන්න එතෙන්දි කියන්නෙ දිසා වශයෙන්. අර චෙතොවිමුත්ති තත්ත්වය දක්වා යන්න නම් මේ මෛත්‍රිය අප්‍රමාණව වඩන්න ඕන. අප්‍රමාණව වැඩීම තමා අර මෙත්ත සූත්‍රයෙන් කිව්වා වගේ මෙතන තියෙන්නේ. එක් දිසාවක්, දෙවෙනි දිසාව, තුන්වැනි දිසාව, හතරවැනි දිසාව, උඩ, යට, සරස - මුළුලෝකය කෙරෙහිම අපරිමාණ, අප්‍රමාණවූ, අවෛරීවූ ඒකට කියන්නේ මහද්ගතසිත - මහද්ගතසිතක් වඩනවා. මෙතනදී මතක තියාගන්න ඕන, ඔය පරණ පොත්වලත් තියනවා - පරණ කියන්න නරකයි මේ මෑත යුගයේ - ඕවා තෝරන්න ගියාම තියෙනවා 'සීමාසම්භෙද' කියල එකක්. සීමා බිඳින්න ඕන කියලා සීමා හතරක් දක්වනවා- තමා, හිතවතා, මැදහතා, වෛරකාරයා කියලා. ඔහොම ආරම්භයේදී ඒක ගැන හිත යෙදීම බොහෝ භාවනායෝගීන්ට කරදරයක් බව අපට ප්‍රකාශ කරලා තියෙනවා. ඒකයි අපි කියන්නේ ඒ ක්‍රමය හොඳ නැහැ කියලා ආරම්භයේදී. බුදුරජාණන් වහන්සේ දක්වූ ආකාරයට පොදු වශයෙන් විග්‍රහකරනවා මිසක් පෞද්ගලික වශයෙන් තමන්ට ඉස්සර වෙලා මෛත්‍රිය කරලා තමන්ගේ හිතවතා ඊළඟට ඔහොම ඔහොම වැට කඩුලු හද හදා කඩන්න ඕනැ නැහැ. තියන වැටකඩුලු කඩාගන යන විධියට හතර දිසාවටම පතුරුවන එකයි මෙතන කරන්න තියෙන්නේ. ඒ හතර දිසාවට පැතිරීම තමන්ගේ හිතට නිසි ආකාරයට- ගැලපෙන ආකාරයට-අපි උපමාවල් කිව්වොත් මේ විධියට කරන්න පුළුවන් කෙනෙකුට.

දැන් බොහෝ තැන්වල කරන්නේ මේක වචනයට නගලා නැගෙනහිර දිශාවේ යම් සත්ත්වයෝ වෙත්ද, බටහිර දිශාවේ, දකුණු දිශාවේ, උතුරු දිශාවේ, එහෙම එහෙම ඒක නිකං වචන මාත්‍රයක් වෙනවා. එහෙම නොවෙයි තමන් ඉන්න ඉරියව්ව ගැන සලකලා බුදුරජාණන් වහන්සේ මෙතන කිව්වේ 'එකං දිසං' එක දිසාවක් කියනකොට එතකොට පළමුව තමා ඉදිරිපිට තියන දිසාව කියා හිතා ගන්න පුළුවන්. ඒ දිසාව, දෙවෙනි දිසාව, තුන්වැනි දිසාව, හතරවැනි දිසාව, අන්න එහෙම තමන්ගේ ප්‍රත්‍යක්ෂයට ගෝචරවන ආකාරයෙන් දිසාවලට මේ මෛත්‍රී සිත විහිදුවා හැරීමයි. බුදුරජාණන් වහන්සේ කියාපු සමස්ත පහ අනුව ආරම්භයේදීම තමන්ගේ හිත- එක වචනය යෙදුවට මොකද- ඒක ශක්තිමත් කරගන්න ඕනෑ. හිතට එකඟව කරන දෙයක් මිසක් මේක ගුප්ත මන්ත්‍රයක් නොවේ. අර 'සුවපත් වේවා' කියන එක ඒ අදහස පතුරවලා හරින්න ඕනෑ.

අපි උපමාවකට කිව්වොත් අඳුරු රැයක කඳු මුදුනක ඉඳගෙන විදුලිපන්දමකින් ආලෝකය විහිදුවනකොට අපි දන්නවා කෝණාකාරව ආලෝකය විහිදෙන බව. එතකොට ඒ විදියට හතර දිසාවට විදුලි පන්දම හැරෙව්වාම හතර දිසාවම සම්පූර්ණයි. ආයෙ අනුදිසා ගැන කියන්න ඕනෑ නැහැ. උඩට යටට. අන්න එහෙම යම් කිසි තමන්ට හිතට ගැලපෙන උපමාවක් අනුව. එහෙමත් නැත්නම් මහා ජලාශයක සොරොව්ව ඇරියාම මුඩුබිම් ඔක්කොම අස්වද්දන්න ඒ වතුර ගලාගන යන්නා වගේ මෛත්‍රී සිත ගලා යන්න සලස්වන්න ඕන, අප්‍රමාණව. අන්න ඒ විධියට කරලා යම් අවස්ථාවක වෙන එකක් තබා යම් තැනක, යම් මධ්‍යස්ථානයක, කේන්ද්‍රස්ථානයක, ඉඳගෙන ඒ දිසා වලට දිසාඵරණ වශයෙන් සීමා කඩාගන යන විධියට මෛත්‍රිය පතුරවා හැරියාද, අන්තිමට ඒ කේන්ද්‍රස්ථානයත් මැකිලා ගිහිල්ලා තනිකරම මෛත්‍රී සිත වශයෙන් මිදුනු අවස්ථාව තමයි මෛත්‍රී චෙතොවිමුක්තිය කියලා කියන්නේ. එතකොට අපි යම් තැනක ඉඳලා මෛත්‍රිය වඩනවා හතර දිශාවට, අන්තිමට ඒ තනිකර මෛත්‍රී හිත පමණයි. තමන් ඉන්න තැනක්වත් හරියට නැහැ. ඒ තරමට එහෙම පිටින්ම මෛත්‍රී සිත. ඒකෙන් හිත විමුක්ත වෙනවා. මොකද හිත විමුක්තය කියල කියන්නේ? එක එක්කෙනාට වෙන වෙනම මෛත්‍රිය කිරීම හිතට කරදරයක් බව වැටහෙනවා. අන්තිමට මේක තනිකර මෛත්‍රිය සියලුම සත්ත්වයින් කෙරෙහි පතුරුවන්න පුළුවන්. අන්න ඒ තත්ත්වය තමයි එතකොට- ඒ අප්‍රමාණ සිතේ ශක්තිය තුළින්.

ඊළඟට අපි දැන් ආයිත් එමු අර සූත්‍රය ඉවර නැහැ. අන්න සංඛ සූත්‍රයේ අර ටික කියලා බුදුරජාණන් වහන්සේ දෙනවා හක්ගෙඩියේ උපමාව. යම්සේ ගාමණී ශක්තිමත් හක් පිඹින්නෙක් පහසුවෙන්ම හතර දිශාවට ඒ හක්ගෙඩියේ හඬ අසවනවාද, අන්න ඒ විධියට අර පුද්ගලයා, අර කලක් පව්කම් කළ පුද්ගලයා, අර විධියට මෛත්‍රීචෙතොවිමුක්තිය පැතිරෙව්වාම ඒ

මෛත්‍රී සිත තුළ- එතන බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනවා 'යං පමාණකතං කම්මං න තං තත්‍රාවසිස්සති න තං තත්‍රාවතිට්ඨති' ප්‍රමාණ වශයෙන් කරන ලද අර පාපකර්ම ඒ මෛත්‍රී චෙතොවිමුක්තිය තුළ රඳන්නේ නැහැ. ඉතුරු වෙන්නේ නැහැ. ඒවා මැකිලා යනවා. එහෙම නැත්නම් දිට්ඨධම්මවේදනීය වශයෙන් සුළු වශයෙන් ඒවා විපාක දීලා එතතින් කෙළවර වෙනවා. ආයෙ පරලොවට ගෙනයන්නේ නැහැ. අන්න ඒ තුළින් අපට හිතාගන්න පුළුවන්- මේ නිගණ්ඨ ධර්මය වගේ නොවේ අපේ මේ බුදුරජාණන් වහන්සේ ඉදිරිපත් කළ ධර්මය තුළ කෙනෙකුට හැදෙන්න පුළුවන්. ඒ විධියේ පව්කම් කළ කෙනෙකුට පවා මම දැන් නිරයට යනවා කියලා ඒකාන්ත වශයෙන් හිතන්නේ නැතිව ජීවිත පරිවර්තනයක් තුළින් අර බරපතල අකුසල් කර්ම පවා ගෙවා දැමිය හැකි බවයි මේ හක්ගෙඩියේ උපමාවෙන් බුදුරජාණන් වහන්සේ දක්වන්නේ.

ඉතින් මේ ධර්ම න්‍යාය මීටත් වඩා පැහැදිලිව ප්‍රකාශ කළ සූත්‍රයක් - සමහර විට මේ පින්වතුන් අහලත් ඇති කලිනුත් අපි ප්‍රකාශ කළ නිසා-ලුණුකැටයේ උපමාවට ඊළඟට එමු. මේ උපමා ආශ්‍රයෙන් මතක තියා ගන්න පහසු නිසා. ඒ සූත්‍රය තුළිනුයි මේ කර්මය පිළිබඳ මේ කාලයේ බොහෝදෙනා නගන ගැඹුරු ප්‍රශ්න වලටත් උත්තර තියෙන්නේ. කර්මය නියතිවාදයක්ද? ඒකාන්තයෙන්ම කෙනෙක් මෙහෙම කළොත් විපාක ඒ විධියටම දෙනවාද? ඒවාට පිළිතුරු තිබෙනවා ලෝණඵල සූත්‍රය කියලා කියන ලුණුකැටය පිළිබඳ උපමාව දක්වෙන සූත්‍රයෙ. ඒකෙදි බුදුරජාණන් වහන්සේ මේ විධියටයි ආරම්භ කරන්නේ. ඉස්සර වෙලා අර සිද්ධාන්ත වශයෙන් දක්වනවා. යම් කෙනෙක් කිව්වොත්-එතන යම් කෙනෙක් කියන්නේ යම් ශාස්තෘවරයෙක්, අපට හිතාගන්න පුළුවන් නිගණ්ඨනාථ පුත්‍ර- එයාගෙ ධර්මයේ එහෙමයි තියෙන්නේ. යමෙක් යම් යම් ආකාරයකින් කර්මය කරයිද ඒ ඒ ආකාරයකින්ම විඳිය යුතුයයි කියනවා නම් යම් ශාස්තෘවරයෙක්, එහෙම නම් එම ධර්මය තුළ බ්‍රහ්මචරිය වාසයකට, නිවන් සඳහා කරන ප්‍රතිපත්ති පූරණයකට, ඉඩක් නැත. මේ දුක් -සසර දුක්-කෙළවර කිරීමට අවසථාව නැත. මොකද? ඒ කරන ඒ හැම පාපයකටම ගෙවන්න ගියොත් කවදාවත් ගෙවලා නිම කරන්න බැරි නිසා.

ඊළඟට කියනවා ධර්මානුකූල සිද්ධාන්තය. ඒක ටිකක් සියුම් විධියටයි එතන ඒ පාලි වචන යොදලා තියෙන්නේ. කෙනෙකුට තේරුම් ගැනීම ටිකක් අපහසු වෙන්නත් බැරි නැහැ. එතෙන්දි කියන්නේ 'යථා යථා අයං පුරිසො කම්මං කරොති තථා තථා නං පටිසංවෙදියති' අපට පාලි වචන කියන්න වෙනවා ඒකෙ වෙනස පෙන්වන්න. යම් යම් ආකාරයට මේ පුරුෂයා කර්මයක් කරනවාද, ඒ ආකාරයට එය විඳී කිව්වොත් අපට බැහැ විමුක්තියක් ලබන්න. ඔන්න ඊළඟට බුදුරජාණන් වහන්සේ ඒක සංශෝධනය කරනවා. "යථා යථා **වෙදනීයං** අයං පුරිසො කම්මං කරොති තථා තථාස්ස **විපාකං**

පටිසංවෙදියති" යම් යම් ආකාරයකට විඳිය යුතු ලෙස - යම් යම් ආකාරයකට **විඳිය යුතු ලෙස**-යමෙක් කර්මය කරයිද ඒ අනුව එහි **විපාකය** විඳී කිව්වොත් ඔන්න එහෙනම් බ්‍රහ්මචරිය වාසයකට ඉඩක් තියනවා. විමුක්තියට ඉඩක් තියනවා. ඒක බොහොම සියුම් කාරණයක්. එතැනින් අපට හිතාගන්න තියෙන්නේ මෙහෙමයි. නිගණ්ඨ ධර්මය අනුව ඒ කර්මානුරූපව ඒ විධියටම විපාක විඳින්න වෙනවා. දඬුවමක් වගේ විඳින්න වෙනවා. නමුත් ධර්මයට අනුව කර්මයයි විපාකයි - විපාකය කියන වචනය තුළ තියෙනවා පැසීම කියන අර්ථය- එතකොට මේ කර්ම වාදය ඇත්ත වශයෙන්ම තියෙන්නේ පටිච්චසමුප්පාද ධර්මය තුළයි. හේතු ප්‍රත්‍යය සම්බන්ධය තුළයි. ඒක නිසාම තමයි මෙතන අර විධියේ බරපතල කර්මයක් කළ කෙනෙකුට පවා ජීවිත පරිවර්තනයක් තුළින් ඒ කර්ම වේග ගෙවා දැමිය හැක්කේ.

ඊළඟට ඒ ගෙවා දමන ආකාරය මේ සූත්‍රයේ එතනදීම බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනවා. ඒක ඒ කර්මය ගෙවන්න පුළුවන් දිට්ඨධම්මවේදනීය වශයෙනුත් - කර්ම විපාක ගැන මේ පිංවතුනුත් අහලා තියෙනවා ඇතැම් කර්ම මෙලොවම ගෙවා දමනවට කියනවා 'දිට්ඨධම්මවෙදනීය' කියලා. ඊළඟ ආත්ම භවයේදී ගෙවන ඒවාට කියනවා 'උපපජ්ජවෙදනීය' කර්ම කියලා. 'අපරාපරිය වෙදනීය' කර්ම කියලා කියන්නේ අනාගත ආත්ම ගණනාවක විඳින්න වෙන කර්ම වලට. ඔය විධියට ප්‍රභේදයක් තියනවා. දිට්ඨධම්මවේදනීය, උපපජ්ජවේදනීය, අපරාපරියවේදනීය. අන්න අර 'විපාකයේ කථාව' කිව්වේ ඒකයි. එතකොට කෙනෙකුට අර පාපකර්ම මෙලොවම සුළු වශයෙන් විඳලා බේරෙන්නත් පුළුවන්කම තියන බවයි බුදුරජාණන් වහන්සේ දක්වන්නේ. ඊළඟට ඒක තවත් පැහැදිලි කිරීමට ඔන්න බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනවා යම්කිසි කෙනෙක් සුළු පාපකර්මයක් කරල, එක තැනැත්තෙක් සුළු පාපකර්මයක් කරල එයින් නිරයට යනවා. තව තැනැත්තෙක් ඒ ප්‍රමාණයේම පාපකර්මයක් කරල නිරයට යන්නේ නැහැ. එයින් බේරෙනවා, මෙලොවම සුළු වශයෙන් ගෙවා දමනවා. දිට්ඨධම්මවේදනීය වශයෙන් පාපකර්මයේ විපාක ගෙවා දාලා පරලොවට කිසිවක් පාපකර්ම ඉතුරු කර ගන්නේ නැහැ. ඔන්න ඒක ප්‍රහේලිකාවක් වශයෙන් ඉදිරිපත් කරලා ඊළඟට තෝරනවා බුදුරජාණන් වහන්සේ කවුද ඒ පළමුවැනි පුද්ගලයා? යම්කෙනෙක් පාප කර්මය කරලා-ඒ තැනැත්තාගේ ජීවන චර්යාව ගැන ප්‍රකාශ කරනවා -ඒ තැනැත්තා 'අභාවිත කායො අභාවිත සීලො අභාවිත චිත්තො අභාවිත පඤ්ඤො' සංවර ආදී වශයෙන් කයක් දියුණු කරලා නැහැ. සීලයක් දියුණු කරලා නැහැ. සමාධි වශයෙන් සිතක් දියුණු කරලා නැහැ. ප්‍රඥාවක් දියුණු කරලා නැහැ. අන්න එබඳු පුද්ගලයා සුළු පාපකර්මයක් කරලා නිරයට යනවා. දෙවනුව කී පුද්ගලයා පාපකර්මයක් කළ බව ඇත්ත. නමුත් ඒ තැනැත්තා ඊටපසුව ජීවිත පරිවර්තනයක් තුළින් - 'භාවිතකායො භාවිතසීලො භාවිතචිත්තො භාවිතපඤ්ඤො' සංවරව හැසිරෙනවා,

සීලය දියුණු කර ගන්නවා, සමාධිය වඩනවා, ප්‍රඥාව වඩනවා. අන්න එබඳු පුද්ගලයා අර කර්මය පරලොවට ගෙන යන්නේ නැහැ. මෙලොවම සුළු වශයෙන් ගෙවා දමලා කෙළවර කරගන්නවා.

ඔන්න ඊළඟට එනවා උපමාව. ඔන්න අර සංඝයා වහන්සේලාට ඒක පෙන්නුම් කරන්න උපමාව දෙනවා. "මහණෙනි, මොකක්ද හිතන්නේ. දැන් යම් ලුණු කැටයක් පොඩි දිය තලියක දමනවා. ඒ දිය තලියේ වතුර ඒ ලුණු කැටය නිසා ලුණු රස ගැන්වෙනවාද?" "එසේය, ස්වාමීනි" "මොකක්ද ඒකට හේතුව?" "ඒ දිය තලියේ වතුර ටිකයි." ඔන්න ඊළඟට අනික් පැත්තට දෙන උපමාව. "ඒ ප්‍රමාණයේ ලුණු කැටයම ගංගා නම් ගඟේ දිය කළාට පස්සේ ඒ දිය ලුණු රස ගැන්වෙනවාද?" "නැත ස්වාමීනි," "මොකද ඒකට හේතුව?" "අර දියකඳ ලොකුයි." අන්න ඒක නිසා තමයි අර මහග්ගත භාවයට, අප්‍රමාණ භාවයට වැඩුන සිතක් තුළ -ඒක ආශ්‍රයෙන් ප්‍රකාශ කරනවා- අර ප්‍රමාණ වශයෙන් කරන ලද පාපකර්ම ඒවා රඳන්නේ නැහැ. ඉතිරිවන්නේ නැහැ. මෙලොවම සුළු වශයෙන් පෙන්නුම් කරල දීල එතනම කෙළවර වෙනව. **ඔන්න සත්ත්වයින්ට බුදුරජාණන් වහන්සේගේ ධර්මය තුළින් තියන සැනසිල්ල,කර්මවාදය තුළින් තියන සැනසිල්ල.** මේවා බොහෝ දෙනා අවුල් කරගෙන. අර විධියට ජීවිත පරිවර්තනයක් තුළින් හොඳ මාර්ගයට පිවිසෙන්න පුළුවන් අයත් සමහරවිට අධෛර්ය වන විධියට කර්මවාදය විග්‍රහ කරන නිසයි මේක අපි ප්‍රකාශ කළේ.

ඒක එතනින් ඉවර වෙන්නේ නැහැ. තව ඊට වඩා ශක්තිමත්ව- ඔන්න ඊළඟට අපි තව දේශනයක් ඒකට එකතුකරන්න යනවා. ඒක කොටින්ම ඔන්න මෛත්‍රී චෙතොවිමුක්තිය පිළිබඳ දේශනාව. එතෙන්දී බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනවා. කෙනෙක් වරදවා වටහා ගන්න ඉඩ ඇති නිසා "මහණෙනි, මම කියන්නේ නැහැ චේතනාවක් සහිතව කරන ලද කර්ම- රැස් කරන ලද කර්ම- විපාක නොදී ගෙවෙනවා කියල. ඒක විපාක දෙන්ට ඕනෑ. නමුත් ඒ විපාක දෙන ආකාරය ඒක දිට්ඨධම්මවේදනීය වෙන්න පුළුවන්. උපපජ්ජවේදනීය වෙන්න පුළුවන්. අපරාපරියවේදනීය වෙන්න පුළුවන්. ඔන්න ඊළඟට කෙලින්ම ප්‍රකාශ කරනවා- මේ කාරණය තේරුම්ගත් ආර්ය ශ්‍රාවකයා අන්න අර කියාපු විධියට අර දස අකුසල් වලින් ඉවත් වෙලා, දසකුසල් පැත්තට වැටිලා සිත වශයෙන් බලනකොට එතෙන්දි ප්‍රකාශ කරන්නේ අන්තිමට එන අර සිත පිළිබඳ කාරණයයි. විෂමලෝභය අතහැරලා ද්වේශය අතහැරලා සම්‍යක්දෘෂ්ටිකව, එතන ඉඳලා මෛත්‍රීචෙතොවිමුක්තිය වඩන ආකාරය. එක දිසාවක් 'මෙත්තා- සහගතෙන චෙතසා එකං දිසං ඵරිත්වා විහරති'. ඔය අප්‍රමාණ අවෛරී මහගගත සිතින් එක දිසාවක් පතුරුවා වසනවා. දෙවෙනි දිසාව, තුන්වැනි දිසාව, හතරවැනි දිසාව, උඩ යට අර විධියට සීලවන්තව මේ පුද්ගලයා එහෙම වඩනවා.

ඊළඟට ඒ පුද්ගලයා කල්පනා කරන ආකාරය බුදුරජාණන් වහන්සේ දක්වනවා. 'කලින් මගේ සිත, පටුයි, පොඩියි, සුළුයි-මේ පාපකර්ම කරන කාලයේ. නමුත් දැන් මගේ සිත පුළුල්, මහත්, අප්‍රමාණයි. ඒක නිසා අර මා කළ ඒ පාපකර්ම මේ මහත්වූ සිතේ රඳන්නේ නැහැ. ඉතිරි වන්නේ නැහැ.' අන්න ඒ සැනසිල්ල ඊළඟට ප්‍රකාශ කරනවා. ඒ තුළින් බුදුරජාණන් වහන්සේ අන්න මෛත්‍රීචෙතොවිමුක්තියෙ අර කියාපු ප්‍රබල ශක්තිය- පාප කර්මවල විපාක ශක්තිය බිඳින ආකාරය- ඒ සූත්‍රයේ විශේෂයෙන්ම ඉදිරිපත් කරලා තියෙනවා. මෙතෙක් ඔය කියාපු උපමා ආදියටත් වඩා ප්‍රබල අන්දමින් ඔන්න ඊළඟට එතන බුදුරජාණන් වහන්සේ ප්‍රබල ප්‍රකාශයක් කරනවා."මහණෙනි මොකද හිතන්නේ? **යම්කිසි ළමයෙක් -'කුමාරො' කියන වචනය යොදනවා- යම්කිසි ළමයෙක් ළදරු කාලයේ ඉඳලම මෛත්‍රීචෙතොවිමුක්තිය වඩනවා නම් ඒ ළමයා පාප කර්මයක් කරයිද?"** මේ සංඝයා වහන්සේලාගෙන් අහන්නේ. "නැත ස්වාමීනි," "පාපකර්මයක් නොකරන ඔහු වෙත දුකක් එයිද?" මේ සංඝයා වහන්සේලා අහනවා "කොහොමද ස්වාමීනී පාපකර්මයක් නොකරන කෙනා වෙත දුක එන්නේ?" ඔන්න එතකොට ඒක පිළිගත්තාට පස්සෙ බුදුරජාණන් වහන්සේ කියනවා- මුළු ලෝකයටම- **මහණෙනි, ස්ත්‍රියක් විසින් හෝ පුරුෂයෙක් විසින් හෝ මෛත්‍රීචෙතොවිමුක්තිය වැඩිය යුතුයි.** ස්ත්‍රියක් විසින් හෝ පුරුෂයෙක් විසින් හෝ මේ ශරීරය අරගෙන යන්න බැහැ. මේ ශරීරය තබලා යන්න ඕනැ. නමුත් මේ ශරීරය තුළ හිතක් තිබෙනවා. **'චිත්තන්තරො'** සිතක් තිබෙනවා. ඒක තේරුම් අරගෙන ඒ සිත උපකාර කරගෙන ඒ අර කියාපු මෙත්තාචෙතොවිමුත්ති පැත්තට හරවලා මෛත්‍රීචෙතොවිමුක්තිය වඩතොත් ඒ වඩන්න ඕනැ මේ අදහසින් කියලා දක්වනවා. ඒ තැනැත්තා හිතන්න ඕනැ මම මේ මගේ කර්මානුරූපව ලැබිච්ච කයෙන් යම් කර්මයක් මේ ජීවිතය තුළ කරලා තියෙනවා නම් ඒක මෙතනම මම ගෙවලා දමනවා. මා පිටිපස්සේ යන්න දෙන්නේ නෑ කියන අදහසින්. අන්න මෛත්‍රීචෙතොවිමුක්තිය වඩනවා. ඒ වැඩීම තුළින් අන්තිමට එන්නේ - අර ඒකයි කලින් කිව්වේ - අර හක්ගෙඩියේ උපමාවේ කිව්වා වගේ අර ප්‍රමාණ වශයෙන් කරන ලද පාපකර්ම සුළු වශයෙන් ගෙවා දාල එතනම ඉවර වෙනවා. පරලොවට යන්නේ නැහැ උපපජ්ජවශයෙන් අපරාපරිය වශයෙන්. අන්න ඒ විධියේ ප්‍රබල සැනසිල්ලක් එතකොට මෛත්‍රී චෙතොවිමුක්තිය තුළ තිබෙන නිසා අර කලින් ප්‍රකාශ කළ ආකාරයට මුලින්ම අපි යෙදූ උපමා, බුදුරජාණන් වහන්සේ යෙදූ උපමා, අතිශයෝක්ති නොවන බව අපි දන්නවා. එතකොට තරුවලට වඩා චන්ද්‍රප්‍රභාව. දානාදී පින්කම් ඔක්කොම පරදවලා උපධිසම්පත්ති ගෙන දෙන- අපි මේ ලොකුවට ගන්න- ඒ දානාදී පිංකම්වලට වඩා ප්‍රබල කුසල් සිතක් මෛත්‍රීචෙතොවිමුක්තිය. ඕකයි කියන්නේ මෛත්‍රීභාවනාව අනික් ඔක්කෝම පරදවනවා කියල චෙතො විමුත්තිතත්වයෙන්. අර කියාපු

එදිනෙදා ආනිශංස පමණක් නොවෙයි අර කියාපු ප්‍රබල පාපකර්ම පවා- කෙනෙක් නිරයට ගෙනයාමට සමත් දේවල්- මෙතනම ගෙවල දමල බේරෙන්න පුළුවන්.

ඊළඟට මෙන්න මේ කාරණා සම්පිණ්ඩනය වන තවත් කෙටි දේශනා තියනවා. ඇතැම් කෙනෙක් ඒවා ගැන ප්‍රශ්න කරනවා. මේවා වෙන්න පුළුවන් දේවල්ද කියලා. නමුත් බුද්ධ වචනය හැටියට ගත්තොත් පුදුම හිතෙනවා. "මහණෙනි, යම් භික්ෂුවක් අසුරු සණක් - අසුරුසණක් කියන එක මේ පින්වතුන් දන්නවා ඇති- ඇඟිලි දෙක එකතු කරලා අර ගහන සද්දේ. අසුරුසණක් තරම් කාලයක් මෛත්‍රීසිත වඩනවා නම් යම් භික්ෂුවක්, ඒ භික්ෂුව නොසිස් ධ්‍යාන ඇතිව ජීවත්වෙනවා කියල කියන්න පුළුවන්. බුදුරජාණන් වහන්සේගේ අවවාද අනුශාසනය අනුව ජීවත්වෙනවා කියලා කියන්න පුළුවන් වෙනවා. රටුන් විසින් දෙන පිණ්ඩ ආහාරය නිෂ්ඵල නොවන ආකාරයට වළඳනවා කියල කියන්න පුළුවන්. ඊට වඩා මෛත්‍රී චිත්ත විමුක්තිය, මෛත්‍රීසිත වඩනවා නම් කියනුම කවරේද? ඒ විධියට අසුරුසණක උපමාවෙන් දෙනවා. මෛත්‍රී චේතොවිමුක්තියේ අගය, මෛත්‍රීසිතක අගය. මෛත්‍රීසිතින් මෙනෙහි කරනවා නම්, මෛත්‍රිය වඩනවා නම් ඒ වගේ වෙනවා කියලා.

ඔන්න ඊළඟට ඒ වගේම තවත් වටිනා සූත්‍ර කෙටියෙන් දක්වනවා, එක තැනක. කෙටියෙන් කියතොත් තවත් සූත්‍රයක බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනවා "මහණෙනි, යම්කෙනෙක් උදේවරුවේ බත් හැලි සියයක් දන්දෙනවා. මද්දහන වේලාවෙත් බත් හැලි සියයක් දන්දෙනවා. සවස් යාමෙත් බත්හැලි සියයක් දන් දෙනවා" මේ එක්කෙනෙක්. අනික් එක් කෙනා උදේ වරුවේ -එතන කියවෙනවා වචනයක් ගද්දූහනමත්තං- ගද්දූහනමත්තං කියන එක තෝරන්නේ දන් එළදෙනකගෙන් කිරි දොවන කොට තණපුඩුව අදින සුලු වෙලාවක් තියනවා නේ ඒකෙ තියන කිරි ඇදෙන්න. අන්න ඒ සා සුලු වෙලාවක් මෛත්‍රීසිත වඩනවා නම් උදේ වරුවේ, මද්දහන වෙලාවේ ඒ තරම් සුලු වෙලාවක් මෛත්‍රී සිත වඩනවා නම්, සවස්වරුවේ ඒ තරම් සුලුවෙලාවක් මෛත්‍රීචෙතො විමුක්ති තත්ත්වයෙන් සිත වඩනවා නම්, ඒ දෙන්නාගෙන් අර දෙවෙනු කී එක්කෙනා අර සියලු කුසලයට අර දානාදී වශයෙන් ඇතිකරගන්නා කුසලයට වඩා ප්‍රබල කුසලයක් ඇතිකර ගන්නවා කියලා බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කළා. ඊට වඩා මෛත්‍රිය වඩනවා නම් කොහොමට ඇද්ද කියලා එහෙම එතන පෙන්නුම් කරනවා.- 'ගද්දූහනමත්තං' ඉතින් එතකොට අර බත්හැලි තුන්සියයක් දන් දෙනවාටත් වඩා අර තරම් සුළු කාලයක් මෛත්‍රී චෙතොවිමුක්ති තත්ත්වයෙන් සිත පැවැත්වීම, ලෝකයාට මෙත් වැඩීම, ප්‍රබල පිංකමක් බවයි එතනින් ප්‍රකාශ වෙන්නේ.

තවත් ඒ වගේ සූත්‍රයක් තියනවා හෙල්ලක උපමාවකින්. මහණෙනි හෙල්ලක් තියෙනවා තුඩ ඉතාමත් තියුණුයි. තියුණු තුඩ ඇති හෙල්ලක් තියෙනවා.

පුරුෂයෙක් එනවා මම මේ හෙල්ල-දැන් මේ කාලයේ දන්නවා නේ ඔය අභියෝග කරනවා- අභියෝග කරන පුරුෂයෙක් එනවා. 'මම මේ හෙල්ලේ තුඩ මොට කරනවා මේ අල්ලෙන්, එහෙම නැත්නම් මිටෙන්. මේ හෙල්ලේ තුඩ මොට කරනවා, මේක නමනවා අඹරනවා' කියලා. "මහණෙනි ඒක එයාට කරන්න පුළුවන් එකක්ද?" "නැත ස්වාමීනි," මොකද ඒ හෙල්ලේ තුඩ බොහොම සියුම්. අර පුද්ගලයා කරන්නේ අත තුවාල කරගන්න එක විතරයි. දුකට පත්වෙනවා පමණයි. අන්න එසේම මහණෙනි, යම් කෙනෙක් ඒ ප්‍රබල මෛත්‍රීචෙතොවිමුක්තියෙන් සිත ශක්තිමත් කරගෙන තිබෙනවා නම්, යම් අමනුෂ්‍යයෙක් එතොත් ඒ තැනැත්තාගේ හිත වික්ෂිප්ත කරන්න, ඒ අමනුෂ්‍යයාගේ ප්‍රයත්නය, උත්සාහය, නිෂ්ඵල වෙනවා. අන්න අර තියුණු හෙල්ලේ තුඩ මොට කරන්න ගිය පුද්ගලයාගේ වගේ. අන්න ඒ තරමට එතකොට මෛත්‍රීයේ ආනිශංස බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරලා තියනවා. මෛත්‍රී චෙතොවිමුක්තිය පිළිබඳව. අපි මේ පැයක් තුළ මේ ඔක්කොම කියන්න ඕනෑ නිසා බොහොම වේගයෙන් කිව්වේ. මේ පිංවතුන්ට ඒ පමණකින් ඒ මූලික කරුණු ටික කියනවා.

දැන් බොහෝ දෙනා අහන එකක් තමයි මේ ප්‍රායෝගික පැත්ත. ඒකට දැනටමත් යමක් කියවිලා තියෙනවා. මෛත්‍රිය වැඩීම අපි තේරුම් ගන්න ඕන. නා නා විධ භාවනා ක්‍රම තිබෙනවා. ඒවා කරපු කට්ටිය අප ළඟට එනවා. කිසිසේත් හිතන්න නරකයි ඒවා අපතේ ගියයි කියලා. ඒ කරපු දේවල යම් යම් ප්‍රමාණයට ආනිශංස තිබෙනවා. කොයි විදියට කළත්. විශේෂයෙන්ම තමන්ගේ හිතට එකඟව- නිකන් ආවට ගියාට නොවේ. කවුරුවත් කිව්වට පොතේ තිබෙනවාට නොවේ. අවංකවම ඒ විධියට කළා නම්. නමුත් අන්න අර සරලව වැඩීම වැදගත් බව අපට පේන්නේ මෙතන විශේෂයෙන් කියවුනා නේ අර කුඩා දරුවෙක්, පොඩි ළමයෙක්, ලාබාල කාලයේ ඉඳලා මෛත්‍රීචෙතොවිමුක්තිය වඩන්නේ කොහොමද? අර විධියට සංකීර්ණ ක්‍රමයකින්ද? ඉතාම සරලව වඩන්න පුළුවන්. අර විධියට 'සුවපත් වේවා' කියන වචනය පොඩි එකාට පුරුදු කළොත්, හතර දිසාවට වඩන්න. හතර දිසාව ගැන දැන ගන්න, මනින්න, යන්න ඕන නැහැ. මේ කාලයේ ලෝකයා ඔය ගෝලීය කරණයට ගියා වගේ. කෙනෙකුට සලකගන්න පුළුවන්. අපට පෙනෙන දේවලට වඩා නොපෙනෙන දේවල් තිබෙනවා. ඉතින් ඒ දිශා වශයෙන් පතුරුවා හරින විට අර විධියට සීමාවක් නැතිව, අසීමිත ලෙස, පිට සක්වලවල් තිබෙනවා නම්, ලෝක තියෙනවා නම්, විශ්ව තියෙනවා නම් ඕනෑම දිශාවකට යන්න කියලා අර ආලෝකය විහිදුවන්නා වගේ පොඩිදරුවට පුරුදු කළොත් අන්න අර පොඩිකාලේ ඉඳලම ඒ දරුවා එහෙම කරනව නම්, පාපකර්ම වලට යොමුවන්නේ නැති බවයි බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරන්නේ. ඉතින් ඒක අනුව අපි සරල ක්‍රමයේ ආනිශංස තේරුම් ගන්න ඕන. ඒක

එදිනෙදා ජීවිතයේ. හැබැයි ඒ වචනය අර්ථවත්ව කරන එකයි මෙතන වැදගත් වන්නේ. මේ මෛත්‍රීචෙතොවිමුක්තිය පමණක් නොවේ අපි මේ මෛත්‍රිය ගැන විශේෂයෙන් කියන නිසා අර ඒ චෙතොවිමුක්ති ගැන කියන හැම අවස්ථාවකම බුදුරජාණන්වහන්සේ ඒ හා සමානව ආනිශංස තිබෙනවා කියල ප්‍රකාශ කරනවා මේ කාලයේ වැඩිදෙනා නොදන්න, වැඩිදෙනා පුරුදු නොකරන, කරුණා චෙතොවිමුක්තිය මුදිතාචෙතොවිමුක්තිය උපෙක්ඛා චෙතොවිමුක්තිය. චෙතොවිමුක්ති හතරක් තිබෙනවා.

එතකොට මෛත්‍රී සිත මුළු ලෝකයට පතුරුවනවා වගේ තමයි කරුණා සිතත් මුළු ලෝකයේම පැතිරීම. ඒකෙත් අර වගේම ආනිශංස. කරුණාව කියන එක දන්නවා නේ? මෛත්‍රිය සාමාන්‍යයෙන් පොදුවේ කාට කාටත්. කරුණාව කියන එක විශේෂයෙන්ම දුකට පත් වූ අයට. දුකට පත්වූවකු ආශ්‍රයකරගෙන ඒ ආශ්‍රයෙන් අර හිතුවිලි පැතිරවීමයි. ඊළඟට මුදිතාව කියලා කියන්නේ අන්න අර ඊර්ෂ්‍යාව වෙනුවට. ලෝකයේ පැතිරෙන්නේ ඊර්ෂ්‍යාවයි. ඒ වෙනුවට හදවතින්ම සතුටුවෙනව. කෙනෙකුට ලැබිච්ච සතුටු විය හැකි අන්දමේ ජයග්‍රහණයක් හරි, හොඳ දෙයක් හරි, දියුණු වීමක් හරි ඇතිවුනා නම්, ඒ තැනැත්තා අරමුණු කරගෙන අර මුදිතාව වඩනවා- ඊර්ෂ්‍යාව ඉවත් කරලා. අනේ කොයි තරම් හොඳද? තමන්ට ලැබුන ලාභයක් හැටියට සලකලා. ඒ සිත ඒ විධියටම වැඩුවොත් මුළු ලෝකය පුරා මුදිතාව- අන්න එතකොට මුදිතා චෙතොවිමුක්තිය ඒ හැම එකක් පිළිබඳව 'මුදිතා සහගතෙන.' 'මෙත්තාසහගතෙන' මෛත්‍රී සහගත සිතක් තියෙන්න ඕනෑ. 'කරුණාසහගතෙන' කරුණාසහගත සිතක් මුදිතා සහගතසිතක්. ඊළඟට උපෙක්ඛාසහගත සිතක්. වැඩිහිටියෙකුට තමන්ගේ දරුවන් පිළිබඳව තියෙන්නා වගේ මුළු ලෝකය දිහා බලනකොට අවස්ථානුකූලව උපේක්ෂාවශයෙන්. ඒක ඉතාම ගැඹුරු ගුණයක් කෙනෙකුට සාමාන්‍යයෙන් සලකාගන්න බැරි. අර ඔක්කොම ගුණවලින් පෝෂණය වෙලා අවසානයේ පදම් වුන සිත තමා උපේක්ෂා සිත. ඒකයි මෛත්‍රී කරුණා මුදිතා උපේක්ෂා සතර බ්‍රහ්මවිහරණය. මේ පින්වතුන් කවුරුත් අහල තියනවා.

බ්‍රහ්මවිහරණය කියල කිව්වට අන්න අර කියාපු සිල්ලර වශයෙන් ඒවා වැඩීමයි සාමාන්‍යයෙන් අපි අදහස් කරන්නේ. මෙතන අන්න ඉහළම මට්ටමින් අපරිමාණ වශයෙන් 'විපුලෙන මහග්ගතෙන අප්පමාණෙන' ඔය ආදී වචන සඳහන් වෙනවා. විපුල මහග්ගත අප්‍රමාණ මට්ටමින් වැඩීමේ ආනිශංස පක්ෂය ලෝකයාට කෙසේ වෙතත් තම තමන්ට මේ තරමින් තියනවා කියා කෙනෙක් හිතාගත්තොත් අන්න එතකොට ධර්මයේ වටිනාකම තේරුම් ගන්න පුළුවන් වෙනවා. අර තරම් බරපතළ කර්මවල විපාක බිඳලා, අර අමනුෂ්‍ය උපද්‍රවත් බිඳලා, ඒ විධියට තමන්ගේ ජීවිතය සකසාගන්න උපකාර වන නිසා බුද්ධ වචනය අනුව මේවායේ අගය අපි තේරුම් ගන්නවා නම්, ඒ

තුළින් අර අපි බලාපොරොත්තු වන සමාජයේ අනිකුත් ප්‍රශ්න සමහරවිට බොහෝ දුරට සමනය කර ගන්න පුළුවන්.

ඉතින් ඒ වගේම මේ මෛත්‍රී භාවනාව ගැන තවදුරටත් කියනවා නම් අර එක වචනයක්-ඒවගේම ඉරියව් වශයෙන් මෙතන ප්‍රකාශ කළා නේ ඒ ඒ ඉරියව්වලදී. මෙතන ප්‍රකාශ කළා නේ නින්දයනතුරුත් පුළුවන් කියලා. අර හිත වැඩීමේදී කල්පනාකාරී වන්න ඕනෑ. ඒක නිකම් මන්ත්‍රයක් හැටියට නොවේ. හදවතට අනුව ඒ වචනය ඇත්ත වශයෙන්ම. ඒකටයි අර උපමාව දීලා තියෙන්නේ බුදුරජාණන් වහන්සේ. 'මාතා යථා නියං පුත්තං - ආයුසා එක පුත්තමනුරක්ඛෙ' බලන්න ඒ සූත්‍රයේ කොයි තරම් පුදුම විධියට සංග්‍රහවෙලා තියනවද? කාරණා ඔක්කොම ප්‍රකාශ කරලා ඉවරවෙලා, තර්කානුකූලව තේරුම් ගන්න පුළුවන් ආකාරයට ප්‍රකාශකරලා, ඊළඟට භාවමය වශයෙන් හදවතට එකතුවන අන්දමේ උපමාවක් යෙදිලා තියෙන්නේ. ඒ ටික ඔක්කොම ඒ මෛත්‍රී සූත්‍රයේ පදාර්ථ රාශිය- දන් විටමින් ගැන කියන කොට පදාර්ථ කියන්නේ වෙන අර්ථයකින්. නමුත් අපි හිතමු මෙහෙම- 'සුවපත් වේවා' කියන විටමින් පෙත්තට දාගත්තට පස්සේ තමන්ට ප්‍රශ්නයක් නෑ කවුරු ඇහුවත්. වෙන අය නම් මෛත්‍රිය වඩන්න හුඟාක් වචන පාවිච්චි කරනවා. වෙන අය නම් මෛත්‍රිය වඩන්නේ තමන්ගෙන් පටන් ගෙන ඉස්සරවෙලා ටික කලක් ඒක කරලා, හිතවතෙක් අල්ලගෙන එයාට කරලා, ඊළඟට මැදහතෙක් අල්ලගෙන එයාට කරලා, පස්සේ විරුද්ධකාරයට කරනවා. ඔන්න ඔහොම ක්‍රමයක්. ඒ වැටකඩුළු අවශ්‍ය නැහැ, මේක ශක්තිමත් කර ගන්න නම්. අර පොඩිළමයාට අරවා කියන්න ගියොත් එහෙම තරහකාරයා ගැන හිතන්න කියලා මහා පටලැවිල්ලක් වෙනවා. ඒකයි අපි කියන්නේ කල්යාමේදී මේවා සංකීර්ණත්වයට පත්වෙලා මේ භාවනා ක්‍රම. ඒ තුළින් ප්‍රායෝගික වශයෙන් අපේ ජීවිතයෙන් ඈත්වන ගතියක් තිබෙනවා. ඒකයි මේ ඒක සුළුවශයෙන් සලකන්නේ නැතිව, මේ එක වචනය හෝ වේවා කමටහන කෙටිවීම තුළින් අපට වැඩි කාලයක් ඒ වෙනුවෙන් අර කියාපු 'ආසේවිතාය භාවිතාය, බහුලීකතාය' බහුල වශයෙන් 'යානිකතාය, වත්‍ථුකතාය' වශයෙන් කරන්න අපට අවස්ථාව සැලසෙනවා. එතකොට ඒ විධියට අපි පුරුදු කරනවා නම් මේක අර සමාජය වශයෙන් වගේම තමන්ටත් තමන්ගේ අර කර්ම වේග ගෙවාදැමීමටත්. එදිනෙදා ජීවිතයේ අසහනකාරී නානාවිධ පීඩාවලින් පෙළිල සිටින අයට- ඒ වගේම කවුරුත් අහලා තියනවා රෝග ආදියෙදි පවා මෛත්‍රී භාවනාව උපකාර වන බව දන් කාලේ. ඒ නමුත් ඒ ගුප්ත බලයක් නිසා නොවෙයි. මේක ස්වාභාවික වශයෙන් බුදුරජාණන් වහන්සේ දක්වන්නේ කර්ම වේග පවා ගෙවා දැමීමට ශක්තිමත් හැකියාවක් ඇති පුදුම චිත්ත තත්ත්වයක් බවයි.

අතීතයේ බුද්ධධර්මය පහළවීමට කලින් ඒ සෘෂිවරු ඔය සතර බ්‍රහ්ම විහරණ වඩලා තමයි. බ්‍රහ්මලෝකවල උපන්නේ. බුදුරජාණන් වහන්සේගේ මේ ධර්මය ඉදිරිපත් කිරීමේදී මෛත්‍රීභාවනාව ඊට වඩා ශ්‍රේෂ්ඨ වන්නේ මොකද, ඒක නිවනට නැඹුරු කරලා වැඩීම තුළින් අන්න අනාගාමී තත්ත්වය පමණක් නොවේ තවත් ඕනනම් මෙලොවම ඒ මෛත්‍රීචෙතොවිමුක්තිය ඒ ධ්‍යානය පාදක කරගෙන විදර්ශනා වඩලා අර සත්ත්ව සංඥාව ඉවත් කරලා මේක සංස්කාර වශයෙන් සලකලා උතුම් අර්හත්වයෙන් මුළු සංසාර දුක කෙළවර කරගන්න පුළුවන් මෙලොව වශයෙන්. ඒ ටික බැරි වුනොත් පමණයි අනාගාමී වෙලා බ්‍රහ්මලෝකයට යන්නේ. එතකොට අතීතයේ ඒ වැඩූ සෘෂිවරුන් එපමණකින් පවා කල්පගණන් බ්‍රහ්මලෝකවල ජීවත්වන්න පුළුවන් විධියේ තත්ත්වයක් ඒ චෙතොවිමුක්තිය තුළින් ඇතිකරගත්තා. ඒක අතීතයේ ඉඳලා පැවතුන එකක්.

මෙතනදී බුදුරජාණන්වහන්සේ ඒකට එකතු කළා බොජ්ඣඞ්ග ආදී වශයෙන් වැඩීමත්. බුදුරජාණන් වහන්සේ දක්වලා තිබෙනවා. "මෙත්තා සහගතං සතිසම්බොජ්ඣඞ්ගං භාවෙති විවෙක නිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිණාමිං. මෙත්තාසහගතං ධම්මවිචය සම්බොජ්ඣංගං භාවෙති" ආදී වශයෙන් බොජ්ඣංග භාවනාවත් මෛත්‍රිය කර්මස්ථානය තුළින්ම කරන්න පුළුවන් බවත්. ඒ විධියට වැඩීමෙන් බෝධිපාක්ෂික ධර්මත් මෛත්‍රී භාවනාව තුළින් මතුකරගෙන අර මාර්ගඵල අවබෝධයෙන් උතුම් අමාමහනිවන් දක්වාම මෛත්‍රීචෙතොවිමුක්තිය පාදකකරගෙන ඒ උතුම් නිර්වාණ ධර්මය සාක්ෂාත් කරන ආකාරයක් බුදුරජාණන් වහන්සේගේ ධර්මයේ ප්‍රකාශකරලා තියෙනවා. එතකොට අන්න ඒ තරම් වටිනා භාවනාවක් මෛත්‍රීභාවනාව කියලා කියන්නේ.

දැන් ඒක ගැන අපි කවුරුත් කතා කරන නිසා ඒක අවතක්සේරුවකට ලක්වෙලා කියන්න පුළුවන් තරමට කවුරුත් ඒක සුළු දෙයක් හැටියට සලකනවා. දැන් මෙතනින් පෙනෙනවා ඒක ඉතාමත්ම ප්‍රබල දෙයක් බව. ප්‍රබල ශක්තියක් ඇති භාවනාවක් බව.

ඉතින් මේ පිංවතුන් අද වගේ වටිනා දවසක ගෙදරදොර වලින් ඉවත් වෙලා වටිනා සීලයක් සමාදන්වෙලා අද දවස සතියෙන් සම්පජඤ්ඤයෙන් යුක්තව තම තමන්ගේ කටයුතු කරමින් භාවනාව කරමින් අද මේ අවස්ථාවේ ඇසූ ධර්ම දේශනයත් උපකාර කරගෙන මේ කියාපු ධර්ම මාර්ගයේ යමින් තමන්ගේ ජීවිතත් සාර්ථක කරගනිමින් ලෝකයාටත් අර කියාපු විධියට මෛත්‍රීචෙතොවිමුක්තිය තුළින් සහනයක් සලසන්න ශක්තිමත් වේවා කියා ප්‍රාර්ථනා කරනවා. මෙතෙක් මේ තමන් රකින ලද සීලය, කරන ලද භාවනාව, අසන්න ලැබුණ බණ, උපකාර කරගනිමින් හැකිතාක් ඉක්මණින් සෝවාන් සකදාගාමී අනාගාමී අර්හත් කියන මාර්ගඵල ප්‍රතිවේධයෙන් උතුම් අමා මහ නිවනින් මේ සංසාර දුක කෙළවර කරගන්න මේ පිංවතුන්ට ශක්තිය

බලය ලැබේවා කියා ප්‍රාර්ථනා කරන අතර අවීචියේ සිට අකනිටාව දක්වා වූ යම්තාක් සත්ත්ව කෙනෙක් ධර්ම ශ්‍රවණමය ධර්ම දේශනාමය කුසලය අනුමෝදන්වීමට කැමතිනම් ඒ අනුමෝදන්වීම තුළින් තමන්ගේ ප්‍රාර්ථනීය බෝධියකින් උතුම් අමා මහ නිවන් සාක්ෂාත් කරගනිත්වා කියා ප්‍රාර්ථනා කරගෙන ඊළඟට මේ ගාථා කියන්න.

'එත්තාවතා ච අමෙහහි......'

**02**

පහන් කණුව ධර්ම දේශනා අංක 148

# නමො තසස භගවතො අරහතො සමමා සමබුඬසස

**ආනාපානසතී යසස - පරිපුණණා සුභාවිතා**
**අනුපුබබං පරිචිතා - යථා බුදෙධන දෙසිතා**
**සොමං ලොකං පභාසෙති - අබභා මුතෙතාව චනදිමා**

**-ථෙරගාථා, මහකපපිනථෙරගාථා-**

සැදැහැවත් පින්වතුනි,

මහා කප්පින මහරහතන් වහන්සේ කියන්නේ බුදුරජාණන් වහන්සේගේ අසූමහාශ්‍රාවකයින් වහන්සේලා අතරට ගැනෙන ශ්‍රේෂ්ඨ ස්වාමීන් වහන්සේ නමක්. භික්ෂූන් වහන්සේලාට අවවාද දීමේ සමත් භික්ෂූන් අතර එතදග්ග තනතුර බුදුරජාණන් වහන්සේගෙන් ලබා ගත්තු කෙනෙක්. උන්වහන්සේ භික්ෂුණීන් වහන්සේලාට අවවාද දුන්න අවස්ථාවක ප්‍රකාශ කළ ආනාපානසතිය පිළිබඳ වර්ණනාත්මක ගාථාවක් තමයි අපි මේ මාතෘකා හැටියට අද ඉදිරිපත් කළේ.

මේ කියාපු එතදග්ග තනතුර බලාපොරොත්තුවෙන් දීර්ඝ කාලයක් අතීත බුද්ධ ශාසනවල පාරමී ධර්ම පිරූ කෙනෙක් හැටියට මහා පින්වන්ත කෙනෙක් හැටියට, මහාකප්පින රහතන් වහන්සේ ගැන පොත පතේ සඳහන් වෙනවා. බුද්ධකාලයේදී කුක්කුට කියන නගරයේ රජ පවුලක ඉපදිලා කප්පින නමින් රජවෙලා ඉන්න අතරේ සැවැත් නුවරින් පැමිණි වෙළඳ පිරිසකගෙන් බුදු රජාණන් වහන්සේ පහළවෙච්ච ප්‍රවෘත්තිය අහලා ඇතිවුන ශ්‍රද්ධාව පිට දහසක් අමාත්‍යවරුන් සමඟ පිටත් වෙලා බුදුරජාණන් වහන්සේ හමුවන්න ගිහිල්ලා. 'එහි භික්ෂු' භාවයෙන් පැවිද්ද ලැබූ බවත්, ඊළඟට ඒ දේශනා අහලා ඉක්මණින්ම රහත්වූ බවත් පොත පතේ සඳහන් වෙනවා.

එහෙම රහත්වෙලා මහා කප්පින මහරහතන් වහන්සේ වැඩිකාලයක් ගතකළේ විවේක සුවයෙන්, ධ්‍යාන ඵලසමාපත්ති සුවයෙන්. ඒකට කියනවා. "දිට්ඨ ධම්මසුඛවිහරණ" කියලා. ඒ විදියට කාලය ගතකළ බවක් සඳහන් වෙනවා. එක ප්‍රවෘත්තියකින් කියවෙනවා උන්වහන්සේ විවේක ස්ථානයේ ඉන්න අතරේ 'අහෝ සුඛං' 'අහෝ සුඛං!- එකේ අදහස 'අනේ කොයිතරම් සැපතක්ද! අනේ කොයිතරම් සැපතක්ද!- කියන ඒ වචන ප්‍රකාශ කරනවා. ඒක අහලා සංඝයා වහන්සේලා හිතුවා මේ පැරණි රජකම ගැන

හිතලා මේ විධියට කියනවා කියලා. බුදුරජාණන් වහන්සේ ළඟට ගිහිල්ලා පැමිණිලිකළා මේ සිද්ධිය. බුදුරජාණන් වහන්සේ කප්පින මහ රහතන් වහන්සේ කැඳවලා අහනවා 'සැබෑද කප්පින ඔබ අහෝ සුඛං අහෝ සුඛං කියලා කියන්නේ?' එතකොට ඒ කප්පින ස්වාමීන් වහන්සේ කිව්වා එසේ කියන්නේ මොකද කියා භාගවතුන් වහන්සේම දන්නවා කියලා. බුදුරජාණන් වහන්සේ සංඝයා වහන්සේලාට කිව්වා "නැහැ. මගේ පුත්‍ර කප්පින රජසුව කාමසුව ගැන හිතලා නොවෙයි ඒ කියන්නේ තමන් ලබාගත්තු අර්හත් ඵලය- ඒ සුවය- ප්‍රකාශ කරමිනුයි ඒ 'අහෝ සුඛං' කියන්නේ" කියල ධම්මපදයේ එන එක්තරා 'ධම්මපීති සුඛං සෙති' ආදී ගාථාවත් වදාළා. ඒ එක අවස්ථාවක්.

තවත් අවස්ථාවකදී බුදුරජාණන් වහන්සේ සැවැත් නුවර වැඩවාසය කරන වෙලාවක මහාකප්පින මහරහතන් වහන්සේ බුදුරජාණන් වහන්සේට ටිකක් ඈතින් සමාධියෙන් වැඩසිටිනවා. බුදුරජාණන් වහන්සේ මේක දකලා සංඝයා වහන්සේලාගෙන් අහනවා 'මහණෙනි, අර භික්ෂුවගේ සිරුරේ සෙලවීමක්, සසලවීමක් දකින්න ලැබෙනවාද? එතකොට මේ සංඝයා වහන්සේලා කියනවා භාග්‍යවතුන් වහන්ස ඒ ආයුෂ්මතුන් වහන්සේ සංඝයා මැද හිටියත්, තනිව භාවනාවේ වැඩ හුන්නත්, උන්වහන්සේගේ ශරීරයේ සසලවීමක් සෙලවීමක් අපිට දකින්න ලැබෙන්නේ නැහැ. ඔන්න එතකොට බුදුරජාණන් වහන්සේ කියනවා යම් සමාධියක් හරියාකාර වැඩීම තුළින්, පරිපූර්ණ වශයෙන් වැඩීම තුළින්, කෙනෙකුගේ අන්න ඒ විධියේ සමාධියෙන් වැඩ ඉන්නකොට සසලවීමක් නැද්ද, අන්න ඒ සමාධිය මේ භික්ෂුව විසින් ඉතාමත්ම පහසුවෙන් ලබා ගන්න පුළුවන් තත්ත්වයට පුරුදු කරලා තියෙනවා. ඊළඟට කවර සමාධියක්ද කියලා ඔන්න ඊළඟට බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනවා ආනාපානසති සමාධියයි කියලා. ඒ එක්කම ආනාපානසති සමාධිය පියවර දහසයකින් යුක්තව එතන දක්වනවා.

ඊළඟට තවත් ප්‍රවෘත්තියක් සඳහන් වෙනවා බුදුරජාණන් වහන්සේ එක් අවස්ථාවක මහාකප්පින මහරහතන් වහන්සේගේ ගෝල පිරිසගෙන් අහනවා 'කොහොමද මහණෙනි, මහාකප්පින භික්ෂුව ඔය නමලට අවවාද උපදෙස් එහෙම දෙනවාද' කියලා. එතකොට ඒ සංඝයා වහන්සේලා කියනවා 'මහාකප්පින මහරහතන් වහන්සේ නිරන්තරයෙන්ම දිට්ඨධම්මසුඛවිහරණයෙන් විවේකීව වැඩ ඉන්නවා මිසක් අපට අවවාද මාත්‍රයක්වත් දෙන්නේ නැහැ.' ඔන්න එතකොට බුදුරජාණන් වහන්සේ මහා කප්පින මහරහතන් වහන්සේ 'කැඳවලා සැබෑද කප්පින තමන්ගේ ගෝල භික්ෂූන්ට කිසි අවවාදයක්වත් දෙන්නේ නැද්ද?' 'එසේය ස්වාමීනී' කියලා කිව්වා එතකොට බුදුරජාණන් වහන්සේ කියනවා- දන් වැරැද්දක් කළ සාමාන්‍ය කෙනෙකුට බුදුරජාණන් වහන්සේ 'මොඝ පුරිස' ආදී වචන පාවිච්චි කරන්නේ - නමුත් රහතන්

වහන්සේලාට එහෙම ආමන්ත්‍රණය කරන්නේ නැහැ. 'බ්‍රාහ්මණය, එහෙම කරන්න එපා. තමන් ළඟට එන අයට ධර්මය දේශනා කරන්න.' කියලා බුදුරජාණන් වහන්සේ කීවා. 'එසේය ස්වාමීනි' කියලා පිළිගත්තා.

ඊට පසුව මහා කප්පින මහරහතන් වහන්සේ අවවාද දීමේ කෙතරම් දක්ෂද කියන එක දක්වන්නේ එක අවවාදයෙන්ම දහසක් නමක් රහත් බවට පැමිණෙව්වායි කියනවා. ඒ දක්ෂකම නිසා බුදුරජාණන් වහන්සේ භික්ෂූන් වහන්සේලාට අවවාද දීමෙහි දක්ෂ අය අතර එතදග්ග තනතුර මහා කප්පින මහරහතන් වහන්සේට දී වදාළ බවත් පොතපතේ කියවෙනවා. එතකොට ඒ භික්ෂූන් වහන්සේලාට අවවාද දීම. විටින් විට පැවරෙන වගකීමක් තමයි භික්ෂුණීන් වහන්සේලාටත් අවවාද දීම. ඉතින් මේ කප්පින මහරහතන් වහන්සේ එක් අවස්ථාවක භික්ෂුණීන් වහන්සේලාට අවවාද වශයෙන් ප්‍රකාශ කළ ගාථා අතර දකින්න ලැබෙන ගාථාවක් තමයි අද අපි මේ මාතෘකා කරගත්තේ.

"ආනාපානසතී යස්ස පරිපුණ්ණා සුභාවිතා" යම් කෙනෙකු විසින් ආනාපාන සතිය පරිපූර්ණ වශයෙන් වඩන ලද්දේද "අනුපුබ්බං පරිචිතා යථා බුද්ධෙන දෙසිතා" බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කළ ආකාරයට අනුපිළිවෙලින් පුරුදු කරන ලද්දේද "සො මං ලොකං පභාසෙති- අබ්භාමුත්තොව චන්දිමා" "ඒ භික්ෂුව, ඒ තැනැත්තා, කළුවළාකුලින් මැත්වුනු සඳමඬල වගේ මේ ලෝකය ආලෝකවත් කරනවා." ඒකයි ඒ ගාථාවේ අදහස.

දැන් එතකොට ඒ මහාකප්පින මහරහතන් වහන්සේගේ ජීවිත කථාන්තර ගැන කියනවාට වඩා අපට වැදගත් වෙනවා උන්වහන්සේ ආදර්ශයෙනුත් අවවාදයෙනුත් ලෝකයාට දක්වූ ආනපානසතිය පිළිබඳව, ඒකේ වැදගත්කම ගැන යමක් කීම. මොකද, මේ යුගයේ බොහෝදෙනා ඇත්ත වශයෙන් අපෙනුත් ඉල්ලා සිටිනවා මේ භාවනාවට අදාළ උපදෙස් යම් යම් ප්‍රමාණයට අපගෙන් ලැබෙනවා නම් හොඳයි කියලා. ඉතින් මේ ධර්ම දේශනාව ඒකට අපි උපකාර කරගන්න අදහස් කළා.

දැන් එතකොට ආනාපානසතිය පිළිබඳව බුදුරජාණන් වහන්සේ ඒ ඒ සූත්‍ර දේශනාවල නොයෙකුත් විදියට ඒ ආනාපානසතිය වඩන ආකාරයත් එහි ආනිශංසත් ප්‍රකාශ කරලා තියෙනවා. ප්‍රධාන වශයෙන් සැලකිය හැකියි මැදුම් සඟියේ තියෙන ආනාපානසති සූත්‍රය. ඒකෙදි බුදුරජාණන් වහන්සේ ඒකේ ආනිශංස පක්ෂයත් පෙන්නුම් කරමින් මෙන්න මෙහෙම සඳහන් කරනවා. "මහණෙනි, ආනාපානසති භාවනාව වඩන ලද්දේ, පුරුදු කරන ලද්දේ, මහත්ඵල මහානිසංසයි. කෙසේ වඩන ලද්දේද කියලා ඊළඟට විස්තර ප්‍රකාශ කරනවා. දහසය ආකාරයකට- පියවර දහසයකින්. නමුත් දැන් බොහෝ දෙනාට ආනාපානසති භාවනාව ගැන දැනගන්න ලැබෙන්නේ මහාසතිපට්ඨාන සූත්‍රයෙන්.

සතිපට්ඨාන සූත්‍රය බෞද්ධ පින්වතුන් කවුරුත් බොහොම ආදරයෙන් පරිහරණය කරන සූත්‍රයක්. ඒ සූත්‍රයේ අර කියාපු පියවර දහසයෙන් හතරක් දක්වෙනවා. මොකද, මේ දහසය ඇත්ත වශයෙන් කියනවා නම් ඒ ආනාපානසති සූත්‍රය ආදියේ දක්වන්නේ දහසය හතරේ ඒවායින් බෙදිලා යනවා සතර සතිපට්ඨාන යට. ආනාපානසති සූත්‍රයේ ප්‍රකාශ කරනවා බුදුරජාණන් වහන්සේ මහණෙනි, ආනාපානසති භාවනාව වඩනලද කල්හි පරිපූර්ණ වශයෙන් පුරුදු කරන ලද කල්හි ඒ භාවනාව ගිහිල්ලා සතරසතිපට්ඨානය සම්පූර්ණ කරනවාය, ඒ සතර සතිපට්ඨානය හරියාකාරව වඩනකොට, බහුලවශයෙන් කරන කොට, ඒක ගිහිල්ලා බොජ්ඣංග ධර්ම හත සම්පූර්ණ කරනවාය. බොජ්ඣංග ධර්ම හත සම්පූර්ණ වෙනකොට විජ්ජා, විමුත්ති කියල කියන මාර්ග ඥාණ මාර්ගඵල ආදිය මතුවෙනවාය. ධ්‍යාන අභිඥා ආදිය මතුවෙනවා කියලා. අන්න ආනාපානසතිය දුර යන හැටි එතැන බුදුරජාණන් වහන්සේ පෙන්නුම් කරනවා, ආනාපානසති සූත්‍රයේම. අර හතර බෙදිලා යනවා කායානුපස්සනා, වේදනානුපස්සනා, චිත්තානුපස්සනා, ධම්මානුපස්සනා කියලා. ඒ දහසය හැදෙන්නේ එහෙමයි. අන්න ඒකයි බුදුරජාණන් වහන්සේ මෙතන ප්‍රකාශ කළේ ආනාපානසතිය හරියාකාරව පරිපූර්ණ වශයෙන් වඩනකොට ඒක සතරසතිපට්ඨාන ධර්මයන් සම්පූර්ණ කරනවා. සතර සතිපට්ඨාන ධර්මයන් සම්පූර්ණ වෙනකොට සත්තබොජ්ඣංග ධර්මයන් සම්පූර්ණ කරනවා. ඒකෙන් ඊළඟට විජ්ජා විමුත්ති කියලා කියන මේ ශාසනයේ උතුම්වූ පරමාර්ථ සාක්ෂාත් කරගන්න පුළුවන් කියලා.

ඔන්න ඊළඟට අපි අර සතිපට්ඨාන සූත්‍රයේ වඩාත් සවිස්තරව ආනාපානසතිය කායානුපස්සනාවට ගැලපෙන හැටියට එතන කියවෙන නිසා ඒක එතන බුදුරජාණන් වහන්සේ දක්වන වාක්‍යය අපි පදයෙන් පදය තේරුම් කරන්න බලමු.

"ඉධ භික්ඛවෙ භික්ඛු අරඤ්ඤගතො වා රුක්ඛමූලගතො වා සුඤ්ඤාගාරගතො වා නිසීදති පල්ලඞ්කං ආභුජිත්වා උජුං කායං පණිධාය පරිමුඛං සතිං උපට්ඨපෙත්වා" කියන වචන කීපයක් එතන සඳහන් වෙනවා - පද කීපයක් - ආනාපාන සතිය කරන ආකාරය, මූලිකව ඒකට අවශ්‍ය උපදෙස් කීපයක් එතන කියවෙනවා. "මෙහිලා මහණෙනි, භික්ෂුවක්- ඔන්න ඊළඟට කොයි භාවනාව ගැනත් කියවෙන එකක් තමයි - "අරඤ්ඤගතො වා රුක්ඛමූලගතො වා, සුඤ්ඤාගාරගතො වා" ආරණ්‍යයකට නැත්නම් ගහක්මුලකට එහෙම නැත්නම් පාලුගෙයකට ගියේ, ඒ කියන්නේ විවේකීව. විවේකී පරිසරයක් ආනාපානසතිය වඩන්න අවශ්‍ය බවයි ඒකෙන් හඟවන්නේ. ඊළඟට මේ භාවනාව සඳහා සුදුසු ඉරියව්ව කියවෙනවා. 'නිසීදති' මොකද මෛත්‍රී භාවනාව ආදිය සතර ඉරියව්වෙන්ම වඩන්න පුළුවන් බව මෙත්ත සූත්‍රයේ සඳහන් වෙනවා. 'තිට්ඨං චරං නිසින්නො වා සයානො වා', ආදි

වශයෙන්. නමුත් ආනාපානසති භාවනාව සඳහන් වන හැමතැනකම ඉරියව්ව පිළිබඳව විශේෂයෙන් සඳහන් වෙනවා- 'නිසීදති' හිඳගෙන. ඊළඟට තව වැදගත් කරුණු කීපයක් එතන සඳහන් වෙනවා. 'පල්ලඞ්කං ආභුජිත්වා' අමුතු වචනයක් එතන සඳහන් වෙනවා. පල්ලඞ්කං කියලා පුටුවටත් කියවෙනවා යහනටත් කියවෙනවා. එතකොට 'පල්ලඞ්කං ආභුජිත්වා' කියන්නේ පුටුවක් නමාගෙන. ශරීරයෙන්ම, කයෙන්ම, පුටුවක් නමාගෙන. ඒ වචන ටික ඉතාම වැදගත්. 'පල්ලඞ්කං ආභුජිත්වා උජුං කායං පණිධාය' කය සෘජුව තබාගෙන. දැන් එතකොට, සාමාන්‍යයෙන් මේ පුටුව ගැන සිතනකොට පුටුවේ ඇන්ද තියෙනවා. නමුත් මෙතන බුදුරජාණන් වහන්සේ පෙන්නුම් කරන 'කයින්ම නමාගන්න පුටුවේ' ඇන්ද තමයි පිටකොන්ද. මේ පුටුවේ මෙට්ටය මොකද්ද කියන එක මේ පින්වතුන්ට හිතාගන්න පුළුවන්. අපි කාටත් උපතින්ම ලැබිච්ච මෙට්ටයක් තියෙනවා. ඒ මෙට්ටය උඩ තමයි මේ පින්වතුන් දැන් මේ ඉඳගන සිටින්නේ. ගෙදරදොරවල නම් අර ඉඳගත්තු හැටියෙ ඇතුළට යන නොයෙකුත් විදියේ කුෂන් වර්ග තියෙන්න පුළුවන්. නමුත් බුදුරජාණන් වහන්සේ කියන්නේ අන්න අර සවාභාවික මෙට්ටය, ඒක හිතාගන්න පුළුවන් නේ. එතකොට මේ පුටුවට ඇන්ද පිටකොන්දයි. මේකට අමුතු කොට්ට මෙට්ට ආදියක් අවශ්‍ය නෑ. 'පල්ලඞ්කං ආභුජිත්වා උජුං කායං පණිධාය'.

ඊළඟට මේ කය සෘජු කිරීම පිළිබඳවත් ඇතැම් භාවනා යෝගීන් ලෙහෙසි ක්‍රම සොයා ගන්නවා. පිටිපස්සට යම්කිසි පොඩි කොට්ටයක් එහෙම තියනවා. විදේශික යෝගීන් අතර ඔය පුරුද්ද තියෙනවා. ඒක සමූහ භාවනා ආදිය කරන ඡායාරූප ගන්නකොට ඉස්සරහා පැත්තෙන් ගත්තු ඡායාරූපය හොඳට තියනවා. පස්සෙන් ඡායාරූපය අරන් බලනකොට සමහරුන්ට 'ජැක් ගහලා' වගේ අර කොට්ට යටින් තියෙනවා. ඒක එච්චර හොඳ නැහැ. ඒක කෘත්‍රිම උපක්‍රමයක්. එතකොට අපිට මේවා කියන්න වෙන්නේ අර උපදෙස් බලාපොරොත්තු වන නිසයි. අන්න සවාභාවික- අතීතයේ සංඝයා වහන්සේලාත් බුදුරජාණන් වහන්සේත් ඔය චාරිකාවේ යෙදෙන අවස්ථාවේ ගහක් යටට ගිහිල්ලා සිවුර සිව් ගුණයක් කරලා එලාගෙන හරි ඉඳගන්නව, අන්න අර කියාපු ස්වාභාවික පුටුව නමාගෙන. අමුතු දේවල් අවශ්‍ය නැහැ. ඉතින් අර ආබාධිත තත්ත්වයන් තියනවා නම් ඒක වෙනමයි. නමුත් පටන් ගැන්මෙදීම ලෙහෙසි කරගත්තොත්. ඔය පුටු භාවනා ක්‍රම දැන් ජනප්‍රියවීගන යනවා. අන්න අර ස්වාභාවික පුටුව අමතක කරන්න නරකයි. ඒකයි 'පල්ලඞ්කං ආභුජිත්වා උජුං කායං පණිධාය' කය සෘජු කිරීමේ අර්ථය මොකක්ද කියලත් හිතල බලන්න වටිනවා. මේ හුස්ම කියන එක, ආශ්වාස ප්‍රශ්වාස, ඉතාම ස්වාභාවිකව හොඳට මේ නාසිකාග්‍රයේ දැනෙන්නේ මේ කය සෘජු කළ අවස්ථාවේ. දැන් නයෙක් වුනත් පිඹින්න කය කෙලින් කර ගන්නවා. ඒ වගේ තමයි මේ වායො ධාතුව, ආශ්වාස ප්‍රශ්වාස වායො ධාතුව, ඉතාම

පිරිසිදුව පැහැදිලිව මතු වෙන්නේ කය සෘජු වුන අවස්ථාවෙයි. එතකොට උජුං කායං පණිධාය කියල කියන්නේ කය සෘජු කර තබා ගැනීමට ඉටාගෙන, අධිෂ්ඨාන කරගෙන.

ඔන්න ඊළඟට තවත් වචන කීපයක් සඳහන් වෙනවා. 'පරිමුඛං සතිං උපට්ඨපෙත්වා' සතිය කමටහනට පෙරටුකොට තබාගෙන. ඒ 'පරිමුඛං සතිං උපට්ඨපෙත්වා' කියන එක කොයි භාවනාව පිළිබඳවත් සඳහන් වෙනවා. ඉතිං මෙතන කියන්නේ දන් ඔන්න ආනාපාන සතිය වඩනකොට අපේ සිත විසිරිලා යන්න පහසුයි. ඒක නිසා ආනාපාන සතිය වඩනකොට ඒ ආශ්වාස ප්‍රශ්වාසය ඇතුල්වෙන පිටවෙන තැන නාසිකාග්‍රයේම නූනත් ඒ ප්‍රදේශයේම සිත රඳවා ගන්න ඕනෑ. මොකද ඒ කරන්නේ ආශ්වාසය ප්‍රශ්වාසය පිළිබඳව සතිය පිහිටුවීමයි. ඒ අදහස පෙරටු කරගෙන. ඒකයි පරිමුඛං සතිං උපට්ඨපෙත්වා සිහිය පෙරටුකොට තබාගෙන **'නිසීදති පල්ලඞ්කං ආභුජිත්වා උජුං කායං පණිධාය පරිමුඛං සතිං උපට්ඨපෙත්වා'**

ඔන්න ඊළඟට කියවෙනවා යම්කිසි වාක්‍යයක් ඒක සිද්ධාන්තමය වශයෙන් වටිනාකමක් තියන එකක්. මේ පියවර දහසයටම පොදුවූ, එහෙම නැත්නම් ඊට ආවේණිකවූ, විශේෂ අභ්‍යාස කොටසක් එතන කියවෙනවා. 'සො සතොව අස්සසති සතො පස්සසති' ඒ භික්ෂුව නැත්නම්, ඒ යෝගාවචරයා, සිහි ඇතියේම ආශ්වාස කරයි. සිහි ඇතිව ප්‍රශ්වාස කරයි. මෙන්න මේක පියවර දහසටයම බලපාන එකක්. මෙතන වෙනස මොකක්ද? දන් අපි උත්පත්තියේ ඉඳලම හුස්මගන්නවා. ඇත්ත වශයෙන් අපි උපතින්ම ඇදුම රෝගියෝ වගේ. මව්කුසෙන් එළියට ආපු වෙලාවේ ඉඳලා අපි හුස්ම ගන්නවා. නමුත් ඒක සතියත් එක්ක කෙරෙන එකක් නොවෙයි. බොහෝ විට එදිනෙදා ජීවිතයේ අපි හුස්ම ගන්න බව වත් දන්නේ නෑ. ඒක නේ බොහෝ දෙනා කියන්නේ, භාවනා කරන්නේ එහෙම නැද්ද කියලා ඇහුවාම, 'හුස්ම ගන්නවත් වෙලාවක් නැහැ' කියලා. දන් ඒක නිසා හුස්ම ගන්න වෙලාවක් ලබා ගන්න මොකද්ද කරන්නේ? අනිත් වැඩ වර්ජනය කරනවා. මොන වගේ වැඩද වර්ජනය කරන්නේ? ගමන් බිමන් වර්ජනය කරලා පොඩි නිවාඩුවක් ගන්නවා. ඒකෙ සංකේතය තමයි කකුල් දෙක නමා ගැනීම. ඊළඟට අත්දෙකෙන් කරන්න නානාවිධ වැඩ තියනවා. ඒවාත් වර්ජනය කරලා අත්දෙක තැන්පත් කරගන්නවා. ඊළඟට ඒ වගේම තමයි ඇස් දෙකෙන් බලන්න නොයෙකුත් දේවල් තියනවා. ලස්සන දර්ශන එහෙම. එයිනුත් නිවාඩුවක් ගන්නවා. ඔන්න එතකොට හුස්මක් ගැන අවධානය යොමු කරන්න වෙලාවක් ලැබුනා. ඉතින් ඒකයි 'සතොව අස්සසති' මේ ආශ්වාසය ප්‍රශ්වාසය පිළිබඳව සතිය පිහිටුවීමක් මිසක් අර හින්දුන්ගේ ප්‍රාණායාම වාගේ ආශ්වාස ප්‍රශ්වාස පිළිබඳව අභ්‍යාසයක් නොවේ. ආශ්වාස ප්‍රශ්වාස උත්සාහයෙන් කරලා කය ශක්තිමත් කරගැනීම හෝ වෙන අරමුණක් නොවේ මෙතන තියෙන්නේ. මේ උත්පත්තියේ ඉඳලා

එන ආශ්වාස ප්‍රශ්වාස- මේ 'ඇදුම රෝගය' හරියාකාරව තේරුම් අරගෙන මේ උපත කියල කියන මේ භයානක සංසාර දුක මෙතනම නැති කර ගැනීමටයි ආශ්වාස ප්‍රශ්වාසයේ සතිය පිහිටුවන්නේ. එතකොට මේක සතිය පිහිටුවීමේ අභ්‍යාසයක්. ඒකයි 'සො සතොව අස්සසති සතො පස්සසති'. ඒක සිද්ධාන්තමය වටිනාකමක් ඇති පාඨයක්.

ඔන්න එතැන ඉඳලා තියෙන්නේ අර එක එක පියවර. අපි කිව්ව සතිපට්ඨාන සූත්‍රයේ මුල් පියවර හතර පමණයි තියෙන්නේ. කායානුපස්සනාවට අදාළ නිසා. එතන සඳහන් වන ඒවා අපි කිව්වොත් පළමුවෙන්ම සඳහන් වෙනවා. 'දීඝං වා අස්සසන්තො දීඝං අස්සසාමීති පජානාති' දික්ව හෝ ආශ්වාස කරන්නේ දික්ව ආශ්වාස කරමියි දැන ගනියි. මනාව දැන ගනී කියන එකයි 'පජානාති' කියන්නේ. ප්‍රකට ලෙස දැනගනී. මේකේ එක එක වචනයක්ම වැදගත්. අපට බුද්ධ වචනය ආශ්‍රයෙන්- 'යථා බුද්ධෙන දෙසිතා' කියල කියන්නේ- බුද්ධ වචනය ආශ්‍රයෙන් ආනාපානය කරන තරමට තමයි ඒක ආනිශංස සහිත වෙන්නේ. එතකොට මෙතන 'දීඝං වා අස්සසන්තො දික්ව හෝ ආශ්වාස කරන්නේ දික්ව ආශ්වාස කරමි' යි දැන ගනී. ඊළඟට කියනවා දික්ව හෝ ප්‍රශ්වාස කරන්නේ දික්ව ප්‍රශ්වාස කරමි' යි දැන ගන්නවා. ඊළඟට ඒ එක්කම තියෙනවා 'රස්සං වා අස්සසන්තො රස්සං අස්සසාමීති පජානාති' කෙටියෙන් හෝ ආශ්වාස කරන්නේ කෙටියෙන් ආශ්වාස කරමි'යි දැනගනී. කෙටියෙන් හෝ ප්‍රශ්වාස කරන්නේ කෙටියෙන් ප්‍රශ්වාස කරමි යි දැනගනී. මෙන්න මේ තියෙන පාඨ යුගල දෙකත් ඇතැම් අය වරදවලා වටහා ගන්නවා. මේකත් අර අභ්‍යාසයක් හැටියට සළකලා. පළමුව දීර්ඝව හුස්ම ගන්න උත්සාහ කරනවා. උත්සාහයෙන් හුස්ම ගන්නවා දිගට, හුස්ම අරගෙන ඊළඟට තියෙන්නේ, ඊළඟ ඉලක්කම්වල තියෙන්නේ කොටට ගන්න නේ, ඔන්න ඉතින් කොටට ගන්නවා. එතකොට අස්වාභාවිකයි. එහෙම නොවේ. මෙතන අපට තේරුම්ගන්න උපකාර වන එක අකුරක් තියෙනවා. 'දීඝං වා' -'වා' කියන නිපාතයේ අදහස **හෝ**. දික්ව **හෝ** - එතකොට ඕනෑකමින් දික්ව ආශ්වාස ප්‍රශ්වාස කිරීම නොවේ. මෙතන කියන්නේ දික්ව ආශ්වාස කරනවා නම් දික්ව බව දැන ගන්නවා. කොට නම් කොට හැටියට දැන ගන්නවා. ඒකයි මේ කියන්නේ. එතකොට ඔන්න යුගල දෙකක් එතැන සඳහන් වෙනවා. 'දීඝං වා රස්සං වා'

එතකොට ඊළඟට කියවෙනවා 'සබ්බකායපටිසංවෙදී අස්සසිස්සාමීති සික්ඛති' සබ්බකායපටිසංවෙදී පස්සසිස්සාමීති සික්ඛති'. එතන ටිකක් අමුතු වෙනස් වීමක් වෙනවා ඒ පාඨයේ. ඕක බොහෝ දෙනා අතර මතභේද වලට හේතුවුන පාඨයක්, 'සබ්බකායපටිසංවෙදී' මුළුකය ප්‍රතිසංවේදනය කරමින්,වින්දනය කරමින්, සබ්බකායපටිසංවෙදී අස්සසිස්සාමි. අර ඉස්සර වෙලා කීවේ වර්තමාන වශයෙන්. දැන් කියන්නේ අනාගත වශයෙන්. ඒ වගේම

'සික්ඛති' කියන වචනයකුත් තියනවා. සික්ඛති කියන්නේ හික්මෙනවා. සිංහලට නැගුවොත් 'මුළු කයම වින්දනය කරමින් ආශ්වාස කරන්නෙමියි හික්මෙයි.' 'මුළු කයම වින්දනය කරමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයි' මේකේ අදහස මොකක්ද? දැන් මේ ආශ්වාස ප්‍රශ්වාස ඇත්ත වශයෙන්ම කයට අයිති දෙයක්. ඒක සඳහන් වෙනවා. ඒක වෙන තැන්වල සඳහන් වෙනවා 'අස්සාසපස්සාසා කාය සංඛාරෝ' කියලා. දැන් කයින් කෙරෙන වැඩ තියෙනවා. ඒවා මේ පින්වතුන් දන්නවා, අතින් පයින් කරන වැඩ. ඒවා හැම එකක්ම, කුසල් අකුසල් ගැන කියන කොට කයින් කෙරෙන අකුසල් එහෙම කියන්නේ ඒ කර්ම රැස්වෙන විදියේ දේවල්. ඊට වඩා ගැඹුරු දෙයක් මෙතන කියවෙනවා. ආශ්වාස ප්‍රශ්වාස 'කාය සංඛාරෝ' වෙන්නේ ආශ්වාස ප්‍රශ්වාසය තුළින් තමයි කය සකස් වෙන්නේ. එතකොට කයින් කෙරෙන සකස්කිරීම්ම නොවෙයි මෙතන කියන්නේ. ආශ්වාස ප්‍රශ්වාස තුළිනුයි කය සකස් වෙන්නේ. අන්න ඒක නිසයි මේ සබ්බකායපටිසංවෙදී කිව්වේ. එතකොට මුළු කයම. ඇත්ත වශයෙන් අවධානය යොමුව තියෙන්නේ මේ නාසිකාග්‍රය හරියේ තමයි. නමුත් යම් අවස්ථාවක, මේක මුළු කයට බලපාන හැටි ප්‍රකට වෙනවා. 'සබ්බකායපටිසංවෙදී'. මොකද මේක කායසංඛාරයක් බව වටහා ගන්න ඕනෑ.

දැන් ධර්මයේ තව ටිකක් පැහැදිලි කරනවා නම්, ඒක ටිකක් ගැඹුරු කාරණයක්. 'කායසංඛාරෝ' කියල කියන කය සකස්වීමට හේතුවන මූලික ක්‍රියාකාරිත්වය තමයි ආශ්වාස ප්‍රශ්වාසය. ඒක තේරුම් ගන්න පුළුවන්. දැන් යම්කිසි බර වැඩක් කරනකොට තමන් හොඳ හයියෙන් හුස්මක් ගන්නවා. කය සකස්කර ගන්නවා. හුස්මක් අල්ලගන්නවා සමහර වැඩ කරන්න. අන්න ඒ විදියට ඇතුළතින් කය සකස්කර ගැනීමට ඒක උපකාර වෙනවා. දැන් ධර්මයේ සඳහන් වෙනවා. සඤ්ඤා වේදනා දෙක තමයි චිත්තසංස්කාර. චේතනාදිය සකස්වෙන්න උපකාර වෙනවා සංඥාවත් වේදනාවත්. ඒ වගේම වචනය, අපි කටින් පිටකරන වචනයට යටින් තිබෙන්නේ විතක්ක- විචාර. 'විතක්ක විචාරා වචී සංඛාරෝ' ඔන්න ඔය ගැඹුරු කාරණයත් ඔතන සඳහන් වෙනවා. ඒක නිසා මෙතන තේරුම් ගන්න තියෙන්නේ කයට අවධානය යොමු කරන්නේ මක් නිසාද, එහෙම නැත්නම් අර සතිය හොඳට පිහිටුවා ගත්තාට පස්සේ බැහැරට යන්නේ නැත්නම් කය එක්ක තමයි දැන් ජීවත් වෙන්නේ. කය එක්කමයි දැන් සතිය පවතින්නේ, මේ ආශ්වාස ප්‍රශ්වාස දෙක කයටම අයිති දෙයක්. කය සකස් කෙරෙන්නේ ආශ්වාස ප්‍රශ්වාසයෙන් කියන කාරණය තේරුම් ගන්න උපකාර වෙනවා. ඒකයි සබ්බකායපටිසංවෙදී කියන්නේ. එතකොට 'අස්සසිස්සාමීති සික්ඛති'.

ඊළඟට කියවෙනවා ඒකේ අරමුණ මොකක්ද කියන එක. "සබ්බකායපටිසංවෙදී අස්සසිස්සාමීති සික්ඛති, සබ්බකායපටිසංවෙදී පස්සසිස්සාමීති

සික්ඛති" කියන එකට පස්සේ ඊළඟට සඳහන් වෙනවා තව යුගලයක්. 'පස්සම්භයං කායසංඛාරං අස්සසිස්සාමීති සික්ඛති' මේ කායසංඛාර කියල කියන මේ ආශ්වාස ප්‍රශ්වාසය සංසිඳුවමින් ආශ්වාස කරන්නෙමියි හික්මෙයි. කායසංස්කාර සන්සිඳුවමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයි. මේ කියන්නේ ආශ්වාස ප්‍රශ්වාස දෙකේදී කල්පනාකාරී වෙනවා කය පිළිබඳව. මොකද මේ හැම එකේම බලාපොරොත්තුව මේ ක්‍රියාකාරිත්වය සන්සිඳුවලා පස්සද්ධිය තුළින් සමාධිය ළංකර ගැනීමයි. එතකොට කයට හිත යාම තුළින් අර ආශ්වාස ප්‍රශ්වාසය තුළ, ආශ්වාසය ප්‍රශ්වාසය නිසා, යම් කයේ අනවශ්‍ය - අන්න අර මහා කප්පින හාමුදුරුවන්ට නැති අන්දමේ-සසලවීම් ආදියක් තිබෙනවා නම් අනවශ්‍ය, එහෙම නැත්නම් වේගයෙන් හුස්ම ගැනීම් ආදී අතිධාවන ඇතිවෙනවා නම්, ඒවා ඉබේටම අහුවෙනවා සබ්බකාය පටිසංවේදී අවස්ථාවේ. අහුවුනාට පස්සේ- පස්සම්භයං-ඒවා සන්සිඳුවනවා. කය සංසිඳුවනවා. ආශ්වාස ප්‍රශ්වාස සන්සිඳුවමින් නැත්නම් කාය සංස්කාර නම්වූ ආශ්වාස ප්‍රශ්වාස සංසිඳුවමින් ආශ්වාස කරනවා. ප්‍රශ්වාස කරනවා, ඔන්න ඔය හතර විතරයි අපට සතිපට්ඨාන සූත්‍රයේ දකින්න ලැබෙන්නේ.

ඊළඟට වටිනා උපමාවක් බුදුරජාණන් වහන්සේ ඉදිරිපත් කරනවා මේ හතරටම ගැලපෙන. මහ පුදුම උපමාවක් ඒක. මොකක්ද? යම්සේ මහණෙනි, එතන 'භමකාර' කියන වචනය යොදනවා. ලියවන පට්ටල මේ කාලයට වඩා යම්කිසි වෙනස්කම් තිබෙන්න පුළුවන්. නමුත් ලියවන පට්ටල් වඩුවෙක් පිළිබඳව සඳහන් වනවා. 'භමකාරො වා භමකාරන්තෙවාසී වා' ලියවන පට්ටල් වඩුවෙක් හෝ ඔහුගේ අතවැසියෙක් හෝ දික්ව හෝ අදින්නේ දික්ව යයි දැනගනී. කෙටිව හෝ අදින්නේ කෙටිව යයි දැනගනී. ඔය උපමාව දක්වනවා. එයින් අපට හිතාගන්න තියෙන්නේ මේ ආශ්වාස ප්‍රශ්වාස කළාට පස්සේ මේක දිගයි කොටයි කියලා තේරුම් ගැනීම නොවෙයි. ආශ්වාසය-දීර්ඝ ආශ්වාසය පුරාම සතිය පිහිටුවනවා. මේක දිග ආශ්වාසයක් කියලා දැනගෙනම ආශ්වාස කරනවා ප්‍රශ්වාස කරනවා. මේක කෙටි ආශ්වාසයක් ප්‍රශ්වාසයක් කියලා දැනගෙනම ආශ්වාස ප්‍රශ්වාස කරනවා. ඒක ටිකක් හිතා ගන්න පුළුවන් දැන් මේ පින්වතුන්ට ඔය ලියවන පට්ටල් උපමාවෙන් දික්ව හෝ කෙටිව හෝ එය කිරීමේදී භමකාරයා හරියට ඒක දැනගන්න ඕනෑ. මේ කරන්නේ දික් එකද කෙටි එකද කියලා. එහෙම නැත්නම් ඒක වැරදෙන්න පුළුවන්. සම්පූර්ණ ක්‍රියාවලිය තුළ සතිය පිහිටුවීමටයි ඒ උපමාව දක්වලා තියෙන්නේ. ඒක කළාට පස්සේ දිග-කොට සැලකීමක් නොවේ.

ඊළඟට මේ එක්කම එන ප්‍රායෝගික ගැටළු රාශියක් තියනවා. දැන් අපි මේ සූත්‍රයේ තියෙන ටික කිව්වට මේක අස්සේ හුඟක් ප්‍රායෝගික ගැටළු බොහෝ දෙනාට-ආනපානසති භාවනාවට බහින අයට- තියෙනවා.

එකක් තමයි මේ සතිය කොහේ රැඳවිය යුතුද? ඊළඟට මේ නාසිකාග්‍රය පිළිබඳ කතාන්දර නොයෙකුත් විදියේ- එක එක්කෙනා එක එක විධියේ මත දක්වනවා. නමුත් අපට හිතාගන්න තියෙන්නේ මේකයි, අර පළමුවෙන් 'පරිමුඛං සතිං' කිව්ව ආකාරයට ආශ්වාසය ප්‍රශ්වාසය සඳහාය මේ ඉඳගත්තේ, ආශ්වාස ප්‍රශ්වාසය පිළිබඳ සතිය පිහිටුවීමටයි මේ ඉඳගත්තේ කියන අවබෝධය ඇති යෝගාවචරයා පිටතට හිත නොයවා ඒ ඇතුල්වන පිටවන තැනවූ නාසිකාග්‍රයේ කෙසේ වෙතත් ඒ ප්‍රදේශයේ සිත රඳවාගෙන සතිය පිහිටුවා ගන්න ඕනෑ. සතිය පිහිටුවාගෙන ආශ්වාස ප්‍රශ්වාසයේ යෙදෙන අතරේ යම් අවස්ථාවක නිරුත්සාහයෙන්ම දැනෙනවා යම්කිසි සියුම් ස්පර්ශයක් නාසිකාග්‍රයේ. බොහෝ විට එක නාස්පුඩුවක. ඒ අවස්ථාව ඉතා සුවිශේෂ අවස්ථාවක්. නමුත් බොහෝ දෙනා මේක වරදවා වටහාගෙන ඒ අවස්ථාව කලින් උදාකර ගැනීමට කෘත්‍රිම වශයෙන් වේගවත්ව හුස්ම ගන්න බවත් අහන්න ලැබෙනවා. කවුරුවත් කීවොත් මූලික නිමිත්ත නාසිකාග්‍රය යැයි කියලා ඒක මතුකරගන්න උත්සාහයෙන් ආශ්වාස කරනවා. අර ප්‍රාණායාම වගේ. එහෙම ක්‍රමයක් බුදුරජාණන් වහන්සේ දක්වලා නැහැ. මේක සංසිඳුවමින් යන ගමනක්. එතකොට ආශ්වාස ප්‍රශ්වාසය සන්සිඳුවන්න සන්සිඳුවන්න තමයි කලින් නොදැනුන ස්පර්ශය දැනෙන්න පටන් ගන්නේ. උත්සාහයෙන් ඕළාරික වශයෙන් ඇතිකර ගැනිල්ලක් නොවේ. අන්න ඒක හොඳින් තේරුම් ගන්න වෙනවා. යම් අවස්ථාවක ඒකේ යෙදෙනකොට තේරෙනවා. සුළු සුළු වෙනස්කම් ඇතිවෙන්න පුළුවන් ඒ හරියටම කොයිතැනද කියලා. මේ නාසිකාග්‍රය ආශ්‍රිතව සියුම් වායුව ස්පර්ශවන තැනක්. ඒ සුවිශේෂ අවස්ථාව උදාවෙන ආකාරය අතීතයේ ඉඳලා දක්වන උපමා දෙකක් තියෙනවා. ඒ උපමා දෙකත් ප්‍රයෝජනවත් වෙනවා. බොහෝ දෙනා දන්නවා ඇති පොත පතේ සඳහන් වෙනවා.

දැන් ඔන්න අපි හිතමු- උපමා දෙකත් තේරුම් ගන්න පුළුවන් වෙන්න කිව්වොත්. දැන් ඔය ඔන්චිල්ලා තියෙනවා නේ ඔය අවුරුදු කාලයේදී එහෙම. දැනුත් තියනවාද මම දන්නේ නැහැ. ඔන්චිල්ලාවල සමහරු රුකුල් ගන්නවා. එතකොට ඔන්චිල්ලාවේ රුකුල් ගන්නවා බලන්න පොඩි ළමයෙක් ආවාට පස්සේ සාමාන්‍යයෙන් එයා පෙළඹෙන්නේ වම් පැත්තට දකුණු පැත්තට ඔළුව හරවන්නයි. නමුත් ටික වෙලාවකින් තේරුම් ගන්නවා එහෙම ඔළුව හැරෙව්වේ නැතත් මැද හිටගෙන ඉන්න කොට ඇස් කොනින් පෙනෙනවා- නොපෙනෙනවා නොවෙයි- ඇස් කොනින් පෙනෙනවා එහා කොනටත් මෙහා කොනටත් රුකුල යනවා. එතකොට ඒ අවබෝධය එන අවස්ථාව වගේ තමයි ආශ්වාසය ප්‍රශ්වාසය අන්න අර නාසිකාග්‍රය අසල සියුම් ස්පර්ශය දැනෙන තැන. සතිය පිහිටවා ගන්න තැනක් අහුවෙනවා- නියම තැන අහුවෙනවා. මධ්‍යස්ථානය මෙතනයි. නාසිකාග්‍රය ළඟ නේ ඇතුල්වීම් පිටවීම් වෙන්නේ. ඒකයි.

තවත් උපමාවක් දෙනවා. ඒකෙන් කියන්නේ - ඒක විස්තර කරලා දක්වුවොත් පොතපතේ දක්වෙන ආකාරය කෙසේවෙතත්- ඔය දත් කියතකින් කොටයක් ඉරන කොට ඒත් අර වගේ සමහරවිට නොදන්නා කෙනෙක් ඒක දිහා බලා ඉන්නකොට ඉස්සර වෙලාම උඩ ඉන්න මිනිහත් පහල ඉන්න මිනිහත් කියත අදින හැටි බලනවා. පස්සේ හිතනවා, මේක තේරුම් ගන්නවා, ඒක එච්චර මහන්සි වෙන්න දෙයක් නැහැ. හරියට කොටේ කියත වදින තැනට හිතයෙදුවාම අර ටික ඉබේටම පෙනෙනවා. නොපෙනෙනවා නොවේ. ඒවත් පෙනෙනවා. අන්න ඒ වගේ තමයි මේ මධ්‍යස්ථානය වගේ තියන ඒ නාසිකාග්‍රය අසල සියුම් ස්පර්ශය දැනෙන්නේ. ඒ දැනිය යුත්තේ මේ අභ්‍යාසයේ යෙදෙන අතරේයි. ආරම්භයේදී ඒක සඳහා උත්සාහයෙන් ආශ්වාස ප්‍රශ්වාස නොකළයුතුයි. ඕකයි කියන්න තියෙන්නේ. එතකොට මුල ඉඳලා අගටම සතිය පිහිටුවීම මිසක් මේක හින්දුන්ගේ ප්‍රාණායාම වගේ ආශ්වාස ප්‍රශ්වාස ගැනීමේ කෘත්‍රිම ක්‍රමයක්, එහෙම නැත්නම් අභ්‍යාසයක් නොවේ මේක.

ඊළඟට ඒ වගේම තමයි ඇතැම් කෙනෙක් මේ සඳහා වඩා උපකාරවන පිහිටක් හැටියට ගණන් කිරීමේ පුරුද්දක් තියෙනවා. ඉතින් පොතපතේ සඳහන් වෙනවා- මෑත යුගයේ පොත් වලයි සඳහන් වන්නේ- අර කියාපු බුද්ධදේශිත සූත්‍රයේ නොවෙයි. අටුවා ආදියේ සඳහන් වෙනවා. මේ ආනාපානයට බහින අය පැමිණිලි කරන එකක් තමයි විතර්ක පීඩනය. බුදුරජාණන් වහන්සේ මේක විතර්ක කපා හැරීමට දේශනා කළ නමුත් හරියට විතර්ක එනවා කියලා. ඒකට පොඩි බෙහෙතක් හැටියට ඇතැම් කෙනෙක් දක්වනවා ගණන් කිරීම. ඉතින් ගණන් කිරීම තුළින් කරන්නේ මොකක්ද? ඔන්න 'එකයි' කියා ගන්නවා, ආශ්වාසයේදී එකයි එකයි 'දෙකයි දෙකයි' ඔහොම. ඔය ක්‍රමය එච්චර හොඳ නැතෙයි කියල කියන්නේ මොකද. දැන් මේ ආශ්වාසයේ කෙළවර තමයි ප්‍රශ්වාසයේ ආරම්භය. ප්‍රශ්වාසයේ කෙළවර තමයි ආශ්වාසයේ ආරම්භය. ඇත්ත වශයෙන් මේක චක්‍රයක් වගේ යන දෙයක්. නමුත් අර කුඤ්ඤයක් ගැහුව හැටියේ ඔන්න දැන් ආශ්වාස කළා. ඊළඟට ඔන්න ප්‍රශ්වාස කළා. ඒක තුළින් මැකිලා යනවා අර සියුම් හරිය. ඇත්ත වශයෙන් ආනාපාන භාවනාව කරගෙන යනකොට මේ හුස්ම ගිහිල්ලා ඒකෙ කෙළවර ඊළඟට තියෙන්නේ ඊළඟ හුස්මෙ ආරම්භය. ආශ්වාසයේ කෙළවර ප්‍රශ්වාසයේ ආරම්භයයි. ඒක උපකාර වෙනවා- මොකද මේ විදර්ශනාවට යනකොට ඔන්න ඊළඟට ඒ හරිය මතුවෙනවා. එතකොට අපි අර ගණන් කිරීමේ ක්‍රමය එතරම් හොඳ නැතෙයි කියලා කියන්නේ මොකද ඒක තුළින් කෘත්‍රිම වශයෙන් ආශ්වාසයත් ප්‍රශ්වාසයත් වෙන් කරනවා. එහෙම වෙන් කරන්න පුළුවන්කමක් නැහැ. මේක ප්‍රතීත්‍යසමුත්පන්න වශයෙන් ආශ්වාසයේ කෙළවර ප්‍රශ්වාසයේ ආරම්භයයි. ප්‍රශ්වාසයේ කෙළවර ආශ්වාසයේ

ආරම්භයයි. ඒ චක්‍ර ස්වභාවය අමතක වෙනවා අර විදියට ඉලක්කම් ඔස්සේ ගියොත්. ඒ වගේම අවධානයත් ඒ පැත්තට යොමු වෙනවා. අපි අර ලෝකයෙන් සිත ඉවත් කරගෙන හුස්ම පිළිබඳ සතිය පිහිටුවන්න උත්සාහ කරන අතරේ ඉලක්කමක් එකතුකර ගත්තාම හාවෝ දෙන්නෙක් පස්සේ එලවන්නා වගේ වැඩ දෙකක් වෙනවා. අන්න ඒක නිසා ඒ විධියේ කෙටි මාර්ග අනවශ්‍යයි.

එතකොට ඔන්න ඊළඟට ඒවා නැතිව කරනකොට භාවනාව සමථ වශයෙන් කය තැන්පත්වුනු අවස්ථාවේ තමයි ඔය පීති සුඛ ආදී වශයෙන් ඊළඟට ඒවා තුළින් සමාධිය පැත්තට යන්නේ.

තවත් විශේෂයෙන් කිවයුතුව තියෙනවා අපි දැන් සතිපට්ඨානය ආශ්‍රයෙන් මේ ආනාපානසතිය විග්‍රහකරන නිසා එතන සතිපට්ඨාන සූත්‍රයේ ඒ කායානුපස්සනා, වේදනානුපස්සනා, චිත්තානුපස්සනා, ධම්මානුපස්සනා කියන හතර පිළිබඳවම වටිනාම කොටසක් සඳහන් වෙනවා. මේ විදර්ශනාවට අදාළ කොටසක්. ඒක මේ විදියටයි කියවෙන්නේ. 'ඉති අජ්ඣත්තං වා කායෙ කායානුපස්සී විහරති, බහිද්ධා වා කායෙ කායානුපස්සී විහරති, අජ්ඣත්ත බහිද්ධා වා කායෙ කායානුපස්සී විහරති'- ඊළඟට තව සඳහන් වෙනවා 'සමුදය ධම්මානුපස්සී වා කායස්මිං විහරති, වයධම්මානුපස්සී වා කායස්මිං විහරති, සමුදය වයධම්මානුපස්සී වා කායස්මිං විහරති. අන්න ඒ ටික අපි ඉස්සරවෙලා ගනිමු. එතකොට මේ 'අජ්ඣත්තං වා කායෙ කායානුපස්සී විහරති'- මේ කියන්නේ තමාගේ කය පිළිබඳව. මේක මේ ආනාපාන සතිය ආශ්‍රයෙන් ආනාපානයත් අර කායසංස්කාරයක් නිසා ආශ්වාස ප්‍රශ්වාසයේ සතිය පිහිටුවීම තුළින් අපි තේරුම් ගන්නවා මේ 'අජ්ඣත්තං වා කායෙ කායානුපස්සී'- කය අනුව බැලීමක් වෙනවා. ත්‍රිලක්ෂණය වටහා ගැනීමට උපකාර වන්නේ මේ කයත්, කයේ තිබෙන වේදනාත්, වේදනා ආශ්‍රයෙන් ඇතිවන සිතත්, ඊළඟට සිතට අදාළ අරමුණුවන ධම්මත්. ඔය හතරයි අනුපස්සනා වශයෙන් දක්වෙන්නේ සතිපට්ඨාන භාවනාවේදී. ඉතින් මෙතන අර තමාගේ කය පිළිබඳව. කෙනෙකුට අහන්න පුළුවන් එහෙනම් අපි අනිත් අයගේ ආශ්වාස ප්‍රශ්වාසවලට කන්දෙන්න ඕනද කියලා. කන් දෙන්නේ නැතත් ඒක ධර්මතාවක් බව වටහා ගැනීමට තමාගේ ශරීරය ක්‍රියාත්මක වන්නේ- මේ තමන්ගේ මේ ශරීරය පවතින්නේ- මෙන්න මේ පණ කෙන්ද උඩයි කියන අවබෝධය එතනදී එනවා.

අර හින්දුවරු- අර ප්‍රාණායාම කරන ඒ ගොල්ලෝ- ප්‍රාණය ආත්මයක් හැටියට ගන්නවා. නමුත් බෞද්ධයා- බුදුරජාණන් වහන්සේ පෙන්නුම් කරන්නේ ඒක සංස්කාරයක් පමණයි. කය සකස්කිරීමට උපකාරවන දෙයක් මේ ආශ්වාස ප්‍රශ්වාස. ඒක නැතිව එතකොට ඒ අවබෝධය තමන්ගේ කය පිළිබඳව ආවත් ඇතැම් කෙනෙකුට ඔය ටිකක් හුස්ම ගැනවත් දන්නෙ නැති තරම් හුස්ම උඩ ජීවිතය පවතින්නෙත් නැතිය කියල හිතාගෙන කය

සරසාගෙන යන කෙනෙක් දැක්කාම කල්පනා කරන්න පුළුවන් මේ අමුතුම ලෝකයකින් ආපු කෙනෙක් කියලා. නමුත් අන්න අර 'බහිද්ධ වා කායෙ' බැහැර කය පිළිබඳවත් ඒ අවබෝධය තියෙන්න ඕනෑ අවබෝධය සම්පූර්ණ වීමට. අජ්ඣත්ත බහිද්ධා දෙකම අවශ්‍යයි. ඉතින් ඒක අර අපි කිව්ව ඇදුම රෝගයක් - තමනුත් ඇදුම රෝගියෙක් බව වැටහී යනවා වගේම ලෝකයේ අනික් අයත් ඒ ධර්මතාවට යට බව. ඒක බොහෝ විට සඳහන් වෙනවා ඔය අසුභ භාවනා ආදියේ 'යථා ඉදං තථා එතං, යථා එතං තථා ඉදං- අජ්ඣත්තං ච බහිද්ධා ච කායෙ ඡන්දං විරාජයෙ' කියන පාඨයෙන් හොඳටම ඔප්පු වෙනවා- මේ කය යම්සේද ඒ කයත් එසේමය. ඒ කය යම්සේද මේ කයත් එසේමය.[1] අන්න ඒක නිසා ඇතුළතත් පිටතත් කය පිළිබඳ ඇති ඇල්ම දුරලන්නේය. කියන බුද්ධ අවවාදයෙන් අපට පෙනෙනවා මෙතන මේ අජ්ඣත්ත- බහිද්ධා කියන දෙකක් යොදා ගත්තේ මොකටද කියල. ඇත්ත වශයෙන්ම තමන්ගේ විදර්ශනාව මෝරා යනකොට තමන්ට සිහිපත් වෙනවා ඇතැම් කෙනෙක් දකලා තියනවා නම් ඇදුමරෝගියෙක් 'අනේ මෙයා කොයි තරම් දුක් විදිනවාද' කියා ඒ ඇදුම රෝගියා වගේම නේද මාත් කියලා ඇතැම් විට ඒ විදර්ශනාත්මක වැටහීම ඒක ආශ්‍රයෙන්ම එනවා. තමන්ගේ ශරීරය තුළ මේක ක්‍රියාත්මක වෙනවා හරියට මයිනහම පිඹිනවා වගේ. ඒ විදර්ශනාත්මක වැටහීම මහ පුදුමයි. වෙන ලෝකයාට නොපෙනෙන වින්දන රාශියක් තුළිනුයි මේ තිවන කරා යන්නේ. මේ ශරීරය තමයි මේ හැම එකකටම උපකාර වන්නේ. ඇතැම් අය යන්ත්‍ර සූත්‍ර වලින් මේවා පිළිබඳව නිර්ණය කරන්න යනවා. නමුත් මේක හිතට වැටහෙන්නේ මේ තමන්ගේ ශරීරය ආශ්‍රයෙන්. ආයෙ යන්ත්‍ර සූත්‍ර අවශ්‍ය නැහැ එතකොට ඒ අවබෝධය එන්න, ඒ ඥාන මාර්ග උදාවෙන්න. ඔන්න ඔය ඇදුමරෝගය. තමනුත් ඇදුම රෝගියෙක් වගේම අනික් අයත් ඇදුම රෝගියෝ. අජ්ඣත්ත- බහිද්ධා ඒ දෙක එකතු කරලා දක්වන්නේ මොකද, අන්න ඒ දෙක සම්පූර්ණ වුන අවස්ථාවයි.

ඊළඟට ඒ වගේ තමයි 'සමුදය ධම්මානුපස්සී වයධම්මානුපස්සී' කයේ හටගැනීම් ස්වභාවය දකිමින්- 'සමුදය ධම්මානුපස්සීවා කායස්මිං විහරති' ඒ කියන්නේ - කය පිළිබඳව එහි හට ගන්නා ස්වභාවය දකිමින් හෝ වාසය කරනවා. ඊළඟට 'වයධම්මානුපස්සීවා කායස්මිං විහරති' ගෙවීයන ස්වභාවය දකිමින් හෝ වාසය කරනවා. එතකොට සමුදය වය කියල කියන්නේ පටිච්චසමුප්පාදයේ ඇතිවීම් නැතිවීම් දෙකයි. ඒක ආශ්වාස ප්‍රශ්වාස ආශ්‍රයෙන් තේරුම් ගන්නවා. මෙතන ආත්මයක් කරන දෙයක් නොවෙයි. ආශ්වාසයක් ඇතිවුනා ඒක නැතිවෙලා ගියා. අන්න ඒ අවබෝධය- ශරීරය ඒ විදියේ අනිත්‍යවූ දෙයක් කියන අවබෝධයයි. ආශ්වාස ප්‍රශ්වාසයෙහි සතිය පිහිටුවා ගැනීම තුළින් විදර්ශනාව මතුකර ගැනීමයි, අනිත්‍යතාව වටහාගැනීමයි, එතන පෙන්නුම් කරන්නේ. කයේ හටගන්නා ස්වභාවය දකිමින් වාසය කරනවා.

ගෙවී යාමේ ස්වභාවය දකිමින් වාසය කරනවා. ඊළඟට ඒ දෙක එකතු කරලා කියනවා "සමුදය වයධම්මානුපස්සීවා කායස්මිං විහරති" හටගැනීම් ගෙවීයාම් දෙකම එකවිට බලමින්. අන්න එතන බොහෝ දෙනා වරදවා වටහා ගන්නවා. මේ එතන ගැඹුරු කාරණයක් කියවෙන්නේ. ඒ දෙක එකතුවන අවස්ථාව. මේක පොතේ උපමාවක් නොවුනත් මේක තේරුම් ගන්න එක අවස්ථාවක උපමාවක් දුන්නා. දලි පිහිය මදිනකොට කරගලේ හරි, නැත්නම් පටියේ හරි, එතකොට ඒක ඉස්සරවෙලා ඉහළට ඉහළට ඉහළට එක පැත්තක් මදිනවා. ඊළඟට පහළට පහළට පහළට අනික් පැත්ත මදිනවා. ඔන්න ඊළඟට ඒ දෙකම එකතු කරලා වේගයෙන් ඉහළට පහළට- ඉහළට පහළට මදිනවා. මොකක්ද ඒකේ අදහස. මේ මුවහත හරියට පන්නරය එන්නේ අන්න අර අන්තිම අවස්ථාවේ. ඉහළට පහළට - ඉහළට පහළට. ඒ වගේ තමයි අජ්ඣත්ත බහීද්ධා දෙක එකතුවුන තැන තමයි විදර්ශනාව සම්පූර්ණ වෙන්නේ. පොතපතේ සඳහන් වෙනවා ඇතැම් කෙනෙක් ඇතුළතින් පටන්ගෙන පිටතින් විදර්ශනාව සම්පූර්ණ කර ගන්නවා. ඒ කියන්නේ තමාගේ කයින් පටන්ගෙන අනුන්ගේ කයත් ඒ ධර්මතාව බව තේරුම්ගෙන ඒක සමවුනු අවස්ථාවයි අර අජ්ඣත්ත බහිද්ධා කියන්නේ. එතන වගේ මෙතනත් තියෙන්නේ 'සමුදය ධම්මානුපස්සී වා වයධම්මානුපස්සී වා' කියලා පසුව 'සමුදය වයධම්මානුපස්සී ඒ දෙකම එකතුකරලා දක්වන්නේ අන්න අර දලිපිහියේ මුවහත වගේ. **හරියටම කියන්න පුළුවන්ද මුවහත කොයි පැත්තටද අයිති කියලා? මුවහත දෙපැත්තටම අයිති නැහැ. නමුත් මුවහත වන්නේ අර දෙකම සම්පූර්ණ වුන අවස්ථාවෙයි. අන්න එතන තමයි විදර්ශනාවේ විනිවිදයාම වෙන්නේ.** විනිවිද යාම කියන එක ඉතාමත්ම ගැඹුරු කාරණයක්. නිබ්බෙධිකා පඤ්ඤා- ඒ විනිවිද යන අවස්ථාව පෙන්නුම් කිරීමටයි ඒ දෙක එකතුකරලා දැක්වූවේ. එතකොට 'සමුදය වයධම්මානුපස්සී වා කායස්මිං විහරති.'

ඔන්න ඊළඟට දක්වනවා ඊටත් වඩා වැදගත් කාරණයක්. මේ අපි විස්තර කරන්නේ අර සතිපට්ඨාන සූත්‍රයේ අනුපස්සනා හතරටම පොදු විදර්ශනාත්මක කොටසයි. ඔන්න අවසාන වාක්‍යයෙන් කියවෙනවා "අනිස්සිතො ච විහරති නච කිඤ්චි ලොකෙ උපාදියති". මේ විදියට කරන්නේ මොකටද කියන එක දක්වනවා. කිසිවක් පිළිබඳව - අනිස්සිත කියලා කියන්නේ ඒවාට හේත්තු වන්නේ නැතිව, ග්‍රහණය කරන්නේ නැතිව, උපාදාන වශයෙන් ග්‍රහණය කරන්නේ නැතිව ඉදීමට උපකාරවන දර්ශනයකුයි මෙතන පෙන්නුම් කරන්නේ. එතකොට 'අත්ථි කායොති වා පනස්ස සති පච්චුපට්ඨිතා හොති යාවදෙව ඤාණමත්තාය පතිස්සති මත්තාය' ඔන්න අවසානයේ කයක් තියෙනවා කියන එක, කයක් තියෙනවා කියන අදහස පවා, කෙනෙක් ඒ අවස්ථාවේ තේරුම් ගන්නවා ඇත්ත වශයෙන් මේ ඝන වශයෙන් තිබෙන කයක් නොවේ මේක.

'අත්ථි කායොති වා පනස්ස සති පච්චුපට්ඨිතා හොති' ඔහු වෙත මේ කයක් තිබෙනවා කියන සිහිය එළඹ සිටින්නේ මොකටද 'යාවදෙව' හුදෙක් 'ඤාණ මත්තාය පතිස්සතිමත්තාය' ඤාණය දියුණු කර ගැනීමටත් සතිය දියුණු කර ගැනීමටත් ආධාරයක් හැටියටයි. පලංචියක් හැටියටයි 'කයක් තියෙනවා' කියලා කියන්නේ. ඇත්ත වශයෙන්ම කයක් තියනවා නොවේ. මේක නිරන්තරයෙන්ම වෙනස් වෙනවා. ආශ්වාස ප්‍රශ්වාස තුළිනුත් මේ කය වෙනස් වෙනවා. ආහාරපාන, මේ හැම එකක්ම. දන්නවා නේ මේ ශරීරය පවතින්නේ මූලිකව වාතය, දෙවනුව වතුර, ජලය, ඊළඟට ආහාරය. එතකොට මේ එක එකක් පාසා බාහිර ලෝකයත් එක්ක කෙරෙන ගනුදෙනුව අර උත්පත්ති අවස්ථාවේ තමයි ආරම්භ වෙන්නේ. ඊට කලිනුත් මේ ගනුදෙනුව පටන්ගත්තා මව් කුසේදී. එළියට ආවට පස්සේ ඔන්න බාහිර වායුගෝලයත් එක්ක ගනුදෙනුව පටන් ගන්නවා ආශ්වාස ප්‍රශ්වාස තුළින්. අන්න එතකොට ඒ නිසා කය ඇත්ත වශයෙන් මේක ඒකකයක් හැටියට ඝන වශයෙන් එකක් හැටියට ගන්නත් බැරි දෙයක්. නමුත් ඒක ගන්නේ මොකටද, අන්න ප්‍රායෝගික අර්ථයක් සඳහා. **හුදෙක්** සතියත් ඤාණයත් වඩා ගැනීමට ආධාරකයක් වශයෙන් පමණයි. ඒක නිසා 'අනිස්සිතො ච විහරති න ච කිඤ්චි ලොකෙ උපාදියති'. ඒකටයි' අත්ථි කායොති වා පනස්ස සති පච්චුපට්ඨිතා හොති' කිව්වේ. එහෙම හිතා ගන්නේ මොකටද 'ලෝකේ කොතනකටවත් නොඇලී සිටීමට. 'අනිස්සිතො ච විහරති නච කිඤ්චි ලොකෙ උපාදියති'

ඒ විදර්ශනාත්මක කොටස ඇත්ත වශයෙන්ම කායානුපස්සනාව පිළිබඳව පමණක් නොවේ වේදනානුපස්සනාව, චිත්තානු පස්සනාව, ධම්මානුපස්සනාව කියන හතරටම පොදුයි.

ඔන්න එතකොට අපි සතිපට්ඨානයට අදාළ මුල්කොටස කාලවේලා ඇති පමණින් ආනාපානයට අදාළ අන්දමින් ප්‍රකාශ කළා.

ඊළඟට අර දහසයක් තියනවා කිව්ව නිසා කෙටියෙන් අනිත් ඒවා මොනවද කියලා හඳුන්වලා දෙන්න සිද්ධ වෙනවා. බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කළා සතර සතිපට්ඨානයම ආනාපානසති භාවනාව තුළ තිබෙනවාය, ඒ සතර සතිපට්ඨානය, එහෙම නැත්නම් පියවර දහසය, ඇත්ත වශයෙන්ම පරිපූර්ණ වශයෙන් වඩනකොටයි ඒකේ සම්පූර්ණ ආනිශංස තියෙන්නේ කියලා.

එතකොට ඊළඟ හතර තමයි වේදනානුපස්සනාව. ඒකට අදාළව කියලා තියෙන්නේ මෙහෙමයි. 'පීති පටිසංවේදී අස්සසිස්සාමීති සික්ඛති' ප්‍රීතිය විඳිමින් ඒ කියන්නේ මේ අපේ කය සංසිඳවනකොට 'පස්සද්ධ කායො සුඛං වෙදෙති සුඛිනො චිත්තං සමාධියති' කය සංසිඳවන කොට ප්‍රීතියක් සුඛයක් දැනෙනවා. අන්න ඒක නිසා ඒ ප්‍රීතිය වින්දනය කරමින් ආශ්වාස කරන්නෙමියි හික්මෙයි. ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයි. කෙටියෙන් සලකා ගන්න. ඊළඟට

ඒවගේම 'සුඛ පටිසංවේදී' සැපය. කායික සුඛය ඒකත් සතිය එතැනට යොමු කරනවා. ඒවා මතුවෙනවා. මතුවෙන එක සතියෙන් ඒකට යොමුකරලා තේරුම් ගන්නවා. 'පජානාති' කියන්නේ ප්‍රකට වශයෙන් දන ගන්නවා. මොකද මේ ඉබේ කෙරෙන ක්‍රියාතුළයි අවිද්‍යාව සැඟවිලා තියෙන්නේ. තණ්හාවත් සැඟවිලා තියෙන්නේ ඉබේ කෙරෙන ක්‍රියා තුළයි. එතකොට සතිපට්ඨානය තුළින් කෙරෙන්නේ ඒවා මතු කරලා දීමයි. නිවන මෙතනම තියනවා කියන්නේ ඒකයි. එතකොට ලෝකයා දීර්ඝ කාලයක් සංසාරයේ සාංසාරික ආශ්‍රව- සංසාර පුරුදු- වලට යටවෙලා හිටියා. අර ඉබේ කෙරෙන ක්‍රියාවලට යටවෙලා. ඒක පහසු නිසා. නමුත් මේක මතු කරගත්තු අවස්ථාවේ අවබෝධය එතනමයි. සතියයි සම්පජඤ්ඤයයි එකට යන්නේ ඒකයි. සතිය එකතු කරගත්තු තැන අවබෝධය. සම්පජඤ්ඤය කියන්නේ මනා අවබෝධය. දැනුවත්බව. එතකොට ඔන්න ඔය සඳහායි මේක කරන්නෙ. දැන් එතකොට වේදනානුපස්සනාවට බහිනවා අර ආශ්වාස ප්‍රශ්වාසය තුළින්ම. ඒ තුළින් අර කය සන්සුන් වුනාට පස්සේ අර ප්‍රීතිය වින්දනය කරමින්ම ආශ්වාස කරන්නෙමි- එතකොට වින්දනය කරමින්.

ඊළඟට කියැවෙනවා-ඔන්න ගැඹුරු පැත්තකට යනවා. 'පීති සුඛ' ආදිය පවා ග්‍රහණය කරන්නේ නැහැ. දැඩිව අල්ලා ගන්නේ නැහැ. මොකද? මේවා හුදෙක් චිත්තසංඛාර පමණයි. මේවා චිත්ත සංස්කාර හැටියට තේරුම් ගන්නවා. ඒ එන සංඥාවල් වේදනාවල් ආශ්‍රයෙනුයි මේ පීති සුඛ ආදිය දැනෙන්නේ. එතකොට ඒ 'චිත්ත සංඛාර පටිසංවේදී' මේවා චිත්ත සංස්කාර බව දැනගෙන ආශ්වාස කරනවා ප්‍රශ්වාස කරනවා. ඊළඟට ඒ සංස්කාර අර කාය සංස්කාර වගේම සංසිඳුවනවා. 'පස්සම්භයං චිත්තසංඛාරං අස්සසිස්සාමීති සික්ඛති. පස්සම්භයං චිත්තසංඛාරං පස්සසිස්සාමීති සික්ඛති.' අර චිත්ත සංස්කාරයන්-සඤ්ඤා වේදනා නමැති චිත්ත සංස්කාරයන් පවා, ඒවාත් සංසිඳුවමින් ආශ්වාස කරනවා ප්‍රශ්වාස කරනවා. ඔන්න එතකොට වේදනානුපස්සනා කොටස.

ඔන්න ඊළඟට චිත්තානුපස්සනාව ළඟට එනකොට චිත්තපටිසංවේදී. ඒ සංඥාවේදනා ආදියෙන් සකස්වුනු සිත ආශ්වාසය ප්‍රශ්වාසය ආශ්‍රයෙන්මයි ඒ කාර්යයේ යෙදිලා ඉන්නේ. ඒ සිත හරියට දැනගනිමින් චිත්තානුපස්සනා කියල කියන්නේ සිත සිත හැටියට දැනගනිමින්. සිතක් ඇතිවුනා සරාග- වීතරාග සදෝස-වීතදෝස සමෝහ- වීතමෝහ ආදී වශයෙන් සිත හඳුනාගැනීම සතිය තුළින් ඒක අවබෝධ කරගනිමින් ආශ්වාස කරනවා ප්‍රශ්වාස කරනවා. ඊළඟට 'අභිප්පමොදයං චිත්තං' සිතේ ඇතිවන සතුට ඒවා පිළිබඳව දැනුවත්ව ආශ්වාස ප්‍රශ්වාස කරනවා. ඊළඟට 'සමාදහං චිත්තං' සිත සමාධිමත් කරමින් ආශ්වාස කරනවා ප්‍රශ්වාස කරනවා. ඊළඟට 'විමොචයං චිත්තං' සිත මුදා ගනිමින් ඔය නීවරණ ධර්ම ආදියෙන් සිත මුදා ගනිමින් ආශ්වාස ප්‍රශ්වාස කරනවා. ඔය ටික සඳහන් වෙනවා චිත්තානුපස්සනා කොටසට හතරක් හැටියට.

අවසානයේ කියවෙනවා 'අනිච්චානුපස්සී අස්සසිස්සාමීති සික්ඛති. අනිච්චානුපස්සී පස්සසිස්සාමීති සික්ඛති'. ඔන්න විදර්ශනා පැත්තට හැරෙනවා. ඒ ටික ධම්මානුපස්සනාවයි. මේ සිතට එන අරමුණු ඒවා හැම එකක්ම අනිත්‍යයි- එතකොට ඒකේ අනිත්‍යතාව ඒ අරමුණු ආශ්වාස ප්‍රශ්වාස ආශ්‍රයෙන්. මොකද මුල ඉඳලම 'සො සතොව අස්සසති සතො පස්සසති' කරන්නේ ආශ්වාසයත් ප්‍රශ්වාසයත් සිහියෙන්. ඒ කරන එක තුළ අනිත්‍යතාව තේරුම් ගන්නවා. අන්න එතකොට එතනදි තමයි අර චක්‍රාකාර අවබෝධය එන්නේ. මේ ආශ්වාසයේ කෙළවර ප්‍රශ්වාසයේ ආරම්භය. දැන් සාමාන්‍යයෙන් අපි අර කුක්කුඩයක් ගැහුව හැටියේ මේක සෘජු ඉරක් වගේ පේන්නේ. නමුත් අන්තිමට මේක වැටහෙනවා චක්‍රයක් වගේ. පලු දෙකක් වගේ. ඉතින් ඒ ටික අන්න අනිච්චානුපස්සනාවට වැටෙනවා. ඊළඟට ඒක දැනීම තුළින් කලකිරීම, 'විරාගානුපස්සනා' ඔන්න නිවන පැත්තට මේ යොමුවන්නේ. ඒක තුළින් කලකිරීම. විරාගානුපස්සනා. ඒ එක්කම තණ්හාව තුනීවෙන කොට නිරෝධය. ආශ්වාසය ප්‍රශ්වාසය වැටෙන එක. මේක ඇතිවෙනවා නැතිවෙනවා කියන එක. දැන් අපි සාමාන්‍යයෙන් ආශ්වාසය ප්‍රශ්වාසය ගැන සිතන කොට ආශ්වාසය අර සෘජුරේඛාවක් හැටියට ගන්නවා. පස්සේ මේක වැටහෙනවා උඩට යනවා වැටෙනවා. උඩට යනවා පහතට වැටෙනවා. අන්න ඒ වගේ දෙයක්. ඒ නිරෝධය. නිරෝධය වැඩියෙන් පේන්න පටන් ගන්නවා. ඊළඟට ඒක තුළින් මේක පිළිබඳව අර ආත්ම සංඥාවත් නැතිවෙන තත්ත්වය 'පටිනිස්සග්ගානුපස්සී'. මේකත් අතාරින්න. ආශ්වාස ප්‍රශ්වාස-හැම ආශ්වාසයක්ම ප්‍රශ්වාසයෙන් කෙළවර වෙනවා. එතකොට ඒක තුළ පටිනිස්සග්ගය කියන්නේ අතහැරීම- 'වොස්සග්ග' කියන නිවනට උපකාරවන.

ඔන්න ඔය ආකාරයට බුදුරජාණන් වහන්සේ දහසය පියවරක් දක්වනවා ආනාපාන සතිය පිළබඳව. එයින් හතරයි- මුල්හතරයි- බොහෝ දෙනාට ප්‍රායෝගික වශයෙන් එදිනෙදා ජීවිතයේ උපකාර වන්නේ. කලාතුරකින් යෝගාවචරයෙකුට අර අනික් ඒවත් උපකාරවන්න පුළුවන්. ඇතැම් කෙනෙක් මුල් හතර කරලා ඉවර වෙලා වෙන කමටහනක් ඔස්සේ විදර්ශනාව වඩනවා. තනිකර ආනාපාන සතිය වඩනවා නම් අන්න අර කියාපු අවස්ථාවන් සියුම් අන්දමින් පෙන්නුම් කරනවා. නමුත් හැම භාවනාවකටම වඩා ආනාපානසති භාවනාව ප්‍රබල වටිනා දෙයක් බව බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනවා. ඒකේ ආනිශංස මෙන්න මේ විධියට. ඒකයි ඊළඟට අපි කල්පනා කරන්ට ඕනෑ.

බුදුරජාණන් වහන්සේ මේ ආනාපාන සතියේ වටිනාකම ප්‍රකාශකර වදාළ අවස්ථා රාශියක් තිබෙනවා. එක් අවස්ථාවක බුදුරජාණන් වහන්සේ සංඝයා වහන්සේලාට ප්‍රකාශ කරනවා. 'මහණෙනි, මම සම්බෝධියට කලින් බෝධිසත්ත්ව අවස්ථාවේ පවා මෙන්න මේ ආනාපානසති භාවනාව මේ විධියට වැඩුවා. ඒ වැඩීමේ ආනිශංස උන්වහන්සේ ප්‍රකාශ කරනවා. 'ඒ නිසා

මට කයේ ක්ලාන්තබවක් දැනුනෙත් නැත. ඇසට ක්ලාන්ත බවක් දැනුනෙත් නැත.' ආනාපානසති භාවනාව වඩන කොට කයට ක්ලාන්ත බවක් දැනෙන්නේ නැහැ. වෙහෙසක් දැනෙන්නේ නැහැ. ඇස්වලට වේදනාවක් දැනෙන්නේ නැහැ. ඇයි එහෙම කියන්නේ? දැන් කසින ආදී අට්ඨික ආදී, ඇසින් නිමිති ගැනීම් කරන භාවනාවලදී යම්කිසි වෙහෙසක් කෙනෙකුට ඇති වෙනවා. බාහිර අරමුණක් හිතට ගැනීමට යම් වෙහෙසක් දරන්න වෙනවා. දැන් මෙතන ස්වභාවිකව තමා ළඟම තිබෙන දෙයක්. අන්න ඒකයි අර බුදුරජාණන් වහන්සේ බෝධිසත්ත්ව කාලයේ පවා බහුල වශයෙන් මේ ආනාපාන සතිය පුරුදු කළ බව ප්‍රකාශ කරලා "මහණෙනි, යම් භික්ෂුවක් බලාපොරොත්තු වෙනවා නම් මගේ කය ක්ලාන්ත නොවේවා ඇස්වලට පීඩාවක් නොවේවා කියලා එහෙනම් මේ ආනාපානසති භාවනාව වඩන්න" කියලා තමන් වහන්සේගේ අත්දැකීම් ආශ්‍රයෙන් බුදුන් වහන්සේ ආනිශංස පක්ෂය දක්වනවා. ආනාපානසති භාවනාව අනිත් භාවනාවන්ට වඩා ඉතාමත්ම සුඛ විහරණයට උපකාරවන බව ඒවගේම විශේෂ සූත්‍රයක බුදුරජාණන් වහන්සේ පෙන්නුම් කරනවා. 'ආනාපානසති සමාධි භාවිතො බහුලීකතො සන්තොචෙව පණීතොච අසෙචනකො සුඛො ච විහාරෝ' කියලා පද කීපයක් සඳහන් වෙනවා. ආනාපානසති සමාධිය ශාන්තයි ප්‍රණීතයි. ඔන්න ඊළඟට වටිනා වචන දෙකක් සඳහන් වෙනවා. 'අසෙචනකො සුඛො ච විහාරෝ' ශාන්තයි ප්‍රණීතයි අසේචනකො සුඛො ච විහාරො-කියල කියන්නේ තනිකර- අමුතුවෙන් යමක් එකතු නොකරම- ඒක සුඛ විහරණයක්. උපමාවක් කියනව නම් දැන් සමහර ආහාරවල රසයක් නැතිවෙන කොට අපි රසකාරක දානවා. එහෙම නැත්නම් කේක් එක රස නැති වෙනකොට අයිසිං එකක් දානවා. මේ ආනාපානසති භාවනාවට අමුතුවෙන් රස එකතු කරන්න දෙයක් නැහැ. මේක ස්වාභාවික රසයකින් යුක්තයි. ශාන්තයි ප්‍රණීතයි 'අසෙචනකො සුඛො ච විහාරෝ' කියලා අන්න එහෙම ආනාපානසති භාවනාව පිළිබඳව ඒකේ තියන විශේෂ ශාන්ත ප්‍රණීත දිට්ඨ ධම්ම සුඛ විහරණයට හේතුවන ආකාරය ප්‍රකාශ කළා.

ඒ වගේම ඒ එක්කම බුදු රජාණන් වහන්සේ උපමාවක් දෙනවා. 'මහණෙනි, ගිම්හාන ඍතුවේ අවසාන මාසයේ අකාල මේඝයක් වැස්සාම පැන නැඟිලා තියන ධූලි, දැන් පාරවල් වල එහෙම පැන නැඟිල තියන ධූලි, අකාල මේඝයක් තුළින් සංසිඳෙනවා වගේ ආනාපානසති සමාධිය තුළින් අර පාප අකුසල ධර්ම සංසිඳෙනවා කියලා ඒ විධියටත් ආනිශංසයක් දක්වනවා. තවත් උපමාවක් දක්වනවා ආනාපානසති සමාධිය තුළින් අර සතරාකාරයෙන් වැඩුවාම- සතර සතිපට්ඨානයට අදාළ අන්දමින්- ඒකේ ආනිශංස ප්‍රකාශ කරන්නේ ඔන්න සතර මං සන්ධියක ධූලි ගොඩක් තියනවා, එහෙම නැත්නම් පස් ගොඩක් තියනවා. සතර මං සන්ධියක තියන පස්ගොඩක් බොහොම පහසුවෙන් ඒ යන වාහන නිසා තුනී වෙනවා. යන යන වාහනයට අර පස්ගොඩ යටවෙලා තුනීවෙලා යනවා. අන්න ඒ වගේ ආනාපානසතිය අර

කියාපු දහසය ආකාරයකින් සතර සතිපට්ඨානයට අදාළ අන්දමින් වැඩීමේදී අර මංසන්ධියේ කතාවට ගැලපෙනවා. එහෙම වඩන කොට පාපක අකුසල ධර්ම කෙලෙස් ඒවා එහෙමම සමනය වනවා. ඔය ආනාපානසති භාවනාවේ ආනිශංස වදාළ තැන්.

තවත් අවස්ථාවක ධර්මයේ සඳහන් වෙනවා බුදුරජාණන් වහන්සේ තුන්මාසයක් වස්කාලය විවේකයට වැඩම කළා. ඒවගෙ බොහෝ අවස්ථා සඳහන් වෙනවා ධර්මයේ. මේ අවස්ථාවේ බුදුරජාණන් වහන්සේ භික්ෂූන් වහන්සේලාට කියනවා 'මහණෙනි, මම බලාපොරොත්තු වෙනවා තුන් මාසයක් විවේකයට යන්න. කැලේට යන්න. කවුරුවත් මාව හමුවන්න එන්න එපා. පිණ්ඩපාතය අරගෙන එන භික්ෂුව හැර' කොහොමද එතකොට ආනන්ද හාමුදුරුවන්ට වත් දන් යන්න ඉඩ නැහැ. මහා පුදුමයි. නමුත් බුදුරජාණන් වහන්සේ මේ යන්නේ මොකටද? දුක් විඳින්න නොවෙයි. දිට්ඨධම්ම සුඛ විහරණය සඳහා. මෙලොවම සැප විඳීම සඳහා. එතකොට බුදුරජාණන් වහන්සේත් සංඝයා වහන්සේලා වෙනුවෙන් මුළු දවසම ගත කිරීම තුළින් කයකට ඔරොත්තු නොදෙන තරම් පීඩාවල් වින්දා. අපි මේ බුදුරජාණන් වහන්සේ ගැන හිතන ආකාරයටම නොවේ. පිළිමයක් දැකලා අපි හිතන ආකාරයට නොවේ. කොයි තරම්- රෑට හරියට නින්දකුත් නැතිව ඇතැම් අවස්ථාවල ධාතු කෝපවීම නිසා ජීවක වෙදමහත්තයාට විරේක බෙහෙත් දෙන්නත් සිදුවුනා. අන්න ඒක නිසා මේ කයේ තත්ත්වය දැනගෙන බුදුරජාණන් වහන්සේ ඒ විවේක සුවය- ඒ වගේම උන්වහන්සේ විවේකයට යන්නේ කාරණා දෙකක් නිසා බව සඳහන් වෙනවා. බුදුරජාණන් වහන්සේ මොකටද විවේකයට යන්නේ ඔක්කොම වැඩ ඉවර නේ? බුදු වෙලා ඉවර නේ? යන්නෙ මොකටද? එතන සඳහන් වෙනවා 'දිට්ඨ ධම්මසුඛ විහාරං ච පච්ඡිමංච ජනතං අනුකම්පමානො' තමන්ගේ දිටුදැමියෙහි මෙලොව වශයෙන් සුඛ විහරණය සඳහාත් පශ්චිම ජනතාව කියන්නේ පසුවට එන සංඝයා වහන්සේලාට ආදර්ශයක් සඳහාත් බුදුරජාණන් වහන්සේ කැලයට වැඩියා භාවනාව සඳහා.

මොන භාවනාව සඳහාද? ඔන්න ඊළඟට කියවෙනවා, බුදුරජාණන් වහන්සේ තුන්මාසය කැලේ ඒ විධියට තනිව වැඩ වාසය කරලා ඇවිල්ලා සංඝයා වහන්සේලාට ප්‍රකාශ කරනවා 'මහණෙනි, අන්‍ය තීර්ථක පරිබ්‍රාජකයින් ඇහුවොත් බුදුරජාණන් වහන්සේ කවර නම් විහරණයකින් බහුල වශයෙන් වාසය කළාද, කවර විහරණයකින් විවේකය ගත කළාද කියල මෙහෙම කියන්න. මම ආනාපානසති සමාධියෙන්ය වාසය කළේ. අන්න එතනිනුත් පෙන්නුම් කරනවා. ඊළඟට ප්‍රකාශ කරනවා බුදුරජාණන් වහන්සේ ආනාපාන සති භාවනාවේ ශ්‍රේෂ්ඨත්වය, විශිෂ්ටත්වය උත්තරීතර තත්ත්වය මේ විධියට. 'මහණෙනි, යමෙක් කියනවා නම් 'අරිය විහාරො' කියලා 'තථාගත විහාරො' කියලා 'බ්‍රහ්ම විහාරො' කියලා කියන්න ඕන ඒ ආනාපානසති සමාධියටයි. එතකොට අමුතු දෙයක් නෑ නේ. එතකොට යමක් ප්‍රකාශ කරනවා නම්

ආර්ය විහරණය කියලා යමක් ප්‍රකාශ කරනවා නම් බ්‍රහ්ම විහරණය කියලා, යමක් ප්‍රකාශ කරනවා නම් තථාගත විහරණය කියලා, ප්‍රකාශ කරන්න ඕන ඒ ආනාපානාසති සමාධිය පිළිබඳවයි කියලා බුදුරජාණන් වහන්සේ වදාළා. එයින් අපට පෙනෙනවා එතකොට ආනාපානාසති භාවනාව තමයි මේ ශාසනයේ තියෙන භාවනාවන් අතුරෙන් අග්‍රගණ්‍ය රජමාවත. ඒකයි. අතීතයේ හැම බුදුවරුන්ම ඒ තත්ත්වය ලැබුවේ ආනාපානසති භාවනාව තුළිනුයි. මොකද, ඒ අර කියාපු විජ්ජා විමුත්ති කියලා කියන උපරිම මට්ටමෙන් අවබෝධය එන්නේ මේ ශරීරයටම අදාළ මූලික ක්‍රියාවලිය තුළිනුයි. මේක තුළයි සැඟවිලා තියෙන්නේ අවිද්‍යාවත් තෘෂ්ණාවත්. ආශ්වාස ප්‍රශ්වාස ක්‍රියාවලිය. ඒකමයි අර අන්‍ය ආගමිකයින් ආත්මයක් හැටියට අරගෙන ඒකට 'ප්‍රාණ' කියලා කියන්නේ. ඒ ආත්මයක් හැටියට ගන්නේ. බුදුරජාණන් වහන්සේ සංස්කාර පිළිබඳ අවබෝධය තුළින් නිවන් මඟ මතු කරලා දුන්නා. මේ ආශ්වාස ප්‍රශ්වාස ක්‍රියාවලිය තුළින්. ඒක තමයි ඔය මැදුම් පිළිවෙතට බැස්ස අවස්ථාව.

අපි කල්පනා කරන්න ඕන බුදුරජාණන් වහන්සේත් අතීතයේදී අර නිගණ්ඨයින් වගේ ආශ්වාස දඬිව හිරකරගෙන ක්ලාන්ත වෙලා වැටුනා. යම් අවස්ථාවක හිතුනා මේක නොවේ මාර්ගය, මේක නොවේ මාර්ගය, 'සියා නු බො අඤ්ඤො මග්ගො බොධාය' වෙන මාර්ගයක් තියෙන්න ඕන කියලා හිතෙන කොට ඔන්න ඊළඟට උන්වහන්සේ තමන් වහන්සේගේ අත්දැකීම ප්‍රකාශ කරන අරිය පරියේසන සූත්‍රයේ වදාළ 'මට ඒ වෙලාවේ මතක් වුනා පිය මහරජුගේ ඒ වප් මඟුල අවස්ථාවේ මම ආනාපානසතියේ ප්‍රථම ධ්‍යානයට වැටුන අවස්ථාව.' අන්න අර බෝධිසත්වයින් වහන්සේගේ අත්දැකීම ආයි මතුවුනා. එතකොට බුදුරජාණන් වහන්සේගේ ඒ පාරමී ශක්තිය තුළින් සවාභාවිකව තිබූ ඒ අවබෝධය සමාජයේ පැතිරිලා තිබුන අර අත්තකිලමථානුයෝග මතය නිසා අන්න නුහුරට ගිහිල්ලා අර හය අවුරුද්දක් දුෂ්කර ක්‍රියා කරලා යම් අවස්ථාවක ඒවායේ නිස්සාරත්වය දැකලා ආපහු වැටුනේ මේ ආශ්වාස ප්‍රශ්වාස තුළ ස්වාභාවිකවම සතිය පිහිටුවීමටයි. ප්‍රාණායාම වගේ, උත්සාහයෙන් කරන යෝග අභ්‍යාස වගේ, දෙයක් නොවේ. අන්න ඒ ටික අපි තේරුම් ගත්තා නම් ඊළඟට ඒ තුළින් මතුවුන අවබෝධය තමයි මේක සංස්කාරයක් පමණයි. ආශ්වාසය ප්‍රශ්වාසය තුළිනුයි කය සකස් වන්නේ. මේක ආත්මයක් නොවේ. හැම ආශ්වාසයක්ම ප්‍රශ්වාසයකින් කෙළවර වෙනවා. හැම ප්‍රශ්වාසයක් ආශ්වාසයකින් කෙළවර වෙනවා. මේකයි අනිත්‍යතාව. එතනම තියෙනවා දුක් ස්වභාවය. අපි කවුරුත් ඇදුම රෝගියෝ. ඊළඟට ඒකම තමයි අනාත්ම ස්වභාවය. මේකේ මමය මගේය කියල ගන්න තරම් දෙයක් නැහැ. මේ හුස්ම රැල්ල, පණකෙන්ද, උඩයි මේ ලෝකය- මේ අපේ මනුෂ්‍ය ජීවිතය තියෙන්නේ කියන අවබෝධය මතුවුන අවස්ථාවේ බුදුරජාණන් වහන්සේ තථාගත තත්ත්වය ලබාගත්ත බවයි අපට හිතාගන්න තියෙන්නේ.

එතකොට මේ පැයක් තුළ කිවයුතු හැම එකක්ම කියනවා නොවේ. මේ තුළින් යමක් ගන්න පුළුවන් නම් ප්‍රායෝගිකව භාවනායෝගීන් ගතයුතුව තිබෙනවා.එතකොට ඇතැම් අයට තියන අර ප්‍රශ්න ආනාපානසතිය එච්චර හොඳ වුනත් හරි අමාරුයි. මොකද විතර්ක පීඩනය වැඩියි. විතර්ක පීඩනය වැඩි නම් කරන්න තියෙන්නේ අන්න අර අපි නිතර මතක් කරන සතර කමටහන් ආදී විතර්ක කපාහැරීමට උපකාරී වන 'බුද්ධානුස්සති මෛත්‍රා අසුභ මරණසති' ආදිය වඩලා විතර්ක පීඩනය තරමක් අඩුකරගෙන ආනාපානසතියට බහිනවා මිසක් උත්සාහයෙන් ආශ්වාස ප්‍රශ්වාස කරලා ඒ ආනාපානසතිය හදා ගන්න යන එක මෝඩ කමක් හැටියටයි කියන්න වෙන්නේ. යම් අවස්ථාවක ස්වාභාවිකව කරතොත් අර බුදුරජාණන් වහන්සේ දුන්න අවවාදය අනුව, අන්න අවසානයේ බුදුරජාණන් වහන්සේ දක්වන අර ගාථාවේ දක්වෙන- කිව්ව නේ අර:

"ආනාපානසතී යසස - පරිපුණ්ණා සුභාවිතා
අනුපුබ්බං පරිචිතා - යථා බුද්ධෙන දෙසිතා
සොමං ලොකං පභාසෙති - අබ්භා මුත්තොව චන්දිමා"

යම්කෙනෙකුන් විසින් ආනාපානාසතිය පරිපූර්ණ වශයෙන් අර දහසය ආකාරයෙන්ම වඩන ලද්දේද, ඒ වගේම අනුපිළිවෙලින් පුරුදු කරන ලද්දේද, බුදුරජාණන් වහන්සේ දේශනා කළ ආකාරයට- ඒ තැනැත්තා මුළු ලෝකය ආලෝකවත් කරනවා කළු වළාකුළින් මිදුන සඳමඩලක් වගේ.

එතකොට මේ පින්වතුන් කල්පනා කරන්න ඕන. ගතයුතු ප්‍රායෝගික පිහිට අරගෙන මේ වටිනා සීලයක් සමාදන් වෙලා අද දින භාවනාව තම තමන්ගේ ප්‍රමාණයෙන් කළා. එතකොට මේ රජමාවතට වැටෙන්න ඒවා උපකාර කරගන්න ඕනෑ. එහෙම කරගෙන තමන් බලාපොරොත්තු වන උත්තමාර්ථයන් වන සෝවාන් සකදාගාමී අනාගාමී අර්හත් කියන මාර්ග ඵල ප්‍රතිවේධය සඳහා මෙන්න මේ භාවනාවත් හරියාකාරව කරලා ඉක්මණින්ම ජාති ජරා ව්‍යාධි මරණ ආදී සියලු සංසාර දුකින් අත්මිදිලා උතුම් අමා මහ නිවනින් සැනසෙන්න කල්පනා කර ගන්න ඕනෑ. එතකොට අද දින පුරන ලද සීලයත්, කරන ලද භාවනාවත්, මේ අසන ලද ධර්ම දේශනාවත්, තමතමන්ගේ අර කියාපු නිවන් ප්‍රාර්ථනා ඉෂට සිද්ධකර ගැනීමට උපකාර වේවා. උපනිශ්‍රය වේවා කියා ප්‍රාර්ථනා කර ගන්න. ඒ වගේම අවීචියේ සිට අකනිටාව දක්වා වූ යම්තාක් කෙනෙක් ධර්ම දේශනාමය ධර්ම ශ්‍රවණමය කුසලය අනුමෝදන් වීමට කැමති නම් ඒ අනුමෝදන් වීම තුළින් ඒ කුසලයත් උපනිශ්‍රය කරගෙන ප්‍රාර්ථනීය බෝධියකින් උතුම් අමාමහ නිවනින් සැනසෙත්වා කියා ප්‍රාර්ථනා කරගෙන මේ ගාථා කියන්න.

එත්තාවතා ච අම්හෙහි ................

## 03

පහන් කණුව ධර්ම දේශනා අංක 149

# නමො තසස භගවතො අරහතො සමමා සමබුදධසස

**උරගොව තචං ජිණ්ණං - හිත්‍වා ගච්ඡති සං තනුං**
**එවං සරීරෙ නිබ්භොගෙ - පෙතෙ කාලකතෙ සති**
**ඩය්හමානො න ජානාති - ඤාතීනං පරිදෙවිතං**
**තස්මා එතං න සොචාමි - ගතො සො තස්ස යා ගතී**

**- උරග ජාතක - ජාතක පාළි**

සැදැහැවත් පින්වතුනි,

ඉපදෙමින් මැරෙමින් යන මේ දීර්ඝ සංසාර ගමන කෙළවර කරගන්න කෙනෙක් උනන්දු නොවන්නේ මත්වීම් තුනක් නිසා බව තිලෝගුරු බුදුරජාණන් වහන්සේ අපට මතක් කර දෙනවා. යෞවන මදය, ආරොග්‍ය මදය, ජීවිත මදය කියන මත්වීම් තුනෙන් ප්‍රමාදයට වැටිලා සත්ත්වයා නැවත නැවතත් සසර දුකෙහිම ගැලෙන බව උන්වහන්සේ වදාළා. තරුණකමත්, නිරෝගිකමත් නිසා ඇතිවන මාන්නයටත් වඩා තමා ජීවත් වෙනවා කියන අදහස තුළින් ඇති කරගන්නා මානය, සියුම් මානය, ප්‍රමාදයට හේතුවෙනවා. ඒ ප්‍රමාදයෙන් මිදිලා අප්‍රමාදීව නිවන් ගමනට යොමුවෙන්න මරණසතිය වඩන්න කියලා බුදුරජාණන් වහන්සේ අපට අවවාද කරනවා. උන්වහන්සේ බෝධිසත්ත්ව කාලයේදී පවා තමන් ඇසුරේ සිටි අයට මේ අවවාදය කළ බව හෙළිවන ජාතක කථාන්තරයකුයි මේ අද මාතෘකා කරගත්තු ගාථාවලට අදාළව දක්වෙන්නේ.

බුදුරජාණන් වහන්සේ සැවැත් නුවර වැඩවාසය කරන කාලයේ සැවැත් නුවර එක්තරා ගෘහපතියෙකුගේ පුත්‍රයෙක් කාලක්‍රියා කරලා දවස් ගණනක් ශෝක කරමින් සිටියා. බුදුරජාණන් වහන්සේ ඒ උපාසක උන්නැහේගේ ගෙදරට වැඩම කරලා ශෝකයට හේතුව ඇසුවාම "පුතා මළ දවසේ ඉඳලා මම බොහොම කණගාටුවෙන් ඉන්නේ" කියලා ප්‍රකාශ කළා. බුදුරජාණන් වහන්සේ ඒ අවස්ථාවේ ප්‍රකාශ කළා, "උපාසකය, බිඳෙනසුළු දේ බිඳෙනවා, නැසෙන සුළු දේ නැසෙනවා. මේක එක පුද්ගලයෙකුට, ගමකට, සීමාවුනු දෙයක් නොවේ. සියලු සක්වල වල හැම භවයකම හැම සත්ත්වයින්ට පොදු දෙයක්. සාධාරණ දෙයක්. අතීතයේ පණ්ඩිතයින් තමාගේ පුත්‍රයා මියගියාම කිසිම ශෝකයක් නැතිව විනාශවන දේ විනාශ වෙනවා කියන අවබෝධය

ඇතිකරගෙන ඒවා දරා ගත්තා." කියලා ප්‍රකාශ කරල ඊළඟට ඒකට අදාළව උරගජාතකය උන්වහන්සේ වදාළා.

අතීතයේ බරණැස් නුවර බ්‍රහ්මදත්ත කියන රජ්ජුරුවෝ වාසය කරන කාලයේ ඒ නගරයේ දොරටු අසල බ්‍රාහ්මණ ගමක බෝධිසත්ත්වයින් වහන්සේ බමුණු පවුලක ඉපදිලා ගොවිතැනින් පවුල්ජීවිතයක් ගෙනයමින් සිටියා. එක පුතෙකුත් දුවකුත් සිටියා. ඒ පුතා තරුණ වයසට පත්වුනාම විවාහයක් කරගත්තා. ඒ පවුලේ ගෙදර හයදෙනෙක් සිටි බවයි කියවෙන්නේ. ඒ බ්‍රහ්මණයත් බැමිණියත් පුතත් දුවත් ලේලියත් දාසියත් කියන ඔය හයදෙනා. බෝධිසත්ත්වයන් වහන්සේ නිරන්තරයෙන්ම අර පස් දෙනාට දන්දෙන්න සිල්රකින්න, පෙහෙවස් සමාදන් වෙන්න, නිරන්තරයෙන් මරණ සතිය පුරුදු කරන්න කියලා මේ හැමදෙයක්ම විනාශවෙනවා කියන අදහස මතක් කරදෙමින් හිටියා. ඉතින් ඔහොම ඉන්න අතරේ, බොහොම සමගියෙන් ඒ කට්ටිය ජීවත්වෙන අතරේ, එක දවසක් ඒ බ්‍රාහ්මණයා පුතත් එක්ක කෙත සීසාන අතරේ පුතා කැලිකසළ ආදිය එකතු කරලා ගිනිගොඩක් ගහලා දවනකොට ඒ කිට්ටුව හුඹහක හිටපු නයෙක් කිපිලා ඇවිල්ලා මේ පුතාට දෂ්ට කළා. දෂ්ටකළ හැටියෙම එහෙමම මැරිලා වැටුනා. බ්‍රාහ්මණයා නඟුල තියලා ඇවිල්ලා බලලා ඒකෙන් කිසිම ශෝකයක් ඇතිකරගන්නේ නැතිව, පුතාව ඔසවාගෙන ගිහිල්ලා ගහක් යට හාන්සි කරලා රෙද්දකින් වහලා නැවතත් සීසාන්න පටන් ගත්තා, අනිත්‍යතාව මෙනෙහි කරමින්.

ඒ අතරේ තමන්ගේ අසල් වැසියෙක් ඒ කිට්ටුවෙන් යනවා දකලා, ගෙදරද යන්නේ කියලා අහලා ගෙදරට යනවා නම් මෙන්න මේ පණිවුඩය බ්‍රාහ්මණියට කියන්න කියලා. 'අද වෙනදා වගේ දෙන්නෙකුට ආහාර නොවේ එක්කෙනෙකුට ආහාර අරගෙන එන්නෙයි දාසිය අත එවන්නේ නැතිව හතර දෙනාම මෙහාට එන්න පිරිසිදු සුදු වස්ත්‍ර ඇඳගෙන සුවඳ මල් අරගෙන, එක්කෙනෙකුට විතරක් ආහාර අරගෙන එන්න' කියලා. ඒ ආරංචිය තුළින්ම බැමිණිය දැනගත්තා පුතා කළුරිය කළ බව. නමුත් කිසිම ශෝකයක් ඇතිකරගත්තේ නැහැ. ඒ කට්ටිය ආහාර අරගෙන ආවට පස්සෙ බ්‍රාහ්මණයා පුතා හාන්සිකළ තැනම ඉඳගෙන ආහාර ටික අනුභව කරලා දරසෑයක් හදලා පුතාගෙ සිරුර දවන්න පටන් ගත්තා. එතකොට මේ අවස්ථාවේ, කිසිම ශෝකයක් නැතිව මේක දවන අවසථාවේ, බොහෝ තැන්වල ඔය ජාතක කථාවල තියන ආකාරයට ඔවුන්ගේ සීල තේජස නිසා ශක්‍රභවනය උෂ්ණ බව දැනිලා ශක්‍රයා මේ අය ලවා මරණ සතිය පිළිබඳව සිංහනාද කරවලා සත්රුවන් පුරවා එන්න ඕනෑ ඒ ගෙදර කියලා කල්පනා කරගෙන වෙස්වළාගෙන ඇවිල්ලා අර දවන අතරේ ඉස්සරවෙලාම බ්‍රාහ්මණයගෙන් අහනවා'කවුද දවන්නේ කියලා'. 'මනුස්සයෙක්ය' කිව්ව. එතකොට 'මනුස්සයෙක් වෙන්න බැහැ' මුවෙක් වෙන්න ඇති. 'නැහැ මනුස්සයෙක්ම තමා' 'එහෙනම් වෛරකාරයෙක්ද?' 'නෑ, අපේම පුතා' 'අප්‍රිය පුතෙක්ද?' 'නැහැ අපේම

බොහොම ප්‍රිය පුතා' 'මොකද එහෙනම් අඬන්නේ නැත්තේ?' කිව්වාම ඔන්න එතකොට ප්‍රකාශ කළ ගාථාවයි අපි අර මාතෘකාව වශයෙන් දක්වූයේ.

**උරගොව තචං ජිණ්ණං - හිත්වා ගච්ඡති සං තනුං**
**එවං සරීරෙ නිබ්බොගෙ - පෙතෙ කාලකතෙ සති**

**ඩය්හමානො න ජානාති - ඤාතීනං පරිදෙවිතං**
**තස්මා එතං න සොචාමි - ගතො සො තස්ස යා ගතී**

අර සර්පයාගෙන්ම උපමාව ගත්තු බවයි පෙනෙන්නේ. එතකොට හරියට සර්පයෙක් තමාගේ හැව අතහැරලා ගියා වගේ කෙනෙක් මෙතනින් මිය පරලොව ගියාට පස්සේ ඒ ජිවිතින්ද්‍රිය පරිහරණය නොකරනු ලබන ඒ ශරීරයත් ඒ තත්ත්වයේමමයි. ඒ ශරීරය දවනකල්හි නෑයන්ගේ වැළපීම් ආදිය මරණ කාරයාට අවබෝධයක් නැහැ. මළසිරුරට නෑයින් ඇඬුවයි කියල ඒක දනෙන්නේ නැත. එම නිසා මම මගේ පුතා වෙනුවෙන් හඬන්නේ නැත. ඒ මියගිය පුතා තමන්ගේ කර්මානුරූපව සුදුසු තැනකට ගිහිල්ලා තියනවාය කියන එකයි, ඒ අදහසයි, ගාථා දෙකේ තියෙන්නේ.

ඉතින් ඔය ගාථා දෙක ප්‍රකාශ කළාට පස්සේ ශක්‍රයා බැමිණියගෙන් ඇහුවා මේ මරණකාරයා ඔබේ කවුද? කියලා. 'මගේ පුත්‍රයා. මම දසමාසක් කුසේ දරාගෙන ඉඳලා කිරිපොවලා කවලා පොවලා ඇතිදැඩි කළ දරුවයි' කියලා කිව්වා. 'පියාට නම් පුරුෂයෙක් නිසා ඒ ශෝකය දරාගන්න පුළුවන් නමුත් මවගේ හදවත සාමාන්‍යයෙන් මෘදුයි. ඇයි හඬන්නෙ නැත්තේ?' කියලා ඇහුවාම ඒ මව කීවා ගාථාවක්.

එතන අදහස තියෙන්නේ- ගාථාව අමුතුවෙන් නොකීවත් - අදහස වශයෙන් ගත්තොත් අපේ ආරාධනයක් නැතිව, අපි එන්න කියන්නේ නැතිව, ඒ අය ආවා. මේ පුතා ආවා. අපෙන් අවසර නැතිව ගියා. ආවා වගේම ගියා. මොකටද මේකට අඬන්නේ? කියලා ඒ අදහස දෙන ගාථාවකින් බැමිණිය පිළිතුරු දුන්න බවයි කියවෙන්නේ.

ඊළඟට ඒ නැඟනිය ළඟට ගිහිල්ලා සහෝදරිය ළඟට ගිහිල්ලා ඇහුවා 'මේ ඔබේ කවුද' කියලා. 'මේ මගේ සොහොයුරා' කිව්වාම 'ඇයි ඉතින් සොහොයුරු ප්‍රේමය තියෙනවා නේද? සොහොයුරු ස්නේහය තියනවා නේද? ඇයි අඬන්නේ නැත්තේ?' කියලා ඇහුවාම ඒ තැනැත්තියත් කියනවා 'මම ඇඬුවත් ඒකෙන් මියගිය සහෝදරයාට කිසිම ප්‍රයෝජනයක් නැහැ. නිකම් මම කෙට්ටුවෙනවා, දුර්වල වෙනවා විතරයි. මගේ නෑයිනුත් හිත දුර්වල කරගන්නවා. වඩ වඩාත් අප්‍රිය තත්ත්වයකට මා පත්වෙනවා විතරයි ඒකෙ ප්‍රතිඵලය, කියලා ඒ අදහස නැඟණිය ප්‍රකාශ කළා.

ඊළඟට භාර්යාව ළඟට ගිහිල්ලා ඇහුවා ඔබේ කවුද කියලා.

'මගේ ස්වාමිපුරුෂය'යි කිව්වා. එතකොට 'සාමාන්‍යයෙන් භාර්යාවක් ස්වාමි පුරුෂයා නැතිවුනාම වැන්දඹුවක් වෙලා අනාථවන නිසා බොහොම දුක්වෙන එකයි ස්වභාවය. ඇයි ඔබ දුක් වෙන්නෙ නැත්තෙ?' කියලා ඇහුවාම එතකොට ඒ භාර්යාව කියනවා 'හරියට කුඩා දරුවෙක් අහසේ යන හඳ දැකලා මවට හඳ මට ලබාදෙන්න කියනවා වගේ දෙයක් තමා මිය පරලොව ගිය කෙනා පිළිබඳව ඇඬීම. ඒකත් නිශ්ඵලයි' කියලා ඒ භාර්යාවත් ප්‍රකාශ කළා.

ඊළඟට දාසිය ළඟට ගිහිල්ලා ඇහුවා 'මේ ඔබේ කවුද?' කියලා. 'මේ මගේ හාම්පුතා' කියල කිව්වාම 'එහෙනම් ඔබට හොඳට බැණලා තළලා වැඩ ගන්න ඇති. ඒක නිසා දැන් ඉතින් මැරුණ එක හොඳයි කියලා වෙන්න ඇති අඬන්නේ නැත්තේ' 'නෑ නෑ එහෙම කියන්න එපා. මගේ පුතෙක් වගේ හරියට බොහොම දයාවෙන් මෛත්‍රියෙන් කරුණාවෙන්, සලකපු කෙනෙක්ය.' 'ඉතින් අඬන්නෙ නැත්තේ මොකද?' කියලා ඇහුවම දාසිය දෙනවා දාසියටම ගැලපෙන උපමාවක්. 'බිඳිච්ච කලයක් ආයෙත් කෑලි එකතු කරලා හරිගස්සන්න බැරිව වගේ මිය ගියාට පස්සේ අඬන්න දෙයක් නැහැ' කියන ඔය අදහසයි කීවේ.

ඉතින් මේක ප්‍රකාශ කළාට පස්සේ ශක්‍රයා ඒ ගැන ප්‍රශංසා කරලා මේ මරණ සතිය වැඩීම ගැන, මීට පස්සේ වෙහෙස මහන්සි වෙලා වැඩ කරන්න එපා. මම ගෙය සත්රුවන් වලින් පුරවනවා කියලා අවවාද කරලා ගියාය කියන එකයි කියැවෙන්නේ. ඊළඟට ඒ කථාව අවසාන වෙන්නේ සාමාන්‍යයෙන් ජාතක කථාවක් අවසාන වන ආකාරයට. මේ ජාතක කථාව ප්‍රකාශ කරලා බුදුරජාණන් වහන්සේ ඊළඟට චතුරාර්ය සත්‍යය දේශනාකළා. බුදුරජාණන් වහන්සේ බොහෝ අවස්ථාවල මරණකාරයකුගේ ගෙදරට වඩින්නේ වෙන දෙයකට නොවේ රත්වෙච්ච වෙලාවේ තලන්න ඕන නිසා. එතකොට මේ ජාතක කථාවෙන් අතීත සිද්ධියකින් අර ශෝකය තුනී කරලා ඊළඟට සංවේගය ඇතිකරලා චතුරාර්ය සත්‍යය දේශනා කළාට පස්සේ අර කියාපු ගෘහපතියා සෝවාන් ඵලයට පැමිණි බව ප්‍රකාශ කරනවා. ඊළඟට ඒ ජාතක කථාවේ සඳහන් වෙනවා සාමාන්‍ය ජාතක කථාවක ක්‍රමයට- මෙතන දක්වන්නේ චරිත හඳුනා ගැනීම් වශයෙන් දක්වන්නේ, ඒ දාසිය ඛුජ්ජුත්තරා උපාසිකාවය බුද්ධ කාලයේ. ඊළඟට දුව උපුල්වන් මෙහෙණියයි. ඊළඟට භාර්යාව ඛේමා තෙරණියයි-මේ බුදුධකාලයේ හිටි අය එක්ක සම්බන්ධකරලා. ඊළඟට පුත්‍රයා රාහුලය. බ්‍රාහ්මණයා තමන් වහන්සේය කියලා ඔය විධියට ජාතක කථාව සම්පූර්ණ කළ බවයි කියන්නේ.

ඉතින් මේ ජාතක කථාව ආශ්‍රයෙන් අපට හිතාගන්න පුළුවන් මේ මරණ සතිය වැඩීමේ මූලිකම ආනිශංසය එදිනෙදාට අන්න අර කියාපු ප්‍රිය විප්‍රයෝග දුක්ඛය- තමන් සමඟ ඇසුරු කරන අය පිළිබඳව ඇති කර

ගත්තු ප්‍රේමය, ප්‍රියතාව, ආලය, තණ්හාව ආදී නොයෙකුත් විදියෙ වචනවලින් දක්වන ඒවා නිසා සමහරවිට ඇතැම් අය දිවිනසා ගන්නවා එවැනි කෙනෙක් නැතිවුනාම, නැත්නම් දිනගණන් මාස ගණන් ශෝක කරමින් සිටිනවා. එතකොට මරණ සතිය නිරන්තරයෙන් වැඩීම තුළින් අර'පියවිප්පයොග දුක්ඛය' බොහෝ දුරට තුනී කර ගන්න පුළුවන්. දන් මේ බෝධිසත්ත්වයන් වහන්සේගේ අවවාදය පිළිපැද්ද දාසිය ඇතුළු සියලුම දෙනා අර විධියේ අවස්ථාවක ක්‍රියාකළ ආකාරය මහපුදුමයි. අන්න එතකොට ඒ කතාව ආශ්‍රයෙන් අපට මේ මරණ සතියේ වටිනාකම තේරුම් අරගෙන එදිනෙදා ජීවිතයට කාට කාටත් ආදර්ශයක් ගන්න පුළුවන්.

ඊළඟට ඒ වගේම බොහෝ අවස්ථාවල බුදුරජාණන් වහන්සේ මරණසතිය පිළිබඳව වර්ණනාත්මකව ප්‍රකාශ කරලා තියෙනවා. මේ අර කලින් සඳහන් කළා වගේ ඒ බුද්ධචරිතයේදී පමණක් නොවේ බෝධිසත්ව චරිතයේදීත් ඒක කළ බව හෙළිවන තවත් කතාන්තරයක් ධර්මයේ සඳහන් වෙනවා. ඒක ජාතක කථාවලත් ඇතුළත්වෙලා තියෙනවා. ඒ වගේම සූත්‍රදේශනාවලත් කියවෙනවා. බුදුරජාණන් වහන්සේ අතීතයේ සිටි සියගණනක් ශ්‍රාවකයින් ඇති මහා පුදුම විධියේ ශාස්තෘවරුන්ගේ නාමලේඛණයක් දක්වනවා එක තැනක. එයින් එක් ශාස්තෘවරයකුගේ නම තමයි අරක. 'අරකෝ' කියල කියන්නේ. අරක නමැති ශාස්තෘවරයා පිළිබඳ ආශ්චර්යවත් ප්‍රවෘත්තියක් බුදුරජාණන් වහන්සේ දක්වනවා. මේ කාලයේ ඇතැම් කෙනෙක් සැක කරන්නත් පුළුවන්. ඒ අරක කියන ශාස්තෘවරයා පිළිබඳව බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනවා. ඒ ශාස්තෘවරයාට නොයෙක් සියගණන් ගෝලයින් සිටියා. ඒ හැමදෙනාටම ඒ බ්‍රාහ්මණයා හැමදාම මරණසතිය පිළිබඳව මේ විධියේ අනුශාසනයක් නිරන්තරයෙන් කළයි කියලා. "බ්‍රාහ්මණයිනි මේ ජීවිතය ඉතාමත්ම කෙටියි, අල්පයි, සුළුයි, මේක බොහොම දුක් කරදර සහිතයි. ඒක නිසා සංවේගය ඇතිව නුවණින් තේරුම් අරගෙන බ්‍රහ්මචරිය විසිය යුතුයි. කුසල් කළයුතුයි." කියලා ඒ විධියට නිරන්තරයෙන් අවවාද කළා, මේ ජීවිතය කෙටි බව. ඊළඟට ඒකට අදාළ උපමා හතකුත් ඒ ශාස්තෘවරයා ප්‍රකාශ කළබව දක්වනවා. ඒවා මේ පින්වතුන් බොහෝවිට අහලත් ඇති.

පළමුවැනි උපමාව තමයි හරියට උදෑසන තණකොළ අග තියෙන පිණිබිංදුවක් ඉර පායනවාත් එක්කම ඉක්මණින්ම නැතිවෙලා යන්නා වගේ මේ ජීවිතයත් බොහොම පහසුවෙන්ම මරණයෙන් කෙළවර වෙනවා.

දෙවෙනි උපමාව දක්වනවා තදට වැහි වහින අවස්ථාවේ, ලොකු පොද සහිත වැහි වහින අවස්ථාවේ, දිය බුබුළු පැන නඟිමින් එතන එතනම බිඳිල යනව වගේ මේ ජීවිතයත් ඒ විධියටම මරණයෙන් නැතිවෙලා යනවා.

තුන්වැනි උපමාව දක්වනවා දියේ ඉරක් ඇන්දාම දියෙහි දණ්ඩකින්

ඉරක් ඇන්ද හැටියෙම ඒක පේන්නෙ නැති තරම් වේගයෙන් බොහොම ශීඝ්‍රයෙන් නැතිවෙනවා වගේ මරණයෙන් මේ ජීවිතය කෙළවර වෙනවා.

එතකොට තණ අග පිණිබිඳු, ඊළඟට අර වැහි වහින අවස්ථාවේ දියබුබුළු, දියේ ඇන්ද ඉර- ඔන්න ඔය උපමා දෙනවා. ඊළඟට තව උපමාවක් දෙනවා පර්වතයකින් වේගයෙන් ගලා බසින ගඟක් එක මොහොතක්වත් නවතින්නේ නැතිව කරකැවි කරකැවී ගමනේ යෙදෙන්නා වගේ ජීවිතයත් මරණය කරා වේගයෙන් ගලා බහිනවා කියලා ප්‍රකාශ කළා.

ඊළඟ උපමාව දෙනවා ශක්තිමත් පුරුෂයෙක් දිව අගට කෙළපිඩක් අරගෙන බොහොම පහසුවෙන් ඒක එළියට දමන්නා වගේ මේ ජීවිතයත් පහසුවෙන්ම මරණයෙන් කෙළවර වෙනවා. ඉක්මණින් මරණයට ළංවෙනවා කියන එකයි.

ඒ වගේම තව උපමාවක් දක්වනවා දවසක් පුරා රත්වුණු යකඩ තලියකට මස් කැල්ලක් දැම්ම හැටියේ ඒ දාන සුනංගුව විතරයි ඒ වැටුන හැටියෙම පිළිස්සිලා නැතිවෙලා යනවා. ඒ විධියට මේ ජීවිතයත් ක්ෂණයෙන්ම, බොහොම ඉක්මණින්ම නැතිවෙලා යනවා.

හත්වෙනි උපමාව දක්වනවා වධයට ගෙන යන- මරන්න ගෙනයන- එළදෙනක්, ඇදගන යන එළදෙනෙක්, තියන තියන අඩියක් පාසා ඒකාන්තයෙන් මරණයට ළංවෙනවා වගේ අපේ ජීවිතයත් ඉක්මණින්ම මරණය කරාම යනවා, දවසක් දවසක් පාසා, කියන අදහසයි.

ඔය කියන උපමා හත දැක්වුවයි කියලා කියනවා. බුදුරජාණන් වහන්සේ ඊළඟට තමයි අර ආශ්චර්යවත් කාරණය හෙළිකරන්නේ. ඒ අරක නම් ශාස්තෘවරයා ඒ වගේ අනුශාසනයක් කළ ඒ කාලයේ මනුෂ්‍යයින්ගේ වයස් ප්‍රමාණය අවුරුදු හැටදාහයි. අවුරුදු හැටදහසක් ආයුෂ තියෙන කාලයකයි අර කියාපු අරක නම් ශාස්තෘවරයා අර විදියට අනුශාසනාවක් කළේ. ඒ වගේම ඒතරම් දීඝී ආයුෂ කාලයක් තිබුනත් රෝග පීඩා වශයෙන් තිබුනේ රෝග හයයි. සීතල දැනෙනවා, උෂ්ණ දැනෙනවා, කුසගින්න දැනෙනවා, පිපාසය දැනෙනවා, මළමුත්‍ර පහකරන්න අවශ්‍ය වෙනවා. ඔය කියන කාරණා හය විතරයි අපහසුවක් හැටියට තිබුනෙ. නමුත් අර තරම් මේ ජීවිතය බොහොම කරදර සහිතයි ආදී වශයෙන් ඒ ශාස්තෘවරයා ගෝලයින්ට කිව්ව බවයි කියවෙන්නේ. එහෙම ප්‍රකාශ කරලා බුදුරජාණන් වහන්සේ සංඝයා වහන්සේලාට කියනවා. "මහණෙනි, ඒ හැටදහසක් අවුරුදු ආයුෂ ඇති, ඒතරම් රෝගපීඩා අඩු, යුගයකයි අරක නම් ශාස්තෘවරයා අර වගේ දේශනාවක් පැවැත්වූවේ. නමුත් දන් අවුරුදු සීයක් තමයි පරම ආයුෂ- අවුරුදු සීයක් හෝ එයට ටිකක් අඩු හෝ වැඩි. මෙබඳු යුගයකටයි මේ උපමා හරියටම ගැලපෙන්නේ" කියලා ඊළඟට බුදුරජාණන් වහන්සේ අමුතු දෙයක් කරනවා.

අර අවුරුදු සියයේ කතාව එතනින් කියලා නවත්වන්නේ නැතිව සංඝයා වහන්සේලාට වඩාත් සංවේගය ඇති කරන්න අමුතු විදියේ පරිගණනයක් එතන ඉදිරිපත් කරනවා. "මහණෙනි, අවුරුදු සියයක් ජීවත්වන කෙනෙක් අවුරුද්දට ඍතු තුනක් කීවොත් ගතකරන්නේ ඍතු තුන්සීයයි. ඊළඟට අවුරුදු සීයක් ජීවත්වන කෙනෙක් ජීවත් වන්නේ මාස එක්දහස්දෙසීයයි. අර්ධ මාස දෙදාස් හාරසීයයි. ඊළඟට දක්වනවා රාත්‍රි ගතකරන්නේ රාත්‍රි තිස්හයදාහයි. දවසට බත්වේල් දෙක බැගින් ගත්තොත් බත්වේල් හැත්තෑදෙදාහයි. මේ බුදුරජාණන් වහන්සේ මේ පරිගණනය දෙන්නේ. බත්වේල් හැත්තෑදෙදාහයි. ඒකෙන් අඩුකරන්නත් ඕනෑ. හරියට අය වැය මෙතැන පෙන්නුම්කරනවා. ඒ හැත්තෑදෙදාහෙන් අඩුකරගන්න ඕන මව්කිරි බිව්ව කාලයත්, බත් වැරදුන අවස්ථා පහත්. බත් වැරදුන අවස්ථා පහ හැටියට දක්වන්නේ ඇතැම් අවස්ථාවල ඔය ගෙදරවල සමහර කෙනෙක් කෝපය නිසා ආහාර නොගෙන ඉන්නවා. කෙනෙක් දැඩිදුකක් නිසාත් සමහර විට ආහාර නොගෙන ඉන්නවා. එහෙමත් නැත්නම් ආබාධයක් නිසාත් ආහාර නොගෙන ඉන්නවා. පෙහෙවස් සමාදන් වෙලා පොහොය අටසිල් සමාදන්වෙලත් ආහාර නොගෙන ඉන්නවා. එහෙමත් නැත්නම් බත් අනුභව කරන්න ඕන නමුත් බත් වේල ලැබෙන්නේ නැහැ. නොලැබීම. ඔන්න ඔය කියන කාරණා අනුව බත්වේල් නැතිවුන ඒවාත් අඩුකරන්න ඕනෑ හැත්තෑදෙදාහෙන්" කියලා.

බුදුරජාණන් වහන්සේ ඒ විධියට ප්‍රකාශ කරලා 'මහණෙනි, දැන් ඉතින් මම තුඹලාට පරිගණනයක් දුන්නා අවුරුදු සීයක් ජීවත්වන කෙනෙක් ගතකරන ඍතු ගණන, මාස ගණන, අර්ධමාස ගණන, රාත්‍රි ගණන, බත් වේල් ගණන ආදිය" මේවා කළේ මොකටද? ඔන්න ඊළඟට බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනවා. "ශෝලයින්ට අනුකම්පාව ඇති ශාස්තෲවරයෙක් හැටියට මවිසින් තුඹලාට යමක් අනුශාසනා වශයෙන් කළයුතුව තිබුණා නම් එය මම කරලා අවසානයි. ඔය තියෙන්නේ ගස්මුල්. ඔය තියෙන්නේ සුන් ගෙවල්. භාවනා කරන්න. ප්‍රමාද වෙන්න එපා" කියලා නිවනට උනන්දු කරවීමටයි බුදුරජාණන් වහන්සේ ඒ අවස්ථාවේ පැරණි කතාන්තරයක් ඉදිරිපත් කරලා තියෙන්නේ.

ඊළඟට ඒ වගේම ඊටත් වඩා වටිනා අවස්ථාවක් සඳහන් වෙනවා බුද්ධ චරිතය හා සම්බන්ධ. ඤාතික කියන ගමේ ලිච්ඡවි රජදරුවන් ඉන්න ප්‍රදේශයේ ගමක ගිඤ්ජකාවසථ කියන ගඩොල් විහාරයේ බුදුරජාණන් වහන්සේ වාසය කරන අවස්ථාවක සංඝයා වහන්සේලා අමතලා මරණසතියේ ආනිශංස කෙලින්ම ප්‍රකාශ කරනවා. 'මහණෙනි, මරණසතිය වඩන ලද්දේ බහුලවශයෙන් පුහුණුකරන ලද්දේ, අමෘතය කියල කියන නිවනටම ඇදගෙන යනවා. 'අමතොගධා අමතපරියොසනා' නිවනටම ඇදගෙන යනවා. නිවනින්ම කෙළවරවෙනවා. එතකොට අමෘතය කියල අපි මේ නිවනට කියන්නේ, නිවන

අමෘතය නමින් හඳුන්වන්නේ, මරණයෙන් මිදීමයි. නමුත් මරණයෙන් මිදීමට බුදුරජාණන් වහන්සේ දක්වන්නේ මරණය ගැන මෙනෙහි කිරීමයි. ඉතින් මහ පුදුම දෙයක් මෙතන කියවෙන්නේ. ඒක නිවනින්ම කෙළවර වෙනවා කියලා ආනිශංස ප්‍රකාශ කරලා බුදුරජාණන් වහන්සේ අහනවා 'මහණෙනි, නුඹලා මරණසතිය වඩනවාද?' ඇහුවාම ඔන්න එක් භික්ෂූන් වහන්සේ නමක් කියවා 'මම මරණසතිය වඩනවා' 'කොහොමද මරණසතිය වඩන්නේ?' ඔන්න ඇහුවාම කියනවා 'භාග්‍යවතුන් වහන්ස' මම හිතනවා මට එක දවසකුත් රැයකුත් ජීවත්වෙන්න ඇත්නම් භාග්‍යවතුන් වහන්සේගේ අනුශාසනය මෙනෙහි කරමින්, ඒක ලොකු දෙයක් හැටියට මං සලකනවා. ඒ කියන්නේ මගේ 'සැලැස්ම' එක දවසකටත් රැයකටත් විතරයි. ඊට එහාට හිතන්න ඉඩක් නැහැ මරණය එන්න පුළුවන් නිසා. ඔන්න ඕකයි අදහස. ඒක කිව්වට පස්සේ තවත් භික්ෂූන් වහන්සේ නමක් කියනවා 'මමත් මරණසතිය වඩනවා' 'කොහොමද මරණ සතිය වඩන්නේ?' අර පංතියකින් ගුරුවරයෙක් අහන විධියටයි මේ අහන්නේ. එතකොට ගෝලයොත් අත උස්සල කියන්නේ අර 'මමත් වඩනවා,' 'මමත් වඩනවා'. ඔන්න ඔය විධියට දෙවෙනියා කියනවා- උන්වහන්සේ කියනවා අරට ටිකක් ඉහළයි. 'මම මරණසතිය වඩන්නේ මට එක දවල් කාලයක් ජීවත්වෙන්න ලැබුනොත් භාග්‍යවතුන් වහන්සේගේ අනුශාසනය මෙනෙහි කරමින් ඒකත් ලොකු දෙයක් හැටියට මම සලකනවා,

තවත් භික්ෂූන් වහන්සේ නමක් ප්‍රකාශ කරනවා 'මමත් මරණ සතිය වඩනවා.' 'කොහොමද මරණසතිය වඩන්නේ?' මම කල්පනා කරනවා මට අඩදවසක්, ඒ කියන්නේ දවල් කාලයෙනුත් භාගයක් ජීවත්වෙන්න තිබුනොත් ඒත් ඇති මට බුදුරජාණන් වහන්සේගේ අනුශාසනය මෙනෙහිකරමින්.' ඒ කියන්නේ ඊට එහාට සැලසුම් කරන්නේ නැහැ.

ඊළඟට තවත් භික්ෂූන් වහන්සේ නමක් කියනවා. 'මමත් මරණ සතිය වඩනවා'(ඔය විධියට අට නමක්ම පිළිතුරු දෙනවා) ඊළඟ භික්ෂූන් වහන්සේ කියන්නේ 'මම පිණ්ඩපාතය වළඳන කාලය තුළ එක පිණ්ඩපාතයක් වළඳා ඉවර වනතුරු ජීවත් වෙන්න ඇත්නම් භාග්‍යවතුන් වහන්සේගේ අනුශාසනය මෙනෙහි කරමින්, ඒකත් ලොකු දෙයක් හැටියට මම සලකනවා' කියල.

ඔන්න ඊළඟ භික්ෂු නම කියනවා' මමත් මරණ සතිය වඩනවා.' 'කොහොමද මරණසතිය වඩන්නේ?' පිණ්ඩපාතයෙන් භාගයක් වළඳන කාලයක් මට ජීවත්වෙන්න ඇත්නම් ලොකු දෙයක් හැටියට මම සලකනවා.'

ඔන්න ඊළඟට තව භික්ෂූන් වහන්සේ නමක් කියනවා 'මට බත් පිඩු හතරක් පහක් හපලා වළඳන තුරු ජීවත්වෙන්න ඇත්නම් භාග්‍යවතුන් වහන්සේගේ අනුශාසනාව අනුව, භාවනාවට හිත යොදාගෙන, ඒකත් ලොකු දෙයක්' කියල.

ඊළඟට තවත් භික්ෂුවක් ප්‍රකාශ කරනවා 'මමත් මරණසතිය වඩනවා. මට එක් බත් පිඩක් හපලා අනුභව කරන තුරු ජීවත්වෙන්න ඇත්නම් භාග්‍යවතුන් වහන්සේගේ අනුශාසනය මෙනෙහි කරමින් ඒකත් ලොකු දෙයක් හැටියට සලකනවා' කියල.

ඊළඟට අවසාන භික්ෂුව ප්‍රකාශ කරනවා.' මම මරණසතිය මෙහෙමයි වඩන්නේ. ආශ්වාසයක් කරලා ඒ ආශ්වාසය හෙලන තුරු ප්‍රශ්වාසය වශයෙන්, ප්‍රශ්වාසයක් කරලා ආශ්වාසයක් ගන්නතුරු, ඒ අතරතුර මට ජීවත්වෙන්න ඇත්නම් භාග්‍යවතුන් වහන්සේගේ අනුශාසනය මෙනෙහි කරමින් ඒක මම ලොකු දෙයක් හැටියට සලකනවා.' ඒ තරම් අප්‍රමාදීව මරණසතිය වඩන බවයි පෙන්නුම් කරන්නේ.

එතකොට ඔන්න ඔහොම ප්‍රකාශ කළාට පස්සේ බුදුරජාණන් වහන්සේත් ලකුණු දෙනවා. අර අට දෙනාගෙන් මුල්හය දෙනා බොහොම ප්‍රමාදවයි මරණසතිය වඩන්නේ. අර කිව්වා වගේ රෑදවල් දෙකක්, ඊළඟට දවසක්, අඩදවසක්, බත් වේලක්, බත් වේලෙන් අඩක්, බත්කටවල් පහක් හයක්, ඒවාට ලකුණු දෙන්නේ නැහැ බුදුරජාණන් වහන්සේ. ඒ අය මරණසතිය වඩන ආකාරය හෙමින් වැඩියි. ප්‍රමාදයට තුඩුදෙන විධියටයි. නමුත් දෙන්නයි විභාගයෙන් පාස් වෙන්නේ. කවුද? අන්න අර එක බත් පිඩක් හපලා අනුභව කරනතුරු මට ජීවත් වන්න ඇත්නම් කියන කෙනාත්, අවසාන වශයෙන් වඩාත් තියුණු මරණසතිය හැටියට දක්වන්නේ ආශ්වාස කරලා ප්‍රශ්වාස කරනතුරුවත් ප්‍රශ්වාස කරලා ආශ්වාස කරන තුරුවත් මට ඉන්න ඉඩක් ලැබෙයිදෝ කියන සැකයෙන් භාග්‍යවතුන් වහන්සේගේ අනුශාසනය මෙනෙහි කරන කෙනාත්. ඔන්න ඔය විධියට මරණසතියේ තියුණු බව බුදුරජාණන් වහන්සේ පෙන්නුම් කරනවා.

ඒ ආශ්‍රයෙන් අපට හිතාගන්න පුළුවන් ඇත්ත වශයෙන් මරණසතිය වඩන කෙනාට ආනපාන සතියත් බොහොම පහසුවෙන් වඩන්න පුළුවන්. අර උග්‍ර විධියට මරණ සතිය වඩන භික්ෂූන් වහන්සේ - ඇත්ත වශයෙන් උන්වහන්සේට ආනාපානසතිය බොහොම පහසුවෙන් වැඩෙනවා ඇති. විතර්ක ආදියට ඉඩක් නැහැ. දැන් බොහෝදෙනාට ආනාපානසති භාවනාවට බාධාවක් වන්නේ නානාවිධ අතීත අනාගත සිතිවිලි ගලාගන එනවා නේ. නොයෙකුත් සැලසුම්. දැන් අර වගෙ භික්ෂුවකට මරණසතියත් එක්ක යන නිසා ඊට එහාට සැලැස්මක් නැහැ. ආශ්වාසයක් අරගෙන ප්‍රශ්වාසය හෙලන තුරු විශ්වාස නැහැ. ප්‍රශ්වාසය හෙළලා ආශ්වාසය ගන්න තුරු විශ්වාසයක් නැහැ. එතකොට සතිය හොඳට පවත්වන්න පුළුවන්. අන්න ඒක නිසාම තමයි ඔය ආනාපාන සති භාවනාව ගැන ප්‍රකාශකරන අවස්ථාවක බුදුරජාණන් වහන්සේ රාහුලස්වාමීන් වහන්සේට වදාළේ, ඒ ආනාපානසතිය හරියාකාරව දහසය

ආකාරයකින් වඩලා පුරුදු කරපු භික්ෂුන් වහන්සේ අවසාන ආශ්වාසය ප්‍රශ්වාසය පවා මරණ වේලාවේදී - අපවත්වෙන අවස්ථාවේදී - අවසාන ආශ්වාසයත් ප්‍රශ්වාසයත් සිහිනුවණින්ම කරනවා කියලා. ඉතින් ඒක තුළින් මරණසතියත් ආනාපානසතියත් අතර සම්බන්ධතාව තේරුම්ගන්න පුළුවන්.

මොකද, විශේෂයෙන්ම, දැන් මේක තවත් ගැඹුරින් කල්පනා කරනවා නම්, අපි අර කිව්වා නේ අමෘතත්වය කරා යනවා කියලා. මේ මරණ භය  තියෙන්නේ උපාදානය උඩයි. අල්ලා ගැනීම උඩයි. එතකොට ආනාපානසතියෙත් අවසාන ධම්මානුපස්සනා හරියේ තියෙන්නේ 'අනිච්චානුපස්සී' අනිත්‍යතාව බලමින් ආශ්වාස කරනවා. ප්‍රශ්වාස කරනවා. ඊළඟට විරාගය නොඇල්ම දකිමින්. ඊළඟට නිරෝධය, මේවා බිඳිල යන හැටි බලමින්. ඊළඟට පටිනිස්සග්ග අතහැරීම- මේ ආත්ම දෘෂ්ටිය ආදී අල්ලා ගැනීම් සිතින් අතහැරීම. අන්න ඒ විධියට මරණසතිය උපකාරවෙනව එතකොට ආනාපානසතිය වැඩීමටත්.

ඊළඟට ඔය විධියටම තමයි බුදුරජාණන් වහන්සේ තවත් අවස්ථාවක ප්‍රකාශකළා අමුතුම විධියේ සූත්‍රයක්. ඒක ආරම්භ කළේ මෙහෙමයි. "මහණෙනි, ලෝකයේ ඉන්නවා, ආජානීය අශ්වයින් හතරදෙනෙක්. අජානීය කියලා කියන්නේ, පින්වතුනි, ඔය ඉස්තරම් වර්ගයේ අශ්වයින්. ඒ අශ්වයින්ගෙ අවබෝධ ශක්තිය බොහොම දියුණුයි. ඉතින් ඒ ආජානීය අශ්වයින් හතරදෙනා අවරෝහණ ක්‍රමයට බුදුරජාණන් වහන්සේ දක්වන්නේ. ඉස්තරම්ම, හොඳම, පළමුවැනි අංකය දෙන්න පුළුවන් අශ්වයාගේ ස්වභාවය මොකක්ද? තමාගේ අස්ගොව්වා කසය ඔසවන කොට ඒ හෙවනැල්ල දැකලා ඒ අශ්වයා හික්මෙනවා. අශ්වයා කල්පනා කරනවා අද මොකක්ද මගේ ආචාර්ය වරයා- ගුරුවරයා- දෙන හික්මීම. කොහොමද මම හික්මෙන්න ඕන කියලා. ඒ හිතුවිල්ල එකපාරටම ඇති කරගන්නවා. අර ආචාර්යවරයා කසය ඔසවනවාත් එක්කම කසයේ ඡායාව දැක්කත් ඇති.

දෙවෙනි ගණයේ අශ්වයාට එච්චර අවබෝධයක් නැහැ. එයාට අර කසය ලෝමවල වදින කොට ඔන්න එයා සංවේගවත් වෙනවා. දැන් මං මොකක්ද කරන්න ඕන ගුරුවරයාගේ අවවාදය ඉෂ්ට කරන්න, එහෙම නැත්නම් පුහුණුවෙන්න, කියලා ඒ අවබෝධය මතුවෙන්නේ ලෝමවලට වැදුනාම.

තුන්වෙනි අශ්වයාට මස්වලට වැදුනාම අර කසය, එතකොට අවදි වෙනවා. අවබෝධය එනවා.

හතරවෙනි අශ්වයාට ඇට වලට වැදුනාම තමයි ඔන්න කල්පනා කරන්නේ මගේ ගුරුවරයා කියන විධියට මම කොහොමද අද හික්මෙන්නේ කියලා.

ඔය අවබෝධ ශක්තිය අනුව ආජානීය අශ්වයින් හතර දෙනා

ගැන උපමාව දක්වල ඔන්න ඊළඟට බුදුරජාණන් වහන්සේ ඒකට උපමේය වශයෙන් මේ ධර්මකාරණය මතුකරනවා. 'එසේම, මහණෙනි, ඇතැම් කෙනෙක් ඉන්නවා - යම් කෙනෙකුට අහන්න ලැබෙනවා අසවල් ගමේ අසවල් ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් හෝ දුක්ඛිතව කාලක්‍රියා කළා කියලා. ඒ කාලක්‍රියා කළා කියන ආරංචියම ඒ තැනැත්තාට ඇති භාවනාවට බැහැලා සසර දුක් කෙළවර කරන්න. එතන කෙළවර වෙන්නෙ අන්තිමට රහත්බව දක්වාම වැඩකරගන්න මරණය කියන ඒ ආරංචියම ඇති බවයි. අන්න අර ඉස්තරම්ම අශ්වයා වගේ. ඉස්තරම්ම පුරුෂයා එතන කියන්නේ 'භද්‍රො පුරිසාජානියො' යහපත් ආජානීය පුරුෂයා යහපත් ආජානීය අශ්වයාට සමාන කරලා මෙතන. ආජානීය පුරුෂයා, අවබෝධ ශක්තිය ඇති පුරුෂයා, මරණය කියන ආරංචිය ඇසූ පමණින්ම සංසාර භය ඇතිකරගෙන, සංවේගය ඇතිකරගෙන, ධර්මමාර්ගයට නැඹුරුවෙලා භාවනා කරලා රහත් වෙනවා.

ඔන්න දෙවෙනි ගණය ඒකත් උපමා උපමේය වශයෙන් දක්වන්නේ. තවත් කෙනෙකුට ඒ ආරංචිය මදි. එයාට දකින්න ලැබෙනවා මැරිලා ඉන්න- දුක්ඛිතව මැරිලා ඉන්න - ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් හෝ ඒ දැක්කට පස්සෙ සංවේගය උපදවාගෙන මරණය තුළින් සංවේගය උපදවාගෙන භාවනාවට බැහැලා උත්සාහ කරලා, රහත්වෙනවා.

තුන්වෙනි පුද්ගලයා - එයාට අරිටත් වඩා- එතන දක්වන්නේ තමන්ගේ නෑ කෙනෙක්, තමන්ගේ නෑයෙක්ම, මරණයට පත්වෙනවා. ඒක සංවේග වස්තුවක් හැටියට මතුකරගෙන ඒ තැනැත්තා උත්සාහවත්ව සසර දුක් කෙළවර කරගන්නවා.

හතරවෙනි තැනැත්තා. අර කියාපු අවස්ථාවලුත් මදි ඒ තැනැත්තාට. තමන්ම බරපතල රෝගයකින් ආබාධයකින් මාරාන්තික වේදනාවලට පත්වෙලා ඉන්න අවස්ථාවේ ඔන්න තේරෙනවා මේ සංසාරයෙන් මිදෙන්න ඕන කියලා. දැනටත් මේ පින්වතුන් අහලා තියෙනවා නේ ඔය සමහර බරපතල රෝග ඇතිවුනාම ඒ වෛද්‍යවරයා, සමහරුන්ට හෙළිකරන්නේ නැහැ. සමහරු දැනගත්තු හැටියේ දැන් ඉතින් තව දවස් ගණනයි ජීවත් වෙන්න තියෙන්නේ. සතියයි, සතිදෙකයි ඔය ආදී වශයෙන්. ඔන්න ඒ වෙලාවට ධර්මය වැටුනොත් ඒ තැනැත්තාට මේ ධර්ම මාර්ගයෙ යම් දුරක් යන්න පුළුවන්. මොකද, අන්න හරියට රත්වෙච්ච වෙලාව. තවත් නම් වැඩක් නැහැ. ලොකු සැලසුම්වලට ඉඩක් නැහැ. දවස් කීපයයි ජීවත් වෙන්න තියෙන්නෙ. අන්න ඒ වගේ හතරවෙනි පුද්ගලයා.

මේ කොටසටත් අහුවන්නේ නැත්නම්- දැන් මේ කිව්වේ ආජානීය අශ්වයෝ- මේ කොටසටත් අහුවෙන්නේ නැති අය, මරණසතිය ගැන කොහෙත්ම උනන්දු නොවන අය, අයිතිවන්නේ කොයිගණයටද කියලා මේ පින්වතුන්ම කල්පනා කරන්න ඕන. අශ්ව පවුලට අයිති අවබෝධ ශක්තිය ඉතාම අඩු

සතෙක් ඉන්නවා. මෝඩ සතෙක් ඉන්නවා. අන්න ඒ ගණයටයි අයිති. මෙච්චර අවටින් මරණ ඇතිවෙලා තමතමන්ගේ අයත් මැරෙනවා. තමනුත් මැරෙන බව දන්නවා. එච්චරත් වෙද්දී කිසිම සංවේගයක් නැතිව ඒවෙනුවට- දැන් මේ පින්වතුන් බොහෝදෙනෙක් දන්නවා ගම්බදව පමණක් නොවේ දැන් රටේ හැමතැනම තියෙනවා අවමංගල්‍යාධාර සමිති. අවමංගල්‍යවලට ආධාර කරන්න ඉන්නවා හුඟක් කට්ටිය. නමුත් ඒ අවමංගල්‍ය අවස්ථාවට ගිහිල්ලා-අර කියාපු සාංසාරික මත්වීම් තුනක් තියෙනවා. ඒක කවුරුත් දන්නවා ස්වාභාවික දැන් කිව්ව අර යෞවන මදය ආරෝග්‍ය මදය ජීවිත මදය කියන ඒවා සාංසාරික වශයෙන් ආපු ආශ්‍රව, ස්‌වාභාවික ආශ්‍රව. කාමාශ්‍රව භවාශ්‍රව, අවිද්‍යාශ්‍රව, කියන ආශ්‍රව වලින් හැදිච්ච දේවල්. ඒ වෙනුවට කෘත්‍රිම ආශ්‍රව ද්‍රව්‍යවලින් හදාගත්තු අමුතු කෘත්‍රිම මත්වීම්, මත්වෙන ද්‍රව්‍යයන් අර විධියේ ස්ථානවල පරිභෝග කරන බව අපි දන්නවා. අපි අහලා තියෙනවා ඒ මළමිනිය තියෙද්දිම සමහරවිට ගෙවල් පිටිපස්සේ අන්න අර විධියේ කෘත්‍රිම මත්වීම්. අන්න එබඳු අය අර කියාපු අශ්ව පවුලට අයිති අර කොටසටයි අපට එකතු කරන්න වෙන්නේ.

ඊළඟට ඒක ආශ්‍රයෙන් අපි දැන් කල්පනා කරල බලමු, අතීතයේ ඉඳලා චාරිත්‍රයක් තියෙනවා මළගෙවල්වල සතිපට්ඨාන සූත්‍රය කියවනවා. මේ සතිපට්ඨාන සූත්‍රය මළගෙවල්වල කියවීම නිසා ඒ චාරිත්‍රය වැරදියට වටහාගත් ඇතැම් උගත් පඬිවරු පවා මේ කාලයේ මහා සතිපට්ඨාන සූත්‍රය අසුභ දෙයක් හැටියට, මරණ ගෙදරවල හැර වෙන ගෙවල්වල කියවන්න සුදුසු නැති අසුභ සජ්ඣායනාවක් හැටියටත් සළකනවා. ඒ තරම් මෝඩ අදහසකුත් සමහර උගතුන් තුළ තියෙනවා. නමුත් මහා සතිපට්ඨාන සූත්‍රය මළගෙවල්වල කියවන්නේ මොකද කියල අපි ටිකක් කල්පනා කරන්න ඕන.

දැන් මේ පින්වතුන් කොතෙකුත් ඔය මඟුල් වලට වගේම අවමඟුල් වලට සහභාගී වෙනවා. මොකද සාමාන්‍ය කථාවක් තියෙනවා මඟුලට මරණයට නැත්නම් වැඩක් නැහැ කියල නෑයකුගෙන්. ඒක නිසා ඒවාට යනවා. ඉතින් ගිහිල්ලා අර කියාපු විධියට සංවේගය උපදවා ගන්නවා වෙනුවට වෙන වෙන දේවලුත් කරනවා. නමුත් අන්න අතීතයේ ඉඳලා ඔය සතිපට්ඨාන සූත්‍රය යම් හේතුවකින් මරණගෙවල්වල කියන්න යොදාගත්ත නම් අපිට හිතන්න තියෙන්නේ දැන් අපි කොතෙකුත් අනිත් අයගේ අවමඟුල්වලට සහභාගී වෙනව. නමුත් තමන්ගේ අවමඟුලට සහභාගී වෙන්නෙ නැහැ. තමන්ගේ අවමඟුලට සහභාගී වන්න අවස්ථාවක් දීමටයි, සතිපට්ඨාන සූත්‍රය කියවන්නේ. දැන් මේක ප්‍රහේළිකාවක් වෙන්න පුළුවන් මේ පින්වතුන්ට. සතිපට්ඨාන සූත්‍රය කියවලා කොහොමද තමන්ගේ අවමඟුලට සහභාගීවන්නේ කියලා.

මේ සතිපට්ඨාන සූත්‍රයේ තියෙනවා පින්වතුනි, දැන් දන්නවා නේ ඔය අසුභ භාවනා කියලා කියන්නේ. දැන් අර සොහොනක මළකුණට යන

කල ප්‍රකාශ වෙනවා නේ එතන? ඒ කියන්නේ දැන් ඔන්න අපි හිතමු යම්කිසි මරණ ගෙදරක- දැන් නම් ඉතින් ඒවා හොඳට සරසලා රටේ වටිනාම පෙට්ටියක දාලා තවත් නොයෙකුත් සැරසිලි ඇතිව සමහර විට- මඟුල් ඇඳුමෙන් ඔය විධියට මළකුණක් ප්‍රදර්ශනය කරනවා. නමුත් අතීතයේ කොහොමද මේවාට සැළකුවේ. බුද්ධ කාලයේ - දැනටත් සමහර විට ඉන්දියාවේ- අමුසොහොනක ගිහින් දානවා මේ දවස් ගණන් තියාගන මේක තුළින් නොයෙකුත් නොයෙකුත් ලෞකික දේවල් මතුකරන්නේ නැතිව. ඉතින් අර ඒ අමු සොහොනේ දමාපු මළකුණු තුළ ඔන්න ඊළඟට බුදුරජාණන් වහන්සේ පෙන්නුම් කරනවා මේ පින්වතුන් අහලා තියෙනවානේ නවසීවථිකය කියලා. ඔය භාවනා කරන පින්වතුන් දන්නවා සතිපට්ඨාන සූත්‍රයේ අමුසොහොනට දාපු සිරුරට යන අවස්ථාවන්. අවස්ථා නව වැඩිකරන්නත් පුළුවන්. සාමාන්‍යයෙන් නවයක් හැටියට දක්වනවා. ඉතින් එතනදී අන්න මරණ ගෙදරක හරියාකාරව සතිපට්ඨාන සූත්‍රයෙන් ප්‍රයෝජන ගන්නවා නම්- දැනුත් ඔය සතිපට්ඨාන සූත්‍රය දේශනා කරනවා සජ්ඣායනා කරනවා තමයි. අපටත් යම් යම් අය ආරාධනා කරනවා සජ්ඣායනා කරන්න. ඒක මිහිරි හඬින් සජ්ඣායනා කිරීම නෙවෙයි එතන කරන්න තියෙන්නේ. සජ්ඣායනාව අවශ්‍ය තමයි. ඒක මිහිරිහඬින් සජ්ඣායනා කරල චාරිත්‍රයක් හැටියට ඉෂ්ට කිරීම නොවේ. ඒක ඇතුළට කිමිදිලා ඒකේ ගැඹුරු අර්ථය, අන්න අර කියාපු අර්ථය, මතුකරගෙන තමන්ගේ අවමඟුලට සහභාගී වෙන එකයි.

කොහොමද තමන්ගේ අවමඟුලට සහභාගී වෙන්නේ. අර ශරීරයට වෙච්ච දේ තමන්ගේ ශරීරය තුළට ආරෝපණය කරනවා. ඒක සතිපට්ඨාන සූත්‍රයේ තියෙන්නේ මෙහෙමයි. අපි එක නිදර්ශනයක් කීවාම අනික් ඒවා තේරුම් ගන්න පුළුවන්. මියගිය පුද්ගලයා මළකඳක්. ඒ කියන්නේ බාහිර වශයෙන් මෛත්‍රිය ගැන හිතනකොට තමා උපමා කරගෙන 'අත්තූපමාය' අනික් අයට මෛත්‍රී වඩනවා. මරණය ගැන හිතන කොට අනික් අය උපමා කරගන්න ඕන. තමන් මැරුණාට පස්සේ ඒක කරන්න බැහැ නේ. ඒක නිසා මළ කෙනෙක් උපකාර කරගෙනයි අපි මරණය ගැන සිත මතු කරගන්නේ. එතෙන්දී අන්න අමු සොහොනේ දාපු මළකඳකට යන කල දසාවයි එතන බුදුරජාණන් වහන්සේ පෙන්නුම් කරන්නේ. දවසක්, දෙකක් තුනක් ගියාම ශරීරයට මොකක්ද වෙන්නේ. ඉදිමිලා, නිල්වෙලා, පැසවලා. එතකොට මේ රටේ තියන තරම් වටිනා මාංශජනක ඉස්තරම්ම ආහාර වලින්වත් මහත් කරගන්න බැරිවුන ශරීරය දවස් තුනක් ඇතුළත විශාල වෙලා පුපුරලා යනවා අන්තිමට. ඉතින් ඒ ටික බුදුරජාණන් වහන්සේ පෙන්නුම් කරනවා. උද්ධුමාතකං, විනීලකං, විපුබ්බකං කියන වචන වලින් ඉදිමිලා නිල්වෙලා පැසවලා ඒ තත්ත්වයට දවස් තුනක් යනකොට පත්වෙනවා.

ඊළඟට ඒ මළකුණේ කතන්තරය තමන්ටම ආරෝපනය කරනවා.

'උපසංහරති' කියලා කියන්නේ තමන්ටම ආරෝපණය කරනවා. මේ කයත් 'එවං භාවී' මේ තත්ත්වයට පත්වෙනවා. මේ තත්ත්වයෙන් මිදුනේ නෑ. 'එවං ධම්මො' මේ ධර්මතාව මගේ ශරීරයටත් පොදුයි. මේ තත්ත්වය මගේ ශරීරය ඉක්මවලා නැහැ. අන්න ඒක තුළින් තමයි තමන්ගේ අවමඟුලට සහභාගී වෙනවා කියලා අපි කිව්වේ. එතකොට අනුන්ගේ අවමඟුලට සහභාගී වන අවස්ථාව, තමන්ගේ අවමඟුලට සහභාගිවෙන්න සුදුසු අවස්ථාවක් කර ගන්න තියෙන්නේ. ඒක නැත්නම් මැරුණාට පස්සේ කරන්න හම්බවෙන්නේ නැහැ නේ? ඉතින් මේ හොඳ නිදර්ශනයක් ඉදිරියේ තියෙනවා. ඒ කාලයේ ඒකට ගැලපෙනවා. දැන් මේ කාලයේ නම් අර කිව්ව වෙන දේවල් විදියටම අර තරම් අසුබ හැඟීමක්වත් ඇති නොවන ආකාරයටයි මළකුණකට සළකන්නේ. කෙසේ හෝ වේවා අපි හිතෙන් හරි මේක අමු සොහොනකට දම්මහම යන කලදසාව- එහෙම නැත්නම් ඔය කෘත්‍රිම ඖෂධ ආදිය නැත්නම් මේ ශරීරයට යන කලදසාව- අර කියාපු 'ආයු උසමා ච විඤ්ඤාණං' ආයුෂය, උෂ්ණය, විඤ්ඤාණය ඉවත්වුන සැටියේ මේ ශරීරයේ තත්ත්වය කල්පනා කරලා බලන්න ඕන. ඒ දවස් තුනක් ගියාට පස්සේ. තවත් ඇතට බුදුරජාණන් වහන්සේ පෙන්නුම් කරනවා. ඊළඟට අමු සොහොනක තියනවා නම් අර ශරීරයට යන කලදසාව තමන් ගැනත් සිතුවොත් අමුසොහොනකදි දවස් තුනක් හතරක් යනකොට තමන් ළඟට එන අමුත්තෝ කවුද? කපුටෝ, බල්ලෝ, හිවල්ලු, උකුස්සෝ, ගිජුලිහිණියෝ ඔය විධියේ සත්තු තමයි එන්නේ. තමන්ගේ මළගෙදරට, අවමඟුලට ඇවිල්ලා ඊළඟට ඒගොල්ලන්ට ආහාර හැටියට තියෙන්නේ අර ඉතින් පැසවල තියන ශරීරයෙ ඉතිරි කෑලි කඩාගෙන කනවා. ඔන්න එතකොට ඒකත් අවස්ථාවක් තමන්ගේ අවමඟුලට සහභාගි වන්න. දැන් පළමු අවස්ථාවට සහභාගි වෙනකොට ඉදිමුනා. ඊළඟට පුපුරලා ගියා. ඔන්න ඊළඟට දැන් ඉතින් අර සතුන්ට ආහාර.

ඊළඟට ඉතිරිවන හරිය ක්‍රම ක්‍රමයෙන් බුදුරජාණන් වහන්සේ දක්වනවා ඇටසැකිල්ල තියෙනවා යන්තම් ලේ තැවරුනු, ඊළඟට නහරවලින් බැඳුණු. ක්‍රම ක්‍රමයෙන් නහරත් දිරලා ගියාට පස්සේ තව ටික කලක් යනකොට ඇටසැකිලි. ඇටකෑලි වෙන වෙනම. කෑලි හතකට කැඩිලා යනවා. බොහෝ තැන්වල තියෙන්නේ අඤ්ඤෙන හත්ථට්ඨිකං අඤ්ඤෙන පාදට්ඨිකං අඤ්ඤෙන ජඞ්ඝට්ඨිකං අඤ්ඤෙන ඌරට්ඨිකං අඤ්ඤෙන කටට්ඨිකං, අඤ්ඤෙන පිට්ඨිකණ්ටකං, අඤ්ඤෙන සීසකටාහං, එකපැත්තක අත් ඇට, තව පැත්තක පා ඇට, තව පැත්තක කෙණ්ඩා ඇට, තව පැත්තක කලවා ඇට, තව පැත්තක උකුල් ඇටය, තව පැත්තක පිටකටුව, තව පැත්තක හිස්කබල. ඔන්න හතකට කැඩිලා ගියා.

ඊළඟට තවත් ඕන නම් තමන්ගේ අවමඟුලට සහභාගි වෙන්න- අවුරුද්දක් විතර යනකොට ඊළඟට මේ ඇටකෑලි තනිකර ගොඩක් හැටියට.

දැන් ඊට කලින්, ඔය නොයෙකුත් සොහොන් කොත් ආදිය බඳිනවා. නමුත් මේවා එහෙමම තියෙන්න ඇරියොත් ඊළඟට ඇට කෑලි වෙන වෙනම තියනවා. අවසාන අවස්ථාවේ මේවා සුණුවිසුණු වෙලා සුණු බවට පත් වෙලා ආයෙත් පොළවට එකතුවෙනවා. ඔන්න එතකොට ශරීරයේ කතාන්තරය.

ඉතින් මේවා වෙනකන් ඉන්නේ නැතිව මේ විදියට මරණසතිය වඩන්නයි අර අතීත කාලයේ චාරිත්‍රය තියෙන්න ඇත්තේ. මේ මහා සතිපට්ඨාන සූත්‍රය කියවීමේ ගැඹුරු අර්ථය ඕකයි. මහාසතිපට්ඨාන සූත්‍රයේ නානා ප්‍රකාර දේවල් තියෙනවා. මරණයට අදාළ කොටස තමයි ඔන්න ඔය කියාපු මළකඳට යන කලදසාව. එතකොට ඒ තත්ත්වය තමන්ටම පැමිණෙනවා කියන ඒ අවබෝධය ලබා ගන්නයි අපි සතිපට්ඨාන සූත්‍රය සජ්ඣායනා කරන්න ඕන මළගෙදරක. නමුත් ඒක පිළිබඳ සංකල්පය එහෙම පිටින්ම වෙනත් විධියකට ඇවිල්ලා තියෙන්නේ. ඒ වටිනා සූත්‍රයට පවා අසුබදෙයක් හැටියට ගරහන තත්ත්වයකට පත්කරගෙන තියෙනවා. ඉතින් අර විදියට හොඳට මිහිරි හඬ ඇති හාමුදුරුකෙනෙකු ලවා සතිපට්ඨාන සූත්‍රය සජ්ඣායනා කරවාගෙන, මේවා මරණගෙවල් වල අහන්න සලස්වන එක නෙමෙයි කරන්න තියෙන්නේ. එකවරක් අහලා හරි ඒකෙ තියෙන ගැඹුරු අදහස තේරුම් අරගෙන අන්න තමන්ගේ අවමඟුලට සහභාගී වන එකයි. ඒක තුළින් නිවන ළංකර ගන්න එකයි. එහෙමත් නැත්නම් අන්න අර කියාපු අශ්ව ගණයේ අර තැනට පත්වන බව අපි හිතාගන්න ඕනෑ.

මේ මරණසතිය බුදුරජාණන් වහන්සේ මේ තරම් වර්ණනා කළේ මොකද? ඒකේ හේතුව මොකද? ඔන්න දැන් ඉතින් ධර්මයේ ගැඹුරු පැත්තටයි එන්නේ. යථාභූත ඤාණය කියලා කියන්නේ, පින්වතුනි, ඇත්ත ඇති හැටියට දැන ගැනීම.ඒ යථාභූත ඤාණය හැටියට බුදුරජාණන් වහන්සේ ඉදිරිපත් කරලා තියෙන කාරණා ටික මේ පින්වතුන් කොතෙකුත් අහලා තියෙනවා- ත්‍රිලක්ෂණය කියලා කියන්නේ. අනිත්‍ය- දුඃඛ- අනාත්ම. එතකොට අනිත්‍යතාව කියලා කියන්නේ - විදර්ශනාව වඩන පින්වතුන් දන්නවා - අනිත්‍යතාව ගැඹුරින් තේරුම් ගැනීමේදී දෙකකට බෙදී යනවා. යමක් අනිත්‍යයි කියලා කියන්නේ එහි හටගැනීමක් දකින්න ලැබෙනවා. ගෙවීයාමක්, නැතිවීමක් දකින්න ලැබෙනවා. 'සමුදය අත්ථංගම' කියලා කියනවා. එතකොට ඒ ඇතිවීමත් නැතිවීමත් කියන දෙක තුළින් සාමාන්‍ය සාංසාරික සත්ත්වයා, පෘථග්ජනයා, නිරන්තරයෙන්ම සමුදය පක්ෂයේ සිටින්නේ. නිරෝධය දකින්නවත් කැමති නෑ. නිරන්තරයෙන්ම අලුත්කරගැනීම් ගැන වෙහෙසෙනවා මිසක් දිරාපත් වෙන දේ ගැන බලන්නේවත් නැහැ. අන්න ඒකයි යථාභූත නොවන්නේ. යථාභූත ඤාණය තුළ දෙකම තියෙන්න ඕනෑ. දෙකම මතුවෙන්න ඕනෑ. ඒකයි බුදුරජාණන් වහන්සේ මේ අනිත්‍යතාව කියලා කීවේ. වෙන එකක් නොවේ. මේ නිරෝධය දැකීමයි. සාමාන්‍ය ලෝකයාට නිරෝධය පෙනෙන්නේ නැහැ. සමුදය විතරයි

පෙනෙන්නේ. ඒක බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනවා. 'යෙ ච රූපූපගා සත්තා- යෙ ච අරූපට්ඨායිනො' රූපලෝකවල ඉන්න අයත් අරූපලෝකවල ඉන්න අයත් දෙවියන් බඹුන් ඇතුළු හැම දෙනෙක්ම නිරෝධය නොදනීම නිසා නැවත නැවත පුනර්භවයට එනවා කියලා බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කළා. කොටින්ම, නිවනට පවා නිරෝධය කියල කියන්නේ ඒකයි.

ලෝකයාට මේ නිරෝධය, ගෙවීයාම, නොපෙනෙන්නේ මොකද? ඒකටත් හේතුවක් තියෙනවා. ඒකට හේතුව බුදුරජාණන් වහන්සේ දක්වනවා මේ චතුරාර්ය සත්‍යයේ තණ්හාව ගැන තේරුම් කරන කොට තණ්හාව හඳුන්වන 'තණ්හා පොනොභවිකා නන්දිරාගසහගතා තත්‍රතත්‍රාභිනන්දිනී' කියන පදමාලාවක් මේ තණ්හාවට යෙදිලා තියනවා. අපි මේ තණ්හාව ස්ත්‍රියක් කියල හිතුවොත් -ඒ පදය ස්ත්‍රීලිංගික පදයක් නිසා - මේ තණ්හාව පොනොභවිකා නිරන්තරයෙන්ම භවය වඩන ඇතිකිරීමට තුඩුදෙන පුනර්භවයක් ඇතිකරවන ස්වභාවයක් තියෙනවා මේ තණ්හාවේ. ඒ වගේම නන්දිරාගසහගතා ඒ ඒ තැන්වල සතුටුවන, ඇලෙන ස්වභාවයක් තියෙනවා. ඊළඟට තත්‍රතත්‍රාභිනන්දිනී - තැනින් තැන සතුටුවන ස්වභාවයක්- මේ තැනින් තැන සතුටුවෙනවා කියලා කියන්නේ මොකක්ද? **නිරෝධය අමතක කරලා** සමුදය තුළින් පැන පැන යනවා. **සමුදයෙන් සමුදයට පැන පැන යනවා** නිරෝධය අමතක කරමින්. ඒ පැත්තට කැමති නැහැ. ගෙවෙන දේවල්- දන් මේ පින්වතුන් වුනත්- අලුත් මෝස්තරයක් අලුත් දෙයක් මතුවුන හැටියේ තමන් පාවිච්චි කරන දේ එතකොට පරණ වෙලා ඉවරයි. ඒක කසළ ගොඩට දාලා අලුත් එක හොය හොයා යනවා. හැම එකක්ම ප්‍රතිසංස්කරණය කරමින්, අලුත් කරමින්, යනවා. සංස්කාර කියන වචනය තුළ තියෙන්නෙත් ඕකයි. **මේ සංස්කරණය කෙරෙන්නේ** අන්න අරක වහ ගන්නයි. **අර ගෙවී යන එක වහගන්නයි.** නිරෝධය වහගන්නයි. එතකොට ඒක යථාභූත වෙන්නේ නැහැ නේ. ලෝකස්වභාවය ඇතිවන හැම දෙයක්ම නැතිවෙනවා. 'යං කිංචි සමුදයධම්මං- සබ්බං තං නිරොධධම්මං' -පටිච්චසමුප්පාදයේ හරය, සාරය එතැනයි. යම්තාක් දෙයක් ඇතිවන ස්වභාවය ඇත්නම් එය දිරායන ස්වභාවයක්ද තියනවා. ඒකාන්තයෙන් දිරායනවා. නමුත් ලෝකයා දිරායන බව, නිරුද්ධවෙනබව අමතක කරනවා, අමතක කරන්නේ අන්න අර තණ්හාවෙන්. ඒක නිසා තණ්හාවේ තියන ඒ පැන පැන යන ගතිය, අර අමතක කරන ගතිය, සමහරවිට දක්වනවා, මේක ලාටුවක් වගෙයි කියලා. තණ්හාවෙන් අලවනවා. **සමුදයෙන් සමුදය අලවනවා නිරෝධය අමතක කරලා.** ඇතිවීම් ඇතිවීම් ටික එකතුකර ගන්නවා. නිරුද්ධ වෙච්ච එක අමතක කරනවා. ඔන්න ඔය ගතිය නිසා සංසාරයේ තව තවත් ගමන්කරන බවයි බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරන්නේ.

බුදුරජාණන් වහන්සේලා මතු කරලා දෙන්නේ අන්න අර මෙතෙක්

ලෝකයාට අමතක වෙච්ච නිරෝධයයි. ව්‍යය පක්ෂයයි, ගෙවීයාම් පක්ෂයයි. ඒක ඉස්මතු කරලා දක්වනවා. ඒක මතුවුන අවස්ථාවේ තමයි මේකෙන් ගැලවීමක් තියෙන්නේ. ඒ අනිත්‍යතාව දුකක්බව තේරෙන්නෙ එතකොටයි. මේක අනිත්‍යයි. මේක ඇතිවීම් නැතිවීම් ස්වභාවයෙන් පෙළෙන නිසාම මේක දුකක්. දුක් ස්වභාවය නිසා මේක මමය මාගේය කියල මාන්නයෙන් ගන්න බැහැ. මෙතන තමන්ගේ වසයේ පවත්වන්න බැහැ. සාමාන්‍ය ලෝකයා තුළ ඒ අදහස තියෙන්නේ අන්න අර කියාපු පැන පැන යන ගතිය නිසා. ඒවා එහෙම පිටින්ම අමතක කරලා - දැන් අපේ ජීවිතය ගැන හිතුවත්, අපේ ශරීරය ගැන හිතුවත් අපි මේ මමය මගේය කියන මොහොතක් පාසා 'මම' කියන වචනය යොදන මොහොතක් පාසා අපේ ශරීරයේ සිදුවන සියුම් වෙනස්කම් ඔක්කොම අපි අමතක කරනවා. මේක ඡායාරූපයේ සිටින මමයි කියලා අපි ගන්නවා. අන්න එහෙම ස්වභාවයක් තියනවා. ඒකට කියනවා ඝන සංඥාව කියලා. මේ ඝන සංඥාව තුළ- තණ්හාවෙන් අර ලාටු මෙන් අලවලා ගත්තු ඝන සංඥාව තුළ - සක්කායදිට්ඨිය කියල එකක් තියනවා. මේ හැම දෙයක්ම රූපගොඩක්. මේ රූපගොඩ තියනවා, වේදනාගොඩ තියෙනවා, සංඥා ගොඩම තියෙනවා, සංස්කාර ගොඩම තියෙනවා, විඤ්ඤාණය කියල කියන ඔක්කොටම වඩා සියුම් - මායාව වගේ, ඇතිවන හිත් බොහෝම ශීඝ්‍රයෙන් ඇතිව නැතිවන හිත් සමූහය නමුත් 'මගේ හිත' 'මම' හැටියට විඤ්ඤාණයත් එකක් හැටියට ගන්නවා. ඉතින් ආත්ම දෘෂ්ටිය තියෙන්නේ ඔතනයි. මේ ඔක්කොටම හේතුව අන්න අර යථාභූත කියලා කියන ඇතිවීම් නැතිවීම් දෙකෙන් නැතිවීම් පක්ෂය අමතක කරලා ඇතිවීම් පක්ෂය පමණක් උලුප්පලා පෙන්වන ගතියයි. ඒක තුළයි ලෝකයා හිරවෙලා ඉන්නේ. එතකොට අන්න ඒක නිසයි බුදුරජාණන් වහන්සේ මරණසතිය වඩන්න කියන්නේ. මරණය තුළ- කෙනෙක් ඉපදෙනවාත් එක්කම-

**උප්පත්තියා සහෙවෙදං**

**මරණං ආගතං සදා**

කියලා ගාථාවක් තියෙනවා උපතත් එක්කම මරණය ආවා. පොඩි එකාට තේරෙන එක මව්පියන්ට තේරෙන්නේ නැහැ. පොඩි එකා උපදින කොට අඬාගෙන උපදින්නේ හරියට 'මම මේ උපන්නෙ මැරෙන්නයි' කියන්නා වගේ. මම මේ උපන්නේ මැරෙන්නයි කියන්නා වගේ. නමුත් මව්පියන්ට ඒක සතුටට කාරණයක්. පොඩි එකෙක් උපන්නා ඉතින් මැරෙන බව දන්නෙ නැහැ. මැරෙන වෙලාවෙත් අර කිව්වා වගේ දිව් නසා ගන්න තරම්, වස කන්න තරම්, ශෝකයක් ඇතිකර ගන්නවා. ඔන්න ඕකයි තත්ත්වය.

ඉතින් ඒක නිසා අපි කල්පනා කරන්න ඕනෑ. බුදුරජාණන් වහන්සේ මරණසතිය වඩන්න කීවේ අර යථාර්ථය මතුකර ගන්නයි. ඒ

යථාර්ථය මතුකර ගන්නයි. මොකද, සංසාරයෙන් මිදීමට ඒකයි උපකාර වෙන්නේ. දැන් පටිච්චසමුප්පාද ධර්මය කියල කියන්නෙත් ඕකයි. මේ හැමදෙයකම ඇතිවීම් නැතිවීම් ස්වභාවය තියෙනවා. ඒකෙන් පෙළෙනවා. ඒකට හේතු වන අර නොදැනීම අවිද්‍යාව කියලා කියන්නේ අර වසන ගතිය- එතකොට තණ්හාවත් අවිද්‍යාවත් - මේ සංසාරයේ අපේ අම්මත් තාත්තත් වගේ තමයි, තණ්හාවයි, අවිද්‍යාවයි. අවිද්‍යා නීවරණය කියලා කියන්නේ අවිද්‍යාවෙන් වහනවා අර ටික. තණ්හාවෙන් අලවනවා. ඒ ඇලවීම තුළ නිරෝධය, ගෙවීයාම, අමතක කරලා අපි මේ ' පැවැත්මක්' කියලා එකක් හදා ගන්නවා. මෙන්න මේ කියාපු පැවැත්ම- මේකේ සියුම්ම කොටස තමයි 'අස්මිමානය' කියලා කියන්නේ. 'අස්මි' කියන්නේ 'වෙමි' මෙන්න මේ 'වෙමි' කියන හැඟීම ඉතාමත්ම සියුම් අන්දමින් තැන්පත් වෙලා තියෙනවා අන්න අර ආශ්වාසයත් ප්‍රශ්වාසයත් අතර. අපි දැන් කිව්වා නේ මරණසතියට බුදුරජාණන් වහන්සේගේ ප්‍රශංසාව ලැබුනෙ, ඉහළම ලකුණු, සීයට සීයක් ලකුණු, ලැබුනේ අර අටදෙනාගෙන් ආශ්වාසයත් ප්‍රශ්වාසයත් අතර මරණසතිය වඩන භික්ෂුවට. ඒකෙන් හිතාගන්න පුළුවන් ආනාපානසතියේ යම් අවස්ථාවක මම හුස්ම ගන්නවා කියන හිතීම වෙනුවට මෙතන තියෙන්නේ හිස්වීම් ගොඩක් පිරවීම් ගොඩක් විතරයි. මමෙක් නැහැ මෙතන. හිස්වීම් පිරවීම් කියල කියන එකත් චලන රාශියක් පමණයි. එක හුස්මක් නොවේ. 'මගේ' හුස්මක් නොවේ. ඒක හුස්ම රැළි ගොඩක්. ගන්නෙත් හුස්මරැළි ගොඩක් ඉවර වෙන්නෙත් හුස්ම රැ ළි ගොඩකින්. මෙතන 'මමය' කියල ගත්තු සංකල්පයයි, ඒ අර අවිද්‍යාවත් තෘෂ්ණාවත් නිසා. අර කියාපු අලවලා වහලා ගත්තු ඒ දෘෂ්ටිය නිසයි ඒක ඇතිවෙන්නේ. අන්න ඒක තුළින් එතකොට හිතාගන්න පුළුවන් මරණසතිය වඩන කෙනාට ක්‍රම ක්‍රමයෙන් අන්න අර අනිත්‍යතාව වැටහෙනවා.

ඒකයි පරණ පොත්වල මරණසතියේ ආනිශංස මහ පුදුම විධියට දක්වන්නෙ. පළමු එක පහසුවෙන් හිතාගන්න පුළුවන්. අර කිව්ව ප්‍රිය විප්‍රයෝග දුක් දරා ගන්න පුළුවන් තත්ත්වය, ඊළඟට ජීවිත ආශාව අඩුවීම, ඊළඟට රැස්කිරීම වෙනුවට අස්කිරීමට හිතයොමුවීම. දැන් බොහෝ දෙනා කෝටි ගණන් රැස්කර ගෙන බැංකුවල තැන්පත් කර එකතු කරගෙන ඉන්නවා. ඒවා නැතිවුන හැටියේ සමහර විට හෘදයාබාධයකින් මිය යනවා. ඒවා හිතෙන් අල්ලාගෙන ඉන්නෙ. කොහේ තිබුන නමුත් මේ හැම එකක්ම අනිත්‍යයි. තමන්ගේ ජීවිතය පමණක් නොවේ අයිති දේවල් පවා. ඉතින් අන්න ඒ වගේ අර මරණ සතිය වඩන කෙනාට ඒවා පිළිබඳ ඇල්ම අඩුයි. ලොකු දේවල් ගොඩගසාගෙන ඒවාට ඇලුම් පවත්වන්න හිත දෙන්නේ නැහැ. ඊටත් වඩා වටිනා දේ තමයි- ඒක තුළින්ම අනිත්‍ය සංඥාවට ළංවන බව දක්වලා තියෙනවා. අනිත්‍ය සංඥාව ඇති කෙනාට අනාත්ම සංඥාව මතු වෙනවමයි. අර කියාපු කාරණා නිසා. ඒ ඇතිවීම නැතිවීම් සභාවයෙන් පෙළෙනව නම්

ඒක මගේය කියල ගන්න හැටියක් නැහැ. ඒකේ අන්තිම කොටස තමයි භවය පිළිබඳව කියන සියුම්ම මානය 'අස්මි' කියල, 'වෙමි' කියල, හිතාගන්නවා. එතකොට අර 'වෙමි' කියලා කියන්න බැරි තත්ත්වයක් සියුම් අන්දමින් ආශ්වාස ප්‍රශ්වාසය පිළිබඳ අවබෝධය ආපු අවස්ථාවේ තේරෙනවා කෙනෙකුට. ඒ අස්මිමාන සමුග්ඝාතය කියල කියන අස්මිමානය නැති කිරීමෙන් තමයි කෙනෙක් අර්හත්වයට පත්වෙන්නේ. එතකොට ඒ මරණසතිය බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කළේ 'මහණෙනි, මරණසතිය වැඩීමේ කෙළවර අමෘතයයි. **මරණසතිය වැඩීමේ කෙළවර අමෘතයයි.** මේක පරස්පර විරෝධී කියමනක් වගෙයි. නමුත්, පින්වතුනි, මේකට පොඩි සාධකයක් හැටියට කියනව නම් දැන් මේ පින්වතුන් දන්නවා සමහර විට හෝමියෝපති කියලා වෛද්‍යක්‍රමයක් තියනවා නේ. සමහරවිට රෝගයට ගැලපෙන විෂබීජයක්ම දමලා රෝගය සමනය කරනවා. ඒ වගේ මෙතන මරණ සතිය කියන්නේ මනුෂ්‍යයා භයයි මේකට-මරණය කියන අදහසට. නමුත් මරණය කියන අදහස හිතට කාවැද්දුනාට පස්සේ අර මරණය කියන භය නැතිවෙනවා. අවසානයේ නිර්වාණ අමෘතයෙන් කෙළවර වෙනවා. ඔන්න ඔය කතාන්තරයයි එතකොට අපි තේරුම් ගන්න තියෙන්නේ.

මේ මරණ සතියට- අපි සාමාන්‍යයෙන් මේ විධියේ දේවල් වලට කැමති නැහැ මේ යුගයේ. අසුභ භාවනාවට කැමති නැහැ. උගත්තු අසුභ භාවනාව පැවිද්දන්ට මිසක් ගිහියන්ට කරන්න බැරි දෙයක් හැටියටත් හිතනව මේ කාලේ. ඒ වගේම මරණ සතිය ගැනත්. ඒ විදියේ සංකල්පයක් දැන් තියනවා. ඒක නිසා අපි හිතන්න ඕන බුදුරජාණන් වහන්සේ මේ තරම් වර්ණනා කළ මරණ සතිය අපි එදිනෙදා ජීවිතයේ අර කියාපු අවමඟුලට සහභාගිවන අවස්ථා ඒවායෙන් අනියම් ප්‍රයෝජන ගන්නේ නැතිව තමාගේ අවමඟුලට සහභාගි වෙන්න ආරාධනාවක් හැටියට සලකලා ඒක උපකාර කරගෙන අර මරණසතිය වඩනවා නම් බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කළ හැටියට අමෘතත්වය කරාම යන්න පුළුවන්.

ඉතින් මේ පින්වතුන් සතුටුවෙන්න ඕන මේ ටික කියා ගන්නතුරු මට මේ මගේ හුස්ම ටික ඉතිරිවීම ගැන. මම දේශනාව බාගයක් පවත්වන කොට මට සැකයක් ඇතිවුනා මරණසතිය පිළිබඳ නිදර්ශනයකුත් දෙන්න වෙයිද කියලා. කොහොම හරි මේ පින්වතුන්ට මේ දේශනාව ඉවරකරන්න තරම් අවස්ථාව ලැබුනා.

ඉතින් මේ පින්වතුන් කල්පනා කරන්න ඕනෑ. මේවා හිතට වදින්න ඕන නිසා- මේ පින්වතුන්ට පහර ගහන්න කීවා නොවේ. අපට අහන්න ලැබෙන හැටියට දැන් ජීවිත තත්ත්වය සමාජයේ මේ ධර්මයට නොවෙයි

ඒ අනිත් පැත්තටයි ගමන් කරන්නේ. විකෘත විදියටයි ධර්මය තෝරන්නේ. ඒක නිසා මේව මතක් කරලා දෙන්න සිද්ධවෙනවා.

ඉතින් මේවායින් ප්‍රයෝජන අරගෙන මේ පින්වතුන් අද මේ රැක්ක සීලය උපකාර කරගෙන තමන් කරන බණ භාවනා සමථයට උපකාර කරගෙන හිත තැන්පත් කරගෙන අන්න අර කියාපු ත්‍රිලක්ෂණයට අදාළව මේ කියාපු මරණ සතිය ආනාපානසතිය ආදිය දියුණු පවුණු කරලා- බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කළ ආකාරයට සත් තිස් බෝධිපාක්ෂික ධර්ම ඇතිතාක් ඕනෑම කෙනෙකුට නිවන් දකින්න පුළුවන්- මේවා අවලංගුකරන්න උත්සාහ කළත් ඇතැම් කෙනෙක්- ඒක නිසා මේවා කල්දාන්නේ නැතිව, අප්‍රමාදීව මේ ධර්මයේ යෙදෙමින්, එදිනෙදා ලැබෙන හැම අවස්ථාවක්ම අනිත්‍ය සංඥාවට, මරණ සතියට උපකාර කරගනිමින් මේ ධර්ම මාර්ගයේ යනවා නම් අර කියාපු උත්තමාර්ථයන් මේ ජීවිතයේදීම ලබාගන්න පුළුවන්. එතකොට මේ පින්වතුන් අද දින රැක්ක සීලයත්, කළ භාවනාවත්, මේ ඇසූ විදර්ශනාත්මක බණත්, මේ පින්වතුන්ට ඒ අර කියාපු උතුම් ප්‍රාර්ථනා සාක්ෂාත් කර ගැනීමට හේතු වාසනා වේවා කියා ප්‍රාර්ථනා කරනවා. ඉක්මණින්ම කළ්‍යාණ මිත්‍ර ආශ්‍රය උපකාර කරගෙන බණ භාවනා ආදිය මුදුන්පත් කරගෙන, සෝවාන් සකදාගාමී අනාගාමී අර්හත් මාර්ග ඵල ප්‍රතිවේධයෙන් උතුම් අමා මහ නිවන් සාක්ෂාත් කර ගැනීමට මේ වචන කීපයත් උපනිශ්‍රය වේවා කියල අපි ප්‍රාර්ථනා කරනවා. එසේම යම්තාක් අවීචියේ සිට අකනිට්ඨාව දක්වා කෙනෙකු සිටිනවා නම් මේ විදියේ ධර්මදේශනාමය ධර්මශ්‍රවණමය ආනිශංස අනුමෝදන් වීමට ඒ කුසලය අනුමෝදන්වීම තුළින් තමන්ගේ ප්‍රාර්ථනීය බෝධියකින් උතුම් අමා මහ නිවනින් සැනසෙත්වා කියා ප්‍රාර්ථනා කරගෙන. මේ ගාථා කියන්න.

'එත්තාවතා ච අමෙහහි..........'

# 04

පහන් කණුව ධර්ම දේශනා අංක 150

# නමො තසස භගවතො අරහතො සමමා සමබුදධසස

**සුඤ්ඤතො ලොකං අවෙක්ඛස්සු - මොඝරාජ සදා සතො**
**අත්තානුදිට්ඨිං ඌහච්ච - එවං මච්චුතරො සියා**
**එවං ලොකං අවෙක්ඛන්තං - මච්චුරාජා න පස්සති**
**-මොඝරාජසුත්ත-සුත්ත නිපාතය**

සැදැහැවත් පින්වතුනි,

ලෝකය මාරයාගේ රාජධානිය හැටියට ධර්මයේ හඳුන්වලා තියෙනවා. උපදින හැම කෙනෙක්ම මරණයට යටත් නිසා ලෝකසත්ත්වයා මාරයාගේ වසයේ සිටින මාරයාගේ යටත් වැසියන් බව බුදුරජාණන් වහන්සේ වදාළා. ඒ එක්කම ඒ තිලෝගුරු බුදුරජාණන් වහන්සේ ඒ මාරයාගේ රාජධානියෙන් මිදෙන, ලෝකයෙන් එතරවන මාර්ගයත් පහදා දුන්නා. ලෝකයෙන් එතරවීමට උපකාර වන ඒ උත්තරීතර ලෝක දර්ශනය අඩංගු වන ගාථාවකුයි අද අපි මාතෘකා හැටියට තබාගත්තේ.

මේ ගාථාව තිලෝගුරු බුදුරජාණන් වහන්සේ දේශනා කර වදාළේ මෝඝරාජ කියන බ්‍රාහ්මණ මානවකයාගේ ප්‍රශ්නයකට උත්තර වශයෙනුයි. මේ මෝඝරාජ කියලා කියන්නේ බාවරී නමැති බ්‍රාහ්මණ ආචාර්ය වරයාගේ ගෝලයින් දහසය දෙනාගෙන් එක්කෙනෙක්. මේ බාවරී කියන බ්‍රාහ්මණ ආචාර්ය වරයා පිළිබඳ දීර්ඝ විස්තරයක් සුත්ත නිපාතයේ පාරායන වග්ග කියන ඒ ධර්ම කොට්ඨාශයේ සඳහන් වෙනවා. ඒ වගේම අටුවා වලත් ඒ අතීත ප්‍රවෘත්ති ආදිය සඳහන් වෙනවා. අවස්ථානුකූලව අපි කෙටි කරලයි කියන්න බලාපොරොත්තු වෙන්නේ.

ඒවායේ දැක්වෙන හැටියට අතීත බුද්ධශාසනවල බොහොම පාරමීශක්තිය දියුණු කර ගත්තු ඒ බාවරී බ්‍රාහ්මණයා ඇතුළු ශිෂ්‍ය පිරිස එකට බොහෝ අවස්ථාවල ඉපදිලා එහෙම ඇවිල්ලා පසේනදී කොසොල් රජ්ජුරුවන්ගේ පියරජු වන මහා කෝසල රජ්ජුරුවන්ගේ කාලයේදී මේ බාවරී බ්‍රාහ්මණයා ත්‍රිවේද පාරගත බ්‍රාහ්මණයෙක්ව පුරෝහිතයා හැටියට හිටිය බව සඳහන් වෙනවා. මහා කෝසල රජ්ජුරුවන්ගේ කාලයේ ඉඳලම පුරෝහිතයා

හැටියට හිටියා. පසේනදී කෝසල රජ්ජුරුවන්ටත් ඒ වගේම පුරෝහිතකම් කරන අතරේ යම් අවස්ථාවක නෙක්ඛම්ම අදහස දැඩිව ඇවිල්ලා විවේකයක් බලාපොරොත්තුවෙන් රජතුමාගෙන් අවසර ලබාගෙන දක්ෂිණාපථය දක්වා - ඒ කියන්නේ ඉන්දියාවේ දකුණු දිශාව දක්වා තමන්ගේ අතවැසි පිරිසත් එක්ක පිටත් වෙලා ගියා. පොතපතේ දක්වෙන හැටියට රජතුමා අමාත්‍යවරු දෙදෙනෙකුට පැවරුවාලු මේ ආචාර්යවරයා ඇතුළු පිරිස සුදුසු තැනක වස්වලා ආශ්‍රම ආදිය හදන්න. අන්තිමට බොහොම දුර මහක් ගෙවා ගෙන ගිහිල්ලා ගෝධාවරී නදී තෙර අස්සක කියන රටේ රජතුමාට අයත් කොටසක ගං ඉවුරේ ලොකු ආශ්‍රමයක් සාදාගෙන මේ පිරිස භාවනානුයෝගීව සිටියා. ඒ වගේම ඒ ගම් ප්‍රදේශයත් බොහොම සමෘද්ධිමත් වෙලා ඒවායින් ලැබෙන ආදායම රජතුමා 'අපේ ආචාර්වරයටම දෙන්න' කියලා ඒ මනුෂ්‍යයින්ට පැවැරුවාම ඒවා ගෙන ආ අවස්ථාවේ දී බාවරී බ්‍රාහ්මයා ඒවා පිළිගත්තේ නැහැ. ඒ වෙනුවට ඒවා යෙදෙව්වා මහා යාගයකට. ඒ විධියට ඒ කියන හැටියට වර්ෂයක් පාසා ඒ ප්‍රදේශයෙන් ලැබෙන ආදායම උපකාර කරගෙන මහායාග පවත්වලා තිබෙනවා.

දැන් මේ කියන සිද්ධිය වන අවස්ථාවෙත් ඒ ලැබිච්ච ඔක්කොම ධනය වියදම් කරලා යාගයක් පවත්වලා ආපසු ආරාමයට ආපු අවස්ථාවේ ආගන්තුක බ්‍රාහ්මණයෙක් ඇවිල්ලා- ඒ කියන හැටියට කුහක බ්‍රාහ්මණයෙක්- තමන්ගේ මානසික ශක්තියක් තියන බව අහවලා කහවණු පන්සියයක් ඉල්ලුවා. එතකොට බාවරී බ්‍රාහ්මණයා "මට කරන්න දෙයක් නැහැ. මා ළඟ තිබූ ඔක්කොම ධනය යාගය සඳහා යෙදෙව්වා" කියලා කිව්වම මේ බ්‍රාහ්මණයා දැඩිව සාපයක් කළා. "මට එහෙම කහවණු පන්සීය දෙන්නේ නැත්නම් හත්දිනකින් ඔබේ හිස සත්කඩකට පැලෙනවා ඇති" කියලා. ඉතින් මේ සාපයට බයේ බාවරී බ්‍රාහ්මණයාගේ භාවනාවත් ඇදැහැලුණා. ආහාරත් නොගෙන නිරාහාරව දවස් ගණනක් ගතකරනවා දකලා ඒ බ්‍රාහ්මණයා පිළිබඳව ශ්‍රද්ධාවක් ඇති එක්තරා දේවතාවෙක් ඇවිල්ලා මේ බ්‍රාහ්මණයා අමතලා කියනවා "ආචාර්යවරය, ඒ ආපු ආගන්තුක බ්‍රාහ්මණයා මහා කුහක ධනලෝභී කෙනෙක්. එයා දන්නේ නැහැ මුදුන මොකක්ද, මුදුන වැටීම මොකක්ද- 'මුද්ධං මුද්ධාධිපාතඤ්ච' කියල යෙදෙනවා. 'හිස්මුදුන දන්නෙත් නැහැ. හිස් මුදුන වැටෙන හැටි දන්නෙත් නැහැ'- කියලා ඒකෙ අර්ථය. 'ඒක පිළිබඳ ඥානයක් එයාට නැත' කියලා කිව්වා. එතකොට බාවරී බ්‍රාහ්මණයා අහනවා "එහෙනම් ඔබ දන්නවාද?" කියලා මේ දේවතාවගෙන් අහනවා. 'මමත් ඒක දන්නේ නැහැ. ඒක පිළිබඳ ඥානය බුදුවරුන් ළඟ විතරයි තියෙන්නේ' කියලා ඔන්න කීවා "කපිල වස්තු පුරයේ ශාක්‍ය කුලයෙන් නික්මිලා දැන් ලෝක නායකත්වය ලබාගෙන සම්මා සම්බුද්ධ කෙනෙක් පහළ වෙලා ඉන්නවා ඒ භාග්‍යවතුන් වහන්සේ දැන් සංඝයා වහන්සේලාට ධර්මය

දේශනා කරනවා." කියල කීවාම ඒ බුදු කෙනෙක් පහළවුනා කියන වචනය අහනවත් එක්කම ප්‍රීතියක් ඇතිවෙලා ශෝකය නැතිව ගියා. ඊළඟට ඇහුවා දන් කොතනද භාග්‍යවතුන් වහන්සේ වැඩවසන්නේ කියලා. එතකොට දේවතාවා කිව්වා සැවැත් නුවර-කොසොල් රජුට අයිති ඒ සැවැත් නුවරය කියලා.

එතකොට මේ බ්‍රාහ්මණයා අර ගෝලයින් දහසය දෙනාට කථා කරලා කියනවා මෙන්න ලෝකයේ ඉතාමත්ම දුර්ලභ තථාගත සම්මා සම්බුදු කෙනෙක් පහළවෙලා ඉන්නවා කියලා මට අහන්න ලැබුනා. වහාම ගිහිල්ලා ඒ බුදුරජාණන් වහන්සේ හමුවෙලා මෙන්න මේ ප්‍රශ්නයට පිළිතුරු ලබාගන්න. 'මුදුන මොකක්ද මුදුන ඇදවැටීම මොකක්ද' කියලා. තමන් නොගියේ මොකද කියන එක අපට හිතා ගන්න පුළුවන්. බාවරී බ්‍රාහ්මණයාට මේ අවස්ථාව වනවිට වයස එකසියවිස්සක්. ඒක බුද්ධ වචනයක් වශයෙනුත් සඳහන් වෙනවා. වයස එකසියවිස්ස නිසා බාවරී බ්‍රාහ්මණයා ගියේ නැහැ. ඒ වෙනුවට ගෝලයින් දහසයදෙනා, දහසය දෙනා පමණක් නොවේ එතන සඳහන් වන්නේ දහස්ගණනක් ගෝලයින්. ඒ දහසය දෙනාගෙන් එක එක්කෙනාටත් හිටියා විශාල පිරිස්. එතකොට විශාල ගණනක් මේ. ඉතින් ගෝලයින් ඇහුවා ආචාර්යවරයාගෙන් ඉස්සරවෙලාම බුදුකෙනෙක් දක්කාම අපි කොහොමද බුදුකෙනෙක් බව හඳුනා ගන්නේ. ඔන්න එතකොට මේ බ්‍රාහ්මණයා කියනවා අපේ මන්ත්‍රවල සඳහන් වෙනවා ලෝකයේ යම්කෙනෙක් දෙතිස් මහා පුරුෂ ලක්ෂණයන්ගෙන් යුතුව උපන්නොත් ඒ පුද්ගලයාට ජීවිතයේ පැති දෙකයි යන්න තියෙන්නේ. ගිහි ජීවිතයේ සිටියොත් මුළු ලෝකයේම චක්‍රවර්ති වෙලා ඒ කියන්නේ ලෝකය ධර්මයෙන් ජයගෙන ධර්මයෙන් අනුසාසනා කරනවා. ගිහිගෙන් නික්ම පැවිදි වුනොත් සම්මා සම්බුදු වෙනවා කියලා අපේ මන්ත්‍රවල තියෙනවා. ඒක නිසා ඒ ශරීරයේ තියෙන මහා පුරුෂ ලක්ෂණ තුළින් බුදුකෙනෙකු හඳුනාගන්න. ඒවගේම ඒ බුදුරජාණන් වහන්සේ මුණ ගැසුනාම අහන්න මා පිළිබඳවත්, මගේ ගෝත්‍රය, මට කොච්චර පිරිස ඉන්නවාද මගේ ශරීරයේ ලක්ෂණ ආදිය ගැනත් අහන්න. ඒ වගේම මේ කියාපු ගැඹුරු ප්‍රශ්නයත් අහන්න. හැබැයි ප්‍රශ්න අහන්න කීවේ හිතෙන්. කටවචනයෙන් නොවෙයි. හිතෙන් අහන්නේ මොකද? ඒ බුදුරජාණන් වහන්සේ ඇත්ත වශයෙන්ම අනාවරණඥානය තිබෙන කෙනෙක් නම්-'අනාවරණ දස්සාවී' කියලා කියනවා-අනාවරණ ඥානය තියෙන කෙනෙක්නම් බුදුරජාණන් වහන්සේ නුඹලා හිතෙන් අහපු ප්‍රශ්න වලට වචනයෙන්  පිළිතුරු දෙනවා ඇති කියලා කිව්වා.

ඔන්න එතකොට මේ ගෝලයින් ආචාර්යයන් වහන්සේට වැඳලා පැදකුණු කරලා ඒ විශාල පිරිසක්- හිතාගන්න- එතකොට ඉන්දියාවේ ඒ ගෝධාවරී නදී තෙර ඉඳලා ඒ දුරු මහ ගෙවාගෙන ඒ පොත්වල තියෙනවා දන් මේ කාලයේ එතන ඉඳලා ගමන් මාර්ගය ඉතිහාසඥයෝ හඳුනා ගන්නේ ඔවුන් පසුකළ නගර, ග්‍රාම සඳහන් වෙනවා, ඒවායින්ය කියල. ඒ විදියට මහ

ගෙවලා ඒ වෙලාව වෙනකොට සෑහෙන කාලයක් යන්න ඇතැයි කියලා අපට හිතාගන්න පුළුවන්. ඒ පිරිස යනකොට සැවැත් නුවර නොවේ බුදුරජාණන් වහන්සේ, මගධයේ පාසාණක චෛත්‍යය තියන තැන. ඉතින් ඒකත් පොතපතේ දැක්වෙන හැටියට බුදුරජාණන් වහන්සේ ඒ අය එන බව දැනගෙන ඊට සුදුසු තැනක් දක්වා බුදු රජාණන් වහන්සේ ඇතට වැඩිය බවයි පෙන්නුම් කරන්නේ.

ඉතින් කොහොම හරි මේ පිරිස ඔන්න ඒ දුර මහ ගෙවාගෙන ගිහිල්ලා.- ඒ ගෝලයින් දහසය දෙනාගේම නම් සඳහන් වෙනවා. අජිත, තිස්ස මෙත්තෙය්‍යා, පෝසාල, පුණ්ණක, උදය, මෝඝරාජ ආදී වශයෙන් ඒ දහසය දෙනාගේ නම් සඳහන් වෙනවා. එයින් අජිත ශිෂ්‍යයා ප්‍රධාන ඒ දහසය දෙනාම ඒ ප්‍රදේශයට ආවට පස්සේ බොහොම සතුටින් කන්ද නැගලා ගිහිල්ලා අජිත කියන බ්‍රාහ්මණ මානවකයා බුදුරජාණන් වහන්සේ හමුවෙලා අර කියාපු විධියට බුදුරජාණන් වහන්සේගේ ශරීරය දැකීම තුළින්ම තේරුම් ගත්තා. මේ බුදු කෙනෙක් තමයි කියලා. ඒ වුනත් තමන්ගේ ආචාර්යවරයා කිවූ ආකාරයට හිතින් ප්‍රශ්න කළා, මෙන්න මේ ප්‍රශ්නවලට පිළිතුරු දෙන්න කියලා. ඒ අවස්ථාවේ බුදුරජාණන් වහන්සේ මහා සංඝයා පිරිවරාගෙන ධර්මය දේශනා කරමිනුයි සිටියේ. ඉතින් අජිත අවසර ලබාගෙන හිතින්ම ප්‍රශ්න කරන අවස්ථාවේ බුදුරජාණන් වහන්සේ කවුරුවත් අහපු නැති ප්‍රශ්නවලට පිළිතුරු දෙන්නා වගේ පිළිතුරු දෙනවා. පිරිසත් පුදුමයට පත්වුන බව සඳහන් වෙනවා. ඔබ අහන ගුරුවරයා අහවල් හැඩරුව තියන මෙච්චර පිරිසක් සිටින පන්සීයක් ශිෂ්‍යයින්ට වේදය උගන්වන ආචාර්යවරයෙක්. අවුරුදු එකසිය විස්සයි වයස කියලා, ඊළඟට ඇහුවා අර ප්‍රශ්නය 'මුදුන මොකක්ද මුදුනේ වැටීම මොකක්ද' කියලා. ඔන්න ඒකට බුදුරජාණන් වහන්සේ පිළිතුරු දෙනවා අවිද්‍යාව තමයි මුදුන. හිස්මුදුන අවිද්‍යාවයි. එතකොට හිස් මුදුන බිඳ වැටීම කියලා කියන්නේ විද්‍යාවයි. විද්‍යාව කිව්වාම මේ කාලයේ අර්ථයෙන් නෙවෙයි. මේ පින්වතුන් වරදවා වටහා ගන්න එපා. අවිද්‍යාව නැතිවුනාම ඇතිවන ඒ ප්‍රඥාවයි ධර්මානුකූලව විද්‍යාව. ඒ විද්‍යාවත් එක්කම යන අනෙක් වචනත් එතන සඳහන් වෙනවා, ඒ ගාථාවේ සද්ධා, සති, සමාධි, ඡන්ද, විරිය. සද්ධා, සති සමාධි, ඡන්ද, විරිය ආදියෙන් යුක්ත විද්‍යාවෙන් තමයි ඒ මුදුන බිඳ හැලෙන්නේ කියලා අන්න අර ගැඹුරු ප්‍රශ්නයට එතෙන්දි පිළිතුරු දුන්නා.

ඉතින් අජිත මානවකයා විශාල සතුටකින් ඒ බුදුරජාණන් වහන්සේට වන්දනා කළා අර බාවරී බ්‍රාහ්මණයා කිව්ව ආකාරයට තමන්ගේ ශිෂ්‍යයින් සමඟ 'මාගේ ආචාර්යයන් වහන්සේ ඔබ වහන්සේගේ පා වඳිනවා' කියලා. ඒ අවස්ථාවේ බුදුරජාණන් වහන්සේත් ආශිර්වාද කළා. 'බාවරී බ්‍රාහ්මණයා සුඛිත වේවා! ඒ වගේම ඔබත් සුඛිත වේවා! දීර්ඝායුෂ්ක වේවා!' කියලා අජිත බ්‍රාහ්මණ මානවකයාට ආශිර්වාද කරලා ඊළඟට බුදුරජාණන් වහන්සේ පැවරුවා, බාවරීට හෝ ඔබ අතුරෙන් කෙනෙකුට හෝ යම් ධර්ම

ප්‍රශ්නයක් තිබෙනවා නම් මගෙන් අහන්න කියලා. ඔන්න ඒ අවස්ථාවේ අජිත ප්‍රධාන ඒ දහසය දෙනාම බුදුරජාණන් වහන්සේගෙන් ගාථාවලින් ධර්ම ප්‍රශ්න ඇහුවා හිතෙන්. ඒ අහපු ප්‍රශ්නවලට බුදුරජාණන් වහන්සේ කට වචනයෙන් පුදුම අන්දමේ ගැඹුරු පිළිතුරු දුන්නා. ඒ සූත්‍ර දේශනාව අවසානයේ දක්වන හැටියට ඒ දහසය දෙනා අතුරෙන් පහළොස් දෙනෙක්ම එහෙමම රහත් වුණා. පිංගිය කියන වයසක බ්‍රාහ්මණයා පමණක් අවසානයේ අනාගාමී තත්ත්වයට පත් වුණා. මොකද, පිංගිය බ්‍රාහ්මණයා නිතරම හිත හිතා හිටියා දැන් මේ ප්‍රවෘත්තිය ගිහින් බාවරී බ්‍රාහ්මණයාට කියන්න ඕන කියලා. බාවරී බ්‍රාහ්මණයාගේ ඥාතිවරයෙක්. ඒ හැරෙන්න අනිත් ඔක්කොම රහත් වුන බවයි කියවෙන්නේ.

ඔන්න දැන් අපි අපේ ප්‍රශ්නයට ළං වෙමු. එතකොට දැන් මේ පින්වතුන් දන්නවා ඒ දහසය දෙනාගෙන් කෙනෙක් බව මෝඝරාජ බ්‍රාහ්මණයා. නමුත් පොත පතේ දක්වෙන හැටියට මෝඝරාජ බ්‍රාහ්මණයාගේ ප්‍රශ්නයට වාරය ලැබුණේ, අවසරය ලැබුණේ, පහළොස්වෙනි අවස්ථාවේයි. අනිත් දාහතරදෙනෙක් අහලා ඉවර වුනාට පස්සේ. එතැන කියවෙන හැටියට ඒ මෝඝරාජ බ්‍රාහ්මණයා කියනවා මම දෙවරක් භාග්‍යවතුන් වහන්සේගෙන් හිතෙන් ප්‍රශ්න ඇහුවාම භාග්‍යවතුන් වහන්සේ මට උත්තර දුන්නේ නැහැ. මම අහලා තියනවා බුදුරජාණන් වහන්සේලාගෙන් තුන්වරක් අහන්න පුළුවන් කියලා. එන අතරමඟ දැනගන්න ලැබෙන්න ඇති, සම්මා සම්බුදුරජාණන් වහන්සේ කෙනෙකුගෙන් ඇසිය යුතු ආකාරය. කොයි හැටි නමුත් ඒක නිසා මම තුන්වන වරටත් අහනවා කියලා. ඔන්න මෝඝරාජ බ්‍රාහ්මණයා ප්‍රශ්නය ඉදිරිපත් කරනවා. තවත් ගාථා තිබුනත් කෙටියෙන් කියතොත් මේකයි ප්‍රශ්නය.

කථං ලොකං අවෙක‍ඛනතං- මච්චුරාජා න පස‍්සති

ලෝකය කොයි ආකාරයකින් - ලෝකය දෙස කොයි ආකාරයකින් - බලන කෙනාද මාරයා නොදකින්නේ? මාරයාගේ ඇසට ලක් නොවන්නේ? ඔන්න ඔය ප්‍රශ්නයට පිළිතුරු වශයෙන් තමයි බුදුරජාණන් වහන්සේ මේ අපි මාතෘකා කළ ගාථාව වදාළේ.

**සුඤ‍්ඤතො ලොකං අවෙක‍්ඛස‍්සු - මොඝරාජ සදා සතො**

**අත‍්තානුදිට‍්ඨිං ඌහච‍්ච - එවං මච‍්චුතරො සියා**

**එවං ලොකං අවෙක‍්ඛන‍්තං - මච‍්චුරාජා න පස‍්සති**

මෝඝරාජය, හැමකල්හි සතිමත්ව ලෝකය ශූන්‍ය ලෙස බලව, හිස් හැටියට බලව.

අත‍්තානුදිට‍්ඨිං ඌහච‍්ච එවං මච‍්චුතරො සියා.

ආත්මය අනුව ගිය දෘෂ්ටිය මුලින් උපුටා දමන්න. ඒ මුලිනුපුටා දැමීම තුළින් මෙසේය, මාරයාගෙන් එතර වන්නේ,

එවං ලොකං අවෙක්ඛන්තං - මේ ආකාරයට ලෝකය දෙස බලන තැනැත්තාව
මච්චුරාජා න පස්සති - මාරයා නොදකී

ඉතින් මෙතන මේ ගාථාවේ තියෙන ගැඹුර අපට හිතාගන්න පුළුවන්. බුදු රජාණන්වහන්සේ මේ මෝඝරාජ කියන බ්‍රාහ්මණයාට එල්ල කළේ මේ ගාථාව අර දෙවරක් ප්‍රශ්නය අහලත් එතන කියන විදියට අනික් ප්‍රශ්න අහලා ඥානය මෝරා යනතුරු හිටියයි කියලයි සමහර විවරණ දක්වන්නේ.

මෙතන ශූන්‍යතාව ගැන කියපු එකේ ගැලපීම එන්නේ මොකද 'මෝඝ' කියන වචනයේ තේරුම. හිස්, මෝඝ කියන වචනයේ තේරුමත් හිස්.

දැන් සාමාන්‍යයෙන් මෝඝ පුරුෂයා කියනව බුදුරජාණන් වහන්සේ කෙනෙකුට නිග්‍රහ කිරීමට. නමුත් මෙතන 'මෝඝරාජ'- මේ බ්‍රාහ්මණයාගේ නමත් මෝඝරාජ. නමුත් මෙතනදී හිස්බව ලෝකයේ ඇති ගැඹුරුම දර්ශනය හැටියට බුදුරජාණන් වහන්සේ පෙන්නුවා. ශූන්‍යතාව. ඉතින් ලෝකය ශූන්‍ය වශයෙන් බලන්න. මේ ගාථාව අහලා ඉවරවෙන කොට මෝඝරාජ බ්‍රාහ්මණයා රහත්වුන බවයි, දැක්වෙන්නේ. මොකද, මේ දහසය දෙනාම එසේ මෙසේ අය නොවෙයි. ඒ අය ගැන මෙන්න මේ විධියට සඳහන් වෙනවා.

' ඣායී ඣානරතා ධීරා - පුබ්බවාසනවාසිතා'

නිරන්තරයෙන් ධ්‍යාන වඩන ඒ වගේම 'පුබ්බවාසනවාසිතා' අතීත පුණ්‍ය ශක්තීන් ඇති අය බාවරී බ්‍රාහමණයගෙ පිරිස. බාවරී බ්‍රාහ්මණයාට මහා පුරුෂ ලක්ෂණ පවා තිබිලා තියනවා ශරීරයේ. ඒ තරම් ධ්‍යාන වඩලා ඒ පැත්තෙන් දියුණු කට්ටිය නිසා, සංසාරික පුරුද්ද දියුණු කරල තියෙන නිසා, අන්න අර ගාථාව අහලා රහත්වුන බව සඳහන් වෙනවා.

දැන් එතකොට අනිකුත් ප්‍රවෘත්ති කෙසේ වෙතත් මෝඝරාජ බ්‍රාහ්මණයා ඇතුළු පිරිස බුද්ධ ශාසනයේ 'එහි භික්ෂු භාවයෙන්' පැවිදි වුනයි කියලා කියනවා. මෝඝරාජ බ්‍රාහ්මණයා පැවිදි වෙලා ඉවර වෙලා ඔන්න දැන් ඉතින් මෝඝරාජ මහ රහතන් වහන්සේ- මෝඝරාජ මහරහතන් වහන්සේ පිළිබඳව ශාසනික වශයෙන් බලන කොට වටිනා පැත්තක් තිබෙනවා. උන් වහන්සේ රහත් වුනාට පස්සේ පැවිදි ජීවිතය ආරම්භ කළේ, පාංශුකූල චීවර, ඉතාමත්ම අල්පේච්ඡ රළු සිවුරු දරමින්. එතකොට බුදුරජාණන් වහන්සේ ඒක නිසා- දැන් එතදග්ග නමින් දැක්වෙන කොටසෙ කියවෙනවා බුදුරජාණන් වහන්සේ අවස්ථානුකූලව භික්ෂු භික්ෂුනීන්ට, උපාසක උපාසිකාවන්ට අග්‍ර තනතුර දුන්නා කියලා. "එතදග්ගං භික්ඛවෙ මම සාවකානං" ආදී වශයෙන් මාගේ ශ්‍රාවකයින් අතර මේ මේ පැත්තෙන් මේ මේ අය අග්‍රයි කියලා. ඉතින් මේ රළු සිවුරු දරන්නන් අතර අග්‍ර ස්ථානය මෝඝරාජ මහරහතන් වහන්සේට ලැබුණා. දැන් මේ පින්වතුන්ට අද දවසේ මේක අහනකොට පුදුම හිතෙන්න

පුළුවන්. එදත් අදත් අතර වෙනස. දැන් මේ වස්සානය අවසාන වන පෝයයි. පසුගිය මාසය තුළම මේ ශ්‍රද්ධාවන්ත ගිහි පින්වතුනුත් සංඝයා වහන්සේලාත් නිරන්තරයෙන් සිවුරු ගැනයි කථාව සිතුවිල්ල ඔක්කොම යොදලා තියෙන්නේ. ඉතින් සිවුර ගැන හිතන කොට උත්කෘෂ්ටම සිවුර නේද අපි කවුරුත් ලොකු හැටියට ගන්නේ. බුදුරජාණන් වහන්සේ එහෙම උත්කෘෂ්ට සිවුරු දරන්නන් අතර එතදග්ග තනතුර දුන්නේ නැහැ. රූක්ෂ, කටුක, රළු සිවුරු දරන්නන් අතර අග්‍රස්ථානය මෝඝරාජ මහරහතන් වහන්සේට දී වදාළා. ඉතින් මේ එදත් අදත් අතර වෙනස මේ පින්වතුන්ට හිතාගන්න පුළුවන්.

තවදුරටත් ඒ ගැන කියනවා නම් උන්වහන්සේගේ චරිතයේ තවත් විශේෂ ලක්ෂණයක් පොත පතේ සඳහන් වෙනවා. උන්වහන්සේ එහෙම රළු සිවුරු දරමින් අල්පේච්ඡ වශයෙන් ජීවත්වෙන අවස්ථාවේ අතීත කර්ම වේගයක් නිසා ශරීරය පුරා දද බිබිලි මතුවෙලා තිබුණා. එක් අවස්ථාවක, උන්වහන්සේ සේනාසනය කිලිටි වෙනවා කියලා හිතාගෙන සේනාසනය අතහැරලා කෙත්වල ගොයම් පැහිච්ච කාලයේ පිදුරු ඇඳක, පිදුරු යහනක සැතපුනා. එතකොට එක් අවස්ථාවක බුදුරජාණන් වහන්සෙගේ උපස්ථානයට ආවාම බුදුරජාණන් වහන්සේ පිළිසඳර වශයෙන් මෝඝරාජ ස්වාමීන් වහන්සේ අමතලා මේ විධියටයි ප්‍රකාශ කරන්නේ **'ඡවිපාපක චිත්ත භද්දක'** එහෙම ආමන්ත්‍රණය කරලා ගාථාවකින් අහනවා සුවදුක්. කොහොමද අහන්නේ- ඒ වචන දෙකටයි අපි ඉස්සෙල්ල හිත යොදන්න තියෙන්නෙ එතන 'ඡවිපාපක' ඡවිය කියන්නේ සිවිය ශරීරයේ හමේ උඩින් තියන පැත්ත නේ සිවිය කියන්නෙ? එතකොට පිටපැත්තෙන් බැලුවාම 'පාපක' ගන්න දෙයක් නැහැ. පිට පොත්ත සුන්දර නැහැ. නමුත් 'චිත්ත භද්දක' සිත භද්‍රයි. සොඳුරුයි. එතකොට බුදුරජාණන් වහන්සේ **'ඡවිපාපක චිත්තභද්දක මොඝරාජ සතතං සමාහිතො'** ඔන්න ඊළඟට ගුණ පක්ෂය කියනවා. හැමකල්හිම සමාධිමත්වූ මෝඝරාජ- ඒ නමුත් අන්න අර කිව්ව කාරණය **'හම සුන්දර නැහැ සිත සුන්දරයි'**. **'හේමන්ත සීත කාල රත්තියො'** මේ හේමන්ත ඍතුවේ රාත්‍රි බොහොම සීතලයි. **'භික්ඛු තුවං කථං කරිස්සසි'** භික්ෂුව ඔබ මොකද කරන්නේ? කොහොමද ඉන්නේ? කොහොමද සැප සනීප කියලයි ඇහුවේ. ඔන්න එතකොට මෝඝරාජ මහරහතන් වහන්සේ පිළිතුරු දෙන ආකාරය පුදුමයි.

**සම්පන්නසස්සා මගධා - කෙවලා ඉති මෙ සුතා**

**පළාලච්ඡන්නකො සෙය්‍යං - යථඤ්ඤෙ සුඛජීවිනො**

ඒ කියන්නේ "මට අහන්න ලැබිලා තියනවා මගධය පුරා කෙත්, මුළු මගධ ප්‍රදේශයේම කෙත්- පැහිලයි කියලා. පිදුරු ඇඳක් මට තියනවා. සුවසේ ඉන්න අනික් අය වගේම තමයි මමත්. ඒකයි ඒ ගාථාවේ අදහස.

අන්න මේ පින්වතුන්ට බුදුරජාණන් වහන්සේ පිළිබඳව ඇට්ටේරිය වනයේ ගතකළ ඒ කතාව මතක් වෙනවා ඇති. ඒ සීතල රාත්‍රියක් ගත කරලා සුවසේ ඉන්නවා කියලා කිව්වා වගේ මෝඝරාජ මහ රහතන් වහන්සේත් කියනවා සමාධි ශක්තීන් තුළින් අර කියාපු අල්පේච්ඡතාවට හිත නඟා ගැනීම තුළින්, අර ශූන්‍යතා දර්ශනය ජීවිතයට ළංකරගැනීම තුළින්, මේවා හිස්බව දකලා- අන්න එතකොට ගතකළේ පිදුරු සෙවිලි කළ පැලක පිදුරු ඇඳක. ඔන්න එතකොට ඒක හොඳයි මේ යුගයේ මේ පින්වතුන්ට මෝඝරාජ ස්වාමීන් වහන්සේලා වගේ අය මේ කාලයේ ධර්මදේශනාවල ඉස්සරහට එන විධියේ චරිත නොවෙයි. නමුත් අපි හිතන්න ඕන අන්න බුදුරජාණන්වහන්සේ ඇමතූ ආකාරයට'චිත්තභද්දක'- 'පොත්ත' නරකයි සිත සොඳුරුයි. **පොත්ත ලස්සනට තිබුනත් වැඩිකල් තියෙන්නේ නැහැ. 'චිත්ත භද්දක' සිත සොඳුරුයි. ඒකයි වැදගත්.** නමුත් දැන් ශාසනයේ වටිනාකම් අතර කොයිතරම් පෙරළියක්ද කියල මේ පින්වතුන්ට හිතාගන්න පුළුවන්. කෙසේ හෝ වේවා ඔන්න එතකොට මෝඝරාජ මහරහතන්වහන්සේ පිළිබඳව- ඒ චරිතය පිළිබඳව- තවත් තැන්වල තියනවා උන්වහන්සේ බුදුරජාණන් වහන්සේගෙන් අහපු ධර්ම ප්‍රශ්න ගැන.

දැන් ඊළඟට අපි යමු මේකෙ මාතෘකාවට. අපි කීවා උත්තරීතර දර්ශනයක් මේ බුදුරජාණන් වහන්සේ ඉදිරිපත් කරලා තියෙන්නේ කියලා මාරයාගෙන් මිදෙන්න. ශූන්‍යතාව කියන වචනය බොහෝ දෙනාට අප්‍රියයි. ශූන්‍ය කියල කියන්නේ හිස්. එතකොට භවය ප්‍රාර්ථනා කරන ලෝකයාට 'භවාරාමා භවරතා භවසම්මුදිතා' කියලා බුදුරජාණන් වහන්සේ දක්වූ ආකාරයට භවය ප්‍රාර්ථනා කරන ලෝකයාට අනිත්‍යතාව- බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කළ ත්‍රිලක්ෂණය- එච්චර හිතට අල්ලන්නේ නැහැ. 'යදනිච්චං තං දුක්ඛං - යං දුක්ඛං තදනත්තා' යමක් අනිත්‍යද එය දුක් සහිතයි. එය දුක් සහිත නිසා, එය තමන්ගේ වසයේ පවත්වන්න බැරි නිසා, ඒක අනාත්මයි. මෙන්න මේ අනාත්ම කියන වචනයට ළඟයි ශූන්‍ය කියන වචනය. මේ හිස්බව කියන ඒක.

දැන් අපි කෙලින්ම ශූන්‍යතාව පිළිබඳව සංඝයා වහන්සේලා ඇසූ ප්‍රශ්නයක් ආශ්‍රයෙන් ගත්තොත් ආනන්ද ස්වාමීන් වහන්සේ එක් අවස්ථාවක බුදුරජාණන් වහන්සේගෙන් අහනවා 'සුඤ්ඤො ලොකො සුඤ්ඤො ලොකො' කියලා කියනවා. ස්වාමීනී කෙතෙකින්ද ලෝකය ශූන්‍යවන්නේ? අන්න බුදුරජාණන් වහන්සේ පිළිතුරු දෙනවා 'සුඤ්ඤමිද අත්තෙනවා අත්තනියෙනවා' යමක් ආත්ම වශයෙන්වත් ආත්මයට අයිති වශයෙන්වත් ගතහැකි නොවේද එය ශූන්‍යයි. ආත්ම වශයෙන් ගත හැකි දේකුත් නැත්නම්, ආත්මීය වශයෙන් ආත්මයට අයිති දෙයක් හැටියට ගත හැකි දේකුත් නැත්නම්, ඒක ශූන්‍යයි, හිස්. ආත්මය කියන වචනයත් එක්ක කල්පනා කරන්න ඕනෑ සාරාර්ථයක්, හරයක් තියනවා, අරටුවක් තියනවා, කියන හැඟීමක්, එනවා ආත්ම කියන වචනයත් එක්ක. වසයේ පැවැත්වීමේ හැකියාවක් පිළිබඳ කථාවක් තියෙනවා.

ඉතින් ඒක ශුන්‍ය කියන්නේ එබඳු දෙයක් නැති බවයි. ඊළඟට බුදුරජාණන් වහන්සේ කියනවා කුමක්ද හිස්, ශුන්‍ය? කුමක්ද හිස්? ඇස ශුන්‍යයි ආත්මයකින් හෝ ආත්මයට අයිති දේකින්. චක්ඛු විඤ්ඤාණය, චක්ඛු සම්ඵස්සය. චක්ඛුසම්ඵස්සය නිසා ඇතිවන වේදයිතය ආදි වශයෙන් සළායතන ආශ්‍රයෙන් ඒ ශුන්‍යතාව එතන දක්වනවා.

තවත් අවස්ථාවක බුදුරජාණන් වහන්සේ ආසිවිසෝපම කියන සූත්‍රයේ- ඒ සූත්‍රයේ උපමා රාශියක් තියනවා- යෙදූ එක උපමාවක් තමයි පාලුගම, 'සුඤ්ඤාගාමො'- පාලුගම කියලා කියන එක හඳුන්වන්නෙත් ආධ්‍යාත්මික ආයතන හය- ඇස, කණ, නැහැය, දිව, කය මන ඒ හයම ශුන්‍යයි කියල. ආත්ම ආත්මීය තත්ත්වයෙන් ශුන්‍යයි, කියලා. ඒව හිස්! ඒවායේ මොකක්වත් රඳන්නේ නැහැ. රඳනවා කියලා අපි හිතනවා පමණයි. **ඇසේ රූපයක් ගැටුනා කියලා කියන්නේ මේකේ ඇඳිලා තියෙන්නේ නැහැ. ඇලෙන්නේ හිතයි.** ඇසේ රූප ගැටුනාම- ඇසේ ඇත්ත වශයෙන්ම රූප ගැටුනොත්හෙම ඇහැ තුවාල වෙනවා. නමුත් අපට ඇහේ රූපය ගැටුනාම අර ඒ ගැටීම තුළින් ගන්න සංඥාවයි අපි ඊළඟට ගෙනියන්නේ, හිතින් හදාගත්තු ප්‍රපංචයක්. එතකොට ඇසේ රූප ගැටෙන්නේ නැහැ. ඒ වගේම කණේ ශබ්ද රැඳෙන්නෙත් නැහැ. නමුත් අපි ඒක හිත ඇතුළේ කන්කරච්චලයක් හදා ගන්නවා. අන්න ඒ වගේ මේ එකක්වත් රඳන්නේ නැහැ. මෙතන පාලු ගෙවල්. නමුත් අපේ අර තියෙන අවිජ්ජාව නිසා අර විධියට ප්‍රපංච වශයෙන් හිතා ගන්නවා, කොච්චර රස ආහාර ගත්තත් දිවේ රැඳෙන්නේ නැහැ. එතකොට ඇසේ රූප ගැටෙන්නේ නැහැ. කණේ ශබ්ද රැඳෙන්නේ නැහැ. දිවේ ඇලෙන්නේ නැහැ. කයේ ඇලෙන්නේ නැහැ. සිතේ රැඳෙන්නේ නැහැ කිසිවක්. අපි හිතනවා හිතේ ආත්මයක් තියෙනවා කියලා. විඤ්ඤාණය පිළිබඳ ඒ ආත්මසංකල්පයයි වැඩිපුරම ගන්නේ. නමුත් හිතේවත් මොකක්වත් රඳන්නේ නැහැ. ඒකයි අනිත්‍යතාවේ ගැඹුරුම කාරණය. එතකොට අනිත්‍යතාවේ කෙළවර තමයි මේ අනාත්ම දර්ශනය තිබෙන්නේ. ඒ අනාත්ම බව හඟවන එකක් මේ ශුන්‍යතාව කියල කියන්නේ. ආත්ම වශයෙන්, සාර වශයෙන්, ගතහැකි දෙයක් නැත්නම් ඒක බොල්, හිස්, රිත්ත, තුච්ඡ, සුඤ්ඤ ආදී පද සමානාර්ථවත් වශයෙන් දක්වෙනවා. රිත්ත හිස් තුච්ඡ ඒවගේම සුඤ්ඤ මේ වචන විදර්ශනාවට උපකාරවන වචන හැටියට දක්වනවා.

දැන් මේ ශාසනයේ ඇතැම් ධර්මසාකච්ඡා, ධර්ම සංවාද, කෙරෙන්නේ නොදන්නා දෙයක් දැන ගැනීමේ අරමුණින් පමණක් නොවේ. ඒ මහා ශ්‍රේෂ්ඨ ස්වාමීන් වහන්සේලා නොදන්නා අනාගත පරම්පරාව වෙනුවෙන් හරියට නොදන්නවා වගේ ධර්ම සංවාද පවත්වලා තියෙනවා. ඒ විධියේ දේවල් කොතෙකුත් මේ සූත්‍ර දේශනාවල තියෙනවා. එහෙම අවස්ථාවක්. දැන් මේ ශාසනයේ කවුරුත් දන්න දෙනමක්- මහාසාරිපුත්ත ස්වාමීන් වහන්සේ

ගැන අමුතුවෙන් කියන්න දෙයක් නැහැ. මහා කොට්ඨිත ස්වාමීන් වහන්සේත් ඒ වගෙයි. නමුත් එක් අවස්ථාවක මහා කොට්ඨිත ස්වාමීන්වහන්සේ දන්නේ නැතිව වගේ ශාරිපුත්‍ර ස්වාමීන් වහන්සේගෙන් අහනවා ඇවැත්නි සාරිපුත්ත සිල්වත් භික්ෂුවක් විසින් කවර නම් ධර්ම කොට්ඨාශ, එහෙම නැත්නම් කවර ධර්ම නුවණින් මෙනෙහි කළ යුත්තේද?

එතකොට ශාරිපුත්‍ර ස්වාමීන් වහන්සේ පිළිතුරු දෙනවා සිල්වත් භික්ෂුවක් විසින් මේ පංචඋපාදානස්කන්ධය, රූප, වේදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ කියන මේ පංචුපාදාන ස්කන්ධය නුවණින් මෙනෙහි කළ යුතුයි. ඔන්න මෙනෙහි කරන ආකාරය දක්වනවා එකොළොස් ආකාරයක්, 'අනිච්චතො, දුක්ඛතො, රොගතො, ගණ්ඩතො, සල්ලතො, අඝතො, ආබාධතො, පරතො පලොකතො, සුඤ්ඤතො, අනත්තතො. අපට ඕනෑ වචනයත් තියෙනවා අගහරියේ. එකොළොස් ආකාරයකින් මෙනෙහි කරන්න කියනවා. අනිත්‍ය වශයෙන්, දුක් වශයෙන්, රෝගයක් වශයෙන්, ගඩක් වශයෙන්, හුලක් වශයෙන් ව්‍යසනයක් වශයෙන්, ආබාධයක් වශයෙන්, පරතො කියල කියන්නේ තමන්ට අයිති නැති දෙයක් වශයෙන්, පලොකතො කියන්නේ බිඳෙන දෙයක් හැටියට. එතකොට පරතො කියන එකෙනුත් තේරෙනවා තමන්ගේ නොවන බව. මේක අයිති නැති බව. අනුන්ට අයිති බව. දැන් අපේ ශරීරය වුනත් අපට අයිතියි කිව්වට මේක ඇතුළේ ඉන්න අයට ඇහුණොත්. මේකෙ කොච්චර ඉන්නවද? මේක ඇතුලේ පණුවො. මේක අපට අයිතියි කිව්වට ඒ අයගේ අයිතිය තහවුරු වන්නේ හුස්ම ටික ගියදාට- 'පරතො' කියලා කියන්නේ. ජීවත් වන අපි අපේම ශරීරය වුනත් කීදෙනෙකුගේ පිහිටෙන්ද පවත්වාගෙන යන්නේ? ඒ පැත්තෙන් බැලුවොත්. ඉතින් අන්න 'පරතො'. ඒ වගේම 'පලොකතො' - බිඳිල බිඳිල යනවා, මොහොතක් මොහොතක් පාසා සියුම් ආකාරයෙන්. 'සුඤ්ඤතො' අර කිව්ව ආත්ම තත්ත්වයක් නැහැ. ඔන්න අන්තිමටයි තියෙන්නේ 'අනත්තතො' අනාත්මයි. ඔන්න එතකොට සළායතනය පමණක් නොවෙයි බුද්ධ දේශනාව අනුව මේ පඤ්චඋපාදානක්ඛන්ධයම ශූන්‍ය බව වැටහෙනවා.

ඒක වඩාත්ම ප්‍රකටයි මේ පින්වතුන් කොතෙකුත් අහල තියන- අපේ දේශනාවලත් නිතර මතක් කරන්න සිද්ධවුනා- කවුරුත් අහල තියන අර බුදුරජාණන් වහන්සේ දෙන පුදුම අන්දමේ උපමා. රූපය පෙණ පිඩකට, වේදනාව දිය බුබුළකට, සංඥාව මිරිඟුවකට, සංස්කාර කෙසෙල් කඳකට, විඤ්ඤාණය මායාවකට සමානය කියන උපමා තුළ තිබෙන්නෙත් අර හිස් බවම තමයි. පෙණ පිඩක් හිස්බව, සාරයක් නැතිබව අල්ලගන්න පුලුවන් දෙයක් නොවන බව, අල්ලගෙන ඒකෙන් යමක් හදන්න බැරිබව, අන්න ඒක කවුරුත් දන්නවා. වේදනාව අර කියාපු දියබුබුළක උපමාව, දැන් ටිකක් ඒ දෙස බැලුවොත් පේන්න පුළුවන් බුදුරජාණන් වහන්සේ පෙන්වූ ලොකු පොද ඇති මේ වගෙ වැස්සක් වහින වෙලාවේ අර වතුරේ ඇතිවෙලා නැතිවෙලා යන

දිය බුබුළු වගේ වේදනාව- ඒ වේදනාවත් මතක් කරන්න පුළුවන්. මේ අවස්ථාවේ උපකාර වෙනවා. ඒ වගේම සංඥාව මිරිඟුවක්. ඒකෙත් කොච්චර දුර දිව්වත් ගන්න දෙයක් නැහැ. සංස්කාර කෙසෙල්කඳ. අන්න විශේෂයි ඒ අතින්. හරයක් නැති එකම පතුරු ගොඩක් හන්දා. නමුත් බැලූ බැල්මට ඒකෙ හරයක් තියනවා වගේ. විඤ්ඤාණය මායාවක් කීවේ නැති දෙයක් ඇති හැටියට පෙන්වන මැජික් කාරයෙක් වගේ නිසයි. ඔන්න ඔය තුළ තියෙන්නේ ශූන්‍යතා දර්ශනයම තමයි. ශූන්‍යත්වයමයි.

ඉතින් කොහේ ගියත් අන්තිමට අර හය ආශ්‍රයෙන් විමසලා බැලුවත්, පංචඋපාදානස්කන්ධය ආශ්‍රයෙන් විමසලා බැලුවත්, තව ඕන නම් ධාතු වශයෙන් පඨවි, ආපො, තේජො, වායො කියල කියන මේ ලෝකයා දැන් බොහොම හපන්කම් කරන්න හිතාගන්න මේ ද්‍රව්‍ය කියල කියන එක බුද්ධ දේශනාවට අනුව මේ රූප සංඥාව ගන්නේ අර හඳුනා ගන්න බැරි මහා භූතයින් හතරදෙනෙක් නිසා. පඨවි ආපො තේජො වායො. එක එක්කෙනා හඳුනාගන්න බැහැ, තනිවම. ඒ ගොල්ලො එකතුවෙන් තමයි අපි මේකට පොළවයි වතුරයි ගින්නයි සුළඟයි කියලා කියන්නේ. ඒවායේත් සාරයක් හරයක් නැහැ. ඒවාත් ශූන්‍යයි. ඒවා ඔක්කොම ශූන්‍ය වශයෙන් කල්පනා කරල බලනකොට ඔන්න ඕකයි නියම තත්ත්වය. ඒක නිසා ශූන්‍යතාව ඇත්තවශයෙන්ම මේ ධර්මයේ ඉතාමත්ම වටිනා වචනයක්. නමුත් ඒක දැන් කොන්වෙලයි තියෙන්නේ.

ඒක කොන්වීමට හේතුවත් බුදුරජාණන් වහන්සේ ඒ කාලෙම ප්‍රකාශ කළා. පුදුම අන්දමේ උපමාවකින්. ඔන්න ඒ උපමාවයි දැන් ඊළඟට අපි මේ පින්වතුන්ට ප්‍රකාශ කරන්න යන්නේ. එක් අවස්ථාවක බුදුරජාණන් වහන්සේ සංඝයාවහන්සේලාට වදාළා - මොකක් කියන්න යනවාද කියන එකවත් අහවන්නේ නැතිව- 'මහණෙනි, දසාරහ කියන ක්ෂත්‍රියයන්ට තිබුණා බෙරයක්. ඒක හඳුන්වන්නේ 'ආණක' කියලා. ආණක කියල කියන්නේ ආණි කියන්නෙ කුඤ්ඤ. කුඤ්ඤයට කියනවා, ලීපතුරට කියනවා. ආණි කියල. යමක සිදුරක් වහන එකට ආණි කියනවා. මේ බෙරයට ආණක කියල කියන්න ඇත්තේ අපට හිතාගන්න තියෙන්නේ බෙරකඳ හදලා තියෙන්නේ ඒවායින්. ඒවගෙ ලීපතුරුවලින්. ඉතින් ඔන්න ඊළඟට බුදුරජාණන් වහන්සේ ප්‍රකාශකරනවා මහණෙනි, (ඒ ආණක කියන බෙරය එතන නොයෙකුත් කතන්තර ඒකට එකතුකරල තියෙනවා- ඈතට ඇහෙන හඬ ඇති පුදුම විධියේ බෙරයක් කියලා. කොහොම නමුත් බොහෝ දුර ඇහෙන හොඳ වටිනා බෙරයක්) එක් අවස්ථාවක අර ආණක බෙරකඳේ පතුරක් ගැලවෙනවා. ඉතින් අර අයිතිකාරයෝ ඒකට වෙන පතුරක් දැම්මා. තව පතුරක් ගැලවුනා තව පතුරක් දැම්මා. තව පතුරක් ගැලවුනා තව පතුරක් දැම්මා. ඔහොම ඔහොම දමාගෙන දමාගෙන ගිහිල්ලා- අන්න බුදුරජාණන් වහන්සේ කියනවා

අවසානයේදී මුල් බෙර කඳ එහෙම පිටින්ම නැති වුනා. අර කුඤ්ඤ ටික විතරක් ඉතුරු වුනා. තවම නැහැ බුදුරජාණන් වහන්සේගේ ධර්මය. ඔය උපමාවයි. ඔන්න ඊළඟට බුදුරජාණන් වහන්සේ ධර්මය ඉදිරිපත් කරනවා. එසේම මහණෙනි, යම්තාක් සූත්‍රදේශනා තිබෙනවා නම් 'යෙ තෙ සුත්තන්තා තථාගතභාසිතා ගම්භීරා ගම්භීරත්ථා ලොකුත්තරා සුඤ්ඤතා පටිසංයුත්තා' තථාගත භාසිත යම්තාක් සූත්‍ර දේශනා තිබෙනවා නම් ගම්භීරවූ ගම්භීරාර්ථවත් ශූන්‍යතා ප්‍රතිසංයුක්ත, අනාගතයේදී ඇතිවන සංඝයාවහන්සේලා දේශනා කරන කොට ඒවාට කන්දෙන්න කැමති නැහැ. 'න සුස්සූසිස්සන්ති න සොතං ඔදහිස්සන්ති' ඒවා තේරුම්ගන්න උත්සාහවත් වන්නේ නැහැ. ඒවා ඉගෙනගතයුතු දේවල් හැටියට සලකන්නෙත් නැහැ. ඒ තථාගත භාසිත ලෝකෝත්තර ශූන්‍යතා ප්‍රතිසංයුක්ත සූත්‍ර. ඒ වෙනුවට- 'යෙ පන තෙ සුත්තන්තා කවිකතා කාවෙය්‍යා චිත්තක්ඛරා චිත්තව්‍යඤ්ජනා බාහිරකා සාවකභාසිතා යම් සූත්‍ර දේශනා තියෙනවාද ශාසනයෙන් පරිබාහිර කවීන් විසින් කරනලද 'කවිකතා' කාව්‍යාත්මක හොඳ මිහිරි විසිතුරු වචන ඇති පද ඇති දේශනා තියනවා නම්, ඒවා දේශනා කරනකොට ඒවාට හොඳට කන්දෙනවා. ඒවා ඇසිය යුතු හැටියට සලකනවා. ඒවා තේරුම් ගතයුතු හැටියට සලකනවා.

ඔන්න එතකොට දැන් බෙරකඳේ උපමාව තේරුම් ගන්න පුළුවන් නේ. අර තථාගත භාසිත ගම්භීරාර්ථවත් සූත්‍රදේශනා ක්‍රමක්‍රමයෙන් අභාවයට යනවා. ඒ වෙනුවට පෙරමුණට එන්නේ මොනවාද? අන්න අර 'කවිකතා කාවෙය්‍යා චිත්තක්ඛරා චිත්තව්‍යඤ්ජනා බාහිරකා සාවකභාසිතා'. ඒවටයි කන්දෙන්නේ, ඒවටයි කන්යොමු කරන්නේ. අන්න ශාසනය එතකොට නිවනින් ඈත්වෙනවා. ශූන්‍යතාවෙන් ඈත් වෙනවා. මාරයාගේ ග්‍රහණයට අහුවෙනවා, මාරයාගේ වසයෙන් මිදෙනවා වෙනුවට. ඔන්න ඔය ටිකයි අනාගත භය කිව්වේ. ශාසනයටම අනාගත භයක් හැටියට. බුදුරජාණන් වහන්සේ ඒ උපමාව දීලා ඊළඟට ප්‍රකාශ කරනවා "එම නිසා මහණෙනි මෙන්න මේ විධියට හික්මිය යුතුයි. තථාගත භාසිත ගම්භීරාර්ථවත් ශූන්‍යතා ප්‍රතිසංයුක්ත සූත්‍රවලට අපි කන්දෙමු." මේ බුද්ධකාලයේ සංඝයා වහන්සේලාට බුදුරජාණන් වහන්සේ අනුශාසනා කරන්නේ, ඒවාට කන්දෙමු. ඒවා තේරුම් ගැනීමට උත්සාහ කරමු. අන්න ඒ පැත්තට හැරෙන්න කියලා බුදුරජාණන් වහන්සේ අවවාද කරනවා. අනුශාසනා කරනවා. අනාගතය බලා වදාරලා. අන්න ඒ අනුව අපි කල්පනා කරන්ට ඕන මේ ශාසනයේ ඉතාමත්ම වටිනා සූත්‍ර දේශනා අභාවයට යන්නේ මොකද? ඒවා පිළිබඳ සැලකිල්ල නැති වෙනවා.

තථාගත සම්මාසම්බුදුරජාණන් වහන්සේ කෙනෙක් ලෝකයේ පහළවෙන්නේ මොකටද? අර තරම් ඈත ඉඳලා අර බමුණන් එන්නේ මොකට ද? ඒ අය ධ්‍යාන වඩලා ලෞකික වශයෙන් ඉහළටම ගිහිල්ලා හිටියත් මාරයාගේ ග්‍රහණයෙන් මිදිලා නැහැ. ඒ අය තේරුම් ගත්තා- අච්චර අර

ත්‍රිවේද පාරගත බමුණන් මුදුන දන්නෙත් නැහැ, මුදුන ඇද වැටීම දන්නෙත් නැහැ. තථාගතයන් වහන්සේලා පමණයි දන්නේ. ඒක නිසා තමයි දැන් මේ පින්වතුන් දන්නවා නේ - **පටිච්චසමුප්පාදය අවිද්‍යාවෙන් පටන් ගන්නේ මොකද? ඔන්න මුදුන.** එතකොට මුදුන බිඳින්න තමයි බුදුරජාණන් වහන්සේ දක්වන්නේ, **ඒ මුදුන බිඳීමටයි උත්සාහ කළ යුත්තේ. මුදුන වැඩීමට නොවේ.** මෙතන මේ කියන අර්ථයෙන් අවිද්‍යාව. ඉතින් ඒක ආශ්‍රයෙන් මේ පින්වතුන්ට හිතාගන්න පුළුවන් මේ ශූන්‍යතා ප්‍රතිසංයුක්ත සූත්‍ර මේවා පිළිබඳව අපේ උනන්දුව නැතිවුනොත්, ඒවා රැකගන්න උත්සාහවත් උනේ නැත්නම්, ඒවා අපේ ජීවිතයට ළංකරගෙන ඒ අනුව ප්‍රතිපදාව සකස්කර ගත්තේ නැත්නම්, බුදුරජාණන් වහන්සේ දක්වා වදාළ ලෝකයෙන් එතරවීම ඒ කටයුත්ත කරන්න පුළුවන් වේද කියන එක.

ඊළඟට අපි මේක තව ටිකක් තේරුම් ගන්න බලමු. මේ මාරයා, මාරයා පිළිබඳ සංකල්පය බොහෝ දෙනා සිත් යොදන දෙයක්. ඒක නොයෙකුත් විධියට විවරණය කරලත් තියෙනවා. ඇතැම් අවස්ථාවල සංඝයා වහන්සේලා බුදුරජාණන් වහන්සේගෙන් අහනවා "මේ මාරයා කියන්නේ කවුද?" කියලා. ඔන්න එහෙම අවස්ථාවක් ධර්මයේ සඳහන් වෙනවා. රාධ කියන ස්වාමීන් වහන්සේ බුදුරජාණන් වහන්සේගෙන් අහනවා "මාරො මාරොති භන්තෙ වුච්චති කිත්තාවතා නු ඛො භන්තෙ මාරොති වුච්චති" ස්වාමීනි, මාරයා මාරයා කියල කියනවා කොතෙකින්ද මාරයා වන්නේ. ඔන්න එතකොට මාරයා කියන වචනයට නිර්වචනයක් බුදුරජාණන් වහන්සේ දෙනව. විවරණයක්. "රාධ, රූපය ඇති කල්හි තමයි මාරයෙක් මරන්නෙක් හෝ මැරෙන්නෙක් හෝ සිටින්නේ. ඒක නිසා රූපයම මාරයා හැටියට දකින්න." හිතාගන්න පුළුවන් නේ මේ පින්වතුන්ට. දැන් මැරෙනවා කියලා කියන්නේ මොකක්ද? රූපය නැතිවීම නේද? එතකොට ඕනෑ කෙනෙකුට හිතාගන්න පුළුවන් මේ මාරයා කියලා කියන්නේ රූපය. ඉතින් ඒ කියන්නේ රූපයට ඇති ඇල්ම රූප උපාදානස්කන්ධය, රූපගොඩ, ඒ අල්ලා ගැනීම. ඒ රූපය ඇති තැන තමයි. මේ ශරීරය අතහැරලා යන්න වෙනවා නේද කියල නේ මරණ භයක් ඇතිවෙන්නේ. දැන් රූපය නැති තැන මාරයෙක්වත් මරන්නෙක්වත් මැරෙන්නෙක්වත් නෑ. 'මාරො වා මාරෙතා වා යො වා පන මීයති'. ඒ නිසා රූපයම මාරයා හැටියට දකින්න. මාරයා හැටියට දකින්න කියලා විතරක් නැවැත්වූයේ නැහැ. එතන, බුදුරජාණන් වහන්සේ, ඒක රූපය උලක්-අනික් තැන්වල දැක්වූවා වගේ ගඩක්. ආබාධයක්. හැටියට රූපය දෙස බලන්න. ඒ කියන්නේ පංචඋපාදානස්කන්ධය ගැන කලකිරෙන විදියට බුදුරජාණන් වහන්සේ පදමාලාවක් යොදලා ඊළඟට ප්‍රකාශ කරනවා රාධ ස්වාමීන් වහන්සේට යම් කෙනෙක් මේ විධියට දකිනවා නම් ඒකමයි සම්‍යක් දර්ශනය.

දැන් අපේ සාමාන්‍ය අවබෝධයට අනුව නම් මේක විකෘත සිතුවිල්ලක්. මේ තරම් ලස්සන රූපයට ඉතින් බුදුරජාණන් වහන්සේ මෙහෙම නිග්‍රහ කිරීම කොයිතරම් වැරදි ද කියල අපට හිතෙන්න පුළුවන්. විකෘත අදහස් කියලා ගන්නත් පුළුවන්. නමුත් බුදුරජාණන් වහන්සේ මේකට කියන්නෙ මේක තමයි සම්‍යක් දර්ශනය. ඔන්න රාධ ස්වාමීන් වහන්සේ අහනවා. 'සම්‍යක් දර්‍ශනය මොකටද ස්වාමීනි?' "සම්‍යක් දර්ශනය නිබ්බිදාව සඳහායි." මේ නිබ්බිදා කියලා කියන්නේ පින්වතුනි සසර කලකිරීම. මේ නිබ්බිදාව කියන වචනයත් දැන් නවීකරණ ඔස්සේ 'නිර්වින්දනය' කරගෙන තියෙනවා. මේ නිර්වින්දනය කියන කොට හිත යන්නේ වෙන පැත්තකටයි. එහෙම ගන්න නරකයි. නිබ්බිදාව කියන්නේ සසර කලකිරීම. එතකොට රාධ ස්වාමීන් වහන්සේ අහනවා- දැන් මේ පින්වතුන් ගොනු කරගන්න බලන්න. බුදුරජාණන් වහන්සේ රූපය දැන් මාරයා කියලා ඉවර වෙලා රූපය ගැන කලකිරෙන අන්දමට ඒක ආබාධයක්, ව්‍යසනයක් ආදී වශයෙන් හඳුන්වලා ඊළඟට කියනවා මේක තමයි සම්‍යක් දර්ශනය කියලා. ඔන්න රාධ ස්වාමීන් වහන්සේ අහනවා, සම්‍යක් දර්ශනය මොකටද? සම්‍යක් දර්ශනය නිබ්බිදාව සඳහායි. සසර කළකිරීම සඳහායි. ඉතින් ඊළඟට රාධ ස්වාමීන් වහන්සේ අහනවා සසර කලකිරීම මොකටද? සසර කලකිරීම කියන්නේ පංච උපාදානස්කන්ධය ගැන කලකිරීමටයි. පංච උපාදානස්කන්ධය ගැන කලකිරීම- නිබ්බිදාව- මොකටද කියලා අහනවා, රාධ ස්වාමීන් වහන්සේ. නිබ්බිදාව විරාගය සඳහායි. නොඇල්ම සඳහායි. කලකිරීම ඇති තැන ඇල්මක් නැහැ. ඊළඟට අහනවා විරාගය කුමක් සඳහා ද? විරාගය විමුක්තිය සඳහායි. නොඇල්ම උපකාර කරගෙන විමුක්තිය. මිදෙන්න ඕනැ. මේක මාරයා නම් මෙයින් මිදෙන්න එපායැ. මිදීම සඳහා. විමුක්තිය මොකට ද කියල අහනවා. විමුක්තිය නිබ්බානය සඳහා. නිවීම සඳහා.

ඔන්න ඊළඟට රාධ ස්වාමීන් වහන්සේ සීමාවත් ඉක්මවලා ගිහිල්ලා අහනවා " නිවන මොකටද" කියලා. නිවන මොකටද කියලා මේ කාලෙත් ඔහොම අහනවා නේ? ඔය අවස්ථාවේ බුදුරජාණන් වහන්සේට අවවාද කරන්න සිද්ධ වුනා, රාධ ස්වාමීන් වහන්සේට. 'රාධ නුඹ මේ ප්‍රශ්නවල කෙළවර ඉක්මවලා ගියා. සීමාව ඉක්මවලා ගියා. මේ ශාසන බ්‍රහ්මචර්යාව තියෙන්නේ නිවන සඳහාමයි. නිවන කෙළවරයි. ඉන් එහාට මොකක්වත් නැහැ. ඒක තමයි පරමාර්ථය. නමුත් එයිනුත් එහාට සමහර කට්ටිය නොයෙකුත් විධියේ දේවල් දක්වනවා. නිවනින් පස්සේ කොහෙ කොහෙ හරි ගිහිල්ලා ඉන්නවා සදාකාලිකව. නමුත් මේ ශාසනයේ පරමාර්ථය දැවීමෙන් පටන්ගෙන නිවීමෙන් කෙළවර වෙනවා. මේ පැවැත්වෙන දුකඛ ස්කන්ධය තුළ තියෙන්නේ දැවීමයි. නිවන කියන්නෙ නිවීමයි. එහෙම කෙටියෙන් සලකා ගත්තාම රාධ අහපු ප්‍රශ්න වැරදි බව මේ පින්වතුන්ටත් හිතාගන්න

පුළුවන්. එතකොට සම්‍යක් දර්ශනය මොකටද කියල හිතාගන්න ඕන. ඒක විකෘත සිතුවිල්ලක් නොවේ. ඇත්ත වශයෙන්ම මෙතන දක්වන්නේ යථාභූත දර්ශනයමයි. යථාභූත දර්ශනය කියලා කියන්නේ ඇත්ත ඇති සැටි දැකීමයි. නැතිව මේක මේ වැඩක් කරවා ගන්න ඕනෑවට බොරුවට ඉදිරිපත් කරන එකක් නොවේ. මේකයි සත්‍ය තත්වය. ලෝකයාට මේක පේන්නේ නැහැ. අවිද්‍යාව නිසා. අවිදු අඳුර නිසා. ඔන්න බුදුරජාණන් වහන්සේ මතු කරනවා රූපයේ යථා තත්ත්වය. ඊළඟට අන්න අර කියාපු අර වචන ටික යොදන්නේ මොකද කියල කල්පනා කරල බලමු.

ඔන්න ඔතන ඉඳල තමයි විදර්ශනා භාවනාවට උපකාර වන දෙයක් තියෙන්නේ. දැන් මෙතැන මේ 'යෝනිසෝමනසිකාර' කියල කිව්වේ පින්වතුනි, අපි සාමාන්‍යයෙන් ඒක පරිවර්තනය කරන්නේ- පරිවර්තනය කරන්න අමාරු වචනයක්- නුවණින් මෙනෙහි කිරීම කියලා. අයෝනිසෝ මනසිකාර කියලා වැරදි විධියට මෙනෙහි කිරීම. යොනිසෝ කියන්නේ නුවණින් හෝ හරි විධියට මෙනෙහි කිරීම. ඇත්ත වශයෙන්ම යෝනිසෝමනසිකාරය තමයි පින්වතුනි, අපේ ප්‍රඥාව පිළිබඳව මූලික බීජය. අප තුළ තියෙන ඒ බීජය මතු කරගෙන බුදුරජාණන් වහන්සේ පෙන්නුව ප්‍රඥාව කරා යන මාර්ගය විදර්ශනාව තුළින්. එතකොට මේ යෝනිසෝමනසිකාරය අවදිකරගත්තු පුද්ගලයා එතන ඉඳල ඒක වඩාගෙන යන්න ඕනෑ. ඒ වඩාගෙන යාම පිළිබඳ විදර්ශනා භාවනාවේ ව්‍යවහාරවන වචනයක් තියනවා. 'සම්මසන' කියලා. සම්මසන කියලා කියන්නේ සම්මර්ශණය. අපිට මේවා විස්තර කරන්න පොත පතේ නැතත් නොයෙකුත් උපමා රූපක යොදන්න සිද්ධ වෙනවා- සම්මර්ශණය කියන වචනය තේරුම් කරන්න. එක් අවස්ථාවක මේ පින්වතුන්ට කියල දෙන්නත් ඇති. දැන් අපි සංස්කාර සම්මර්ශණය ගැන විදර්ශනා භාවනාවේදී කවුරුත් අහල තියෙනවා මේ සකස් කිරීම් ගොඩක් කියන එකේ ඒවායේ තියෙන ඒ රවටන ස්වභාවය. ඒක රවටන්නේ කොහොමද අර සඤ සංඥාවෙන් එකක් හැටියට පෙන්නුම් කරනවා. අර කෙසෙල් ගහ වගේ. එතකොට කෙහෙල් ගහ, හඳුනන කෙනෙක් ඒකෙන් මොකක් හරි දෙයක් මේසයක්, පුටුවක් වගේ දෙයක් හදාගන්න ඕනෑ කියලා කපලා කරගහගෙන යන්නේ නැතිව, ඒ වගේ කරගහගෙන යන්නේ නැතිව, ඒ කෙහෙල් ගහේ පතුරු එකිනෙක අතගාලා බලන කොට එතනම තේරෙනවා ඒකෙ හරයක් නැති බව. අරටුවක් නැති බව. එතකොට මේ පරාමර්ශණය තමයි අන්න අර බදා ගැනීම. අල්ලා ගැනීම. පරාමර්ශණය කියන එක තමයි සාමාන්‍ය ලෝකයා තුළ තිබෙන්නේ. දැඩිව අල්ලා ගැනීම. ඒ වෙනුවට බුදුරජාණන් වහන්සේ දක්වන්නේ යෝනිසෝමනසිකාරය තුළින් සම්මර්ශණය කරන්න. නිකම් අතගාලා බලන්න වාගේ. අතගා බලන්න වගේ හිතගා බලන්න. අන්න ඒ හිතගා බලන්න. ඒකට ආධාර වීම් වශයෙන් තමයි අර විදර්ශනා ක්‍රමය දක්වලා තියෙන්නේ.

ත්‍රිලක්ෂණයමයි මෙතන යන්නේ. අනිත්‍ය දුක්ඛ අනාත්ම ත්‍රිලක්ෂණය ඒ ඒ පුද්ගලයාට විෂය වන ආකාරයට ඇතැම් අවස්ථාවක එකොළොස් ආකාරයට, තවත් අවස්ථාවක දහඅට ආකාරයට, තවත් අවස්ථාවක හතළිස් ආකාරයට ඔය විධියට චත්තාළීසාකාර විපස්සනා කියලා කියන්නේ. ඒ ඒ පුද්ගලයාට පංචඋපාදානස්කන්ධය පිළිබඳව කළකිරෙන න්‍යායයක් අමුතු චින්තනයක් ගන්නවා. මේ මොන කරදරයක්ද? ලෙඩක් ද? ලෙඩක් ද කියල අපි කියන්නේ. අන්න ඒවගේ පංචඋපාදානස්කන්ධය ගැන නිරන්තරයෙන්ම ඒ සිතුවිල්ල මතු කරගන්න, මේවා පිළිබඳව වැරදි ආකල්පයකට වැටෙන්නේ නැතිව. ඒකයි බුදුරජාණන් වහන්සේ කියන්නේ. අන්න එතකොට සම්මර්ශණය කියන එක. පරාමර්ශණය දැඩිව බදාගැනීමක් නම් යථාතත්ත්වය තේරුම් නොගෙන, සම්මර්ශණය තුළින් කරන්නේ තමන්ම ප්‍රත්‍යක්ෂ කරගන්නවා, මේකේ හරයක් නැහැ. අරටුවක් නැහැ. නිස්සාරයි. ශූන්‍යයි. අන්න ඒ ටික තේරුම් ගන්නයි මේ සම්මර්ශණය උපකාර වෙන්නෙ.

ඒ ටිකත් මේකෙන් පේනවා. ඊළඟට අර උපමා එක එකක් යෙදුව වගේම, මේ පින්වතුන්ට කිව්වා වගේ ඒ සංස්කාරවල රැවටිලි ස්වභාවය නිසා එකක් හැටියට අපි ගන්නවා. නමුත් විදර්ශකයා ක්‍රමක්‍රමයෙන් තේරුම් ගන්නවා මෙතන රාශියක්. රාශි සංඥාව මතු වෙලා ඒ රාශි සංඥාව තුළින් ඇතිවීම් නැතිවීම් වඩාත් ශීඝ්‍රයෙන් අවබෝධවන අවස්ථාවේදී තමයි ඒ විදර්ශනා ඥාන පරම්පරාව ක්‍රියාත්මක වෙලා ලෝකෝත්තර තත්ත්වය පවා ලබන්න පුළුවන් වන්නෙ. ඊළඟට මේකට තවත් උපකාරවන වටිනා කාරණයක් අපි කාලවේලා හැටියට කියමු.

දැන් අර කලින් කිව්වා වගේ මහා ශ්‍රේෂ්ඨ ශ්‍රාවකයින් වහන්සේලා අප සඳහා ධර්ම සංවාදයක් කළ තවත් තැනක් සඳහන් වෙනවා. ඒත් මහාකොට්ඨිත මහරහතන් වහන්සේත් සාරිපුත්ත මහරහතන් වහන්සේත් අතර. ඒ පටිච්චසමුප්පාදය පිළිබඳ ගැඹුරු විවරණයක් ලෝකයාට ඉදිරිපත් කරන්නයි. මහා කොට්ඨිත මහරහතන් වහන්සේ දන්නේ නැතිව වගේ අර බමුණො අහන්න වගේ ප්‍රශ්න ඇහුවා. පටිච්ච සමුප්පාදය පිළිබඳව ප්‍රශ්න මාලාවක් අහගෙන ගිහිල්ලා, එක එකක් අංග පිළිබඳව අපට ඕන හරියට ඇවිල්ලා අහනවා. 'ඇවැත්නි සාරිපුත්ත, මේ නාම රූප කියන එක තමා හදාගත්තු දෙයක්ද, අනුන් හදල දුන්න දෙයක්ද?' 'එතැන කියන්නේ 'සයංකතං පරංකතං' කියන වචනයි.' එහෙම නැත්නම් ඒක තමනුත් කළා නොවේ අනුනුත් කළා නොවේ, ඉබේ හටගත් දෙයක්ද?' ඔය ප්‍රශ්නය මහා කොට්ඨිත ස්වාමීන් වහන්සේ සාරිපුත්ත ස්වාමීන් වහන්සේගෙන් අහනවා. මේ නාමරූප කියන එක තමන් විසින් කළ දෙයක්ද? අනුන් විසින් කළ දෙයක්ද? එහෙම නැත්නම් ඉබේ පහළවුනු දෙයක්ද? සාරිපුත්ත ස්වාමීන් වහන්සේ පිළිතුරු දෙනවා නෑ, ඇවැත්නි, නාමරූපය තමන් කළෙත් නැහැ, අනුන් කළෙත් නැහැ, ඉබේ

හටගත්තෙත් නැහැ, විඤ්ඤාණ පච්චයා- විඤ්ඤාණය පිහිට කරගෙනයි නාමරූප ඇතිවන්නේ. විඤ්ඤාණය පිහිට කරගෙනයි නාමරූපයක් තියෙන්නේ. ඒ කියන්නේ නිකම් ගස් ගල්වල නැහැ නාමරූප. ඊළඟට ඔන්න අහනවා ඊළඟ ප්‍රශ්නය 'ඇවැත්නි, සාරිපුත්ත, විඤ්ඤාණය ඒක තමන් කරගත්තු දෙයක්ද? අනුන් කළ දෙයක්ද ඉබේ පහළවුනු දෙයක්ද? කියල ඇහුවම ඒ එකක්වත් නොවෙයි. විඤ්ඤාණය නාමරූපය නිසා පවතිනවා. නාමරූපය තියෙන්නෙත් විඤ්ඤාණය නිසා, විඤ්ඤාණය තියෙන්නේ නාමරූපය නිසා. ඕක තමයි 'අඤ්ඤමඤ්ඤ පච්චය' කියල කියන්නේ. අන්‍යෝන්‍ය ප්‍රත්‍යය ස්වභාවය.

ඔන්න ඊළඟට මහා කොට්ඨිත ස්වාමීන් වහන්සේ හරියට නොතේරුණා වගේ, තව හොඳ උපමා ටිකක් අහගන්න වගේ, 'මේක හරි වැඩක් නේ? ඇවැත්නි, සාරිපුත්ත, ඔබ වහන්සේ කලින් කිව්වා නාමරූපය තියෙන්නේ විඤ්ඤාණය නිසයි කියලා. දන් කියනවා නාම රූපය නිසා විඤ්ඤාණය තියෙනවා කියලා.' ඔන්න එතකොට සාරිපුත්ත මහරහතන් වහන්සේ කියනවා හොඳයි එහෙනම් මම උපමාවක් දෙන්නම්. ඉතින් නාට්‍යාකාරයෙන් මේ සංවාදය තියෙන්නේ. නමුත් හරි වටිනවා. ඔන්න සාරිපුත්ත ස්වාමීන් වහන්සේ උපමාවක් දෙනවා. බටකෝටු මිටි දෙකක් තියෙනවා. උඩින් එකකට එකක් හේත්තු කරලා. හේත්තු කරලා තියෙන නිසා එක බටකෝටු මිටියක් ඇද්දාම අනික් එක ඉබේම වැටෙනවා. මේ පැත්තේ එක ඇද්දාම ඒ පැත්තේ එක වැටෙනවා. ඒ පැත්තේ එක ඇද්දාම මේ පැත්තේ එක වැටෙනවා. ඔන්න ඔය විදියටයි ඇවැත්නි නාම රූපයයි විඤ්ඤාණයයි පවතින්නේ. 'විඤ්ඤාණ පච්චයා නාමරූපං නාමරූප පච්චයා විඤ්ඤාණං'. ඔතන තමා පටිච්චසමුප්පාදයේ ගැඹුරුම තැන. අපි බොහෝ අවස්ථාවලදී දිය සුළිය නමින් ඕක හඳුන්වලා තියෙනවා. අපි නොයෙකුත් අවස්ථාවල පොත්පත්වල පවා දක්වලා තියෙනවා. ඔතන තමා ගැඹුරුම තැන පටිච්චසමුප්පාදයේ.

ඔන්න එතකොට හිතාගන්න තියෙන්නේ මේ උපමාවේ වටිනාකම. ඇයි සාරිපුත්ත මහරහතන් වහන්සේ මෙතනදී අර හර ඇති ලීයක් උපමාවට පාවිච්චි නොකළේ. බටකෝටුව කියන එක මේ පින්වතුන් දන්නවා. බට, උණ ආදිය ඒවායේ ඇතුළේ හරයක් නැහැ නේ. ඒවා හිස් නේ මැද. එතකොට බටකෝටුවක්, ගත්තත්, කෝටු මිටියක් ගත්තත් එතන හරයක් නැහැ නේ. මේ උපමා කළ නාමරූපය. නාමරූපය ඇතුළෙත් සාරයක් නැහැ. අර විදියේ ඇතිව නැතිවන ගොඩක්. විඤ්ඤාණයෙත් හරයක් නැහැ. විඤ්ඤාණයත් බටකෝටු මිටියක්. හරයක් නැහැ. බටකෝටු මිටි දෙකේ උපමාව තුළ තිබෙන ගැඹුර හිතන්න ඕන. ඔය පාලි භාෂාවේ බට, උණ ආදිය හඳුන්වන්නේ 'තචසාර' කියලා. ඒ වචනයත් ගැඹුරුයි. 'තච' කියල කියන්නේ පොත්ත. 'සාර' කියන්නේ හරය. උණ, බට ආදියේ අරටුව පොත්තමයි. පොත්තට වැඩි අරටුවක් නැහැ. ඇතුල හුළං. හිස්. එතකොට දන් මේ විඤ්ඤාණය ආත්මය

හැටියට අරගෙන අනිත් හැම ආගමක්ම එතන ගිහිල්ලා හිර වෙනවා. රූපය ආත්මය නොවන බව තේරුම් ගත්තත්, වේදනාව ආත්මය නොවන බව බව තේරුම් ගත්තත්, සංඥාව ආත්මය නොවන බව තේරුම් ගත්තත්, සංස්කාර ආත්මය නොවන බව තේරුම් ගත්තත්, නොපෙනෙන විඤ්ඤාණයේ ගිහිල්ලා හිරවෙනවා ඒ කට්ටිය අර විඤ්ඤාණයේ මායාත්මක ගතිය නිසා. අන්න එතනදී සාරිපුත්ත ස්වාමීන්වහන්සේ දුන්න උපමාවෙන් තේරුම් ගන්න පුළුවන් විඤ්ඤාණය කියන එකත් හිත් ගොඩක් නේ ඇත්ත වශයෙන් බලන කොට- අපි එකක් හැටියට ගත්තට ආත්ම සංඥාවෙන් මේ සක්කාය දිට්ඨිය තුළින්. එතකොට බටකෝටු මිටි දෙකක් එකකට එකක් හේත්තු කරලා තියෙනවා. ඔන්න පටිච්ච සමුප්පාදයේ ගැඹුරුම තැන. මේක කවුරුවත් කළෙත් නැහැ. අනුන් කළෙත් නැහැ. ඉබේ පහළ වුනෙත් නැහැ. ඕකයි ලෝකයේ පැවැත්ම. ඕකයි ඔය 'ඉදප්පච්චයතාව' කියල මුළු මහත් පැවැත්ම තුළ තියෙන්නෙ. ඕකයි ධර්මයේ සඳහන් වන පටිච්චසමුප්පාදය.

ලෝකයේ යම්තාක් ඉපදීම්, දිරීම්, මරණ, නැවත ඉපදීම්, ඊළඟට ලෝකයේ යම්තාක් සංකල්ප ප්‍රඥප්ති තිබෙනවා නම්, ඒ ඔක්කොම තියෙන්නේ මෙන්න මේ දෙක අතරෙයි කියලා පවසනවා. මේ 'වට්ටය' අතරෙයි කියලා කියනවා. 'විඤ්ඤාණ පච්චයා නාමරූපං, නාමරූප පච්චයා විඤ්ඤාණං. ඔය දෙක අතරෙයි මුළු මහත් පැවැත්මම. තද සංකල්පයක් නැහැ. තද ප්‍රඥප්තියක් නැහැ. අපි මේ සම්මුති හැටියට ගන්න හැම එකක්ම තියෙන්නේ ඔය දෙක අතරේ. ඔන්න ඔය විදියේ මහා ගැඹුරු ධර්මයක් බුදුරජාණන් වහන්සේ ලෝකයාට ඉදිරිපත් කළේ. ඒ එක්කම එතන තියෙන්නෙ ශූන්‍යතාව. එකක් අනික නිසා පවතිනවා නම් මේකෙත් හරයක් නැහැ. අනිකෙත් හරයක් නැහැ. ලෝකයා විඤ්ඤාණයයි අන්තිමට ගිහින් අල්ලන්නේ. ඒ අල්ලගත්තු අවිද්‍යාව තුළින්.

ඒක තමයි දන් මේ පින්වතුන් දන්නව නේ. අවිජ්ජා පච්චයා සංඛාරා, සංඛාර පච්චයා විඤ්ඤාණං, විඤ්ඤාණ පච්චයා නාමරූපං. ඔහොම ඔහොම බොහෝ දෙනාට කඩ පාඩම් ඕක කීප සැරයක් කියල අර්ථය නොදැනගත්තත්. අන්න එතකොට අපි තෝරන්නේ කොහොමද? අවිද්‍යාව නමැති ඒ අන්ධකාරයේ ඒ නොදැනීම තුළ යම්කිසි සංස්කාර, අර ඇඳීම්, සකස් කිරීම්, කෙරෙනවා. ඒවා ඔක්කොම මිච්ඡා දේවල්. රැවටිලි, ව්‍යාජ වැඩ ටිකක්. ඒ අවිද්‍යාව තුළින්, නොදන්ම තුළින්, අන්න දෙකක් හැටියට වෙන් කරලා ගත්තා. විඤ්ඤාණයයි, නාමරූපයයි. ඒකත් දෙකක් කියල කිව්වට අන්න අර කිව්ව වගේ සමූහයක්. හිස්. එකිනෙක සාරය වශයෙන් ගත නොහැකි දේවල්. ඔන්න එතකොට ඔය දෙක අතරෙයි පටිච්චසමුප්පාදයේ ගැඹුරුම කොටස තියෙන්නේ.

ඊළඟට එතන ඒ නාමරූපය තමයි බෙදිලා ගිහිල්ලා ආයතන වශයෙන්- එතනත් අර අධ්‍යාත්ම- දෙකක්. ඇහැයි, රූපයයි, කණයි, ශබ්දයයි ආදී වශයෙන්. එතකොට ඒ මිරිඟුවේ උපමාව තේරුම් ගන්න පුළුවන්. මුවා හිතන්නෙ අතන වතුර කියල. ඒක මිරිඟුව කියල හිතන්නේ නැහැ නේ. නමුත් ඇතට යන්න යන්න අර වතුරත් ඈත් වෙනවා. අන්න ඒ වගෙයි. එතකොට අර සංඥාවේ තිබෙන ස්වභාවය.

අපි ඉතින් කෙටියෙනුයි කීවේ. මේ ශූන්‍යතාව කියන එකටයි කොයි පැත්තෙන් ගියත් අන්තිමට එන්නේ. අපට අප්‍රිය වුනාට වචනය ඇත්ත වශයෙන් මේ ධර්මයේ ගැඹුරුම කොටස ඒකයි. ඒකයි බුදුරජාණන් වහන්සේ අර අවස්ථාවේ ප්‍රකාශ කළේ 'තථාගත භාසිතා ගම්භීරා ගම්භීරත්ථා ලොකුත්තරා සුඤ්ඤතා පටිසංයුත්තා' කියල ගම්භීරාර්ථවත් ශූන්‍යතා ප්‍රතිසංයුක්ත සූත්‍ර දේශනා අනාගතයේ සංඝයා වහන්සේලා ඒවා අහන්නවත්, ඒවා හදාරන්නවත්, ඒවා තේරුම් ගන්නවත් උත්සාහවත් වන්නේ නැහැ. ඒ වෙනුවට අන්න 'කවිකතා, කාවෙය්‍යා චිත්තක්ඛරා චිත්ත ව්‍යඤ්ජනා' කවීන් විසින් බඳින ලද අර මාරයාගේ මුඛයටම ඇදල දමන දේ වලටමයි ඇදිලා යන්නේ. ඒක සත්‍යද නැද්ද කියන එක මේ පින්වතුන්ට හිතා ගන්න පුළුවන්.

මේ පින්වතුන්වත් උත්සාහවත් වෙන්න ඕනෑ අන්න අර සූත්‍ර දේශනා තේරුම් ගන්න. අර මෝඝරාජ ස්වාමීන් වහන්සේ වගේ. අද වැනි මේ වස් පින්කම් අවසන් වෙන අවස්ථාවේ මේ පින්වතුන්ගේ සිතුවිලි පරම්පරාවත්, මෝඝරාජ ස්වාමීන් වහන්සේගේ සිතුවිලි පරම්පරාවත් සන්සන්දනය කරලා වෙනස දැනගෙන බුදුරජාණන් වහන්සේ ඒකට දුන්න ප්‍රශංසාවත් සිහිකරලා අපි මේ ශාසනික වටිනාකම් වටහාගෙන ඉදිරියට යාමට අර වටිනා ලෝකෝත්තර ධර්ම තවදුරටත් ලෝකයා වෙනුවෙන් ඉදිරියට පවතින හැටියට ආරක්ෂා කර ගන්න උත්සාහවත් වෙන්න ඕනෑ.

අද දවසේ සීලයේ පිහිටලා බණ භාවනා කරලා මේ ධර්ම දේශනාව තුළින් තමන්ගේ විදර්ශනා භාවනාදියට උපකාර වන යම් යම් ඉඟි ලබාගන්න පුළුවන් වෙන්න ඇති. එතකොට මෙතෙක් මේ රැක ගත්තු සීලයත්, කළ භාවනාවත්, මේ ධර්ම ශ්‍රවණයත් තුළින් කළ්‍යාණ මිත්‍ර ආශ්‍රය පිහිට කරගෙන තම තමන්ගේ බණ භාවනා මුදුන්පත් කරගෙන අර කියාපු මාරයාගේ ග්‍රහණයෙන්, මාරයාගේ රාජධානියෙන්, මිදිලා සෝවාන් සකදාගාමී අනාගාමී අර්හත් කියන මාර්ගඵල ප්‍රතිවේධයෙන් උතුම් අමා මහ නිවනින් සැනසීමට හේතු වාසනා වේවා! එසේම අවීචියේ සිට අකනිටාව දක්වා යම්තාක් සත්ත්ව

කොටසක් සිටිනවා නම් ධර්ම දේශනාමය, ධර්ම ශ්‍රවණමය කුසලය අනුමෝදන් වීමට, ඒ අනුමෝදන්වීම තුළින් ප්‍රාර්ථනීය බෝධියකින් උතුම් අමාමහ නිවනින් සැනසෙත්වා කියා ප්‍රාර්ථනා කරගෙන මේ විධියට ගාථා කියන්න.

'එත්තාවතා ච අම්හෙහි........'

## 05

පහන් කණුව ධර්ම දේශනා අංක 151

# නමො තසස භගවතො අරහතො සමමා සමබුඩසස

**අහු බුඩසස දායාදො - භිකඛු භෙසකලාවනෙ**
**කෙවලං අට්ඨික සඤඤාය - අඵරි පඨවිං ඉමං**
**මඤ්ඤෙහං කාමරාගං සො - ඛිප්පමෙව පහිසසතීති**

**-සිගාලපිතා ථෙරගාථා, ථෙරගාථා.**

සැදැහැවත් පින්වතුනි,

සසර බැමි වඩන සුභ සංඥාව වෙනුවට සසර බැමි කඩන අසුභ සංඥාව වඩන හැටියට තිලෝගුරු බුදුරජාණන් වහන්සේ අපට නිතර මතක් කරදෙනව. සුභ සංඥාව වැඩීමෙන් රාගයත්, අසුභ සංඥාව වැඩීමෙන් විරාගයත් ඇතිවන බව අපි දන්නවා. එතකොට විරාග නමින්ම හැඳින්වෙන නිවන බලාපොරොත්තු වනවා නම් යම් කෙනෙක්, අසුභ සංඥාව වැඩිය යුතු බව බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරලා තිබෙනවා.

බුද්ධ කාලයේ වැඩ විසූ සිගාල පිතා කියන තෙරුන්වහන්සේ කෙනෙක් සම්බන්ධ ගාථාවක් තමයි, අට්ඨික සංඥාව වැඩූ සිගාල පිතා කියන නම් ඇති සංඝයා වහන්සේ කෙනෙක් පිළිබඳ කථා පුවතක් තමයි, අද අපි මාතෘකා කළ ගාථාවට අදාළව දක්වෙන්නේ. ඒ සිගාලපිතා කියන ස්වාමීන් වහන්සේ අතීතයේ කාශ්‍යප බුදුරජාණන් වහන්සේගේ කාලයේ ශාසනයේ පැවිදි වෙලා අට්ඨික සංඥාව වඩලා පුරුදු කෙනෙක්. මේ බුද්ධ කාලයේ දී උන් වහන්සේ සැවැත් නුවර ඉපදිලා ගිහිගෙයි වාසය කරලා, විවාහ ජීවිතයක් ගත කරලා දරුවෙක් උපන්නට පස්සේ සසර කලකිරිලා පැවිදි වුනා. ඒ පුතාට සිගාල කියන නම දීලා තිබුන නිසා මේ හාමුදුරුවෝ හැඳින්වුනේ 'සිගාල පිතා' නමින්. සිගාලගේ පියා කියන නම ඇති භික්ෂූන් වහන්සේ. ඉතින් උන්වහන්සේට කර්මස්ථානයක් හැටියට බුදුරජාණන් වහන්සේ දුන්නෙත් උන්වහන්සේගේ අතීතයේ සංසාර ප්‍රවෘත්තිය දකලා අට්ඨික සංඥාවයි. අසුභ භාවනාවට අදාළ කර්මස්ථාන අතුරින් ප්‍රධාන තැනක් ගන්නා එකක් තමයි මේ අට්ඨික සංඥාව. ගිහි පැවිදි පින්වතුන්, යෝගාවචර පින්වතුන්, බොහොම උනන්දුවෙන් වඩන එකක් තමයි මේ අට්ඨික සංඥාව.

ඉතින් මේ ස්වාමීන් වහන්සේ පිළිබඳව මේ විධියටයි දක්වෙන්නේ. උන්වහන්සේ කමටහන අරගෙන බුදුරජාණන් වහන්සේගෙන්, විවේක වාසය සොයාගෙන භග්ග රටේ සුංසුමාර කියන කන්දේ භෙසකලාවනයට වැඩම කළා. එතන උග්‍ර විධියට භාවනා කරනවා දකලා දේවතාවෙක් උන්වහන්සේ තව තවත් උත්සාහවත් කරන්න මේ අපි අර මාතෘකා කළ ගාථාව වදාළ බවයි කියවෙන්නේ.

ඒ ගාථාවේ අදහස,
'අහු බුද්ධස්ස දායාදෙ - භික්ඛු භෙසකලාවනෙ.'

මේ දේවතාව අතීත ප්‍රවෘත්තියක් කියන්නා වගේ කියන්නේ. අර ඒ ස්වාමීන් වහන්සේට එල්ල කරලා කියන එකක් හැටියටම නොවේ. මේ විධියටයි කියන්නේ. බුදුරජාණන් වහන්සේගේ දායාදකරුවෙක් වෙන භික්ෂුවක් හිටියා භෙසකලා වනයෙ. ඊළඟට,

'කෙවලං අට්ඨික සඤ්ඤාය - අඵරී පඨවිං ඉමං.'
තනිකර අට්ඨික සංඥාවෙන් මේ පොළව පතුරුවා හැරියා.
ඊළඟට මේ දේවතාවා කියනවා,
'මඤ්ඤෙහං කාමරාගං සො - ඛිප්පමෙව පහිස්සති

මම හිතනවා මේ භික්ෂූන් වහන්සේ ඉක්මණින්ම කාමරාගය දුරු කරනවා ඇත කියලා.

මේ ගාථාව අහලා භික්ෂූන් වහන්සේ තේරුම් ගත්තා මේ දේවතාව මා උත්සාහ කරන්නයි මේ ගාථාව ප්‍රකාශ කළේ කියල. වඩාත් වීර්යවන්තව භාවනා කරලා විදර්ශනා වඩලා රහත් වුනා. රහත් වෙලා ඉවර වෙලා තමන්ගේ අර්හත්වය ප්‍රකාශ කිරීම් වශයෙනුත්, අර දේවතාවගේ ඒ පිහිට ගැන උදාන- ප්‍රීති වාක්‍යයක්- වශයෙනුත්, මේ ගාථාව වදාළ බවයි ඒ කතාන්තරයෙන් දක්වෙන්නේ.

ඉතින් මේ ගාථාව තේරුම් කිරීමේ දී අටුවාචාරීන් වහන්සේලා කියන සමහර කාරණා ගැන අපට විශේෂ අදහසක් කියන්න වෙන්නේ ඒ අටුවාවල මේක අමුතු විධියකට තෝරන්නේ. අර දැන් අපි කිව්ව මේ ගාථාවේ අදහස, තනිකර අට්ඨික සංඥාවෙන් මේ පෘථිවිය පතුරුවා හැරියා කියන එක, අටුවාවේ තෝරන්නේ ශරීරයේ කොටසකින් ගත්තු අට්ඨික සංඥාව- මේ 'පඨවි' කියන එක තෝරන්නේ මේ 'ආත්ම භාවය', මේ ශරීරය - මුළු ශරීරය පුරා පතුරුවා හැරියා කියලා. කොතනකවත් ඒ පඨවි කියන එක මුළු ශරීරය

කියන අදහසින් යෙදිලා නැහැ. ඉතින් මේකට වෙන එකක් තබා නිදර්ශන වශයෙනුත් දක්වන්නේ අතීතයේ අනුරාධපුර යුගයේ යම්කිසි සිද්ධියක්. ඒ කතාන්තරය බොහෝ දෙනාට ප්‍රකටයි. එක කලක් මිහින්තලාවේ වැඩ වාසය කළ, චේතිය පර්වතයේ වැඩ වාසය කළ, භාවනානුයෝගී මහා තිස්ස ස්වාමීන් වහන්සේ පිළිබඳ ප්‍රවෘත්තිය. උන්වහන්සේ දවසක් ඒ මිහින්තලයෙන් පිටත් වෙලා අනුරාධපුර දිසාවට වඩින අතරේ අනුරාධපුරයේ එක්තරා පවුලක භාර්යාවක් ස්වාමිපුරුෂයා එක්ක කලහ කරලා ආපහු මව්පියන්ගේ ගෙදරට යන්න හොඳට ආභරණ ආදිය ඇඳ පැළඳගෙන එන අතරේ පෙරමඟට මේ ස්වාමීන් වහන්සේ හමුවුනාම කෙලෙස් සහිතව මහ හඬින් සිනාසුනා කියලා තියෙනවා. ස්වාමීන් වහන්සේ මොකද ශබ්දය කියලා ඔලුව උස්සලා බලන කොට අර ස්ත්‍රියගේ දත් ටික දුටුවා. ඒ එක්කම කියවෙන්නේ මෙහෙමයි. උන්වහන්සේ අට්ඨික සංඥාවෙන් ඇටසැකිල්ලක් හැටියට දකලා ඒ අවස්ථාවෙම සියලු කෙලෙස් අවසන් කරලා රහත් වුනාය. ඒ රහත්වෙලා ඉදිරියට ගමන් කරන අතරේ අර ස්වාමි පුරුෂයා පිටිපස්සෙන් සොයාගෙන ඇවිල්ලා මේ ස්වාමීන් වහන්සේගෙන් ඇහුවලු මේ පාරේ ගැහැණියක් ගියාද? ස්ත්‍රියක් ගියා ද? කියලා. මේ ස්වාමීන් වහන්සේ පිළිතුරු දුන්නා කියලා කියනවා. "ස්ත්‍රියක් ද, පුරුෂයෙක් ද කියලා මම දන්නේ නැහැ. ඇටසැකිල්ලක් නම් ගියා කියලා."

ඉතින් මේ කථාව ආශ්‍රයෙන් අන්න අර එක ඇට කැබැල්ලක් මුල් කරගෙන මුළු ශරීරයේම පතුරුවා හැරියා කියන අදහස මතු කරන්නයි අටුවාචාරීන් වහන්සේ උත්සාහ කරන්නේ. නමුත් මෙතන එක්තරා නොගැලපෙන දෙයක් තියෙනවා. මොකද, ඉන්ද්‍රිය සංවරය ගැන හිතලා මේ ස්වාමීන් වහන්සේ එක පාරටම ස්ත්‍රියක් දැක්කට පස්සේ ඒ කෙලෙස් ඇති නොවන ආකාරයට මේක ඇටසැකිල්ලක් කියලා හිතුවා නොවේ. ඒ ක්ෂණයෙන්ම, නිරායාසයෙන්ම, උන්වහන්සේට දත් ඇට තුළින් ඇට සැකිල්ලක් පෙනී ගියා මිසක් ස්ත්‍රියක් ද? පුරුෂයෙක් ද? කියන එකවත් දැනගන්න බැරිවුනා. එයින් අපට පෙනෙන්නේ උන්වහන්සේ අට්ඨික සංඥාව හුඟක් දුරට, ඉහළටම පුරුදු කරල බැලූ බැලූ තැන ඇටසැකිලි පෙනෙන තත්ත්වයට හිත දියුණු කරගෙන තිබුනු බවයි. ඇත්ත වශයෙන්ම මේක අර අට්ඨික භාවනාවටත් වැදගත් කාරණයක් නිසා අපි මෙතනදී මතු කරන්නේ. දැන් මේ පින්වතුන් දන්නවා මෛත්‍රී භාවනාව වඩන කොට ඒකෙත් තියනවා දිසා ඵරණ කියල. ඒ ඒ දිසාවලට මෛත්‍රීය විහිදුවනවා. ඒ 'ඵරති' කියන වචනයමයි මෙතනත් තියෙන්නේ. එතකොට හැම පුද්ගලයෙක්ම සැපයට කැමැතියි කියන පොදු ලක්ෂණය ගැන හිතලා සියලු සත්ත්වයින්ට, හැම දිසාවටම, මෛත්‍රිය පතුරුවන්නා වගේ දෙයක් තමයි, හැම සත්ත්වයා තුළම - මනුෂ්‍යයා තුළම - ඇටසැකිල්ලක් තිබෙනවා කියලා අන්න ඒ දෘෂ්ටි කෝණයෙන් අර ඒ අට්ඨික සංඥාව හොඳට වැඩූ

කෙනෙකුගේ ශක්තියක් තමයි ඒක. බලන බලන තැන ඇටසැකිලි දකිනවා. ඒක අමුතුවෙන් උත්සාහයෙන් කරන දෙයක් නොවෙයි. දැන් මේ පින්වතුන් දන්නවා එක්සේ-රේ ඡායාරූප. එක්ස් කිරණ ඒ 'එක්ස්කිරණ' වගේ දෙයක් තමයි විදර්ශනාවත්. විදර්ශනාව දියුණු කළ, අට්ඨික සංඥාව දියුණු කළ, ස්වාමීන් වහන්සේට නිරායාසයෙන්ම ඇටසැකිලි පෙනෙනවා. එතකොට ඒක නිසා ඒ සිගාල පිතා ස්වාමීන් වහන්සේ සමහර විට ඒ අට්ඨික සංඥාව වඩන අතරේ මුළු මහත් පොළවම ඇටසැකිළි ගොඩක් හැටියට හිතුවා වෙන්න පුළුවන්. ඒකයි අපිට තේරුම් ගන්න තියෙන්නේ. තනිකර අට්ඨික සංඥාවෙන් මුළු මහත් පෘථිවිය පතුරුවා හැරියා කියන එක, මෙතන අටුවාවේ තෝරන්නේ මේ ශරීරය පිළිබඳව. ඒකට සමාන කරලා පතුරුවා හැරියා කියලා. ඒක ඉතාමත්ම අඩු මට්ටමකින් පෙන්නුම් කරන්නේ. ඇත්ත වශයෙන්ම අර විදර්ශනාමය ඇසින් බලනකොට හොඳට දියුණුවූ සිතකට ශරීරයේ ඇටසැකිළි පමණක් පෙනෙන තත්ත්වයක් තිබෙනවා.

අපට ඇත්ත වශයෙන්ම ඉල්ලීමකුත් ලැබිලා තියනවා බොහෝ පැතිවලින් මේ යුගයේ බොහෝ දෙනා ඔය ක්‍රමවේදය ගැන කතාකරන කොටසකුත් ඉන්නවා. නැතත් හැමදෙනාටම රත්වෙච්ච වෙලාවක් බවයි අපට පෙනෙන්නේ. හැමදෙනාම ඇවිල්ලා කියනවා තවත් නම් ඉපදෙන්න ඕනෑ නැහැ කියල. නමුත් ඉපදෙන්න ඕන නැහැ කිවූ පමණින්, ඒ ප්‍රාර්ථනාව පමණින්, අපට ඒක ලැබෙන්නේ නැහැ. ඒ සඳහා කරන්න තියන ටික තමයි මේ භවය ගැන කලකිරීම. මේ ශරීරය ගැන කලකිරීම. තවත් මේක එපා කියන හැඟීම ඇතිවන මට්ටමට භාවනාව ගොඩ නහා ගැනීමයි. අනිච්ච සංඥාව තුළින් හෝ අසුභ සංඥාව තුළින් හෝ. දැන් මේ පින්වතුන් දන්නවා විපල්ලාස කියලා ලෝක සත්ත්වයා තුළ තියෙන කාරණා හතරක්. ඔය නිතර ධර්මයේ සඳහන් වෙනවා. අනිත්‍ය දේ නිත්‍ය හැටියට දැකීම, දුක් සහිත දේ සැප හැටියට දැකීම, අසුභ දේ සුභ හැටියට දැකීම, අනාත්ම දේ ආත්ම හැටියට දැකීම. ඉතින් මෙතන කෙලින්ම අන්න අර අසුභ සංඥාව තුළින් කරන්නේ සුභ සංඥාව ඉවත් කිරීමයි. මේ අසුභ භාවනාව කියන වචනය බොහෝ දෙනාට අප්‍රියයි. නමුත් තිත්ත බෙහෙතක් වුනත් ඒක ගන්න සිද්ධ වෙනවා. දැන් යම්කිසි රෝගයක් පැතිරෙන කොට ප්‍රතිශක්තිකරණයක් අවශ්‍ය වෙනවා වගේ, මේ යුගයේ මේ පින්වතුන් හොඳට දන්නවා අපට වඩා, නාගරික සභ්‍යත්වය තුළින් එක්තරා විධියක රෝගයක් පැතිරෙනවා. ඔය නොයෙකුත් විධියේ විලාසිතා රෝගයක්. විලාසිතා රෝගයක් පැතිරෙනවා. ඒ විලාසිතා රෝගයට සමාන්තරව තුන්වෙනි ශික්ෂාපදයට අදාළ අපරාධ රැල්ලකුත් සමාජයේ පැතිරෙන බව දන්නවා. එතකොට නිවන කෙසේ වෙතත් අන්න ඒ මට්ටමින් හිතුවත් අතීත සිංහල සමාජයේ, බෞද්ධ සමාජයේ, මධ්‍යස්ථ මට්ටමකින් ඒ අය පස්කම් සැප වින්ද බවයි පෙනෙන්නේ. පොහොය අටසිල් රැක්කා. ඊළඟට ඒ

වගේම සතර කමටහන් කියල කියන බුද්ධානුස්සති, මෙත්තා, අසුභ, මරණසති කියන ඒ සතර කමටහන් වැඩුවා. අන්න එබඳු පරිසරයක නැති අන්දමේ විෂම තත්ත්වයක් දැන් සමාජයේ තිබෙන බව මේ පින්වතුන් දන්නවා. එතකොට නිවන පමණක් නොවේ අන්න අර කියාපු සාමාජික වටිනාකම් ගැන හිතලා බලන කොටත් අසුභ භාවනාව- සමහර උගතුන් කීවාට- විකෘත මානසික තත්ත්වයක් හැටියට හිතන්න නරකයි. බුද්ධ වචනය අනුව, ඒක ඉතාමත්ම මහත්ඵල මහානිශංස, නිවන ළඟා කරදෙන, මේ සසරින් මිදීමට උපකාර වන, කමටහනක් කියන කාරණය අපි කලින්ම තේරුම් ගන්න ඕනෑ. එහෙම තේරුම් අරගෙන ඔන්න ඊළඟට අපි දැන් බලාපොරොත්තු වෙන්නේ විශේෂයෙන් අට්ඨික සංඥාව ගැනත්  සාමාන්‍ය වශයෙන් අසුභ භාවනාව ගැනත් කරුණු ටිකක් කාලවේලා ඇති පමණින් මේ පින්වතුන් ඉදිරියේ තබන්නයි.

අට්ඨික සංඥාව වැඩීම පිළිබඳව දැන් කවුරුත් දන්නවා දෙතිස්කුණප කොට්ඨාශ අතරින් අට්ඨිකය, ශරීරයේ ඇටත් එකක්. ඊළඟට අසුභ භාවනාව විශේෂයෙන්ම තියෙන්නේ මියගියාට පස්සේ, ශරීරය ඇටසැකිල්ලක් වුනාට පස්සේ. අසුභ කර්මස්ථාන අතරින් අට්ඨික සංඥාව බුද්ධ කාලයේ ඉතාමත්ම- අපට කියන්න බැහැ ජනප්‍රියයි කියලා අපට කියන්න තියෙන්නේ - යෝගාවචර ප්‍රියයි. යෝගාවචර ප්‍රිය කර්මස්ථානයක් බවට පත් වුනේ මොකද අර උද්ධුමාතක ආදී ඉදිමුන ශරීර ආදිය වැඩිකල් තබාගන්න බැහැ. නමුත් ඇටසැකිල්ල, අපේ ශරීරයේ සොහොන් කොත වගේ, අන්තිමට ඉතිරි වන්නේ ඇටසැකිල්ලයි. ඒක කලක් පවත්වා ගන්න පුළුවන්. කලක් තියාගෙන ඒ ඇටසැකිල්ල වඩන්න පුළුවන්. ඒ කියන්නේ ඇටසැකිල්ල පිළිබඳ නිමිත්ත ගැනීම පහසු දෙයක් නොවේ. නැවත නැවත බලලා ඒක හිතට ධාරණය කරගන්න වෙනවා. අන්න ඒ අතින් අට්ඨික සංඥාව අපට කියන්න තියෙන්නේ යෝගාවචර ප්‍රිය කර්මස්ථානයක් කියලා.

නමුත් සාමාන්‍ය වශයෙන් එදිනෙදා භාවනාව පුරුදු කරන අය සරල මට්ටමින් කරන්නේ මේකයි. වචනය විතරක් උපකාර කරගෙන 'අට්ඨී- අට්ඨී -අට්ඨී- අට්ඨී' කියලා නිරන්තරයෙන් ඇට ගැන හිතනවා. ඒක තුළිනුත් යම්කිසි දෙයක් වෙනවා. අර නීවරණ ධර්ම වලට ඉඩ නැතිවීම තුළින් ක්‍රම ක්‍රමයෙන් විරාගී තත්ත්වය ඇතිවෙනවා. නමුත් ක්‍රමානුකූලව ඒ අට්ඨික සංඥාව වැඩීමට යම්කිසි නිමිත්තක් හිතට ඇතිකර ගන්න වෙනවා. ඒකට එක්කෝ අතීතයේ නම් චිත්‍රකරුවන් උපකාර වුනා. ඇත්ත වශයෙන් කියනවා නම් බුද්ධ කාලයේ උපකාර වුනේ අමුසොහොනයි. ඒ ධුතාංගධාරී උග්‍රව්‍රතධාරී ස්වාමීන් වහන්සේලා- නිවන ඉක්මණින් ඕනෑ කට්ටිය- අමනුෂ්‍ය උපද්‍රවවලටත් භය වන්නේ නැතිව මැදියම් රැයේ කාටවත් නොකියා සොහොන් පිටියකට ගිහිල්ලා ඒ ඇටසැකිල්ල පමණක් නොවේ අර ඉදිමිච්ච ආදී නා නා තත්ත්වලට පත්වෙච්ච ඒ ශරීර දිහා බලාගෙන ඒවායින් නිමිත්ත ලබාගෙන ඉක්මණින්ම

භාවනාව වඩලා නිවන දක්කා. ඉතින් එබඳු සොහොන් ආදිය මේ කාලයේ නැතත් මේ පින්වතුන් දන්නවා රටම අමු සොහොනක් වෙච්ච කාලයක් තිබුණා. ඔය සුනාමි ඒකේදී. ඒ වගේම දනටත් යුද්ධ කලකෝලාහල නිසා ඔය අසුභ කමටහන ගන්න අවස්ථාවන් කොතෙකුත් තියෙනවා, ඔය මාධ්‍ය තුළින්. නමුත් ඒවා ගැන කෙනෙක් උනන්දු වෙන්නේ නැහැ මේ කාලයේ. ඔන්න එතකොට අර කිව්වා වගේ නිමිත්ත ගැනීමේදී මෙන්න මේ විධියටයි දක්වෙන්නේ.

වචන වශයෙන් පාවිච්චි කරලා 'අට්ඨි අට්ඨි' කියලා දෘශ්‍ය වශයෙන් නැතිවුනත් එක මට්ටමකින් භාවනාව වඩන්න පුළුවන්. නමුත් හරියාකාරව වඩනවා නම් ධ්‍යාන ආදිය බලාපොරොත්තුවෙන්, නිවන කෙලින්ම බලාපොරොත්තුවෙන්, අන්න එතකොට නිමිත්තක් ගන්න ඕනෑ. ඒක ගත යුතු ආකාරය කෙටියෙන් කියතොත් ඇටසැකිල්ලක්- සම්පූර්ණ ඇටසැකිල්ලක් හෝ එයින් කොටසක් හෝ- හිස් කබල වුනත් ප්‍රමාණවත්. නැවත නැවත මධ්‍යස්ථ බැල්මෙන් බලමින් විටින් විට ඇස් වසා ගෙන ඒකෙන් නිමිත්ත ගන්න පුරුදු වෙන්න ඕන. එහෙම හිතට සෑහෙන්න වැටුනාට පස්සේ ඒක නොපෙනෙන තැනකට ගිහිල්ලා ඒක නැවත මතුකර ගන්න බලන්න ඕන. අට්ඨික කියන වචනය උපකාර කරගන්නේ හිත බැහැරට යාම වළක්වන්නයි. අට්ඨික අට්ඨික අට්ඨික අට්ඨික කියමින් එසේ හිත රඳවාගෙන ඒක හිතට හරියට වැටුනා නම් ඇස් වසාගෙන පමණක් නොවේ ඇස් ඇරගෙනත් පුළුවන් ඒ ඇටසැකිල්ල ගස්වල එල්ලලා වගේ එක එක ආකාරයට පුරුදු කර ගන්න අන්න එහෙම පුරුදු කිරීමේදී තමයි ක්‍රමක්‍රමයෙන් මුළු පොළවම ඇටසැකිලි ගොඩක් හැටියට වුනත් පෙනෙන්නේ. ඒක සම්මා සංකප්පයක්. නෙක්ඛම්ම සංකප්ප, අව්‍යාපාද සංකප්ප, අවිහිංසා සංකප්ප කියල කියන ඒ විධියේ සංකල්ප වලට ඉඩ තියෙනවා. අර කාම සංකල්ප ආදියෙන් යන්නේ වෙන පැත්තකට. මේ නෙක්ඛම්ම සංකල්ප ඔන්න ඔය විධියට යන්නේ.

ඒ නිමිත්ත ගත්තාට පස්සේ ඒකට කියනවා පරිකර්ම. පරිකර්ම කියන්නේ මූලික කටයුතු. පරිකර්ම වශයෙන් උත්සාහවන්තව නමුත් මධ්‍යස්ථ බැල්මෙන් බලමින් විටින් විට හිස් කබලේ හෝ මුළු ඇටසැකිල්ලේ නිමිත්ත ගත්තා නම්- ඒ වගේම තව කියන්න තියෙන්නේ ඒකෙදීත් පොඩි පොඩි උපකාර වන දේවල් තියෙනවා. අටුවාචාරීන් වහන්සේලාත් ඒක පෙන්නුම් කරලා දෙනවා. දන් ඇටසැකිල්ල සකස් වෙලා තියෙන්නේ පුදුම අන්දමට කෑලි හතකින්. ඔය බුද්ධ වචනයේ සඳහන් වෙනවා. 'හත්ථට්ඨිකං', අත් ඇට, පාදට්ඨිකං පා ඇට, අත් ඇට ඉවත් කළාට පස්සේ එතන ඉඳලා තියෙන්නේ එකක් උඩ එකක්. පා ඇට තියෙනවා. ඒක උඩ එතකොට කෙණ්ඩා ඇට තියෙනවා.ඒක උඩ කලවා ඇට තියෙනවා ඒක උඩ උකුල් ඇටය තියෙනවා. ඒක උඩ පිටකටුව තියෙනවා. ඒක උඩ තියෙනවා හිස් කබල. ඉතින් ඔන්න

ඔය හය තමයි. අත් දෙක අයින් කළාට පස්සේ අනිත් හය එකක් උඩ එකක් තියෙන්නේ. ඉතින් ඔය ගරාජයක වාහනයක කොටස් සැරින් සැරේ අහක් කරලා හයිකරන්නා වගේ ඔය ඇටසැකිල්ලත් ඒ සම්බන්ධ වෙච්ච තැන්වලට හිත යොදලා හිත පුරුදු කරගත්තාම බොහොම පහසුයි නිමිත්ත ගන්න. එතකොට දත් ඇට දකලා අනිත් හරිය ඉබේ එන්නා වගේ අත් ඇට, පා ඇට ටික දක්ක හැටියෙ හිතට ගත්තාම  අනෙක් හරිය ඉබේටම හිතට එනවා. සම්පූර්ණ ඇටසැකිල්ල නිමිත්ත ගන්නවා නම් එහෙමත් පුරුදු වෙන්න පුළුවන්. එහෙම නැත්නම් හිස් කබලට විතරක් අවධානය යොමු කරන එක පහසුයි. ඒකෙ නිමිත්ත ගන්නවා අර විදියට විටින් විට. ඔන්න අපි ගත්තා කියලා හිතමු. ගත්තා කියල කියන්නේ ඒක හරියට හිටියට පස්සේ. ඒකට කියන්නේ 'උග්ගහ' නිමිත්ත, කියලා. උග්ගහ නිමිත්ත- ඒ කියන්නේ තමන්ගේ නිමිත්ත හරියට ඉගෙන ගත්තා. උග්ගහ නිමිත්ත සාමාන්‍යයෙන් බැලුවාම අඳුරු කාමරයක තියන දෙයක් වගේ. සමහර විට ටිකක් බිය ජනක අන්දමින් පෙනෙනවා. උත්සාහයෙන් බැලුවාම, ඇත්ත වශයෙන් තියන එකක් වගේ. නමුත් අඳුරු කාමරයක තියෙන්න වගේ. තරමක් අඳුරුයි, උග්ගහ නිමිත්ත. නමුත් ඒකෙත් අඩු පාඩුවක් සමහර විට පෙනෙනවා බැලූ බැල්මට.

නමුත් ඔන්න පටිභාග නිමිත්ත තත්ත්වයට එනකොට ඒ උග්ගහ නිමිත්ත කාලයක් වැඩීම තුළින්- පටිභාග නිමිත්ත කියන්නේ හරියටම අර ඇටසැකිල්ල හා සමාන රූපයයි. 'ප්‍රතිභාග'. ඒක බොහෝවිට එන්නේ ආලෝක තීරුවක් සහිතව. ආලෝක තීරුවක් සහිතව. ඇටසැකිල්ලක් නම් ඇටසැකිල්ල සම්පූර්ණයෙන් ප්‍රභා සම්පන්නයි. එයින් පැහැදිලි වෙනවා. ආලෝක තීරුවක් සහිතව හිත ප්‍රසාදයට පත් කරන එකක්. උග්ගහ නිමිත්ත වගේ මහන්සියෙන් දකිය යුතු එකක් නොවේ. ඒ පටිභාග නිමිත්ත තමයි ධ්‍යාන අවස්ථාව එන්න කිට්ටු වෙන කොට පහළවෙන නිමිත්ත. ඒක හරියට පහළවුනාට පස්සේ ඒ වෙලාව වෙනකොට නීවරණ ඉවත්වෙලා.

නීවරණ පිළිබඳ කතාන්තරය මේ පින්වතුන් කොතෙකුත් අහලා තියනවා. හිත සමාධිමත් කිරීමට බාධක වශයෙන් තියන කාරණා පහට තමයි නීවරණ ධර්ම කියන්නේ. කාමච්ඡන්ද, ව්‍යාපාද-ද්වේශය, ථීනමිද්ධ, කියල කියන්නේ නිදිමත අලස ගතිය ආදිය. ඊළඟට උද්ධච්ච කුක්කුච්ච නොසන්සුන්කම, පසුතැවිලි ආදිය. ඊළඟට විචිකිච්ඡාව දෙගිඩියාව. මේක කරනවාද වෙන එකක් කරනවාද ආදී වශයෙන් දෙගිඩියාව. ඒවා ඔක්කෝම ඉවත්වෙලා හරියටම මේ කමටහනේ හිත තැන්පත් වුන අවස්ථාවේ තමයි අන්න අර විධියට උග්ගහ නිමිත්ත. ඊළඟට ඒකත් තව ඈතට කරගෙන යනකොට වෙන බාහිර දේවලට හිත යන්නේ නැතිව පටිභාග නිමිත්ත වශයෙන් ඇතුළතින් ආශ්චර්යවත් අන්දමින් හිත ඇතුලෙන්ම මේක පෙන්නුම් කරලා දෙනවා පිරිසිදුව.

ඉතින් මේ පටිභාග නිමිත්ත සැහෙන්න දියුණුවුන අවස්ථාවේ- ඒ වෙනකොට නීවරණ යටපත් වෙලා. නීවරණ යටපත් වුන බව පවා තමන්ට වැටහෙනවා. ඒ තුළින් ප්‍රීතිය ආදිය ඇතිවෙනවා. මේ කමටහන් ආයුධය තුළින් කළේ නීවරණ පළවා හැරීමේ උත්සාහයයි. ඒක සාර්ථක වෙනවා කියන හැඟීම තුළ ලොකු ප්‍රීතියක්, ප්‍රමෝදයක්, සතුටක් ඇති වෙනවා. ඒක තුළ තමන් සිත ඒකට ඒකාග්‍රව එකතු වෙනවා. එහෙම එකතු වෙලා හරියටම ඒකාග්‍ර වුන අවස්ථාව තමයි. අර්පනා සමාධිය. අප්පනා කියල වචනයක් තියනවා. අප්පනා කියන වචනයේ සාමාන්‍ය තේරුම ගන්න නම් අපට හිතාගන්න පුළුවන් දන් ඔන්න එක සමාන පියන්පත් දෙකක් ඇති භාජනයක පියන්පත් හරියටම එකකට එකක් හිටින විදියට වැහුවා වගේ. හිතත් අරමුණත් එකතුවන අවස්ථාවක් තියෙනවා. හිතත් අරමුණත් එකතුවන අවස්ථාවක්. ඒ අවස්ථාව තුළ තමයි තමන්ට තමන්ගේ හිතේ තිබෙන ප්‍රබල ශක්තිය ප්‍රත්‍යක්ෂ වෙන්නේ. එදිනෙදා ජීවිතයේ හිතේ විසුරුන බවත් ඒකාග්‍ර බවත් අතර වෙනස පැහැදිලි වෙන්නෙ. විසිරුන හිතේ ශක්තියක් නැහැ. අර වෙලාවේ තනිකර ඒ බලාපොරොත්තු වුන පටිභාග නිමිත්තයි හිතයි එකතු වෙනවා. අන්න එතනදී තමයි අප්පනා කියලා කියන්නේ. ඒ සමාධි ධ්‍යාන ආදී තත්ත්ව වලට යන අවස්ථාව. ඉතින් ඒක උත්සාහයෙන් ලබාගත යුතු තත්ත්වයක්.

එතකොට අපි මේකට අදාළ දේවල් කියන්නේ ගිහි පැවිදි භේදයක් නැතිව බොහෝ යෝගාවචරයන් ඒ වෙනුවෙන් ජීවිතය ගත කරන අයත් ඉන්නවා. එබඳු අයට මේක ප්‍රයෝජනවත්. ඒ නැතත් ඉදිරියට කාට හෝ වේවා මේ විධියේ කාරණා උපකාර වෙනවා ප්‍රායෝගික වශයෙන්. අන්න ඒ ඉලක්කය-ඒක ධ්‍යාන අවස්ථාව කියල කියන්නේ, ඒ අවස්ථාවේදී නීවරණ ධර්ම වෙනුවට ධ්‍යානයට අදාළ කමටහන හා සම්බන්ධ දේවල් පමණයි එතකොට හිතට තියෙන්නේ. විතක්ක, විචාර, පීති, සුඛ, එකග්ගතා කියලා කියන්නේ. විතක්ක කියලා කියන්නේ බාහිර විතර්ක නොවේ. අර කමටහන ගන්න පටන් ගත්තු අට්ඨික අට්ඨික කියන ඒ හැඟීමම තමයි. එතන වචන වශයෙන් නැතත් හිත එතැනට යෙදෙනවා. හිත ඒක තුළ පවතිනවා. විචාර වශයෙන්. ඒක සම්පූර්ණ වීම නිසා ශාරීරික වශයෙන් කායපස්සද්ධිය. කාය පස්සද්ධිය, චිත්තපස්සද්ධිය කියන කයේ සිතේ සැහැල්ලු බව. තවත් සමහර විට ආසනයෙන් උඩ යනවා වගේ දනෙනවා. ඒ සැහැල්ලු බව. ඒක තුළින් ප්‍රීතිය, සුඛය, අන්තිමට ඒකාග්‍රතාව ඔය කාරණා තුනයි. එතකොට විතක්ක, විචාර, පීති, සුඛ, එකග්ගතා කියන අංග තමයි ධ්‍යානයට අදාළ අංග හැටියට දක්වෙන්නේ. අන්න ඒ විධියට හරියට අට්ඨික සංඥාව තුළින් ධ්‍යාන තත්ත්වය ලැබුවාම සිතේ බොහොම ප්‍රබල ශක්තියක් තියෙනවා එතන.

ඉතින් මෙන්න මේ කාරණා ටික ගැන කල්පනා කරලා බලන කොට බුද්ධ වචනය අනුව තවත් නොයෙකුත් දේශනා තිබෙනවා මේකට එකතු කරගන්න.

තවත් අවස්ථාවක බුදුරජාණන් වහන්සේ- එක් අවස්ථාවක නොවේ අවස්ථා කීපයකම- ඔය අසුභ භාවනාව වර්ණනා කරන අවස්ථාවල බුදුරජාණන් වහන්සේ දක්වනවා, දැන් මෑත කාලයේ ග්‍රන්ථවල උද්ධුමාතකය පළමුව දැක්වුවත් බොහෝ විට අට්ඨික සංඥාවෙන් පටන් ගන්නේ. අට්ඨික පුළවක විනීලක විපුබ්බක ඔය විධියට වචන වශයෙන් දක්වන්නේ. ඉදිමුන සිරුර පණුවන් ගැසූ සිරුර, නිල්වූ සිරුර ඔය ආදී වශයෙන් අර සොහොන් පිටියක දකින්න ලැබෙන සිරුරු ආශ්‍රයෙන් වුනත් නිමිති ගන්න පුළුවන්. නමුත් ඒවා අපහසුයි. ඒවා බොහෝ කල් පවතින දේවල් නොවේ. දැන් නම් මේ කාලයේ අතීතයේ චිත්‍ර වගේ දෘශ්‍ය මාධ්‍ය බොහොම බහුල වශයෙන් තිබෙනවා. ඒවා ආශ්‍රයෙන් වුනත් නිමිති ගන්න බැරිකමක් නැහැ. ඉතින් ඊළඟට මෙන්න බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනවා ආනිසංස ගැන. එක එක නිමිත්තක් ගැන කියන එක- පළමුවෙන්ම කියනවා 'අට්ඨික සඤ්ඤා භික්ඛවෙ භාවිතා බහුලීකතා මහප්ඵලා හොති මහානිසංසා' 'මහණෙනි, අට්ඨික සඤ්ඤා වඩන ලද්දේ, බහුල වශයෙන් පුරුදු කරන ලද්දේ, මහත්ඵල මහානිසංස වෙයි.' කියලා දක්වලා ඒකෙ ප්‍රතිඵල හැටියට දක්වන්නේ භාවිත බහුලීකත කළාම- බහුල වශයෙන් පුරුදු කළාම මෙලොවම රහත්ඵලය හෝ අනාගාමී බව. එතකොට මෙලොවම රහත්ඵලය හෝ අනාගාමී ඵලය ලබන තරමට අට්ඨික සංඥාව වඩන්නේ කොහොමද කියන එකත් ඊළඟට බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනවා.

සාමාන්‍යයෙන් අපි අර ධ්‍යාන පැත්තට අදාළ ටික විතරයි ඔය කිව්වේ. එහෙම නමුත් බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනවා ඒක නිවනට නැඹුරු කරලා කරන හැටි. ඒ කියන්නේ බොජ්ඣඞ්ග ආශ්‍රයෙන්. මෙහෙම දක්වනවා. 'අට්ඨිකසඤ්ඤාසහගතං සතිසම්බොජ්ඣඞ්ගං භාවෙති' අට්ඨික සඤ්ඤාව සහිත සතිසම්බොජ්ඣංගය වඩනවා. බොජ්ඣංග හතක් තිබෙනවා නේ. සති, ධම්මවිචය, විරිය, පීති, පස්සද්ධි, සමාධි, උපෙක්ඛා. සති කියන්නේ සිහිය බව කවුරුත් දන්නවා. එතකොට වෙන දේවල්වලට සිහිය නොයොදා අට්ඨිකය පමණක් සිහිකරමින් නිවන බලාපොරොත්තුවෙන් වඩන එක හඟවන තව වචන කීපයකුත් දක්වනවා. විවෙක නිස්සිතං, විරාග නිස්සිතං, නිරොධ නිස්සිතං, වොස්සග්ග පරිනාමිං' විවේක, විරාග, නිරොධ, වොස්සග්ග කියන වචන හතරම යොදන්නේ නිවනටයි. කෙලෙස් වලින්, උපධි වලින්, නික්මීම, විවේකය. ඊළඟට විරාගය කියන එක පහසුවෙන්ම තේරුම් ගන්න පුළුවන්. නිරොධ- නිරුද්ධ කිරීම. ඊළඟට වොස්සග්ග කියන්නේ අතහැරීම. නිවන අරමුණු කරගෙන, නිවන අරමුණු කරගත්තු සිහියෙන් යුක්තව අට්ඨික සඤ්ඤාව වැඩීම.

ඊළඟට ඒ විධියට ඒ වචන හතරම යොදලා කියනවා අට්ඨික සඤ්ඤා සහගතං ධම්මවිචය සම්බොජ්ඣංගං භාවෙති' ඒත් අර විධියට 'විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිනාමිං ආදී වශයෙන්. එතකොට අට්ඨික සංඥාව තුළින්ම ධම්මවිචය සම්බොජ්ඣංගයත් වඩනවා. ධම්මවිචය කියන එක සමහර විට මේ පින්වතුන්ට හුරු නැති වචනයක් වෙන්න පුළුවන්. ධම්මවිචය කියලා කියන්නේ අර ප්‍රඥාව යෙදීමයි. එතන බුදුරජාණන් වහන්සේ පෙන්නුම් කරන්නේ ප්‍රඥාව තුළින් ඒ කමටහන විමසනවා. ප්‍රඥාවෙන් කමටහන විමසා බලනවා. 'පඤ්ඤාය පවිචිනාති, පවිචරති පරිවීමංසං ආපජ්ජති' ආදී වචන යොදනවා. කමටහන පිරික්සා බලනවා. විමසලා බලනවා කියන්නේ අන්න අර නෙක්ඛම්ම සංකල්පයයි වැඩ කරන්නේ. කමටහනේ යථාස්වභාවය හිතට ගන්නවා. එතකොට සතිය ආශ්‍රය කරගෙන ධම්මවිචය සම්බොජ්ඣංගය. ඒක හිත අවදිමත් කරන දෙයක්. හිත අවදිමත් වෙනවා. නිකම්ම නිකං මේක පින්තූරයක් විතරයි. එහෙම නැත්නම් මේක නිකම්ම තියන එකක් කියලා හිතන්නේ නැතිව, ඒක වඩනවා හිතට කාවදින ආකාරයෙන්. මේකේ පිළිකුල් ස්වභාවය. ඒ විධියට හිතට කාවදින අවස්ථාව තමයි ධම්මවිචය සම්බොජ්ඣංගය. ප්‍රඥාවෙන් මේ කමටහන විමසනවා.

ඊළඟට එහෙම විමසන කොට වීර්යයක් ඇති වෙනවා. මේ කමටහන් නිමිත්ත ගැනීම පිළිබඳ වීර්යයක් ඇතිවෙනවා. ඒක තමා විරිය සම්බොජ්ඣංගය. ඒ වීර්යය ඇති වුනාට පස්සේ හිත වෙන පැත්තකට යන්නේ නැහැ. ඒ වීර්යය තුළින් ප්‍රීතියක් එනවා. සතුටක් එනවා ඒ යොමුවීම තුළින්. ඊළඟට ඒක තුළින් පස්සද්ධි කියල කියන කයේ සිතේ සන්සුන් බව. ඊළඟට ඒක සමාධියට හැරෙනවා. සමාධිය ළඟට උපේක්ෂාව. සමාධිය ලැබුනාට පස්සේ ඒක රැක ගැනීම සඳහා උපේක්ෂාව.

ඔන්න ඔය හත තමයි බොජ්ඣංග කියලා කියන්නේ. ඒවට බොජ්ඣංග කියන්නේ අවබෝධයට උපකාරවන කාරණා හත. එතකොට නිර්වාණ අවබෝධයට උපකාර වන කාරණා හත ඇසුරු කරගෙන අට්ඨික සංඥාව වැඩුවොත් තමයි අර කියාපු ප්‍රතිඵල ලබාගන්න පුළුවන් වෙන්නේ. මොනවද, මෙලොවම රහත් බව හෝ අවම වශයෙන් අනාගාමී බව. ඔන්න ඔය කාරණා බොහෝවිට අමතක වන දේවල්. ඒක නිසා යම් කෙනෙකුට උපකාර විය හැකි නිසා අපි මතු කරනවා.

ඒ වගේම ඇත්ත වශයෙන් කමටහන පිළිබඳව- දැන් අපි යම් අවස්ථාවක කිව්වා කමටහනක වටිනාකම, ඒවා ගැනත් සමහර අය නොතකන නිසා. සතර සතිපට්ඨාන බිමේ යෝගාවචර යුද්ධ භටයා කමටහන් ආයුධය අරගෙනයි පුහුණුව ලබන්නේ. එහෙම හිතා ගත්තොත් උපමාවක් වශයෙන්, සතර සතිපට්ඨාන බිමේ යෝගාවචර යුද්ධ භටයා කමටහන් ආයුධයක්

අරගෙනයි ශික්ෂණයේ යෙදෙන්නේ. ඒ ශික්ෂණය තුළ පළමුවෙනි අවස්ථාව තමයි සමමප්පධාන. එතන සමමප්පධාන වායාම, වීරිය කියන වචන සමානාර්ථවත් බොහෝ දුරට. සමමප්පධාන කියන්නේ උත්කෘෂ්ට වීර්ය හතරක්. මේ පින්වතුන් කොතෙකුත් අහල තියෙන සම්මා වායාම කියලා හැඳින්වෙන්නෙත් ඒකයි. මේ සම්මා වායාම නැත්නම් සමමප්පධාන කියන එකෙත් සරල හැඳින්වීමකුත් තියෙනවා. සවිස්තර හැඳින්වීමකුත් තියෙනවා. අපි බොහෝ විට දන්නේ අර සරල හැඳින්වීම විතරයි. ඒක විනාඩි කීපයකින් කියන්න පුළුවන්, පහසුවෙන්. සම්මා වායාම එහෙම නැත්නම් සම්මපධාන සාමාන්‍යයෙන් සරලව හඳුන්වන්නේ මේ විධියටයි. නූපන් අකුසල් නූපදවීම සඳහාත්, උපන් අකුසල් නැති කිරීම සඳහාත්, නූපන් කුසල් උපදවීම සඳහාත්, උපන් කුසල් තහවුරු කරගැනීම සඳහාත් දරණ හතරාකාර වීර්යය.

නමුත් බුදුරජාණන් වහන්සේ ඇතැම් අවස්ථාවල මේක සවිස්තරව දක්වනවා. අන්න ඒ අවස්ථාවල මේ කමටහන පිළිබඳ කතාව හොඳට පැහැදිලි වෙනවා. ඒකයි අපි මේක එළියට ගන්නේ. එතෙන්දි අර නූපන් අකුසල් නූපදවීම කියන එක තෝරන්නේ ඉන්ද්‍රිය සංවරය පිළිබඳවයි. මේ ධර්මයේ ඉන්ද්‍රියයන් හයක් ගැන කියවෙනවා. මේ පින්වතුන් දන්නවා. ඇස, කණ, නාසය, දිව, කය, මන. මනසත් ඇතුළත්ව ඒ ඉන්ද්‍රියයන් හයයි. ඉන්ද්‍රිය හය පිළිබඳ සංවරයයි මෙතන සංවරප්පධාන කියන්නේ. ඒ පිළිබඳ ව්‍යායාමය නැත්නම් සමමප්පධානය, ඒ කියන්නේ දැඩි ලෝභය, ද්වේශය, හටගන්වන කෙලෙස් සිතිවිලි ඇති නොවන ආකාරයට ඇස සංවර කරගන්නවා. කණ සංවර කරගන්නවා. ඒ විධියට නාසය, දිව, කය, අන්තිමට සිතත් සංවර කර ගන්නවා කියන අදහසයි එතැන සංවරප්පධාන කියන්නේ. එතකොට අන්න අර කමටහනම උපකාර කරගෙන ඉන්ද්‍රිය සංවරය කරන්න පුළුවන්. අර ස්වාමීන් වහන්සේ කළා වගේ පිණ්ඩපාතයේ යනකොට. අතීතයේ සංඝයා වහන්සේලාට පිණ්ඩපාතයේ යනකොට 'ගතපච්චාගත වත' කියලා එකක් තිබුණා. පිණ්ඩපාතේ යන්නෙත්, එන්නෙත් කමටහන අරගෙන. පිණ්ඩපාතය ලැබුනත්, නොලැබුනත්,ඒ ගමනේ තියෙන්නේ වටිනාකම- ඒ සංඝයා වහන්සේලාට- කමටහන අරගෙන යනවා, ආයිත් ආපසු අරගෙන එනවා. එතකොට ලැබුනත් නොලැබුනත්, කෙසේ වෙතත් භාවනාව දියුණු වෙනවා. ඒකට කියන්නේ 'ගතපච්චාගත වත'. කමටහන අධිෂ්ඨාන කරගෙන යනවා. ඒකයි අර ස්වාමීන් වහන්සේට අර ස්ත්‍රියගේ හිනාව- දත් ඇට ටික- කමටහනට ආරාධනාවක් වුනේ. ඒක තුළින් ඉබේටම ඇතිවුනා ඉන්ද්‍රිය සංවරය. ඒ ගතපච්චාගත වත තුළිනුත් බලාපොරොත්තු වෙන්නේ ඉන්ද්‍රිය සංවරයයි. ඉතින් ඔන්න කමටහන උපකාර කරගෙන ඉන්ද්‍රිය සංවරය. ඒ පළමුවන සමමප්පධානය.

ඊළඟට පහානය. පහාන කියන එක තෝරන්නේ මේ පින්වතුන් අහල තියෙනවා උපන් අකුසල් දුරුකිරීම කියන එක සාමාන්‍ය හැඳින්වීම. නමුත් එතන කියන්නේ ප්‍රහානය කිරීම- උපන්නා වූ කෙලෙස්.

උපන්නා වූ කාම විතක්ක හෝ ව්‍යාපාද කියල කියන ද්වේෂ විතක්ක හෝ විහිංසා විතක්ක හෝ පාපක අකුසල ධර්ම හෝ ඇතිවුනාම ඒවා නෙරපල හරිනවා. ඉවත් කරනවා. ඒකටත් කමටහන යොදාගන්නවා. කමටහන මතුකර ගත්තාම අරවට ඉඩ නැති වෙනවා. ඔන්න එතකොට සංවරප්පධාන නමින් හඳුන්වන සංවර කිරීමේ පළමුවෙනි පියවර උත්කෘෂ්ටව පැවැත්වීමේදී කමටහන උපකාර කරගන්නවා. ඊළඟට අර කියාපු කෙලෙස් සිතිවිලි ආවාම ඒවා නෙරපා හැරීමටත්. දැන්, තමන්ට වඩා ප්‍රියවන කමටහනට පුරුදු වුනාට පස්සේ ඒකටයි හිත යෙදෙන්නේ. ඒක මතු කරගෙන අරවා පන්නලා හරිනවා.

ඔන්න ඊළඟට කියනවා භාවනා. අන්න එතැනදී බුදුරජාණන් වහන්සේ දක්වනවා බොජ්ඣංග හත. එතැනදී කෙලින්ම දක්වනවා. ඒ 'සති සම්බොජ්ඣංග' අර 'විවේක නිස්සිතං' ආදිය සහිත නිවනට නැඹුරු කරලා ඒ කමටහන ආශ්‍රයෙන් බෝජ්ඣංග වැඩීමයි භාවනා කියල කියන තුන්වෙනි පියවර. **දැන් අපි අර සාමාන්‍යයෙන් නූපන් කුසල් උපදවා ගැනීම කියන එක සවිස්තරව ගත්තොත් බොජ්ඣංග වැඩීමයි. සත්ත බොජ්ඣංග වැඩීමයි.** නිවනට ඒක උපකාර වන නිසා. ඒක වඩන්නෙත් අර කමටහන ආශ්‍රයෙන්. දැන් අපි කිව්ව, කලින් කිව්ව ආකාරයට 'අට්ඨික සඤ්ඤා සහගතං සතිසම්බොජ්ඣඞ්ගං භාවෙති, අට්ඨිකසඤ්ඤාසහගතං ධම්මවිචය සම්බොජ්ඣඞ්ගං භාවෙති' ආදී වශයෙන් අට්ඨික සඤ්ඤාව වඩන කෙනාට අට්ඨික සඤ්ඤාව මුල් කරගෙන. එහෙම නැත්නම් අපි හිතමු අර පුළවක සඤ්ඤා කියලා කියන කෘමීන් ගැබ්වූ ශරීරයක් ගැන හිතනවා නම්, 'පුළවක සඤ්ඤා' කියලා එහෙම හරිගස්සා ගන්නවා. ඒ යෙදෙන කමටහන අනුව. ඔන්න එතකොට තුන්වෙනි එකත් අපට පෙනෙනවා පැහැදිලිවම කමටහන ආශ්‍රිතව බොජ්ඣංග වැඩීම බව.

ඊළඟට හතරවෙනි එකෙන් ඊටත් වඩා පැහැදිලි වෙනවා. 'අනුරක්ඛන'- ඒකට දක්වන්නේ උපන්නා වූ කුසල් තහවුරු කරගැනීම කියන කාරණය. සවිස්තරව දක්වන කොට දක්වන්නේ බුදුරජාණන් වහන්සේ පැහැදිලිවම 'උප්පන්නං භද්දකං සමාධි නිමිත්තං අනුරක්ඛති අට්ඨික සඤ්ඤං පුළවක සඤ්ඤං, විපුබ්බක සඤ්ඤං, විනීලක සඤ්ඤං' ආදී වශයෙන්, බුද්ධ වචන වශයෙන් තියෙන්නේ. උපන්නා වූ යහපත් සමාධි නිමිත්ත රැක ගන්නවා. උපන්නා වූ යහපත්- එහෙම උපන්නා වූ කියල කියන්නේ හටගත්, තමන් ඇතිකර ගත්තා වූ- නිකම් උපදිනවා නොවේ උත්සාහයෙන් ඇතිකර ගත්තා වූ- සමාධි නිමිත්ත රැකගැනීමයි. 'අනුරක්ඛන පධාන' හතරවෙනි එක. එතකොට

ඒ සමාධි නිමිත්ත මොකක්ද? අර ඇතිකර ගත්තු අට්ඨික නිමිත්ත. උග්ගහ නිමිති, පටිභාග නිමිති, වශයෙන් ඇතිකර ගත්තු නිමිත්ත රැකගන්නවා. අන්න ඒකයි එතකොට, එයින් අපට පෙනෙනවා සතර සම්මප්පධානයේ දී අර කමටහන උපකාර වන බව. ඒක තහවුරු කර ගන්නවා. අර යෝගාවචරය, සතිපට්ඨාන බිමේ සම්මප්පධාන වැඩීමටත් ඒක උපකාර කරගන්නා බව හොඳට පැහැදිලි වෙනවා. අනික් ඒවාත් එහෙමයි.

ඉතින් අන්න ඒ විධියට අපි කල්පනා කරලා බලනවා නම් මේ අට්ඨිකසංඥාවෙන් නිවන් බලාපොරොත්තු වන කෙනෙක් අරවා ගැනත් සැලකිලිමත් වෙන්න ඕනෑ. මේක නිකම් ආවාට ගියාට කරන දෙයක් නොවේ.

මේ අට්ඨික සංඥාව තුළ තියන සසර කලකිරවන ස්වභාවය, ඒකේ තියන අසුභ ස්වභාවය, මේවා හොඳට හිතට කාවැද්දෙන්න ඕනෑ. එතකොට තමයි මේක ගැන උත්සාහවත්ව ඒ නිමිත්ත හොඳට එන්නේ. ඒ වගේම ඒ නිමිත්ත ආශ්‍රය කරගෙන යම් අවස්ථාවක ඒ මාර්ගඵල ආදිය මතුවීමේදි වෙන්නෙත් අනිත්‍ය ආදී වශයෙන් ඒවායේ තියන යථා ස්වභාවය යථාභූත වශයෙන් දැකලා අන්තිමට සිත ඒවායෙන් මිදීම. ඒවායින් මුදාගැනීම සඳහායි එය පාවිච්චි කරන්නේ. ඔන්න ඔය විධියට හිතනකොට අට්ඨික සංඥාව ගැන ඔහොමයි.

අනික් ඒවාත් දක්වනවා පසුකාලීන ග්‍රන්ථවල. දස අසුභ හැටියට දක්වනවා අසුභ කර්මස්ථාන. විශුද්ධි මාර්ගය ආදී ග්‍රන්ථවල එහෙම තියෙන්නෙ උද්ධුමාතක විනීලක විපුබ්බක විච්ඡිද්දක වික්ඛායිතක වික්ඛිත්තක හතවික්ඛිත්තක ලොහිතක පුලවක- ඊළඟට අට්ඨික අන්තිමට ඒවායේ දක්වන්නේ. දහයක් දක්වනව. ඉදිමිච්ච සිරුර, නිල්වුන සිරුර, සැරව පිරුන සිරුර, දෙකට කැපිච්ච සිරුර, සතුන් විසින් කා දමන ලද, බල්ලන් කපුටන් ආදීන් කා දමන ලද සිරුර, කැබලි කරලා තැන තැන ආයුධ පහරවල් ඇති සිරුර, ලේ තැවරුන සිරුර එහෙම නැත්නම් පණුවන් ගැසූ සිරුර- ඔය විධියට ඒ සිරුරුවල තත්ත්වය. අන්තිමට දක්වන්නේ එතැන අට්ඨික සංඥාව. නමුත් බුදුරජාණන් වහන්සේ මුලටම අට්ඨික සංඥාව දක්වලා තියෙනවා.

කොහොම නමුත් ඇතැම් තැනක දහයක් පසුකාලීනව එක එක විධියට හදාගෙන තියෙනවා. නමුත් සිතාගන්න තියෙන්නේ අර අතීතයේ අමු සොහොනෙන් ගත්තු ඒ නිමිති මුල් කරගෙන මේ සංඝයා වහන්සේලා සත්තිස් බෝධි පාක්ෂිකධර්ම අතර තියෙන සතිපට්ඨාන සම්මප්පධාන ඉද්ධිපාද ඉන්ද්‍රිය බල බොජ්ඣංග ආදිය කමටහන තුළින්ම දියුණු කරගෙන අර්හත්වයට පත්වුන බවයි.

ඉතින් මේ කථා කළේ එතකොට අර මිය ගියාට පස්සේ දකින්න ලැබෙන දේවල්. තමා මැරුණාට පස්සේ ඒ ටික කරන්න බැහැ නේ.

ඒ නිසා අපට උපකාර කරගන්න වෙනවා මිය ගිය කෙනෙකුගේ සිරුරක්. ඒකයි ඔය අමුසොහොනකට යන්නේ. ඉතින් හැමවිටම එහෙම යන්න බැරි වුනත් හිතට ගත්තට පස්සේ ඔය සතිපට්ඨාන සූත්‍රය කියවන පින්වතුන් දන්නවා එතැන බුදුරජාණන් වහන්සේ දක්වන්නේ 'යම්සේ' සොහොනක දමන ලද සිරුරක් දකින්නේ ද 'එසේම ඒක හිතට නඟා ගෙන ඊළඟට ඒක තමන්ට ආරෝපණය කරගන්නවා. අන්න එතනයි වැදගත්කම තියෙන්නේ. 'සො ඉමමෙව කායං උපසංහරති' මේ කයට ආරෝපණය කර ගන්නවා. ඒ කය යම්සේ ද මේ කයත් එසේම ය. මේ කය යම්සේද ඒ කයත් එසේමය. අන්න ඒක වැදගත් අවස්ථාවක්. එතනදී තමා විපස්සනාව සම්පූර්ණ වන්නේ. ඒක පොතපතේ දක්වෙන්නේ 'අජ්ඣත්තබහිද්ධා' කියල. එතකොට බැහැරින් ගත්ත කමටහන තමාට ආරෝපණය කරගන්නවා. ඒක තුළයි පූර්ණ අවබෝධය එන්නේ. ඇතැම් කෙනෙක් හිතන්න පුළුවන් මේ මගේ ශරීරයට විතරක් වෙන දෙයක් කියල. සමහර විට දිවි නසා ගන්න පුළුවන්. මේක පොදු දෙයක් හැටියට, හැම ශරීරයකටම පොදු සාධාරණ දෙයක් හැටියට, ධර්මතාවක් හැටියට, වටහා ගැනීමයි බුදුරජාණන් වහන්සේ පෙන්නුම් කරන්නේ.

මේ පින්වතුන් අහල තියනවා ඔය ඛේමා, රූපනන්දා ආදීන් ගැන එහෙම. බුදුරජාණන් වහන්සේ අර රූපයක් මවලා ඒ තැනැත්තියට දැඩි මාන්නයක් තිබුන නිසා තමාගේ රූපය ගැන-රූපය ගැන කියන කොට දැන් මේ කාලයේ අපි කිව්ව විලාසිතා ගැන කියන කොට ඇතැම් කෙනෙකුට තරහ යන්න වගේ ඒ කාලයෙත් ඔය රූපලාවන්‍යයට ලැදි අය බුදුරජාණන් වහන්සේ අසුභ භාවනාව ගැන කියන කොට තරහ වෙලා දකින්නවත් ආවේ නැහැ. ඒ ඛේමා කියන බිසොව ගැන සඳහන් වෙනවා. නමුත් අන්න එබඳු අවස්ථාවල බුදුරජාණන් වහන්සේ බැහැරින් රූපයක් ඍද්ධියෙන් මවලා ඒක දිහා බලා ඉන්න සලස්වලා ඒක විනාශ වෙනවා දකලා ඒ තැනැත්තියට හිතන්න සැලැස්වූවා මේ කයත් මෙහෙම නේද කියලා. අන්න එතකොට ඒ ධර්මතාව තමයි අන්තිමට නිවනට උපකාර වෙන්නේ. 'යථා ඉදං තථා එතං- යථා එතං තථා ඉදං, අජ්ඣත්තං ච බහිද්ධා ච කායෙ ඡන්දං විරාජයෙ.' මේ කය යම් සේද ඒ කයත් එසේමය. ඒ කය යම් සේද මේ කයත් එසේමය. ඒ විධියට ඇතුළතත් පිටතත්-'අජ්ඣත්ත බහිද්ධා" ඒ දෙක සම්පූර්ණ වුන අවස්ථාවෙමයි විදර්ශනාව එලගැන්වෙන්නේ. මේ කයේ තත්ත්වයම තමා ඒ කයත්. ඉතින් සොහොනෙන් ගත්තු ශරීරය ඒකට අපට කියන්න පුළුවන් අවිඤ්ඤාණක අසුභය- විඤ්ඤාණය නැති අසුභය.

අවිඤ්ඤාණක අසුභය ගැන කියන්නේ මොකද සවිඤ්ඤාණක අසුභයකුත් තිබෙන නිසා. අවිඤ්ඤාණක අසුභය කියන්නේ මොකක්ද හිතක් නැති අසුභය. ඒ තමා සොහොනේ තිබෙන්නේ. එතකොට සිතක් ඇති අසුභය තමයි ගෙදර තිබෙන්නේ. මේ කියන ශරීරයම තමයි. එතකොට සවිඤ්ඤාණක

වශයෙනුත් අවිඤ්ඤාණක වශයෙනුත් අසුභ කථාව කියන්න පුළුවන්. ඒ වෙනුවට නොයෙකුත් වචන තියෙනවා. ඒ පිළිබඳව මේ පින්වතුන් දන්නවා. පටිකකූල මනසිකාරය කියන පිළිකුල් භාවනාව. ඒ කියන්නේ අර ශරීරයේ දෙතිස්කුණප කොට්ඨාශ මෙනෙහි කිරීම. ඉතින් ඒකත් අසුභ. ඇත්ත වශයෙන්ම, වචනය කොයි ආකාරයෙන් යෙදුනත් ඇතැම් අවස්ථාවල බුදුරජාණන් වහන්සේ කායගතාසති කියන 'කය අනුව ගිය සිහිය' කියන වචනය තුළට දානවා ඔක්කොම කමටහන්. ආනාපාන සතිය ධාතුකර්මස්ථාන ඔය කියාපු පිළිකුල් මනසිකාරය, නවසීවථිකය ඒ හැම එකක්ම කය අනුව ගිය සිහිය කියන පුළුල් මාතෘකාවට දාලා තෝරපු තැනුත් තියනවා.

ඉතින් කොහොම හරි අසුභ භාවනාව සාමාන්‍ය වශයෙන් අපි සලකන්නේ අර විධියට සොහොනක දකින්න ලැබෙන, එහෙම නැත්නම් මියගිය කෙනෙකුගේ ශරීරය ආශ්‍රයෙන් අපි ගන්න නිමිත්තක් හැටියටයි. ඉතින් එහෙම නිමිති මේ කාලයේ බැලුවොත්- අර කිව්වා වගේ උනන්දු වෙනවා නම්- කෙනෙක් දන් තමන්ගේ ඥාති කෙනෙක් අර විධියේ තත්ත්වයට පත්වුනා අර සුනාමි අවස්ථාවේ. සමහරු- මේ පින්වතුන් දන්නවා ඇති අපටත් වඩා,- නහය වහගෙන ඉදිමිච්ච, දින ගණන් පරණ වෙච්ච, තමන්ගේ ඥාතීන්ගේ සිරුරු අඬ අඬා තේරුව හැටි. ඉතින් ඒ අවසාන ඡායාරූපය තමන් හිතින් ගත්තා නම් තමන්ගේ ඒ ඥාතියාගේ, ඒ වෙනුවට ගෙදරවල එල්ලන්නේ සමහර විට තරුණ කාලයේ පින්තූරය සිහිපත් කරන්න. ඇත්ත වශයෙන් නිවන් බලාපොරොත්තු වෙනවා නම් ඒ අවස්ථාවේ තමන් ලබාගත්තු ඒ දුර්ලභ කර්මස්ථානය තමන්ගේ ඥාතියා පිළිබඳව, ඒක හිතට වැදුනා නම්, ඒක උපකාර කරගෙන නිවන් දකින්න පුළුවන්. මුළු මහත් සංසාර දුකින් මිදෙන්න පුළුවන්. නමුත් ඒවා අසුභ නිසා, අප්‍රිය නිසා, අපි ඒවා අමතක කරනවා. සුභ නිමිත්ත නම් ඉබේම සිතට තැන්පත් වෙනවා. අසුභ නිමිත්ත උත්සාහයෙන් කළ යුතුයි. උත්සාහයෙන්- ඒ සඳහා බොහොම වෙහෙස වෙන්න ඕන. පොත පතේ ආචාර්යවරු දක්වනවා- රෝගියකුට බෙහෙත් වගේ. දන් යමෙකුට අසනීපයක් තිබෙනවා නම් වමන විරේචන ආදී බෙහෙත් ගන්න වෙනවා. අන්න ඒ වගේ තිත්ත නමුත් මේ අසුභ භාවනාව අර තරම් බලවත් කියලා තේරුම් ගත්තා නම් අන්න අර මේ කාලයේ පුවත්පත් වලින්, දෘශ්‍යමාධ්‍ය වලින්, දකින්න ලැබෙන අර ඉස්සරවෙලා කියාපු ජාතිය නොවේ. මේවගේ භීෂණ යුගයක දකින්න ලැබෙන සිද්ධි ආශ්‍රයෙන් කොතෙකුත් අමු සොහොනෙන් එදා සංඝයා වහන්සේලා ගත්තු නිමිති ගන්න ඕනෑ හැටියේ ඉඩ තියෙනවා, ඒ ගැන උනන්දුවක් තිබෙනවා නම්. ඒවා සිතට ධාරණය කරගත්තොත්, එහෙම නැත්නම් ඒ ඡායාරූප ආශ්‍රයෙන් නැවත නැවත සිත පුරුදු කර ගත්තොත්, අන්න අර නිවන ලබාගන්න පුළුවන්. ඒ නිසා ලෝකයේ ඇතැම් උගතුන් මේවා විකෘත මානසික තත්ත්වයන් හැටියට දක්වුවත් තිලෝගුරු බුදුරජාණන්

වහන්සේ පෙන්නුම් කරලා තියෙන්නේ යම් කෙනෙක් මේවා ප්‍රයෝජනයට ගන්නවා නම් එයා තමා අමෘතය වළඳන්නේ කියලා. නිවන් අමෘතය වළඳන්නේ. අමෘතය ප්‍රතික්ෂේප කිරීමක් වෙනවා අසුභ භාවනා, කායගතාසතිය ආදියට නිග්‍රහ කිරීම. ඒක නිසා අපි නිවන් බලාපොරොත්තු වෙනවා නම් ඔන්න ඔය විධියට පටික්කූල මනසිකාර ආදී වශයෙන් දක්වන ඒ කර්මස්ථාන ගැන උනන්දුවෙන්න ඕන. මොකද, මේ යුගයේ තමා අර කිව්ව රෝගය බොහොම භයානක අන්දමින් පැතිරෙන්නේ. මේ පින්වතුන් හොඳට දන්නවා. ඒක නිසා ඒකට යටත් වන්නේ නැතිව ප්‍රතිශක්තිකරණයක් හැටියට, එදිනෙදා ජීවිතයේ ප්‍රතිශක්තිකරණයක් හැටියට, අසුභ භාවනාව වඩන්න සිද්ධ වෙනවා. ඉතින් ඒකට උපකාර වන ටික තමයි දැන් සාමාන්‍ය වශයෙන් කිව්වේ.

ඒ ධ්‍යාන පැත්ත පමණක් නොවේ, ධ්‍යානයක් ලබා ගැනීම පමණක් නොවේ, ඒ ධ්‍යාන පැත්ත උපකාර කරගෙන විදර්ශනාවත් වඩන්න ඕනෑ. අන්න අර විධියට ඉන්ද්‍රිය බල බොජ්ඣංග ඒවා සම්පූර්ණ වුන අවස්ථාවෙයි ආර්ය අෂ්ටාංගික මාර්ගය සිතේ පහළවෙන්නේ. ඒක නිසා මේක නිකම්ම කමටහනක් නොවේ. සසර ගැන කලකිරීම, නිබ්බිදා කියල කියන කලකිරීම, ඇතිවන අන්දමටයි මේක වඩන්න වෙන්නේ. එතකොට ඒ කර්මස්ථානය යෝගාවචරයට ප්‍රියයි. ඒක පුරුදු වුනාට පස්සේ ප්‍රියයි. ඒකේ ආනිශංස දකින නිසා. මොකද අර කෙලෙස් සන්තාප නැතිවෙනවා. ඉතින් නොයෙකුත් උපමා වලින් දක්වනවා. ඉතින් ඒ බාහිර තියන අශුභය, අවිඤ්ඤාණක අසුභය උපකාර කරගෙන අපි ඒක ආරෝපණය කරනවා. සවිඤ්ඤාණක අසුභයත් ඒවගේ. නමුත් ඒක ප්‍රකට වෙන්නේ නැහැ. සවිඤ්ඤාණක කියන්නෙ විඤ්ඤාණය සහිත. ඉතින් ඒකටත් අතීත ආචාර්යවරු නොයෙකුත් උපමා කතාන්තර එහෙම දක්වනවා. සාමාන්‍ය ලෝකයා, කෙලෙස් සහිත ලෝකයා, මේ ශරීරය සුභ හැටියට සලකනවා. පිළිකුල් නැති දෙයක් හැටියට සලකනවා. වස්ත්‍රාභරණ වලින් සරසලා සෝදලා නිරන්තරයෙන් පිරිසිදු කරලා තියෙන නිසා- අර දෙතිස් කුණප කියල කිව්වට නමට- මේවා කුණප වශයෙන් සැලකෙන්නේ නැහැ. බොහෝ දෙනා මේවා පුළුවන් තරම් අලංකාර කරගෙන ඉදිරියට ප්‍රදර්ශනය කරන්නයි බලාපොරොත්තු වෙන්නෙ. නමුත් එපමණක් නොවේ. ඒ තමාගේ ශරීරය පිළිබඳවත් අනුන්ගේ ශරීරය පිළිබඳවත් ඒ තියෙන අසුභ බව සලකන්න සිද්ධ වෙනවා. ඉතින් ඒකට අතීත ආචාර්යවරු නොයෙකුත් උපමා කතාන්තර දක්වනවා.

දැන් ඒ බාහිර අසුභ, බාහිර දේවල්වල අසුභ බව තේරුම් ගන්න පහසුයි. එහෙම නැත්නම් අපි කීවේ අර අවිඤ්ඤාණක අසුභය -විඤ්ඤාණය නැති එකක අසුභය, මියගිය ශරීරයක අසුභ ස්වභාවය තේරුම් ගන්න පහසුයි. නමුත් සවිඤ්ඤාණක ජීවමාන ශරීරය තුළ තියෙන මේවායේ අසුභ ස්වභාවය, පිළිකුල් ස්වභාවය තේරුම් ගැනීම අපහසුයි. අපි අර දීර්ඝ කාලයක්

සංසාරයේ සුභ සංඥාව වඩලා තියෙන නිසා, ඒ වගේම රාගාදි කෙලෙස් තිබෙන නිසා. ඔන්න එතකොට ඒකයි. අතීතයේ ආචාර්යවරු දක්වනවා උපමාවක්. මේ පින්වතුන් කතාන්තරත් අහන්න කැමති නිසා කියතොත්, දැන් ඔය කැලෑවල තියෙනවා කැල මල්. කැල ගස්. කැල මල් කියන එක තියෙන්නේ ඒ ගස්වල. එක පාරට පිපෙනවා. රතුපාට මල්. හරියට මස් වැදලි වගේ. එතකොට බැලූ බැල්මට පෙනෙන්නේ මේ ගස්වල මස් වැදැලි එල්ලලා තියෙනවා කියල. ඉතින් සමහර විට හිවලෙක් ඔය ගහ දැකලා කල්පනා කරනවා මේ ගහේ මස් වැදලි එල්ලලා තියෙනවා කියලා. ගහ යටට ගිහිල්ලා උඩ බලාගෙන ඉන්නවා. මස් වැදලි වැටෙනකන්. ඔන්න මලක් වැටුන හැටියේ විගහට දුවලා ගිහිල්ලා ඒක කාලා බලනවා. නැහැ. ඒක මස් වැදල්ලක් නොවේ. තව එකක් වැටෙනවා. එතෙන්ටත් ගිහිල්ලා බලනවා. නැහැ. ඒකත් නැහැ. හැබැයි හිවලා එතනින් යන්නේ නැහැ. මොකද, හිතන්නේ. හිතන්නේ කොහොමද? මේ වැටුන ඒවා තමයි ඒ. නමුත් උඩ තියෙන්නේ හොඳ මස් වැදලි. ඔන්න ඔය උපමාවෙන් ඒ අතීත ආචාර්යවරු දක්වනවා අවිඤ්ඤාණක අසුභයත් සවිඤ්ඤාණක අසුභයත් පිළිබඳ කථාව.

දැන් මේ ශරීරයේ තිබෙන කෙළ, සෙම්, සොටු මළමූත්‍රා ආදිය වැටුනාට පස්සේ කවුරුවත් අල්ලන්නවත් කැමති නැහැ. අතින් ගන්නවත් කැමති නැහැ. නමුත් ඒවා වැටෙන්න කලින් නම් ඒවායේ තියෙන වටිනාකම කියන්න බැහැ. ඔන්න ඔය ටිකයි කැල මල් උපමාවෙන් කියන්නේ. ඒ අතීත ආචාර්යවරු කැල මලේ උපමාව දැක්වූයේ ඒකටයි. මේ ශරීරයෙන් වැටෙන වැටෙන ඒවා අල්ලන්නවත් කවුරුවත් කැමති නැහැ. නමුත් ශරීරයේ තියෙන ඒවා ගැන අර විධියටයි සුභ සංඥාව. මේ වැටුනු ඒවා එහෙම තමයි. අර ගහේ- ශරීරයේ- තියෙන ඒවා බොහොම හොඳ වටිනා දේවල්. ඉතින් ඒ උපමාව දක්වන්නේ ඔන්න ඔය ශරීරය ගැන තමන්ට හිතන්න පොළඹවන්නයි.

ඉතින් ඒ සංසාරයේ දීර්ඝ කාලයක් තිරිසනුන් හැටියට අරගෙන ආ අවිද්‍යා අන්ධකාරය නිසා ඒ සංකල්පය අප තුළ තිබෙනවා. ඒක නැති කරන්නයි බුදුරජාණන් වහන්සේ පෙන්වා දුන්නේ පිළිකුල් භාවනාව. ඔය අසුභ භාවනාව. ඔය හැම එකක්ම. අපි බෞද්ධයින් හැටියට- ගිහි හෝ වේවා පැවිදි හෝ වේවා- හැම කෙනෙක්ම නිවනයි පතන්නේ. එතකොට ඒකට අර විධියට කැලේට නොගියත් තම තමන්ගේ මට්ටමින් මේවා වඩනවා නම් බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කළ ඒ ආනිශංස එතන එතනම දකින්න පුළුවන් වෙනවා. අර කියාපු සමාජයේ තියෙන ඔය භයානක අපරාධ රැල්ලෙන් මිදිලා තමන්ට එක්තරා භාවනාවකින් යුක්තව ජීවිත පවා ගෙවන්න පුළුවන් වෙනවා. අතීතයේ ඒ අපේ පැරැන්නන් වගේ. ඒ එකක්. අනිත් එක, ක්‍රම ක්‍රමයෙන් ගිහි ජීවිතේ ගත්තු කමටහන් නිමිත්ත සමහරවිට යම් දවසක පැවිදි වෙලා රහත් වෙන්නත් උපකාර වෙන්න පුළුවන්. ඒකට හොඳ නිදර්ශන

ඔය ධර්ම කථාවල තියෙනවා. අතීතයේ එක්තරා රජකුමරියක් වැසිකිලියක පණුවන් දකලා පුළුවක සංඥාව ඇතිකර ගත්තා. පුළුවක සංඥාව කියල කියන ඉදිමිලා පණුවන් දාපු ශරීරයක් ඒ තැනැත්තියට සිහි වුණා. දැන් එවැනි වැසිකිළි දකින්නවත් නැහැ. වැසිකිළිය කියලා හිතන්නවත් බැරි තරම් හොඳ සුවඳ ගහන තැන් තමා දැන් වැසිකිළි කියලා කියන්නේ. ඉතින් අතීතයේ අර වල වැසිකිළියකට ගිය රජකුමරියට, රජකුමාරියට සමහර විට හොඳ වැසිකිළි තියෙන්න ඇති. නමුත් අවශ්‍යතාව නිසා ගියා. ගියාට පස්සේ දැක්කා ඒකෙ පණුවන් නට නටා ඉන්නවා. ඒ වෙලාවේ හිතට ආවලු මේ තියෙන මගේ ශරීරය, පණුවන් දැම්මාම මෙහෙම නේද? කියලා. අන්තිමට ඒ සිතුවිල්ල උපකාර වුනා රහත් වෙන්නත්. ඒ විධියේ කොතෙකුත් කතන්තර තියෙනවා. මේ පින්වතුන් කොතෙකුත් ඔය ධර්ම කතාවල අහල තියෙනවා නේ. ඔය රජ කෙනෙක් නගරයේ පැදකුණු කරන අතරේ නළලට දාඩිය දාපුවාම ලේන්සුවෙන් පිහදාල ඒ වෙලාවේ ඇතිවුන අසුභ සංඥාව ඒක තුළින් තමයි චූල පන්ථක කියලා හාමුදුරු කෙනෙක් ඇති වුනේ. අන්න ඒ විධියේ ධර්ම කථා තියෙනවා.

එයින් අපට පේනවා ගිහි හෝ වේවා, පැවිදි හෝ වේවා, අපි මේ කමටහන් ඒ ඒ අවස්ථාවල ලැබුන අවස්ථාවල- රෝහලකට ගියා හෝ මළගමකට ගියා හෝ අර විධියේ භීෂණ යුගයේ ඒ චිත්‍ර දෘශ්‍ය මාධ්‍යවලින් දැක්කා හෝ- ඒවායේ වටිනාකම තේරුම් ගත්තා නම්, ශාසනික වටිනාකම තේරුම් ගත්තා නම්- තමන්ට එතකොට මේ ධර්ම මාර්ගයේ යන්න ඒක ශක්තියක් වෙනවා. එහෙම වැඩුනු ඒ හැඟීම් තමයි බුදුරජාණන් වහන්සේ දක්වන්නේ 'නිබ්බිදා බහුලො භව' නිබ්බිදා කියල කියන්නේ සසර කලකිරීම සසර කලකිරීම වැඩි කරගන්න. සසර කලකිරීම නැතිව, භවය ගැන කලකිරෙන්නේ නැතිව, භවයෙන් මිදෙන්න බැහැ. භවයෙන් මිදෙන්න බැහැ. ඒක අපට පිළිගන්න වෙනවා. පිළිගත්තා නම් අන්න එතකොට අපි නිරන්තරයෙන් අපේ මට්ටමින්, අපේ මට්ටමින් කීවාට සුළුවට හිතන්න නරකයි. අතීතයේ බුද්ධ කාලයේ සිටි ඇතැම් බුද්ධ ශ්‍රාවකයින් අතර මාර්ගඵල බොහොම ඉහළට දියුණු කර ගත්ත කට්ටියත් හිටියා. නකුල මාතා, නකුල පිතා ආදීන් ගැන කියවෙන්නේ. අන්න ඒ නිසා අපිත් ඒ ටික කල්පනා කරලා- හැමෝම කියන්නේ තවත් නම් මේ සංසාරයේ ඉපදෙන්න ඕන නෑ කියලා- නමුත් ඒකට අවශ්‍ය කාරණා ටිකත් සම්පූර්ණ කරගන්න බලන්න ඕනෑ.

ඒක නිසා මේ අසුභ භාවනාව කියන නම තිබුණාට ඒකට හිත නරක් කරගන්න නරකයි. අර මෛත්‍රී භාවනාව ගැන කිව්වා වගේ. අර මුළු පොළවම ඇත්ත වශයෙන්ම ඇටසැකිළි ගොඩක් පමණයි. බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කළ ගාථා, ධම්ම පද ගාථා, ඒවගේ ඇතැම් සූත්‍ර අපට උපකාර වෙනවා අර කියාපු ධම්මවිචය සම්බොජ්ඣංගය ගොඩනගා ගන්න. අපි කිව්වා ධම්මවිචය සම්බොජ්ඣංගය කියලා කියන්නේ කමටහනේ තියෙන

ධර්ම පැත්ත ප්‍රඥාවෙන් විමසා බැලීම. ඔන්න එක අවස්ථාවක බුදුරජාණන් වහන්සේ සංඝයා වහන්සේලාට වේපුල්ල පර්වතය- ඉන්දියාවේ තියන පර්වතයක්- ඒක පෙන්වලා බුදුරජාණන් වහන්සේ අමුතු කතන්තරයක් කිව්වා. "මහණෙනි, එක පුරුෂයෙක්, එක මනුෂ්‍යයෙක් කල්පයක් තුළ හෙළු ඇටසැකිලි- මැරි මැරී ඉපදි ඉපදී - ඇටසැකිලි එකතු කරලා ගත්තොත් මෙන්න මෙ වේපුල්ල පර්වතය තරම් විශාල වෙනවා කියලා. එතැනින් ඉවර කළේ නැහැ. අනිච්චතාව ප්‍රතික්ෂේප කළා නොවේ බුදුරජාණන් වහන්සේ. ඊළඟට එකතු කළා මේවා- ඒ ඇටසැකිලි- එකතු කරන්න කෙනෙක් ඉන්නවා නම් ඒ වගේම එකතු කළ ඇටසැකිලි විනාශ නොවී තියනවා නම්, ඔන්න එහෙනම් මේ වේපුල්ල පර්වතය තරම් වෙනවාය. එතකොට හිතාගන්න පුළුවන් නේ බුදුරජාණන් වහන්සේ අධෝ ලිපියකුත් එක්කයි ඒ කාරණාව ඉදිරිපත් කළේ. නිකම්ම උපමා ඉදිරිපත් කළේ නැහැ. වේපුල්ල පර්වතය තරම් එකක් වෙනවා කල්පයක් තුළදී එක පුද්ගලයෙක් හෙළු ඇටසැකිලි. කෙනෙක් ප්‍රශ්න කරන්න පුළුවන් ඕවා කොහොමද එකතු කරන්නේ. අන්න ඒ ටික බුදුහාමුරුවෝ කීවා. යම් කෙනෙකුට එකතු කරන්න පුළුවන් නම්, එකතු කළ ඇටසැකිළි විනාශ නොවී තියනවා නම් අන්න වේපුල්ල පර්වතය තරම් වෙනවා ඒක, මේ ටික කිව්වේ බුදුරජාණන් වහන්සේ- සම්ඵප්‍රලාපයක් නොවේ නෙ - අන්න අර සම්මා සංකල්පයට උපකාරවන හැටියට හිතන්නයි. මේ මුළු පොළවෙම තියෙන්නේ ඇටසැකිලි ගොඩක් විතරයි නේද කියලා. මේ අපේ අනන්‍යතාව ඔප්පු කරන්න අපට යම් යම් ප්‍රමාණයට මස් සම් ආදිය උපකාරවන බව ඇත්ත. අපේ අනන්‍යතාව ඔප්පු කරන්නත් එපායැ. සමාජයේ ඉන්න කොට. නමුත් පොදුවේ ගත්තොත් කාටත් තියෙන්නේ ඇටසැකිළි ගොඩ තමා. ඒකයි අර ස්වාමීන් වහන්සේ මුළු පොළවම ඇටසැකිලි ගොඩක් හැටියට හිතුවයි කියලා කියන්නේ. ඉතින් හැමදෙනා තුළම තියෙන්නේ ඔය ටික විතරයි. අර උඩින් කොයි විදියට සරසලා තිබුණත්.

ඒකත් බුදුරජාණන් වහන්සේ සුත්තනිපාත, ධම්මපද ගාථාවල දක්වනවා. මේ පින්වතුන් දන්නවා.

අට්ඨීනහාරුසංයුත්තො- තචමංසාවලෙපනො
ඡවියා කායො පටිච්ඡන්නො - යථාභූතං න දිස්සති
-විජය සුත්ත, සුත්ත නිපාතය[1]

ඇට නහරින් බැඳුනු
සම් මසින් පිරියම් වුනු
කය සිවියෙන් වැසුනු
ඇති හැටිය නැත දිස්වනු
සිංහල කවියක් හැටියට ගත්තොත්.

අට්ඨි නහාරු සංයුතෙතා- ඇට නහරින් බැඳුනු, තචමංසාවලෙපනො- සම් මසින් පිරියම් වුනු, ඡවියා කායො පටිච්ඡනෙනා කය සිවියෙන් වැසුනු, යථාභූතං න දිස්සති ඇති සැටිය නැත දිස්වනු. අන්න ඒ එක ගාථාවක්.

ඒ වගේම තවත් තැනක තියෙනවා

යානිමානි අපත්‍ථානි
අලාපූනෙව සාරදෙ
කාපොතකානි අට්ඨීනි
තානි දිස්වාන කා රති

-ජරාවග්ග ධම්මපද ගාථා 149-

සරත් සමයේ ඒ ඒ තැන දමලා තියෙන ලබුකබල් ගොඩක් වගේ මේ හිස් කබල්. ඒවායෙ පාටත් කියලා තියෙනවා. හරියට අර පරෙයියන්ගේ පාට. පරෙයියන්ගේ පාට ඇති හිස්කබල් ගොඩ හරියට සරත් සමයේ ලබුකබල් ගොඩක් වගේ. ඒවා දැකලා කවර නම් ඇල්මක්ද? ඒකත් බුද්ධ වචනයක්.

ඉතින් ඔය විධියට තවත් තියනවා.

අට්ඨීනං නගරං කතං
මංස ලොහිත ලෙපනං
යත්‍ථ ජරා ච මච්චූ ච
මානො මක්ඛො ච ඔහිතො

-ජරාවග්ග.ධම්මපද ගා.150-

මේ තවත් බුද්ධ වචනයක් "අට්ඨීනං නගරං කතං". ඔන්න නගරයක උපමාව බුදුරජාණන් වහන්සේ දෙනවා. මේ පුදුම සංකල්පනාවක්. 'අට්ඨීනං නගරං කතං' ඇටවලින් නගරයක් හදලා තියෙනවා. ඊළඟට 'මංස ලොහිත ලෙපනං' මේ නගරය පිරියම් කරලා තියෙන්නේ මස් ලේ වලින්. අපි හිතමු ඔය ප්‍රාකාර ආදිය බදින්නා වගේ. "යත්‍ථ ජරාව මච්චු ච මානො මකෙඛා ච ඔහිතො" ඔය නගරයේ ඉන්නේ කවුද? ජරාව "ජරා ච" 'මච්චු ච' මාරයා ඒ වගේම "මානො"- මානය 'මක්ඛො' මකුකම, ගුණමකුකම ඔයවිදියෙ කෙලෙස් ඔක්කොම එතකොට ආරෝපණය කරල තියෙන්නෙ මේ නගරයෙ. අර සම් මස් වලින් පවත්වා ගෙන යන්නේ මොකක්ද? ජරාව, මරණය මානය, මකුකම ඕවා ටිකයි නගරය ඇතුළේ තියෙන්නේ.

ඔන්න ඔය විධියේ උපමා බුදුරජාණන් වහන්සේ දුන්නේ කවි සංකල්පනා මතුකරන්න නොවේ. අන්න අර කියාපු සසර කලකිරීම අපට

ඇතිකරන්නයි. සංසාරේ කරපු වැඩේ මොකක්ද කියන එක බුදුරජාණන් වහන්සේ සමහරවිට කෙටියෙන් දක්වලා තියෙනවා. 'කටසි වඩ්ඪිතා' 'කටසි වඩ්ඪිතා' කියල කියන්නේ සොහොන් වැඩුවා. අර වේපුල්ල කතාවෙනුත් පේන්නෙ මෙච්චර කාලයක් කරපු හපන්කම මොකක්ද? සොහොන් වැඩුවා. ඒක එකතු කරන්න බැරිවුන එක විතරයි අඩුපාඩුව. මේ දීර්ඝ කාලයක් කළේ සොහොන් වැඩුවා. මව්කුසෙන් පටන්ගෙන ඊළඟට සොහොන කරා යන ගමන තුළ සතර මහා භූතයින් කියන පඨවි ආපො තේජෝ වායො ගස්කොළං වලිනුත් අනික් සතුන් මරාගෙන හරි මේක තර කරගෙන ඊට පස්සේ ඒවායින් ඇතිවෙච්ච ඇටසැකිල්ල දාල යන්න සිද්ධ වෙනවා. ඉතින් ඒක තමයි "කටසි වඩ්ඪිතා" සොහොන් වැඩු එක තමයි අපි කළ හපන්කම. ඒක නිසා අපි හිතා ගන්න ඕනෑ 'න සියා ලොකවඩ්ඪනො බුදුරජාණන් වහන්සේ කියල තියෙනවා ලෝක වර්ධනයෙක් වෙන්න එපා කියලා. **ලෝක වර්ධනයෙක් වෙන්නෙ නැතිව, සුසාන වර්ධනයෙක් වෙන්නේ නැතිව, අපිට තියෙන්නේ අන්න අර කියාපු සොහොන් භාවනාවම උපකාර කරගෙන සොහොන් වැඩීම නතර කරන එකයි.** සෝසානිකංග කියල අතීත තෙරුන් වහන්සේලා උග්‍ර ධුතාංග අධිෂ්ඨාන කරගෙන මහ රෑ අමුසොහොනකට ගිහිල්ලා භාවනා කරලා ඉක්මණින්ම රහත් වුනා. අපට එච්චර කරන්න බැරි වුනත් මේ ටික ආශ්‍රයෙන් අන්න අර විධියට තමන් ඒවා හරියට වැඩුවා නම් අන්තිමට ලබන ප්‍රතිඵලය මොකක්ද? මේ සංසාරයේ සොහොන් වැඩීම නතර කරලා, ජාති ජරා ව්‍යාධි මරණ ආදී සියලු සංසාර දුකින් අත්මිදිලා, උතුම් අමා මහ නිවන සෝවාන් සකදාගාමී අනාගාමී අර්හත් කියන ඒ මාර්ගඵල ප්‍රතිවේධයෙන් ලබලා සම්පූර්ණයෙන්ම, අමෘතය කියල කියන ඒ නිවන් අමෘතය අනුභව කරන්ට තමන්ට ශක්තිය ලැබෙනවා.

අන්න ඒක නිසා මේ පින්වතුන් කල්පනා කරන්න ඕන අද දින මේ දේශනය ගැන. තම තමන්ගේ ජීවිත මට්ටමින් අද දින මේ පින්වතුන් ගෙවල් වලින් ඉවත් වෙලා ආවේ ඒ ගෙවල්වල අඩුපාඩු නිසා නොවේ. ඊට වඩා වටිනා දෙයක් මේ පොහොය දවසේ කරන්න. මොකද වටිනා සීලයක් සමාදන් වෙලා ඒ තුළ තමන්ගේ භාවනාදිය වෙනදාට වඩා හොඳින් කරමින් ඊළඟට ධර්ම ශ්‍රවණ ආදියෙන් නිවන් මඟට අදාළ දේවල් හිතේ එකතු කරගෙන යම් අවස්ථාවක හැකිනම් මේ ජීවිතයේදීම අර කවුරුත් බලාපොරොත්තු වන 'තවත් නම් උපදින්නේ නැහැ' කියන ඒ ප්‍රාර්ථනය ඉෂ්ට කර ගන්නයි. එතකොට අද දින මෙතෙක් සමාදන් වුනු සීලයත්, ඒක උපකාර කරගෙන වැඩූ සමාධියත්, භාවනාදියත්, මේ ඇසූ ධර්මයත්, නිවනටම උපකාර වේවා! ඒවා උපකාර කරගෙන කල්‍යාණ මිත්‍ර ආශ්‍රය පිහිට කරගෙන ඉක්මණින්ම තමන්ගේ භාවනා කර්මස්ථාන මුදුන් පමුණුවාගෙන අපි සඳහන් කළ ආකාරයට ජාති ජරා ව්‍යාධි මරණ ආදී සියලු දුකින් මිදී උතුම් අමා මහ නිවනින්

සැනසීමට මේ කුසල ශක්තිය ඒකාන්තයෙන් උපනිශ්‍රය වේවා කියා ප්‍රාර්ථනා කර ගන්න. ඒවගේම අවීචියේ සිට අකනිටාව දක්වා යම්තාක් සත්ත්ව කෙනෙක් මේ විධියේ විදර්ශනාත්මක ධර්ම දේශනා, ධර්‍ම ශ්‍රවණ, අනුමෝදන් වීමට කැමති නම් ඒ අනුමෝදන් වීම තුළින් ඒ හැම කෙනෙක්ම ප්‍රාර්ථනීය බෝධියකින් උතුම් අමා මහ නිවනින් සැනසෙත්වා කියා ප්‍රාර්ථනා කරගෙන මේ ගාථා කියන්න.

එත්තාවතා ච අම්හෙහි.....

## 06

පහන් කණුව ධර්ම දේශනා අංක 152

# නමො තසස භගවතො අරහතො සමමා සමබුදධසස

**කදා නු කටෙඨ ච තිණෙ ලතා ච**
**ඛනෙධ ඉමෙහං අමිතෙ ච ධමෙම**
**අජඣතතිකානෙව ච බාහිරානි ච**
**සමං තුලෙයයං තදිදං කදා මෙ**

**-තාලපුටතෙථර ගාථා,ථෙරගාථා**

සැදැහැවත් පින්වතුනි,

සංසාරගත සත්ත්වයා තුළ මුල්බැසගෙන තියෙන ආත්ම සංඥාව දුරු කරන්න උපකාර වන ප්‍රබල කර්මස්ථානයක් හැටියට තිලෝගුරු බුදුරජාණන් වහන්සේ ධාතු මනසිකාර භාවනාව උගන්වා වදාළා. අපේ මේ ශරීරය ඇතුළතත්, පිටත පරිසරයේත්, තිබෙන්නේ පඨවි, ආපො, තේජො, වායො කියන ධාතු හතරමයි. මහාභූත ධර්ම හතරමයි. මේ කාරණය නිරන්තරයෙන්ම අපි සිහිපත් කරගැනීම තුළින් තණ්හා, මාන, දිට්ඨි, වැනි කෙලෙස් තුනී කරගන්න හැකි වෙනවා. ඒ වගේම සිත උපේක්ෂාවට ගේන්නත් පුළුවන් වෙනවා. මෙන්න මේ ධාතු- මනසිකාර භාවනාවට අදාළ චින්තනයක් අද අපි මාතෘකා කරගත්තු ගාථාවේ ඇතුළත් වෙනවා.

මේ ගාථාව දකින්න ලැබෙන්නේ ථේර ගාථා අතර තාලපුට ථෙරගාථා පන්තියේයි. තාලපුට තෙරුන් වහන්සේ පිළිබඳව පොතපතේ මේ විධියටයි ඒ කතාන්තරය දක්වෙන්නේ. උන් වහන්සේ අතීත බුද්ධ ශාසනවල නිවනට අදාළ බොහොම පින්කම් කරලා මේ බුදුරජාණන් වහන්සේගේ කාලයේ රජගහනුවර නාට්‍යකාර පවුලක උත්පත්තිය ලබලා නාට්‍ය ශිල්පය පරතෙරටම හදාරලා පන්සියයක් නාට්‍ය පිරිස සමඟ ගම්නියම්ගම් රාජධානිවල නාට්‍ය සංදර්ශන පැවැත්වූ නාට්‍ය ප්‍රධානියෙක්. ඒ කාලයේ වචනයෙන් කියනවා නම් "නටගාමණී". ගාමණී වචනය ගම් ප්‍රධානියාට පමණක් නොවේ යම්කිසි වෘත්තියක ප්‍රධානියාටත් අතීතයේ යෙදුන බව පෙනෙනවා- නටගාමණී- එතකොට නාට්‍ය ප්‍රධාන සංවිධායකයා. ඉතින් මේ තාලපුට නටගාමණී එක දවසක්දා බුදුරජාණන් වහන්සේ රජගහනුවරට වැඩම කළ වෙලාවක උන්වහන්සේ දකින්න ඇවිත් වැඳලා එකත්පසෙක හිඳගෙන බුදුරජාණන් වහන්සේට මෙහෙම ප්‍රකාශ කරනවා. "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, මට අහන්න ලැබිලා තියනවා

අපේ ආචාර්ය පරම්පරාවේ ආදි කර්තෘවරුන්ගෙන් මෙන්න මෙහෙම කතන්තරයක්. නළුවෙක් රංගපීඨයකට ඇතුල්වෙලා සත්‍යයත් අසත්‍යයත් මිශ්‍රකර නාට්‍ය ජවනිකා ආදියෙන් සත්ත්වයා - අසන්නන් දකින්නන් -හාස්‍ය රසයෙන් ප්‍රීතිමත් කළොත් ඒ නළුවා මරණින් මතු "පහාස" කියන දිව්‍ය ලෝකයේ උත්පත්තිය ලබනවා කියලා. මේ මතය ගැන භාග්‍යවතුන් වහන්සේ මොකද කියන්නේ කියලා ඇහුවා.

බුදුරජාණන් වහන්සේ කියනවා ගාමණී ඔය ප්‍රශ්නය තිබියේවා. ඔය ප්‍රශ්නය මගෙන් අහන්න එපා. නමුත් මේ තාලපුට නටගාමිණී ආයිමත් ඒ ප්‍රශ්නයම අහනවා. දෙවෙනිවරටත් බුදුරජාණන් වහන්සේ කියනවා "ගාමණී, ඔය ප්‍රශ්නය තිබියේවා". මගෙන් ඕක අහන්න එපා. තුන්වෙනි වරටත් තාලපුට අහනවා ඔය ප්‍රශ්නය. ඔන්න ඉතින් බුදුරජාණන් වහන්සේ කියනවා. 'හොඳයි ඉතින් උත්තර දෙන්නේ නෑ කියලා මට බේරෙන්න බැහැ නේ. ඔන්න එහෙම නම් මම ඒකට උත්තර දෙන්නම් කියලා බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනවා 'ගාමණී, රාගය දුරුනොකල සත්ත්වයා රාග බන්ධනයෙන් බැඳිලා ඉන්නේ. නළුවෙක් රංගපීඨයට ඇතුල්වෙලා රාගය වැඩිවෙන අන්දමේ නොයෙකුත් ජවනිකා ආදියෙන් ඒ අයගේ රාගය වැඩිකරනවා. ද්වේෂය දුරු නොකළ සත්ත්වයින් ද්වේෂබන්ධනයෙන් බැඳිලා ඉන්නේ. නළුවෙක් රංගපීඨයට වැදිලා ඒ ඒ ජවනිකා වලින් ද්වේෂය වැඩිවන ආකාරයට කටයුතු කරනවා. මෝහයෙන් මුළාවුන සත්ත්වයා මෝහ බන්ධනයෙන් බැඳිලා ඉන්නේ. මේ නළුවා රංගපීඨයට ඇවිත් මෝහය වැඩි කරන විදියට ජවනිකා පෙන්නුම් කරනවා. එතකොට තමාත් මත්වෙලා ප්‍රමාදයට වැටිලා අනිත් අයත් මත්කරලා ප්‍රමාදයට දැමීමේ හේතුවෙන් ඒ නළුවා මරණින් මතු "පහාස" කියන නිරයේ උත්පත්තිය ලබනවා කියලා බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කළා.

මේක අහලා තාලපුට නටගාමණී අඬන්න පටන් ගත්තා, කඳුළු වගුරුවන්න පටන් ගත්තා. ඔන්න ඉතින් බුදුරජාණන් වහන්සේ කියනවා ඕක නේ ගාමණී, මම කිව්වනේ ප්‍රශ්නය පැත්තකින් තියන්න කියලා' එතකොට නටගාමණී කියනවා "නෑ, භාග්‍යවතුන් වහන්සේ ඒක මට කිව්වට නෙවේ මම අඬන්නේ. මේ මගේ පූර්ව ආචාර්යයන් මෙච්චර කාලයක් මාව මේ විධියට රැවැට්ටුවා නේද කියලා ඒකයි මම අඬන්නේ" කියලා' ඔන්න බුදුරජාණන් වහන්සේ කෙරෙහි ශ්‍රද්ධාව ප්‍රකාශවෙන වාක්‍ය ඒ සූත්‍රවල දකින්න ලැබෙන හැටියට' අතිවිශිෂ්ටයි ස්වාමීනී, අතිවිශිෂ්ටයි ස්වාමීනී. යම්සේ යටිකුරු කළ දෙයක් උඩුකුරු කර දක්වන්නේ ද, වැසුනු දෙයක් විවෘත කර දක්වන්නේද මංමුළා වූ කෙනෙකුට මාර්ගය දක්වන්නේද ඇස් ඇත්තෝ රූප දකිත්වායි අඳුරේ තෙල් පන්දමක් දරන්නේද එසේම භාග්‍යවතුන් වහන්සේ මට ධර්මය දේශනා කළා. මම භාග්‍යවතුන් වහන්සේගේත් ධර්මයේත් සංඝයාගේත් සරණ යනවා. මට මේ ශාසනයේ පැවිද්දත් උපසම්පදාවත් ලැබෙනවා නම් හොඳයි'

කියලා ඔන්න තාලපුට බොහොම ශ්‍රද්ධාවෙන් පැවිද්ද ඉල්ලා හිටියා. බුදුරජාණන් වහන්සේ පැවිදි උපසම්පදා කළා. ඉතින් ධර්මයේ දක්වෙන හැටියට වැඩිකල් නොගොස්ම මේ තාලපුට තෙරුන්වහන්සේ බොහොම උත්සාහ කරලා, දැඩි උත්සාහයක් දරලා, අර්හත්භාවයට පත්වුනා.

ඔන්න රහත් වෙලා ඉවර වෙලා මේ තාලපුට තෙරුන් වහන්සේ තමන් නළුවෙක් නිසා, කලාකරුවෙක් නිසා, අපට හිතාගන්න පුළුවන් ගාථා පනස්පහක දීර්ඝ ගාථා පෙලක් තමන්ගේ ජීවිතය පිළිබඳව රචනා කළා. ඒ ගාථාවලින් දහසයකම සඳහන් වන්නේ 'කවදානම් මම මේ ශාසනයේ පැවිදි වෙලා මේ මේ විධියට වනාන්තර ගතවෙලා වන පරිසරයක දැඩිව භාවනා කරලා බුදුරජාණන් වහන්සේගේ වචනයට අනුව භාවනා කරලා රහත්වෙම්ද' කියන ඒ සංකල්පනාව. නෙක්ඛම්ම සංකල්පනා- නෙක්ඛම්ම පැතුම්, වන සෞන්දර්යයත් එක්ක මිශ්‍ර කරපු ගාථා දහසයක් තියෙනවා. ඊළඟට ඒ පණස් පහේ තව ඇතුළත් වෙනවා ගාථා විසි එකක්ම හිතට ආමන්ත්‍රණය කරලා අවවාද දෙන. එයින් අපිට හිතාගන්න පුළුවන් බුදුරජාණන් වහන්සේ අර තාලපුටට බලාපොරොත්තු වුන ආකාරයේ පිළිතුරක් නොවේ නේ දුන්නේ. නමුත් අමුතු තර්ක විතර්ක නැතිව එක පාරටම ශ්‍රද්ධාව ප්‍රකාශ කරලා පැවිද්ද ඉල්ලුවේ සමහර විට තාලපුට දීර්ඝ කාලයක් නාට්‍ය රඟපෑවට මොකද, සසර ගැන කලකිරිලා "කවදා නම් පැවිදිවෙම්ද" කියලා හිත හිතා හිටිය කෙනෙක් වෙන්න ඇති. එහෙම බොහොම කාලයක් පෙරුම් පුර පුරා හිටිය නමුත් පැවිදි වුනාට පස්සේ- මේ හිතේ ස්වභාවය කොයිතරම්ද කියතොත්- හිත අන්න දමනය කරන්න බැරි තත්ත්වයකට පත්වෙලා. නමුත් තාලපුට තෙරුන් වහන්සේ නාට්‍යාකාරයෙන්ම හිතට ආමන්ත්‍රණය කරලා- ගාථා විසිඑකක්ම තියනවා - 'එම්බා හිත, නුඹ මට මෙහෙම කිව්වා නේද? මෙහෙම කිව්වා නේද? දැන් කරන්නේ කොහොමද?' කියලා හිතට දැඩිව නිග්‍රහ කරලා තමයි අන්තිමට රහත් බවට පත්වුනේ. ඒක නිසා ඒ ගාථා පනස්පහ යෝගාවචරයින්ගෙ පමණක් නොවේ කාව්‍ය රචකයන්ගෙ පවා සිත්ගත්තු වටිනා ගාථා පන්තියක්- තාලපුට ථෙර ගාථා කියලා කියන්නේ.

ඉතින් මෙන්න මෙතනදී අපි මතුකරලා ගන්නේ අන්න අර කියාපු දහසයෙන් එකක්. අනාගත ප්‍රාර්ථනා වශයෙන් කවදානම් මම මේ ධර්ම යේ දක්වෙන, ශාසනයේ දක්වෙන, පරමාර්ථයන්ට ළංවෙම්ද කියන ඒ අදහස දක්වෙන ගාථාවකුයි.

කදානු කට්ඨේ ච තිණේ ලතා ච
ඛන්ධෙ ඉමෙහං අමිතෙ ච ධම්මෙ
අජ්ඣත්තිකානෙව ච බාහිරානි ච
සමං තුලෙය්‍යං තදිදං කදා මෙ.

කවදානම් මම ලී කැබලිත්, තණකොළත්, වැලුත්, මේ පංචස්කන්ධයත්, ඇතුළත හා පිටත ඇති මේ සියලු දේවලුත්, සමකොට කිරා බලම්ද? සම හැටියට සලකන්නෙම්ද? ඒ අවස්ථාව මට කවදා නම් ලැබෙයිද? ඒ අවස්ථාව කියන්නේ මොකක්ද? රහත්බවයි. මේ අප අවට පරිසරයේ තියෙන ධාතු හතරත්, ශරීරයේ ඇතුළත තියන ධාතු හතරත්, උපාදින්න වශයෙන් අපි මේ තණ්හාවෙන් අල්ලා ගත්තු, මව්කුසේ ඉඳල එන මේ ශරීර කූඩුවෙත් අවට පරිසරයේ තියෙන ගස් ගල් තණකොළ ආදියේත් තියෙන්නෙ පඨවි ආපො තේජො වායො කියන ධාතු හතරමයි. ඒක හරියට සම හැටියට වැටහෙන අවස්ථාව රහත් බව. 'ඒ තත්ත්වය මම කවදා නම් ලබම්ද' කියන එකයි එතකොට ඒ ගාථාවෙන් කියවෙන්නේ.

ඔන්න එතකොට එතන ඉඳලා අපි මේ මාතෘකා හැටියට ගත්තු ධාතුමනසිකාරය කියන ඒ කාරණය විග්‍රහ කරන්න බලමු.

කවුරුත් දන්නවා ඇති- මේ සතිපට්ඨාන සූත්‍රය කියවාපු පින්වතුන් -ඒ සූත්‍රයේ මේ ධාතු මනසිකාර භාවනාව ඉතාම කෙටියෙන් දක්වලා තියෙන්නේ. මේ විධියටයි සඳහන් වෙන්නේ. භාවනා කරන භික්ෂුවක්, යෝගාවචරයෙක්, යම්කිසි භික්ෂුවක් මේ ශරීරයම, මේ කයම, පිහිටි ආකාරයෙන්ම 'යථාඨිතං යථා පණිහිතං'- පිහිටි ආකාරයටම, නැත්නම් යොමුව තියන ආකාරයටම, ඒක ධාතු වශයෙන් ප්‍රත්‍යවේක්ෂා කරනව 'මෙතන තියෙන්නේ ධාතුගොඩක්' පමණයි කියන එක. කොහොමද? මෙතන තියෙන්නේ පඨවි, ආපො, තේජෝ, වායො ධාතු හතර පමණයි, මේ කයේ තියෙන්නේ කියලා එහෙම ප්‍රත්‍යවේක්ෂා කරනවා. ඒ ප්‍රත්‍යවේක්ෂාව කරලා ඒ ප්‍රත්‍යවේක්ෂා කිරීම උපමා කරන්නේ කොහොමද, 'යම්සේ ගවඝාතකයෙක් හෝ ගවඝාතක අතවැසියෙක් හෝ ගවදෙනක් මරලා කැබලි කරලා සතරමංසන්ධියක තබාගෙන- ඒ කියන්නෙ විකුණන්න තබාගෙන- ඉන්නව වගේ යෝගාවචරයා මේ තමන්ගේ ශරීරය හිතෙන් කෑලිවලට කඩලා, අර ධාතු හතරට කඩලා, ඒක මෙනෙහි කරනවා. ඔන්න ඔය උපමාවයි දක්වලා තියෙන්නේ. තමන්ගේ ශරීරය පමණක් නොවෙයි අනුන්ගේ ශරීර පිළිබඳවත් ඒ විධියට අර ගව ඝාතකයා කරන්න වගේ වැඩක් කරන්නෙයි කියලා- අර ධාතු හතරට කඩලා දාන්න කියලා කියනවා. ඊළඟට සිව්මංසන්ධිය කියන එකත් තෝරන්නේ සතර ඉරියව්ව තුළ නේ අපේ ජීවිතය පවත් වන්නේ -උපමා වශයෙන් ගත්තොත්. මේ ශරීරය සතර ඉරියව්වට යොමුවෙලයි තියෙන්නේ හැම තිස්සේම. එතකොට ඒ සතර ඉරියව්ව මැද ඉඳගෙන මේක ධාතු සතරක්- කය ධාතු හතරක්- හැටියට සලකනවා. ඒකයි මේ භාවනාව. ඒ වගේම මේක ඇතිවන නැතිවන ආකාරය සතර සතිපට්ඨානයට අනුරූපව. ඊළඟට ධාතුමනසිකාර භාවනාව විග්‍රහ කරනවා. නමුත් කෙනෙකුට ප්‍රශ්නයක් පැනනගින්න පුළුවන් ඇයි මහා කාරුණික බුදුරජාණන් වහන්සේ මේ ගවඝාතක උපමාවක් මේකට එකතු කළේ කියලා. ගවඝාතනයට

අනුබලදීමක්ද? ඒක නොවේ මේ කියලා තියෙන්නේ. ගවඝාතකයාගේ උපමාව අරගෙන තියෙන්නේ මේකටයි. මොකක්ද? මේ අපි ආදරයෙන් රැක බලාගන්න - ආත්මස්නේහය කියලා කියනවා- බුදුරජාණන් වහන්සේ කියනවා මේ අපේ ආත්ම ස්නේහය සිඳ දමන්න කියල. ආත්ම වශයෙන් ශරීරයට ලොකු වටිනාකමක් දීලා තියෙනවා නේ. අන්න ඒක කඩන්නයි බුදුරජාණන් වහන්සේ මේ තරම් ගවඝාතක උපමාවක් දුන්නේ. යම්සේ ගවඝාතකයෙක් නිර්දය ලෙස ගවදෙනක් මරලා කෑලි වලට කපලා ඒක අරම විකුණන්න තියාගන ඉන්න වෙලාවේ මොන කරුණාවක්ද? ගවදෙනකගෙ කතාවක් නෑ. එතන තියෙන්නේ මස්ගොඩක් විතරයි. 'එන්න එන්න මස් ගෙනියන්න' කියලා කියන්නා වගේ. අන්න ඒවගේ ඒ තත්ත්වයට මේ හිත ගන්නයි බුදුරජාණන් වහන්සේ ඔන්න ඔය උපමාව දීලා තියෙන්නේ. අන්න අපි එහෙම තේරුම්ගන්න ඕන. එතකොට ඒක තුළින් ඒ අර ධාතු මනසිකාරය දීර්ඝකාලයක් සංසාරයේ මේ මමය මගේය කියල ගත්තු මේ ශරීරයට තියෙන ඇල්ම දුරු කිරීමටයි.

ඉතින් ඇත්ත වශයෙන්ම මේ පින්වතුන් කලිනුත් ඔය අපේ දේශනාවලදීත් අනිත් බණවලදීත් අහල ඇති මේ ශාසනයේ පරමාර්ථය අපේ ඇතුළත තියන සක්කාය දිට්ඨිය, ආත්ම සංඥාව කෙලෙස් ආදිය දුරු කිරීම සඳහා බව. විශේෂයෙන්ම මේ ශරීරයට තියන ඇල්ම දුරු කළ යුතු බවයි. ඒකට පිළිකුල් භාවනාවේදී ශරීරය පිළිකුල් හැටියට සලකනවා. මෙතනදී ඒක උපේක්ෂාවට ගේනවා. අරක තුළින් පිළිකුල වෙනුවට මෙතන මේ අර ධාතු හැටියට සලකන කොට සිත උපේක්ෂාවට එනවා. අර ගවඝාතකයාට ඉතින් ගවදෙන ගැන කථාවක් නැහැ නේ. එතෙන්දි මස් ගොඩක් විතරයි. අන්න ඒ වගේ මේ ශරීරයත් ධාතු හතර විතරෙයි කියන ඒ සිතුවිල්ලටයි බුදුරජාණන් වහන්සේ යොමු කරන්නේ. ඉතින් ඔන්න ඒ කාරණයයි ධාතුමනසිකාරය. ඔය කෙටියෙන් දක්වුවත් ඒක උනත් කෙනෙකුට ප්‍රමාණවත් ධාතු මනසිකාර භාවනාව මොකක්ද කියල තේරුම් ගැනීමට.

ඉතින් මේක ප්‍රායෝගික වශයෙන් යෝගාවචර සංඝයා වහන්සේලාත් කළයුතු බව දක්වන කොටසක් සංඝයා වහන්සේලාගේ ජීවන ප්‍රවෘත්තිය සම්බන්ධයෙන් සඳහන් වෙනවා. සංඝයා වහන්සේලා නිරන්තරයෙන් පරිහරණය කරන සිවුපසය පාවිච්චි කිරීමේදී ප්‍රත්‍යවේක්ෂා කළයුතු බව බුදුරජාණන් වහන්සේ වදාරලා තියෙනවා. ඒ ප්‍රත්‍යවේක්ෂාවේ එක කොටසක් තමයි ධාතු වශයෙනුත් පිළිකුල් වශයෙනුත් මෙනෙහි කිරීම. ඉතින් ඒකත් මේ විධියටයි යන්නේ- අපි හිතමු චීවර- චීවර, පිණ්ඩපාත, සේනාසන, ගිලානප්‍රත්‍යය කියන සිව්පසයයි සංඝයා වහන්සේලා පරිහරණය කරන්නේ, පාවිච්චි කරන්නේ සිවුර, චීවරය, ගැන කියනවා නම් මේ විධියට සඳහන් වෙනවා. ඒ භික්ෂූන් වහන්සේ විසින් සිවුර පරිහරණය කරන අවස්ථාවේ මෙසේ ප්‍රත්‍යවේක්ෂා කළයුතුයි. කොයි විදියටද? මේ හේතු ප්‍රත්‍ය අනුව පවතින ධාතු කොටසක්

පමණයි මේ සිවුර කියලා කියන්නේ. කොයි කොයි විධියට මේකට රටේ වටිනාකම් දීලා තිබුණාට මේ සිවුර කියන එකත් ධාතු හතරක් විතරයි. පඨවි, අපො, තේජො, වායො. ඊළඟට මේ සිවුර වැළඳගන්න ශරීරයත් ඒත් ධාතු හතරත් පමණයි. ඔන්න ඊළඟට සම කිරිල්ල- කිරා බැලිල්ල. ඊළඟට කියනවා මේවා අතරත් මේ පිළිකුල් නොවූ චීවරය මේ කුණුකයට සම්බන්ධ වෙලා අතිශය පිළිකුල් බවට පත්වෙනවා කියලා. අර සිවුරටත් වැඩිය මේ ශරීරය කිලිටිය කියන ඒ සිතිවිල්ලට දානවා. අන්න එතකොට පිළිකුල් වශයෙන්. ධාතුමනසිකාරයත් පටික්කූල මනසිකාරයත් දෙකම තිබෙනවා සංඝයා වහන්සේලාගේ චීවර ප්‍රත්‍යවේක්ෂාවේ.

ඒ විධියටමයි පිණ්ඩපාත ප්‍රත්‍යවේක්ෂාව. අනිත් ඒවා හිතාගන්න පුළුවන්. පිණ්ඩපාතය ගැන කිව්වොත්, එතකොට එතනදි ආහාර වැළදීමට කලින් ප්‍රත්‍යවේක්ෂා කරන්න, නුවණින් සලකා බලන්න, කියලා ප්‍රකාශ කරලා තියනවා. මේ පිණ්ඩපාතය කියලා කියන්නේ - කොයි කොයි ආකාරයේ රස ආහාර ආදිය තිබුණත්- මෙතන තියෙන්නෙ තනිකර ධාතු ගොඩක් පමණයි. පඨවි, ආපො, තේජො, වායො. රස තෘෂ්ණාව නැතිකර ගැනීමට ක්‍රමයක් හැටියට හිත උපේක්ෂාවට ගැනීමට. මේ ශරීරයත් ඒ වගේම ධාතු ගොඩක් පමණයි. නමුත් ආහාරය පිරිසිදුව තිබිලා මේ කුණුකයට ඇතුල්වුන හැටියේ අතිශයින්ම පිළිකුල් ස්වභාවයට පත්වෙනවා.

අන්න ඒ ආකාරයෙන් මේ පින්වතුන්ට සලකා ගන්න පුළුවන් සේනාසනය තමන් පාවිච්චි කරන සේනාසනය පිළිබඳවත් එසේම සැළකිය යුතු බව.

ගිලන්පස බෙහෙත් පිළිබඳවත් එසේ සැලකිය යුතු බව බුදුරජාණන් වහන්සේ දක්වලා තියෙනවා.

ඔන්න එතකොට ඒ ක්‍රියාත්මක වශයෙන්, ප්‍රායෝගික වශයෙන්, ධාතුමනසිකාරය උපකාර කරගන්නා ආකාරය. සංඝයා වහන්සේලාට, නිවන් බලාපොරොත්තු වන යෝගාවචරයන්ට, ඒක උපකාර වෙනවා.

ඊළඟට මේ ධාතුමනසිකාර භාවනාව පිළිබඳ සැහෙන විස්තරයක්, තවතවත් දෘෂ්ටිකෝණ වලින් මතුවෙන ඒව, අපට දක්වන්න පුළුවන්. මහා රාහුලොවාද සූත්‍රය කියලා කියන්නේ බුදුරජාණන් වහන්සේ රාහුල පොඩිහාමුදුරුවන්ට- තමන්ගේම පුත්‍රයා නේ - බොහොම අවස්ථාවලදී සූත්‍ර රාශියක මේ පොඩි හාමුදුරුවන්ට ධර්ම මාර්ගයට, නිවන් මාර්ගයට එළඹීමට, පියවරෙන් පියවරට ඉදිරියට ගෙනගියා. ඒ එක අවස්ථාවක මහාරාහුලෝවාද සූත්‍රයේදී මෙන්න මේ ධාතු කර්මස්ථානයත් ඉදිරිපත් කරනවා. ඉස්සරවෙලාම කියනවා අර ඇතුළතත් පිටතත් පිළිබඳ කතාන්තරය. අජ්ඣත්තික, බාහිර කියන එක. ඔන්න බුදුරජාණන් වහන්සේ මේ විදියටයි ප්‍රකාශ කරන්නේ.

"රාහුල පඨවි ධාතුව කියන එක ආධ්‍යාත්මික වෙන්නත් පුළුවන් බාහිර වෙන්නත් පුළුවන්". ආධ්‍යාත්මික කියල කියන්නේ මේක ඇතුළත තියන පඨවි ධාතුව වෙන්නත් පුළුවන්, පඨවි ධාතුව කියල කිව්වම, බාහිර පිටත පඨවි ධාතුව වෙන්නත් පුළුවන්. ඊළඟට මොකක්ද මේ ආධ්‍යාත්මික පඨවි ධාතුව කියන්නේ. ඒක විග්‍රහ කරල දෙනවා. ඒ කියන්නේ මේ පින්වතුන් බොහෝ දෙනා දන්නවා දෙතිස්කුණපප කොට්ඨාශයන්. ඒ කුණපප කොට්ඨාශ තිස්දෙක අතුරින්- මෙතන පොඩි වෙනසක් තියනවා. සූත්‍රාගත ක්‍රමයට තිස්දෙක නොවේ තිස්එකයි තියෙන්නේ. පසු කාලයේ 'මත්ථලුඞ්ගං' කියල කියන හිස්මොලයත් ඒකට එකතු කරලා තියනවා. ඒ වගේම බුදුරජාණන් වහන්සේ ඇත්ත වශයෙන් සූත්‍රයේ ඉඩ තියලා තියනවා තවත් ඒ විධියේ දේවල් තියෙන්න පුළුවන් කියලා. ඉතින් ඒකෙ දෝෂයක් අපට පේන්නෙ නැහැ. ඒ තිස්දෙකක් හැටියට අපි ගත්තොත් දැන් ව්‍යවහාරයේ හැටියට, එයින් විස්සක්ම පඨවිධාතුව හැටියට. විස්ස හැදෙන්නේ කොහොමද අර කෙසා, ලොමා, ආදී වශයෙන් එතනින් පටන්ගෙන කරීස කියල කියන මේ ශරීරයේ තියෙන මල-අශුචි-එතනට වෙනකන් දහනවයක් වෙනවා. ඒකට එකතුකරනවා මේ කාලයේ අගටම දමන මත්ථලුඞ්ගං හිස් මොළය ඒ ටික තමයි නියෝජනය කරන්නේ පඨවි ධාතුව. මේ ශරීරය තුළින් පඨවිධාතුව නියෝජනය කරන නියෝජිතයන් විසිදෙනා තමයි ඒ. ඉතින් ඔන්න එතකොට ආධ්‍යාත්මික පඨවි ධාතුව ඒකයි. බාහිර පඨවිධාතුව ගැන අමුතුවෙන් කියල නැහැ. වටපිට බලනකොට ඔය ගස්කොළන්වල හැම එකේම තියන පඨවි ධාතුව සලකාගන්න පුළුවන්.

එතකොට අනිත් වැදගත් දේ තමයි' රාහුල යම් ආධ්‍යාත්මික පඨවි ධාතුවක් වේද, යම් බාහිර පඨවි ධාතුවක් වේද ඒක තනිකර පඨවිධාතුව මැයි'. හුදු පඨවි ධාතුව මැයි. අන්න එහෙම සලකලා ඊළඟට දක්වනවා භාවනාව හැටියට අනාත්ම දර්ශනය දක්වා යොමු කරන්නේ කොහොමද? 'න එතං මම, න එසො හමස්මි, න මෙසො අත්තා'. දැන් ලෝකයේ ස්වභාවය 'එතං මම'- 'මෙය මගේය මෙය මම වෙමි. මෙය මගේ ආත්මයයි'. යමක් අයිති කරගත්තු හැටියේ ඔක තමයි අර සීල් එක වගේ ගහන්නේ. මේක මගේය, මෙය මම වෙමි, මෙය මගේ ආත්මයයි. අන්න ඒකට විරුද්ධව 'න' යන්නක් ඉස්සරහට දානවා. මේක ප්‍රායෝගික වශයෙන් තේරුම් ගතයුතු පාඨයක්- 'න එතං මම' එතකොට රාහුල හාමුදුරුවන්ට කියනවා මේක දිහා අර පුරුදු ආකාරයට 'එතං මම, එසො හමස්මි, එසො මෙ අත්තා' කියලා නෙවෙයි හිතන්න තියෙන්නේ මේ ශරීරය ගැන. 'මෙය මගේ නොවේ. මෙය මම නොවෙමි. මෙය මගේ ආත්මය නොවේ'. අන්න එහෙම සලකන්න කියලා ඇතුළත පිටත දෙකම සම හැටියට. ඉතින් ඔය විධියටම අනෙක් ඒවාත් කෙටියෙන් සලකා ගන්න, අවස්ථාවේ හැටියට. එසේ මෙනෙහි කිරීමේ ක්‍රමය වැරදි කෘත්‍රිම ක්‍රමයක් නොවන බව බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරලා

තියෙන්නේ කොහොමද-'එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දට්ඨබ්බං' ඇත්ත ඇති සැටියට සම්‍යක් ප්‍රඥාවෙන් නියම නුවණින් මේ විධියට සැලකිය යුතුයි. 'මෙය මගේ නොවේ මේ මම නොවෙමි මේ මගේ ආත්මය නොවේ' කියල. එසේ සැලකීමේ ආනිශංස දක්වනවා. ඒ විධියට සැලකීම තුළින් ඊළඟට කරන්නේ මොකක්ද පඨවි ධාතුව ගැන කලකිරෙනවා -නිබ්බිදා- කලකිරෙනවා. කලකිරීම තුළින් විරාගය නොඇල්ම, විරාගය තුළින් විමුක්තිය, නිවන. කොටින්ම මෙතන කියනවා. 'පඨවි ධාතුයා චිත්තං විරාජෙති' ඇල්ම ඉවත් කරනවා. සිත ඒකෙන් හෝදලා අරිනවා වගේ. ඔන්න එතකොට ඒ විධියටම හිතාගන්න.

ආපො ධාතුව ගැනත් බුදුරජාණන් වහන්සේ විග්‍රහ කරනවා. ආපො ධාතුව කියල කිව්වාම දෙයාකාරයි. ආධ්‍යාත්මික වෙන්නත් පුළුවන් බාහිර වෙන්නත් පුළුවන්. ආධ්‍යාත්මික අපෝ ධාතුව නම් අර තිස් දෙකෙන් ඉතිරි දහය 'පිත්තං, සෙම්හං' ආදියෙන් ගිහිල්ලා 'මුත්තං' දක්වා වන ඒ අර දියාරු ස්වභාවය. දන් අර ඉස්සර වෙලා කියන්නේ- අර පඨවි ධාතුව කියල කියන්නේ- ඒ ස්වරූපය අනුව කර්කශ, රළු, ගොරහැඩි ස්වභාවය තියන දේවල් පඨවි ධාතුව නමින් හඳුන්වනවා. අර දියාරු ස්වභාවය- ආපොගතං- ජල ස්වභාවය ඇති ඒවා ආපො ධාතුව. ඒකත් ආධ්‍යාත්මික බාහිර වශයෙන් දක්වනවා. බාහිර ලෝකයේ තියන ආපො ධාතුව ගැන අමුතුවෙන් කියන්න දෙයක් නැහැ. මේ දෙකම එකයි. ආධ්‍යාත්මික හෝ වේවා බාහිර හෝ වේවා මේක හුදු ආපො ධාතුවමයි. ඊළඟට මේක මගේ නොවේ මම නොවෙමි. මගේ ආත්මය නොවේ කියල ඒ විධියටම ආපො ධාතුව පිළිබඳව.

ඊළඟට තේජො ධාතුව පිළිබඳව දක්වන්නේ ඒකත් කොටස් හතරක් හැටියට දක්වනවා. ශරීරයේ ආධ්‍යාත්මික වශයෙන් තියන තේජෝ ධාතුව අර උෂ්ණ ස්වභාවය. ඒක දක්වනවා යම්තාක් තැවීමක් ඇතිවෙනවා නම්, යමකින් ශරීරයේ දිරීම් ඇතිවෙනවා නම්, යමකින් ශරීරයේ දැවීම් ඇතිවෙනවා නම්, යම් තේජො ධාතුවක් නිසා ශරීරයට ඇතුල්වන ආහාර පැසවනවා නම්, අන්න ඒ සතර ආකාරයේ ශරීරයේ තැවීම්, දිරීම්, දැවීම්, ශරීරයේ පැසවීම්, ශරීරයේ දිරවීම් කියලා කියනවා. ඒ කටයුතු කරන තේජො ධාතුව හතර ආකාර වශයෙන් දක්වනවා ඒක ආධ්‍යාත්මික තේජො ධාතුවයි. බාහිර තේජො ධාතුව පහසුවෙන් සලකාගන්න පුළුවන්. ඔය විධියට ඒකත් අර වගේ මෙය මගේ නොවෙයි ආදි වශයෙන් හිතනවා.

ඒ පඨවි, ආපො, තේජො. ඔන්න ඊළඟට වායො ධාතුව. වායො ධාතුව හය ආකාරයකින් දක්වනවා. ශරීරගත වායු ස්වරූපය, වාත ස්වරූපය ඇති දේවල්. ඒක දක්වනවා 'උද්ධංගමා වාතා' උඩහට එන වාත. ඔය උගුරට එනකොට, ඉක්කාව එනකොට, ශරීරයේ උඩහට එන වාතය උද්ධංගම වාතය. 'අධොගමා වාතා' මළපහ කිරීම සඳහා උපකාර වන වාතය. ඊළඟට කුච්ඡිසයා

වාතා' කුස තුළ තිබෙන වායුව. ඒ කියන්නේ බඩවැල් වලින් පිටත තියන වායුවත්,කොට්ඨසයා වාතා ඇතුළත තියන වායුවත්. ඊළඟට 'අංගමංගානුසාරිනො වාතා' ඒ වගේම අඟපසඟ තුළ දුවන වාත. නහරවල් ඔස්සේ, අපේ ශරීරය අතපය දිගු කිරීම් ආදියට උපකාර වන වායොධාතුව. ඊළඟට හයවෙනුව දක්වන්නේ 'අස්සාස පස්සාසා' ආශ්වාස ප්‍රශ්වාස. ඒක තේරුම් ගන්න පුළුවන් නේ. එතකොට හය ආකාරයකින් වායොධාතුව දක්වනවා. ඒ ආධ්‍යාත්මික වායො ධාතුව බාහිර වායො ධාතුව- ඒක පහසුයි හිතා ගන්න.

ඒවා පිළිබඳවත් අන්තිමට ප්‍රධාන කාරණය මේ ශරීරයේ තියෙන්නේ මේ ධාතු හතර පමණයි කියලා ඒවා පිළිබඳ මමත්වය, ආත්මසංඥාව දුරුකරන්නයි අර උපමාව දුන්නේ.

ඊළඟට තවදුරටත් බුදුරජාණන් වහන්සේ දක්වනවා රාහුල හාමුදුරුවන්ට මේ සංකල්පනා තුළින් හිත උපේක්ෂාවට ගෙන එන ආකාරය. "රාහුල පඨවිසමං භාවනං භාවෙහි," පඨවිසම භාවනාව කියන්නේ තමන් පෘථිවියට සමකරලා හිතන්න. එහෙම හිතීමේ ආනිසංසය මොකක්ද? අර මනාප අමනාප ස්පර්ශ පැමිණි අවස්ථාවේ ඒවට හිත නතු වන්නේ නැහැ. ඒවාට හිත යටවෙන්නේ නැහැ කියන එකයි. ඒක දක්වන්නේ, බුදුරජාණන් වහන්සේ විග්‍රහ කරන්නේ, මෙහෙමයි. ''මෙහෙම හිතන්න රාහුල. පොළවෙහි වටිනා දේත් දානවා'' අපිරිසිදු මළමූත්‍රා කෙළ සෙම් සොටු ආදියත් දානවා. ඒවා තුළින් පොළව කිසිම වෙනසක් දක්වන්නේ නැහැ. උපේක්ෂාවෙන් පොළව ඒක දරාගෙන ඉන්නවා. ඒ චින්තනය අරගෙන- 'පඨවිසමං' කියල කියන්නේ තමන් පොළව වගෙයි කියා හිතා ගන්නවා. එහෙම හිතාගෙන මනාප අමනාප දෙකට යටවෙන්නේ නැතිව හිත උපේක්ෂාවට දාගන්න ක්‍රමයක් හැටියට දක්වලා තියෙනවා. ඒ ක්‍රමය මේ පින්වතුන් කලිනුත් අහලා ඇති සාරිපුත්ත ස්වාමීන් වහන්සේ උග්‍රවිධියට මේක රැක්ක බව ඒ සාරිපුත්ත ස්වාමීන් වහන්සේ පිළිබඳ කතාන්තරවල සඳහන් වෙනවා. ඉතින් රාහුල පොඩි හාමුදුරුවන්ටත් ඒ ක්‍රමයයි බුදුරජාණන් වහන්සේ දැක්වූයේ.

එතකොට ඒ වගේම 'ආපොසමං භාවනං භාවෙහි' ඒ වගේම රාහුල හිතන්න තමන් ජලයට සමාන කරලා තමන්ගේ ශරීරයේ තියෙන ආපො ධාතුව ගැන හිතලා. ඊළඟට බාහිර ලෝකයේ තියන වතුරට පිරිසිදු දේ දැම්මත් අපිරිසිදු දේ දැම්මත් වතුර ඒ ගැන අමනාපයක් දක්වන්නේ නැහැ. වෙනසක් දක්වන්නේ නැහැ. අන්න ඒ විධියට හිත සකස්කර ගන්න. මනාප අමනාප ස්පර්ශ ආවාම. ඒ විධියටම පඨවි ආපො තේජො වායො ඒ හතර. ඊළඟට අමුතු එකක් දක්වනවා. ආකාශ ධාතුව පිළිබඳවත් එතන සඳහන් වෙනවා.

ආකාශ ධාතුව ගැන කියන්න තියෙන්නේ ඇත්ත වශයෙන් අපි කියන්නේ කය සකස් වෙලා තියෙන්නේ ධාතු හතරකින් කියලා. ඔන්න

ආකාශ ධාතුව බුදුරජාණන් වහන්සේ විග්‍රහ කරන්නේ දැන් ඔය ශරීරයේ තිබෙන සිදුරු - කන් නාසා ආදියේ ඒ වගේම ශරීරයේ කුස තුළ බඩවැල් ආදියේ- තියෙන සිදුරු තමයි ආකාශය. ශරීරය තුළ තිබෙන සිදුරු ආකාශ ධාතුවට නිදර්ශන හැටියට. බාහිර ආකාශ ධාතුවත් අපට සලකා ගන්න පුළුවන්. බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනවා ආකාශ ධාතුව කොතනකවත් පිහිටලා නැහැ. එතකොට ඒ වගේ තමනුත් ආකාශය හැටියට හිතන්න. එහෙම හිතලා අර මනාප අමනාප ස්පර්ශ නිසා ඇතිවන්න පුළුවන් චිත්ත පීඩා ආදියෙන් හිත මුදාගන්න කියන එකයි එතනින් දක්වන්නේ. ඔන්න ඔය විධියට ඒ රාහුල හාමුදුරුවන්ට අර ධාතු කර්මස්ථානය වඩා පුළුල් අන්දමින් මේ ශරීරයේ තියෙන ධාතු හතර පමණක් නොවේ ධාතු හතර නිසා ශරීරයේ ඇතිවන සිදුරු- ඒ ටිකත් අල්ලල ඒ විධියට එතන මහා රාහුලොවාද සූත්‍රයේ විග්‍රහ කර වදාළා.

ඊළඟට ඔන්න තවත් පියවරක් ඉදිරියට යනකොට අපට හමුවෙනවා අන්න අර කියාපු සාරිපුත්ත මහරහතන් වහන්සේ මහා හත්ථිපදෝපම සූත්‍රයේ ඒ ධාතුන් පිළිබඳව ඒත් ගැඹුරු විග්‍රහයක් කරනවා. අර මුලින් කියාපු ඒවා සිහිපත් කර ගැනීමෙන් ඒ ධාතු විග්‍රහය ඉක්මණින් තේරුම් ගැනීමට පුළුවන් වෙනවා. තමන්ගේ පිරිවර, ඒ අවස්ථාවේ සවන්දුන්න සංඝයා වහන්සේලා, අමතලා 'ඇවැත්නි,' කියලා ඒ ධාතු මනසිකාර ක්‍රමය සංඝයා වහන්සේලාට පහදලා දෙනවා සාරිපුත්ත මහ රහතන් වහන්සේ. අර කිව්ව විධියටම ආධ්‍යාත්මික පඨවි ධාතුව මොකක්ද ඊළඟට බාහිර පඨවි ධාතුව මොකක්ද කියලා පෙන්නුම් කරලා ඒවා පිළිබඳව 'මෙය මගේ නොවේ මෙය මම නොවෙමි මෙය මගේ ආත්මය නොවේ' කියලා එහෙම වැඩිය යුතු බව. එතකොට ඒ ධාතු මනසිකාර ක්‍රමය සාරිපුත්ත මහරහතන් වහන්සේ එතන විශේෂ වශයෙන් කියන ටික අපි මතු කරලා ගත්තොත් ඔන්න තවත් කොටසත් දක්වනවා. අවසානයේදී සාරිපුත්ත මහරහතන් වහන්සේ මේ ආධ්‍යාත්මික පඨවි ධාතුවත්, බාහිර පඨවි ධාතුවත් අතර වෙනස දක්වල අනිත්‍යතාව- අනිත්‍යතා දර්ශනය මතුකරනවා ඒ තුළින්. ඒකෙන් ඉස්සෙල්ල පෙන්නුම් කරන්නේ ආපො ධාතුව. බාහිර ආපො ධාතුව පිළිබඳ මෙන්න මෙහෙම කාරණයක් සාරිපුත්ත මහරහතන් වහන්සේ පෙන්නුම් කරනවා. ඇතැම් කාලපරිච්ඡේද තියෙනවා ආපොධාතුව කිපෙනවා. ලෝකයේ තියෙන ආපො ධාතුව කිපෙනවා ඒ කිපීම පිළිබඳ සංකල්පය මේ පින්වතුන් දන්නවා නේ සුනාමියෙන් පස්සෙ. ආපො ධාතුව කිපුනාම, කොයි තරම්ද කියතොත් පඨවි ධාතුව යට යනවා. ඒ කියන්නේ මහාද්වීප පවා යට යනවා, ආපො ධාතුව කිපුනාම. එතකොට සාරිපුත්ත මහරහතන් වහන්සේ ප්‍රකාශ කරනවා අර තරම් විශාල පඨවි ධාතුව පවා අවස්ථානුකූලව ආපොධාතුවට යටවෙලා අනිත්‍යවෙනවා. ඒක නැතිවෙලා යනවා. අනිත්‍යයි කියල ප්‍රකාශ කරලා

ඊළඟට කියනවා 'කිම්පනිමස්ස මත්තට්ඨකස්ස කායස්ස' එහෙම නම්, ඒ තරම් විශාල පඨවි ධාතුව එහෙම නම්, මේ පුංචි ශරීරය තුළ තියෙන පඨවි ධාතුව ගැන කියනුම කවරේද කියලා. එයින් පෙන්නුම් කරන්නේ, එයින් හිතට දාන්නේ, අර තරම් විශාල පඨවි ධාතුවත් එහෙම වෙනවා නම්, ඒකටත් අනිත්‍යතා ධර්මය බලපවත්වනවා නම්, මේ ශරීරයේ තිබෙන පඨවි කොටස් ගැන අමුතුවෙන් කිව යුතුද? කියලා එහෙම ඒක තුච්ඡ කරලා දක්වනවා.

**ඇල්ම නැතිකරන්න, ආත්ම ස්නේහය නැති කරන්න.**

ඒ විදියටම ඊළඟට දක්වනව ආපො ධාතුව පිළිබඳවත්. ආපො ධාතුව ආධ්‍යාත්මික බාහිර වශයෙන් දක්වලා බාහිර ආපො ධාතුවෙ පවා අනිත්‍යතාව දක්වන්නේ මෙහෙමයි. බාහිර ආපො ධාතුව කිපිලා ගියාට මොකද අන්තිමට දක්වනවා මේ ආපො ධාතුවේ අනිත්‍යතාව. ඒ බලසම්පන්නකමයි අර පෙන්නුවේ. අනිත්‍යතාව දක්වන කොට අර කල්ප විනාශය ගැන විස්තර- බුදුරජාණන් වහන්සේ දක්වන විස්තර වලට සමාන විදියෙන් දක්වන්නේ. මේ මහා සාගරයේ ජලය, යොදුන් ගණන් ගැඹුරු ජලය, ක්‍රමක්‍රමයෙන්, ක්‍රමක්‍රමයෙන් අර සූර්යයා නිසා සත්තසූරියුග්ගමන සූත්‍රය ආදියේ දක්වෙන ආකාරයට ඒවා හිඳිලා හිඳිලා ගිහිල්ලා අන්තිමට මනුෂ්‍යයකුගේ ප්‍රමාණයට, ඊළඟට ඉහටිය ප්‍රමාණයට, දණ ප්‍රමාණයට, බැහැල බැහැලා අන්තිමට ඇඟිලි පුරුකක් තෙමන්න තරම්වත් වතුර මහා සාගරයේ නැතිව යනවා. ඒ තරම් විශාල ආපො ධාතුව පවා මෙහෙම අනිත්‍යතාවට භාජනය වෙනවාය. ක්ෂය වෙල යනවාය, වෙනස් වෙනවාය. මේ ශරීරය තුළ කියන ආපො ධාතුව ගැන කවර කථාද? අන්න ඒ චින්තනයයි එතන දක්වන්නේ.

ඒ වගේම ඔන්න තේජෝ ධාතුව ගැන ප්‍රකාශ කරනවා. මේ තේජෝ ධාතුවත්- ශරීරයේ තියෙන තේජෝධාතුව ගැන කලින් කිව්වා නේ? බාහිර තේජෝධාතුව. ඇතැම් කාලයක ඒ බාහිර තේජෝ ධාතුව කුපිත වෙලා ගම් නියම් ගම් දවමින් යනවා. දවමින් ගිහිල්ලා එක්කෝ මහා පර්වතයක් ළඟට ඇවිල්ලා නතරවෙනවා. නැත්නම් ජලාශයක් ළඟට ඇවිල්ලා ඒ ගින්න නිවිලා යනවා. ඒ කිපුන වෙලාවේ කරන හපන්කම්. නමුත් ඒ එක්කම ඊළඟට ප්‍රකාශ කරනවා අන්තිමට සමහර කාල තිබෙනවා ගින්නක් දල්වා ගන්න- ඒ කාලේ තිබුන ක්‍රමයි දක්වන්නේ- කුකුළු පිහාටුවක් කිට්ටු කරලා යම්තම් ගින්නක් දල්වා ගන්න අවස්ථා තියනවා. ඒ තරමට ගිනි දුර්ලභ අවස්ථාවක්. අර සුලභ අවස්ථා ඉස්සෙල්ල දක්වූයේ. අන්න ඒකෙන් පෙන්නුම් කරන්නේ අර තරම් විශාල තේජො ධාතුව පවා සමහර විට කුකුළු පිහාටිටෙන් යන්තම් මතුකර ගන්න පුළුවන් තත්ත්වයට පත්වෙනවා. අන්න ඒ තරමට බාහිර තේජො ධාතුව අනිත්‍යයි. වෙනස්වන සුළුයි. එහෙම නම් මේ ශරීරයේ තේජො ධාතුව ගැන කවර කථාද?

ඔන්න ඊළඟට වායො ධාතුව. වායො ධාතුව ගැන ප්‍රකාශ කරන්නේ ඒ වායො ධාතුව කිපිලා මහා කුණාටුවලින් ගම්නියම්ගම් විනාශ වෙලා යනවා. ඒ කිපුන අවස්ථාව. නමුත් ඒකම ඊළඟට දක්වනවා ග්‍රීෂ්ම ඍතුවේ අවසාන මාසයේ සුළං පොදක්වත් නැහැ. එතකොට තල්වැට - තල්වැට කියන එක දන්නවා නේ. මේ අපේ පවන් අත්ත. පවන් අත්තෙන් හුළං හොයන්න වෙනවා. එහෙම නැත්නම් වහලේ තියන පිදුරුත් මහ කරදරයක් හැටියට දැනෙනව. ඒ තරමටම හුළං නැති වෙලා යනවා. ඒ තරමට අනිත්‍යතාව බාහිර වායො ධාතුවේ. ශරීරයේ තියෙන වායො ධාතුව ගැන කවර කථාද?

ඔන්න ඔය විධියට ඒ ධාතු හතර ගැන සාරිපුත්ත මහරහතන් වහන්සේ අනිත්‍යතා ශීෂියෙන් ශරීරය ගැන කලකිරෙන්න සලස්වනවා. ඒ චින්තනය තුළ ප්‍රධාන කාරණය අපි හිතන්න ඕන. අර ලෝකචින්තා හැටියට ලෝකෙ තියෙන ඒවා ඔස්සේ නොවේ. නිදර්ශනයක් හැටියට ගන්න තියෙන්නේ මේ අපේ ශරීරය. දෙතැනම තියෙන්නේ එකම ධාතු වර්ග තමයි. නමුත් ශාරිපුත්‍ර මහරහතන් වහන්සේ විශේෂ වචන දෙකක් දක්වනවා. 'උපාදින්න අනුපාදින්න'.තණ්හුපාදින්න කියන වචනය දක්වනවා. ඔන්න මෙතනදි අපි මතුකර ගනිමු මේ වචන දෙකේ වැදගත්කම. මේක විදර්ශනාවට උපකාරවන දෙයක්. දැන් අපි කීවා නේ මේ පඨවි ආපො තේජො වායො කියන ඒවා ඇතුළත පිටත කියලා දෙකක් තියනවා කියලා. මේ ඇතුළත තියන කොටස ධර්මයේ හඳුන්වන්නේ උපාදින්න කියලා. උපාදින්න කියල කියන්නේ **'තණ්හුපාදින්න'** තණ්හාවෙන් අල්ලා ගත්ත. අපේ පසුගිය ජීවිතයේදී අවසාන මොහොතේදී ඒ අපේ තණ්හාව සන්සිඳී නැතිනිසා අපි තණ්හාවෙන් අල්ලගත්තා මේ ධාතු හතර- පඨවි ආපො තේජො වායො. අර අවිද්‍යාව නිසා ධාතු හතර තදින් අල්ලා ගත්තා. ඒ ග්‍රහණය තමයි මව්කුසේ ගර්භයක් හැටියට මතුවෙලා අර තරම් දුක් වේදනා මධ්‍යයේ දසමාසයක් රැකිලා එළියට ඇවිල්ලා ඊළඟට මෙන්න මේ තණ්හුපාදින්න කියන මේ අපි තණ්හාවෙන් අල්ල ගත්තු මේ ශරීරය පෝෂණය කරන්න තමයි අපි මේ ලෝකයේ තියන තරම් රස දේවල් සොයමින්,එහෙම නැත්නම් හොර මැරකම් කරමින් මේ ශරීරකූඩුව රැක ගන්නෙ. මොකද අර කියාපු තණ්හාවෙන් අල්ලගත්තු නිසා. එතකොට ඒ තණ්හුපාදින්න. **මේක පොඩි නමුත් අපට ලොකුයි.** එතකොට ඒ දෙන වටිනාකම් බිඳින්නයි මේ බණ කියලා තියෙන්නේ බුදුරජාණන් වහන්සේත් ශාරිපුත්‍රරහතන් වහන්සේත් මේ තණ්හාවෙන් අල්ලගත්තු එක ගැන.

එතකොට ඒ උපාදින්න. බාහිරව තියන එක අනුපාදින්න. ඒක අනුපාදින්න- උපාදින්න නොවන එක. එතකොට අනුපාදින්න එකට අපි වැඩිය වැදගත්කමක් දෙන්නේ නැහැ. අපි ඔය අත හරි පය හරි ගලක වැදුනාම ගලට මොකද වුනේ කියල බලන්නේ නැහැ නේ. අපේ ශරීරය අතගානවා. එහෙම නැත්නම් බෙහෙත් තෙල් ගානවා. ගලට මොනව වුනත්

කමක් නැහැ. අන්න උපාදින්නයටයි, තණ්හාවෙන් අල්ලාගත්තු මේ ශරීරයටයි අපි තැන දෙන්නේ. ඒක තුළයි මේ ඔක්කොම සත්ත්ව ආත්ම සංඥා කෙලෙස් ඔක්කොම. ඒක රැකගන්නයි තණ්හා, මාන, දිට්ඨි ආදී කෙලෙස් වඩන්නේ, පව්කම් කරන්නේ, මේ ඔක්කෝම කරන්නේ. එතකොට ඒ ටික බිඳලයි අපි සසරින් මිදෙන්න ඕන. ඉතින් එතන දක්වනවා මේවා හිතෙන් - 'විරාජෙති' කියල කියනවා. ඇත්ත වශයෙන් කියනවා නම් හිතේ ඇදිලා තියෙනවා පඨවි, ආපො, තේජො, වායො කියන ධාතුස්වරූප. ඒවා මකලා දමන්න වෙනවා. ඒවා ඇදිලා තියෙන්නේ ඒවාට තියෙන ඇල්ම, රාගය නිසා. ඒ ඇදිච්ච එක විරාගය තුළින්, නොඇල්ම තුළින්, මකා හරින්න වෙනවා. ඒක සම්පූර්ණ වන අවස්ථාව තමයි ප්‍රඥාව, එතකොට ඒ ධාතු හතරින් මිදුනු අවස්ථාව, ධාතු හතරින් මිදුනු විඤ්ඤාණයයි. ඒකයි ඉලක්කය. ඒ කරා යන මාර්ගයයි මේ. ඔන්න එතකොට ශාරිපුත්‍ර මහරහතන් වහන්සේගේ දේශනාව තුළිනුත් අපට අර ධාතුමනසිකාරයේ ගැඹුරු පැත්තක් හෙළිවෙනවා. මේ හැම එකේම අනිත්‍යතාව එතන පෙන්නුම් කරන්නේ අර බාහිර ලෝකයේ ධාතු හතර අර වගේ අනිත්‍ය නම් අපේ මේ ශරීරය ගැන ලොකුවට ගන්න දෙයක් නැහැ කියන එකයි. ඒකයි හිතට දාන්නේ. ඉතින් අන්න ඒ තණ්හුපාදින්න- තණ්හාවෙන් අල්ලගත්තු- 'අහන්ති මමන්ති අස්මීති' මෙය මමය, මෙය මගේය අස්මීති- අන්තිමට කියන්නේ අස්මි කියලා. අන්න එතන වැදගත් කාරණයක්. 'වෙමි' කියන හැඟීම පවා අපට ඇතිවන්නේ මේ ධාතු හතර පිළිබඳව ස්ථාවරයක් ගැනීමෙන්. **මේ ධාතු හතර පිළිබඳ පුඤ්ජයේ අපි යම්කිසි ස්ථාවරයක් ගන්නවා. ඒක තමයි විඤ්ඤාණය. විඤ්ඤාණ මායාව.** ඔන්න දැන් ඊළඟට ගැඹුරු පැත්තට යන්නේ. ඒ ධාතු මනසිකාරයේ ගැඹුරුම පැත්ත මතුවන සූත්‍රයක් තිබෙනවා. ඒක හඳුන්වන්නේ ධාතු විභංග සූත්‍රය කියලා.

ඒ ධාතු විභංග සූත්‍රය අතිශයින්ම ගැඹුරු සූත්‍රයක්. ගැඹුරුයි කිව්වට භයවෙන්න නරකයි. ගැඹුරුයි කියල කියන්නෙ මොකද? ඒ සූත්‍රය අහල ඉවරවෙනකොට ඒ දේශනාව ඇසූ පුක්කුසාති කියන භික්ෂූන් වහන්සේ අනාගාමී ඵලයට පත්වුනා. ඒ කතන්තරය කෙටියෙන් කියතොත් ඒ මහා පින් ඇති පුක්කුසාති බුදුරජාණන් වහන්සේ වෙනුවෙන් මහණ වෙලා පිටත්වෙලා ඇවිත් එක්තරා කුඹල් ගෙයකදී හමුවුනේ. බුදුරජාණන් වහන්සේ බව හඳුනාගත්තෙත් නැහැ. බුදුරජාණන් වහන්සේ ඇහෙව්වෙත් නැහැ. නමුත් රෑ කලින් ඇවිත් සිටියා පුක්කුසාති භික්ෂුව. භික්ෂුව කීවේ බුදුරජාණන් වහන්සේ වෙනුවෙන් පැවිදිවෙලා ආවෙ බුදුන් වහන්සේ දකින්න. බුදුරජාණන් වහන්සේ පෙරමහට ගිහිල්ලා අර කුම්භකාර ශාලාවෙදි හමුවුනා. හමුවෙලා මේ පුක්කුසාතිගෙන්ම අවසර ලබාගෙන- ඒ කුඹල්කාරයාගෙනුත් අවසර ලැබුනා කලින් ආපු භික්ෂුව ඉඩ දෙනවානම් ඉන්න කියල- බුදුරජාණන් වහන්සේත් අවසර ලබාගෙන ඒ ශාලාවේ රෑ හිටියා. ඒ ඉන්න අතරේ මේ

පුක්කුසාති භික්ෂුවගේ ස්වරූපය දකලා ඔන්න බුදුරජාණන් වහන්සේ මේ දේශනාව පැවැත්වූ බවයි සඳහන් වෙන්නේ. මොකක්ද දේශනාව? දේශනාව ආරම්භ කළ පාඨයම අපට උපකාර වෙනවා. **'ඡ ධාතුරො අයං භික්ඛු පුරිසො'** භික්ෂුව මේ පුරුෂයා කියල කියන කෙනා ධාතු හයක සංග්‍රහයක්, ධාතු හයකින් යුක්ත කෙනෙක්. එතකොට මේ පින්වතුන්ට සමහර විට විතර්කයක් එන්න පුළුවන් අපි පටන් ගත්තේ ධාතු හතරෙන්. අන්තිමට ධාතු පහක් වුනා. දැන් ධාතු හයක් වෙලා. කොහොමද මේක වුනේ? මේ කය නම් ඇත්ත -වශයෙන්- කය කියලා වෙනම ගත්තොත් - ඇත්ත වශයෙන් කය හැදිලා තියෙන්නේ ධාතු හතරෙන් තමයි. ඒ ධාතු හතරෙන් සකස්වෙච්ච ආකාරය තුළ අවකාශ ධාතුවකුත් පෙන්වන්න, පෙන්නුම් කරන්න පුළුවන්, ඒකෙ තිබෙන සිදුරු අනුව. ඒකම නිසා තමයි ඔය කය ගැන කියනකොට 'චාතුම්මහාභූතිකො අයං කායො' කියල සමහර තැන්වල සඳහන් වෙන්නෙ. මහා භූත කියන්නේ ධාතු හතරමයි. සතර මහා භූතයින්ගෙන් සකස්වෙච්ච එකක්. 'චාතුම්මහාභූතිකො අයං කායො මාතාපෙත්තිකසම්භවො'- මව්පියන්ගෙන් හටගත්තා. 'ඔදනකුම්මාසූපචයො' බත්කොමුපිඩු ආදියෙන්, ඒ කාලයේ තිබුන ආහාර වර්ග නේ. ඒවායේ එකතුවක්. දැන් මේ පින්වතුන්ට යම්විධියකින් පුළුවන් නම් අවුරුදු පනහක් ජීවත්වෙච්ච කෙනෙක් උපන්දා සිට බිව්ව කිරි ගත්තු ආහාර ටික යම් විදියකින් එකතුකරලා ගත්තොත් එහෙම ලොරි ගණනක්. ඒවායේ සාරය තමා මේ ශරීරයේ තියෙන්නේ. 'ඔදනකුම්මාසූ පචයො' නමුත් 'අනිච්චං' -අනිත්‍යයි මේවා ඔක්කොම අන්තිමට ගිහිල්ලා බලු කැනහිලුන්ට ආහාර වෙනවා. මේ අපි අවුරුදු පනහක් සියයක් රැක බලාගෙන රසම ආහාර පෝෂ්‍යම ආහාර දමල පෝෂණය කරපු එකට අන්තිමට යන කල ඕකයි. එතකොට ඒ කය පිළිබඳ කතන්තරය.

නමුත් සත්ත්වයා කියල කියන කොට පණ ඇති සත්ත්වයෙක් නම් ඔන්න තියෙනවා විඤ්ඤාණය පිළිබඳ ප්‍රශ්නය. ඒක මතු වෙන්නේ මෙතනදි. අර පුරුෂයා ධාතු හයකින් කියලා කිවේ පඨවි, ආපො, තේජො, වායො, ආකාස, විඤ්ඤාණ. විඤ්ඤාණයත් ධාතුවක් හැටියට දක්වලා තියෙනවා. මේ ධාතු කියන වචනය වරදවා ගන්න එපා 'දෙයක්' කියලා. ඕනෑම විග්‍රහයක අවසාන වශයෙන් දක්වන කොටසට ධාතු කියන වචනය යොදනවා. යම්කිසි විග්‍රහයක අවසාන වශයෙන් දක්වන කොටස් ධාතු නමින් හඳුන්වනවා. පඨවි, ආපො, තේජො, වායො, ඊළඟට ආකාශ කියන එකත් අපි කලින් සඳහන් කළා ශරීරය ගැන සලකලා බලනකොට. ඊළඟට අහස කියලා වෙන් කරලා ගන්නේ කවුද? විඤ්ඤාණය. මේක මගෙයි කියලා ගත්තා. අන්න විඤ්ඤාණයේ මායාව. ඔන්න ගැඹුරු පැත්තට එන්නේ. ඉතින් ඒ දේශනාව අර පුක්කුසාති භික්ෂුන් වහන්සේට බුදුරජාණන් වහන්සේ පියවරෙන් පියවරට අර විධියට පටන්ගෙන 'ඡ ධාතුරො අයං භික්ඛු පුරිසො' මේ පුරුෂයා කියලා

කියන්නේ, පුද්ගලයා කියන්නේ මේ ධාතු හය පමණයි කියලා ඊළඟට අර කලින් කිව්ව ආකාරයටම එක එක ධාතු හඳුන්වලා දුන්නා ආධ්‍යාත්මික බාහිර වශයෙන්. ඒ විධියට දක්වලා මේ දෙකම එකයි කියලා හිතින් සලකා ගන්නවා. මේ දෙක අතරින් අර කලින් කිව්වා වගේ උපාදින්නයට වැඩිතැනක් දීම අනුපාදින්නයට අඩුතැන දීම, උපාදින්නය තරකර ගැනීම සඳහා අනුපාදින්නය පාවිච්චි කිරීම කියන ඒ චින්තනය වෙනුවට ඒ දෙකම සමානයි කියලා සිත උපේක්ෂාවට ගෙන ඒමක් මෙතන දක්වන්නේ. එහෙම හිතීම තුළින් ඊළඟට කෙරෙන දේ බුදුරජාණන් වහන්සේ පෙන්නුම් කරනවා. 'පඨවි ධාතුයා චිත්තං විරාජෙති' දීර්ඝ කාලයක් සංසාරයේ මේ ඇදිලා තිබුන පඨවි ධාතුව- දැන් අපි පඨවි කියල කියනකොට එකපාරටම ගල්කුළක් පර්වතයක් මතක් වෙනවා. නමුත් 'පඨවි' කියල කියන්නේ ඒක නොවේ නේ. ආපො කියන කොට ගඟක්, මූදක් මතක් වෙනවා. 'ආපො' කියන්නේ ඒක නොවේ නේ. ධර්මයේ දක්වලා තියන හැටියට පඨවි ධාතුව කියලා අපි හඳුනා ගන්නේ කොහොමද? හඳුනාගන්නේ තද බව. කර්කශ බව අපි අල්ලලා බලන්න එපායැ මේක තදය කියල හඳුනාගන්න. ආපො දියාරු ගතිය.

එතකොට මේ විඤ්ඤාණයට ගොදුරු වන ආකාරයෙනුයි අපි මේ රූපය හඳුනාගන්නේ. ඔන්න ඔතන ගැඹුරු කාරණයක් තියෙන්නේ. එතකොට මේ ධාතු හතර විඤ්ඤාණ මායාව තුළට වැටෙනකොට ඒක තුළින් ගන්නා රූප සංඥාවයි අපි මේ අල්ලාගෙන ඉන්නේ. ඒ රූප සංඥාව හිතින් මකා හැරීමටයි බුදුරජාණන් වහන්සේ මේ දේශනාව පැවැත්වූයේ. එතකොට මේ අර විශේෂත්වයක් දීම තුළින්- අර මැනීම තුළින්- ඒ මැනීම කරන්නේ කොතනින්ද? **'අසමි'**- **'වෙමි'** කියන ස්ථාවරයක් ගන්නවා සත්ත්වයා. ඒක තමා **'අස්මිමාන'** කියලා කියන්නේ. දැන් ඔය මිනින්දෝරු මහත්වරු දන්නවා ඇති යමක් මනින්න කලින් කුඤ්ඤයක් ගහලයි පටන්ගන්නේ. ඒ වගේ මේ සත්ත්වයා මුළු ලෝකය මනින්නේ 'අසමි' කියන කුඤ්ඤය ගහලා- 'වෙමි' 'වෙමි', -'මම වෙමි' මගේ ඉස්සරහ ඉන්න ඔබ 'වෙහි'. අතන ඉන්න එක්කෙනා එයා ඉන්නවා වෙනම. ඔය විධියට කියනවා නේ. එහෙම නැත්නම් ඉදිරියෙන්ම ඉන්න තමා තමයි උත්තමපුරුෂයා. ඊළඟට මධ්‍යම පුරුෂයා- මැද ඉන්න එක්කෙනා. ප්‍රථම පුරුෂයා තමා අර ඈත ඉන්න කෙනා. නමුත් මේ තුන්දෙනාගෙන් වැඩිම වටිනා එක්කෙනා තමයි - උත්තම පුරුෂයා- 'මම'. අන්න ඒ මම කියන එකටත් වඩා සියුම් එක තමා 'අස්මි' වෙමි- අස්මි මානය කියලා කියනවා. මම කියන කෙනා ගොරෝසු පැත්ත විතරයි. ඒක මුල් මාර්ග ඵලවලින් ඉවත් වෙනවා. නමුත් රහත් වන තුරු 'අස්මි' කියන මානය තියනවා. අර මුලින් ගහපු කුඤ්ඤය තියෙනවා. ඒ අසමි කියන කුඤ්ඤය ඒක ඉදිරීමටයි උවමනා වන්නේ. මැනීමක් තියන නිසා නේ කුඤ්ඤයක් ඕනැවන්නේ. මනින්නේ මොකටද? එකකට වැඩිය අනිත් එක හොඳයි. මේ

උපාදින්නයේ වටිනාකම වැඩියි. අනුපාදින්න එකේ යම්කිසි අඩුවක් තියනවා. මේක තණ්හාවෙන් අල්ලාගත්තු නිසා. එතකොට තණ්හාව, උපාදානය, ඉවත්වනකොට අර දෙකම එකයි. අර දෙකම එකයි කියන්නේ ආයෙත් මනින්න ඕන නැහැ නේ. **මනින්න ඕන නැති වෙනකොට කුඤ්ඤය ගැලවිලා යනවා. අන්න අසම්මානය නැති වෙන හැටි.**

ඉතින් අපි කියන තරම් ලේසි නෑ. නමුත් බුදුරජාණන් වහන්සේ දක්වන්නේ ඒකට මාර්ගයයි. අර අතීතයේ පින් ඇති අය ඒ දේශනාව තුළින් කළයුතු දේ තේරුම් ගත්තා. ඒකයි එතකොට මේකේ පරමාර්ථය. එතකොටයි ඉතින් පඨවිධාතුව මකා හැරීම. දැන් හිමකැටයක් ගැන හිතලා බලමු. අයිස් කැටයක් කියලා කියන්නේ ඒක එකපාරටම අතේ හැපුනාම හිතෙන්නේ ගලක් හැපුනා කියලා. නමුත් ඒක දියවෙනකොට වතුර වෙනවා. එතකොට පඨවිධාතුව කියලා හිතාගත්තු දේ මෙන්න ආපො ධාතුව වෙලා. ඉතින් වායො ධාතුව. ඒක රත්වුනොත් තේජො ධාතුව වෙනවා. නමුත් අපේ චින්තනය අර පොඩි ළමයගෙ චින්තනය වගේ. සංසාරගත සත්ත්වයා හිතින් ග්‍රහණය කරනවා. පඨවි කියන එක **'දෙයක්'** හැටියට, ආපො **'දෙයක්'** හැටියට, තේජො **'දෙයක්'** හැටියට, වායො **'දෙයක්'** හැටියට. ඒ මදිවට ඒක මැද තියන ආකාශයත්. එතකොට ආකාශයත් තියෙන්නේ අර විඤ්ඤාණය තුළ- අර මායාව තුළ. ඔන්න ගැඹුරු පැත්තටයි එන්නේ.

විඤ්ඤාණය නිරන්තරයෙන්ම තියෙන්නේ නාමරූප ධර්මයත් එක්කයි. මේව ගැන අපි කලින් අවස්ථාවලත් කියලා තියෙනවා. දැන් ගස් කොළං වලට නාමරූප කියලා දෙයක් නැහැ. අවිඤ්ඤාණක නිසා, විඤ්ඤාණයක් නැති නිසා, ගස් කොළංවලට කරදරයක් නැහැ. ගල්වලට කරදරයක් නැහැ සුළංපාරක් වැදුනත්, නමුත් ගස්ගල් වගේ නොවේ නේ සවිඤ්ඤාණක සත්ත්වයා. දීර්ඝ කාලයක් අවිද්‍යාවත් තණ්හාවත් නිසා සංසාරයේ එනවා කියලා බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කළේ ඒකයි. ඒ ටික තමා ගැඹුරුම කොටස මේ ධර්මයේ. ඇතැම් කෙනෙක් පටලවා ගන්නවා. ඉතින් අපි කල්පනා කරන්න ඕන, අන්න එතනටමයි බුදුරජාණන් වහන්සේ පහර ගහන්නේ. **පඨවි ආපො තේජො වායො කියලා ලෝකයා ගන්න ග්‍රහණය තුළයි ඇත්ත වශයෙන් මේ කාලයේ භෞතික විද්‍යාව පවා අතරමංවෙලා සිටින්නේ.** ඒවා සත්‍ය හැටියට ගන්නවා. කුඩා දරුවන්ට හෝඩිපොතේ උගන්වන පාඩම් වගේ දෙයක් තමා මේ පඨවි කියන්නේ ගල් පර්වත, ආපො කියන්නේ ගංගා- එහෙම හිතන එක. ඇත්ත වශයෙන්ම මේක මනින්නේ කොහොමද? අපේ ශරීරය තුළින්මයි. දැන් අර කිව්ව අයිස් කැටේ හරි මොකක හරි අපේ අත වදිනවා. ඒක තුළින් යම් සංඥාවක් ගන්නවා **වේදනාව** අනුව. ඒ ගත්තු **සංඥාව** අනුව නොයෙකුත් **චේතනාවල්** එනවා. **චේතනාව අල්ලනවා.** ඊළඟට **ස්පර්ශය**. ඊළඟට ඒ අනුව **මෙනෙහි කිරීමක්** එනවා.

මෙනෙහි කිරීම ස්පර්ශ ස්ථානයට යොමු කරනවා. අන්න නාමධර්ම ටික. **වේදනා සඤ්ඤා, චේතනා, ඵස්ස, මනසිකාර කියන නාමධර්ම ටික,** ඉතින් ඕකට ඊළඟට එකතුවෙනවා අපි ගත්තු රූප සංඥාව. පඨවි, ආපො, තෙජෝ, වායො ආශ්‍රයෙන් අපි රූපසඤ්ඤාවක් ඇතිකර ගන්නවා.

ඉතින් මේක උපමාවකට කියනවා නම්, විඤ්ඤාණ මායාව හරියට- අර ආත්ම ස්නේහය ගැන කිව්වා මේකටම අදාළ කලින් දේශනාවලත්- යම්කිසි කෙනෙක් කන්නාඩියක් දිහා බලලා, එහෙම නැත්නම් පැහැදිලි වතුරක් දිහා බලලා, ඒක වරදවා වටහා ගැනීම තුළින් අවිද්‍යාව තුළින් ඒක වෙන කෙනෙක් කියලා හිතාගන්නවා. දැන් අර ඊදණ්ඩ උඩ බල්ලා උපමාවක් හැටියට අපි දක්වූවා. ඒ දණ්ඩ උඩ යන බල්ලෙක් තමාගේ ඡායාව දැකලා වෙන බල්ලෙක්ය කියලා ගොරවන්න පුළුවන්. වල්ගය හොලවන්න පුළුවන්. කුතුහලයෙන් බලන්න පුළුවන්. ඒ වගේ තවත් උපමාවක් දක්වූවා. සමහර කෙනෙක් තමන්ගේ මූණ කලින් දැකලා නැත්නම් වතුරේ මූණ බලනකොට රැවටෙන්න පුළුවන්.[2] අර ආත්ම ස්නේහය. ආත්ම ස්නේහයමයි වෙන ආකාරයකින් එන්නෙ. ඒක ආත්ම වශයෙන් බුදුරජාණන් වහන්සේ පෙන්නුම් කරන්නේ. ආත්මය කියන එක එහෙම පිටින්ම මෝඩ අදහසක් හැටියටයි. අපි ඒක පිළිගන්න සූදානම් නෑ. ලෝක සත්ත්වයා මේ ශරීරය තුළ අර අවිද්‍යාවෙන් ගත්ත ආත්මසංඥාව තියෙන තාක් සංසාරයේ දුක් විඳිමින් යනවා. ආත්මසංඥාව බිඳින්න කිසිම ශාස්තෘවරයෙකුට බැරිවුනා. ඒකත් අරගෙනමයි යන්නේ. හෙවනැල්ලත් අරගෙනමයි යන්නේ. බුදුරජාණන් වහන්සේ පෙන්නුවා **හෙවනැල්ලෙන් මිදෙන්න දුවලත් බැහැ, ඒක බදාගන්න උත්සාහකරලත් බැහැ. ඒක බදාගන්න යනවා වගේ තමා ශාස්වත දෘෂ්ටිය. ඒකට බයේ දුවන්න වගේ තමා උච්ඡේද දෘෂ්ටිය.** ඔය දෙකෙන්ම වෙන්වෙලා බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරන්නේ **එතනම ඉඳලා හඳුනාගන්න.** මේ මොකක්ද මෙතන තියෙන්නේ **පංචඋපාදාන ස්කන්ධයයි. රූප වේදනා සංඥා සංස්කාර විඤ්ඤාණ කියන අල්ලා ගත්තු ගොඩවල් පහක් විතරයි.** එයිනුත් මේ රූප ගොඩ කියලා කියන්නේ- පඨවි ආපො, තේජෝ, වායො ධාතු හතර තමයි රූප ගොඩට **හේතු** හැටියට දක්වන්නේ. **ප්‍රත්‍ය** හැටියට දක්වන්නේ. වේදනා ගොඩ කියලා කියන්නේ ඒක **ස්පර්ශය** ආශ්‍රයෙන් ගත්තු එකක්. සඤ්ඤාගොඩත් **ස්පර්ශය** ආශ්‍රයෙන් ගත්තු ගොඩක්. සංස්කාර ගොඩත් **ස්පර්ශය** ආශ්‍රයෙන් එකතු කරගත්තු ගොඩක්. විඤ්ඤාණය දක්වන්නේ **නාමරූපය** නිසා තියෙන එකක්. විඤ්ඤාණයත් නාමරූපයත් එකිනෙකට උපකාර වෙනවා.

විඤ්ඤාණයේ තියෙනවා- අර ප්‍රත්‍යවේක්ෂා කියල අපි යොදාපු වචනයේ දෙපැත්තක් තියෙනවා. ප්‍රත්‍යවේක්ෂා කියල කියන්නේ ආපසු හැරිලා බලනවා. ආපසු හැරිලා බලනකොට මේ විඤ්ඤාණ මායාව තුළම තියෙනවා

අපව රවටන ස්වභාවයක්. අවිද්‍යා අන්ධකාරය තුළ අපි රැවටෙනවා. 'මේ මගේ' කියල ගන්නවා. 'මෙය මගේය, මෙය මම වෙමි, මේ මගේ ආත්මයයි.' ඕක සාමාන්‍ය සංසාරගත සත්ත්වයාගේ ස්ථාවරයයි. බුදුරජාණන් වහන්සේ පෙන්නුම් කරනවා ඊට විරුද්ධව සම්මා දිට්ඨි වශයෙන් ගතයුතු ස්ථාවරය දක්වනවා. ඒකත් ස්ථාවරයක් තමයි, ආරම්භයේදී එතනට දානවා 'න' යන්නක්. ආරම්භ කරන්නේ 'න එතං මම' - උත්සාහයෙන් හරි. දැන් මේ පින්වතුන් අහලා තියෙනවා නේ ලෝක සත්ත්වයා සිටින්නේ විපල්ලාස හතරක් තුළය කියලා. විපල්ලාස කියන්නේ විපරීත අදහස්. විපිරියාස හතර. අනිත්‍ය දේ නිත්‍ය හැටියට සලකනවා. අනිච්චෙ නිච්ච සඤ්ඤා, දුක්ඛෙ සුඛ සඤ්ඤා, දුක්දේ සැප හැටියට සලකනවා. 'අසුභෙ සුභ සඤ්ඤා, අසුභ දෙය සුභ හැටියට සලකනවා. 'අනත්තනි අත්තසඤ්ඤා' අනාත්ම දේ ආත්ම හැටියට සලකනවා. මේ විපරීත දෘෂ්ටි හතර අපි සංසාරයේ අරගෙන ඇවිල්ලා තියනවා. ක්‍රමානුකූලව මේක මට්ටු කරන හැටි බුදුරජාණන් වහන්සේ දක්වනවා. මෙතනදී ධාතු මනසිකාරය. වෙන තැන්වලදී අර පිළිකුල් ආදිය. නොයෙකුත් ක්‍රම තියනවා ඒක නැතිකරන්න. ඉතින් මේ ධාතු මනසිකාරය ප්‍රබලයි. බොහෝ විට ප්‍රඥාව අධික අය- දැන් පුක්කුසාති භික්ෂූන් වහන්සේ ඒ දේශනාව අහල ඉවර වෙනකොට අනාගාමී වෙලා ඉවරයි.

එතකොට ඒ විධියට ධාතු හතර හිතින් මකා හැරියට පස්සේ විඤ්ඤාණය පිරිසිදු තත්ත්වයකට එනවා. ඊළඟට ඒක තුළත් ගැඹුරින් දක්වනවා මේ අවස්ථාවේ හැටියට විස්තර වශයෙන් නැතත්, ඔක්කොම කිව්වෙ නැතත්- ඊළඟට දක්වනවා විඤ්ඤාණ මායාවෙනුත් මිදෙන හැටි. විඤ්ඤාණ මායාවෙ තව ඉතිරිවෙලා තියෙන කොටස් තමයි ඊළඟට ඔය අරූපලෝක වලට ආශාවල් ඇතිවෙනවා. රූපයෙන් හිත මුදාගන්නකොට ඊළඟට අරූප තත්ත්ව තමයි. අරිට වඩා සැප නමුත් ඒත් සංසාරයේම කොටස්. ඒවාත් සංසාරයටම අයිති බව බුදුරජාණන් වහන්සේ පමණයි දැක්වූයේ. අතීතයේ ආලාරකාලාම, උද්දක රාම පුත්ත, ආදීන් බුදුරජාණන් වහන්සේට උපදෙස් දීලා දැන් ඉතින් ඔබවහන්සේ අපි තරමටම දන්නවා ඒක නිසා දැන් මේ ගෝල පිරිස බෙදා ගනිමු කියල කියද්දී බුදුරජාණන් වහන්සේ අතහැරලා ගියේ මොකද? අර **ඒ අය රූපය අත හැරලා අරූපය බදා ගත්තා,** අරූපය අල්ලා ගත්තා. අරූපය හැටියට ඔයලොකුවට කියනකොට දන්නවා නේ. ආකාසානඤ්චායතනය විඤ්ඤාණඤ්චායතනය, ආකිඤ්චඤ්ඤායතනය, නෙවසඤ්ඤානාසඤ්ඤායතනය ආදි වශයෙන් රූපය අතහැරියට පස්සේ ඒත් අහුවෙනවා. සියුම් දෙයක් අහුවෙනවා. ආකාශය අනන්තයි, අනන්තයි, අනන්තයි කියලා හුඟක් කාලයක් කල්ප ගණන් ඉන්න පුළුවන්. බ්‍රහ්ම ලෝකවල හිටියත් ආයිත් කරකැවිල එනවා. ඊළඟට ආකාශය හිතට ගත්තු විඤ්ඤාණය. ඒකත් අනන්තයි අනන්තයි කියල අල්ලගෙන ධ්‍යාන වශයෙන් භාවනා කරලා ඒ තත්ත්වයට පත්වුනොත්

ඉපදෙන්නේ ඒකට ගැලපෙන ලෝකයක. කල්ප ගණන් ඉන්න පුළුවන්. ඒත් කරකැවිලා ආපසු එනවා. ඊළඟට **ඒ වගේම 'කිසිවක් නැත' කියලා ගන්නවා. 'කිසිවක් නැත' කියන එකත් දෙයක් වන හැටි බලන්න.** පුදුමය කියන්නේ- මොකක්ද ආකිඤ්චඤ්ඤායතනය කියන්නේ? මෙතන යටින් තියෙන්නේ සංඥාවක්. **ඔන්න දැන් කේරුම් ගන්න 'කිසිවක් නැත, කිසිවක් නැත' කියන එකත් සංඥාවක්**. වේදනාවත් සංඥාවත් ඒත් ඉතිරියි.

මේ සංස්කාර ගැන කථාවට ඊළඟට අපි එන්නේ. **මේ මහා සංසාරය අවිද්‍යාව තුළින් එන සංස්කාර ගොඩක්.** මේ අවිද්‍යාව කියන නොදැනීම තුළින්, ඒ අඳුරේ අතපත ගෑම තුළින්, සංස්කාර කියල කොටසක් ඇතිවෙනවා. කාය සංඛාර, වචී සංඛාර චිත්ත සංඛාර කියල. කාය සංඛාර තමයි මූලික වශයෙන් ආශ්වාස ප්‍රශ්වාස. ආශ්වාස ප්‍රශ්වාස පිහිට කරගෙන අපි අර පව් පින් වලට උපකාර වන කර්ම කරනවා. වචී සංඛාර විතක්ක විචාර- සිතුවිලි. අන්තිමට චිත්ත සංඛාර වේදනාවත් සංඥාවත්. ඔය ටික ඉතුරු වෙනවා. ඒ ටිකත් මකා හැරලා, චේතනාව තුළින් අර සංස්කාර දිගට ගෙනයන ශක්තියත් නැති කරලා, අන්තිමට බුදුරජාණන් වහන්සේ අස්මි මානයෙනුත් මිදෙන හැටි දක්වා වදාළේ ඒ දේශනාව තුළ.

එතකොට දැන් මේ පින්වතුන් කෙටියෙන් සලකාගන්න- අපේ කාලය අවසාන වන නිසා- මෙන්න මේ ධාතු මනසිකාරය, රහත් තත්ත්වය දක්වාම ගෙන යා හැකි ගැඹුරු භාවනාවක්. එදිනෙදා ජීවිතයේ හැකි පමණින්, අර සංඝයා වහන්සේලාට සිව්පස ප්‍රත්‍යවේක්ෂාව වගේ, තමන්ටත් අවස්ථාව තිබෙනවා. මේ දැන් ලෝකයේ තියන අනවශ්‍ය මාන්න ආදිය, ඔය විලාසිතා ආදිය, ඉබේටම නැතිවෙලා චාම් ජීවිතයට පුරුදු පුහුණු වන්න හොඳයි. ඒ වගේම මේ කාලයේ කවුරුත් දන්නවා නේ **පරිසර හිතකාමී චින්තනය.** ඒ අයටත් මේක හොඳ පාඩමක්. මේක හොඳ නිදර්ශනයක්. **පරිසරයට හිතකර, පරිසරය දූෂණය නොවන, පරිසරයත් තමා සමඟ මේ ධාතු හතරින් නිර්මිතයි** කියන ඒ සිතුවිල්ල තුළ සාමාජීය වශයෙනුත් ඒකෙ ලොකු ආනිශංස තියනවා.

ඉතින් ඒ විධියට කල්පනා කරලා අද මේ දේශනාව තුළින් නිවන් මඟ යන අතරම එදිනෙදා ජීවිතයෙදිත් තමන්ගේ ජීවිත සරල චාම් නමුත් ධර්මයට ලැදිව, ඒ වගේම අර පරිසරය විනාශ කරන්නේ නැතිව, පරිසරයත් උපකාර කරගෙන, යහළුවෙක් හැටියට උපකාර කරගෙන, මේ සංසාරෙන් එතෙර වීමේ අවස්ථාවක්ය මේ මනුෂ්‍ය ආත්ම භාවය කියල කල්පනා කරගෙන, මානවාභිමානය මකා දමලා, අනික් සත්ත්වයින්ටත් ජීවිත අයිතිය තියනවා කියලා තමන්ගේ ඒ සහෝදරත්වයත් සිහිපත් කරගෙන, මේ ධර්මකාරණා පිළිපදින හැටියට මේ පින්වතුන් අධිෂ්ඨාන කරගන්න.

එතකොට මේ විදර්ශනාත්මක බණත්, අද රැක්ක සීලයත්, කළ භාවනාවත්, උපකාර කරගෙන හැකිතාක් ඉක්මණින් මේ බුද්ධ ශාසනය තුළදීම සෝවාන්, සකදාගාමී, අනාගාමී අර්හත් මාර්ගඵල ප්‍රතිවේධයෙන් අති දීර්ඝ සංසාර ගමන කෙළවර කර උතුම් අමා මහ නිවනින් සැනසීමට ශක්තිය බලය ලැබේවා. අවීචියේ සිට අකනිටා දක්වා යම්තාක් සත්ත්ව කෙනෙක් මේ ධර්මදේශනාමය, ධර්ම ශ්‍රවණමය කුශලයන් අනුමෝදන් වීමට බලාපොරොත්තු වෙත් නම් ඒ අනුමෝදන්වීම තළින් ප්‍රාර්ථනීය බෝධියකින් උතුම් අමා මහ නිවන සලසා ගනිත්වා කියා ප්‍රාර්ථනා කරගෙන මේ විධියට ගාථා කියන්න.

එත්තාවතා ච අම්හෙහි..........

## 07

පහන් කණුව ධර්ම දේශනා අංක 153

# නමො තසස භගවතො අරහතො සමමා සමබුදධසස

නයිදං අත්තකතං බිම්බං - නයිදං පරකතං අඝං
හෙතුං පටිච්ච සමභූතං - හෙතුභඞ්ගා නිරුජ්ඣති

යථා අඤ්ඤතරං බීජං - ඛෙත්තෙ වුත්තං විරූහති
පඨවිරසඤ්ච ආගම්ම - සිනෙහඤ්ච තදූභයං

එවං ඛන්ධා ච ධාතුයො - ඡ ච ආයතනා ඉමෙ
හෙතුං පටිච්ච සමභූතා - හෙතුභඞ්ගා නිරුජ්ඣරෙ.

( සේලා සූත්‍රය-සංයුත්ත නිකාය)

සැදැහැවත් පින්වතුනි,

සසර පැවැත්මත් නැවැත්මත් හේතුඵල සම්බන්ධතාව තුළින් විග්‍රහ කිරීම තථාගත සම්මා සම්බුදුරජාණන් වහන්සේ ලෝකයට හෙළිකර වදාළ පටිච්චසමුප්පාද ධර්මයේ විශේෂ ලක්ෂණයක්. ස්වභාව ධර්මයේ දකින්ට ලැබෙන නිදර්ශන ආශ්‍රයෙන්ම බොහොම අවස්ථාවල මේ ධර්මතාව පැහැදිලි කරලා දීලා තියෙනවා. අද මේ මාතෘකා කළ ගාථා තුළිනුත් ඉතාමත්ම සරල උපමාවක් මගින් මේ ධර්මතාව ඉදිරිපත් කෙරිලා තියෙනවා.

මාරයා නැගූ ප්‍රශ්නයකට සේලා කියන රහත් මෙහෙණින් වහන්සේ දුන්න පිළිතුරක් හැටියටයි මේ ගාථා සංයුත්සඟියේ සඳහන් වෙන්නේ. සේලා කියන රහත්මෙහෙණින් වහන්සේ එකදවසක් සැවැත් නුවර පිඬුසිඟා වැඩලා පිණ්ඩපාතය වළඳලා ඉවරවෙලා දවල්කාලයේ විවේකයෙන් ගතකරන්න අන්ධ වනයට වැඩම කරලා ගසක් මුල භාවනාවෙන් වැඩහුන්නා. ඒ අවස්ථාවේ මාරයා- බොහෝ තැන්වල ඔය ධර්මකාථාවල එහෙම සඳහන්වෙන මාරයා- මේ සේලා තෙරණියට බියක් තැතිගැන්මක් ඇති කරන්න ඒ ළඟට ඇවිල්ලා ඇහෙන විධියට මෙන්න මේ විධියෙ ගාථාවක් ඉදිරිපත් කළ හැටියටයි, ප්‍රකාශ කළ හැටියටයි, සඳහන් වෙන්නේ.

කෙනිදං පකතං බිම්බං - කොනු බිම්බස්ස කාරකො
කවන්නු බිම්බං සමුප්පන්නං - කවන්නු බිම්බං නිරුජ්ඣතී

මේ ප්‍රශ්න කීපයක් ඉදිරිපත් කරන්නේ. 'කෙනිදං පකතං බිම්බං' මේ බිම්බය, මේ ප්‍රතිරූපය, එහෙම නැත්නම් මූර්තිය- කා විසින් කරන ලද්දක්ද? 'කොනු බිම්බස්ස කාරකො' මේ ප්‍රතිරූපය එහෙම නැත්නම් මේ මූර්තිය, හැදූ කෙනා කව්ද? 'ක්වනු බිම්බං සමුප්පන්නං' මේ ප්‍රතිරූපය බිම්බය කොහේද හටගත්තේ? 'ක්වනු බිම්බං නිරුජ්ඣති' මේ ප්‍රතිරූපය නැතිවෙන්නේ කොහේද?

මේ ප්‍රතිරූපය, මූර්තිය, කියලා කිව්වේ මේ අපේ ශරීරයටයි. අපි මේ මමය මගේය කියලා කියන මේ ශරීර කූඩුවටයි. එතකොට මේ ප්‍රශ්නය- මේ කාලයේ නම් කවුරුත් අහන ප්‍රශ්නයක් - මාරයෝ විතරක් නොවෙයි. අනික් අයත්. එතකොට මේකට සේලා තෙරණිය බියකට තැති ගැන්මකට පත් නොවී කල්පනා කරනවා කවුද මේ මනුෂ්‍යයෙක්ද අමනුෂ්‍යයෙක්ද මේක කියන්නේ? වටපිට කවුරුවත් පේන්නත් නැහැ. හිතුවා මේ මාරයාම තමයි. මේක මට සමහර විට මිථ්‍යාදිට්ඨියක් දාන්න වෙන්න ඇති කියලා හිතලා ඔන්න ධර්මානුකූල පිළිතුරු සේලා තෙරණින් වහන්සේ දුන්නා බුද්ධ වචනයට එකඟව. ඒක තමයි අපි මේ මාතෘකාව හැටියට තිව්වේ.

ඔන්න ඒ ගාථා තුන තියනවා

නයිදං අත්තකතං බිම්බං - නයිදං පරකතං අඝං

හෙතුං පටිච්ච සම්භූතං - හෙතුභඞ්ගා නිරුජ්ඣති

මේ බිම්බය, මේ ප්‍රතිරූපය හරි, මූර්තිය හරි, මේක තමා විසින් කරන ලද්දකුත් නොවෙයි. 'නයිදං පරකතං අඝං'- අඝං කියලා කියන්නේ ව්‍යසනය, මේ ව්‍යසනය වෙන කෙනෙක් කරපු එකකුත් නොවෙයි. 'හෙතුං පටිච්ච සම්භූතං' යම් හේතුවක් නිසා මේක හටගත්තා. 'හෙතුභඞ්ගා, නිරුජ්ඣති' හේතුව බිඳ දැම්ම හැටියේ ඒක නිරුද්ධ වෙනවා.

ඔන්න ඊළඟට අර උපමාව යොදනවා.

යථා අඤ්ඤතරං බීජං - ඛෙත්තෙ වුත්තං විරූහති

පඨවීරසඤ්ච ආගම්ම - සිනෙහඤ්ච තදූභයං

යම්සේ එක්තරා බීජයක්, එහෙම නැත්නම් යම්කිසි බීජයක්, කෙතක පැල කරන ලද්දේ පෘථිවි රසයත්, දියසීරාවත්, කියන ඒ කාරණා දෙක ලබාගෙන, ඒ දෙක උපකාර කරගෙන, වැඩේද ඔන්න ඒ උපමාව දුන්නා. ඊළඟට උපමේය-

එවං ඛන්ධා ච ධාතුයො - ඡ ච ආයතනා ඉමෙ

හෙතුං පටිච්ච සම්භූතා - හෙතුභඞ්ගා නිරුජ්ඣරෙ

අන්න එසේම 'එවං ඛන්ධා ච ධාතුයො' මේ ස්කන්ධයෝද ධාතූහුද - අටළොස් ධාතූන් මෙතන කියන්නේ- පංචස්කන්ධයත් අටළොස්ධාතූත් 'ඡ ච

ආයතනා ඉමෙ' මේ ආයතන හයත් කියන මේවා 'හෙතුං පටිච්ච සමභූතා' යම්කිසි හේතුවක් නිසා ඇතිවුනා, 'හෙතු භඩ්ගා නිරුජ්ඣරෙ' හේතුව නැති කරලා දම්මාම නිරුද්ධ වෙනවා. ඔන්න පිළිතුරු දුන්නා. එතකොට ඉතිං මාරයා අතුරුදහන් වුනා කියලා කියනවා.

නමුත් ඔන්න එතන ඉඳලා තියෙන්නේ මේ අපේ ධර්ම මාර්ගයට පිවිසීමයි. මේක ගැඹුරු පැත්තක් ඇත්ත වශයෙන්. නමුත් ධර්මයේ හරය තියන කොටසක් මේක. ඉතින් මෙන්න මේ උපමාව සේලා තෙරණියම හදපු එකක් නොවන බව, බුද්ධ වචන ආශ්‍රයෙන්ම ඉදිරිපත් කරපු එකක් බව, අපට හෙළිවන සූත්‍ර දේශනාවක් අංගුත්තර නිකායේ දකින්න ලැබෙනවා.

ආනන්ද ස්වාමීන් වහන්සේ එක් අවස්ථාවක බුදුරජාණන් වහන්සේගෙන් අහනවා 'ස්වාමීනි මේ 'භවය' 'භවය' කියල කියනවා. කෙතෙකින්ද යමක් භවය වෙන්නේ. භවය කියන්නේ ඔය අපි කියන්නේ කාමභව, රූපභව, අරූප භව කියලා කියන ලෝක තුනක් ගැන ධර්මයේ සඳහන් වෙනවා නේ? එතකොට ඒක ගැනයි ආනන්ද හාමුදුරුවෝ අහන්නෙ. ඒ භවය කොතෙකින්ද මේ භවයක් වෙන්නේ. ඔන්න එතකොට බුදුරජාණන් වහන්සේ ඒකට පිළිතුරු දෙනවා. ප්‍රශ්නයක් වශයෙන්ම ඉදිරිපත් කරනවා. 'ආනන්ද කාම ලෝකයක විපාක දෙන්න සුදුසු කර්මයක් නැත්නම් කාමභවයක් කියන එකක් පෙන්නුම් කරන්න හැකිවේද?' 'නැතමය ස්වාමීනි' කියලා පිළිතුරු දුන්නා. ටික ටික තේරුම් ගන්න බලන්න. එතකොට කාම භවයක උපදින්න හේතුවන කර්මයක් නැත්නම් කාම භවයකුත් නැහැ. කාමලෝකයකුත් නැහැ. හිතටයි මෙතන මුල්තැන දීලා තියෙන්නේ මේ උත්තරය තුළ. ඔන්න ඊළඟට ආනන්ද හාමුදුරුවෝ ඒක පිළිගත්තාට පස්සේ බුදුරජාණන් වහන්සේ විස්තරකරනවා ඒකට හේතුවත්. අවිද්‍යාවෙන් වැසුනාවූ තණ්හාවෙන් බැඳුනාවූ සත්ත්වයින්ට කර්මය කෙතක් වෙනවාය. 'කම්මං ඛෙත්තං'- විඤ්ඤාණය බීජයක් වෙනවාය. 'විඤ්ඤාණං බීජං' තණ්හාව දියසීරාව වෙනවාය. 'තණ්හා සිනෙහො' ඒ කාරණා තුන හේතු කරගෙන යම් සත්ත්වයෙකුට කාම භවයක ඉපදීමට උපකාර වන චේතනාවක් ප්‍රාර්ථනාවක් ඇතිවෙනවා, ඒ සිතුවිල්ල තුළිනුයි, ඔන්න ඊළඟට කියනවා ඒ සිතුවිල්ල තුළින් 'ආයති පුනබ්භවාභිනිබ්බත්ති' නැවත උත්පත්තියක් ඇතිවෙනවා. දැන් මේ හැමෝම කතා කරන මාතෘකාවක් නේ මේ.

දැන් එතකොට ආයති පුනබ්භවයක් ඇතිවන හැටි, පුනර්භවයක් ඇතිවන හැටි, බුදුරජාණන් වහන්සේ මෙතන පෙන්නුම් කරන්නේ. ඒ ඇතිවීමේදී කර්මය කෙත හැටියට බලපවත්වනවා. විඤ්ඤාණය තමයි බීජය. තණ්හාව දිය සීරාව. ඉතින් ඊළඟට ඒ වගේම අනිත් භව ගැනත් ආනන්ද හාමුදුරුවන්ගෙන් අහනවා. ඒ වගේම කෙටියෙන් සලකා ගන්න පුළුවන්. 'රූප ලෝකයක විපාක දෙන කර්මයක් නැත්නම් රූප භවයක් ඇති වේද?' 'නැතමය ස්වාමීනී'

එතනදිත් අර වගේම තමයි. රූප ලෝකයක, රූප භවයක, උපදින්න හේතුවන- දිව්‍යලෝක ආදිය නේ- ඒකට උපකාරවන චේතනා ප්‍රණිධි, ප්‍රාර්ථනා ආදී කර්ම වශයෙන් ඇතුළතින් මනුෂ්‍යයා ඇතිකරගන්න දේවල් නැතිනම්- ඒවා ඇතිකර ගන්නේ අවිද්‍යාවෙන් වැහිලා තණ්හාවෙන් බැඳිලා නිසා- එහෙම වුනාම තමයි රූපභවයේ පුනර්භවයක් -නැවත උපතක් වන්නේ. ඒ වගේම අරූප භවය පිළිබඳවත් ප්‍රකාශ කරනවා. ඔන්න එතකොට ඒක ආශ්‍රයෙන් බුදුරජාණන් වහන්සේ යම්කිසි ධර්මයක් ඉදිරිපත් කරනවා. ඊළඟට දැන් මේක මේ මාරයා නැගූ ප්‍රශ්නය තුළිනුත් කෙනෙකුට යමක් හිතාගන්න පුළුවන්.

ලෝකයේ තියන අන්තගාමී දෘෂ්ටි රාශියක් මැදිනුයි බුදුරජාණන් වහන්සේ මේ පටිච්ච සමුප්පාද ධර්මය ඉදිරිපත් කළේ. දැන් මේ පින්වතුන්ට බොහෝ විට පුරුදුවෙලා තියෙන්නේ මධ්‍යම ප්‍රතිපදාව කියන්නේ ආර්ය අෂ්ටාංගික මාර්ගය විතරයි කියලා කියන්න. නමුත් ඇතැම් අවස්ථාවල ඊට වඩා ගැඹුරින් දක්වලා තියෙනවා. පටිච්ච සමුප්පාද ධර්මයමයි මධ්‍යම ප්‍රතිපදාව. මොකක මැදද? අන්න අර කියාපු අන්තවාදී දෘෂ්ටි වල. අන්න අර මාරයා ඉදිරිපත් කළේ 'මේක, තමා හදපු එකක්ද?' වෙන කෙනෙක් හදපු එකක්ද? බොහෝ අවස්ථාවල බුදුරජාණන් වහන්සේ ළඟට ඔය අචේලකස්සපාදී පරිබ්‍රාජකයින් ඇවිල්ලා බුදුරජාණන් වහන්සේගෙන් මේ විධියේ ප්‍රශ්න අහනවා- අන්තගාමී ප්‍රශ්න. ඒ අවස්ථාවල බුදුරජාණන් වහන්සේ පෙන්නුම් කරනවා යම් කෙනෙක් කිව්වොත් තමන්ම මේක කර ගත්තයි කියලා එහෙම නම් ශාස්වත දෘෂ්ටියට යනවා, ආත්ම දෘෂ්ටියට යනවා. මේකෙ කෙළවරක් නැහැ. වෙන කෙනෙක් කරයි කියලා කිව්වොත් ඔන්න උච්ඡේද දෘෂ්ටියට යනවා. මෙතනින් ඉවරයි. මරණින් පස්සේ කිසි ප්‍රශ්නයක් නෑ කියලා. ඒ අන්ත දෙක මැදයි මේක තියෙන්නේ. හේතු ප්‍රත්‍ය නිසයි ඇතිවෙන්නේ. හේතු ප්‍රත්‍ය නැති කළ හැටියේ නැතිවෙලා යනවා. අන්න ඒ විදියේ ගැඹුරු කාරණයක් මෙතන ඉදිරිපත් කරන්නේ.

එතකොට ඒකටම තවත් උපකාර වන වටිනා සූත්‍රයක් තියෙනවා. දැන් අර උච්ඡේදවාදීන් එහෙම හිතන්නේ මේ පුද්ගලයා කියල කියන්නේ පඨවි ආපො තේජෝ වායො ධාතු හතරෙන් සකස්වුන එකක්. ඉතින් පුද්ගලයා මැරුණාට පස්සේ පොළවට පස්වෙනවා. එච්චරයි කතන්දරය. නමුත් බුදුරජාණන් වහන්සේ කියනවා එපමණකින් මේ සත්ත්වයකුගේ කෙළවරක් වෙන්නේ නැහැ මරණින්. ඊට ඈතට යනවා. ඈතට යන්නේ අර හේතු ඵල සම්බන්ධය තුළයි. ඒ පිළිබඳව වඩාත් පැහැදිලි දේශනාවක් බුදුරජාණන් වහන්සේ එක් අවස්ථාවක සංඝයාවහන්සේලාට ප්‍රකාශ කරනවා 'මහණෙනි, මම මේ ධාතූන් හයක් පිළිබඳව ධර්මයක් දේශනා කරලා තිබෙනවා. කිසිම ශ්‍රමණ බ්‍රාහ්මණයෙකුට ප්‍රතික්ෂේප කරන්න බැරි විධියේ ධර්මයක්.' ධාතූන් හයක්, මොනවද ධාතු හය? පඨවි ධාතුව, ආපො ධාතුව, තේජෝ ධාතුව,

වායෝ ධාතුව, ආකාශ ධාතුව, විඤ්ඤාණ ධාතුව. එතකොට පඨවි, ආපො, තේජෝ, වායෝ, විතරක් නොවෙයි. එහෙනම් භෞතික දෘෂ්ටියට යනවා එහෙම ගත්තොත්. ආකාශ ධාතුව, විඤ්ඤාණ ධාතුව කියලා ඔය දෙකත්. ඔය හයයි. ඔන්න එතකොට ඒක ආශ්‍රයෙන් බුදුරජාණන් වහන්සේ තව ගැඹුරට යනවා. 'මහණෙනි මෙන්න මේ ධාතු හය උපාදාන වශයෙන් අල්ලා ගැනීම තුළින් තමයි ගර්භයකට බැස ගැනීමක් වෙන්නේ.' මව්කුසකට බැසගැනීමක් වන්නේ මේ ධාතූන් හය උපාදාන වශයෙන් අල්ලා ගත් විටයි. නිකම්ම විඤ්ඤාණයක් නොවෙයි, ආශ්‍රව සහිත- එතකොට අපිට තේරුම් ගන්න පුළුවන් ආශ්‍රව සහිත විඤ්ඤාණයක් නම් අපි හිතුවට මෙතනින් ඉවරයි කියල ඉවර වෙන්න බැහැ. ඒක කොහොම හරි ඉදිරියට යනව. ඊළඟට ඒක යන හැටි පෙන්නුම් කරනවා. ඒ විඤ්ඤාණයේ බැසගැනීම නිසා මව්කුසක නාමරූපයක් ඇතිවෙනවා. ආයතන හය නිසා ස්පර්ශ වේදනා. ඔන්න එතකොට ඊළඟට දුක් ඇතිවෙනවා. නාමරූපය නිසා ආයතනයන් ඇති වෙනවා. අන්න ඒ විදියටයි දුක් ඇතිවීම කියලා කියන්නේ. ඔන්න එතකොට මේ භව දෙකක් ගැලපීම පිළිබඳ කාරණයේදී අපට විඤ්ඤාණ- නාමරූප කියන දෙකම කල්පනාවට ගන්න වෙනවා. දැන් බොහෝ දෙනා නැවත උපත ගැන කථාකරනවා ඇහෙනවා. විඤ්ඤාණය ගැන විතරයි කියන්නේ. බුද්ධ ධර්මයේ තියෙන මහා ගැඹුරුම තැන තමයි මෙතන.

එතකොට බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනවා විඤ්ඤාණය බැස ගැනීම තුළිනුයි මව්කුසක නාමරූපයක් ඇතිවන්නේ. ඊළඟට එපමණක් නොවෙයි තව ඈතට යනවා. ආනන්ද ස්වාමීන් වහන්සේගෙන්ම අහනවා ප්‍රශ්න කරලා ආනන්ද යම් ආකාරයකින් මව්කුසට විඤ්ඤාණය බැසගත්තාට පස්සේ බිහිවෙන්න කලින් විඤ්ඤාණය මව්කුසින් නිකුත් වුනා. ගිලිහිලා ගියා. එතකොට මව්කුසේ දරුවෙක් වැඩෙයිද? එහෙම නැත්නම් නාමරූපයක් සකස් වෙයිද? නාමරූපයක් ඉතිරිවෙයිද? නාමරූප කියලා එතන කිව්වේ විඤ්ඤාණයට අරමුණු වුනු අරමුණ පමණයි. නමුත් ඒ අරමුණ ජීවයක් හැටියට, මව් කුසක සත්ත්වයෙක් හැටියට ඇතිවෙයිද කියන එකයි අහන්නේ. එතකොට ආනන්ද ස්වාමීන් වහන්සේ කියනවා 'නැතමය ස්වාමීනී' එයින් පෙන්නුම් කරන්නේ විඤ්ඤාණය නැතිව නාමරූපය වැඩෙන්නේ නැහැ.

ඒක තවත් තහවුරු වෙන්න ප්‍රකාශ කරනවා යම් අවස්ථාවක උපන්නට පස්සේ පවා ළදරුවියේදී දරුවකුගේ හෝ දැරියකගේ විඤ්ඤාණය නැතිවුනා, විඤ්ඤාණය ගිලිහිලා ගියා. එතකොට නාමරූපය කියන්නේ දැන් අපි මමය මගේය කියලා කියන මේ ප්‍රතිරූපය- මේ බිම්බය- මේ රූපය- මේ 'මූර්තිය' වැඩෙයිද එතකොට ඉතින් මළකඳක් විතරයි නේ? අන්න එතකොටත් නැතෙයි කියලා ආනන්ද ස්වාමීන් වහන්සේ ප්‍රකාශ කරනවා. අන්න ඒක නිසා විඤ්ඤාණය මුල් වෙනවා. විඤ්ඤාණය ගිහිල්ලා නාමරූපයේ බැස

ගන්නත් ඕන. ඊළඟට විඤ්ඤාණයට නාමරූපය නැතිවත් බැහැ. ඔන්න ඔය දෙක අතර තියෙනවා අන්‍යෝන්‍ය ප්‍රත්‍යසම්බන්ධතාවක්. ඔතනයි ගැඹුරුම කොටස තියෙන්නේ.

මෙන්න මේ නාමරූප කියන වචනය හැමෝටම පැහැදිලි නොවන්න පුළුවන්. දන්නවයි කියල හිතාගන ඉන්න අයටත් සමහර විට වැරදි අවබෝධයක් තියෙන්න පුළුවන්. ඒක නිසා අපි ඒක බුද්ධ වචනයත් සාරිපුත්ත ස්වාමීන් වහන්සේ ආදී ඒ ශ්‍රේෂ්ඨ ස්වාමීන් වහන්සේලා දක්වූ වචනත්, ආශ්‍රයෙන් - පාලිපාඨ නොකීවත් - හිතාගන්න නාමරූපය කියන එක බොහෝ දෙනාගේ උගතුන්ගේ සැලකිල්ලට හේතුවෙලා තියෙනවා. මොකද? සාමාන්‍ය ලෝකයේ අපි මමය මගේය කියන එක මොකක්ද කියන එක තෝරනකොට කියන්නේ මෙතන කයයි හිතයි. හිතයි කයයි තියෙන්නේ. ලේසියට කියන කොට හිතයි කයයි දෙකක්. නමුත් මේ ධර්මයේ ඊට වඩා ගැඹුරට යනවා. නාමරූප කියන වචනයේ හරි ගැඹුරක් තියෙනවා. හිතයි කයයි කියනව නම් ඔන්න බුදුරජාණන් වහන්සේට කියන්න තිබුනා 'චිත්තරූප' හරි 'මනෝ රූප' හරි ඒ වගෙ වචනයක් යොදන්න තිබුනා. ඇයි නාම රූප කිව්වේ? මේ නාම කියන වචනය පවා ඇතැම් කෙනෙක් මේක තෝරන්නේ 'නැමීමක්' හැටියට නමුත් මෙතන නැමීම නොවෙයි කියන්නේ. නම, නම්කිරීම. මොකක්ද නම් කිරීම? නාම ධර්ම ඔන්න බුදුරජාණන් වහන්සේ පෙන්නුම් කරන්නේ මේවා හැටියට- වේදනා සඤ්ඤා, චේතනා, ඵස්ස, මනසිකාර. මේ වචන කීවට මේවා තේරුම් ගන්න අමාරු නැහැ නේ.

වේදනාව කියන එක කවුරුත් දන්නවා. වේදනාව ආශ්‍රයෙන් සංඥාවක් එනවා. සංඥාව ආශ්‍රයෙන් ඒක අනුව පිළිපදින්න පෞද්ගලික වශයෙන් හිතෙනවා. මේක මේ විදියට ක්‍රියා කරන්න ඕනෑ කියලා චේතනාවක් එනවා. එතෙන්දියි ඇත්ත වශයෙන් පෞද්ගලිකත්වය මතුවන්නේ. වේදනා සංඥා චේතනා ඊළඟට ඒකට අරමුණු වන ස්පර්ශය. ස්පර්ශය වන තැනක් තියනවා. එතෙන්ට මනසිකාර කියල කියන මෙනෙහි කිරීමක් යෙදෙනවා. ඔන්න ඔය පහ, අතේ ඇඟිලි පහ වගෙයි. වේදනා, සඤ්ඤා, චේතනා, ඵස්ස, මනසිකාර. ඕවයි බුදුරජාණන් වහන්සේ නාමධර්ම හැටියට තේරුවේ. ඇයි මේවා නාම ධර්ම හැටියට කීවේ? මේවා තුළින් තමයි භාෂාවක් නොදත්තත් කෙනෙක් යමක් හඳුනා ගන්නේ. පොඩිදරුවෙක් පවා. ඒකෙන් එන වේදනාව අනුව සංඥාව, ඒක අනුව චේතනාව- පරීක්ෂණ වශයෙන්. ඊළඟට ස්පර්ශය, මනසිකාර, මෙනෙහි කිරීමෙහි යෙදෙනවා. ඔන්න එතකොට ඒ ප්‍රාථමික වශයෙන් යමක් හඳුනා ගැනීමට උපකාරවන දේවල් එතන බුදුරජාණන් වහන්සේ නාමධර්ම හැටියට සැලකුවා.

ඊළඟට රූපය කියලා කියන්නේ- අන්න ඒ රූපය කියන වචනයෙනුත් යමක් හිතා ගන්න පුළුවන්. අපි දන් ලේසියට 'ද්‍රව්‍යය, ද්‍රව්‍යය'

කියල කියනවා. ද්‍රව්‍ය ගැන නේ කථාකරන්නේ හැමෝම. නමුත් මෙතන ද්‍රව්‍යය නොකියා කිව්වේ මොකද? මෙතන තියෙන්නේ මේ හිතට වැටෙන ඡායාවක් - මේ රූපය කියන එක. එතකොට ඒක බුදුරජාණන් වහන්සේ දක්වනවා ඇත්ත වශයෙන් තියෙන්නේ පඨවි, ආපො, තේජෝ, වායෝ කියල කියන අඳුනාගන්න බැරි විධියේ මහාභූත ධර්ම හතරක්. පඨවි ආපො තේජෝ වායෝ කියන මහා භූත ධර්ම හතර උපාදාන කරගෙනයි, ඒ ආශ්‍රයෙනුයි, රූප සංඥාව කෙනෙක් ඇතිකර ගන්නේ. එතකොට ඒ රූප සංඥාව ඇතිකර ගන්න උපකාර වෙන්නේ අර කියාපු නාම ධර්ම. අන්න එතකොට එතනත් තියනවා මහා පුදුම ගැටළුවක්. නාමය නිසා රූපය පවතිනවා. රූපය නිසා නාමය පවතිනවා. ඒක අතීත පඬිවරුත් තේරුම් අරගෙන තිබුණා. ඒකයි අර පොත පතේ බොහෝවිට දක්වන උපමාවක් තමයි ඇස් පෙනෙන කොරාත් ඇවිදින්න පුළුවන් අන්ධයාත් යන ගමනක් වගේ. රූපය ඇවිදින්න පුළුවන් වුනාට අන්ධයි. නාමය- නාම ධර්ම- පෙනුනට මොකද කොරයි. අන්න ඒ වගේ මේ දෙක එකට යන්න ඕන ගමනක් නාමරූප දෙක- රූප ධර්ම අපි හඳුනාගන්නේ අන්න අරවා තුළින්. ඒ කියන්නේ රූප **සංඥාවක්** ඇත්ත වශයෙන් තියෙන්නේ. ඔන්න එතකොට ඒ නාම රූප ගැනයි.

ඉතින් මෙතන කියනවා අන්න අර ඒ විඤ්ඤාණයක් නැත්නම්- අර ගස් ගල් පිළිබඳ නාමරූප ප්‍රශ්නයක් නැහැ කොහෙත්ම. සවිඤ්ඤාණක- විඤ්ඤාණය සහිත- සත්ත්වයින් පිළිබඳවයි මේ කාරණය තියෙන්නේ. ඒ අයටයි සංසාරයක් තියෙන්නේ. ගස්වල ඇට පැලවුනාට අපි සංසාරයක් කියලා කියන්නේ නැහැ නේ. ජීවයක් ඇති සත්ත්වයින් පිළිබඳව කර්මානුරූපව පහලවන පරම්පරාවයි අපි මේ සංසාරය කියලා කියන්නේ. ඒක ඇතිවෙන්නේ ඔන්න ඔය දෙක අතරේ. එතකොට මේක අර ඒකාන්ත වශයෙන් තමා ඇති කළායි කියන්නත් බැහැ. දෙවියෙක් මැව්වයි කියන්නත් බැහැ. ඉබේ ඇතිවුනයි කියන්නත් බැහැ. හේතු ප්‍රත්‍ය නිසා ඇතිවුනා. ඒ වගේම හේතු ප්‍රත්‍ය නැති කිරීමෙන් නැතිකරන්න පුළුවන්. අන්න ඒ ධර්මතාව එතකොට බුදුරජාණන් වහන්සේ ඉදිරිපත් කළා.

තව ඔන්න ඊළඟට ඒක තව ඇතට යනකොට දැන් නාමරූප කියන වචනය තේරුම් ගත්තා. ආයතන හය කියන එකත් සමහර විට තේරුම් කරන්න වෙනවා. අපි බොහොම දෙනා දන්නවා දැන් ඉන්ද්‍රිය පහක් ගැන කතා කරනවා. ධර්මයේ ඉන්ද්‍රිය හයක් ගැන කියනවා. මනසත් ඇතිව. ඇස, කණ, නාසය, දිව, කය, මන. මේ ඉන්ද්‍රිය හය ක්‍රියාත්මක වන අවස්ථාව ගැන හිතලයි සළායතන- ආයතන හයක්- කියලා කියන්නේ. ඇසට රූපය, කණට ශබ්දය ආදී වශයෙන් මනසට ධර්ම- මනසට වැටෙන දේවල් අන්තිමට. ඒවා ක්‍රියාත්මක වන අවස්ථාව ගැන හිතලා, ඒ එකතුකරලා

ගත්තාම ස්පර්ශ ආයතන කියලා කියන්නේ. ඇත්ත වශයෙන්ම ආයතන හයක් වන්නේ ඒ ජෝඩු, ජෝඩු, යන්නේ ඇසයි-රූපයයි, කණයි- ශබ්දයයි, නහයයි- ගඳ සුවඳයි ඔය ආදී වශයෙන් ක්‍රියාත්මක වන අවස්ථාව ගැන හිතලා ආයතන. ආයතන ගැන කියන කොට දන්නවා නේ ක්‍රියාත්මක වන ඒවා නේ? එතකොට මේ ආයතන හය අර නාමරූපයම- දැන් අර බූවල්ලා වගේ -නාමරූපයයි ඔන්න ඔය හයෙන් අල්ලන්නේ. ඉතින් අපි අර බිහිවුනාට පස්සේ නාමරූපයක් කියලා කියන්නේ මේ ප්‍රතිරූපයක්. විඤ්ඤාණය ගැන අමතක කරනවා සමහරු. විඤ්ඤාණය නිසයි මේක මේ තත්ත්වයට වැටුනේ. නමුත් අන්න අර සළායතන නිසා ඊළඟට ස්පර්ශය ඇතිවෙනවා. ඒ නිසා වේදනාව ඇතිවෙනවා. ඊළඟට තණ්හාව උපාදාන වෙලා ඔන්න තව තවත් ඈතට යනවා. ඔන්න ඔය ටික. මේ හැමෝම කතා කරන මේ පටිච්චසමුප්පාද ධර්මය ගැන අපිට හිතාගන්න පුළුවන්- ඔය ඩිංග. එතකොට වැදගත්ම තැන තමයි අන්න විඤ්ඤාණයත් නාමරූපයත්. එතන සන්ධිස්ථානයක්. ඒ සන්ධිස්ථානයයි අර බුදුරජාණන් වහන්සේ ආනන්ද ස්වාමීන් වහන්සේට ප්‍රශ්නෝත්තර වශයෙන් ප්‍රකාශකොට වදාළේ.

ඒක තවදුරටත් තවත් අවස්ථාවක බුදුරජාණන් වහන්සේ පෙන්නුම් කරනවා ඒ විඤ්ඤාණය-අර විදියටම තමයි - අන්තිමට විඤ්ඤාණය නිසා නාමරූපය පවතින බව පෙන්නුම් කරන්න තමයි අර කිව්වේ විඤ්ඤාණය නැත්නම් නාම රූපය ගිලිහිලා යනවා කියලා. අනික් පැත්තට නාමරූපයට විඤ්ඤාණය අවශ්‍ය බව දක්වන්නේ, යම් විධියකින් විඤ්ඤාණයක් මව්කුසට බැසගත්තේ නැත්නම් නාමරූපයක් ඇතිවන්නේම නැහැ. එ කියන්නේ විඤ්ඤාණය **ප්‍රතිෂ්ඨාවක්** ලබනවා. අන්න එතන විශේෂ වචනයක්. විඤ්ඤාණය නාමරූපයේ **ප්‍රතිෂ්ඨාවක්** ලබන්නේ නැත්නම් මව්කුසක උපතක් ඇතිවන්නේ නැහැ. ප්‍රතිෂ්ඨාව කියන වචනය මතක තබාගන්න වෙනවා. එතකොට සාමාන්‍ය ලෝකයාගේ සාමාන්‍ය කෙලෙස් සහිත විඤ්ඤාණය- අනිවාර්යයෙන්ම කෙලෙස් සහිත විඤ්ඤාණය - නාමරූපයක ප්‍රතිෂ්ඨාවක් ලබනවාමයි. ගිලිහිලා ගියොත් වෙන තැනක හිටිනවා. මේක නැතිවන්නේ නැහැ. එතකොට මේ විඤ්ඤාණයේ මොකක් හරි දෝෂයක් තියනවා. අර කලින් කියාපු දෝෂය තමා- අර උපාදානය නිසා. ඒ උපාදානය නිසාමයි විඤ්ඤාණ- නාමරූප දෙක අතර පුදුම විධියේ සම්බන්ධයක් තිබෙන්නේ. ඒක අපි නොයෙකුත් ආකාරයෙන් උපමා ආශ්‍රයෙන් ඉදිරිපත් කළා.

දැන් අපි මේ අද දවසේ දුන්න ධර්ම පත්‍රිකාව[2] එකපාරට නොතේරෙන්න පුළුවන්. අපි ඒකෙ බටහිර සාහිත්‍යයෙන් ගත්තු උපමාවකින් පෙන්නුවා. අර නාසිසස් පිළිබඳ කතාන්තරය මීට කලින් අවස්ථාවක අපි විස්තර වශයෙන් ප්‍රකාශ කරලා තියනවා ඔය නාමරූපය විග්‍රහ කිරීමේදී. එතෙන්දි අර නාසිසස් කියන ග්‍රීක තරුණයා තමාගේ මුහුණ දැකලා නැති

නිසා කැලේ ඇවිදින අතරේ පොකුණකට නැඹුරුවුනාම මුහුණ පෙනුණා. රූවටුනා මේ දෙවහනක් කියලා. ඊළඟට වැළඳගන්න උත්සාහ කර කර ඉඳලා අන්තිමට මැරිලා ගියා. එතකොට නාසිසස් ඒ දෙවහනක් කියලා වැළඳගත්තු එකම තමයි අපි මේ සංසාරයේ දීර්ඝ කාලයක් මැරෙන අවස්ථාවේ මේ 'මමය' 'මාගේය' කියලා ගත්තු ටික, මේ රූප කොටස හෝ ඒ අනික් ඒවා ටික. ඒ ගත්තු ගැන්ම නිසා තමයි නැවත උත්පත්තියක් ලැබෙන්නේ. සක්කාය-දිට්ඨිය කියලා කියන්නෙත් ඒකයි. ඒක වැළඳ ගන්නවා. වැළඳ ගන්න ගිහිල්ලා අන්තිමට එක්කෝ මව්කුසක වෙන්න පුළුවන්, වෙන තිරිසන් කුසක වෙන්න පුළුවන් වැළඳගන්නවා. අර ග්‍රහණය නිසා.

එතකොට අල්ලගන්න නම් **දෙකක්** තියෙන්න ඕන. උපාදානය කරන්න නම් **දෙකක්** තියෙන්න ඕන. ඒක බොහෝ අවස්ථාවල බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරලා තියනවා, කණ්ණාඩියේ උපමාවෙන්. බුදුරජාණන් වහන්සේ පමණක් නොවේ ශ්‍රාවකයින් වහන්සේලාත්. දැන් උපාදාන ගොඩවල් කියලා කියන්නේ මේ එක එකක්. රූපය, අල්ලා ගැනීම නිසා ඉබේම ඇතිවෙනවා. දැන් කණ්ණාඩියක් අල්ල ගත්තාම වගේ හිතෙන්නේ 'ආ මේ මම තමා.' එහෙම නැත්නම් ඡායාරූපයක් ගත්තාම. 'වෙන කෙනෙක් නොවේ මේ මමමයි.' ඉතින් ඔන්න ඔය විධියට මේ පින්වතුන් අහලා තියනවා ඔය ආත්ම දෘෂ්ටිය ක්‍රියාත්මක වන ආකාරය, බුදුරජාණන් වහන්සේ පද තුනකින් දක්වනවා. 'එතං මම,' 'එසොහමස්මි,' 'එසො මෙ අත්තා,' මෙය මගේ, මෙය මම වෙමි, මෙය මගේ ආත්මයයි. තණ්හාව වශයෙන් 'එතං මම' කියලා අල්ල ගන්නවා. මානයක් ඇති කර ගන්නවා 'මේ මමමයි,' ඔය ඡායාරූපයක් ගත්තාම ඔය ගෙදරවල්වල එල්ලලා තියෙන. 'ඒක නේ. මේ මම තමයි වෙන කවුද?' ඒක ඉතින් හැඩ වැඩ දාල තමයි ගන්නේ. ඒ වුනාට ඒ මම. එතකොට ඊළඟට 'එසො මෙ අත්තා'. අන්න ඒක අර දෘෂ්ටියකට හරවා ගන්නවා. මේකෙ සියුම් අන්දමින්- අපට පෙනුනේ නැතිවාට- ආත්ම කියලා දෙයක් තියනවා. අර භව තණ්හාව නිසා ආත්ම දෘෂ්ටියක් ඇතිකර ගන්නවා. එතකොට 'එතං මම, එසො හමස්මි, එසො මෙ අත්තා' කියලා මේ ගැන්ම නිසා තමයි, ඒ උපාදානය නිසා තමයි, සත්ත්වයා නැවත නැවත උත්පත්තිය ලබන්නේ. අර නාසිසස් වගේම තමයි වැළඳ ගන්න උත්සාහ කර කර ඉඳලා එතනම මැරිලා ගියා.

ඉතින් ඒ ක්‍රමයෙන්ම- මෙතන නාමරූපය කියන වචනය ඔන්න එතකොට තේරෙනවා. ඇයි මේකට මූර්තියක් කිව්වේ? ඇයි බිම්බයක් කිව්වේ? බිම්බ කියන වචනය දැන් පිළිබිඹුව කියන වචනයට කිට්ටුයි නේද? බිම්බ කියන එක- දැන් ප්‍රතිබිම්බය කියන එකත් මේ පින්වතුන් දන්නවා. ප්‍රතිමාව කියන එකට බිම්බ කියන වචනය යොදනවා. පිළිරුව. එතකොට මාරයා කියපු වචනය හරි. කවුරුත් පාවිච්චි කරන මේක බිම්බයක්ම තමයි. මූර්තියක්.

ඒ කියන්නේ තමා හෝ අනුන් හෝ සත්ත්වයෙක් පුද්ගලයෙක් හැටියට හිතන දේ. මේක ඒ හිතාගත්තු ගැන්ම නිසාම. අර කියාපු තණ්හාව නිසයි උපාදානය. අවිද්‍යාවත් තණ්හාවත් නිසයි- කොතෙකුත් අහල තියන ආකාරයට - මේ සත්ත්වයා සංසාරයේ යන්නේ. ඒක නම් කවුරුත් අහලා තියනවා. ඒකයි මෙතනදීත් අවිද්‍යාව නීවරණයක් හැටියට- අවිද්‍යාව කියන එක නීවරණයක් කියලා කියන්නේ, එයින් අවබෝධය වැහෙන නිසා. අවිද්‍යාව කියන නීවරණයට, නැත්නම් ආවරණයට යටවෙලා ඉන්නවා. තණ්හාව සංයෝජනයක්. තණ්හාව හැකිල්ලක්, බැඳීමක්. එතකොට ඔන්න ඔය දෙක තුළිනුයි අපි සංසාරයේ යන්නේ. එතකොට තණ්හාව තුළින් ඇතිවන බැඳීමට හේතුව -මූලික හේතුව- අවිද්‍යාවයි, නොදැන්මයි. අර නාසිසස් නොදැන්ම නිසා නේ - මෙතන පෙනෙන්නේ දෙවඟනක් නොවේ. මේ තමන් බලන වාරයක් පාසා, **බලන වාරයක් පාසා** මේ පෙනෙන ටික. ඒකෙ, අවබෝධය එන්නේ නැහැ.

අපි දන් ඔය පත්‍රිකාවේ පැරණි කතාවෙ නවීකරණයක් කළා. මැරිච්ච නාසිසස්ට පණ ගන්වලා අපි සෝවාන් කළා අන්තිමට. අපි එහෙම හිතමු. අන්න ඒ බුද්ධ ධර්මය ඉදිරිපත් කිරීමට සාධකයක් කර ගත්තා. ඔය පත්‍රිකාවේ තියන ආකාරයට යම් අවස්ථාවක නාසිසස් තේරුම් ගත්තා නම් මේ අර අයෝනිසෝ මනසිකාරය කියල කියන වැරදි මෙනෙහි කිරීම තුළිනුයි වාරයක් පාසා ඒක වැළඳගත්තේ- පිළිබිඹුව. නමුත් යම් වේලාවක තේරුම් ගත්තා නම්- මේක මම නොබලන අවස්ථාවේ තියන දෙයක් නොවේ. මම බලන වාරයක් පාසා දියේ පෙනෙන පිළිබිඹුවක් පමණයි. දියේ තියෙනවා යම් පිළිබිඹු කරන ස්වභාවයක්. ඒක නිසා මේ පෙනෙනවා පිළිබිඹුවක්. වතුර ඇතුලේ කවුරුවත් ඉන්නවා නොවේ. දන් වුනත් ඡායාරූපයක් දකලා ඒකම ඇති නේ කෙනෙකුට- අනික් හරිය කියන්න ඕන නැහැ නේ- දන් ඔය බොහොම ප්‍රිය කරන කෙනාගේ ඡායාරූපය ප්‍රමාණවත්. මොකද හේතුව? ඒකෙ එහා පැත්ත බලනකොට කඩදාසිය තමයි. නමුත් අන්න හිතාගන්නවා මෙතන ඉන්නවා මා ප්‍රිය කරන තැනැත්තා. ඉතින් ඒකම තමයි කා තුළත් තියෙන්නේ. මේ පිටට පෙනෙන ටික - තව ටිකක් ඇඳුම්වලින් සරසලා තියෙනවා. මේක තමයි 'මමය' කියන්නේ. ඒ මම තමයි අර මැරෙන අවස්ථාවේ අතහරින්න අකැමැතිකම නිසා 'අපොයි මා නැතිවෙනවා' කියලා ඊළඟට අල්ලනවා, ග්‍රහණය කරනවා. කර්මශක්තිය තුළින් අර බූවල්ලා වගේ දිගු කරනවා. දිගුකරන කොට අහුවන තැන තමන්ට ඕන කරන තැන නොවෙන්න පුළුවන්. කර්මය කෙත. වැටෙන්නේ කර්ම ක්ෂේත්‍රයට. ඊළඟට අර විඤ්ඤාණය බීජය. පැලවෙන්න පුළුවන් බීජයක් ඒක. අන්න එතනයි හිතාගන්න තියෙන්නේ. පැලවෙන්නේ අර කියාපු කෙලෙස් නිසා. ඊළඟට ඒ පැලවෙන ස්වභාවය නිසා තණ්හාව නමැති දිය සීරාව ඒකට උපකාර වෙනවා. අන්න දන් හිතාගන්න පුළුවන් බුදුරජාණන් වහන්සේ දීපු උපමාව අර්ථවත් වෙනවා ක්‍රම ක්‍රමයෙන්.

එතකොට ඉතින් අපට මේක ගැන කියලා, හේතුව ඇතිවීම පමණක් කියලා, නතරවෙනවා නම් ඒක ධර්මය නොවේ. කවුරුත් බලාපොරොත්තු වෙන්නේ මේකෙන් මිදීමයි. කෘත්‍රිම ක්‍රම තියෙනවා මේ කාලේ ලොකුවට හිතන වෛද්‍ය ශාස්ත්‍රය අනුව පෙන්නුම් කරන, නැවත උපත නැති කරන්න. තවත් නොයෙකුත් දේවල් තියෙන්න පුළුවන්. කවදාක්වත් ඒක කරන්න බැහැ. අන්න අර කියාපු සංසාර ස්වභාවය නිසා කොතනක හරි උපදිනවා. ඒක තැනකින් මරලා දම්මත් වෙන කොහේ හරි උපදිනවා. කර්මවේගය නිසා සමහර විට ඒක වෙන්නේ. ඉතින් ඔන්න ඔය විධියේ තත්ත්වයක් තියෙනවා.

ඉතින් අපට අවශ්‍ය දේ- මේක නැති කරන්නේ කොහොමද? මේ නැවත ඉපදීම නැති කරන්නේ කොහොමද? 'අනෙක ජාති සංසාරං-සන්ධා විස්සං අනිබ්බිසං' කියලා බුදුරජාණන් වහන්සේ බුද්ධත්වය ලැබුවාට පස්සේ 'මම මේ අනන්ත කාලයක් මේ සංසාරයේ දිවුවා' 'ගහකාරකං ගවෙසනෙතා'- මේක හදපු වඩුවා සොයමින්. 'නැවත නැවත ඉපදීම දුකක් - දුක්ඛාජාති පුනප්පුනං. ගේ හැදුව එක්කෙනා දුටුවා. කවුද ඒ? ඔන්න ඔය කියාපු අර විඤ්ඤාණය පිළිබඳ තත්ත්වයයි. මේ මායාකාරී විඤ්ඤාණය. නාසිසස් තේරුම් ගත්තා වගේ 'මේක මගේම විඤ්ඤාණය, මගේ හිත ඇතුළෙයි දෙවඟන ඉන්නේ කියලා තේරුම් ගත්තා යම් අවස්ථාවක.' සක්කාය දිට්ඨිය කියන්නේ ඒකයි. මේක මේ උපාදානය දෙකක් හැටියට හිතා ගැනීම තුළින්. තණ්හාව බලාපොරොත්තු වෙනවා තව අල්ලගන්න දෙයක්, උපාදානය තුළින් එකක් ඉදිරිපත් කරනවා. ඉදිරිපත් කරන්නේ නාමරූපයයි. ඉදිරිපත් කරන්නේ අර ඡායාව. ඒක අල්ලා ගන්නවා. එතකොට ඒ මුළාව නිසා. ඊළඟට ඇතිකර ගත්තු චේතනා වලින්, ආසා වලින්, ඇලීම් වලින් ගැටීම්වලින්, මුළාවීමේ ප්‍රතිඵලයක් හැටියට ඔන්න ඊළඟට උත්පත්තියක් එනවා. ඉතින් ඔය ටිකයි පටිච්චසමුප්පාදයේ ගැඹුරුම කොටස.

ඒ අර මුලින් ඇතැම් කෙනෙක් අවිජ්ජාවෙන් පටන්ගෙන අවිද්‍යාව නිසා සංස්කාර, සංස්කාර නිසා විඤ්ඤාණය, විඤ්ඤාණය නිසා නාමරූප- එහෙම කියාගන යනවා. නමුත් ඔතන ගැඹුරුම කාරණය අවිද්‍යාව නමැති අන්ධකාරයේ කෙරෙන අතපතගෑම් නමැති සංස්කාර නිසයි විඤ්ඤාණයත් නාමරූපයත් අතර මෙන්න මේ පෙරළිය වෙන්නේ. විඤ්ඤාණය නාමරූපයෙන් සම්පූර්ණයෙන් වෙනස්වුන දේකුත් නොවෙයි. නාමරූපය විඤ්ඤාණයෙන් සම්පූර්ණයෙන් වෙනස්වුන දේකුත් නොවේ. විඤ්ඤාණයෙන් ඇහුවොත් 'තමුසෙ කව්ද?' කියලා නාමරූපයෙන් අහන්න කියාවි. ඇයි? වේදනා සංඥා ආදිය එතනට සම්බන්ධයි නේ? නාමරූපයෙන් ඇහුවොත් 'තමුසෙ කව්ද?' කියලා විඤ්ඤාණයෙන් අහන්න කියාවි. අන්න එහෙම මහ පුදුම 'අඤ්ඤමඤ්ඤ පච්චයතාව' කියල එකක් බුදුරජාණන් වහන්සේ පෙන්නුම් කරන්නේ- අන්‍යෝන්‍ය ප්‍රත්‍යය සම්බන්ධතාව. අපි බොහෝ අවස්ථාවල ප්‍රකාශ කරලා තියෙනවා,

සාරිපුත්ත ස්වාමීන් වහන්සේ අර බටකෝටු මිටි දෙකක් උපමාවට ගත්තා. එකක වත් හරයක් නැහැ. බටකෝටු. එතකොට ඒ බටකෝටු මිටි දෙකක්, උඩින් එකකට එකක් හේත්තු වන හැටියට තියෙන්නා වගේ, විඤ්ඤාණ ප්‍රත්‍යයෙන් නාමරූපයත්, නාමරූප ප්‍රත්‍යයෙන් විඤ්ඤාණයත් ඇතිවෙනවා කියනවා. එතකොට මේකෙ එක්කෝ විඤ්ඤාණ බටකෝටු මිටිය අදින්න ඕනැ. එහෙම නැත්නම් නාමරූප බටකෝටු මිටිය අදින්න ඕනැ. එතෙක් මේ සම්බන්ධතාව යනවා.

කොහොමද අදින්නේ? මේක ඇදෙන්නේ අන්න අර අවිද්‍යාව කියන යම් මෝහයක් මුළාවක් නිසා නාසිසස් අර ක්‍රියාවලියේ යෙදුනද, ඒ මුළාව- අවිද්‍යාව- වෙනුවට ප්‍රඥාව පහළවුනාද, ඒ අවස්ථාවේ තේරුම් ගන්නවා. අර අඳුරේ අතපත ගෑම් ඉවරයි එතකොට. අවිද්‍යාව ශක්තිමත් ප්‍රමාණයටයි සංස්කාර ශක්තිමත් වෙන්නේ. අවිද්‍යාව තුනී වෙනකොට සංස්කාර- අර සකස්කිරීම්, සූදානම් වීම්, අර ඇදීම්, ඒවා එන්න එන්නම සියුම් වෙලා යනවා. අවිද්‍යාව සම්පූර්ණයෙන්ම නැතිවුන අවස්ථාවේ, ආලෝකය පහළවුන අවස්ථාවේ, අන්න එතකොට අර සිනමා තිරයේ යමක් මැකිලා යන්නා වගේ තේරෙනවා මෙතන යථාතත්ත්වය.

එතකොට ඒ අවබෝධය කරා යන මාර්ගයත් බුදුරජාණන් වහන්සේ විවිධ සූත්‍රවල විවිධාකාරයෙන් දක්වලා තිබෙනවා. ඉතාමත්ම ගැඹුරින්- මේ ධාතු ගැන අපි ප්‍රකාශ කළ නිසා- ඒකට උපකාර වන සූත්‍රයක් තමයි ධාතු විභංග සූත්‍රය. මීට කලිනුත් අපි යම් ප්‍රමාණයකට විග්‍රහ කළා. ධාතු විභංග- ධාතූන් පිළිබඳව ප්‍රඥා ඇසින් බලනවා නම් එතකොට බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කළා කිසිම ශ්‍රමණ බ්‍රාහ්මණයෙකුට ප්‍රතික්ෂේප කරන්න බැරි අන්දමින් මම ප්‍රකාශ කළා ධාතු හයක් තියනවා කියා. ඉතින් රාහුල ස්වාමීන් වහන්සේටත්, තව නොයෙකුත් අවස්ථාවලත්, බුදුරජාණන් වහන්සේ පෙන්වලා දුන්නා මේ ධාතූන්ගෙන් හිත මුදාගන්නා ආකාරය.

කොහොමද මුදා ගන්නේ? ඔන්න මේකෙදි වැදගත් වන වචන දෙකක් තිබෙනවා දැන්, මේ **උපාදින්න අනුපාදින්න** කියලා. උපාදින්න කියන වචනය බොහෝ විට ධර්මයේ පාවිච්චි වෙන්නේ දැන් මරණ අවස්ථාවේ දැඩි ග්‍රහණයක් තියෙනවා නේ. ඒ ග්‍රහණයේ ප්‍රතිඵලයක් හැටියට තමයි ඒ කළල රූපය- මව්පියන් නිසා ඇතිවෙච්ච කළල රූපය- ජීවයක් බවට පත්වන්නේ- ඒ මඩ පැල්ලම. එතකොට ඒක අන්න එතනදී අර ඒ හිතෙන් ගත්තු ගැන්ම ධාතූන් පිළිබඳව- 'පඨවි, ආපෝ, තේජෝ, වායො කියලා කියන්නේ මහා භූත ධර්ම නොවේ. ඇත්ත වශයෙන්ම පඨවි කියන්නේ පොළව. අපො කියල කියන්නේ වතුර. තේජෝ කියන්නේ ගින්දර වායො කියන්නේ හුළඟ.' ඔය විධියට සාමාන්‍ය පොඩි දරුවා තේරුම් ගන්නවා වගෙයි සාමාන්‍ය පෘථග්ජනයාගේ අවබෝධය. බුදුරජාණන් වහන්සේ පෙන්නුම්

කරනවා ඒ පෘථග්ජන සංඥාව වෙනුවට තේරුම් ගන්න ඕනෑ මේ අපි පෘථිවිය කියල ගන්නේ මොකද? අන්න එතනදී නාමරූප කථාව එනවා. මේ රූප ධර්මයන් හඳුනා ගන්නේ නාම තුළින්.

මේ පින්වතුන්ට සරල කතන්දර කිය කියා කාලය ගත කරනවා නොවෙයි. සමහරු අහලත් ඇති නේ - පරණ කතන්දර සමහර විට උපකාර වෙනවා, අර අන්ධයාට කිරි හඳුන්වලා දීපු හැටි. ඇස් පේන්නෙ නැති නිසා, සුදුපාට දන්නේ නැති නිසා, කොකෙක් ගෙන්නලා -කොකා සුදුපාට නේ- අල්ලලා බලන්න කීවා. 'ආ! කිරි මේ වගේ නේ' අන්න ඒ වගෙයි පෘථග්ජනයාගේ අවබෝධය- පඨවි පිළිබඳ අවබෝධය, ආපො පිළිබඳ අවබෝධය. මේවා මහා භූත- අඳුනා ගන්නා බැරි මහා භූත ධර්ම. විඤ්ඤාණයක් සහිතව, විඤ්ඤාණයට ගෝචර වන ආකාරයට- අපි අර අලුත් වචනයක් කීවා **මානවාභිමානය** කියලා මනුෂ්‍යයාට ඔක්කොම තේරෙනවා කියල හිතාගන අපි මේ ලෝකය ගැන විග්‍රහ කරන්න ගිහිල්ලා භෞතිකවාදය තුළ අතරමං වෙනවා. මේවා ඇත්ත වශයෙන් කොහේ හරි තියෙනවා කියලා. පඨවි ආපෝ තේජෝ වායෝ කියන ඒවා දේවල් හැටියට. ඉතින් ඒක නිසා බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනවා මෙන්න- ඇත්ත වශයෙන්ම තියෙන්නේ අන්න අර උපාදානය නිසා, මැනීම නිසා. උපාදින්න වශයෙන් ග්‍රහණය කර ගත්තු මේ ශරීර කූඩුවට තමයි අපි මුල් තැන දෙන්නේ. ඒක රැක ගන්නයි ඔක්කොම කරන්නේ. ඒක රැක ගන්න අපි උපකාර කරගන්න ටිකට අනුපාදින්න කියල කියනවා. උපාදින්න නොවන යම්තාක් දෙයක් තියනවා නම් ඒක 'අනුපාදින්න'- උපාදින්න නොවන. දැන් අපේ ශරීරයට අදාළ දේවල් රැක ගන්න උත්සාහ ගන්නේ  බාහිරව තියෙන දේවල් වලින්, අන්න අනුපාදින්න. ඔය දෙක අතර තියනවා ගැටුමක්. ඔය දෙක අතර තියන ගැටුම නිසා තමයි, දැන් අපි දන්නවා කවුරුත් ඔය ධාතු කෝප, සෙම් කෝප ආදිය කියන්නේ ඒ අර ඒවා සමනය නොවීමෙන්. ඒවා තුළින්මයි අන්තිමට මරණයට පත්වන්නේ. කොච්චර උත්සාහ කළත්, වා- පිත්- සෙම්- ආදී වශයෙන් ඕවා මතුවෙලා එනවා. නමුත් මේක රැකගන්න අපි දඟලනවා. ඔය විධියයි තත්ත්වය. ඉතින් ඒ වෙනුවට බුදුරජාණන් වහන්සේ ප්‍රඥාව තුළින් මේවා පිළිබඳව තියන තණ්හාව, ඇල්ම, නැති කර ගන්නා හැටි බොහෝ අවස්ථාවල ප්‍රකාශ කරලා තියෙනවා. ඒවා අපි කලිනුත් ප්‍රකාශ කරලා තියෙනවා.

ශරීරය තුළ තියන කොටස් තිස්දෙකක් ඔය අසුභ භාවනාවට- පිළිකුල් භාවනාවට- මේ පින්වතුන් යොදා ගන්නවා. එයින් මුල් විස්ස පඨවි ධාතුව නියෝජනය කරනවා. අනික් දොළහ ආපො ධාතුව නියෝජනය කරනවා. සවිස්තරව නොකීවත් තේජෝ ධාතුව ක්‍රියාකාරී වන ආකාරය බුදුරජාණන් වහන්සේ පෙන්නුම් කරලා තියනවා. වායො ධාතුව ශරීරය තුළ ආශ්වාස ප්‍රශ්වාස ආදී වශයෙන් ක්‍රියාත්මක වෙනවා. එතකොට ඒක -

අජ්ඣත්තික- ආධ්‍යාත්මික පඨවි ධාතුවයි. ඊට බාහිරව තියෙන්නේ බාහිරව තියන ගස් ගල් ආදිය, බාහිර පඨවි ධාතුවයි. එතකොට භාවනාවක් වශයෙන් යම් ආධ්‍යාත්මික පඨවි ධාතුවක් වේද, ඇතුළත පඨවි ධාතුවක් වේද, යම් පිටත පඨවි ධාතුවක් වේද, ඒ දෙකම පඨවි ධාතුව වශයෙන් ගත්තොත් එකමයි. ඒ දෙකම පඨවි ධාතුව වශයෙන් සලකන විට එකමැයි. ඒක පළමු පුරුද්ද වෙනුවට ඔන්න බුදුරජාණන් වහන්සේ- 'එතං මම' කියන කථාව වෙනුවට- ඒකට **"න"** යන්නක් ඉදිරිපත් කරනවා. විදර්ශනාවට ඕනෑ වන්නේ **"න"** යන්න විතරයි. මෙතෙක් 'එතං මම, එසො හමස්මි, එසො මෙ අත්තා' කිව්වා. ඒ වෙනුවට**"න"**යන්නක් ඉස්සරහට දානවා. මේක කියන තර්කයක් හැටියට නොවේ, තමාගේ හිතට කාවද්දා ගන්නවා. **"න** එතං මම" මෙය මගේ නොවෙයි.**"න** එසො හමස්මි" මේ මම නොවෙමි. **"න** එසො මෙ අත්තා" මේ මගේ ආත්මය නොවේ. ඒ ටික තමයි අන්තිමට නාසිසස් වටහා ගත්තේ. මොළේ ආවට පස්සේ- අවබෝධය ආවට පස්සේ, යොනිසො මනසිකාරයෙන්. ආත්ම ස්නේහය පිළිබඳ වචනයක් ඒ **'නාසිසිසම්'** කියන වචනය දැක්වුයේ ඔය පත්‍රිකාවේ. නාසිසස් කියන ඒ පුද්ගලයා ආශ්‍රයෙන්. මේ බටහිර සාහිත්‍යයේ තියෙන වචනයක්. නමුත් මේක බෞද්ධයින්ට අර්ථවත් කර ගන්න පුළුවන්. **ඒ දෙවඟන වැළඳ ගැනීම වගේ තමයි තමන් වැළඳ ගැනීම.** සංසාරයේ අපි මෙතෙක් කල් කළේ ඒකයි.

එතකොට මේකෙන් මිදෙන්නේ මේක දුක නිසා- ව්‍යසනයක් නිසා. අර මෙහෙණින් වහන්සේ කියන හැටියට මේක ව්‍යසනයක්, දුකක්. එතකොට මේකෙන් හිතූ පලියට මිදෙන්නත් බැහැ. අර කෘත්‍රිම ක්‍රම වලින්, උපත් පාලන වලින්, මිදෙන්නත් බැහැ. එහෙනම් කරන්න තියෙන්නේ අන්න අවබෝධය තුළින්. අවිද්‍යා නීවරණය ඉවත් කරන්න ඕන. ඒ වැස්ම. ඒ වැස්ම ඉවත් කරන්නේ කොහොමද? අවිද්‍යා නීවරණය ඉවත් වන්නේ ප්‍රඥාව මතුවුන අවස්ථාවේ. ඊළඟට තණ්හා කියන බන්ධනය නැතිවෙන්නේ කලකිරීම ආව අවස්ථාවේ. අන්න ඒකටයි බුදුරජාණන් වහන්සේ ඊළඟට රුකුල් දෙන්නේ. ඒ කලකිරීම කියන වචනයට අතීතයේ යොදලා තියෙන්නේ නිබ්බිදා කියල. නිර්වේදය- එපා කම. එතකොට එපාකම ඇතිවන්නයි අර විධියට භාවනාවක් වශයෙන් මෙතෙක් 'මමය මාගේය' කියල ගත්තු දේවල් අර කියාපු කුණප කොට්ඨාශ පවා- අපි සාමාන්‍යයෙන් ජීවිතයේ කුණප හැටියට සලකන්නේ නැහැ නේ? පුළුවන් තරම් ඒවා හෝදලා කියලා ලස්සන කරගෙන ඉදිරියට පෙන්නනන්න නේ යන්නේ. එතකොට මේ පින්වතුන් අශුභ භාවනාව දන්නවා. අසුභ පැත්තෙන් බලලත් පුළුවන් ඒකෙන් සිත මුදා ගන්න- ප්‍රඥාවන්තයට - ධාතු වශයෙන් හිතලත් පුළුවන්, හිත මධ්‍යස්ථ භාවයට ගේන්න. දන් අසුභ භාවනාව තුළින් පිළිකුල් වශයෙන් සලකලා හිත මුදා ගන්නවා. ධාතු මනසිකාරය

තුළින් උපේක්ෂාවට ගෙන එනවා. කොහොමද උපේක්ෂාවට ගෙන එන්නේ? මෙතන තියන පඨවි ධාතුව තමා අතන තියෙන්නෙත්. මෙතන තියන ආපො ධාතුව තමා අතන තියෙන්නෙත්. පඨවි ධාතුව වශයෙන් බැලුවම එකයි. ආපොධාතුවත් ඒ විධියට. උපේක්ෂාවට- මධ්‍යස්ථ භාවයට- හිත ගෙන එනවා. ඒ තුළින් අර තියන ග්‍රහණය- උපාදානය- බුරුල් වෙනවා. අන්න එතනයි එතකොට අවිද්‍යාව දුරුකිරීමට ඒ ධාතු මනසිකාරය උපකාර වන තැන.

ඒ හතර පමණක් නොවේ, ඊට වඩා ගැඹුරු පැත්තක් තියනවා, රූපය ගැන කතා කරන කොට හැම තිස්සෙම රූපයත් එක්කම පසුබිමක් තියනවා. ඒක තමයි අරූප කියලා කියන්නේ. එතකොට රූපයෙන් හිත මුදාගන්න යන කෙනා එතන ද්වයතාව තුළ හිරවෙනවා. රූපයෙන් මිදෙනකොට ඊළඟට අරූපයක් එනවා. රූප නොවන එකක්. ඒ දෙකම අතහරින්න වෙනවා. ඒ නිසා තමයි ඒකට උපකාර වන්නේ අවකාශය, ආකාස. මේ ශරීරයේ තිබෙන සිදුරු ගැනත් හිතනවා. මුව සිදුරු, කන් සිදුරු ඒ ඇතුළත තියන ආකාශ ධාතුවයි. පිටත තියන අවකාශය අවට දිහා බැලුවාම පෙනෙනවා. අන්න එතකොට ඒකත් අවකාශ ධාතුව. මේකත් මගේ නොවේ. මම නොවේ. අන්න ඒ විධියට ඇත්ත වශයෙන් මේ ශරීරයට, මේ ඇඟට, දාන ආහාර ආදිය අර පැය ගණනක් හරි, දින ගණනක් හරි, මේකේ රැඳෙන්නේ නැතිව දානවත් එක්කම එළියට යනවා නම් මේකට කියන්න වෙන වචනය 'බෝක්කුව' බෝක්කුව- බෝක්කුව ඉතින් නොමමර හැටියට දාන්න පුළුවන්. දැන් ඔය පාරේ තියෙන්නේ එක එක බෝක්කු. අංක එකේ බෝක්කුව, අංක දෙකේ බෝක්කුව, ඒක යට තව දරුවන් ඉන්නවා නම් ඒවටත් දාන්න පුළුවන්. අන්න ඇත්ත වශයෙන් ඒ වගේ දෙයක්.

නමුත් මේ මාරයාගේ මැවුම කොයි තරම් සියුම්ද කියතොත් - අපි මාරයා කියලා කියන්නේ ඇත්ත වශයෙන් මේ කෙලෙස් ගොඩට- ඉතින් තව පැත්තක් තියනවා. නමුත් අපි ඒ අතට හිතල බැලුවොත් අපි රැවටෙන්නේ මොකද? යම්කිසි කලක් මේක ඇතුලේ තිබිලා පිටවෙන්නේ. **පිටවීම ගැන අපි හිතන්නේවත් නැහැ.** ඒකයි බුදුරජාණන් වහන්සේ කියන්නේ **සාමාන්‍ය පෘථග්ජනයා ඉන්නේ සමුදය පක්ෂයේ** කියලා. සමුදය පක්ෂය කියලා කියන්නේ හටගැනීම පමණයි, ඒ තැනැත්තාට පෙනෙන්නේ. නිරුද්ධ වෙන එක ගැන කැමතිත් නැහැ බලන්න.

දැන් භෝජන සංග්‍රහයකට යන කෙනා භෝජන සංග්‍රහය කෙරෙන අතරේ සමහරවිට ඒ කිට්ටුව තියන පොඩි කාමරයකට යන්න පුලුවන්. ඒ මොකටද කියලා අපි කියන්නවත් යන්නේ නැහැ. ඒක ඒකේ ප්‍රතිඵලය තමයි. නමුත් අපි ඒවා ගැන හිතන්නේ නැහැ. අර ඒ තියන ටික මාන්නය වශයෙන් ගන්නවා. මේ මමය කියලා. අන්න ඔය විදියෙ දෙයක් තියෙන්නේ. නමුත්

මෙයින් මිදෙන්න ඕන නම් බුදුරජාණන් වහන්සේ කියන්නේ **නිරෝධය දකින්න වෙනවා. නිරෝධ පැත්ත මතුකර ගන්න ඕන.** අමාරුවෙන් කරන්න තියන එකක්. අපි මේ ඒකයි කියන්නෙ බොහෝ දෙනා මේවාට විරුද්ධව කතා කරනවා. මේ නිකන් හිත දුර්වල කරගන්න මොකද්ද මේ බුදුහාමුදුරුවෝ කියලා තියෙන්නේ. මේක අශුභදර්ශනයක් -සර්ව අශුභ දර්ශනයක්- ඔය විධියේ නොයෙකුත් දේවල් ඉදිරිපත් කරනවා. එතකොට සංසාරය තියෙන්නේ අන්න අර සමුදය පැත්තේ. 'දැන් මේ දවස ගෙවුනට මොකද හෙට උදේ ඉර පායන්නේ.' ඔහේ ඉන්නවා. අන්න ඒ වගේ දෙයක්, නමුත් බුදුරජාණන් වහන්සේ පෙන්නුම් කරනවා මේ හැමදෙයක්ම උපදින්නේ මැරෙන්නයි. නැතිවෙන්නයි. **උපදින්නෙ මැරෙන්නයි**. ඒ කීම පමණක් නොවෙයි අන්තිමට ඒක විනිවිද පෙනෙන අවස්ථාවක් ඇති වෙනවා. **ඉපදෙන්නේ මැරෙන්නයි, කියන එක මැරෙනකන් ඉන්නේ නැතිව එක පාරටම ඉපදීමත් එක්කම නිරෝධය පෙනෙන අවස්ථාව තමයි විනිවිද යන අවස්ථාව**. අන්න ඒ තත්ත්වයට, ඒකට, විදර්ශනා ඥාන ආදියේ භංග ඥාන කියලා කියන්නේ. **භංග ඥානය.** ඇතිවීම් නැතිවීම් බල බලා ඉඳලා ඇතිවීම් නැතිවීම් පෙනෙන ඒ දර්ශනය දියුණු කරගෙන ගිහිල්ලා යම් අවස්ථාවක ඒක උග්‍ර වුනාම ඇතිවීම පෙනෙන්නේ නැති තරම් ශීඝ්‍රයෙන් නිරෝධය පෙනෙනවා. ඇති වෙන්නේ, උපදින්නේ, විනාශ වෙන්න. උපදින්නේ විනාශවෙන්න. අන්න එතකොට සැබෑ වශයෙන්ම භයක් ඇති වෙනවා. භයක් ඇතිවෙලා මේවා ඇත්ත වශයෙන් මම බදාගෙන ඉන්න නිසා නේ මේවා අතහරින්න බය. මෙතන තියෙන්නේ සංස්කාර ගොඩක්. අන්න සංස්කාර කියන වචනය  මේ පින්වතුන් කොතෙකුත් අහල තියනවා. සකස් කිරීම්. සකස් කිරීම් කියන වචනය ගැලපෙනවා අන්න අර මූර්තිය කියන එකත් එක්ක. දැන් අර පිළිබිඹුව කියන එක අපි කවුරුත් දන්නවා. අපි පිළිමයක් දිහා බලල නම් සාමාන්‍යයෙන් දන්නවා, ඒත් රූ වටෙන අවස්ථාවල් තියෙනවා, ඡායාරූප ආදිය. නමුත් අර මවාපාපු දෙයක්, සැරසීමක්, සරසල පෙන්නපු දෙයක්, කියලා කියන්නේ. දැන් නළු නිළියන් එහෙම වේදිකාවට ගොඩවෙන්න කලින් නානාප්‍රකාර දේවල් කරනවා නේ ඒ ටික තමයි සංස්කාර.

දැන් මෙතන **මේ අඳුරේ අතපත ගෑම- අවිද්‍යාව තුළ අඳුරේ අතපත ගෑම** -මේවා තුන් ආකාරයකින් අපි කරනවා එදිනෙදා ජීවිතයේ. කයින් අතපත ගානවා. වචනයෙන් අතපත ගානවා. සිතින් අතපත ගානවා. කාය සංස්කාර, වචීසංස්කාර මනෝ සංස්කාර. මනෝ සංස්කාර කියලත් කියනවා චිත්ත සංස්කාර කියලත් කියනවා. ඒකේ තවත් ගැඹුරු පැත්තක්- කෙටියෙන් ගත්තොත්. එතකොට මේ කයක් කියල එකක් අපට තියෙනවා. ඒකේ වගකීම මම ගන්නවා. **මේ මගේ කය**, දැන් ඒකෙන් හිතාගන්න පුළුවන් මේ පින්වතුන්ට යමක් කර්මය පිළිබඳවත්. අපි ඇවිදින අතරේ නොදැනුවත්ව

සතෙක් පැගෙනවා. අනේ ඉතින් සමහර විට කණගාටු හිතෙනවා. නමුත් සතෙක් දැකලා 'මූ මරන්න ඕන' කියලා අතින් පයින් ගහනවා. සම්පූර්ණයෙන්ම මුළු ශරීරයේම බර යොදලා. එතකොට ඒ **මමයි** ඒක කරන්නේ අර **'මම'**. ඉබේ කෙරුනා නොවේ. අන්න ඒකට කියනවා කර්මයට අහුවෙනවා කියලා. එතැනදී තේරෙනවා නේ එතකොට ශරීරය ඇත්ත වශයෙන්ම මගේ කියලා ගත්තු අවස්ථාවේ එතන ඉඳලාම කර්මයට යටවෙනවා. ඒ කර්ම සංස්කාර වලට ගෙවන්න වෙනවා. ඒවායේ විපාක. විපාක නොදී යන්නේ නැහැ කියලා බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනවා. එතැනයි මේ සංසාරයේ තියෙන භයානකම තැන. ඒ කර්මයත් විපාකයත් අතර. විපාක කථාව කිව්වෙත් ඒක නේ. ඒකයි දැන් අපි කලින් අවස්ථාවක කිව්වේ කාමභව කියලා- දැන් ඔය ගොඩනැගිලි හදලා තියෙන්නා වගේ ඕන කෙනෙකුට ගන්න- එහෙම එකක් නොවේ මේක. කර්ම ශක්තියක් තුළිනුයි භවයක් පවා ඇතිවන්නේ කෙනෙකුට. **ඒක භෞතික දර්ශනය තුළින් හිතලා තේරුම් ගන්නත් බැරි තරම් සියුම් කාරණයක්. සිතිනුයි මේවා හදන්නේ. "මනො පුබ්බංගමා ධම්මා- මනො සෙට්ඨා මනොමයා"** කිව්වේ ඒකයි අවසාන වශයෙන් බලනකොට, අවසාන පරිච්ඡේදයෙන් බලන කොට, ධාතු හතරක් තියෙනවා තමයි. ඒවා පවා අන්න අර කර්ම ශක්තියට යටයි. කර්ම ශක්තිය තුළින් ඒවා ග්‍රහණයට අරගෙන- ඒක නිසා ඉදිරියට යන්නෙ.

එතකොට කරන්න තියෙන්නේ මොකක්ද? අන්න අර කියාපු උපාදානය- අල්ලා ගැනීම- එයින් හිත මෑත් කර ගන්නවා. ඒක තමයි අර ධාතු විභංග සූත්‍රයේ විශේෂයෙන්ම ක්‍රමානුකූලව බුදුරජාණන් වහන්සේ පෙන්නුම් කරන්නේ ඒ පඨවි ධාතුවෙන් සිත මෑත්කර ගන්නා ආකාරය. පඨවි ධාතුව සිතේ ඇදිලා තියෙන්නේ. සංසාරයේ දීර්ඝකාලයක් මේක ගලක් පර්වතයක් වගේ හිතෙන හැටියට ගත්තු එක යම් අවස්ථාවක අර භාවනාව තුළින් - 'ඇතුළත තියෙන්නෙත් පිටත තියෙන්නෙත් මේකමයි. මේක ආත්ම වශයෙන් ගතයුතු දේකුත් නොවේ.' කියලා අන්තිමට නාමරූප වශයෙන් තේරෙනකොට මේ ගත්තු සංඥාවක් පමණයි. **වේදනා සංඥා චේතනා ස්පර්ශ මනසිකාර ආදියෙන් පර්යේෂණය කරලා**. මේ දැන් ටිකකට හිතන්න, යමක් තදද බුරුල්ද කියලා දැනගෙන නේ මේක පඨවි කියල කියන්නේ. අල්ලල බලනව නිසැක වීමට. අන්න පඨවි. අපි මේක පොළව හරි ගලක්හරි කියල- සමහර විට ගලක් නොවන දෙයක් වෙන්න පුලුවන්. ආපො දියාරු ගතිය. ඒ හැම එකක්ම ඒ පරීක්ෂණය කරන්නේ අන්න අර නාම ධර්ම තුළින්. වේදනා, සඤ්ඤා, චේතනා, ඵස්ස, මනසිකාර. එතකොට මේ අපට **ඇස් පෙනෙනවා කියල හිතුවට අන්ධයි.** ඒකයි බුදුරජාණන් වහන්සේ කියන්නේ පෘථග්ජනයා අන්ධයි කියලා. ආර්යයාට ඇස පහළ වෙනවා කියන එකේ තේරුම බොහෝ දෙනා දන්නේ නැහැ. **ධර්ම චක්ෂුසය කියන එක දන්නේ නැහැ.**

ධර්ම චක්ෂුසය කියන්නේ ඒකයි. අන්න අර ලෝකයා හිතන තත්ත්වය නොවෙයි මෙතන තිබෙන්නේ. මේවා දේවල් නොවේ. මෙතන තිබෙනවා මහ පුදුම වට්ටයක්. ඒක අපි සමහර වෙලාවක පෙන්නුවා. දිය සුළියක් වගේ, විඤ්ඤාණයත් නාමරූපයත් අතර. බුදුරජාණන් වහන්සේ ඉතාමත් ගැඹුරු අන්දමින් දක්වනවා ආනන්ද හාමුදුරුවන්ට අර අවස්ථාවේදීම. අවසානයෙ ප්‍රකාශ කරනවා. විඤ්ඤාණය නිසා නාමරූපය පවතිනවා, නාමරූපය නිසා විඤ්ඤාණය පවතිනවා, මෙන්න මේ දෙක අතරෙයි කෙනෙකුගේ ඉපදීම, දිරීම, මැරීම, නැවත ඉපදීම ආදී යම්තාක් මේවා පිළිබඳ ප්‍රඥප්ති ව්‍යවහාර ආදිය යොදන්න පුළුවන් නම්, ඒ ඔක්කොම තියෙන්නේ මේ දෙක අතරෙයි කියලා. මේ දිය සුළිය තුළයි කියලා. ඉතින් අපි දිය සුළියක් දැක්කාම ඒකට නමක් දෙනවා නේ. යම් ක්‍රියාකාරිත්වයක් තියනවා නම් ඒක අපි තැනක් හැටියට ගන්නවා. දෙයක් හැටියට ගන්නවා. ඕන නම් නමකුත් දෙනවා ඒකට. ඒ වගේ තමයි විඤ්ඤාණය නිසා නාමරූපය පවතිනවා. නාම රූපය නිසා විඤ්ඤාණය පවතිනවා. මේ දෙක අතර 'වට්ටං වට්ටති ඉත්ථත්තං පඤ්ඤාපනාය' කියලා බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනවා. මෙලොව මේ **පැවැත්ම කියලා කියන්නේ ඔය දෙක අතරේ තියෙන කරකැවිල්ලයි.**

එතකොට මේ කරකැවිල්ල- මේකට සරලම උපමාව කිව්වොත් සමහර විට ඒක හාස්‍යජනක එකක් කියලා හිතන්න පුළුවන්. නමුත් මේ කරකැවිල්ල තේරුම් ගන්න පුළුවන් ගෙදර ඉන්න බල්ලාගේ වල්ගයේ මැක්කෙක් වැහුවාම ඌ කරන දෙයින්. ඌ මැක්කා අල්ලන්න කරකැවෙනවා. ඌට තේරෙන්නෙ නැහැ වල්ගය කරකැවෙන වාරයක් වාරයක් පාසා ඌත් කරකැවෙන බව. අන්න ඒ වගේ දෙයක් තමා මෙච්චර කාලයක් කරලා තියෙන්නේ. විඤ්ඤාණයට පෙනෙන නාමරූපය අල්ල ගන්නවා. අන්තිමට ගිහිල්ලා ආයෙත් ඒ ගමනම තමයි යන්නේ. මේ සංසාර ගමන බොහොම දිග ගමනක් කියලා කියනවා. දැන් මේ පින්වතුන්ගේ වාහනවල සමහර විට කිලෝමීටර- දැන් කාලේ කියන හැටියට- මැනලා බොහෝ දිග ගමනක් ගිහිල්ලා ආවා කියනවා. **රෝදෙ කරකැවෙන වාර ගණන විතරයි.** අන්න ඒ වගේ තමයි මේ සංසාර චක්‍රය. එතකොට එක අතකින් බලනකොට අපි දීර්ඝ කාලයක් මේ සංසාරයේ ගිහිල්ලා තියනවා- කාල වශයෙන් බැලුවොත්. අනික් අතින් බලනකොට මේ එක තැනම කරකැවිල්ලක්. අන්න ඒ රහසයි බුදුරජාණන් වහන්සේ ලෝකයාට ඉදිරිපත් කළේ පටිච්චසමුප්පාද ධර්මතාව තුළින්. එතකොට මේක අනාගත භවයකට දාලා විසඳන්නත් බෑ. එතනයි ධර්මයෙ අකාලික බව. මෙතනම තියනවා විසඳුම. **මෙතනම තිබෙනවා විසඳුම.** මොකක්ද විසඳුම? එක්කෝ නාමරූපය විඤ්ඤාණයෙන් ඈත් කරන්න ඕන. නැත්නම් විඤ්ඤාණය නාමරූපයෙන් ඈත් කරන්න ඕන- අර බටකෝටු මිටි දෙක.

ඉතින් මෙන්න මේ කතාන්තරය- ගැඹුරු කාරණයක් අපි කෙටියෙන් මතුකරලා දුන්නොත් මේ පින්වතුන්ට තව දුරටත් කරුණු හිතලා එකතු කර ගන්න- මේකට ගැලපෙන එක්තරා මහ පුදුම සූත්‍රයක් තියෙනවා. කෙනෙක් මේවා මිථ්‍යා දේවල් කියලා හිතන්නත් පුළුවන්. කේවඩ්ඪ කියන ගෘහපතියා, බුදුරජාණන් වහන්සේට ඒ නාලන්දාවේ වැසියන් පහදවා ගන්න ප්‍රාතිහාර්ය පෙන්වන්න කියලා කියනවා. බුදුරජාණන් වහන්සේ කියනවා 'ඒ ප්‍රාතිහාර්ය නොවේ මම නියම ප්‍රාතිහාර්ය හැටියට දක්වන්නේ අනුශාසනා ප්‍රාතිහාර්යයි'. අනුශාසනා ප්‍රාතිහාර්ය යයි කියලා ඒකටම ගැලපෙන අන්දමින් ඔන්න කතාන්තරයක් කියනවා. මෙතෙක් බුදුරජාණන් වහන්සේ වෙන තැනක කියාපු නැති කාරණයක් එතන කියනවා. 'කේවඩ්ඪ, මේ භික්ෂු සංඝයා අතරම හිටියා එක්තරා සංඝයා වහන්සේ නමක් ඔය ඍද්ධි ප්‍රාතිහාර්ය තියන කෙනෙක්. ඒ භික්ෂුවට හිටිගමන් විතර්කයක් ඇතිවුනා- දැන් මේ කාලයේ ඔය විද්‍යාඥයින්ට ඇතිවෙනවා වගේ විතර්කයක්- කොතනද මේ පඨවි ආපො තේජො වායො කියන මහාභූත ධර්ම නැති වෙන්නේ කියලා.' එතකොට ඒක බුදුරජාණන් වහන්සේගෙන් අහන්න ගියේ නෑ. ඊට වඩා දන්නවා කියලා හිතුවා දෙවියෝ බ්‍රහ්මයෝ. එහෙම ඍද්ධියක් අධිෂ්ඨාන කරලා ගියා. චාතුර්මහා රාජික, තාවතිංස, යාම, කියන්න ඕන නැහැ මේ පින්වතුන් දන්නවා නේ - ඉස්සර ගිහිල්ලත් ඇති - දිව්‍යලෝක හයට ඉස්සර වෙලා ගියා. යනකොට ඒ හැම තැනින්ම කිව්වා  අනේ අපි නම් දන්නේ නැහැ, ඉහළ දිව්‍ය ලෝකයේ අය දන්නවා ඇති, සමහර විට, කියලා. ඔහොම ඔහොම ගියා. දිව්‍ය ලෝකවල අන්තයටම ගියා. අන්තිමට අපි නම් දන්නේ නැහැ සමහර විට බ්‍රහ්මලෝකේ අය දන්නවා ඇති.

ඊළඟට ඒකට ගැලපෙන ඍද්ධියක් ඇතිකරගෙන අර කියාපු භික්ෂුව බ්‍රහ්මලෝක එකින් එක ඉහළට ඉහළට ගියා. ගිහිල්ලා බ්‍රහ්මලෝකේ මහාබ්‍රහ්මයා, එතනත් මහ පුදුම සිද්ධියක් කියවෙනවා. මහා බ්‍රහ්මයා පිළිබඳව හිතන්නේ මේ ලෝකේ මැව්වේ මහා බ්‍රහ්මයා තමයි කියන එක. දැනටත් බොහෝ දෙනා තුළ ඒ මතය තියෙනවා නේ? ඒ අවස්ථාවේ අර බ්‍රහ්මයින් කීවා අපි නම් දන්නේ නැහැ සමහර විට මහා බ්‍රහ්මයා දන්නවා ඇති කියලා. අන්තිමට ඒ භික්ෂුව ආලෝකයක් පහළවුනාම මහා බ්‍රහ්මයා ආවා කියලා දැනගෙන මහා බ්‍රහ්මයාගෙන් ඇහුවා. මහා බ්‍රහ්මයා ඒ වෙනුවට වෙන එකක්, වෙන උත්තරයක්, දෙන්න ගියා. එතකොට භික්ෂුව කීවා ඒක නොවේ මම අහන්නේ. බ්‍රහ්මයා කියන්න පටන් ගත්තා තමන් කවුද කියලා. මම තමයි ලෝකේ මැව්වේ, මම තමයි කෙරුම්කාරයා කියල ඔය විධියට බ්‍රහ්මයා කියාගෙන ගියා. මේ භික්ෂුව කියනවා ඕක නොවේ මම ඇහුවේ මගේ ප්‍රශ්නයට උත්තර දෙන්න කියලා. ඒ පිරිස ඉදිරියේ උත්තර නොදී මහබ්‍රහ්මයා ඒ භික්ෂුව පැත්තකට අරගෙන ගිහිල්ලා, මේ අය හිතන්නේ මම දන්නවා

කියලා. ඇත්ත වශයෙන් මමවත් දන්නේ නැහැ. මේක දන්නේ නම් අර භාග්‍යවතුන් වහන්සේයි, ඇයි මෙච්චර දුර ආවේ? ගිහිල්ලා භාග්‍යවතුන් වහන්සේගෙන්ම අහන්න කියලා.

**දැන් අන්න ඒ තත්ත්වයට තමා අපේ විද්‍යාඥයින් පත්වෙලා තියෙන්නේ. දුර යනවා අන්තිමට එන්න වෙන්නේ කොතනටද? බුදුරජාණන් වහන්සේ ළඟට.** අර භික්ෂුවට වෙච්ච දේමයි. එතකොට අර භික්ෂුව ඇවිල්ලා බුදුරජාණන් වහන්සේට අර ප්‍රශ්නය ඉදිරිපත් කළා. ඉස්සරවෙලා බුදුරජාණන් වහන්සේ පොඩි විහිළුවක් කරා- දිග කතන්දර කියන්නේ නැතත්- හරියට අර අතීතයේ නැව්වල යන අය කුරුල්ලෙක් අරන් යනවා ගොඩබිම පෙනෙන. ඒ කුරුල්ලාට ගොඩබිම සොයාගන්න බැරිවුනාම ආපසු කුඹගහට එනවා. අන්න ඒ වගේ ඔබත් ආවයි මා සොයාගන කියලා ඊළඟට ප්‍රශ්නයට උත්තර දෙන්න කලින් කියනවා. මහණ නුඹ ප්‍රශ්නය අහපු හැටිම වැරදියි 'කොතනද මේ ධාතු හතර නැති වන්නේ?' ප්‍රශ්නය එහෙම නොවේ අහන්න තියෙන්නේ. ප්‍රශ්නයම හරි ගැස්සුවා. ඒක ගාථාවකින් කියවෙන්නේ. යම්කිසි තැනක මේවා නිරුද්ධ වෙනවා නොවේ. කොතනක මහා භූත ධර්ම **ප්‍රතිෂ්ඨාවක්** නොලබද්ද? මේ මහා භූත ධර්ම කොතනකද **ප්‍රතිෂ්ඨාවක්** නොලබන්නේ? පඨවි ආපො තේජො වායො- ඒ වගේම එපමණක් නොවේ, දිග කොට ආදී භේද මේ රූප ධර්ම ආශ්‍රයෙන් අපි ඇති කර ගත්තු මැනීම් නේ? ඒවා ඔක්කොම කොතනද ප්‍රතිෂ්ඨාවක් නොලබන්නේ කියලා ප්‍රශ්නය ඉස්සර වෙලා හරි ගස්සලා ඉවර වෙලා ඒකට දුන්නා මහපුදුම, ගැඹුරු, පිළිතුරක්, දැන් උගතුන්ට පවා තේරුම් ගන්න බැරි. අද ප්‍රහේලිකාවක් බවට පත්වෙලා තියෙන්නේ. මේ ගැඹුරු පැත්තකට එන්නේ. ඒක මතුපිටින් විතරයි කරන්න පුළුවන් වෙන්නේ කාලවේලාව අනුව.

'විඤ්ඤාණං අනිදස්සනං- අනන්තං සබ්බතො පභං' මහ පුදුම කාරණයක් බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනවා. අනිදස්සන විඤ්ඤාණය කියල එකක් තිබෙනවා. අපි කලින් කිව්වා නේ විඤ්ඤාණය හැමතිස්සේම යමක්- නාමරූපයක්- පෙන්නුම් කරනවා කියල. එතකොට නාමරූපයක් පෙන්නුම් නොකරන විඤ්ඤාණයක් මේ කියන්නේ. "විඤ්ඤාණං අනිදස්සනං" ඒක අනන්තයි."සබ්බතො පභං" අර නාසිසස්ගේ දෘෂ්ටිය අතන අර වතුරේ ඡායාවේ නැවතුනා නේ. ඇතට පෙනුනාට පස්සේ නේ තේරුම් ගත්තේ මේක පිළිබිඹුවක් පමණයි කියලා. ඊළඟට 'සබ්බතො පභං' අන්ධකාරය නිසා යමක් නොපෙනුනාට ආලෝකය ආවාම පෙනෙනවා. හැමපැත්තෙන්ම ආලෝකය 'සබ්බතො පභං'.අන්න ඒ විමුක්ත විඤ්ඤාණයයි නිවන් තත්ත්වය. 'විඤ්ඤාණං අනිදස්සනං අනන්තං සබ්බතො පභං' එතැනයි පඨවි ආපො තේජො වායො ඒ වගේම දිගකොට සුභ අසුභ ආදී සියලුම ප්‍රඥප්ති ඒ ඔක්කොම නිරර්ථක වෙන්නේ. අර්ථ ශූන්‍ය වෙන්නේ. අන්න ඒ කියාපු විමුක්ත විඤ්ඤාණයේයි,

කියල ඊළඟට නාමරූපය එතන සම්පූර්ණයෙන් නැතිවෙලා යනවා. නාමරූපය උපරෝධනය වෙනව විඥ්ඥාණය නිරුද්ධවීම තුළින්. සාමාන්‍ය සංසාරයෙ යන අර කියාපු ආශ්‍රව සහිත, කෙලෙස් සහිත, විඥ්ඥාණයෙ නිරෝධයෙන් තමයි අර කියාපු ධාතූන් නැතිවෙන්නේ. ඔය කියන්නේ නිවන් තත්ත්වයයි. භව නිරෝධ තත්ත්වයයි. නිවනයි. දිට්ඨෙව ධම්මෙ - දිටු දැමියෙහිම. එතකොට මේ ඇස්වලට පෙනෙන, කණට ඇහෙන, මේ ලෝකය අන්ධවීමෙන්වත් බිහිරිවීමෙන්වත් මේවා නැති කරනවා නොවේ. **ඇස් තිබුණත් පෙනෙන්නේ නැති, කන් තිබුණත් ඇහෙන්නේ නැති, විදිහේ මහා පුදුම විමුක්ත තත්ත්වයක් තමයි ඒ නිවන කියල කියන්නේ, දිටු දැමියෙහිම.** ඒක තමයි **"භව නිරොධො නිබ්බානං"** කියලා කියන්නේ. ඒ භව නිරෝධ තත්ත්වය බුදුරජාණන් වහන්සේ ප්‍රත්‍යක්ෂ කළා පමණක් නොවේ ඒකට මාර්ගය ප්‍රකාශ කරලා තිබෙනවා. ඒවා කොතෙකුත් මේ පින්වතුන් අහලා තියෙනවා. මෙතන ගැඹුරුම කොටස අන්න ඒ විඥ්ඥාණ තත්ත්වය තුළින් එතකොට මෙලොවම ප්‍රත්‍යක්ෂ කරනවා. ආයි සැකයක් නැහැ. මෙලොවම ප්‍රත්‍යක්ෂ කර ගන්නවා. මේ භවය කියන එක හිතෙන්ම මවා ගත්තු එකක්, එක එක සත්ත්වයා එක එක සත්ත්වයාගේ ශරීරයෙ මේ හය තුළින් - බූවල්ලා වගේ මේ හය තුළින් අල්ල ගන්නවා. සතුන්ට කතා කරන්න ඉඩක් නැහැ, මේ **මානවාභිමානය** තුළ. අපි ඉතින් මේ අපේ ලෝකය තමයි කියල ලොකුවට අරගෙන අනික් සතුන් ඔක්කොම පරපුටු සතුන් හැටියට සලකනවා. නමුත් අන්න බුදුරජාණන් වහන්සේ පෙන්නුම් කරනවා මෙන්න ලෝකය විඥ්ඥාණයෙන් ප්‍රත්‍යය වෙච්ච නාමරූපයක් පමණයි කියල. ඒක ඔස්සේයි මේ ලෝකයා දුවන්නේ. **යම් අවස්ථාවක අවබෝධය ආවා නම් අන්න එතන නාමරූපයේ නිරෝධය. ඔන්න එතකොට ඔය ටිකයි ධර්මයේ ගැඹුරුම කොටස.**

ඉතින් අර මාරයා අහපු ප්‍රශ්නයට සම්පූර්ණ පිළිතුර ලැබුනා. කොතනද මෙන්න මේ ප්‍රතිබිම්බය - මේ මූර්තිය - නිරුද්ධ වෙන්නේ? නිරුද්ධ වෙන්නේ නිවනේ. නිරෝධය කියල කියන්නෙත් ඒකයි. දුක්ඛ නිරොධො කියල කියනව, භව නිරොධො කියල කියනව. ඉතින් අන්න අර සමුදය පැත්ත බලාගෙන හිටිය ලෝකයාට බුදුරජාණන් වහන්සේ මේ ධර්මය තුළින් නිරෝධය පැත්තට යොමු කරලා විමුක්තිය සලසා දුන්නා. තමන් තනියම ලබාගෙන ඊට පස්සෙ තමයි අර 'අනෙකජාතිසංසාරං' ආදි වශයෙන් දැන් ඉතින් උපතක් නැහැ කියල බුදුරජාණන් වහන්සේ උදාන වශයෙන් ප්‍රකාශ කළේ.

අපි තේරුම් ගන්න ඕන එතකොට, හැමෝම කතා කරනවා තවත් නම් උපදින්න ඕනෑ නැහැ කියල - එන එන අය ගිහි පැවිදි භේදයක් නැතිව බොහෝ දෙනෙක්. මේ කාලයේ මේ තියන, හැම පැත්තෙන්ම එන මහ භයානක ව්‍යසන ආදිය. ඊට වඩා සිය දහසක් ව්‍යසන ආදිය මේ සංසාරයේ විඳින්න ඇති. නමුත් අර විධියට සංවේගයක් එනවා. හැබැයි තාවකාලිකයි.

ඊට පස්සේ ඉතින් මතක නැහැ. තවත් මොකක් හරි ආව හැටියේ. සුනාමි එනවා යනවා. ඒත් තවම 'ධම්මං සුණාමි' කියන තත්වයට ධර්මයට ඇහුම්කන් දෙන්න ලෑස්ති නෑ කවුරුවත්. අන්න ඒක නිසා අපි කල්පනා කර ගන්න ඕන නුවණින් එතකොට බුදුරජාණන් වහන්සේ මේවා මතුකරලා දුන්නේ -සර්ව අශුභ වාදයක් කියල සමහරු සැලකුවට- මේ අවස්ථාව තමයි අපට අන්න අර කියාපු ධාතූන් සිතෙන් මකා හැරීමට, නැත්නම් නාම රූපයෙන් මිදීමට තියන එකම අවස්ථාව -බුද්ධෝත්පාද කාලය. ඒකට උවමනා මාර්ගය තමයි සමථ විදර්ශනා වශයෙන් මේවා වැඩීම. ඉතින් ඒකටයි මේ පින්වතුන් අද දවසේ- ඒ සඳහායි සිල්සමාදන් වුනේ. ඊළඟට බණ භාවනා කළේ. ඒකයි පරමාර්ථය. සම්‍යක් දෘෂ්ටිය නැත්නම්, අඳුරේ අතපත ගානව නම්, මේ මොනවා කළත් වැඩක් නැහැ. යන්නේ වෙන පාරක. ඕන වෙන්නේ වෙන තැනකට යන්න. **යන්නේ වෙන පාරක.**

දැන් තේරුම් ගන්න ඕන මේකයි ඉලක්කය. මේ භව නිරෝධය බලාපොරොත්තු වෙනව නම් මෙන්න මේ තත්ත්වයට සිත පත්කර ගන්න ඕනෑ. අර බුදුරජාණන් වහන්සේ දක්වපු භාවනා විධි තමා තුළින් දියුණු පවුණු කරගෙන එතකොට අද දවසේ මේ තමන් වැඩූ සීලයෙන්, කළ භාවනාවෙන්, මේ අද අසන්න ලැබුණ විදර්ශනාත්මක ධර්ම දේශනයෙන්, යම් ප්‍රයෝජනයක් අරගෙන මේ ශාසන පහන නිවෙන්න කලින් හැකිතාක් වීර්යවන්තව උත්සාහවන්තව තමන් බණ භාවනා කරලා අර සෝවාන් සකදාගාමී අනාගාමී අර්හත් කියන මාර්ගඵල ප්‍රතිවේධයෙන් මේ භයානක සංසාරයෙන් අත්මිදීමට අධිෂ්ඨාන කර ගන්න. මේ කුසල ශක්තියත් ඒකට හේතු වාසනා වේවා කියා ප්‍රාර්ථනා කරගෙන අවීචියේ සිට අකනිටාව දක්වා යම්තාක් සත්ත්ව කෙනෙක් ධර්ම ශ්‍රවණමය ධර්ම දේශනාමය කුශලය අනුමෝදන්වීමට කැමති නම් ඒ අනුමෝදන්වීම තුළින් තමන් බලාපොරොත්තු වන බෝධියකින් උතුම් අමා මහ නිවන් ලබත්වා! කියා ප්‍රාර්ථනා කරගෙන මේ ගාථා කියන්න.

එත්තාවතා ච අමෙහහි....

## 08

පහන් කණුව ධර්ම දේශනා අංක 157 (පොසොන්)

# නමො තසස භගවතො අරහතො සමමා සමබුදධසස

| | |
|---|---|
| සුගගහීත නිමිතතසස | - චිතතසසුපපාද කොවිදො |
| සමථං අනුයුඤ්ජෙය්‍ය | - කාලෙන ච විපසසනං |
| | |
| විරිය-සාතච්ච සමපනෙනා | - යුතතයොගො සදා සියා |
| න හි අපපතවා දුකඛනතං | - විසසාසං එය්‍ය පණ්ඩිතො |
| | |
| එවං විහරමානසස | - සුදධිකාමසස භිකඛුනො |
| ඛීයනති ආසවා සබෙබ | - නිබබුතිඤ්චාධිගචඡතී ති |

- උපසේන වඞගනතපුතත ථෙර ගාථා -ථෙර ගාථා

සැදැහැවත් පින්වතුනි,

මිහිඳු මහ රහතන් වහන්සේගෙන් මේ රටට ලැබුනු සම්බුද්ධශාසන දායාදය කාටත් සිහියට නැගෙන පොසොන් පෝය දවසයි අද. ඒ ලැබුනු බුද්ධ ශාසන දායාදයෙන් කොයි තරම් කොටසකට අද අපි උරුමකම් කියනවාද කියන එක අද වගේ දවසක හිතන්න වටිනවා. සම්බුද්ධ ශාසනයේ හරය, සාරය, සංසාර විමුක්තියයි, නිවනයි. ඒ කාරණය මේ වගේ අවස්ථාවක සිහියට නඟා ගැනීම පවා මිහිඳු මහ රහතන් වහන්සේට කරන උපහාර පූජාවක් වෙනවා. ඒක නිසා අපි අද දවසේ තෝරා ගත්තේ ඊට අදාළ සිතුම් පැතුම් අවදි කරවන අන්දමේ ගාථා කීපයක්.

මේ මාතෘකා කළ ගාථා දේශනා කළේ උපසේන ස්වාමීන් වහන්සේයි. උපසේන ස්වාමීන් වහන්සේ කියලා කියන්නේ සාරිපුත්ත ස්වාමීන් වහන්සේගේ බාල සොහොයුරෙක්. සාරිපුත්ත ස්වාමීන් වහන්සේගේ බාල සොහොයුරා ඒ නමින් වෙන්කර දක්වන්න ඕනෑ නිසා උන්වහන්සේ ශාසනයේ හැඳින්වූයේ උපසේන වංගන්ත පුත්ත නමින්. එතකොට සාරිපුත්ත ස්වාමීන් වහන්සේ මෑණියන්ගේ නමින් සාරිපුත්ත වුනා. උපසේන ස්වාමීන් වහන්සේ පියාගේ නමින් වංගන්තපුත්ත නමින් හැඳින්වුනා. ඉතින් මේ උපසේන වංගන්ත පුත්ත ස්වාමීන් වහන්සේ ශාසනයේ මුල් කාලයේ ඉඳලම එකතුවෙච්ච කෙනෙක්. ඒ ශාසනයේ මුල් අවදියේ බුදුරජාණන් වහන්සේ උපසම්පදා කරන ආකාරය

එහෙම විනය නීති වශයෙන් පැනෙව්වාට පස්සේ සංඝයා වහන්සේලා- ඇතැම් සංඝයා වහන්සේලා- තමන් එක වසක් පමණක් ශාසන වයස තිබෙද්දී ගෝලයන් උපසම්පදා කරන්න පටන් ගත්තා, බුදුරජාණන් වහන්සේගෙන් අහන්නෙ කියන්නෙත් නැතිව. ඉතින් උපසේන වංගන්ත පුත්ත ස්වාමීන් වහන්සේත් තමන්ට එක වසක් තිබියදී ගෝලයකු උපසම්පදා කරලා වස් දෙකක් උනාට පස්සේ ගෝලයත් එක්ක බුදුරජාණන් වහන්සේ දකින්න වැඩම කළා. බුදුරජාණන් වහන්සේ සංඝයා වහන්සේ කෙනෙකුගෙන් යම් ප්‍රශ්නයක් අහන්නේ කාරණය දනගෙනයි. ඒ වගේම යම්කිසි ධර්මකාරණයක් කියාදීමට හෝ විනය නීතියක් පැනවීමටයි. ඉතින් මේ අවස්ථාවේදී බුදුරජාණන් වහන්සේ පිළිසඳර කථාකරලා ඉවර වෙලා උපසේන වංගන්ත පුත්ත ස්වාමීන් වහන්සේගෙන් අහනවා "මහණ ඔය නමට වස් කීයද? " "භාග්‍යවතුන් වහන්ස, මට වස් දෙකයි." 'මේ නමට වස් කීයද?' ගෝලයා දිහාට පෙන්නුම් කරලා ඇහුවා. 'ඒ නමට එක වසයි.' මේ නම ඔය නමට තියෙන සම්බන්ධය මොකක්ද කියලා ඇහුවා. 'ඒ මගේ ගෝලයාය' කිව්වා. ඔන්න බුදුරජාණන් වහන්සේ ඒ සැරේ වදාළා "හිස් පුරුෂය- මෝඝ පුරිස- කියන වචනයෙන් තමයි නිග්‍රහ කරන්නේ. 'හිස් පුරුෂය' මේක නොකළ යුතු දෙයක් අශාසනික දෙයක්. තමන් අවවාද අනුශාසනා ලබන්න සුදුසුව සිටියදී තව කෙනෙකුට අවවාද අනුශාසනා කරන්න යන එක පමණට වැඩිය කල් ඇතිව මේ ශාසනයේ පිරිස් බැඳගන්න පටන් ගැන්මක්' කියලා මේක නොපහන් වූවන්ගේ පහන්වීම පිණිසවත් පහන් වූවන්ගේ ප්‍රසාදය වැඩිවීම පිණිසවත් හේතුවන දෙයක් නොවේ, නොකළ යුතු දෙයක්, කියලා විනය නීතියක් පැනෙව්වා, ඒක මුල්කරගෙන. සංඝයා වහන්සේ කෙනෙක් උපසම්පදාවෙන් වස් දහයක් වන තුරු ගෝලයන් උපසම්පදා නොකළ යුතු බවට. එතකොට මේ බුදුරජාණන් වහන්සේගෙන් ලැබුන 'හිස් පුරුෂයා' 'මෝඝ පුරුෂයා' කියන නිග්‍රහය නිසා සංවේගවත් වුන උපසේන ස්වාමීන් වහන්සේ එයින් පසුව ධූතංගධාරීව උග්‍ර ප්‍රතිපත්ති රකිමින් ආරණ්‍යකව, පිණ්ඩපාතීව, පාංශුකූලිකව ප්‍රතිපත්ති රකලා ඉක්මණින්ම රහත් බව ලබා ගත්තා.

නමුත් ඒ එක්කම ඉස්සරවෙලා කියූ අවස්ථාවට වඩා එහෙම පිටින්ම ප්‍රතිවිරුද්ධ අවස්ථාවක් අපට විනය පිටකයේ දකින්න ලැබෙනවා. ඒක සඳහන් වන්නේ මෙහෙමයි. එක් අවස්ථාවක බුදුරජාණන් වහන්සේ සංඝයා වහන්සේලාට වදාරනවා "මහණෙනි මම තුන් මාසයක් විවේකීව ගතකරන්න කැමතියි, විවේකයට ගිහිල්ලා කැලේට. බොහෝ අවස්ථා වලදී බුදුරජාණන් වහන්සේ එහෙම විවේක වාසයට වැඩම කළා. 'මා හම්බවෙන්න කිසිම කෙනෙක් ආයුතු නැහැ, පිණ්ඩපාතය අරගෙන එන භික්ෂුව හැර.' ඉතින් මෙහෙම බුදුරජාණන් වහන්සේ විවේකයට වැඩම කළාට පස්සේ සංඝයා වහන්සේලාත් බුදුරජාණන් වහන්සේගේ විවේකයට අනුබල දෙන අදහසින්-

නමුත් අවසර නැතිව- අමුතු විනය නීතියක් පැනෙව්වා. බුදුරජාණන් වහන්සේ මෙන්න විවේකයට වැඩම කරනවා. යම් කෙනෙක් බුදුරජාණන් වහන්සේ දකින්න ගියොත් එහෙම, ඒ භික්ෂුවට, පචිති ඇවැතක් වෙනවා කියලා. ඔය විනය පිටකයේ තියෙන ඇවැත් ක්‍රමයෙන් එකක් පාචිත්තිය කියන ඇවැතක්, වැරැද්දක් වෙනවා කියලා නීතියකුත් පැනෙව්වා.

මේ නීතිය පනවා තිබෙද්දී බුදුරජාණන් වහන්සේ විවේකයට ගියාට පස්සේ අර උපසේන වංගන්ත පුත්ත ස්වාමීන් වහන්සේ තමන්ගේ ගෝලයිනුත් එක්ක බුදුරජාණන් වහන්සේ දකින්න ආවා. අර ශික්ෂාපදය පැනෙව්වාට මොකද උපසේන වංගන්ත පුත්ත ස්වාමීන් වහන්සේ තේරුම් ගත්තා ඒක සුදුසු නැතිබව. බුදුරජාණන් වහන්සේ හැර වෙන කෙනෙකුට එහෙම ශික්ෂා පද පනවන්න බැරිබව. කොහොම හරි උපසේන වංගන්ත පුත්ත ස්වාමීන් වහන්සේ වැඩියම පිළිසඳර කථාවෙන් පස්සේ ගෝලයන් ගැනත් බොහොම ප්‍රසාදයක් ප්‍රකාශ කරලා බුදුරජාණන් වහන්සේ වදාළා උපසේන වංගන්ත පුත්ත ස්වාමීන් වහන්සේට "උපසේන ඔබේ මේ ගෝල පිරිස බොහොම ප්‍රසාදජනකයි නේ. කොහොමද ඔබ ගෝලයන් හික්මවන්නේ.?' එතකොට කියනවා "භාග්‍යවතුන් වහන්ස, මගෙන් කවුරුවත් උපසම්පදාව ඉල්ලාගෙන ආවොත් මම කියනවා මම ආරණ්‍යකයි පිණ්ඩපාතිකයි පංසුකූලිකයි ඒ ධූතාංග රකිනවා, ඔබත් එහෙම වෙන්න කැමති නම් මම උපසම්පදාව කරනවා. එහෙම කැමති නැත්නම් මම උපසම්පදා කරන්නේ නැහැ." ඔන්න බුදුරජාණන් වහන්සේ කියනවා. "සාධු සාධු උපසේන. බොහොම හොඳයි ගෝලයින් හික්මවන ආකාරය" කියලා විශේෂ ප්‍රසාදය දක්වීම් වශයෙන් විශේෂ වරප්‍රසාදයක් දුන්නා. "මම ඉඩදෙනවා ආරණ්‍යක පිණ්ඩපාතික පංසුකූලික භික්ෂූන් වහන්සේලාට ඕනෑම වෙලාවක ඇවිල්ලා මාව හමුවන්න" ඉතින් අර සංඝයා වහන්සේලා පාචිත්තිය ඇවැතක් පැනෙව්වාට මොකද අන්න බුදුරජාණන් වහන්සේ ඒ අවස්ථාවේ උපසේන වංගන්ත පුත්ත භික්ෂූන් වහන්සේට ප්‍රශංසා කරලා- එපමණක් නොවෙයි සූත්‍ර දේශනාවල සඳහන් වෙනවා, විනය පිටකයේත් එහෙම කියවෙනවා, ඒ වගේම මේ පින්වතුන් අහල තිබෙනවා බුදුරජාණන් වහන්සේ ඇතැම් අවස්ථාවල සංඝයා වහන්සේලාට එතදග්ග තනතුරු දුන්නා කියලා. දැන් මේ කාලයේ උපාධි දෙන්නා වගේ එකක් නොවෙයි. බුදුරජාණන් වහන්සේ ගැඹුරින් කල්පනා කරලා ඒ අතීත සංඝයා වහන්සේලාගේ ගුණ ශක්තිය අනුව, "මහණෙනි, අහවල් අහවල් කාරණා අනුව අහවල් භික්ෂුව අග්‍රයි" කියලා. ඉතින් ඒ වගේ මේ උපසේන වංගන්ත පුත්ත ස්වාමීන් වහන්සේ සම්බන්ධයෙන් සඳහන් වෙනවා. 'මහණෙනි, මගේ ශ්‍රාවක සමන්ත පාසාදික භික්ෂූන් අතරෙන් අග්‍ර හැටියට මම සම්මත කරනවා උපසේන වංගන්ත පුත්ත භික්ෂුව කියලා. මේ සමන්ත පාසාදික

කියලා හඳුන්වන්නේ, පින්වතුනි, හැම පැත්තෙන්ම ප්‍රසාදය එලවනසුළු හාත්පසින්ම පහදවනසුළු කියන එක. එයින් පෙන්නුම් කරන්නේ උපසේන වංගන්ත භික්ෂූන් වහන්සේත් බැලුවාම බොහොම ප්‍රසාදනීයයි. පහදවන සුලුයි. ගෝලයිනුත් එහෙමයි. එතකොට එතන හාත්පසින්ම පහදවන සුළු, හැම පැත්තෙන්ම පහදවනසුළු කියලා කීවේ අර ගෝලයිනුත් ගැන හිතලා. එතකොට බුදුරජාණන් වහන්සේගෙන් විශේෂ ප්‍රශංසාවක් ලැබුනා.

ඊළඟට සඳහන් වන සිද්ධිය මේ පින්වතුනුත් අහලා ඇති. ඇතැම් කෙනෙක් බුදුරජාණන් වහන්සේගේ ශාසනයේ නා නා විධ ගැටළු ඇති කළා. බුදුරජාණන් වහන්සේටවත් විසඳා ගන්න බැරි උග්‍ර ගැටළු ආවා. එක් අවස්ථාවක් තමයි කොසඹෑ නුවර භික්ෂූන් වහන්සේලා පිරිසක් පොඩි විනය ප්‍රශ්නයක් උඩ ඇතිකර ගත්තු වාද විවාද නිසා භේද භින්නවෙලා බුදුරජාණන් වහන්සේට ජාතක කථා කියලාවත් හික්මවන්න බැරිව ඒ සංඝයා වහන්සේලා බොහොම දඩබ්බර විධියට කිව්වා භාග්‍යවතුන් වහන්සේ විවේකයට යන්න අපි අපේ දබරය කලහය විසඳාගන්නම් කියලා. ඒ විධියට බුදුරජාණන් වහන්සේටත් එහෙම ප්‍රකාශ කළා. බුදුරජාණන් වහන්සේ- මේ පින්වතුන් අහලා තියනවා- පාරිලෙය්‍ය වනයට වැඩියේ විවේකය සඳහා ඒ අවස්ථාවේයි. සංඝයා වහන්සේලා හික්මෙන්නේ නැති නිසා. ඉතින් මෙයින් සංවේගවත් වුන එක්තරා භික්ෂූන් වහන්සේ නමක් උපසේන වංගන්ත පුත්ත ස්වාමීන් වහන්සේ ළඟට ඇවිල්ලා මේ වගේ ශාසන අර්බුද ඇතිවුනාම ඒවා වළක්වන්න අපි කොහොමද අනාගතයේ ක්‍රියා කළයුත්තේ කියලා උපසේන වංගන්ත ස්වාමීන් වහන්සේගෙන් ඇහුවා කියලා සඳහන් වෙනවා. ඒ ඇහුව අවස්ථාවේ උපසේන ස්වාමීන් වහන්සේ ගාථා දහයකින් අනුශාසනයක් වදාළා. ඒ අනුශාසනයේ කෙටියෙන් කියතොත් මුලහරියේ කියවෙන්නේ ආරණ්‍යවාසීව පිණ්ඩපාතිකව, පංසුකූලිකව ධුතංගධාරීව, විනය ගරුකව, විවේකයට ලැදිව, පිරිස් ඔස්සේ යන්නේ නැතිව, අල්පේච්ඡව, රස තෘෂ්ණාව ඉවත් කරලා ඒ හොඳ ප්‍රතිපත්ති උඩ තමන් බණ භාවනා කරමින් සිටිය යුතු බවයි. ඒ ගාථාවල මුල් හරියේ කියවෙන්නේ ඒවයි. ඒකේ අවසාන වශයෙන් තියෙන ගාථා තුනයි අපි මේ අවස්ථාවේ මාතෘකාව හැටියට ගත්තේ. දැන් ඒවා මතක්කර ගනිමු.

සුගහීත නිමිත්තස්ස - චිත්තස්සුප්පාද කොවිදො
සමථං අනුයුඤ්ජෙය්‍ය - කාලෙන ච විපස්සනං

'සුගහීත නිමිත්තස්ස' කියලා කියන්නේ සමාධි නිමිත්ත හරියාකාරව ගත් කෙනෙක් වන්නේය. සමාධි නිමිත්ත හරියාකාරව තේරුම්ගත් කෙනෙක් වන්නේය. ඒවා අපි පස්සේ විග්‍රහකරනවා.'චිත්තස්සුප්පාද කොවිදො' කියල කියන්නේ සිතක් උපදින ආකාරය දන ගැනීමේ දක්ෂයෙක් වන්නේය. ඊළඟට 'සමථං අනුයුඤ්ජෙය්‍ය' සමථයෙහි යෙදෙන්නේය. සමථය කියලා කියන්නේ

සිත සමාධිමත්කර ගැනීමට උපකාර වන ධ්‍යාන ආදිය වැඩීමයි. සමථං අනුයුඤ්ජෙය්‍ය සමථයෙහි යෙදෙන්නේය. 'කාලෙන ච විපස්සනං' අවස්ථානුකූලව විදර්ශනාවද වඩන්නේය. විපස්සනාවද වඩන්නේය. ඊළඟට,

**විරියසාතච්ච සම්පන්නො - යුත්තයොගො සදා සියා**

**න හි අප්පත්වා දුක්ඛන්තං - විස්සාසං එය්‍ය පණ්ඩිතො**

නිරන්තරයෙන් වීර්යවන්තව- විරියසාතච්ච සම්පන්නො- යුත්තයොගො සදා සියා හැම කල්හිම ඒ යෝග භාවනාවේ යෙදෙන්නේය. නිරන්තරයෙන්ම යෝගකර්මයේ යෙදෙන්නේය කියන එකයි. ඊළඟට 'න හි අප්පත්වා දුක්ඛන්තං' දුක්කෙළවරට නොපැමිණ 'විස්සාසං එය්‍ය පණ්ඩිතො' නුවණැත්තා තමා ගැන විශ්වාසය නොතබන්නේය. දුක් කෙළවර කරන තුරු නවතින්න එපා කියන එකයි. ඊළඟට,

**එවං විහරමානස්ස - සුද්ධිකාමස්ස භික්ඛුනො**

**ඛීයන්ති ආසවා සබ්බෙ - නිබ්බුතිඤ්චාධිගච්ඡති**

ඒ කියන්නේ මෙසේ වාසය කරන්නා වූ, විශුද්ධිය බලාපොරොත්තු වන්නා වූ, භික්ෂුවගේ සියලු ආශ්‍රවයෝ ක්ෂය වෙත්. ඒ වගේම නිවනටද පැමිණෙයි. නිවනද ලබා ගනියි කියලා මෙන්න මේ අවවාදාත්මක අනුශාසනාත්මක ගාථා තුනයි උපසේන වංගන්ත පුත්ත ස්වාමීන් වහන්සේ ප්‍රකාශ කළේ.

මේ අවස්ථාවේ අපි මේක මතු කරලා ගත්තේ විශේෂයෙන්ම දැන් මේ කාලයේ බොහෝ විට අප ළඟට එන අය සමථ විදර්ශනා ආදිය පිළිබඳ ගැටළුත් අරගෙනයි එන්නේ. ඒකටම අදාළව මේ පළවෙනි ගාථාවේ කාරණා කීපයක් කියවෙනවා. පළමුවෙන්ම කියවෙන්නේ 'සුග්ගහීත නිමිත්තස්ස' ඒ කියන්නේ ඒකත් සවිස්තරව කිව්වොත් දැන් කෙනෙකුට හිත සමාධිමත් වෙන වෙලාව, සමාධිමත් නොවන වෙලාව, ඒවා පිළිබඳව හිත යොදලා ඊට හේතුවන හේතු ප්‍රත්‍ය, ඊට හේතුවන කාරණා, හරියාකාරව තේරුම් ගැනීමයි. ඒක උපකාර වෙනවා තමන්ගේ භාවනාව දියුණු කර ගන්න.

ඉතින් මෙන්න මේ කාරණය ලස්සනට බුදුරජාණන් වහන්සේ එක්තරා උපමාවකින් වදාළා සංඝයා වහන්සේලාට, දක්ෂ කෝකියා- එහෙම නැත්නම් අරක්කැමියා- පිළිබඳ උපමාවකින්. ඒ කියන්නේ ඔන්න බුදුරජාණන් වහන්සේ සංඝයා වහන්සේලාට ප්‍රකාශ කරනවා- ඉස්සරවෙලා ප්‍රකාශ කරන්නේ අදක්ෂ අරක්කැමියාගේ ස්වභාවය 'මහණෙනි, ඔන්න යම්කිසි අරක්කැමියෙක් තමාගේ ස්වාමියාට- රජකෙනෙකුට හෝ රාජමහාමාත්‍යයෙකුට- ආහාර පිළියෙල කරනවා. ආහාර පිළියෙල කරලා මේසෙට ඇරලා බලාගන ඉන්නේ නැහැ. හොරෙන් වත් බලාගන ඉන්නේ නැහැ. මේ ස්වාමියා ඒ ආහාර, ආහාර පිළියෙල කරන කොට විවිධාකාර ව්‍යංජන එහෙම තියෙනවා නේ? මේ

පිංචතුන් දන්නවා නේ, ඇඹුල් රස ඇති, ලුණු රස ඇති, මිහිරි රස ඇති, කටුක රස ඇති, ඔය ආදී විවිධ ව්‍යංජන, ඉතින් ඒවා බලාගන ඉඳලා තේරුම් ගන්නේ නැහැ අද මගේ ස්වාමියා එක්කෝ ඇඹුල් රස ආහාරයට වඩා රුචිය. ඒ ආහාරයට අත දික් කරනවා. ඒ ආහාරයෙන් වැඩියෙන් ගන්නවා. ඒ ආහාරය ගැන, ව්‍යංජනය ගැන, වර්ණනා කරනවා කියලා ඒක දැන ගන්න ළඟින් ඉන්නේ නැහැ. ඉතින් ඒක නිසා ඒකෙන් වෙන පාඩුව මොකක්ද? අර අරක්කැමියට- කෙටියෙන් දක්වලා තිබෙන්නේ- අර අරක්කැමියට අර ස්වාමියාගේ හිත ප්‍රසාදවීම හේතුකොට ගෙන ලබා ගන්න වස්ත්‍ර ආදිය නියම වැටුප එහෙම නැත්නම් ප්‍රසාද දීමනා ආදිය ලැබෙන්නේ නැහැ. අර අදක්ෂ අරක්කැමියාගේ ඒ නොසැලකිල්ල නිසා.

ඒ වගේම- ඔන්න උපමාවට සම්බන්ධ කරනවා- එසේම ඔන්න යම්කිසි භික්ෂුවක් සතර සතිපට්ඨානය වඩනවා. කයේ කය අනුව බලමින්, වේදනාවන්හි වේදනා අනුව බලමින්, සිතෙහි සිත අනුව බලමින්, ධර්මයන්හි ධර්මය අනුව බලමින් වාසය කරනවා. සතර සතිපට්ඨානය වඩන ඒ භික්ෂුවගේ සිත සමාධිගත වෙන්නේ නැහැ. ඒ වගේම නොයෙකුත් උපක්ලේශ ධර්ම හිතට එනවා. එතකොට ඒ භික්ෂුව ඒ ගැන කල්පනා කරන්නේ නැහැ. මොකද මෙහෙම වෙන්නේ කියලා තේරුම් ගන්න. ඒක නිසා ඒ භික්ෂුවට තමන්ගේ හිත සමාධිමත් කරගන්න බැහැ. දිට්ඨ ධම්මසුඛ විහාර කියලා කියන එදිනෙදා සිත තැන්පත් කර ගැනීමෙන් ලැබෙන සැපය ලැබෙන්නේ නැහැ. සතිසම්පජඤ්ඤය දියුණු වන්නේ නැහැ. ඔන්න ඔය අදක්ෂ අරක්කැමියා අදක්ෂ භික්ෂුවට සමාන කළා. අදක්ෂ භික්ෂුවගේ ස්වභාවය.

ඊළඟට දක්ෂ අරක්කැමියා ගැන කියන්නේ මෙහෙමයි බුදුරජාණන් වහන්සේ. අර විදියට තමන්ගේ ස්වාමියාට ආහාර ඇරලා දක්ෂ අරක්කැමියෙක් නම් බලාගන ඉන්නවා අද ස්වාමියා මේකෙන් වැඩිපුර ගන්නවා මේකට වැඩිය රුචියි මේක ගැන වර්ණනා කරනවා කියලා දැනගෙන ඒක අනුව ඊළඟ දවසේ ආහාර සූදානම් කරනවා. එතකොට ඒ නිසා අර ස්වාමියා ඒ ගැන සතුටු වෙලා විශේෂ ප්‍රසාද ආදිය දෙනවා.

අන්න ඒ වගේ යම්කිසි නුවණැති භික්ෂුවක්- දක්ෂ භික්ෂුව කරන්නේ මොකක්ද? සතර සතිපට්ඨානය වඩන අතරේ යම් අවස්ථාවක සිත සමාධිමත් වෙනවා නම්, ක්ලේශ නැතිවෙනවා නම්, ඒක හොඳට තේරුම් ගන්නවා මේ මේ ආකාරයේ මේ මේ විධියට පවතින නිසා මේ විධියේ සිතිවිලි නිසා මම මෙහෙම දියුණුවක් ලබනවා කියලා. ඒකට නිමිත්ත අන්න ඒකයි. "සුග්ගහීත නිමිත්ත" නිමිත්ත කියලා කියන්නේ ඒකේ සළකුණ. එතකොට හිත යන ආකාරය දැන ගැනීම කියන එකයි ඔතන කියන්නේ. හිත යන ආකාරය ඊට හේතුවන කාරණා දැන ගත්තාම ඊළඟ සැරේ ඒවා ඉවත් කරලා එහෙම නැත්නම් ඊට රුකුල් දීලා- හොඳ පැත්ත නම්- හිත දියුණු කරගන්න

පුළුවන්. ඔන්න ඔය කාරණය එතකොට බුදුරජාණන් වහන්සේ අර අරක්කැමියාගේ උපමාවෙන් දක්වුවා.

ඒ වගේම "චිත්තස්සුප්පාද කොවිදා" කියලා කියන්නේ සිතක් උපදින ආකාරය පිළිබඳ දැන ගැනීමෙහි දක්ෂයෙක් වන්නේය. ඒ සිතක් උපදින්නේ තවත් හේතූන්, තවත් සිතුවිලි රාශියක් ඒකට කිට්ටු වෙනකොටයි. සිතිවිලි හා සම්බන්ධ වන ආකාරය ඒවා ගැනත් සැලකිලිමත් වෙන්න ඕනෑ. විශේෂයෙන්ම ඔය සතිපට්ඨානය වඩන පින්වතුන් දන්නවා ඇති චිත්තානුපස්සනාව හරියට එතකොට, ධම්මානුපස්සනාව හරියට එනකොට, ඔන්න සිත ගැන බලන ස්වභාවය එනවා. විශේෂයෙන්ම ධම්මානුපස්සනා කොට්ඨාශයේ තියෙනවා නීවරණ ආදිය ගැන එහෙම. මෙහෙම සඳහන් වෙනවා. මේක නිදසුනක් හැටියට ගත්තොත් යම් කෙනෙකුගේ සිතට කාමච්ඡන්ද ව්‍යාපාද, ථීනමිද්ධ, උද්ධච්ච කුක්කුච්ච, විචිකිච්ඡා කියලා කියන ඒ නීවරණ ධර්ම සමාධියට බාධක- ඒවගේම විදර්ශනා ආදියට බාධක- වන දේවල් හැටියටත් දක්වනවා. කාම සිතුවිලි, ද්වේශ සිතුවිලි, නිදිමත අලසගති, නොසන්සුන් ගති, සැක කුකුස්, ඊළඟට දෙගිඩියා ආදී දේවල් ඒවා බුදුරජාණන් වහන්සේ එතන ඒ සතිපට්ඨාන සූත්‍රයේ ප්‍රකාශ කරනවා. ඒවා ඇති අවස්ථාව තේරුම් ගන්නවා, නැති අවස්ථාව තේරුම් ගන්නවා, යම්කිසි නීවරණයක් නැතිව තිබිලා ඒ නීවරණය ඇතිවන හැටි තේරුම් ගන්නවා. ඊළඟට ඒක ඇතිවුනාට පස්සේ ඒක නැති කරන ආකාරයත් තේරුම් ගන්නවා. ඊළඟට නැති කළාට පස්සේ තවත් මතු නොවන ආකාරයත් තේරුම් ගන්නවා. ඔය විධියට පස් ආකාරයකින් නීවරණ ධර්ම ආදිය පිළිබඳව තේරුම් ගන්නවා. ඒ සතිපට්ඨාන සූත්‍රයේ කියවෙන දේවල් ඕවා. ඒ වාගේම බොජ්ඣංග ආදී දේවල් පිළිබඳව නම් ඒවා ඒත් අර විදියටම තිබෙන අවස්ථා, නැති අවස්ථා, සති, ධම්මවිචය ආදී හොඳ ධර්ම ඒවා මතුවන හැටි ඒවා දිගට පවත්වාගෙන යන හැටි හිත හැකිළෙන අවස්ථාවන්, සිත විසිරෙන අවස්ථාවන් ඒවා ඇතිවන ආකාරය තේරුම් ගන්නවා. ඔන්න 'චිත්තස්ස උප්පාද කොවිදො.'

ඔන්න ඊළඟට අපි එන්නේ අර සමථ විදර්ශනා පිළිබඳ කාරණයටයි. ඒක ගැන විශේෂයෙන් අපට බොහෝ ආරාධනාත් ලැබුණා. බොහොම දෙනෙක් මේ කාලේ - අපි කියමු භාවනා ක්ෂේත්‍රයේ කියලා- භාවනා ක්ෂේත්‍රයේ නොයෙකුත් විධියේ වාද විවාද තියනවා. ඔය සමථ විදර්ශනා ගැන. ඇතැම් කෙනෙක් ඒක නිසා දෙගිඩියාවල, විචිකිච්ඡාවල පසුවෙලා අපෙනුත් යම් යම් දේවල් අහනවා. ඉතින් සාමාන්‍යයෙන් මේ කාලයේ පවතින වාද විවාද ගැන හිතලා බලනකොට මෙන්න මෙහෙම කියන්න පුළුවන්.

ඇතැම් කෙනෙක් ප්‍රකාශ කරනවා සමථය විදර්ශනාවය කියන්නේ එකමයි. සමථය වඩලා ඉවර වෙනකොට විදර්ශනාව කෙරිලා ඉවරයි. කෙටියෙන් තේරුම් ගන්න පුළුවන්, සමථය කියලා කියන්නේ සමාධි පැත්ත. කිසියම් කුසල් අරමුණක හිත එක්තැන් කර ගැනීමෙන් සමාධිමත් කරගැනීම. විපස්සනාව කියලා කියන්නේ- මේ පින්වතුන් දන්නවා ඇති- අනිත්‍ය දුඃඛ අනාත්ම කියන ත්‍රිලක්ෂණය විනිවිද දැකීම. එතකොට ඒ කාරණා දෙකම ඉබේම සමථය කරනකොට විදර්ශනාව වැඩෙනවා කියලත් ඇතැම් කෙනෙක් කියනවා.

තවත් කෙනෙක් කියනවා මේ සමථය කියන එක බෞද්ධයින්ට අයිති දෙයක් නොවේ. ඒක අර අතීතයේ සෘෂිවරුන්ට, තාපසයින්ට, අයිතිදෙයක්. අපට විදර්ශනාව විතරක් තිබුනාම ඇති. විදර්ශනාවෙන් පුළුවන් අපට ඔක්කොම කරගන්න. ඔන්න ඔය විධියට ඒ අන්ත දෙක.

තවත් ඇතැම් කෙනෙක් කියනවා සමථයේ ඔය කෙළවරටම යනකන්, නෙවසඤ්ඤානාසඤ්ඤායතන ආදියට යනකන්, විදර්ශනා ගැන හිතන්නවත් ඕන නැහැ. ඔහොමත් කියනවා. ඉතින් ඔය වගෙ නානාවිධ මතිමතාන්තර ඇතැම් අය තුළ තිබෙන බව පෙනෙනවා. ඕක නිසා වික්ෂිප්ත වුන යෝගාවචරයිනුත් බොහෝවිට අප ළඟට ඇවිල්ලා සාකච්ඡා කරනවා.

ඉතින් මේකෙදී කෙටියෙන්ම කියන්න තියෙන්නේ බුදුරජාණන් වහන්සේගේ ධර්මය සංග්‍රහ කරලා දක්වන සූත්‍රවල ඔය අංගුත්තර නිකාය ආදියේ කෙලින්ම දක්වනවා, “ද්වෙ ධම්මා සමථො ච විපස්සනා ච”. දෙකේ ඒවා දක්වන කොටසේ දක්වනවා ධර්ම දෙකක් තියෙනවා. සමථයයි විපස්සනාවයි. එහෙම දෙකේ කොටසක දක්වන්නේ ඒක දෙකක් නිසයි. එතකොට අපි නිසැකවම තේරුම් ගන්න ඕන සමථයයි විපස්සනාවයි කියල කියන්නේ දෙකක්. ඊළඟට ඒ දෙක අතර සම්බන්ධතාව ගැන ප්‍රකාශ වෙනකොට- ඒ වගේම මෙතන අපි හැම වචනයක්ම විග්‍රහ කරනවා නම් “කාලෙන ච” කියන වචනයකුත් කියවුනා. 'සමථං අනුයුඤ්ජෙය්‍ය කාලෙන ච විපස්සනං' සමථයෙහි යෙදෙන්නේය. කලින් කලට, එහෙම නැත්නම් අවස්ථානුකූලව, විපස්සනාව. ඇත්ත වශයෙන්ම “කාලෙන” කියන එක ඒ වචන දෙකටම ගැලපෙන විධියටයි අපි තේරුම් ගන්න ඕනෑ. ඇතැම් ගාථාවල ඒක එකවරක් සඳහන් වුනත්. සමථය කාලානුරූපව කරන්න ඕන, අවස්ථානුකූලව. විපස්සනාව අවස්ථානුකූලව කරන්න ඕන.

ඒක පැහැදිලිවන සූත්‍රයකුත් ධර්මයේ තියෙනවා. බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනවා “ මහණෙනි, කාල සතරක් තියෙනවා. මොනවද කාල සතර? මුල්, දෙක නම් මේ පින්වතුන් බොහොම අහලත් ඇති “ කාලෙන ධම්මසවනං - කාලෙන ධම්මසාකච්ඡා- කාලෙන සමථො - කාලෙන විපස්සනා”. අන්න ඒ කියන්නේ අවස්ථානුකූලව. ධර්ම ශ්‍රවණයට කාලයක්

වෙලාවක් තියෙනවා. ධර්ම සාකච්ඡාවට වෙලාවක් කාලයක් තියනවා. සමථයටත් නියමිත කාලයක් වෙලාවක් එතකොට තියනවා. විපස්සනාවටත් තියෙනවා. එයිනුත් අපට තහවුරු වෙනවා සමථ විපස්සනා කියන දෙක ශික්ෂණ දෙකක් බව.

මේක ශික්ෂණ දෙකක් බවත්, ඒ දෙක අතර තියන සම්බන්ධතාවත්, තවත් පැහැදිලි වන සූත්‍රවලට- ඈතට- ගියොත් ඒත් අංගුත්තර නිකායේ - කෙනෙකුට බලාගන්න පුළුවන් වන නිසා අපි මේ කියන්නේ - හතරේ ගොඩවල් දක්වෙන තැනක, බුදුරජාණන් වහන්සේ ධර්මයක් විග්‍රහකරනකොට හරියට ඉඩක් නොතියා ඒක සම්පූර්ණ වශයෙන් ඉදිරිපත් කරන්නේ. මෙතන කාරණා දෙකක් නමුත් හතරක් හැටියටයි ඉදිරිපත් කරන්නේ වගන්ති හතරකින් තර්කානුකූල විධියට. මෙහෙමයි දක්වන්නේ. ඔන්න යම්කිසි භික්ෂුවක් ඉන්නවා සමථයෙන් දියුණුයි විපස්සනාව නැහැ. ඒක දක්වන්න විශේෂ වචන කෙටියෙන් දක්වතොත් "අජ්ඣත්තං චෙතො සමථං" -අජ්ඣත්තං චෙතො සමථං" කියන්නේ සිත ඇතුළත සංසිඳවා ගැනීම- සමාධිය කියන එකයි. "අධිපඤ්ඤා ධම්ම විපස්සනා" කියල කියන්නේ විපස්සනා කියන වචනයේ අදහසයි එතැන කියන්නේ. ප්‍රඥාවෙන් ධර්මයන් පිළිබඳ ගැඹුරට දැකීම. ඔය කියන දෙකෙන් යම්කිසි භික්ෂුවක් ඉන්නවා, සමථයෙන් දියුණුයි. සමථය තියනවා ඒ භික්ෂුවට විපස්සනාව- අධිපඤ්ඤා ධම්ම විපස්සනාව නැහැ. දෙවනුව කී භික්ෂුවට අධිපඤ්ඤා ධම්ම විපස්සනාව තියෙනවා සමථය නැහැ. තුන්වෙනි භික්ෂුවට ඔය දෙකම නැහැ. හතරවෙනි භික්ෂුවට චෙතො සමථයත් තියනවා. විපස්සනාවත් තියනවා. ඔය විධියටයි බුදුරජාණන් වහන්සේ ඔය කාරණා විග්‍රහ කරලා දක්වන්නේ.

ඉතින් එයිනුත් අපට මුල් දෙකයි ප්‍රධාන වශයෙන් මාතෘකාවට අදාළ වෙන්නේ. අනිත් ඒවා හිතා ගන්න පුළුවන්- අනිත් දෙන්නා ගැන. ඉතින් මෙතනදී බුදුරජාණන් වහන්සේ ඊළඟට ප්‍රකාශ කරනවා අර පළමුවැනි පුද්ගලයා පිළිබඳව ඒ කියන්නේ සමථය තියනවා අධිපඤ්ඤා ධම්ම විපස්සනාව නැහැ. ඒ පුද්ගලයා පිළිබඳව බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරන්නේ, කළ යුත්තේ මේකයි. ඒ භික්ෂුව විසින් තමන් ලබාගෙන තිබෙන චෙතොසමථයෙහි පිහිටලා, ඒකෙ පිහිටලා, අධිපඤ්ඤා ධම්ම විපස්සනාවත් වඩන්න ඕනැ. එසේ වැඩුවාම යම් දවසක අර කෙලෙස් ඉවත් කරලා රහත්වන්න පුළුවන්. ඊළඟට දෙවෙනි භික්ෂුව ගැන සඳහන් වන්නේ ඒ භික්ෂුවට අධිපඤ්ඤා ධම්ම විපස්සනාව තියෙනවා චෙතො- සමථය නැහැ. ඒක නිසා ඒ අඩු එක- චෙතොසමථය ඒ භික්ෂුව විසින් දියුණු කරගන්න ඕනැ. එහෙම දියුණු කර ගත්තම අන්න අර බලාපොරොත්තු අර්ථයට පැමිණෙනවා. එයිනුත් මේ දෙකම අවශ්‍ය බවයි පෙන්නුම් කරන්නේ.

ඔච්චර දුර නොගියත් ධම්මපදයේ භික්ඛු වග්ගය කියවපු කෙනෙකුට මේ වටිනා ගාථාව හමුවෙනවා. මේ කාරණය ඉතාම සැකෙවින් කියාපු තැනක්.

**නත්ථි ඣානං අපඤ්ඤස්ස**
**පඤ්ඤා නත්ථි අජ්ඣායතො**
**යම්හි ඣානඤ්ච පඤ්ඤා ච**
**ස වෙ නිබ්බාන සන්තිකෙ**

ඒකේ තේරුම. 'නත්ථි ඣානං අපඤ්ඤස්ස'- ප්‍රඥාව නැති කෙනාට ධ්‍යානයක් නැත. 'පඤ්ඤා නත්ථි අජ්ඣායතො' - ධ්‍යාන නොවඩන කෙනාට ප්‍රඥාවකුත් නැත. 'යම්හි ඣානඤ්ච පඤ්ඤා ච'- යම්කෙනෙකු තුළ ධ්‍යානයත් ප්‍රඥාවත් දෙකම තිබෙනවා නම්- 'ස වෙ නිබ්බාන සන්තිකෙ' ඒ තැනැත්තා නිවන ළඟමය. ඉතින් එයිනුත් අපට පැහැදිලි වෙනවා මේ ශික්ෂණ දෙකම අවශ්‍ය බව භික්ෂු ජීවිතයට.

ඊළඟට තවදුරටත් අර දැන් කියාපු සූත්‍රයට අදාළවම දක්වනවා ඒ තමන්ටම ඒක හරි ගස්සා ගන්න බැරි නම්- අර අඩුපාඩුව- තමන්ට වඩා ඒ අංශයෙන් දියුණු කෙනා ළඟට, තැනැත්තා ළඟට, භික්ෂුව ළඟට, ගිහිල්ලා ඒ අඩුපාඩුව හරි ගස්සා ගන්නා හැටියටත්, උපදෙස් ලබා ගන්නා හැටියටත්, බුදුරජාණන් වහන්සේ දක්වනවා ඊළඟ සූත්‍රයක. ඔන්න අර පළවෙනි භික්ෂුව ගැන හිතමු. ඒ භික්ෂුවට"අජ්ඣත්තං චෙතො සමථං" සමාධි පැත්ත හරි. විදර්ශනාවෙන් අඩුයි. අන්න ඒ භික්ෂුව පිළිබඳව බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනවා ඒ භික්ෂුව අධිපඤ්ඤාධම්ම විපස්සනාවෙන් දියුණු භික්ෂුවක් හොයාගෙන ගිහිල්ලා මෙන්න මේ විධියට ප්‍රශ්න කරන්න ඕන. "ඇවැත්නි, කොහොමද සංස්කාර තේරුම් ගන්නෙ? කොහොමද සංස්කාර සම්මර්ශනය කරන්නේ. මෙනෙහි කරන්නේ? කොහොමද සංස්කාර විදර්ශනාවට නගන්නේ?" කියලා ඒ උපදෙස් ලබා ගන්න ඕනැ. එතකොට අධිපඤ්ඤාධම්ම විපස්සනාවෙන් දියුණු භික්ෂුව කියලා දෙනවා තමන්ගේ අත්දැකීම් අනුව මෙන්න මේ මේ විධියටයි සංස්කාර කියන එක අඳුනා ගන්න ඕන. මේ විධියටයි සංස්කාර මෙනෙහි කරන්න ඕන. මේ විදියටයි විදර්ශනාවට නගන්න ඕන. ඒ උපදෙස් ලබාගෙන ඒ භික්ෂුව යම් දවසක තමන්ගේ විදර්ශනාව මුදුන්පත් කරගෙන රහත් වෙනවා.

ඊළඟ භික්ෂුව ගැන කියවෙන්නේ ඒ භික්ෂුවට අධිපඤ්ඤා ධම්ම විපස්සනාව තියනවා. චෙතොසමථය නැහැ. විපස්සනාව තියනවා සමථය නැහැ. බුදුරජාණන් වහන්සේ කියන්නේ ඒ භික්ෂුව යායුතුයි අන්න අර සමථයෙන් දියුණු භික්ෂුව කරා. ගිහිල්ලා ඒ භික්ෂුවගෙන් සිත සමාධිමත්

කරගන්නා ආකාරය මෙන්නමේ විධියට අහන්න ඕනෑ. “කොහොමද? ඇවැත්නි, මේ හිත නතර කර ගන්නෙ? මේ හිත - ඒකට යොදලා තියන වචන හරි අර්ථවත්- පාලි වචනයත් කියමු. “සණ්ඨපෙතබ්බං” දැන් ඔන්න දුවන කෙනෙක් නතර කරන්නා වගේ. “සණ්ඨපෙතබ්බං” ඊළඟට දෙවෙනි වචනය විශේෂයෙන්ම“සන්නිසාදෙතබ්බං”- හිඳුවා ගන්නේ කොහොමද? නතර කරගෙන හිඳුවා ගන්නේ කොහොමද?-“සන්නිසාදෙතබ්බං”.ඊළඟට “එකොදිකාතබ්බං” ඒ නතර කරලා එකඟ කර ගන්නේ, එකතු කරගන්නේ, එක තැනක එක් තැන් කරන්නේ කොහොමද ඒ හිත? ඊළඟට "කථං සමාදහිතබ්බං''-කොහොමද මේක සමාධිමත් කරන්නේ? අන්න තමාගේ ගැටළු ටික සමථයෙන් දියුණු භික්ෂුවගෙන් අහලා ඒක සකස් කරගන්නවා. දියුණු කරගන්නවා. අන්‍යෝන්‍ය වශයෙන්. ඉතින් ඔන්න ඔයින් අපට පෙනෙනවා සමථයත් විදර්ශනාවත් දෙකම මේ භාවනා කරන භික්ෂුවකට අවශ්‍ය බව නිවන් බලාපොරොත්තු වෙනවා නම්. ඉතින් ඒ වගේම ඒකට අදාළ වටිනා සූත්‍ර ඉදිරියට තියෙනවා.

ඇත්ත වශයෙන්ම මේ ශාසනයේ කියවෙන සමථයෙ- එහෙම නැත්නම් සමාධියෙ-අර අන්‍ය ආගමිකයන්ගේ සමාධියට වඩා වෙනසක් තිබෙනවා. මොකද? දැන් බුද්ධ කාලයේ මේ පිංවතුන් අහලා තියෙනවා බෝධිසත්ත්ව තාපසයන් වහන්සේ ආලාරකාලාම උද්දකරාම පුත්‍ත කියන ඒ දෙදෙනා ළඟට ගිහිල්ලා, ඒ ආචාර්‍යවරුන් දෙන්නා ළඟට ගිහිල්ලා, ඒ ඔය ඉහලම සමාධිය හැටියට සලකන අරූප ධ්‍යාන හැටියට සැලකෙන ඒ ආකිඤ්චඤ්ඤායතනය, නෙවසඤ්ඤානාසඤ්ඤායතනය කියන අවස්ථා ලබා ගත්තු ආකාරය එතන කියවෙන්නේ. ඒ ආචාර්යයන් වහන්සේලා තොල් සොලවනකොට, වචන කියන කොට, බුදුරජාණන් වහන්සේ ඒවා ලබාගෙන ඉවරයි. මොකද, සංසාරයේ අතීතයේ බෝධිසත්ත්ව කාලයේ ඒවා ඔක්කොම දියුණුකරලා ඉවරයි. එතකොට ඒ වචන කියන කොට බුදුරජාණන් වහන්සේ ඒවා ලබා ඉවරයි. ඒ ආචාර්‍යවරු දෙන්නම බුදුරජාණන් වහන්සේට දක්වූ ගෞරවය එතන කියවෙනවා.

ඔන්න ආලාරකාලාම කියපු එක කියමු- "ආලාරකාලාම යමක් දන්නවා නම් ඔබත් එය දන්නවා. ඔබ දන්නා දේ ආලාරකාලාමත් දන්නවා. ඒක නිසා මේ ගෝලයන් බෙදාගෙන අපි පරිහරණය කරමු'' කියලා. තමන් ආචාර්යයන් වුනාට බුදුරජාණන් වහන්සේට ආචාර්ය තත්ත්වයක් දුන්නා. උද්දකරාම පුත්‍තත් එහෙමයි. එයින් අපට පෙනෙනවා එතකොට ඒ ධ්‍යාන පැත්ත බුදුරජාණන් වහන්සේ සාංසාරික වශයෙන් දියුණු කරලා තිබෙනවා. නමුත් එයින් සෑහීමට පත්වූයේ නැති නිසා මේක නොවෙයි නිවනට මාර්ගය කියලා තමයි අර විධියට භාවනා කරලා අන්තිමට මැදුම් පිළිවෙත ලබා ගත්තේ.

ඔන්න එතකොට ඔය මැදුම් පිළිවෙතට අදාළවම තමයි ඔය සමථයත් විදර්ශනාවත් අන්න බුදුරජාණන් වහන්සේ ඒ දෙක එකිනෙකට උපකාර වන හැටි දක්වන්නේ. ඊට අදාළ සූත්‍ර කීපයක් අපි ඊළඟට කෙටියෙන් අවස්ථානුකූලව දක්වන්න බලමු. වෙලාව අනුව.

ඔන්න මේ සමථය දන් මේ පිංවතුනුත් අහලා ඇති- භාවනායෝගීන්- සමාධිය අහක දාන දෙයක් නොවෙයි. නමුත් සමාධිය මොකටද අපි වඩන්නේ. විදර්ශනාව සඳහා පාදක කරගන්න. විදර්ශනාව සඳහා පාදක කරගන්නවා කියලා කියන්නේ සමාධිය ලබාගෙන, ඒ සමාධිය ලබා ගැනීමෙන් කෙරෙන්නේ තමන්ගේ විසිරිච්ච පංචඋපාදාන ස්කන්ධය එකතු කරලා දෙනවා සමාධිය තුළින්. ඊට පස්සේ ඒක විදර්ශනාවට නඟනවා. ඒක ප්‍රායෝගික අර්ථයක් සඳහායි. ඒකයි සමථය කියන එක. අනිත් ආචාර්යවරු සමථය ආත්මයේ තත්ත්ව හැටියට අරගෙන අමුතු අත්දැකීම් නිසා, සාමාන්‍ය ලෝකයාට නැති අත්දැකීම් නිසා, ඒ තුළ මානයක් ඇති කරගෙන වෙන එකක් තබා - ඒක නිසා මේ පින්වතුන් අහලා තියනවා ඔය උරුවෙල කස්සප ආදීන් ඒ ධ්‍යාන වලින් දියුණු අය හික්මවා ගන්න බුදුරජාණන් වහන්සේට ප්‍රාතිහාර්ය පවා පෙන්වන්න සිදුවුනා. ඒ තරම් ආඩම්බරයි. මාන්නක්කාරයෝ. නමුත් ඔක්කොම එහෙම නොවේ. එහෙම නැති බව පෙනෙනවා අර ආලාරකාලාම උද්දකරාම පුත්ත ආදීන්- ඒ ශ්‍රේෂ්ඨයින්- බුදුරජාණන් වහන්සේට කළ ගෞරවයෙන්. නමුත් අර දෝෂය ඇතිවුනේ මොකද? සක්කායදිට්ඨිය කියන වැරදි දෘෂ්ටිය තුළින් ඒක ආත්මය හැටියට ගත්තා.

අදත් හින්දු යෝගීන් ඒ ධ්‍යාන ලබා ගෙන තිබෙන නමුත් ඒ අර ධර්මයේ විදර්ශනා පැත්ත නැති අය ඒක ආත්ම තත්ත්ව හැටියට ග්‍රහණය කරනවා. ඒක නිසා සංසාරේ තවදුරටත් කරකැවෙනවා. ඒක බුදුරජාණන් වහන්සේ පෙන්නුම් කරන්නේ ලෞකික තත්ත්වයක්. ධ්‍යානය ලෞකික තත්ත්වයක්. ඒක සංඛතයි. හදාගත්තු දෙයක්. කෘත්‍රිම දෙයක්. නමුත් බුදුරජාණන් වහන්සේ ඒකෙන් කරන්නේ මධ්‍යම ප්‍රතිපදාව තුළින් ඒක උපකාර කර ගන්නවා අන්න අර විධියට විසිරිලා තියන - සාමාන්‍ය හිතට අහුවෙන්නේ නැති- පංච උපාදාන ස්කන්ධය එක්තැන් කරලා ගන්න. එක්තැන් කර ගත්තාට පස්සේ ඒක ආත්මතත්ත්වයක් හැටියට නොවේ ඊට පස්සෙ සලකන්නේ. **සංස්කාර හැටියට. අන්න ඒකයි විශේෂ බෞද්ධ වචනය.** ඒවා සංස්කාර- සකස්කිරීම් ගොඩක්- හැටියට තේරුම් ගන්නවා. ආත්ම තත්ත්වය හැටියට නොවේ. ඒකයි අර භික්ෂුව ඇහුවේ මේවා කොහොමද සම්මර්ශනය කරන්නේ කියලා.

බෞද්ධ භික්ෂුව- නිවන් බලාපොරොත්තු වන භික්ෂුව- ධ්‍යාන දිහා බලන්නේ ඒ විධියටයි. මේ සංස්කාර සම්මර්ශනය කළ යුතු ආකාරය, මෙනෙහි කළයුතු ආකාරය, විදර්ශනාවට නැගිය යුතු ආකාරය, ඊටත් අදාළ උපදෙස් ඇතැම් සූත්‍රවල තිබෙනවා.

විශේෂයෙන්ම ඔන්න ඔය දැන් කියාපු ධ්‍යාන පාදක කරගන්නා ආකාරය. ඉතින් ඒ න්‍යායය බුදුරජාණන් වහන්සේ දක්වපු එක, ඉතාම කෙටි වාක්‍යයකින් ඇතැම් තැනක දක්වනවා. "නිස්සාය නිස්සාය ඔඝස්ස නිත්ථරණා." නිස්සාය නිස්සාය කියලා දෙවරක් කියන්නේ යම්කිසි දෙයක් උපකාර කරගෙනයි. මේ සැඩ වතුරෙන් එතර වන එක පහසු එකක් නොවේ. මොකක් හරි ඕන. පහුරක් ඕනෑ. පහුර හදාගෙන හරි යන්න ඕන. **ඇත්ත වශයෙන් ආර්ය අෂ්ටාංගික මාර්ගය කියලා කියන්නේ පහුරයි.** ඒකයි, පහුර හැටියට දක්වලා තියෙන්නේ බුදුරජාණන් වහන්සේ. ඒ පහුර තමන්ම හදාගත්තු දෙයක්. මේ සැඩ වතුරෙන් එතර වෙන්න නැවක් නැහැ. පාලමක් නැහැ. තමන්ම කොහෙන් හරි වැල් ටිකක්, ලී ටිකක්, එකතු කරගෙන පහුරක් බැදගෙන අත් දෙකත් පිහිට කරගෙන පහුර තල්ලුකරගෙන ගිහිල්ල තමයි එතර වෙන්නෙත්. අන්න ඒකම තමයි ආර්ය අෂ්ටාංගික මාර්ගය කියලා කියන්නේ. සම්මා දිට්ඨිය පෙරටු කරගෙන හරියට සම්මා සමාධියට පැමිණෙනවා. අන්න ඒ භික්ෂුවට එතකොට **සම්මා සමාධි යයි** අන්තිමට නිවනට උපකාර වෙන්නේ. "අරියො සම්මා සමාධි" කියලා කියන්නේ ඒකයි. ආර්ය සම්මා සමාධිය. **සාමාන්‍ය සමාධිය ආර්ය සමාධියට පත් කර ගැනීමට නම් අන්න විදර්ශනාව අවශ්‍ය වෙනවා.**

ඒ විදර්ශනාව කරන ආකාරය ඊළඟට දක්වලා තිබෙනවා. ඒ වගේම අපි තව පැත්තක් කියමු. දැන් ඔය බුදුරජාණන් වහන්සේ දක්වලා තිබෙනවා නිවන බලාපොරොත්තු කෙනෙකුට තුන් ආකාරයකින් නිවනට ළං විය හැකි බව. ඒක දක්වන්නේ මෙහෙමයි. 'සමථ පුබ්බංගමං විපස්සනං භාවෙති, විපස්සනාපුබ්බංගම සමථං භාවෙති, සමථංච විපස්සනංච යුගනද්ධං භාවෙති' එයින් කියන්නේ ඇතැම් කෙනෙකුට පුළුවන් සමථය පෙරටු කරගෙන විදර්ශනාව වඩන්න. තව කෙනෙකුට පුළුවන් විදර්ශනාව පෙරටු කරගෙන සමථය වඩන්න. ඒ ටිකට අදාළ ඒව අපි කලිනුත් කිව්වා නේ. ඒ සමථයේ පිහිටා විදර්ශනාව වඩන්න. විදර්ශනා වේ පිහිටලා සමථය වඩන්න. ඊළඟට තුන්වැනි කාරණය යුගනද්ධ කියලා කියන්නේ, පින්වතුනි, දැන් ඔය නගුලක බැන්ද ගවයින් දෙන්නා ඉස්සරහට යනකොට එක්කෙනෙක් ඉස්සරහට අඩිය තියනකොට අනිත් එක්කෙනාත් ඒකට අනුව අඩිය තියන්න එපායැ. අන්න යුගනද්ධ කියලා කියන්නේ එකට බැන්ද ගවයින් දෙන්නෙක් වගේ සමථයයි විදර්ශනාවයි යන්න ඕන. එහෙමත් කරලා පුළුවන් නිවන් දකින්න. ඉතින් ඒක විස්තර කරන්නේ මෙහෙමයි.

ඔන්න යම් භික්ෂුවක් පළවැනි ධ්‍යානයට සමවදිනවා. ධ්‍යානයෙන් නැගිටලා ඉවරවෙලා ඒක විදර්ශනාවට නගනවා. විදර්ශනාවට නගන ආකාරයත් දහමේ දක්වලා තිබෙනවා. ඔය ත්‍රිලක්ෂණය කියලා කියන අනිත්‍ය දුක්ඛ අනාත්ම කියන ත්‍රිලක්ෂණය ඇතැම් අවස්ථාවල බුදුරජාණන් වහන්සේ

එකොළොස් ආකාරයකට දක්වනවා. මේ තුනම එකොළොහක් හැටියට. ඇතැම් අවස්ථාවල දහ අටක්, හතලිහක්, ඔය ආදී වශයෙන් විවිධාකාරයෙන් දක්වෙනවා. ඒ ඒ පුද්ගලයින්ට මේ ත්‍රිලක්ෂණය වැටහෙන ආකාරයෙන් බුදුරජාණන් වහන්සේ දක්වලා තිබෙනවා. මේ එකොළොස් ආකාරය නිරන්තරයෙන් සූත්‍රවල සඳහන් වෙනවා. බොහෝ අවස්ථාවල අපි මේ පින්වතුන්ට මතක් කරලා දුන්නා “ අනිච්චතො දුක්ඛතො රොගතො ගණ්ඩතො සල්ලතො අඝතො ආබාධතො පරතො පලොකතො සුඤ්ඤතො අනත්තතො.” ඒ කියන්නේ ඒ ධ්‍යානයෙන් නැගිටලා ඉවර වෙලා ඒ ධ්‍යානයට අදාළ රූප වේදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ කියන ඒවා ඒ කියන්නේ -යදෙව තත්ථ රූපගතං- ඒ ධ්‍යානයට අදාළව තිබුන රූප කොටස, වේදනා කොටස, සඤ්ඤා කොටස, සංඛාර කොටස, විඤ්ඤාණ කොටස, දිහා ආපසු හැරිලා බලලා ඒවා සම්මර්ශනය කරනවා, මෙනෙහි කරනවා. කොහොමද මෙනෙහි කරන්නේ. නිත්‍ය හැටියට ආත්ම හැටියට නොවේ. අනිත්‍ය වශයෙන්. මේ 'තො' 'තො' කියලා කීවේ 'වශයෙන්' කියන එකට. ඒ බලන ආකාරයට. අනිත්‍ය වශයෙන් දුක්ඛ වශයෙන් අනාත්ම වශයෙන්. 'අනිච්චතො- දුක්ඛතො- රොගතො- ' අනාත්ම කියන එක අගට එන්නේ. අනිත්‍ය හැටියට දුකක් හැටියට 'රොගතො' රෝගයක් හැටියට- 'ගණ්ඩතො' ගඩක් හැටියට- සල්ලතො - උලක් හැටියට- 'අඝතො' ව්‍යසනයක් හැටියට- 'ආබාධතො'- ආබාධයක් හැටියට, 'පරතො'- තමාගේ නොවන දෙයක් හැටියට, අනුන්ගේ දෙයක් හැටියට- 'පලොකතො' - බිඳෙන දෙයක් හැටියට - 'සුඤ්ඤතො'- හිස් දෙයක් පුස් දෙයක්, හැටියට, අනත්තතො - අනාත්ම දෙයක් හැටියට- අන්තිමට තියෙන්නේ අනාත්ම දෙයක් හැටියට. ඉතින් ඔය එකොළොස් ආකාරයකට සම්මර්ශනය කරන්න ඕන. ඒකයි විදර්ශනාවට නඟනව කියලා කියන්නේ. ඊළඟට පළවෙනි ධ්‍යානයෙන් නැගිටලා ඉවරවෙලා දෙවැනි ධ්‍යානයට සමවැදිලා ඒත් නැගිටලා අර විදියට දෙවෙනි ධ්‍යානයත් සම්මර්ශනය කරනවා. ඉතින් ඔහොම කිරීම තුළින් ඇතැම් කෙනෙකුට එක්කෝ රහත් වෙන්න පුළුවන්. නැත්නම් අනාගාමී වෙන්න පුළුවන්. නැත්නම් ඉදිරි මාර්ගඵල වලට යන්න පුළුවන්. ඔන්න බුදුරජාණන් වහන්සේ දක්වන ක්‍රමය. ඉතින් ඔය විධියට සමථයත් විදර්ශනාවත් එකිනෙකට ඇඳිලා යන හැටියට යුගනද්ධ හැටියටත් බුදුරජාණන් වහන්සේ දක්වලා තිබෙනවා.

ඉතින් මේ හැම එකෙන්ම අපි තේරුම් ගන්න ඕනෑ ඇත්ත වශයෙන්ම බුදුරජාණන් වහන්සේ ලෝකයට ඉදිරිපත් කළ විශේෂ පණිවුඩය තමයි විදර්ශනාව. නමුත් බුදුරජාණන් වහන්සේගේ ධර්මය පටිච්ච සමුප්පාද කියන මූලධර්මය අනුව- ඒ වගේම මධ්‍යම ප්‍රතිපදාව. මේ මධ්‍යම ප්‍රතිපදාව කියන එක ඉතාම පුළුල් දෙයක්. ඇතැම් කෙනෙක් හිතනවා මේ ආර්ය අෂ්ටාංගික මාර්ගය කියන එකෙන් ඔක්කොම සම්පූර්ණයි කියලා. නමුත්

විවිධාකාරයෙන් ඒ ආර්ය අෂ්ටාංගික මාර්ගයේම ප්‍රතිඵලයක් වශයෙන් ඒක මුළු මහත් ධර්මය පුරා පැතිරිලා තියනවා ගැඹුරු අන්දමින්. ඇත්ත වශයෙන් පටිච්චසමුප්පාද ධර්මය තුළිනුයි ඒ මධ්‍යම ප්‍රතිපදාත්මක ගතිය එන්නේ. මොකද, හේතු ප්‍රත්‍යයන් උඩයි යමක් ඇතිවන්නේත් නැතිවන්නේත්. ඉතින් ඒක නිසා බුදුරජාණන් වහන්සේ ඉස්සර වෙලාම හිත තැන්පත් කරගන්නා ආකාරය ප්‍රකාශ කරනවා. ඒ තැන්පත් කරගත්තු හිත අර විධියට ග්‍රහණය කරන්නේ නැහැ. උපාදාන වශයෙන් ග්‍රහණය කරන්නේ නැහැ අර අන්‍ය ආගමිකයින් කළා වගේ ඒක ආත්ම තත්ත්වයක් හැටියට. ඒ වගේම ධ්‍යානයක් තුළ තියෙන්නේ යම්කිසි අලෞකික සැපයක්. සාමාන්‍ය ලෝකයාට නොදැනෙන පුදුම අන්දමේ සැපයක් ඒ ඇතුළතින් විඳින්නේ ධ්‍යානලාභියා. ඉතින් බොහොම පහසුයි ඒක තුළ තමන්ට ලැබුන විශේෂ ආත්ම තත්ත්වයක්ය මේක' කියල හිතන්න. එහෙම නැත්නම් ඒක ගැන අනියම් සතුටක් ඇතිකර ගන්නවා මේක තමයි ආත්ම තත්ත්වය කියලා. මේක සදාකාලිකයි කියලා. ඒක බුදුරජාණන් වහන්සේ ක්ලේශයක් හැටියට දක්වනවා.

එතකොට ඒක නිසාම තමයි බුදුරජාණන් වහන්සේ සංඝයා වහන්සේලාට ප්‍රකාශ කරන්නේ ධ්‍යානය අත්දුටුවාට කමක් නැහැ. ඒ ධ්‍යාන සුඛයේ ගැලෙන්න එපාය. ධ්‍යාන නිකාන්ති කියල කියන්නේ ධ්‍යානයට තියන ඇල්ම. ධ්‍යානය ඇත්ත වශයෙන් දිට්ඨ ධම්ම සුඛ විහාර කියලා කියන එදිනෙදා සැප විහරණය සඳහා ධ්‍යානලාභියා යොදා ගන්නවා. ඔය ශබ්ද ඇහෙනකොට කාමරය වහලා බුදියගන්නවා වගේ යම්කිසි සමාධියක් තුළින් එදිනෙදා ධ්‍යාන පුරුදු කළ කෙනාට දිට්ඨධම්ම සුඛ විහාර වශයෙන් සැපයක් ලබන්න පුළුවන්. නමුත් ඒක අනියම් විධියට පමණට වැඩියෙන් බදා ගැනීම තුළින් සසරින් මිදීමේ අවස්ථාව නැතිකර ගන්න එපා කියලා බුදුරජාණන් වහන්සේ දක්වනවා. ඒකයි ධ්‍යාන නිකාන්තිය කියන ධ්‍යානයට තියන අනියම් ඇල්ම ඉවත් කරලා, ඒ තුළ ඇති මාන්නය ඉවත් කරලා, තේරුම් ගන්නවා මේකත් අනිත්‍යයි. දුක්ඛයි. අනාත්මයි. මේක සදාකාලික නැහැ. අන්න ඒකටයි සම්මර්ශනය කියල කියන්නේ. අනිත්‍ය දුක්ඛ අනාත්ම වශයෙන් දැකීම තුළින් ඒවා ගැන කලකිරිලා අන්තිමට කරන්නේ මොකක්ද? බුදුරජාණන් වහන්සේ දක්වනවා එහෙම විදර්ශනාවට නගලා ඒ පංචඋපාදානස්කන්ධයෙන් සිත මෑත් කරගෙන - **සිත මෑත් කරගෙන** - එතන ඊළඟට දක්වනවා, "අමතාය ධාතුයා" අමෘත ධාතු හැටියට ධර්මයේ දක්වන්නේ- එක පාඨයක් තියනවා නිවන හඳුන්වන- ඒකම 'උපසමානුස්සති' හැටියටත් දක්වනවා. මේ පින්වතුන්ට කලින් නොයෙකුත් ආකාරයෙන් අහන්න ලැබිලත් ඇති. "එතං සන්තං එතං පණීතං යදිදං සබ්බසංඛාර සමථො සබ්බුපධිපටිනිස්සග්ගො තණ්හක්ඛයො විරාගො නිරොධො නිබ්බානං" කියන පාඨයෙන් දක්වන්නේ නිවනයි. මේක ශාන්තයි මේක ප්‍රණීතයි. සියලු සංස්කාර සංසිඳීම සියලු- උපධීන් - මේ පංච

උපාදානස්කන්ධයමයි. මේ උපධීන් අතහැර දැමීම. ඊළඟට තණ්හාව ක්ෂය කිරීම විරාගය- නොඇල්ම- නිරොධය- නැවැත්ම, නිවීම කියන අන්න ඒකට හිත යොදනවා.

එතකොට අර පංච උපාදානස්කන්ධය පිළිබඳව- නැගිට්ට ධ්‍යානයට ඇති ඇල්ම ඉවත් කරලා ඒක උපකාර කරගෙන- විදර්ශනාව වඩලා නිවනට හිත හරවනවා. මේ බුදුරජාණන් වහන්සේ දුන්න උපමාවක් නොවේ, මේ පින්වතුන්ට ඔය කාරණය පැහැදිලි කරන්න "ගොඩේ උපමාවක්" කිව්වොත් දැන් මේ පින්වතුන් දන්නවා ගොයම් කපනකොට වම් අතින් ගොයම් පඳුර අල්ලනවා. අල්ලලා දෑකැත්තෙන් කපනවා. එතකොට අල්ලන්නේ කපන්නයි. ගොයම් පඳුර අල්ලන්නේ කපන්නයි. අන්න ඒ විධියට හිතාගන්න ඕනෑ. ධ්‍යානයට හිත දාන්නේ මේකට විදර්ශනාව යොදවා මේකෙන් හිත මුදාගන්නයි. මේ පංච උපාදාන ස්කන්ධයේ විසිරිච්ච සංස්කාර ප්‍රඥාවෙන් අධික අයට පුළුවන් වුනත් සාමාන්‍යයෙන් අපහසුයි විසිරුන පංච උපාදානස්කන්ධය විදර්ශනාවට ලක් කරන්න. ඒක නිසා අන්න බුදුරජාණන් වහන්සේ ධ්‍යානය එතැනදී ඒකට උපකාර කරගන්නවා. නමුත් ඒක සම්මා දිට්ඨිය තුළින් සම්මා සමාධි තත්ත්වයක්. ඒ ත්‍රිලක්ෂණය යෙදුවාට පස්සේ තමයි එයින් සිත මෑත් කරගන්න පුළුවන් වන්නේ. ඉතින් අන්න ඒකෙන් අපට තේරුම් ගන්න පුළුවන් වෙනවා. ඒකාන්ත වශයෙන් අන්තගාමී හැටියට සමථය විතරක් අල්ල ගන්න එක හරි නැහැ. විදර්ශනාව විතරක් අල්ල ගන්න එක හරි නැහැ. බුදුරජාණන් වහන්සේගේ වචනයට ඒක විරුද්ධයි.

නමුත් ඇතැම් අවස්ථාවල බුදුරජාණන් වහන්සේ දක්වලා තිබෙනවා පඤ්ඤින්ද්‍රිය කියන එක ඉන්ද්‍රියන් අතර අග්‍ර බව. ඉන්ද්‍රියයන් කියලා කියන්නේ මේ ඇස් කන් නාසාදිය නොවේ. අපි ශාසනික ධර්ම ගැන කථා කරනවා නම් සද්ධා විරිය සති සමාධි පඤ්ඤා. සද්ධා විරිය සති සමාධි පඤ්ඤා ඕවා ඔය ඉන්ද්‍රිය ධර්ම හැටියට දක්වන්නේ මොකද? මේ ඇතැම් පුද්ගලයින් සංසාරයේ එක එක පැතිවලින් දියුණු වෙලා ඇවිල්ලා තියනවා. ඇතැම් අය ශ්‍රද්ධාවෙන් අධිකයි. ඔය වක්කලී වගේ අය. ඇතැම් අය, සෝණ ආදී අය වීර්යයෙන් දියුණුයි. වීර්යය දියුණු කරලා තියෙනවා. ඔය විදියට ඇතැම් අය ඉන්නවා. සංසාරයේ එක එක පැත්තෙන් දියුණු වෙලා. ඒක බුදු ඇසටයි පෙනෙන්නේ. සාමාන්‍ය පුද්ගලයා ලකුණු දාගන්න නරකයි මම අයිති ප්‍රඥා ගණයට කියලා. ඒක නිසා බුද්ධ වචනයට අනුව අන්න අර මුලින් කීව වගේ දින චරියාව සකස් කරගත යුතුයි. ඒක තවත් පැහැදිලිව දක්වනවා භික්ෂුවගේ දින චරියාව දක්වන තැන. සීලය පිරිසිදු කරගෙන ඊළඟට 'අජ්ඣත්තං චෙතො සමථං අනුයුත්තො'- නිරන්තරයෙන් සමථයෙහි යෙදෙමින් ඊළඟට 'අනිරාකතජ්ඣානො' ධ්‍යාන නොපිරිහෙළා වඩමින්, 'විපස්සනාය සමන්නාගතො' විදර්ශනාවෙන් සමන්විතව, 'බ්‍රූහෙතා සුඤ්ඤාගාරානං' පාලු ගෙවල් පිළිබඳව

ඇල්ම ඇතිකර ගන්න. ඒවායේ වාසය කරන්න. කියලා අන්න සාමාන්‍යයෙන් බුදුරජාණන් වහන්සේ සංඝයා වහන්සේලාට දීපු අනුශාසනය. ඒ දෙකම වැඩෙන ආකාරයට "සමථං අනුයුඤ්ජෙය්‍ය කාලෙන ච විපස්සනං" කියන විධියට ඒ උපසේන ස්වාමීන් වහන්සේ ප්‍රකාශ කරන්නේ ඒ බුද්ධ වචනයමයි. අවස්ථානුකූලව සමථය වඩන්න ඕන. අවස්ථානුකූලව විදර්ශනාව වඩන්න ඕන. අවස්ථානුකූලව කිව්වේ ඇත්ත වශයෙන්ම මේ පින්වතුන්ට ප්‍රායෝගික වශයෙන් බලනවා නම් දන්නවා හිත සමාධිමත් කර ගන්න, විශේෂයෙන් ආනාපාන සති භාවනාව ආදියට, නිහඬ පරිසරයක් අවශ්‍යයි. ඉතින් ඒක නිසා දවසේ නිහඬ කාලය අන්න සමාධිය සඳහා යොදවනවා. විදර්ශනාවට එතරම්ම එහෙම බාධකයක් එන්නේ නැහැ. ඒක සිතුවිලිත් එක්ක, විතර්කත් එක්ක, යන එකක් නිසා. එතකොට ඔය දෙක එකකට එකක් උපකාර කරගෙනයි මේ ගමන යායුත්තේ.

ඊළඟට දැන් අර කලින් කිව්ව ආකාරයට මේ සමථය- මේ සම්බුද්ධ ශාසනයේ සමථයට ලැබෙන තැන මොකද්ද? විදර්ශනාවට ලැබෙන තැන මොකක්ද? කියන එක පැහැදිලි කරගන්න පුළුවන් වටිනා සූත්‍ර දේශනාවක් බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කළා එක් අවස්ථාවක ඒත් හොඳ උපමාවකින්, ගැඹුරු උපමාවකින්. දැන් අර අපි ප්‍රකාශ කළා නේ එක් එක් ධ්‍යානයෙන් නැගිටලා එකොළොස් ආකාරයකින් 'අනිච්චතො දුක්ඛතො රොගතො' ආදි වශයෙන් සම්මර්ශනය කිරීම තමා විදර්ශනාවට නැඟීම කියලා. ඊළඟට බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනවා මෙන්න මෙහෙම උපමාවක්. යම් කිසි දුනුවායෙක් හෝ දුනුවායකුගේ අතවැසියෙක් හෝ - 'තිණපුරිසක' කියලා කියන්නේ තණකොළ වලින් හදපු මිනිහෙක්. පඹයෙක් කියලා කියමු. තණකොළ වලින් පිදුරු වලින් එහෙම ඔය මිනිස්සු පඹයෝ හදනවා නේ. පඹයෙක් හෝ "මත්තිකා පිණ්ඩං" කියලා කියන්නේ මැටි පිඩ. එතකොට පඹයෙක් හෝ මැටි පිඩක් ආශ්‍රය කරගෙන දුනුවායෙක් දුනු ශිල්පය පුරුදු කරනවා. ඒ කියන්නේ ඉලක්ක පුවරුවක් හැටියට යොදනවා. අර පඹයා හරි මැටිපිඩ හරි යොදාගෙන එහෙම අභ්‍යාස කරලා යම් දවසක, සෑහෙන පමණට දක්ෂ වුනාට පස්සේ කරන ටිකත් දක්වනවා. යෝධාජීව වග්ගය කියන එක්තරා කොටසක තියනවා- 'යෝධාජීව' කියලා කියන්නේ, පින්වතුනි, රක්ෂාවක් හැටියට යුද්ධ කරන කෙනා- ඉතින් අපි හිතමු හොඳ දුනුවායෙක්. ඒ දුනුවායාගේ රක්ෂාව යුද්ධයේදී විදීමයි. ඉතින් ඒ තැනැත්තා අර විධියට පුහුණු වෙලා ඒ තමන්ගේ දක්ෂතාව ඔප්පු කරන අවස්ථාව බුදුරජාණන් වහන්සේ දක්වන්නේ කොහොමද? අර විධියට මැටිපිඩට හරි, පඹයට හරි, විද විද ඉඳලා යම් අවස්ථාවක- "දූරෙපාතී" කියන වචනය යොදනවා. මේ දුනුවායට පුළුවන් හුඟක් ඈතට විදින්න. ඈත ඉලක්කයකට විදින්න පුළුවන් වෙනවා- "දූරෙපාතී"

ඒ පළමු දක්ෂතාව. ඊළඟට "අක්ඛණවේධී" කියලා වචනයක් තියනවා. අක්ඛණවේධී කියන්නේ, පින්වතුනි, අකුණු එළියෙන් විදීම. මේ පින්වතුන් අහලා ඇති නේ පැරණි දුනුවායන්ගේ දක්ෂකම දක්වන්නේ අකුණු එළිය වැටෙන වෙලාව බලලා වෙන එකක් තියා අශ්වලෝමයක් පවා පලනවා කියලා කියනවා. ඒ තරම් මහ පුදුම දෙයක්. නමුත් අකුණු එළිය වෙලාවටම හරියට විදින එක පවා මහ දුෂ්කර එකක්. ඒකත් කරනවා. "අක්ඛණවේධී" ඔන්න දුනුවායාගේ දෙවෙනි දක්ෂකම. තුන්වැනි දක්ෂකම මොකක්ද? "මහතො කායස්ස පදාලෙතා" මහ විශාල ශරීරයක් වුනත් පලනවා. ඉලක්කය බලලා විද්දොත් සමහර විට ලොකු ශරීරයක් වුනත් පලලා දාන්න පුළුවන්. අන්න ඒ දුනුවායාගේ දක්ෂකම.

ඕක සම්බන්ධ කරනවා මෙන්න මේ විදර්ශනා භාවනාවට පුදුම අන්දමින්. ඒ කියන්නේ දැන් අර කිව්ව නේ එකොළොස් ආකාරයකින් මෙනෙහි කරනවා කියලා ත්‍රිලක්ෂණය වශයෙන්. තවත් එකොළොස් ආකාරයක් තිබෙනවා. අන්න ඒ විග්‍රහයයි ඔතනදී දක්වන්නේ, අර "දූරෙපාතී" කියන එකට- මේ පින්වතුන් කල්පනාවෙන් ඇහුම්කන් දෙන්න. මේ හරිය ටිකක් සංකීර්ණ වෙන්න පුළුවන්- නමුත් සන්සුන්ව ඇහුවොත් තේරෙන්න පුළුවන්. 'දූරෙපාතී' කියලා බුදුරජාණන් වහන්සේ පළමු දක්ෂතාව හැටියට දක්වන්නේ- දුනුවායට ඈතට විදින්න පුළුවන් කියන එක තේරුම් කරන්නේ- මෙහෙමයි. අර පංචඋපාදානස්කන්ධයම වෙනත් එකොළොස් ආකාරයකට මෙනෙහිකිරීම. ඒ එකොළොස් ආකාරය මොකක්ද? මේ පංචස්කන්ධය- ස්කන්ධය කියල කියන්නේ ගොඩ නේ? මෙන්න මේ "ගොඩ" කියලා මේකට ව්‍යවහාර කරන්නේ මක්නිසාද කියලා කියන එකත් බුදුරජාණන් වහන්සේ පහදලා දීලා තියනවා, ඇතැම් අවස්ථාවල. මේක "ගොඩක්" වෙන්නේ කොහොමද? ඒ ගොඩ හැටියට දක්වන්නේ එකොළොස් ආකාරයකින්- 'අතීත, අනාගත, පච්චුප්පන්න' එතන තුනක් තියනවා. 'අජ්ඣත්තං වා බහිද්ධා' ඇතුළත හෝ පිටත හෝ 'ඕළාරිකං වා සුඛුමංවා' ගොරෝසු හෝ සියුම් හෝ, 'හීනං වා පණීතංවා', පහත් හෝ උසස් හෝ 'යං දූරෙ සන්තිකෙ වා,' දුර හෝ ළඟ හෝ. ඔන්න එතකොට එක එක ස්කන්ධයක් රූප හෝ වේවා, වේදනා හෝ වේවා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ හෝ වේවා, මේ අපි අල්ලාගෙන ඉන්න ගොඩවල් ඔන්න ඔය එකොළොස් ආකාරයටයි තියෙන්නේ.

දැන් මේ පින්වතුන් මේ රූපය කියලා කියන්නේ ඔය තියන ටිකට විතරක් නොවෙයි නේ. ඔය සාක්කුවල දාගන ඉන්න, එහෙම නැත්නම් ගෙදරවල තියාගෙන ඉන්න, පින්තූරත් 'ඒක මගේ' කියල කියනවා. ඒවා අතීතයේ ගත්තු ඒවා. අනිත් අය පිළිබඳවත් එහෙමයි. අනාගතයෙ තියන රූපත් හිතේ තියෙනව. ඔය සැරසෙන වෙලාවල දන්නව නේ 'කොහොමට

හිටීද මම සැරසිල ඉවර වෙනකොට' - ඉතින් ඒක අතීත අනාගත පච්චුප්පන්නයි. අජ්ඣත්තං බහිද්ධා - ඇතුළත තමා පිළිබඳව වෙන්නත් පුළුවන්, අනිත් අයගේ රූප වෙන්නත් පුළුවන්- තමන් අල්ලාගෙන ඉන්න. ඊළඟට රූපය ගැන කියනවා නම් මේක තේරුම් කරලා දෙන්න 'ඕළාරිකං වා සුඛුමං වා' රළු එකක් වෙන්නත් පුළුවන් සියුම් එකක් වෙන්නත් පුළුවන්. 'හීනං වා පණීතං වා' පහත් එකක් වෙන්නත් පුළුවන් උසස් එකක් වෙන්නත් පුළුවන්. දුර එකක් වෙන්නත් පුළුවන් ළඟ එකක් වෙන්නත් පුළුවන්. ඔය එක එක ස්කන්ධයක් ඔය එකොළොස් ආකාරයට බුදුරජාණන් වහන්සේ දක්වල තියෙනව. එයින් පෙන්නුම් කරන්නේ අර එක එක ස්කන්ධයක් පරිපූර්ණ වශයෙන්, ඒ ඔක්කොම, එකොළහක් එක ස්කන්ධයක තියනවා. අන්න ඒකයි මේක 'දූරෙපාතී' කිව්වේ. එතකොට අර දුනුවායට අර විධියට ත්‍රිලක්ෂණයට අනුව එකොළොස් ආකාරයකින් මෙනෙහි කිරීම තුළින් ඒ ලබන දක්ෂතාව කෙළවර වන්නේ කොහොමද?

අන්න එතැනදී දක්වනවා විශේෂ දෙයක්. අර කියාපු එකොළොස් ආකාරයකින් මෙනෙහි කරන්නේ කොහොමද? බුදුරජාණන් වහන්සේ දක්වන්නේ අනාත්ම වශයෙන් 'නෙතං මම, නෙසොහමස්මි, න මෙසො අත්තා' 'නෙතං මම' මෙය මගේ නොවේ. 'නෙසොහමස්මි' කියන්නේ මෙය මම නොවේ. මම නොවෙමි. 'න මෙසො අත්තා' මෙය මගේ ආත්මය නොවේ. ඔන්න කෙලින්ම අනාත්ම දර්ශනය. ඒක තමයි දුරට විදිනවා කියලා කියන්නේ. අර කියාපු කරපු අභ්‍යාසයේ අවසාන ප්‍රතිඵලය, අර ඊතලය හුඟක් ඈතට විදිනවා කියලා කියන්නේ ඔන්න පංචඋපාදානස්කන්ධය සම්පූර්ණයෙන්ම, පරිපූර්ණ වශයෙන්ම, අල්ලලා අනාත්ම වශයෙන් මගේ නොවේ මම නොවෙමි මගේ ආත්මය නොවේ කියලා දකින්න පුළුවන් අවස්ථාවෙදි තමයි මාර්ග ඵල අවබෝධය ලබන්නේ. ඒකයි අර "දූරෙපාතී" කිව්වේ.

ඔන්න ඊළඟට ඒකේ අනිත් පැත්ත. ඊළඟ එකත් තේරුම් කරනවා. "අක්ඛණවෙධී" කියලා කියන්නේ මොකද්ද? විදුලිය එළියෙන් විදීමේ දක්ෂතාව උපමා කරන්නේ බුදුරජාණන් වහන්සේ චතුරාර්ය සත්‍යය විනිවිද දැකීමට. අර කියාපු දුනුවායාගේ ශිල්පය තුළින්, එහෙම නැත්නම් උපමාව තුළින්, උපමේයත් මේ පින්වතුන් හිතට නගාගන්න. අර භික්ෂුව අර විධියට යම් අවස්ථාවක සමාධිය උපකාර කරගෙන වඩන විදර්ශනාව තුළින් මාර්ගඵල අවස්ථාවේදී අවබෝධ කර ගන්නේ චතුරාර්ය සත්‍යයයි. මේ පංච උපාදාන ස්කන්ධයම දුකයි. මේක යට තණ්හාවයි. තණ්හාව නැතිවුනාම නිවනයි. ඊළඟට ඒකට මාර්ගය ඉබේම සකස්වෙලා ඉවරයි. ආර්ය අෂ්ටාංගික මාර්ගය තුළිනුයි මේ ටික කෙරෙන්නේ.

ඔන්න ඔය ටිකයි එතකොට. චතුරාර්ය සත්‍යය විනිවිද දැකීමයි. විනිවිද දැකීම- එතන අර ක්ෂණයක වෙන දෙයක් ඒක. බොහොම පොඩි මාර්ගක්ෂණය කියන එක. ඉතාමත් සියුම් අන්දමින් ආර්‍ය අෂ්ටාංගික මාර්ගයේ ඒ මාර්ගඥානය කියන එක මාර්ග අංග අටම එක හිතක පහළවන ඉතාමත්ම ප්‍රබල සමාධියක්. ඒකයි එතන 'අක්ඛණවෙධී' කියලා කියන්නේ. විදුලි එළියෙන් විදිනවා වගේ එකක්. ඒ හපන්කම ඒ දෙවැනි හපන්කම.

ඊළඟට "මහතො කායස්ස පදාලෙතා" අර දුනුවායාගේ තුන්වැනි හපන්කම මොකක්ද? විශාල ශරීරයක් වුනත් පලන්න පුළුවන් මේ ඊතලයෙන්. පොඩි ඊතලය වුනාට හොඳට එල්ලෙ අල්ලල ඉලක්කයට විද්දනම් ඒක "මහතො කායස්ස පදාලෙතා." ලොකු කයක් පලනවා කියන එකෙන් දක්වන්නේ මොකක්ද? බුදුරජාණන් වහන්සේ ඒක උපමා කරන්නේ අති විශාල- මහා විශාල අවිද්‍යාව- පළලා දමනවා. අවිද්‍යාව නමැති මේ අඳුරු කඳ පළනවා. අවිද්‍යාව නමැති අඳුරු කඳ පළාදැමීම තමයි අන්න අර තුන්වැනි හපන්කම. ඒ ඔක්කොම කරන්නේ අර ධ්‍යානය උපකාර කරගන.

ඉතින් මෙන්න මේ උපමාව ආශ්‍රයෙන් අපි තේරුම් ගන්න ඕනෑ අර අන්‍ය ආගමිකයින් ආත්ත්ම තත්ත්වයක් හැටියට ගත්තු මේ ධ්‍යානය බුදුරජාණන් වහන්සේ උපමා කරන්නේ මොකටද? **පඹයෙකුට, මැටි පිඩකට.** ඒකට නිග්‍රහ කළයුතු අන්දමට නොවේ. නමුත් පාවිච්චි කරන්න වෙනවා විදර්ශනාව සඳහා යොදාගන්න, පඹයෙක්, මැටිපිඩක්, කියලා හිතා ගන්නවා. **ඉතින් ධ්‍යානයම ලොකුවට අරගෙන ඇතැම් කෙනෙක් විදර්ශනාව පස්සට දමනවා.** කල්පනා කරන්න ඕන. බුද්ධෝත්පාද කාලයක විදර්ශනාවේ අගය. ඒක නිසාමයි බුදුරජාණන් වහන්සේ පඤ්ඤින්ද්‍රියේ වටිනාකම ප්‍රකාශ කරලා තියෙන්නේ. පඤ්ඤින්ද්‍රිය අනිත් ඔක්කොම ඉන්ද්‍රියයන්ට අග්‍ර වෙනවා. අපි අර කිව්වා කලින් ලකුණු දාගන්න යන්න එපා කියලා. නමුත් ඇතැම් අවස්ථාවල- පැයක් තුළ මේ ඔක්කොම කියන්න බෑ- කලාතුරකින් ඇතැම් කෙනෙක් අර විධියේ විශේෂ ධ්‍යාන ශක්තීන් නැතිව, නැත්නම් අවම ධ්‍යාන ශක්තිය තුළින්, අර කියාපු ප්‍රත්‍යක්ෂය ලබනවා. නමුත් කෙනෙක් එහෙම හිතන්න නරකයි- දන් අර බාහිය ආදීන් මේ පින්වතුන් දන්නවා- හිතන්න නරකයි බාහිය දාරුචීරිය ආදීන්ට සමථ ශක්තියක් නැහැ කියලා. අතීතයේ ඒවා වඩලා තියනවා. ඒ සුදුසුකම් ඇතුළේ තියනවා. ඒකයි අමුතුවෙන් වඩන්න දෙයක් නැත්තේ. ඒක අපට තේරුම් ගන්න බැහැ. වැඩේට 'කර'- දීලයි තේරුම් ගන්න වෙන්නේ. **නමුත් අන්න බුද්ධ වචනයේ සාමාන්‍ය රීතිය අනුව අපි කවුරුත් සමථයත් වඩන්න ඕනෑ. විදර්ශනාවත් වඩන්න ඕන.** එහෙම නැත්නම් දෙක එකටම වඩන්න ඕන. ඒකයි අපිට තේරුම් ගන්න තියෙන්නේ.

එතන අර මැටි පිඬේ උපමාව ඉතාමත්ම ප්‍රබල වටිනා කාරණයක්. මේ ශාසනයේ සමාධියට ලැබිච්ච තත්ත්වය. මොකද, බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනවා පංචඋපාදානස්කන්ධය ධ්‍යාන අවස්ථාවේදී පවා- ඉහළම ධ්‍යානය පවා- ඒක "අනිච්චං සංඛතං පටිච්ච සමුප්පන්නං" අනිත්‍යයි, හදාගත්තු, අටවාගත්තු දෙයක් සකස්කර ගත්තු දෙයක්. ඒකයි ඔය සංඛත කියලා කියන්නේ. මේ සංස්කාර වලින් සකස්කරගත්තු දෙයක්. ඒක නිසා සංස්කාර අනිත්‍ය නම් සංස්කාර වලින් සකස් කරගත් දෙයත් අනිත්‍ය නේ. එතකොට ධ්‍යානයත් සමහරවිට එහෙම කල්ප ගණන් තිබිලත්, අන්තිමට බ්‍රහ්මලෝකෙ ගිහිල්ලත්, ඊළඟට ආයිත් කරකැවිලා එනවා. එතකොට ඒවා ඔක්කොම ලෞකිකයි. ඒවා ලෞකිකයි. **නමුත් විදර්ශනාවෙන් යන අවසාන කෙළවර නිවන "අසංඛත" කියලා කියන්නේ ඒකයි. ඒක අලෞකිකයි ලෝකෝත්තරයි.** එතකොට සංඛතය උපකාර කරගෙනයි යන්නේ. සංඛතය උපකාර කරගෙන, අර පහුර උපකාර කරගන්නවා වගේ, සංඛතය උපකාර කරගෙන, අන්න ලෝකයෙන් එතර වන හැටි බුදුරජාණන් වහන්සේ දක්වුවා. ඒකයි සෝවාන්, සකදාගාමී, අනාගාමී, අර්හත් කියලා කියන්නේ.

ඔන්න එතකොට තේරුම් ගන්න ඕන මේ සමථයත් විදර්ශනාවත්. සමථය- ඒක සම්පූර්ණයෙන් බැහැර කරලත් බැහැ. ඒක උපකාර කරගන්න ඕන. ඒක තුළින් අර විසිරිච්ච හිත එක් තැන් කරනවා. නමුත් ඒ එක්කම එයින් සෑහීමට පත්වන්න නරකයි. ධ්‍යාන සුවයේ ගැලෙන්න නරකයි. ඊළඟට ඒක උපකාර කරගෙන අර එකතු කරගත්තු ටික විදර්ශනාවට නගලා අර යම් අවස්ථාවක අන්න අර කිව්ව දුනුවායා වගේ අන්තිමට මේ පංච උපාදාන ස්කන්ධය 'නෙතං මම, නෙසොහමස්මි, න මෙසො අත්තා, 'මෙය මගේ නොවේ, මෙය මම නොවෙමි., මේ මගේ ආත්මය නොවෙයි කියලා ඒක හොඳට වැටහුනු අවස්ථාවෙයි අන්න අර පංච උපාදානස්කන්ධයෙන් සිත මෑත් කරලා- සිත මෑත් කරලා- අන්න අර නිවන කියන- නිවන කියන්නේ මොකක්ද? සබ්බ සංඛාර සමථ- එතකොට සියලු සංස්කාර සමථය කිරීම, සංස්කාර සංසිඳීම ඊළඟට ඒ සංඛාර තුළින් ඇතිකරගත්තු මේ උපධි, උපධි කියල කියන්නේ මේ වත්කම් රාශිය අපි මේ අල්ලාගන ඉන්න පංච උපාදාන "ගොඩ". රූප ගොඩ වේදනා ගොඩ ආදියම තමයි, උපාදාන නමින් හඳුන්වන ඒ උපාදාන ටිකම තමයි, අල්ලලා තැන්පත් කරගත්තට පස්සේ ඒවා 'උපධි' නමින් හැඳින්වෙන්නේ. සමහර දේවල් වල අපි **එල්ලිලා** ඉන්නවා. සමහර දේවල්වල **රඳා සිටිනවා.** එල්ලිලා ඉන්න එකත් අනිත්‍යයි. ඒක කැඩුන හැටියේ ඇද වැටෙනවා. රඳා සිටින දේවලුත් අනිත්‍ය බව මේ පින්වතුන්ට අහන්න ලැබෙන දේවල් වලින් තේරෙනවා. උපධීන් ආදී ඒ වත්කම් කියලා හිතාගන හිටපු දේවල් ඔක්කොම ඒව අනිත්‍යයි. ඉතින් එහෙම එකක් තමයි මේ ධ්‍යානය කියන එකත්. ඒකයි ධ්‍යානයෙන් පිරිහෙන්නත් පහසුවෙන්නේ.

නමුත් අර මාර්ගඵල ලබාගත්තාට පස්සේ ඒවා-ඉන් ලැබෙන ප්‍රත්‍යක්ෂය - කිසිසේත් වෙනස් වන්නේ නැති දෙයක්. විශේෂයෙන්ම මේ භවයෙන් මිදීමට උපකාර වෙන්නෙ අවසානයේ අමෘතය නමින් හැඳින්වෙන අමත ධාතුව. 'අමත ධාතු' නමින් දක්වෙන්නේ "දෙයක්" නොවේ. මරණින් මතු යන "තැනක්" නොවේ. අමුතු "ලෝකයක්" නොවේ. අන්න අර කියාපු හිතේ උපාදානය තුළ නම් පැවැත්ම තියෙන්නේ උපාදානය නැතිවූ තැන පැවැත්මේ නිරෝධයයි. "භව නිරොධො නිබ්බානං" කිව්වේ ඒකයි. පැවැත්මේ කෙළවර. එතකොට මේ සංසාරයේ උපදින්න ලේසියි. ලේසි නිසා තමයි මෙච්චර කාලයක් අපි ඉපදි ඉපදි මැරි මැරී ආවේ. නමුත් අමාරු දේ තමයි මේ ඉපදීම නැතිකර ගන්න එක. ඉපදීම නැතිකර ගන්න එකයි අමාරු. ඒකටයි බුදුකෙනෙක් ඕන වන්නේ. බුදු කෙනෙක් පහළ වෙලා මෙච්චර මිනිස්සු වඳින්නේ පුදන්නේ බුද්ධ ශාසනයේ සාරය කියලා කිව්වේ ඒකයි. සංසාර විමුක්තියයි.

ඉතින් යම් අවස්ථාවක ඒ සංසාර විමුක්තිය කියල කියන මූල් පරමාර්ථය අපි අමතක කරනවා නම් එතකොට වෙන්නේ මොකද්ද? **අන්න අර අඳුරු රාත්‍රියක- අඳුරු රාත්‍රියක - සිරීපාදේ නගින්න යන පිරිසකට සිරීපාදෙ මුදුනේ තියන ආලෝකය නිවුන අවස්ථාව වගේ.**

එතකොට මේ පින්වතුන්ට අපි මිහිඳු මහරහතන් වහන්සේ අපට ලබා දුන්න මේ වටිනා බුද්ධ ශාසනය පිළිබඳව අපි ගැඹුරින් කල්පනා කරලා මේ අවස්ථාවේ ප්‍රකාශ කළේ සම්බුද්ධ ශාසනය ඉතාම ලිහිල් කරගෙන- සම්බුද්ධ ශාසනය කියල අර බාහිර ටික පමණක් බුද්ධ ශාසනය හැටියට ඉදිරිපත් කරන සංකල්ප අද බොහෝ විට දකින්න තියෙන්නේ. නමුත් මේ පින්වතුන් තේරුම් ගන්න ඕන පර්යාප්තිය, ප්‍රතිපත්තිය, ප්‍රතිවේධය, කියන තුන එකකට එකක් සම්බන්ධයි. ඒ ප්‍රතිපත්ති ප්‍රතිවේධ ආදියෙන් තොරවුන හැටියේ පර්යාප්තිය විකෘත වන බව පහසුවෙන්ම තේරුම් ගන්න පුළුවන්. ඒකයි බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරලා තියෙන්නේ මේ ධර්මය- අර සමථ විදර්ශනා තුළින් ධර්මය අවබෝධ කරගෙන ඒ තුළින් ධර්මය පිළිබඳ හරි අවබෝධයක් ලබාගෙන නැත්නම්- අර තමන් කටපාඩම් කරගත්තු එක ඊළඟ පරම්පරාවට යනකොට ඒක තවත් විකෘත වෙනවා. මේකෙ හරි එක මොකක්ද, වැරදි එක මොකක්ද, කියන එක තේරුම් ගන්න බැරිවෙනවා. ඊළඟට ඒක අනුව යන චින්තන පරම්පරාව සමහර විට මිථ්‍යාදෘෂ්ටි වලින් කෙළවර වෙන්නෙ. **මිථ්‍යාදෘෂ්ටි වලින් කෙළවර වෙන්නෙ.** එතකොට ඒක තමයි අර කකුළු අඬු බෙරේ වගේ. බෙරේට වෙන කැලි එකතු කරනවා. අන්තිමට බෙරේ බොල් හඬක්.

අන්න ඒක නිසා අපි කල්පනා කරන්න ඕනෑ. සම්බුද්ධ ශාසනයේ සාරය හරියට තේරුම් අරගෙන අද දින ඒකට අදාළව වටිනා සීලයක් සමාදන් වෙලා ඊට අදාළ බණ භාවනා කළෙ මේ සංසාර විමුක්තිය කියන ඒ උතුම් නිර්වානය සාක්ෂාත් කරගැනීම සඳහායි. එතකොට අපි බලාපොරොත්තු වන ඒ වටිනා සම්බුද්ධ ශාසනය ආරක්ෂා කර ගැනීම සඳහා මේ පින්වතුන් තමන් අර කියාපු සීල සමාධි ප්‍රඥා කියන ශාසන ධර්මයන් තමා තුළින් දියුණු පවුණු කරගෙන, සමථ විදර්ශනා දෙකම වඩමින්, ගිහි හෝ වේවා පැවිදි හෝ වේවා- ඒ එකම මාර්ගයයි- එතකොට ඒ තුළින් සෝවාන් ආදී මාර්ග ඵල ප්‍රතිවේධයෙන් අවසානයේ සංසාර විමුක්තිය කියන උතුම් අමා මහ නිවන සාක්ෂාත් කරගැනීම සඳහා මේ පින්වතුන්ට මේ දේශනයත් උපකාර වේවා කියලා අපි ප්‍රාර්ථනා කරනවා. එතකොට අපේ මේ දේශනාව තුළ ඇති ධර්ම දේශනාමය ධර්මශ්‍රවණමය කුශලය සමාදන් වීමට බලාපොරොත්තු වෙන අවීචියේ සිට අකනිටා දක්වා යම් සත්ත්ව කෙනෙක් ඇතොත් ඒ අනුමෝදන්වීම තුළින් ඒ තමන් බලාපොරොත්තු වන ප්‍රාර්ථනීය බෝධියකින් උතුම් අමා මහ නිවන් සාක්ෂාත් කර ගනිත්වා. තමතමන්ටත් මේ ජීවිතය තුළදීම මේ උතුම් තත්ත්වයන් ලබා ගැනීමට ශක්තිය බලය ලැබේවා කියා ප්‍රාර්ථනා කරගෙන මේ ගාථා කියන්න.

එත්තාවතා ච අමෙහහි...

# උපග්‍රන්ථය

*උපග්‍රන්ථය - 1*

## කයක හැටි

### (සුත්ත නිපාතයේ විජය සූත්‍රය ඇසුරෙනි.)

1. ඇවිදිනේ     සිටිනේ
හිඳිනේ හෝ     වැතිරුණේ
හැකුළුම් දිගැරුම්     අනේ
කයෙක සෙලවුම්     පමණේ

2. ඇට නහරින්     බැඳුනු
සම්මසින් පිරියම්     වුනු
කය සිවියෙන්     වැසුනු
ඇති හැටිය නැත     දිස්වනු

3. අතුනු වකුගඩු     මලමූ
අක්මා හද     පෙනහලූ
ලේ පිත් කෙල     සෙම්සොටූ
ඩහදිය මේද     වුරුණූ

4. නව දොරින්     හැමදා
අසුචි වැගිරේ     දුගඳා
කඳුලු කන්     මලදා
කබ සෙම් සොටුද     නිබඳා

5. විටෙක එයි     වමනේ
පිත් සෙම්ද ගෙන     මුවිනේ
කයෙන් ඩහදිය     නේ
කුණු දැලි මුසුව     ගලනේ

6. හිස් කබලෙහි     පිරුන
මොළ ළොඳ සුබැයි     හඟවන
මානයකි     යටවන
බාලයා අවිදුවෙහි     විදුවන

7. මියැදි ඉදිමී තිල්වී
අමුසොහොනක දන් හොවී
මළකුණක් මෙන් වී
නෑසියන් සැමටම එපා වී

8. බලු කැණහිලු කපුටු
ගිජුලිහිණි වැනි දුටු දුටු
සතුනට අහර ඉටු
ඉතිරි වෙන තුරු මොහුගෙ ඇටකටු

9. බුදු බණ ඇසූ මහණ
ඇත වඩා විදසුන් නැණ
තතු ඇති පරිදි දැන
දකියි කය වෙත සිත යොමාගෙන

10. මෙකය වෙද යම්සේ
එකයටද වෙයි එලෙසේ
එකය වෙද යම්සේ
මෙකයටද වනු නියති එමසේ

11. තම කයටද බැහැර
කයටද ඇලුම දුර හැර
මහණ එම පැණසර
ළඟාවෙයි වෙත නිවන් අමදොර

12. ඇතිමුත් දෙපාදේ
කුණපමය ගෙන යන දේ
වැගිරෙත හැම සදේ
හමයි දස දෙස එයින් දුහදේ

13. කුණු කය දරමිනේ
නමුදු ඇතිකර මානේ
අනුන් අවමානේ
හෙළන අය තුළ නුවණ නැ නේ

## උපග්‍රන්ථය - 2

# නාසිසස් මල සහ නොමළ නාසිසස්

**නාසිසස් මල:**

නාසිසස් කිසිදාක තම රුව නුදුටු රූමත් ග්‍රීක තරුණයෙකි. හේ දිනක් වනයක සැරිසරන අතර මුව සෝදා ගැනීමට පොකුණකට නැඹුරු විය. පළමු වරට තම රූමත් මුහුණේ ඡායාව දුටු නාසිසස්, දියෙහි වෙසෙන දෙවඟනකැයි රැවටී එය වැළඳ ගැනීමට තැත් කළේය. **දියරැළි අතර නොපෙනී ගිය දෙවඟන, දියරැළි සන්සිඳෙන විට නැවත දිස්විය.** තමා දෙස ඇල්මෙන් බලා සිටින දෙවඟන වැළඳ ගැනීමට ඔහු නැවත නැවතත් තැත් දැරූ නමුදු ඇය දිය රැළි අතර සැඟවි සැඟවී එබිකම් පෑවාය. දවස පුරා නිෂ්ඵල තැතක් දැරූ ඔහු නිවස බලා ගියේ පසුදා ද පැමිණ තම මනදොළ පුරවා ගැනීමේ අදිටනිනි.

පසුදාද, ඊට පසුදාද, ඊට පසුදාද,.... පොකුණ වෙත පැමිණි නාසිසස් යළි යළිත් දෙවඟන වැළඳ ගැනීමට තැත් කළ මුත් දිය රැළි ඊට හරස්විය. අන්තිමේදී ඔහු ආලයෙන් වෙළී, වියළී පොකුණු තෙරම මරු වැළඳ ගත්තේය.

නාසිසස් දිවි පිදූ තැන මල් පැලයක අපූරු සුවඳැති මලක් පිපී තිබෙනු දුටු ඔහුගේ ශෝකාතුර නෑ හිතවත්හු සිහිවටනයක් ලෙසින් එයට "නාසිසස්" යන නම තැබූහ. "**ආත්ම ස්නේහය**" යන අරුත ඇති Narcissism යන වචනය ශබ්ද කෝෂයට එකතුවිය.

(ග්‍රීක දේව කථාවක් ඇසුරෙනි)

"ආත්මයක් නැති දෙයක ආත්මයක් ඇතැයි මානය ගත් දෙවියන් සහිත ලෝකයා දෙස බලව. "**නාමරූපය" තුළට රිංගා ගෙන** මෙය සත්‍යයැයි හඟියි."

ද්වයතානුපස්සනා සූත්‍රය-
සුත්තනිපාත - ගා. 756

* * *

**නො මළ නාසිසස්:**

“...... **දියරැළි අතර නොපෙනී ගිය දෙවඟන, දියරැළි සන්සිඳෙන විට නැවත දිස්විය......**” දියරැළි අතර නොපෙනී යන දෙවඟන දියරැළි සන්සිඳෙන විට නැවත දිස්වන්නේ මක්නිසාදැයි නාසිසස් කුහුලින් **නුවණැසද මෙහෙයා** බැලීය. දෙවඟනක් **පෙනෙන්නේ** තමා **බලන** නිසා බව අන්තිමේදී ඔහුට වැටහී ගියේය. දෙවඟන සිටින්නේ දියෙහි නොව තම මනසෙහිම බවත් අවබෝධ විය.

හිරු බැස යද්දී පොකුණු තෙර ගසක් මුල හිඳගත් නාසිසස් තමා දරූ නිෂ්ඵල වෑයමෙන් ලත් අත්දැකීම් ගොනුකරන්ට විය. ආත්මස්නේහයෙන් දුටු තමාගේම **පිළිබිඹුව (නාමරූපය)** නිසා උපන් සැප **වේදනාව** අනුව ගත් **සංඥාව, චේතනාවකට** තුඩු දුන් අතර ඒ තුළින් **ස්පර්ශය** සහ **මෙනෙහිකිරීම** දක්වා විහිදුන ක්‍රියාදාමයක් දෙවඟන වැළඳගැනීමට තැත්කළ වාරයක් පාසා ඇතිවූ හැටි **නුවණින් මෙනෙහි කරන** ඔහුට තේරුම් ගියේය. දියෙහි ඇති පිළිබිඹු කරන මායාත්මක ස්වභාවය අමතකවීමෙන් නැවත නැවතත් පෙනෙන දෙවඟනකගේ **ව්‍යාජ රූපයකුත්**, වැළඳගැනීමේ **ව්‍යාජ ක්‍රියාවලියකුත්** අතර දවස ගෙවීගොස් ඇති බවද ඒ සමගම අවබෝධ විය.

“දෙවඟන වැළඳ ගනිමියි කියා පොකුණට නැඹුරුවී මා වැළඳ ගත්තේ **පෙණපිඩක් මෙන් හසුනොවන රූපගොඩක්ම** නේද? **දියබුබුලු වැනි බිඳෙන වේදනා ගොඩක්ම** නේද? **මිරිඟුවක් මෙන් රවටන සංඥා ගොඩක්ම** නේද? **කෙසෙල් පතුරු ගොඩක් වැනි නිසරු සැරසීම් ගොඩක්ම** නේද? **මායාවක් වැනි මුළා කරවන හිත් ගොඩක්ම** නේද?.......”

රූපය පෙණ පිඩුවක් සේ දිස්නේ
වේදනාව දිය බුබුලක් වැන්නේ
මිරිඟුව උපමාවට ගති සන්නේ
සැකැසුම් කඳ කෙසෙලින් දක්වෙන්නේ

මායාවම උපමාවකි විනැණේ
මනසක මෝහනයක් ඇති කරනේ
හිරුකුල-නෑ බුදු රද දක්වන්නේ
පස්කඳ ලෙස් පස් උපමාවකිනේ

- ඵේණ පිණ්ඩුපම සූත්‍රය - ඛන්ධසංයුත්ත
- සං.නි. 111 240

# අනුක්‍රමණිකාව

# අ


| | |
|---|---|
| අකුසල කර්ම | 14 |
| අකුසල ධර්ම | 41,42 |
| අකුසලය | 12 |
| අක්ඛණවෙධී | 166,167,168 |
| අංගුත්තර නිකාය | 129,156,157 |
| අඝතො | 74 |
| අචෙල කස්සප | 130 |
| අජිත | 68,69 |
| අජ්ඣත්ත බහිද්ධා (ආධ්‍යාත්මික බාහිර) | 98,112-117, 121,143,166,167 |
| අඤ්ඤමඤ්ඤපච්චයතාව | 81,137 |
| අටළොස් ධාතු | 128 |
| අටුවා | 34,65,86,87 |
| අට්ඨික | 41 |
| අට්ඨික භාවනාව | 87 |
| අට්ඨික භාවනා ආනිශංස | 93 |
| අට්ඨික සංඥාව | 85-97 |
| අත්තකිලමථානුයෝගය | 43 |
| අත්තූපමා | 57 |
| අත්ථකුසල | 3 |
| අධිපඤ්ඤා ධම්ම විපස්සනා | 157,158 |
| අනත්තතො | 74 |
| අනාගත භය | 76 |
| අනාගාමී | 7,22,44,64,69,84,93,94,105,124, 148,169 |
| අනාත්ම දර්ශනය | 73,113,167 |
| අනාත්ම සංඥාව | 62 |
| අනාත්ම ස්වභාවය | 43,59,72,156,162,163 |
| අනාවරණ ඥානය(අනාවරණ දස්සාවී) | 67 |
| අනිච්චතො | 74 |
| අනිච්චානුපස්සනා | 40 |
| අනිත්‍යතාව (අනිච්චතා) | 36,40,43,46,54,59,61,62,72,73,103 116-119,162,163 |
| අනිත්‍ය සංඥාව | 62,64,74,88,156 |

අනිදස්සන විඤ්ඤාණය 146
අනිස්සිත 37
අනුට්ඨීතාය 9
අනුපස්සනා 35
අනුපාදින්න 118,121,122,138,139
අනුරාධපුර යුගය 87
අනුශාසනා ප්‍රාතිහාර්යය 145
අපරාපරියවේදනීය 15
අප්පකිච්චා 3
අප්පගබ්භා 4
අප්‍රමාණව සිත වැඩීම 12,16
අප්‍රමාණ වූ මෛත්‍රී සිත 6,13
අභිඥා 27
අමතා ධාතු 163
අමෘතය 51,54,63,99,105,170
අයෝනිසෝමනසිකාර 79,136
අරක ශාස්තෘවරයා 49,50
අරටුව 79
අරක්කැමියාගේ උපමාව 153,154,155
අරියපරියේසන සූත්‍රය 43
අරියෝ විහාරෝ 43
අරූප 141
අරූපලෝක (අරූප භව) 60,124,129
අර්පනා සමාධිය (අප්පනා සමාධිය) 92
අර්හත්වය (රහත්ඵලය) 22,25,44,63,64,83,86,93,94,97,102,
105,109,110,126,148,157,158,169
අල්පේච්ඡතාව 72
අවමඟුල 56,57,58
අවිඤ්ඤාණක අසුභය 98,100,101
අවිද්‍යා අන්ධකාරය 101,124
අවිද්‍යා නීවරණය 62,136,140
අවිද්‍යාව (අවිජ්ජා) 43,62,68,73,77,79,82,118,123,125,
129,136,137,138,141,142,168
අවිද්‍යාශ්‍රව 56
අවිහිංසා සංකප්ප 90
අව්‍යාපාද සංකප්ප 90
අසංඛත 169

| | |
|---|---|
| අසිබන්ධකපුත්ත | 10 |
| අසුභකර්මස්ථාන | 89,97 |
| අසුභදර්ශනය | 142 |
| අසුභනිමිත්ත | 99 |
| අසුභ භාවනා (පිළිකුල් භාවනා) | 36,56,63,88-102,111,139,140 |
| අසුභ භාවනා ආනිශංස | 101 |
| අසුභ සජ්ඣායනා | 56 |
| අසුභ සංඥාව | 85,88,102 |
| අස්මිමානය | 62,63,121,122,125 |
| අස්මිමාන සමුග්ඝාතය | 63 |

# ආ


| | |
|---|---|
| ආකාශ ධාතුව | 115,131,141 |
| ආකාසානඤ්චායතනය | 124 |
| ආකිඤ්චඤ්ඤායතනය | 124,159 |
| ආජානීය අශ්වයා | 54 |
| ආජානීය පුරුෂයා | 55 |
| ආණක | 75 |
| ආත්ම දෘෂ්ටිය | 7,130,135 |
| ආත්මය | 35,36,43,69,72,82,86,111,123, 160,163,168 |
| ආත්ම සංකල්පය | 73 |
| ආත්ම සංඥාව | 40,107,111,115,119,123 |
| ආත්මස්නේහය | 111,117,123,140 |
| ආත්මීය | 72 |
| ආධ්‍යාත්මික ආයතන හය | 73,75 |
| ආධ්‍යාත්මික පඨවි ධාතුව | 140 |
| ආනන්ද | 72,129,131,134 |
| ආනාපානසති භාවනාව | 27-44 |
| ආනාපානසති භාවනාව- ප්‍රායෝගික ගැටළු | 32 |
| ආනාපානසතිය | 7,24,26,29,35,40,44,53, 54,62,64,99 |
| ආනාපානසතියේ ආනිශංස | 26,40.41 |
| ආනාපානසති අභ්‍යාසය | 29,30 |
| ආනාපානසති සමාධිය | 25,41,42,43 |
| ආනාපාන සති සූත්‍රය | 27 |
| ආපො ධාතුව | 75,105,107,110,112,114,115,116 117,122,123,130-139,141,146 |
| ආබාධතො | 74 |
| ආසෙවිතාය | 8 |
| ආර්යඅෂ්ටාංගිකමාර්ගය | 100,130,161,163,167,168 |
| ආරෝග්‍යමදය | 45,56 |
| ආර්ය දර්ශනය | 7 |
| ආර්ය ශ්‍රාවකයා | 2 |
| ආලාර කාලාම | 124,159,160 |
| ආශ්වාසය-ප්‍රශ්වාසය | 29-44,53,54,62,125 |
| ආශ්වාස ප්‍රශ්වාස වායොධාතුව | 28,115 |
| ආශ්‍රව | 56,131,153 |

## ඇ


ඇදුම රෝගය 29,36,43


## ඉ


ඉතිවුත්තක පාළිය 1
ඉද්ධිපාද 97
ඉන්ද්‍රිය ධර්ම 97,100
ඉන්ද්‍රියයන් හය 95,133
ඉන්ද්‍රිය ධර්ම 164
ඉන්ද්‍රිය සංවරය 87,95

<u>**උ**</u>


| | |
|---|---|
| උගගහනිමිත්ත | 91,97 |
| උච්ඡේද දෘෂ්ටිය | 123,130 |
| උච්ඡේදවාදීන් | 130 |
| උජු | 3 |
| උත්තරීතර ලෝක දර්ශනය | 65 |
| උදය | 68 |
| උද්දකරාම පුත්ත | 124,159,160 |
| උද්ධචච කුක්කුචච | 91,155 |
| උපක්ලේශ ධර්ම | 154 |
| උපධි | 1,93,164,169 |
| උපපජ්ජවේදනීය | 15 |
| උපරෝධනය | 147 |
| උපසමානුසසති | 163 |
| උපසම්පදා | 150,151 |
| උපසංහරති | 58,98 |
| උපසේන වංගන්ත පුත්ත | 149-152,165 |
| උපාදාන | 131-136,139,141,143,163 |
| උපාදින්න | 118,122,138,139 |
| උපුල්වන් මෙහෙණීය | 48 |
| උපෙක්ඛා (උපේක්ෂා සිත) | 20,93,94,111,115,121,141 |
| උපෙක්ඛා චෙතොවිමුත්ති | 20 |
| උරග ජාතකය | 45,46 |
| උරුවෙල කස්සප | 160 |

## එ


| | |
|---|---|
| එකක් (ඒකකය) | 80 |
| එකොළොස්ආකාර මෙනෙහි කිරීම (සම්මර්ශනය) | 74,162,166,167 |


## ඒ


| | |
|---|---|
| ඒකාග්‍රතාව | 92 |
| ඒතදගග තනතුර | 24,26,70,71,151 |
| ඒදණ්ඩ උඩ බල්ලා උපමාව | 123 |
| ඒහිභික්ෂුභාවය | 24 |


## ඔ


| | |
|---|---|
| ඔන්චිල්ලාවේ උපමාව | 33 |


## ඕ


| | |
|---|---|
| ඕපධික පුණ්‍ය ක්‍රියා වස්තු | 1,2 |

## ක


| | |
|---|---|
| කටසිවඩ්ඪිතා | 105 |
| කපිලවස්තු පුරය | 66 |
| කමටහන(කර්මස්ථාන) | 29,85,86,89,92-99,100,101,102 107 |
| කය සෘජුකිරීම | 28 |
| කරුණාව | 5,20 |
| කරුණා චෙතොවිමුත්ති | 20 |
| කර්මය | 129,142,143 |
| කර්මවාදය | 15 |
| කර්ම විපාක | 1 |
| කර්මවේග | 21,137 |
| කර්ම සංස්කාර | 143 |
| කසිණ | 41 |
| කළ්‍යාණමිත්‍ර ආශ්‍රය | 64,83,105 |
| කළල රූපය | 138 |
| කාමච්ඡන්දය | 91,155 |
| කාමභව | 129,143 |
| කාමරාගය | 86 |
| කාමවිතක්ක | 96 |
| කාමාශ්‍රව | 56 |
| කායගතාසති (කය අනුව ගිය සිහිය) | 99,100 |
| කායපස්සද්ධිය | 92 |
| කායසංඛාරා (කායසංස්කාර) | 125,142 |
| කායසංඛාරෝ (කාය සංස්කාරය) | 31,35 |
| කායානුපස්සනා | 27,29,30,35,38 |
| කාල හතර | 156 |
| කාශ්‍යප බුදුරජාණන්වහන්සේ | 85 |
| කැල මලේ උපමාව | 101 |
| කියතේ උපමාව | 34 |
| කුසලය | 18,23,64,126 |
| කුසල ශක්තිය | 1,2,105,136,143,148 |
| කුසල් සිත | 1 |
| කෙලෙස් | 111,119,141,157,163 |
| කේවඩ්ඩ | 145 |
| කොරා සහ අන්ධයා උපමාව | 133 |
| කොවිදො (දක්ෂයා) | 152,155 |

## ඛ


| | |
|---|---|
| ඛුජ්ජුත්තරා | 48 |
| ඛේමා තෙරණිය | 48,98 |


## ග


| | |
|---|---|
| ගණන්-කිරීමේ පුරුද්ද | 34 |
| ගණ්ඩතො | 74 |
| ගතපච්චාගත වත | 95 |
| ගවඝාතක උපමාව | 110 |
| ගෝධාවරී නදීතෙර | 66,67 |


## ඝ


| | |
|---|---|
| ඝන සංඥාව | 61,79 |

## ච


| | |
|---|---|
| චක්‍රවර්ති රජ | 67 |
| චක්‍රාකාර අවබෝධය | 40 |
| චක්ඛු විඤ්ඤාණය | 73 |
| චක්ඛු සම්ඵස්සය | 73 |
| චතුරාර්ය සත්‍යය | 48,60 |
| චතුරාර්ය සත්‍යය විනිවිද දැකීම | 167,168 |
| චත්තාළීසාකාර විපස්සනා | 80 |
| චිත්තානුපස්සනා | 27,35,38,39,155 |
| චිත්තනන්තරො | 17 |
| චිත්තපස්සද්ධිය | 92 |
| චිත්තවිමුක්තිය (චෙතොවිමුත්ති) | 1,2,12 |
| චිත්තසංස්කාර(චිත්තසංඛාරා) | 31,39,125 |
| චූලපන්ථක | 102 |
| චේතනා | 122,123,125,129,130, 132,137,143 |


## ඡ


| | |
|---|---|
| ඡන්ද | 68 |
| ඡවිපාපක චිත්තභද්දක | 71 |


## ජ


| | |
|---|---|
| ජරාව | 104 |
| ජාතකපාළි | 45 |
| ජීවිත මදය | 45,56 |

## **ත**


| | |
|---|---|
| තචසාර | 81 |
| තණ්හාව (තෘෂ්ණාව) | 43,60,62,107,110,119, 129,134,136,139 |
| තණ්හා සංයෝජන | 136 |
| තණ්හුපාදින්න | 118 |
| තථාගතවිහාරො | 43 |
| තස (තැතිගත්) | 5 |
| තාලපුට | 107,108 |
| තිස්සමෙත්තෙයා | 68 |
| ත්‍රිලක්ෂණය විනිවිද දැකීම | 156 |
| තේජෝ ධාතුව | 75,105,107,110,112, 114,115,117,122,123, 130,131,133,138,139, 146 |


## **ථ**


| | |
|---|---|
| ථාවර (තහවුරු) | 5 |
| ථීනමිද්ධ | 91,155 |
| ථෙරගාථා | 24,85,107,150 |

# දු


| | |
|---|---|
| දසඅකුසල් | 12,16 |
| දසඅසුභ | 97 |
| දසකුසල් | 12,16 |
| දලිපිහියේ උපමාව | 37 |
| දිට්ඨධම්මවේදනීය | 14,15 |
| දිට්ඨධම්මසුඛවිහරණය | 24,25,41,42,154,163 |
| දිට්ඨි | 108,119 |
| දියසුළිය | 81,144 |
| දිසාචරණ | 13,87 |
| දිසාවලට මෛත්‍රිය පැතිරීම | 12,13,16 |
| දුක්ඛතො | 74 |
| දුක්ඛස්කන්ධය | 78 |
| දුක් ස්වභාවය (දුක්ඛ) | 43,59,61,88,140,156,<br>162 |
| දුනුවායාගේ උපමාව | 165 |
| දූරේපාතී | 165,167 |
| දෙකක් | 135,137 |
| දෙතිස් කුණප කොට්ඨාශ | 89,99,113 |
| දෙතිස්මහා පුරුෂ ලක්ෂණ | 67 |
| දෙයක් (දේවල්) | 122,125,139,144,170 |
| ද්වේෂ බන්ධනය | 108 |
| ද්වේෂ විතක්ක | 96 |
| ද්වයතාව | 82,83,141 |
| ද්වේෂය | 16,91,108 |

# ධ


| | |
|---|---|
| ධම්ම | 35 |
| ධම්මපදය | 103,104,158 |
| ධම්මවිචය | 93,94,102 |
| ධම්මානුපස්සනා | 27,35,38,40,54,155 |
| ධර්ම චක්ෂුසය | 143,144 |
| ධර්මානුකූල සිද්ධාන්තය | 14 |
| ධාතු කර්මස්ථාන | 112,116 |
| ධාතු මනසිකාර භාවනාව | 107 |
| ධාතු මනසිකාරය | 99,110-119,124,125,<br>140,141 |
| ධාතුමනසිකාරයේ ආනිශංස | 114,115,125 |
| ධාතුවිභංග සූත්‍රය | 119,138,143 |
| ධාතුහතර | 75,110-118,120,130,<br>143,146 |
| ධාතුහය | 130,138 |
| ධාතුහයක සංග්‍රහය | 120 |
| ධුතාංග | 105 |
| ධුතාංගධාරී | 89,150,152 |
| ධ්‍යාන | 22,27,76,90-93,100,<br>124,153,<br>158-165,168 |
| ධ්‍යාන නිකාන්තිය | 163 |
| ධ්‍යාන ඵලසමාපත්ති සුවය | 24 |
| ධ්‍යාන සුවය | 169 |

## න


| | |
|---|---|
| නකුල පිතා | 102 |
| නකුල මාතා | 102 |
| නගරයක උපමාව | 104 |
| නව සීවථිකය | 57,99 |
| නාම | 139 |
| නාම ධර්ම | 123,133,143 |
| නාම රූප | 80-83,122,123, 131139,143147,148 |
| නාලන්දා | 10 |
| නාසිකාග්‍රය | 29,33 |
| නාසිසස් | 134,135,136,138, 140,146 |
| නාසිසිසම් | 140 |
| නිගන්ථ ධර්මය | 11,14,15 |
| නිගන්ථනාථපුත්ත | 10,14 |
| නිත්‍ය | 88 |
| නිපකො | 4 |
| නිබ්බිදාව (නිර්වේදය, කලකිරීම) | 78, 88,100,102, 114,140 |
| නිමිති ගැනීම් | 41,89,90,93,94,96,99 |
| නියතිවාදය | 11,14 |
| නිරෝධය | 40,54,59,60,93,141 142,147 164,170 |
| නිරොධ නිස්සිතං | 93,94 |
| නිවන(නිබ්බාන, නිර්වාන, නිවීම) | 3,22,23,36,44,51, 52,59-64,76, 78,88,89,94-101,112, 146,147,149,153, 159,163,164,169,171 |
| නීවරණ ධර්ම | 39,89,91,92 |
| නෙක්ඛම්ම | 66,94 |
| නෙක්ඛම්ම සංකප්ප | 90,94,109 |
| නෙවසඤ්ඤානාසඤ්ඤායතනය | 124,156,159 |

## ප


| | |
|---|---|
| පජානාති | 30,38 |
| පඤ්ඤින්ද්‍රිය | 164,168 |
| පටික්කූල මනසිකාරය(පිළිකුල් භාවනාව) | 90,99,100,112 |
| පටිසංඛා | 6 |
| පටිච්චසමුප්පාද ධර්මය | 15,36,60,61,77,80-83,127,130 134,137,144,162,163 |
| පටිනිස්සග්ග (අතහැරීම) | 54 |
| පටිනිස්සග්ගානුපස්සී | 40 |
| පටිභාග නිමිත්ත | 91,92,97 |
| පඨවි ධාතුව | 75,86,105-117, 121,122,123,130, 131,133,138,139,141, 143,146 |
| පඨවිසම භාවනාව | 115 |
| පරතො | 74 |
| පරාමර්ශණය | 79,80 |
| පරිකර්ම නිමිත්ත | 90 |
| පරිමුඛං සතිං උපට්ඨපෙත්වා | 29,33 |
| පරිසර හිතකාමී චින්තනය | 125 |
| පර්යාප්ති | 170 |
| පරිච්තාය | 9 |
| පලංචිය | 38 |
| පලොකතො | 74 |
| පසේනදී කොසොල් රජ | 65,66,67 |
| පහානය | 96 |
| පහාස නිරය/ පහාස දිව්‍යලෝකය | 108 |
| පහුරේ උපමාව | 161,169 |
| පස්සද්ධිය | 32,93,94 |
| පස්සම්භයං කායසංඛාරං | 31,32 |
| පඹයාගේ උපමාව | 168 |
| පංචඋපාදානස්කන්ධය | 74,75,78,80,110,123, 128,160,163,164, 166,167,169 |
| පංචකාම | 7 |
| පංසුකූල චීවර | 70 |

පාපක අකුසල ධර්ම 96
පාරමී ධර්ම 24
පාරමී ශක්තිය 43,65
පාරිලෙය්‍ය වනය 152
පාලුගම (සුසෙඤ්ඤා ගාමො) 73
පාලුගෙවල් 73
පැවැත්ම 62,82,144
පිංකම් 1,2
පිංගිය 69
පීති (ප්‍රීතිය) 38,92,93,94
පීතිපටිසංවෙදී 38
පුක්කුසාති 119,124
පුණ්ණක 68
පුනර්භවය(ආයතිපුනබ්භවාභිනිබ්බත්ති) 129,130
පුලවක සංඥාව 97,102
පොහොය අටසිල් 88
පෝසාල 68
පෘථග්ජනයා 143
පෘථග්ජන සංඥාව 139
ප්‍රඥප්ති 82,144,146
ප්‍රඥාව 15,16,79,94,124,138,
139,140,157,158,171
ප්‍රණිධි 130
ප්‍රතීත්‍යසමුත්පන්න 34
ප්‍රතිපත්ති 170
ප්‍රතිපදාව 77
ප්‍රත්‍යක්ෂය 168,170
ප්‍රතිවේධ 170
ප්‍රතිෂ්ඨාව 134,146
ප්‍රත්‍යවේක්ෂා 110,111
ප්‍රථම ධ්‍යානය 43,161
ප්‍රපංච 73
ප්‍රමාදය 45,53,108
ප්‍රමෝදය 92
ප්‍රාණ 43
ප්‍රාණායාම 29,33,34,35,43
ප්‍රියවිප්‍රයෝග දුක්ඛය 49

## ඵ


ඵස්ස (ස්පර්ශය) 123,132,134


## බ


| | |
|---|---|
| බටකොට්ටු මිටි දෙකේ උපමාව | 81,138,144 |
| බල | 97,100 |
| බහුලීකතාය | 8 |
| බාවරී බ්‍රාහ්මණයා | 65,67-70 |
| බාහිර පඨවි ධාතුව | 140 |
| බිම්බය(ප්‍රතිරූපය, මූර්තිය, පිළිබිඹුව) | 128,131,134,135,136,142,147 |
| බුද්ධ වචනය | 21,30 |
| බුද්ධානුස්සති | 89 |
| බුද්ධශාසන දායාදය | 149 |
| බුදුරජාණන් වහන්සේගේ දායාදකරු | 86 |
| බෙර-කදේ උපමාව | 76 |
| බොජ්ඣඞ්ග | 22,27,93,94,96,97,155 |
| බොජ්ඣඞ්ග භාවනාව | 22,93-96 |
| බෝධිපාක්ෂික ධර්ම | 22 |
| බෝධිසත්ත්ව | 40,45,49 |
| බ්‍රහ්මචරිය වාසය | 14,15 |
| බ්‍රහ්මලෝක | 22 |
| බ්‍රහ්ම විහරණය | 7,20,22,43 |
| බ්‍රාහ්මණ | 25,48 |

## <u>භ</u>


| | |
|---|---|
| භගග රට | 86 |
| භව තණ්හාව | 135 |
| භව නිරෝධය | 147,148,170 |
| භවය | 129 |
| භව බැමි | 2 |
| භවාශ්‍රව | 56 |
| භංග ඥාණය | 142 |
| භාවනා | 96,126,148 |
| භාවනායෝගී | 12,28,44,55,66 |
| භාවිතාය | 8 |
| භෞතික දර්ශනය | 143 |
| භෞතික දෘෂ්ටිය | 131 |
| භෞතික වාදය | 139 |

## ම


| | |
|---|---|
| මකුකම | 104 |
| මනෝසංස්කාර | 142 |
| මමත්වය | 115 |
| 'මම' සංකල්පය | 62 |
| මරණසතිය | 45-59, 89 |
| මරණ සතියේ ආනිශංස | 49,51,52,62 |
| මහග්ගත සිත (මහද්ගත සිත) | 12,16 |
| මහත්ඵල මහානිශංස | 89 |
| මහාකප්පින | 24,32 |
| මහාකොට්ඨිත | 74,80,81 |
| මහාකෝසල රජ | 65 |
| මහාතිස්ස | 87 |
| මහාබ්‍රහ්මයා | 145 |
| මහාභූත ධර්ම (මහාභූතයින්) | 75,107,120,133, 138,139,145,146 |
| මහාරාහුලෝවාද සූත්‍රය | 112 |
| මහාසතිපට්ඨාන සූත්‍රය (සතිපට්ඨාන සූත්‍රය) | 26,32,35,37,56, 57,59,98,110 |
| මහාසාරිපුත්ත | 73,80,81,115,116, 118,119,138,149 |
| මහාහත්ථිපදෝපම සූත්‍රය | 116 |
| මාර්ගක්ෂණය | 168 |
| මාර්ගඥානය | 168 |
| මානය (මාන්නය) | 45,62,104,107,119, 125,135,141 |
| මානවාභිමානය | 125,139,147 |
| මාරයා | 62,72-78,83,127, 128,129,135,141,147 |
| මාර්ගඵල ප්‍රතිවේධය | 22,44,64,84,105, 126,148,171 |
| මැටිපිඩේ උපමාව | 168,169 |
| මැදුම් පිළිවෙත (මධ්‍යම ප්‍රතිපදාව) | 43,130,159,160, 162,163 |
| මිථ්‍යාදෘෂ්ටි (මිච්ඡාදිට්ඨි) | 7,128,170 |
| මිරිඟුවේ උපමාව | 83 |
| මිහිඳු | 149,170 |

| | |
|---|---|
| මිහින්තලාව | 87 |
| මුදිතා චෙතොවිමුත්තිය | 20 |
| මුදිතාව | 20 |
| මුදු | 3 |
| මුදුන (මුද්ධං) | 66,68,77 |
| මුදුන වැටීම (මුද්ධාධිපාතං) | 66,68,77 |
| මුළුකය | 30 |
| මෙත්ත සූත්‍රය | 2,3,12,21,27 |
| මෙත්තානිසංස | 8,9 |
| මෙත්තානිසංස සූත්‍රය | 8 |
| මෙනෙහිකිරීම (මනසිකාර) | 122,123,132,143 |
| මොඝපුරිස | 25,70,150 |
| මෝඝරාජ | 65,68-72,83 |
| මෝහබන්ධනය | 108 |
| මෝහය | 108 |
| මෛත්‍රීචෙතොවිමුක්තිය (මෙත්තා චෙතොවිමුත්තිය) | 1,6-22 |
| මෛත්‍රී චෙතොවිමුක්ති දේශනාව | 16 |
| මෛත්‍රී භාවනාව | 1,2,4,7,18,19,21, 22,87,102 |
| මෛත්‍රීමය සිහිය | 7 |
| මෛත්‍රිය | 2,3,5,6,9,12,57,58 |
| මෛත්‍රී සිත | 13,14,18,20 |

## ය

| | |
|---|---|
| යථාභූතඥානය | 59,60 |
| යථාභූත දර්ශනය | 79 |
| යථාර්ථය | 61 |
| යානිකතාය | 8 |
| යෝග අභ්‍යාස | 43 |
| යෝග භාවනාව | 153 |
| යෝගාවචරයා | 3,29,40,85,89,92,94, 97,100,109,110,111 |
| යොධාජීව | 165 |
| යොනිසොමනසිකාර | 79 |
| යෞවන මදය | 45,56 |

## ර


| | |
|---|---|
| රජමාවත | 44 |
| රහත්බව | 55,125 |
| රාග බන්ධනය | 108 |
| රාගය | 85,101,108,119 |
| රාධ | 77,78 |
| රාහුල | 48,53,112,115,138 |
| රාශි සංඥාව | 80 |
| රූප | 74-82,121,133,135,<br>141,162,<br>166 |
| රූප උපාදානස්කන්ධය | 61,77,123 |
| රූප ධර්ම | 139 |
| රූපනන්දා | 98 |
| රූපභව (රූපලෝක) | 60,129 |
| රූපසංඥාව | 75,123,133 |
| රොගතො | 74 |


## ල


| | |
|---|---|
| ලබුකබලේ උපමාව | 104 |
| ලියවනපට්ටල් වඩුවා උපමාව (හමකාරො) | 32 |
| ලුණුකැටයේ උපමාව | 14,16 |
| ලෝක චින්තා | 118 |
| ලෝකෝත්තර | 169 |
| ලෝණඵල සූත්‍රය | 14 |
| ලෞකික | 169 |

# <u>ව</u>


| | |
|---|---|
| වක්කලී | 164 |
| වචී-සංඛාරා (වචී සංස්කාර) | 125,142 |
| වචීසංඛාරො | 31 |
| වටටය | 82,144 |
| වත්ථුකතාය | 8 |
| වායාම | 95 |
| වායො ධාතුව | 75,105,107,110,118,<br>122,123,130,131,133,<br>138,139,146 |
| විචිකිච්ඡා (දෙගිඩියාව) | 91,155 |
| විඤ්ඤාණය | 73,74,81,82,119-<br>124,129,131,132,136-<br>138,162,166 |
| විඤ්ඤාණ ධාතුව | 131 |
| විඤ්ඤාණ මායාව | 119-124,137 |
| විඤ්ඤාණ ස්කන්ධය | 61,123 |
| විතකක විචාර | 31,53,92,125 |
| විතර්ක පීඩනය | 34,44 |
| විදර්ශනා (විපසසනා) | 22,34-38,40,73,79,<br>86,88,100,118,140,<br>153-158,161-171 |
| විදර්ශනා ඥාන | 80,142 |
| විදර්ශනාත්මක ධර්ම දේශනා | 106,126,148 |
| විදර්ශනාවේ විනිවිද යෑම | 37,142 |
| විදර්ශනා භාවනාව | 79,83,166 |
| විද්‍යාව (විජ්ජා) | 27,43,68 |
| විනය නීති | 150 |
| විනය පිටකය | 150 |
| විපරීත දෘෂ්ටි | 124 |
| විපල්ලාස (විපිරියාස) | 88,124 |
| විපපටිසාරී | 11 |
| විපාක | 15,143 |
| විමුක්ත විඤ්ඤාණය | 146 |
| විමුතති | 27,43,78,114 |
| විරාග නිසසිතං | 93,94 |

විරාගය 54,78,85,89,114,119,164,
විරාගානුපසසනා 40
විරාජෙති 119
විරිය 68,93,94,95,164
විවෙක නිසසිතං 93,94,96
විවේකය 150,151,152
විවේකී පරිසරය 27
විෂම ලෝභය 16
විසුදධිය 153
විහිංසා විතකක 96
වෙමි (අසමි) හැඟීම 119,121,125
වේදනා 31,39,74,61,82,122,123,125,
132,134,143,162,166
වේදනානුපසසනා 27,35,38,39
වේදනාස්කනධය 61,123
වේදයිතය 73
වේපුල්ල පර්වතය 103
වොසසගග 40,93,94
වොසසගග- පරිනාමිං 93,94
ව්‍යවහාර 144
ව්‍යසනය 128,140,147
ව්‍යාපාදය 91,155

## ශ


| | |
|---|---|
| ශක්‍රයා | 46,47,48 |
| ශාසන බ්‍රහ්මචරියාව | 78 |
| ශාස්වත දෘෂ්ටිය | 123,130 |
| ශූන්‍ය | 69,70,73,80 |
| ශූන්‍යතා දර්ශනය | 72 |
| ශූන්‍යතා ප්‍රතිසංයුක්ත සූත්‍ර | 76,77,83 |
| ශූන්‍යතාව | 70,75,76,83 |
| ශ්‍රද්ධාව | 108,109 |

## ස


| | |
|---|---|
| සංකල්ප | 82 |
| සංඛත | 169 |
| සංඛ සූත්‍රය | 9,13 |
| සංයුත්ත නිකාය | 127 |
| සංයෝජන | 2 |
| සංවේගය | 54,55,56 |
| සංසාර චක්‍රය | 144 |
| සංසාර විමුක්තිය | 149,170,171 |
| සංස්කාර (සංඛාර) | 22,35,43,60,61,74,79,80,82, 123,125,137,138,142,158,162 164,166, |
| සංස්කාර විදර්ශනාව | 158 |
| සංස්කාර සම්මර්ශණය | 79,80,158,160,162,163,165 |
| සකදාගාමී | 22,44,64,83,105,126,148,149 |
| සක්කායදිට්ඨිය | 61,82,111,135,137,160 |
| සක්කො | 3 |
| සජ්ඣායනා | 57,59 |
| සඤ්ඤා (සංඥා) | 31,39,61,73,74,82,83,122,123 125,132,143,162,166 |
| සතර ඉරියව්ව | 7 |
| සතර කමටහන් | 44,89 |
| සතර බ්‍රහ්මවිහරණය | 20 |
| සතර මහාභූතයින් | 105 |
| සතර සතිපට්ඨානය | 27,35,38,41,42,94,154 |
| සති | 68,93,94,96,164 |
| සතිපට්ඨාන | 97,155 |
| සතිපට්ඨාන භාවනාව | 35,39 |
| සත්තසූරියුග්ගමන සූත්‍රය | 117 |
| සත්තිස්බෝධිපාක්ෂික ධර්ම | 64,97 |
| සතිසම්පජඤ්ඤය | 22,39,154 |
| සත්ත්ව සංඥාව | 22 |
| සද්ධා | 68,164 |
| සන්තින්ද්‍රියො | 4 |
| සන්තුස්සකො | 3 |
| සත්තබොජ්ඣංග ධර්ම | 27 |

| | |
|---|---|
| සබ්බකායපටිසංවේදී | 31,32 |
| සබ්බෙ සත්තා | 5 |
| සමථ | 35,64,153,155,156-158, 164-171 |
| සමථ විදර්ශනා | 148,159,160 |
| සමන්තපාසාදික භික්ෂුව | 152 |
| සමසත පහ | 5 |
| සමාධිය | 15,16,25,32,35,68,71,72,92-94 105,154-169,171 |
| සමාධි නිමිත්ත | 96,152,154 |
| සමුදය | 141,142,147 |
| සමුදය අත්ථංගම | 59 |
| සමූහ භාවනා | 28 |
| සම්බෝධිය | 40 |
| සම්මප්පධාන (සංවර, පහාන, භාවනා, අනුරක්ඛන) | 95,96,97 |
| සම්මා දිට්ඨිය | 16,124,148,161,164 |
| සම්මා සමාධි | 161,164 |
| සම්මා සම්බුදුරජාණන් වහන්සේ | 1-171 |
| සම්මා සංකප්ප | 90,103 |
| සම්‍යක් දර්ශනය | 77,78,79 |
| සම්‍යක්ප්‍රඥාව | 114 |
| සල්ලහුකවුත්ති | 3 |
| සයංකතං- පරංකතං | 80 |
| සර්ව අශුභවාදය | 142 |
| සල්ලතො | 74 |
| සවිඤ්ඤාණක අශුභය | 98,100,101 |
| සළායතනය (ස්පර්ශ ආයතන) | 74,133,134 |
| සැප (සුඛ) | 38,88,92 |
| සැවැත් නුවර | 67,68 |
| සියුම් ස්පර්ශය | 33 |
| සිගාලපිතා | 85,88 |
| සිව්පසය | 111 |
| සිව්පසය ප්‍රත්‍යවේක්ෂාව | 111,112,125 |
| සීමාසම්භේද | 12 |
| සීලය | 15,16,22,44,64,83,126,148, 164,171 |

සුඛපටිසංවේදී 38
සුඛවිහරණය 41
සුඤ්ඤතො 74
සුත්තනිපාතය 65,103
සුභනිමිත්ත 99
සුභරො 3
සුභ සංඥාව 85,88,100,101
සුවචො 3
සුවපත්වෙත්වා! 7,8
සුසමාරද්ධාය 9
සුජූ 3
සේලා 127,128,129
සොහොන් භාවනාව 105
සෝණ 164
සෝවාන් 22,44,48,64,83,105,126,136,
148,169
සෝසානිකංග 105
ස්පර්ශය 115,116,122,143

## සෘ

සෘද්ධි ප්‍රාතිහාර්ය 145
සෘෂීන් 156

## හ

හක්ගෙඩියේ උපමාව 13,14,17
හෙල්ලක උපමාව 19
හේතු ප්‍රත්‍යය 123,130
හේතුඵල සම්බන්ධතාව 127,130
හෝමියෝපති වෛද්‍යක්‍රමය 63

# කතු හිමියන්ගේ සිංහල කෘති

සැ.යු.: මෙම කෘති ලේඛනය සරලත්වයට මුල් තැන දුන් අංක අනුපිළිවෙලක් සහිතව සකස්වී ඇති බවත්, ලේඛනයේ අගහරියේ එන කෘති බොහෝ දුරට ගැඹුරු විය හැකි බවත්, පාඨකයින් දැනුවත් කිරීම් වශයෙන් සඳහන් කරනු කැමැත්තෙමි.

- සම්පාදක

1. තිසරණ මහිම
2. හිතක මහිම – 1
3. හිතක මහිම – 2
4. හිතක මහිම – 3
5. දිවි කතරේ සැඳෑ අඳුර
6. කය අනුව ගිය සිහිය
7. හිත තැනීම
8. පින් රුකෙක මහිම
9. අබිනික්මන
10. පිළිවෙතින් පිළිවෙතට
11. කයේ කතාව
12. මා-පිය උවැටන
13. ප්‍රතිපත්ති පූජාව
14. පැවැත්ම හා නැවැත්ම
15. කර්ම චක්‍රයෙන් ධර්ම චක්‍රයට
16. මෙත් සිතේ විමුක්තිය
17. ඇති හැටි දැක්ම
18. තපෝ ගුණ මහිම
19. සක්මනේ නිවන
20. පහන් කණුව ධර්ම දේශනා – 1 වෙළුම
21. පහන් කණුව ධර්ම දේශනා – 2 වෙළුම
22. පහන් කණුව ධර්ම දේශනා – 3 වෙළුම
23. පහන් කණුව ධර්ම දේශනා – 4 වෙළුම
24. පහන් කණුව ධර්ම දේශනා – 5 වෙළුම
25. පහන් කණුව ධර්ම දේශනා – 6 වෙළුම
26. පහන් කණුව ධර්ම දේශනා – 7 වෙළුම
27. පහන් කණුව ධර්ම දේශනා – 8 වෙළුම
28. පහන් කණුව ධර්ම දේශනා – 9 වෙළුම

29. විදසුන් උපදෙස්
30. භාවනා මාර්ගය
31. උත්තරීතර හුදකලාව
32. සසුන් පිළිවෙත
33. චලන චිත්‍රය
34. දිය සුළිය
35. බුදු සමය පුද්ගලයා හා සමාජය
36. නිවනේ නිවීම – පළමු වෙළුම
37. නිවනේ නිවීම – දෙවන වෙළුම
38. නිවනේ නිවීම – තෙවන වෙළුම
39. නිවනේ නිවීම – සිවුවන වෙළුම
40. නිවනේ නිවීම – පස්වන වෙළුම
41. නිවනේ නිවීම – සයවන වෙළුම
42. නිවනේ නිවීම – සත්වන වෙළුම
43. නිවනේ නිවීම – අටවන වෙළුම
44. නිවනේ නිවීම – නවවන වෙළුම
45. නිවනේ නිවීම – දසවන වෙළුම
46. නිවනේ නිවීම – එකොළොස්වන වෙළුම
47. නිවනේ නිවීම – පුස්තකාල මුද්‍රණය (1-11 වෙළුම්)
48. පටිච්ච සමුප්පාද ධර්මය – 1 වෙළුම
49. පටිච්ච සමුප්පාද ධර්මය – 2 වෙළුම
50. පටිච්ච සමුප්පාද ධර්මය – 3 වෙළුම
51. පටිච්ච සමුප්පාද ධර්මය – 4 වෙළුම
52. පටිච්ච සමුප්පාද ධර්මය – පුස්තකාල මුද්‍රණය (1-4 වෙළුම්)
53. ස්පර්ශයේ ආශ්චර්යය
54. මනසේ මායාව
55. පැරණි බෞද්ධ චින්තාවේ සංකල්පය සහ යථාර්ථය

---

නැවත මුද්‍රණය කරවීම පිළිබඳ විමසීම්

කටුකුරුන්දේ ඤාණනන්ද සදහම් සෙනසුන
කිරිල්ලවලවත්ත, දම්මුල්ල, කරඳන

දුරකථනය: 0777127454

knssb@seeingthroughthenet.net

## By The Same Author

1. Concept and Reality in Early Buddhist Thought
2. Saṁyutta Nikāya – An Anthology
3. Ideal Solitude
4. The Magic of the Mind
5. Towards Calm and Insight
6. From Topsy-turvydom to Wisdom, Volume I
7. From Topsy-turvydom to Wisdom, Volume II
8. Seeing Through
9. Towards A Better World
10. Nibbāna – The Mind Stilled, Volume I
11. Nibbāna – The Mind Stilled, Volume II
12. Nibbāna – The Mind Stilled, Volume III
13. Nibbāna – The Mind Stilled, Volume IV
14. Nibbāna – The Mind Stilled, Volume V
15. Nibbāna – The Mind Stilled, Volume VI
16. Nibbāna – The Mind Stilled, Volume VII
17. Nibbāna – The Mind Stilled, Library Edition
18. Nibbāna and The Fire Simile
19. A Majestic Tree of Merit
20. The End of the World in Buddhist Perspective
21. The Law of Dependent Arising, Volume I
22. The Law of Dependent Arising, Volume II
23. Walk to Nibbāna
24. Deliverance of the Heart through Universal Love
25. Questions and Answers on Dhamma
26. The Miracle of Contact
27. From The Wheel of Kamma To The Wheel of Dhamma

---

All enquiries should be addressed to:

Kaṭukurunde Ñāṇananda Sadaham Senasun Bhāraya
Kirillawala Watta, Dammulla, Karandana
Phone: 0777127454
knssb@seeingthroughthenet.net